අනුබුද්ධ බුද්ධඝෝෂ සථවිරපාදයන් විසින් විරචිත

ධම්මපදට්ඨ කථා

II

(සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය
බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

ධම්මපදට්ඨකථා
දෙවැනි භාගය
සිංහල පරිවර්තනය

පාලි අටුවකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි ධම්මපදට්ඨ කථා දෙවැනි කොටස සිංහලට පරිවර්තනය කර ලද්දේ පූජ්‍ය පන්නල සුමේධ නායක ස්ථවිරයන් වහන්සේ විසිනි. උන්වහන්සේ පොල්ගහවෙල විද්‍යාර්ථෝදය පිරිවෙනේ මූලික අධ්‍යාපනය ලබා අනතුරුව විද්‍යෝදය පිරිවෙනෙහි පිරිවෙන් අවසාන විභාගයෙන් ගෞරව පංතියෙන් සමත් වැ රත්මලානේ හික්ඛු අභ්‍යාස විද්‍යාලයෙන් ගුරු පුහුණු සහතිකය ලබා 1975 වසරේදී භාෂාත්‍රයෙන් උසස් ලෙස සමත් වැ රාජකීය පණ්ඩිත උපාධිය ද, 1982 වසරේදී ජේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධියද, 1986 වසරේදී කැළණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨයෙන් ශාස්ත්‍රපති උපාධියද, 1987 කොළඹ විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපන ඩිප්ලෝමා පශ්චාත් උපාධියද ලබාගත්හ. වසර 30 ක පිරිවෙන් ගුරු සේවයෙන් පසු 2005 වසරේදී නුගේගොඩ සුභදාරාම විද්‍යායතන සේවයෙන් විශ්‍රාම ලබා සිටින පූජ්‍ය සුමේධ හිමියෝ දඹදෙණිය වේවැල්වල ශ්‍රී සෝණුත්තරාරාම විහාරස්ථානයේ අධිපතීන් වහන්සේ වන අතර පහළ දොළොස් පත්තුවේ ප්‍රධාන සංඝනායකධුරය උසුලමින් දඹදෙනිය වේවැල්වල බෞද්ධ ජනතාවගේ ප්‍රසාදයට පත්ව ආගමික හා ශාසනික සේවාවන්හි යෙදෙන ගෞරවණීය මහා ස්ථවිරයන් වහන්සේ නමකි.

Vol XIII

අනුබුද්ධ බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

ධම්මපදට්ඨකථා

(සිංහල පරිවර්තනය)

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ
අනුග්‍රහයෙනි.

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන. 29

අනුබුද්ධ බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

ධම්මපදට්ඨකථා

දෙවන කොටස

(සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය.

පන්නල සුමේධ නායක ස්ථවිර

රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති- (කැළණිය)

අධ්‍යාපන ඩිප්ලෝමා - (කොළඹ)

අධීක්ෂණය හා පද්‍යරචනය

විජිතනන්ද සරත්චන්ද්‍ර

ප්‍රකාශනය.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල

අනුබුද්ධ බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

ධම්මපදට්ඨකථා

දෙවන කොටස
(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2008

ISBN- 978-955-1604-25-7

පරිගණක අකුරුකරණය

ලිතෝ ප්‍රින්ටස් - කොහුවල

පිටකවරය

සුසිල් ජයශාන්ත පෙරේරා මහරගම

මුද්‍රණය
අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.
දුරකථනය: 0112517269

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල
දූ.ක. 2734256, 2728468.2726234 / ෆැක්ස් 2736732
විද්‍යුත් තැපෑල:bcc456@sltnet.lk
www.buddhistcc.com

ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලි එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශ වල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරුකල චින්තකයන්ගේද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස් වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රිස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් , ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෙගර් තුමා අනුමත කරයි.

4. බුදු රජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සළකන වින්ටර්නිට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රනයද ඇතිව, ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුනු පන්සාලිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වුවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදු රජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභඞ්ග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කළ ඒ එක නාමයක් දැඩිව අල්වා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නෛෂ්ක්මව්‍යය යුතු බවත් අරණ විභඞ්ග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරලා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත්, මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත්, මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුලුල්ලේහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර,මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ජනතා ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස්කිරීමත්, ආදිය නිසා බුද්ධ ධර්මයත්, පාළි භාෂාවත්, බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාදීපයේ තහවුරු විය.

හෙළ අටුවා (හෙළටුවා)

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත් විය. මොග්ගලීපුත්තතිස්ස මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දහසක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහා රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහා රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදී. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කරදීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන පාළි ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන් වලදී විස්තරාර්ථ සැපයීමත් ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

මහා අට්ඨකථා
කුරුන්දී අට්ඨකථා
පච්චරිය අට්ඨකථා නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨ කථාවේ, ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘත්තාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජීවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධි මණ්ඩපයට දකුණු දිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමර්ශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩබෙටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍රා දේශයේ ගුන්ටුර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ තලුන් පෙදෙසේ "කෝටතේමලී පුරි" "ගුන්ඩලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩබෙටක යැයි පැවසේ. උන් වහන්සේ උපන් පෙදෙස මොරන්ඩබෙටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කතීං සංදර්ශක ගාථාවක මයුර සුත්ත පටියන හෝ මයුර රූප පටියන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහිද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කායවාග්චිත්තශෙද විද්‍යාවන් හිද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන් ය. බුද්ධඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවස බුද්ධ වර්ෂ 953-975 අතර කාලයේ ය. උන් වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කිපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුළත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇතිබව දඹදිව විසූ රේවත හිමියන් දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදු දහම චිරස්ථායි වීමට හේතුවක් යැයි උන් වහන්සේ සලකා හෙලටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

"බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාළ දෙලක්ෂ පන්සැත්තෑදහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්ෂ එක්සැට්දහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දන යුතු යැයි" පුජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියේහි වූ හෙළටුවාවන්හි අන්තර් ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඩු කරමින්, විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස්කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය. යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදි විශ්‍රැත අර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ථ සහ ඇතුලත් වන්නාවූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු"

"නවද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර නැන් පිඩුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු."යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිදු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදු සමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවා වන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත් වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයා යි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහල වූයේ "බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය" යන ජනප්‍රවාදයක් ද ඇත.

අටුවා විස්තර

විනය පිටකය

උභය විභඞ්ග	1 පාරාජික පාළි	1. ආණා දෙසනා	සමන්තපාසාදිකා	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව
	2. පාචිත්තිය පාළි	2. යථාපරාධ සාසන විනය අට්ඨකථා		
බන්ධක	3. චුල්ල වග්ග පාළි	3 සංවරාසංවර කථා		
	4. මහාවග්ග පාළි			
පරිවාර	5. පරිවාර පාළි			
	භික්ඛුපාතිමොක්ඛ	කඞ්ඛා විතරණී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
	භික්ඛුණී පාතිමොක්ඛ (මාතිකයකථා)			

අභිධර්ම පිටකය

1. ධම්මසංගණිප්පකරණ	1. පරමත්ථ දේසනා	අත්ථසාලිනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
2. විභංගප්පකරණ	2. යථාධම්ම සාසන	සම්මොහ විනොදනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
	3. නාමරූප පරිච්ඡේදකම්			
3. කථාවත්තුප්පකරණ			බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
4. පුද්ගලපඤ්ඤත්තිප්පකරණ				
5. ධාතුකථාප්පකරණ		පරමත්ථදීපනී		
6. යමකප්පකරණ		පඤ්චප්පකරණට්ඨකථා		
7. පට්ඨානප්පකරණ				

සුත්‍ර පිටකය

1. දීඝනිකාය	1. වොහාර දේශනා	සුමඞ්ගල විලාසිනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
2. මජ්ඣිමනිකාය	2. යථානුලෝමසාසන	පපඤ්ච සූදනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
3. සංයුත්තනිකාය	3. දිට්ඨි විනිමෙයන කථා	සාරත්ථප්පකාසිනි	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව
4. අංගුත්තරනිකාය		මනෝරථපූරණී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
5. ඛද්දකනිකාය				

1. බුද්දකපාඨ	පරමත්ථ ජෝතිකා	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
2. ධම්මපද	ධම්ම පදට්ඨ කථා	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
3. උදාන	පරමත්ථ දීපනී	ධම්මපාල ආචාර්ය	5වන ශ.වි.
4. ඉතිවුත්තක	පරමත්ථ දීපනී	ධම්මපාල ආචාර්ය	5වන ශ.වි.
5. සුත්තනිපාත	පරමත්ථ ජෝතිකා	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
6. විමානවත්ථු	පරමත්ථ දීපනී	ධම්මපාල ආචාර්ය	5වන ශ.වි.
7. පේත වත්ථු	පරමත්ථ දීපනී	ධම්මපාල ආචාර්ය	5වන ශ.වි.
8. ථේර ගාථා	පරමත්ථ දීපනී	ධම්මපාල ආචාර්ය	5වන ශ.වි.
9. ථෙරී ගාථා	පරමත්ථ දීපනී	ධම්මපාල ආචාර්ය	5වන ශ.වි.
10. ජාතක ජාතකටඨකථා		බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
11. නිද්දේස (චුල්ල - මහා)	සද්ධම්ම ජෝතිකා	උපසේන ආචාර්ය	6වන ශ.වි.
12. අපදාන (ථේර-ථෙරී)	විසුද්ධජනවිලාසනී	මහානාම ආචාර්ය	7වන ශ.වි.
13. පටිසම්භිදා මග්ග	සද්ධම්මප්පකාසිනි	ධම්මපාල ආචාර්ය	5වන ශ.වි.
14. බුද්ධ වංස	මධුරත්ථප්පකාසිනි	බුද්ධදත්ත හිමි	5වන ශ.වි.
15. චරියාපිටක	පරමත්ථ දීපනී	ධම්මපාල ආචාර්ය	5වන ශ.වි.
	විසුද්ධි මග්ග	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
නෙත්තිප්පකරණ	නෙත්ති අට්ඨකථා	ධර්මපාල ආචාර්ය	5වන ශ.වි.
චතුභාණවාරපාළි	චතුභාණවාර අට්ඨකථා	ආනන්ද වීනරතන	8වන ශ.වි.

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාළියට නගන ලද්දේ බුද්ධදත්ත, ධම්මපාල, උපසේන සහ මහානාම තෙරණුන් විසිනි.

බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි නම් බුද්ධ වංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

මහානාම හිමි

පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියා ඇත.

පරමත්ථදීපනී අට්ඨකථා - (උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - පෙතවත්ථු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා) මුන්වහන්සේ ලියා ඇත.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථා චරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද ආචරිය මත ආචරියා වාද යන නම් වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවති. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතබේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට ඒවැනි දේ ඇතුලත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ දී බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන් වලදී එම මතිමතාන්තර ඇතුලත් වන්නට ඇති බව සිතිය යුතුයි.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරාහිද එවැනි සම්ප්‍රදායයන් පැවතුන බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මත වලට පටහැනි සුත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දුන දුනත් සිය මතය නහවුරු කරණු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, සංගායනා වලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාම වල පොත්ගුල් වල තබා පුස්තකාල වල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික

වැඩපිළිවෙල ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාල තුමා විසින් ඇති කරණ ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 වන දින ත්‍රිපිටක මුද්‍රණ සභා නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදිහත් වීමෙන් කොල්ලුපිටියේ ප්ලාම්ස් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජූනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලා හිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහ නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමිවරුන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාල තුමා ප්‍රධාන සාසනමාමක පිරිසක්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සව්මන් හේවා විතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල් පිහිටුවීය. ඒම අරමුදල මගින් හේවා විතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය ඉතිහාසය පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදි ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයන වලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුනින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත් පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලයට පරිවර්තනය කර මුද්‍රණය කිරීමෙන් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසුව අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කළහ. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්ම දේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනිනම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනිනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වන විට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාවය වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථා වල සිංහල පරිවර්තන නොමැති කමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීම ද, පුජ්‍ය රාජකීය පණ්ඩිත වැලමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාව ද, අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදුර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුල අවසන් කිරීම සඳහා අපට පවරන ලදී. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දැක්වූ ආදර්ශයන් ගොඩනැගූ විශ්වාසයන් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්ය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට ගරු අගමැති තුමන්ට ගරු බුද්ධ ශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට අමාත්‍යාංශයේ ලේකම් මහතාට, අමරහේවා මද්දුම මහතාට අපේ කෘතඥතාවය පුණ්‍යානුමෝදනා පූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද උගත් ගිහි මහතුන්ට ද අපගේ කෘතඥතාවය හිමි වේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධ කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාර වූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාට ය. මෙම මහත්වරු දෙපලම ඉතා උනන්දුවෙන් මෙම කටයුතු වල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ට ද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව

මෙම කාර්යයට හොඳ හිතින් අවංකව සහාය දුන් සියලුදෙනාටම පින් පුරවමින් ආසිරි පතමිහ.

මෙයට

ශාසනස්තිථිකාමී,
කිරම විමලජෝති ස්ථවිර
අධ්‍යක්ෂ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
නැදිමාල
දෙහිවල.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තන මණ්ඩලය.

පූජ්‍ය රාජකීය පණ්ඩිතඅම්බලංගොඩ ශ්‍රී සුමංගල නායක මාහිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත ආඳාවල දේවසිරි නායක මාහිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත තුඹුල්ලේ ධම්මානන්ද නායක මා හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සම්මන හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරි සීවලී හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත ඇස්වත්තේ රේවත හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත බඹුරුගම ධම්මවංස හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම් පිටියේ විජිතධම්ම හිම්පාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිම්පාණන් වහන්සේ.

රාජකීය පණ්ඩිත	කීර්ති නාරම්පනාව මහතා.
ශාස්ත්‍රවේදී	ඇන්.එච්. පෙරේරා මහතා.
රාජකීය පණ්ඩිත	ජේ.පී. නිමල් ලාල් රංජිත් මහතා.
රාජකීය පණ්ඩිත	ටී.ජී. ජයතිලක මහතා.
රාජකීය පණ්ඩිත	ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා.
රාජකීය පණ්ඩිත	එච්.පී.ඇස්. නිශ්ශංක මහතා.
රාජකීය පණ්ඩිත	බී.එම්.පී. බාලසූරිය මහතා. (නිතිඥ)
රාජකීය පණ්ඩිත	සෝමරත්න ගම්ලත් වෙල ගෙදර මහතා
රාජකීය පණ්ඩිත	දයා ගුණසේකර මහතා.
ශාස්ත්‍රවේදී	ඩබ්ලිව්.ඇල්.පී. ධර්මදාස මහතා
ශාස්ත්‍රවේදී	ජිනදාස ගොඩකන්ද මහතා.
රාජකීය පණ්ඩිත	ලසිත් නලන්ත මහතා.
රාජකීය පණ්ඩිත	පී.ඇල්.කේ. පෙරේරා මහතා.

සම්බන්ධීකරණය :- විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා.

බෞද්ධ මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තන සමීක්ෂණ මණ්ඩලය

01. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
(ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය පේරාදෙණියේ කථිකාචාර්ය)

02. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
(කැලණිය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය)

03. පූජ්‍ය මැදඋයන් ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
ශාස්ත්‍රපති.

04. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ ශාස්ත්‍රපති

05. පණ්ඩිත දයාගුණසේකර මහතා (රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව)

06. හේමචන්ද්‍ර දිසානායක මහතා ශාස්ත්‍රවේදී.

07. පණ්ඩිත ඒ. ලසිත් නලන්ත මහතා (රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව)

08. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා ශාස්ත්‍රවේදී

සංඥාපනය

"අනනානං ධාරෙනත චතුසු අපායෙසු වජ්ඣතෙසුව අපත මානෙ කත්වා ධාරෙතීති ධම්මො" සෝවාන් ආදී සතරමග සතරඵල, තෙමේ, සතර අපායෙහි හා සසරෙහි උපැත්මට හේතුවන කෙළෙසුන් මුදා සත්ත්වයා සසරින් මුදාලන්නේය යන අර්ථයෙන් "ධම්ම" නම් වේ. සුදේශිත ත්‍රිපිටක බුද්ධ වචනය ධාරණාර්ථයෙන් "ධම්ම" නම් වේ. පද යන්නෙන් වචන - පද එකතුව ගැනේ. මේ අනුව සකස් වූ ඇති ධම්මපදපාලිය ධම්මපදට්ඨකථාව අර්ථෝත්පත්ති දේශනා ගණයට එකතු වේ.

ත්‍රිපිටක බුද්ධ වචනය නවාංග ශාස්තෘෘ ශාසනය වශයෙන් බෙදා දැක්වීමේ දී "ගාථා" නමින් එක් අංගයක් වෙයි. සුත්‍ර පිටකයේ සමහර තැන්වල "ධර්ම පද" නාමය පැහැදිලිව සඳහන්ව ඇත. මෙහි මේ ධම්මපද නාමයෙන් අදහස් කරන්නට ඇත්තේ, අද අප හමුවේ පවත්නා "ධම්මපද පාලි" නම් පොත නොව. ශාන්ති නායකයාණන් වහන්සේ විසින් යම් යම් අවස්ථාවලදී දේශනා කරන ලද පාලි ගාථාය. ත්‍රිපිටකයේ එක් එක් සුත්‍රවල තැනින් තැන සඳහන් ඒ ගාථා එක තැනකට රැස්කොට ක්‍රමානුකූලව වර්ග බෙදා පසුකාලයකදී විකසිත කරන ලද සකස් කරන ලද ග්‍රන්ථය "ධම්මපද" නම් විය. සුත්‍ර පිටකයේ එන ඇතැම් ධර්ම කොටස් ගාථාවට නංවා ඒ ඒ සුත්‍රවලට ඇතුලත් කර අයුරු ත්‍රිපිටක පරිශීලනයේ දී අපට දැකිය හැකිය. අංගුත්තර නිකාය. සංයුත්ත නිකාය කියවන විට මෙය මැනවින් පැහැදිලි වේ. මේ අනුව ත්‍රිපිටකයේ එන සුභද ඉගැන්වීම් ගාථාවට නගා ධම්මපදයට ඇතුළත් කරන්නට ඇත. එකල සඬ්ඝ සමාජයට විවිධ පළාත්වලින්, විවිධ කුලවලින් පැමිණ පැවිදි වූ අය වූහ. ඒ ඒ භික්ෂූන්ට තම තමන්ගේ භාෂාවලින් රචිත හා කුල ප්‍රවෙණිවලින් එන සුභාෂිත පද මතක තිබි, සමාජ සුභ සිද්ධියට ඉවහල් වන ඒවා ද ගාථා වශයෙන් ඇතුළත් වන්නට ඇත. ගිහි ජීවිතයේ විවිධ කම්කටොළුවලින් දුක් පීඩා විඳි අය පැවිදිවීමෙන් පසුව සැනසිල්ල ලබා, අධ්‍යාත්මික සුවය පිළිබඳව ප්‍රකාශ කරන ලද ගාථා ද ඇත. ජෙනයන්ට, බමුණන්ට කෙළින්ම පිළිතුරු දුන් හා ඔවුන් උපහාසයට ලක්කල ගාථා ධම්මපදයේ තිබේ. මේ අන්දමට විකසිත වූ ගාථාවලින් යුත් ධම්මපදයෙන් සැබෑ වූ නාත්වික වූ ජීවිත විවරණයක් එළි දක්වයි.

ධම්මපදය සංග්‍රහ කිරීමේදී විශේෂයෙන් යොමු වී ඇත්තේ ගිහි සමාජය පිළිබඳවයි. එහෙත් ඒ සිංහල බෞද්ධ ගිහි සමාජය නම් නොවේ. ජාති ආගම් කුල පළාත්, රට, සුදු කළු, පන්ති, ආදී කිසිදු භේදයකින් තොර සමස්ත ලෝක ගිහි සමාජයයි. මේ අනුව ධම්මපදයේ මුඛ්‍ය උද්දේසය මුළු ලෝකයටම සාධාරණ විශ්වානු කම්පිත අදහස් ප්‍රචාරය කිරීමයි. ආගම් හෙළා දැකීමක් හෝ අනවශ්‍ය පරිදි තම ආගම නුවා දැක්වීමක් හෝ එහි නැත. ඉන්ද්‍රිය දමනය, ආත්ම සංයමය, පරෝපකාරය. කරුණාව, වැනි අලෞකික දහම් ධම්මපදයේ ආදර්ශයයි. මේ අනුව විමසන විට ධම්මපදය සමාජවාදය පිළිබඳ ප්‍රතිනිධි ග්‍රන්ථයකි.

එවැනි සම්භාවනීය ධම්මපද පාලියේ එන සෑම ගාථාවකම නිධානය, එම ගාථාව දේශනා කිරීමට ප්‍රස්තුත වූ කාරණය ගාථාවේ පද වර්ණනාත්මකව විස්තර කිරීම . ඒ ගාථාව හා අදාළ ධර්මය දේශනා කිරීමෙන් ලද ප්‍රතිඵලය ආදී මේ සියල්ලක්ම විස්තර කරමින් ලියන ලද ග්‍රන්ථය ධම්මපදට්ඨ කථාව නම් වේ.

මේ ධම්මපදට්ඨ කථාව ඇසුරෙන් විශාල ග්‍රන්ථ සංඛ්‍යාවක් පරිවාර ග්‍රන්ථ වශයෙන් සිංහල සාහිත්‍යය පෝෂණය කරමින් එදත් බිහි වී ඇත. අදත් බිහිවෙමින් පවතී. මේවා අතුරෙන් සද්ධර්ම රත්නාවලිය, (ධර්මසේන හිමි) සලමෙවන් අබා කසුප් මහරජුගේ දම්පියා අටුවා ගැටපදය, අර්ත කථාව අනුගමනය කරමින් ලියන ලද ධර්මපද පුරාණ සන්නය සද්ධර්ම කෞමුදී නම් ධම්මපද සන්නය ආදිය සම්භාවනීයය.

ධම්මපදය ඒ ඒ ගාථාවලින් දැක්වෙන දර්ශනය අනුව වර්ග 26 කට බෙදා ඇත.

1. යමක වර්ගයෙන්, හොඳ නරක සංකල්පය ප්‍රස්තුත කර ගනිමින් සනාතනදහමක් ඉදිරිපත් කෙරේ. මෙහි එන උපදේශයන් යුගල වශයෙන් දැක්වේ.
2. අප්‍රමාද වර්ගයෙන්, අප්‍රමාදයට ප්‍රශංසා හා ප්‍රමාදයට නින්දා කර ඇත.
3. චිත්ත වර්ගයෙන්, සිතේ දමනය සංවරය ගැන විස්තර වේ.
4. ප්‍රප්ඵ වර්ගයෙන්, මල අරමුණ් සේ තබාගෙන නෛතික උපදෙස් ඉදිරිපත් කෙරේ.

5. බාලවර්ගයේ, මෝඩයන්ගේ ලක්ෂණ දක්වමින්. මෝඩයාට සසර දිග බව දක්වයි. මෙහි සංසාරික උන්නතිය හා පරමාර්ථ මාර්ගයේ වෙනස දක්වමින් ලාභය අනිකකි, නිවන්මග අනිකකි යන්න දක්වා ඇත.
6. පණ්ඩිත වර්ගයේ, වාස්තවික පණ්ඩිතයන්ගේ ලක්ෂණ දක්වා ඇත.
7. අරහන්ත වර්ගයේ, ඉතාමත් සුන්දර වූ කාව්‍ය භාෂාවෙන් රහතුන් ගේ ලක්ෂණ දක්වයි.
8. සහස්ස වර්ගයේ, මූල භාවනාව වන්නේ අනර්ථ පදයෙන් දහසක් දේ අසනවාට වඩා යමක් අසා බුපසමයක්, නිවීමක් වෙයි නම් ඒ එක ගාථා පදය උතුම්බවයි.
9. පාප වර්ගය, පින් කිරීමෙහි යුහුසුළු විය යුතු බව.
10. දණ්ඩ වර්ගය, හැම දෙනෙකුම අඩුවමට බිය බව. අනුන් ද තමා මෙන් සලකා අනුන් නොපෙළිය යුතු බව උගන්වයි.
11. ජරා වර්ගය, වෘද්ධ අවස්ථාවේ ඇතිවන දුක්වල දර්ශනය දක්වා. තරුණ වියේ දී ධනය ඉපදවිය යුතු බව.
12. අත්ත වර්ගය, අනුන්ට අවවාද දෙන්නට පෙර තමන් යහපත් විය යුතු බව දක්වයි.
13. ලෝක වර්ගය, ලෝකය පිළිබඳ උපදෙස් ඇතුළත් වේ.
14. බුද්ධ වර්ගය, බුදුවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය දක්වයි.
15. සුඛ වර්ගය, වෛර නො කරන අය සුවසේ ජීවත්වන බව, හා බඩගින්න ප්‍රධානම රෝගය බව ද දක්වයි.
16. ප්‍රිය වර්ගය, යමක් ප්‍රිය වී නම් ඒ ප්‍රමාණයටම දුක් සහිත වන බව දක්වයි.
17. ක්‍රෝධ වර්ගය. ක්‍රෝධ නො කිරීමෙන් ම ක්‍රෝධය ජයගතහැකි බව දක්වයි.
18. මල වර්ගය, අවිද්‍යාව සියල්ලටම වඩා කිලුට බව දක්වයි.
19. ධර්මස්ථ වර්ගය, ධර්මිෂ්ඨ ජීවිතයක ස්වරූපය දක්වයි.
20. මග්ග වර්ගය, නිර්වාණ ගාමී ප්‍රතිපදාව දක්වා නිවණම උතුම් බව දැක්වෙයි.
21. ප්‍රකීර්ණක වර්ගය, අනුන්ට දුක් දීමෙන් තමන්ට සුවයක් නොලැබෙන බව හා පැවිද්ද දුෂ්කර බව,
22. නිරය වර්ගය, වරදවා ගන්නා ලද කුසනණ පත් තමාගේ අතම කපන්නාසේ දුසිල් මහණුන්ද නිරයටම යන බව දක්වයි.
23. නාග වර්ගය, යුදට වන් ඇතෙකු සේ ඉවසිය යුතු බව අනුවණයාගේ

සහායෙන් තොර හුදෙකලා වාසය සුදුසු බව දක්වයි.

24. තණ්හා වර්ගය, තෘෂ්ණාවේ ආදීනව, අපේක්ෂාවන් දුරුකළයුතු බව උගන්වයි.
25. භික්ෂු වර්ගය, සංවර වීම, මෛත්‍රී වැඩීම ආදී වශයෙන් භික්ෂූන්ගේ දිවි පෙවෙතට අදාළ කරුණු දක්වයි.
26. බ්‍රාහ්මණ වර්ගය, නියම බමුණා කවරෙක් ද, ජාතියෙන් ගෝත්‍රයෙන් බමුණකු නොවන බව ද දක්වේ.

මේ විස්තර අනුව ධම්මපදයේ වර්ග බෙදීමේ යම්කිසි ක්‍රමානුකූල බවක් දක්නට ලැබෙන අතර දහම් කරුණු ඉදිරිපත් කිරීමේදී, විෂය කරුණු අනුව වර්ගයක් වෙන්කර ඇති අතර මූලික තේමාව අනුව වර්ගයන්ට නම් යොදා තිබේ.

බුදුන් වහන්සේ හා සම කාලයෙහි ශාස්තෘවරුන් හය දෙනෙක් ඉන්දියාවේ විසූ බවත්, ඒ හට ශාස්තෘවරුන්ගේෂට දර්ශන පිළිබඳ විස්තර විවේචනත් බ්‍රහ්මජාල සූත්‍ර වැනි සූත්‍රවල දැක්වේ. එහෙත් ධම්මපදය බලන විට පැහැදිලි වන්නේ නිසණ්ඨනාථ පුත්තගේ ජෛන ශාසනය පිළිබඳව - (දණ්ඩවග්ග) මක්ඛලී ගෝසාල නිසා ප්‍රකට වූ ආජීවක ශාසනය පිළිබඳව (බාලවග්ග) ධම්මපදයේ සඳහන් ව ඇති බවයි. ..... සාංඛ්‍ය, දර්ශනය ගැන කිසිත් නැති තරම්ය. ධම්මපදයේ වර්ග අතුරෙන් දිගම වර්ගය "බ්‍රාහ්මණ" වර්ගයයි. බ්‍රාහ්මණ වර්ගයෙන් බ්‍රාහ්මණ යන්නට පවත්නා ප්‍රකට අර්ථය නොව, වෙනත් අර්ථයක් ධම්මපදය මගින් ලැබේ. බ්‍රාහ්මණයෝ ඉන්දියාවේත්, ලංකාවේ ත්, මහත් කරදරකාරී පිරිසක් වශයෙන් සිටියහ. ඒ බමුණන් දේශනා කළ බමුණු මත තවමත් ලංකා සමාජයේ ද, ව්‍යවහාරික බුදු දහමේ ද පවතී. ධම්මපදය තුළින් නියම භික්ෂූන් වහන්සේ ලෝකයාට හඳුන්වා දෙයි. "අඤ්ඤාභිලාභූපනිසා අඤ්ඤා නිබ්බාණ ගාමිනී" යන්න ධම්මපදයේ සඳහන් අටුවාව හා පෙළ මැනවින් සන්සන්දනය කරමින් කරන ධර්ම දේශනාව භික්ෂුවගේ සුදුසුකම් මනින උසස් ලක්ෂණයක් හැටියට භික්ඛු වර්ගයේ සඳහන් කර ඇත.

මානව සමාජයේ මිනිසුන් තුළ පවත්නා කාමය ගුණමකු කම, කුහක කම, ඊර්ෂ්‍යාව, ආදී දුර්ගුණයන්ට අහිංසක ලෙස පහර දෙමින් ඉදිරිපත් කරන

වස්තූන් නූතන කෙටිකථා වස්තූන්ට වඩා රසවත්ය. ඒ අතින් ධම්මපදට්ඨ කථාව උදාරතර සාහිත්‍ය කෘතියකි. බුදුරදුන් සමාජය දෙස බැලූ සාමාජික දෘෂ්ටිය කෙබඳු වන්නේදැයි මෙම කථාවලින් මැනවින් පිළිබිඹු වේ. භාරතීය සමාජයේ බමුණු ආධිපත්‍යය තුළින් හෙම්බත්ව සිටි ජනතාවට ඒ සීමා පවුරු බිඳ දමමින් ජීවිතය නගා සිටුවීමට ගත් ප්‍රයත්නය ද මේ කථා තුළින් දියවැළක් මෙන් ගලා යයි. බුදුන් දවස සමාජ පන්ති අරගලයන් නිසා අසරණ තත්ත්වයට පත්වූවන්ට කාමයෙන් රාගයෙන්, ද්වේෂයෙන් මෝහයෙන් ඊර්ෂ්‍යාවෙන්, මුසපත් වූ රජුන්, ඇමතියන්, වනිසකරුවන්, බමුණන්, වැනි පුද්ගලයන්ට නිසි මග දක්වා තිබීම මෙහි වැදගත්ය.

සමස්ත ලෝක බෞද්ධයන්ගේ අත් පොතක් වන ධම්මපදය ලෝකයේ සෙසු භාෂාවන්ට පරිවර්තනය වූ ආකාරය පිළිබඳව අවධානය යොමු කිරීම සුදුසුය.

ක්‍රි.ව. 2 වන ශතකයේ දී ක්‍රිස්තියානි සාහිත්‍යයේ ශාන්ත ලූක්ගේ ශුභාරංචි පොතේ ධම්මපදයේ එන ගාථා කිපයක ඡායානුවාද තිබේ. ක්‍රිස්තු දර්ශනයක් වූ බැසලයිඩිස් දර්ශනයේ ජීවිතයක ප්‍රධාන ලක්ෂණය දුක බවත්, පෞද්ගලිකත්වය හා පුනරුත්පත්තිය. පංච ස්කන්ධය තුළ පවත්නා බවත් සඳහන් කරයි.

ධම්මපදය පිළිබඳව කතෝලික පූජකවරයකු විසින් ලියන ලද ශාස්ත්‍රීය ලිපියක් 1840 දී "දප්‍රෙන්ඩ්" සඟරාවේ පළ වී ඇත. ඒ පූජකවරයා පෝන් ශොගර්ලි නම් විය.

1855 දී ධම්මපදය ලතින් භාෂාවට පරිවර්තනය කර ඇත. එය කරනලද්දේ ජීතායෙල් ජීගෝ පවුස් බෝල් නම් ඩෙනිස් ජාතිකයකු විසිනි. මේ සිදුවීම නිසා ධම්මපදය පිළිබඳව ජර්මනියේ උනන්දුවක් ඇතිවිය. ඇල්බට් වේබර් මහාචාර්ය තුමා 1860 දී ධම්මපදයේ අනුවාදයක් ජර්මන් බසින් ලියා ඇත. 1871 දී රොබට් සීසර් වයිල්ඩිස් නම් පඬිවරයා ධම්මපදය පිළිබඳව ශාස්ත්‍රීය සංග්‍රහයක් කර ඇත. 1871, 1872 කලයේ දී ධම්මපදය ඇමෙරිකාවේ දී ප්‍රකාශයට පත්විය. 1872 දී මැක්ස් මුලර් පඬිවරයා අතින් ධම්මපදයේ වටිනා අනුවාදයක් ඉංග්‍රිසියෙන් පළවිය. 1878 දී සැමුවෙල් බිල් නමැති

ක්‍රිස්තියානි පූජකතුමා අතින් චීන ධම්මපදය ආශ්‍රයෙන් ඉංග්‍රිසි බසින් අනුවාදයක් ලියවිණි මේ අනුව ජර්මනිය. ඇමෙරිකාව, එංගලන්තය ආදී රටවල ධම්මපදය ප්‍රචාරය වීමෙන් පසුව 1878 ධම්මපදය පිළිබඳ වැදගත් අධ්‍යයනක් ප්‍රංශබසින් සිදුවිය. පෙර්නොන්ද නියූ ශූරින් විසින් හැඳින්වීමක් හා විස්තර සහිත ධම්මපදයක් ප්‍රංශභාෂාවෙන් 1878 දී නිකුත් විය. ප්‍රංශය හැරුණු විට බෙල්ජියම. ස්විට්සර්ලන්තය කැනඩාව ආදී රටවල මෙය ප්‍රචාරය විය. 1881 දී ධම්මපදය ඉංග්‍රිසි භාෂාවට නැවත පරිවර්තනය විය. මේ අනුවාදය ජේමිස් ග්‍රේ නමැති භාරතීය විද්‍යාඥයා විසින් පරිවර්තනය කර ඇත. 1898 දී, එන්. අයි. හෙරසමොස් ශූරින් විසින් ධම්මපදය රුසියන් බසට පරිවර්තනය කරන ලදී. 1902 දී ඇමෙරිකානු විද්වතුකු වූ ඒ ජේ.එම්. මන්මිජ් විසින් ධම්ම පද අනුවාදයක් ඉංග්‍රිසි බසින් පලකරන ලදී. ඉතාලි ජාතික භාරතීය විද්‍යාඥයින් ධම්මපදය පිළිබඳව අවධාරණය යොමු කරන ලදුව ධම්මපද අනුවාදයත් නැවත ඉතාලි බසින් 1908 දී නිකුත් වී ඇත. වී.ඊ පවුලෝනි නමැති ඉතාලි ජාතික පඬිවරයා ධම්මපදය ඉංග්‍රිසි කවියෙන් ඉදිරිපත් කර තිබේ. බෞද්ධ ගීතිකා නමින් එය ප්‍රචාරය විය. 1920 දී හාන්ස් මූෂ් නමැති වියතා පස්වන වතාවටත් ධම්මපදය ජර්මන් බසට පරිවර්තනය කර ඇත. මේ වනවිට ධම්මපදය හින්දි, බෙංගාලි මරාටි, දෙමළ ආදී භාෂාවන්ට පරිවර්තනය කර තිබේ. චීන ධම්මපදය අපේ පාළි ධම්මපදයට වඩා වර්ග කීපයක වැඩියෙන් ඇත. එහි වර්ග 39 ක් වෙති. ගාථා 752 කි. වර්ගවල නම් බොහෝසෙයින් පාලි ධම්මපදය හා සමානය. මේ අතර ප්‍රාකෘත ධම්මපදය ක් ද තිබී ඇත.

මේ අන්දමට ලෝකයේ විවිධ භාෂාවන්ට ධම්මපද යේ අනුවාද ඇති වී හැම ජාතියකගේම වර්ගයකගේම, ගෞරවාදරයට පාත්‍ර වී ඇත්තේ ධම්මපද යේ පවත්නා සබ්බසත්ත හිතවාදය නිසා ම බව පැහැදිලිය.

ධම්මපදය ළයාන්විතව ගායනා කළ හැකි ගාථා සමූහයකින් සංයුක්ත වේ. තථාගතයන් ධරමාණ කාලයේ දීත් තෙරවරුන් ගාථා කටපාඩම් කර සජ්ඣායනා කළ අයුරු සුත්‍ර පිටකයෙන් පැහැදිලි වෙයි. සංයුත්ත නිකායේ පියඞ්කර සුත්‍රයේ මෙයට කදිම උදාහරණයක් එයි. සැවැත්නුවර

ජේතවනාරාමයේ එක් උදැසනක අනුරුද්ධ හිමියන් ධර්මපද ගාථා සජ්ඣායනා කරද්දී, යකින්නක් ඒ ගාථා ගායනය අසා සිටී බවත්, යකින්නගේ දරුවා හඬන විට යකින්න විසින් එය නැවැත්වූ බවත්, දහම් පදයක් දුන එය පිළි පදිමු නම් එය තමන්ට හිත පිණිස පවතින බව ඇය කියූ බවත් ඒ විස්තරයේ සඳහන් වේ. සුත්ත නිපාතයේ අට්ඨක වර්ගයේ සඳහන් වන්නේ තථාගතයන්ගේ ශිෂ්‍යයකු විසින් උන්වහන්සේ ඉදිරිපිටදීම ගාථා සජ්ඣායනය කළ බවයි. සංයුත්ත නිකායේ සජ්ඣාය සූත්‍රයේ ද එක්තරා භික්ෂුවක් ධර්මපද ගාථා කටහඬම් කරමින් සිටී බව දැක්වේ. අංගුත්තර නිකායෙන් හෙළි වන්නේ සජ්ජින නැතහොත් සජ්ජිතිකා ගංතෙර පිහිටි පරිබ්‍රාජිකාරාමයක දී පරිබ්‍රාජිකාවන් පිරිසකට තථාගතයන් ධර්මපද ගාථා දේශනා කළ බවයි. මේ තත්ත්වය අද ද පවතී. ධම්මපදය වනපොත් කිරීම ශ්‍රී ලංකාව, කාම්බෝජ, සියම, බුරුමය ආදී රටවල අද ද පවතී. කුල දරුවකු පැවිදි කිරීමේදී ඔහුට ධම්මපදය පාඩම් කරවීම සිරිතකි පොළොන්නරු දඹදෙණි කතිකාවත්වල මෙය කතිකාවකි. නීතියකි.

මෙසේ ගායනා කරමින් උගත් ධර්මපද ගාථාවලට ක්‍රි.ව. 5 වැනි සියවසේ දී මහානාම රජු දවස බුද්ධඝෝෂ තෙරණුවෝ පාලි ධම්මපදට්ඨ කථා නම් අටුවා ග්‍රන්ථ කළහ. මේ බුද්ධඝෝෂ සාමීන් කළ ධම්මපදට්ඨ කථාවේ කථා 299 කි. ඒ කථාවල අංග අටක් දක්නට ඇත. ගාථා නිද්දේස පුග්ගල නිද්දෙස, පඤ්චුප්පන්න වත්ථු ගාථා අටුවාව, සංඛේපය අනීත වත්ථු හා සමෝධානය ඒ අටයි. මහාකාව්‍ය ලක්ෂණ අනුව ධම්මපදට්ඨ කථාව චම්පූ කාව්‍යයකි. ආඛ්‍යායිකා ගද්‍යමය කෘතියක් ලෙසද දක්වේ.

නොයෙක් ශත වර්ෂවල විසූ පැරණි කවීන් කියනලද ගයන ලද සම්පාදනය කරන ලද කාව්‍ය බටහිර විචාරකයන් හඳුන්වන්නේ විකසිත මහා කාව්‍ය කමිනි. අපේ ධම්මපදය ද ඒ අනුව විකසිත මහා කාව්‍යයකි.

පාලි ධම්මපදට්ඨ කථාව පාලියෙන් ලිවීමෙන් පසුව සිංහලට පරිවර්තනය වන්නේ පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේය. අටුවාව සිංහලෙන් කියවන්නට ලැබෙන ප්‍රථම අවස්ථාව මෙය වේ. ඒ අනුව පාලි ධම්මපදට්ඨ කථාවේ සිංහල පරිවර්තනය පරිශීලනය කරමින්

මෙලොව යහපත් සාධු සමාජයක් බිහි කිරීමටද, පරලොව සුගතිගාමී වීමටද අවස්ථාව උදා වනු ඇත.

ලක්ෂපතියේ සමාධි මෙහෙණිය
බී.ඒ. ගෞරව - ජේරාදෙනිය.

පටුන

10 වැනි දණ්ඩ වර්ගය

10.1	සවග මහණුන්ගේ	කථා පුවත	01
10.2	සවග මහණුන් පිළිබඳ දෙවන	කථා පුවත	03
10.3	බොහෝ කුමාරවරුන්ගේ	කථා පුවත	04
10.4	කුණ්ඩධාන තෙරුන්ගේ	කථා පුවත	06
10.5	විසාඛා ආදී උපාසිකාවන්ගේ	කථා පුවත	11
10.6	අජගර ප්‍රේතයාගේ	කථා පුවත	13
10.7	මහමුගලන් තෙරුන්ගේ	කථා පුවත	17
10.8	බහුභාණ්ඩික තෙරුන්ගේ	කථා පුවත	22
10.9	සන්තති මහ ඇමති ගේ	කථා පුවත	27
10.10	පිලෝතික තෙරුන්ගේ	කථා පුවත	31
10.11	සුබ සාමණේර	කථා පුවත	34

11 වැනි ජරා වර්ගය

11.1	විශාකාවගේ සහායිකාවන්ගේ	කථා පුවත	43
11.2	සිරිමාවගේ	කථා පුවත	46
11.3	උත්තරී තෙරණියගේ	කථා පුවත	50
11.4	අධිමානක භික්ෂුන්ගේ	කථා පුවත	52
11.5	ජනපදකල්‍යාණී, රූපනන්දා -තෙරණියගේ	කථා පුවත	54
11.6	මල්ලිකා දේවියගේ	කථා පුවත	59
11.7	ලාළුදායි තෙරුන්ගේ	කථා පුවත	62

11.8	ආනන්ද තෙරුන්ගේ උදානගාථා ඇතුළත්	කථා පුවත	65
11.9	මහාධන සිටු පුත්‍රයාගේ	කථා පුවත	67

12. වැනි අත්ත වර්ගය

12.1	බෝධිරාජ කුමාරයාගේ	කථාපුවත	71
12.2	උපනන්ද ශාක්‍ය පුත්‍රයාගේ	කථා පුවත	75
12.3	පධානික තිස්ස තෙරුණ්ගේ	කථා පුවත	78
12.4	කුමාර කස්සප මාතාවගේ	කථා පුවත	80
12.5	මහා කාල උපාසකතුමාගේ	කථා පුවත	84
12.6	දේවදත්තගේ	කථා පුවත	86
12.7	සංඝයා භේදයට උත්සහ -දරීම පිළිබඳ	කථා පුවත	88
12.8	කාල තෙරුන්ගේ	කථා පුවත	90
12.9	චුලකාල උපාසකතුමාගේ	කථා පුවත	92
12.10	අත්තදන්ථ තෙරුන්ගේ	කථා පුවත	94

13 වැනි ලෝකවර්ගය

13.1	එක්තරා ළමා භික්ෂුවක්ගේ	කථා වස්තුව	96
13.2	සුද්ධෝදන රජතුමාගේ	කථා වස්තුව	99
13.3	පන්සියයක් විපස්සක භික්ෂූන්ගේ	කථා වස්තුව	102
13.4	අභයරාජ කුමාරයාගේ	කථා වස්තුව	103
13.5	සම්මුඤ්ජනී තෙරුන්ගේ	කථා වස්තුව	105
13.6	අංගුලිමාල තෙරුන්ගේ	කථා වස්තුව	107
13.7	සන්නාලි දියණිය පිළිබඳ	කථා වස්තුව	109

13.8	භික්ෂූන් නිහකගේ	කථා වස්තුව	113
13.9	විඤ්ඤ්විමානවිකාවගේ	කථා වස්තුව	115
13.10	අසදෘශ මහා දානයේ	කථා වස්තුව	120
13.11	කාලනම් අනේපිඬු සිටුතුමාගේ -පුත්‍රයාගේ	කථා වස්තුව	125

14. වැනි බුද්ධ වර්ගය

14.1	මාරදූවරුන්ගේ	කථා පුවත	128
14.2	යමක ප්‍රාතිහාර්යයේ	කථා පුවත	133
14.3	ඒරක පත්ත නා රාජුගේ	කථා පුවත	152
14.4	ආනන්ද තෙරුන්ගේ	කථා පුවත	157
14.5	අනහිරත භික්ෂූන්ගේ	කථා පුවත	160
14.6	අග්ගිදත්ත බ්‍රාහ්මණයාගේ	කථා පුවත	163
14.7	ආනන්ද තෙරුන් -අසන ලද ප්‍රශ්න පිළිබඳ	කථා පුවත	168
14.8	බොහෝ භික්ෂූන්ගේ	කථා පුවත	169
14.9	කස්සප බුදු රදුන්ගේ රත්තරං -චෛත්‍ය පිළිබඳ	කථා පුවත	171

15 වැනි සුබ වර්ගය

15.1	ඤාතීන්ගේ කලහය සංසිඳුවන	කථා පුවත	174
15.2	මාරයාගේ	කථා පුවත	177
15.3	කොසොල් රජුගේ පරාජයේ	කථා පුවත	179
15.4	ඒක්තරා කුල දූරියකගේ	කථා පුවත	181
15.5	එක්තරා උපාසකයකුගේ	කථා පුවත	183

15.6	පසේ නදී කොසොල් රජුගේ	කථා පුවත	185
15.7	එක්තරා භික්ෂුවකගේ	කථා පුවත	188
15.8	සක්‍රදේවරාජයාගේ	කථා පුවත	190

16 වැනි පිය වර්ගය

16.1	භික්ෂූන් තිදෙනකුගේ	කථා පුවත	193
16.2	එක්තරා කෙළඹියකුගේ	කථා පුවත	196
16.3	විසාකාවගේ	කථා පුවත	198
16.4	ලිච්ඡවීන්ගේ	කථා පුවත	200
16.5	අනිත්ථිගන්ධ කුමාරයාගේ	කථා පුවත	201
16.6	එක්තරා බ්‍රාහ්මණයකුගේ	කථා පුවත	204
16.7	පන්සියයක් දරුවන්ගේ	කථා පුවත	206
16.8	අනාගාමී තෙරුන්ගේ	කථා පුවත	208
16.9	නන්දියගේ	කථා පුවත	210

17. වැනි ක්‍රෝධ වර්ගය

17.1	රෝහිණීයගේ	කථා පුවත	213
17.2	එක්තරා භික්ෂුවකගේ	කථා පුවත	216
17.3	උත්තරාවගේ	කථා පුවත	218
17.4	මහමුගලන් තෙරුන් විමසන ලද ප්‍රශ්න පිළිබඳ	කථා පුවත	225
17.5	සාකේත බ්‍රාහ්මණයාගේ	කථා පුවත	227
17.6	පුණ්ණාවගේ	කථා පුවත	230
17.7	අතුල උපාසකයාගේ	කථා පුවත	233
17.8	ජබ්බග්ගිය භික්ෂූන්ගේ	කථා පුවත	236

18 වැනි මල වර්ගය

18.1	ගවඝාතක පුත්‍රයාගේ	කථා පුවත	238
18.2	එක්තරා බ්‍රාහ්මණයකුගේ	කථා පුවත	242
18.3	තිස්ස තෙරුන්ගේ	කථා පුවත	244
18.4	ලාළුදායී තෙරුන්ගේ	කථා පුවත	246
18.5	ඒක්තරා කුලපුත්‍රයකුගේ	කථා පුවත	249
18.6	සැරියුත් තෙරුන්ගේ අනෙතවාසිකගේ	කථා පුවත	251
18.7	පන්සියයක් උපාසකවරුන්ගේ	කථා පුවත	254
18.8	තිස්ස දරුවාගේ	කථා පුවත	256
18.9	උපාසකයන් පස්දෙනෙකුගේ	කථා පුවත	258
18.10	මෙණ්ඩක සිටුවරයාගේ	කථා පුවත	261
18.11	උජ්ඣානසඤ්ඤී නම් තෙරුන්ගේ	කථා පුවත	268
18.12	සුභද්‍ර පරිබ්‍රාජකයාගේ	කථා පුවත	269

19 වැනි ධර්මස්ථ වර්ගය

19.1	විනිච්ඡය මහ ඇමතියන්ගේ	කථා පුවත	271
19.2	ෂට්වාර්ගික භික්ෂූන්ගේ	කථා පුවත	273
19.3	එක් උදානයක් පැවසු රහත් තෙරකගේ	කථා පුවත	274
19.4	ලකුණ්ටක භද්දිය තෙරුන්ගේ	කථා පුවත	276
19.5	බොහෝ භික්ෂූන්ගේ	කථා පුවත	278
19.6	හත්ථකගේ	කථා පුවත	280
19.7	එක්තරා බ්‍රාහ්මණයකුගේ	කථා පුවත	282
19.8	තීර්තකයන්ගේ	කථා පුවත	284
19.9	බාලිසිකගේ	කථා පුවත	287
19.10	බොහෝ භික්ෂූන්ගේ	කථා පුවත	288

20 වැනි මඟඵල වර්ගය

20.1	පන්සියයක් භික්ෂූන්ගේ	කථා පුවත	290
20.2	අනිත්‍ය ලක්ෂණ පිළිබඳ	කථා පුවත	292
20.3	දුක ලක්ෂණ පිළිබඳ	කථා පුවත	293
20.4	අනාත්ම ලක්ෂණ පිළිබඳ	කථා පුවත	294
20.5	පධාන කම්මික තිස්ස තෙරුන්ගේ	කථා පුවත	295
20.6	උෆරු ප්‍රේතයාගේ	කථා පුවත	298
20.7	පොඨිල තෙරුන්ගේ	කථා පුවත	302
20.8	මහළු තෙරුන්ගේ	කථා පුවත	305
20.9	රන්කාර තෙරුන්ගේ	කථා පුවත	307
20.10	මහාධන වෙළෙන්දාගේ	කථා පුවත	310
20.11	කිසාගෝතමීගේ	කථා පුවත	313
20.12	පටාචාරාවගේ	කථා පුවත	315

21 වැනි ප්‍රකීර්ණක වර්ගය

21.1	ගංඟා රෝහණ	කථා පුවත	317
21.2	කිකිළි බිත්තර කෑ තැනැත්තියගේ	කථා පුවත	325
21.3	හද්දිය භික්ෂූන්ගේ	කථා පුවත	327
21.4	ලකුණ්ටක හද්දිය භික්ෂුවකගේ	කථා පුවත	329
21.5	දරකරත්තකරුගේ පුත්‍රයාගේ	කථා පුවත	331
21.6	වජ්ජී පුත්තක භික්ෂුවගේ	කථා පුවත	334
21.7	විත්ත ගෘහපතියාගේ	කථා පුවත	337
21.8	චූල සුභද්‍රාවගේ	කථා පුවත	339
21.9	එක් විහාරික භික්ෂුවගේ	කථා පුවත	343

22 වැනි නිරය වර්ගය

22.1	සුන්දරී පරිබ්‍රාජිකාවගේ	කථා පුවත	345
22.2	දුශ්චරිත විපාක විඳින්නන්ගේ	කථා පුවත	348
22.3	වග්ගුමුදාතීරිය භික්ෂූන්ගේ	කථා පුවත	350
22.4	ඛේමාවගේ	කථා පුවත	351
22.5	අකිකරු භික්ෂුවගේ	කථා පුවත	353
22.6	රේෂ්‍යාව ප්‍රකෘතිය -කොටගත් ස්ත්‍රියගේ	කථා පුවත	355
22.7	බොහෝ ආගන්තුක භික්ෂූන්ගේ	කථා පුවත	357
22.8	නිගණ්ඨයන්ගේ	කථා පුවත	359
22.9	තිර්ථ ශ්‍රාවකයන්ගේ	කථා පුවත	361

23 වැනි නාගවර්ගය

23.1	තමන් අරභයා කරන ලද	කථා පුවත	363
23.2	ඇතුන් හුරුපුරුදු (හීලෑ) -කළ භික්ෂුවගේ	කථා පුවත	366
23.3	එක්තරා බමුණෙකුගේ පුතුන්ගේ	කථා පුවත	368
23.4	පසේ නදී කොසොල් රජුගේ	කථා පුවත	373
23.5	සාණු සාමණේරයන්ගේ	කථා පුවත	375
23.6	බද්ධෙරක ඇතාගේ	කථා පුවත	380
23.7	දිසාවැසී පන්සියයක් භික්ෂූන්ගේ	කථා පුවත	382
23.8	මාරයාගේ	කථා පුවත	386

24 වැනි තණ්හා වර්ගය

24.1	කපිල ඇමතියාගේ	කථා පුවත	389
24.2	ඊරි පැටියාගේ	කථා පුවත	394
24.3	එක් විබ්භන්තක භික්ෂුවකගේ	කථා පුවත	398
24.4	බන්ධනාගාරගේ	කථා පුවත	400
24.5	ඛේමා තෙරණියගේ	කථා පුවත	403
24.6	උග්ගසේන සිටුපුත්‍රයාගේ	කථා පුවත	405
24.7	කුඩාභික්ෂුවකගේ	කථා පුවත	410
24.8	මාරයාගේ	කථා පුවත	414
24.9	උපක ආජීවකයාගේ	කථා පුවත	416
24.10	සක්‍රයාගේ ප්‍රශ්න පිළිබඳ	කථා පුවත	418
24.11	පුත්‍රයන් නැති සිටුවරයාගේ	කථා පුවත	421
24.12	අංකුරගේ	කථා පුවත	424

25 වැනි භික්ඛුවර්ගය

25.1	භික්ෂූන් පස්දෙනෙකුගේ	කථා පුවත	426
25.2	හංසයන් මැරූ භික්ෂුවකගේ	කථා පුවත	429
25.3	කෝකාලික භික්ෂුවගේ	කථා පුවත	432
25.4	ධම්මාරාම තෙරුන්ගේ	කථා පුවත	434
25.5	විපක්ෂසේවක භික්ෂුවගේ	කථා පුවත	436
25.6	පඤ්ච අගගදායක බමුණාගේ	කථා පුවත	439
25.7	බොහෝ භික්ෂූන්ගේ	කථා පුවත	442
25.8	පන්සියයක් භික්ෂූන්ගේ	කථා පුවත	449
25.9	සන්තකාය තෙරුන්ගේ	කථා පුවත	450
25.10	නඟුල්කුල තෙරුන්ගේ	කථා පුවත	452

25.11	වක්කලි තෙරුන්ගේ	කථා පුවත	455
25.12	සුමණ සාමණේරයන්ගේ	කථා පුවත	457

26 වැනි බ්‍රාහ්මණ වර්ගය

26.1	ප්‍රසාදබොහෝ ඇති බ්‍රාහ්මණයාගේ	කථා පුවත	468
26.2	බොහෝ භික්ෂූන්ගේ	කථා පුවත	470
26.3	මාරයාගේ	කථා පුවත	471
26.4	එක්තරා බ්‍රාහ්මණයකුගේ	කතා පුවත	472
26.5	ආනන්ද තෙරුන්ගේ	කථා පුවත	473
26.6	එක්තරා බමුණු පැවිද්දකුගේ	කථා පුවත	475
26.7	සැරියුත් තෙරුන්ගේ	කථා පුවත	476
26.8	මහා ප්‍රජාපතී ගෝතමියගේ	කථා පුවත	479
26.9	සැරියුත් තෙරුන්ගේ	කථා පුවත	481
26.10	ජටිල බ්‍රාහ්මණයාගේ	කථා පුවත	483
26.11	කුහක බ්‍රාහ්මණයාගේ	කථා පුවත	484
26.12	කිසා ගෝතමියගේ	කථා පුවත	488
26.13	එක් බ්‍රාහ්මණයකුගේ	කථා පුවත	489
26.14	උග්ගසේනගේ	කථා පුවත	491
26.15	බ්‍රාහ්මණයන් දෙදෙනකුගේ	කථා පුවත	492
26.16	අක්‍රෝස භාරද්වාජගේ	කථා පුවත	494
26.17	සැරියුත් තෙරුන්ගේ	කථා පුවත	496
26.18	උප්පල වණ්ණා තෙරණියගේ	කථා පුවත	498
26.19	ඒක්තරා බ්‍රහ්මණයකුගේ	කථා පුවත	499
26.20	ඛේමා තෙරණියගේ	කථා පුවත	500
26.21	පර්වත වාසී තිස්ස තෙරුන්ගේ	කථා පුවත	501

26.22	එක්තරා භික්ෂුවකගේ	කථා පුවත	505
26.23	සාමණේරයන් සතරනමකගේ	කථා පුවත	507
26.24	මහාපණ්ථක තෙරුන්ගේ	කථා පුවත	510
26.25	පිලින්දිවච්ඡ තෙරුන්ගේ	කථා පුවත	512
26.26	එක්තරා තෙරනමකගේ	කථා පුවත	514
26.27	සැරියුත් තෙරුන්ගේ	කථා පුවත	516
26.28	මහා මුගලන් තෙරුන්ගේ	කථා පුවත	518
26.29	රේවත තෙරුන්ගේ	කථා පුවත	519
26.30	චන්දාභ තෙරුන්ගේ	කථා පුවත	520
26.31	සීවලි තෙරුන්ගේ	කථා පුවත	523
26.32	සුන්දර සමුද්ද තෙරුන්ගේ	කථා පුවත	525
26.33	ජටිල සිටුවරයාගේ	කථා පුවත	529
26.34	ජෝතිය තෙරුන්ගේ	කථා පුවත	543
26.35	නටපුත්‍රයා පිළිබඳ	කථා පුවත	545
26.36	නටපුත්‍රයා පිළිබඳ	කථා පුවත	546
26.37	වංගීස තෙරුන් පිළිබඳ	කථා පුවත	547
26.38	ධම්ම දින්නා තෙරණියගේ	කථා පුවත	550
26.39	අඞ්ගුලිමාල තෙරුන්ගේ	කථා පුවත	552
26.40	දේවංගික බ්‍රාහ්මණයාගේ	කථා පුවත.	553

10-1

"සබ්බෙ තසන්ති" යන මේ ධර්ම දේශනාව ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර දෙවිරම් වෙහෙරේ වැඩසිටිය දී, ෂඩ්වර්ගීය (හයේ කණ්ඩායම වූ) භික්ෂූන් නිමිති කරගෙන දේශනා කළසේක.

එක් අවස්ථාවකදී භික්ෂූන් දහසයේ කණ්ඩායමක් විසින් සෙනසුන් පිළියෙල කරණ අතරතුරදී - සයවර්ගීය භික්ෂූන් - අපි වඩා වැඩිහිටි අය වෙමු. එනිසා මෙය අපට අයත් වේ. යයි කියා සිටියදී, එම දහසය වර්ගීය භික්ෂූන් විසින් අපි නොදෙන්නෙමු, අප විසින් මෙය පළමු වෙන් පිළියෙල කරණ ලදැයි පැවසුවිට - එම භික්ෂූන්ට පහර දෙන ලදී.

දහසය වර්ගීය භික්ෂූහු මරණබියෙන් යුතුව මහ හඬින් විලාප නගන්නට වුහ. බුදුරජාණන් වහන්සේ ඔවුන්ගේ හඬ අසා මේ මහ ශබ්දය කුමක්දැයි විමසා - මේ හේතුවෙන් යයි දැනගත් විට මහණෙනි ! මෙතැන් සිට භික්ෂූන් විසින් නම් මෙසේ නොකළ යුතුය. යම් භික්ෂුවක් නැවත මෙසේ පහර දෙයිද ඇවැත් සිදුවේයයි "පහරදාන විනය සිඛ පදය" පනවන ලදහ. මෙම ශික්ෂාපදය පනවා මහණෙනි ! තමන් දඬුවමට බියවන්නා සේම අනෙක් අයද දඬුවමට බිය වෙතැයිද, මරණයට බිය වේයයිද, දැනගෙන භික්ෂුවක් විසින් අන් භික්ෂුවකට පහර නොදිය යුතුය. සාහනය නොකළ යුතුයයි පවසා, පෙර පසු සම්බන්ධ කර දහම් දෙසමින් මෙම ගාථාව දේශනා කළහ.

බිය වෙති හැම දෙනම මරණෙට	දඬුවමට
හොඳ නැහැ මරණ, දඬුවම් නැති	වරදකට
තම සිත තම සිරුර අරගෙන	උවමකට
සතෙකුටම මෙන පතුරනු	දියුණුවට

සියල්ලෝ දඬුවමට බියවෙති සියල්ලෝ මරණයට බියවෙති - තමාගේ බියවීම උපමා වශයෙන් ගෙන සත්ත්ව හිංසාවෙන් හා සාහනයෙන් වැළකිය යුතුය.

02

එහි **සබ්බෙ තසන්ති** - යනු සියළු සත්ත්වයෝ තමාකෙරෙහි දඬු මුගුරු පතිත වන විට ඒ දඬුවමට - දඬුවලට බියවෙති. **මච්චුනෝ මරණයට** ද බියවෙත්ම ය. මෙම දේශනයේ ව්‍යඤ්ජනාර්ථය, **සම්පුර්ණ අර්ථයනම්** අවශේෂවෙයි. යම් ලෙස රජු විසින් සියල්ලන් එක් රැස් වේවායි. අණබෙර යැවුවිට - රජ මහ ඇමති අත්හැර සෙසු අය රැස්වෙති. මෙලෙසම සියල්ලෝ බියවෙත්යයි පැවසුවිටද ආජානේය ඇත් - අස් හා කේශර සිංහයෝ ද රහතන්වහන්සේලා ද යන මේ සිව් පිරිස අත්හැර අනෙක් අය බියවෙතියි දතයුතු මොවුන් අතර රහතන් වහන්සේලා නම් සක්කාය දෘෂ්ටිය දුරුකර ඇති හෙයින් කයේ බිඳීමක් විනා මියයන කෙනෙක් නොදකින්නේ බියනොවෙති. අනෙක් තිදෙන මමය මාගේය යන දෘෂ්ටියෙන් බලවත් නිසා තමන්ට ප්‍රතිපක්ෂවු කෙනෙක් නොදකින්නේ බිය නො වෙති.

න හනෙය්‍ය න ඝාතයෙ, යම්සේ මා මෙන්ම අනෙක් **සත්ත්වියෝ** ද මරණයට බියවෙතියි අන් අය නොපෙළති අන් සතුනට අන්අය ලවා හෝ හිංසා නොකරවති. යන අරුත් දේ දේශනය අවසානයේ බොහෝ දෙන සෝවාන් ඵලය ආදියට පත්වුහ.

සවග මහණුන්ගේ පළමුවන කථා පුවතයි.

10-2

"සබ්බෙ තසන්තීති" මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩසිටියදී **ඡබ්බග්ගිය** (ෂඩ්වර්ගීය) භික්ෂූන් නිමිති කරගෙන දේශනාකළහ. එම භික්ෂූන් විසින් එක් අවස්ථාවකදී යම් කරුණක් නිසාම පළමු ලෙසම පහර දීම කළහ. එවැනි කරුණක් නිසා ම පහර දෙන අයුරු දක්වා අත් ඔසවා උළුක්කළහ. මෙහිදී ද බුදුහු ඔවුන්ගේ සෝෂාව අසා මේ කුමක්දැයි විමසා මෙම සිදුවීම ගැන දැනගත් පසු - මහණෙනි. මෙතැන් සිට භික්ෂුවකට මෙසේ නො කළ යුතුය. යමෙක් මෙලෙස භික්ෂුවකට පහරදීම කරයිද ඔහු මේ ඇවතට පත්වන්නේයයි (පහරදීමට අත එසවීමේ) **තලසත්තික ශික්ෂාපදය** පමුණුවා මහණෙනි. භික්ෂුවක් විසින් යම්ලෙස තමන් තමන් පිළිබඳව එලෙසම අන්අය ගැනද සිතා මා ලෙසටම අන්අය ද ජීවිතයට ප්‍රිය වේයයි තේරුම් ගෙන අන්අයට හිංසා නොකළ යුතුය ඝාතනය **නොකළ** යුතුයයි පවසා අනුපිළිවෙල සසඳා දහම් දෙසමින් මෙම ගාථා ධර්මය දෙසුහ.

හැම දෙන කැමතියි තම	ජීවිතයට
අකමැති වේමැයි ගුටිබැට	කෑමට
තමන්ගෙ දිවියම ගෙන	උපමාවට
හිරිහැර නොකරනු අනුන්ට	කිසිවිට

එහිදී සබ්බෙසං ජීවිතං පියන්ති යනු - රහතන් වහන්සේලා හැර අනෙක් සත්ත්වයින්ට ජීවිතය ප්‍රියවේ. මධුරවේ රහත්හුනම් ජීවිතය පිළිබඳවත් මරණය පිළිබඳවත් උපේක්ෂා සහගත වෙති. සෙසු අය පළමු දුක්වූ පරිදිමය දෙසුම අවසාන බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පත්වුහ.

සඟ මහණුන් පිළිබඳ දෙවැනි කථා පුවතයි.

10-3

"සුඛකාමානි භූතානි" - යන මේ දම් දෙසුම ශාස්තෘන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ සිටියදී දරුවන් පිරිසක් නිමිති කරගෙන දෙසුහ. එක් දිනක් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර පිඬු පිණිස පිවිසියේ අතරමග දී දරුවන් බොහෝ දෙනෙක් ගැරඩියෙකුට දණ්ඩකින් පහර දෙනු දැක. දරුවනි ! කුමක් කරන්නේදැයි විමසූහ. අපි දණ්ඩෙන් සර්පයකු මරන්නෙමුයි පැවසූහ. කුමක් හෙයින් මරන්නේදැයි විමසා දෂ්ටකරයි යන බියෙන් මරන්නෙමුයි පැවසුවිට.

නුඹලා තමන්ට සැපයක් කරගන්නේයයි සිතමින් මේ සතා මැරීමෙන් ඉපදෙන හැමතැනකදීම සුවය නො ලබන්නෝය. තම සුවය සිතන්නවුන් විසින් අන් අය නැසීම සුදුසු නො වේයි පවසා පිළිවෙළ කථාව සසඳා දහම් දෙසමින් මේ ගාථාව පැවසූහ.

සුව කැමති	සත්නට
එපා දුක් ගෙන	දෙන්නට
දුක් දෙන	දනන් හට
නිරය දුක් සිදුවේ	ගෙවන්නට
අවිමුගුරු	අරගෙන
මිනිසුන් සතුන්	නොමරන
මෙන්සිතින්	වැඟඹෙන
දනෝවෙති දෙව්සුවය	වළඳන

"සැප කැමැතිව යමෙක් (දණ්ඩකින්) දඬුවම් කිරීමෙන් අන් සතුන් පෙලන්නේද එබඳු අය සැප කැමතිවුවද පරලොවදී සැප නොලබති සැප කැමැත්තේ දඬුවම් දීමෙන් අන් සතුන් නොපෙළත් ද? ඔවුහු පරලොව දී සැප ලබති.

එහි යො දණ්ඩෙන - යනු යම් පුද්ගලයෙක් දණ්ඩකින් හෝ ගල් කැට කැබලි ආදියෙන් හෝ පෙළන්නේද?

පෙච්ච සො නලභතෙ සුඛං- යනු ඒ පුද්ගලයා පරලොවදී මිනිස් සුවයක් හෝ දිව්‍ය සුවයක් හෝ පරමාර්ථ වශයෙන් නිවන් සුවයක් හෝ නො ලබයි. **පෙච්ච සො** ලභතෙ - යනු යම් පුද්ගලයෙක් පරලොවදී කියන ලද ලෙසට තුන් ආකාරවු සුවයක් ලබයි යන අර්ථ දෙයි. දේශනය අවසානයේදී පන්සියයක් වූ ඒ දරුවෝ සෝවාන් ඵලයෙහි පිහිටියහ.

බොහෝ කුමාරවරුන්ගේ කථාපුවතයි.

10-4

"මාවොච එරුසං කඤ්චි" යන මේ දම් දෙසුම ශාස්තෘන් වහන්සේ සැවත් නුවර දෙව්රම් වෙහෙරේ වැඩසිටියදී කුණ්ඩධාන තෙරුන් නිමිති කරගෙන දේශනාකළ සේක.

උන්වහන්සේ පැවිදි වූ දින පටන් එක් ස්ත්‍රී රුවක් තෙරුන් සමගම හැසිරෙයි. ඇයව තෙරුන්වහන්සේට නොපෙනේ. නමුත් මහජනයා දකී. ඇතුළුගම පිඬුපිණිස හැසිරෙන විටද මිනිස්සු එක් දානයක් පූදා - ස්වාමීනි මෙය ඔබවහන්සේටය, මෙය ඔබ වහන්සේගේ සහායිකාවටයයි කියමින් දෙවැනි දානයක්ද දෙති.

(මෙසේ වන්නට කාරණ කවරේද යත්)
අතීතයේ කාශ්‍යප බුද්ධ කාලයේදී යහළු භික්ෂූහු දෙනමක් එක මවකගේ කුසින් ඉපදුනලෙස ඉතා දැඩි සමගියෙන් විසුහ. දීර්ඝායුෂ්ක කාලයේදී අවුරුදු පහක් හෝ අට වසරක් පාසා හෝ භික්ෂූන් වහන්සේලා පොහොය කිරීම සඳහා එක්රැස් වෙති. එනිසා ඒ භික්ෂූන් වහන්සේලා දෙනමද පොහොය කරණ ගෙට යන්නෙමුයි. වාසයකළ තැනින් නික්මුනාහුය.

තවුතිසා භවන වසන දේවතාවියක් මේ තෙරවරුන් දැක මේ දැඩි සමගිය බිඳින්නට හැකිදයි සිතා තමාගේ බාලබැවින් (පව්කාරසිත නිසා) එසේ කිරීමට සිතා ගත්තාය. ඉක්බිති එක් භික්ෂුවක් විසින් ඇවැත්නි, මොහොතක් ඉන්න, මට ශරීරකෘත්‍ය කිරීමට අවශ්‍යයයි පවසා මදක් ඇතට ගියේය. ඒ දේවතාවිය එහිදී ගැහැනියකගේ වෙසක් මවාගෙන තෙරුන් ගියතැනට පිවිස. නික්මෙන අවස්ථාවේදි එක් අතකින් කෙස් කළඹද අනෙක් අතින් ඇඳසිටි රෙද්දද (වස්ත්‍රයද) සකස්කරමින් තෙරුන්ගේ පිටුපසින් නික්මී ආවාය. උන්වහන්සේ ඇය නොදකී. ඇය එද්දී පෙරටුව ගමන් කල භික්ෂූන්වහන්සේ නැවතී. බලමින් සිටින්නේ ඒ ස්ත්‍රිය එන අයුරු දුටුවේය. ඇය එම තෙරුන් දුටුබව දැනගෙන අතුරුදහන් වුවාය. මේ නිසා අනෙක් භික්ෂුව තමාලඟට පැමිණි අවස්ථාවේදී - ඇවැත්නි ! සිල්බිඳුනා නේදැයි විමසුවේය. නැත අවැත්නි මම එබඳු දෙයකට පත්නොවුවෙමි යයි පැවසුහ.

මේ දැන් ඔබ පසුපසින් ආ තරුණ ස්ත්‍රිය (ඇඳිවත හඳමින් පැමිණිය) දුටුවෙමි. ඔබ එසේ නොවේයයි පවසන්නේ කුමක් හෙයින්ද? එවිට අනෙක් භික්ෂුව හිසමත හෙනයක් වැටුනසේ ඇවැත්නි මා නොනසවයි ද මම එබඳු වරදක් නොකෙළෙමි යයි ද පැවසුහ. එවිට අනෙක් සහායක භික්ෂුව මම දැන් දැසින් දුටුදෙය නුඹ නො අදහන්නේදැයි සැරයටි කෙලවර කඩා දමා යන්නට ගියේය.

පොහොය කරණ ගෙයිද මොහු සමග මම පොහොය නොකරමි යි වාඩි වුයේය. අනෙක් භික්ෂුව ස්වාමීනි මගේ සිල්වත් බවේ ඉතා කුඩා පලුද්දක් හෝ නැතැයි භික්ෂුන්ට දන්වා සිටියේය. අනිත් තෙරුන්ද දැසින් දකින ලද දේ පැවසුවේය. දේවතාවිය මේ භික්ෂුව සමග පොහොය නොකරන බව දැක - මා විසින් බැරැරුම් දෙයක් කරණ ලදැයි සිතා ස්වාමීනි මම නිසා තෙරුන්ගේ සිල් බිඳීමක් සිදුනොවිය මම උන්වහන්සේ පරීක්ෂා කිරීම සඳහා එය කළෙමි. ඒනිසා මුන්වහන්සේ සමග පොහොය කරන්නැයි පවසා සිටියාය. උන්වහන්සේ ඇය අහසේ සිට කියන විට අදහාගෙන පොහොය කරණ ලදි. (පිරිසිදු යයි සිතා පොහොය කළත්) ඒ තෙරුන් වහන්සේ පෙරදී මෙන් මෘදු සිතක් නොවිය. දේවතාවිය විසින් පෙර දී කරණ ලද කර්මය මෙපමණි.

ආයු කෙලවර තෙරුන් වහන්සේලා සුවසේ ඉපදුනහ. දේවතාවිය අවීචියේ ඉපදී බුද්ධාන්තර කල්පයක් එහි පැසී මේ බුදුදොන්පාද සමයේදී සැවැත් නුවර ඉපිද වැඩිවියට පත්ව සසුනේ පැවිදිවිය. උපසම්පදාවද ලැබුවේය. ඔහු පැවිදි වූ දාසිට ඒ ස්ත්‍රී රුව පෙරලෙසටම පෙනෙන්නට විය. මේ නිසාම උන්වහන්සේට කුණඩධාන යන නම යෙදුහ. ඔහු එසේ හැසිරෙනු දැක භික්ෂුන් වහන්සේලා අනේපිඬු සිටු තුමන්ට සිටුතුමනි ! මේ දුසිල් තැනැත්තා ඔබේ විහාරයෙන් බැහැර කරන්න. මොහු (මේ භික්ෂුව) නිසා අනෙක් භික්ෂූන්ටද අපකීර්ති ඇතිවේ යයි පැවසුහ.

සිටුවරයා, ඇයි ස්වාමීනි ! බුදුරජාණන් වහන්සේ විහාරයේ නොසිටින්ද? උපාසක තුමනි බුදුහු සිටිතියි පැවසුහ. එසේ නම් ස්වාමීනි තථාගතයන් වහන්සේ (කළයුතු දේ) දනිතියි පැවසීය. එහෙත් භික්ෂූන් වහන්සේලා ගොස් විශාඛා උපාසිකාවට ද දැනුම් දුන්හ. ඇයද සිටුතුමා කීලෙසටම පිළිතුරු

දුන්නාය. භික්ෂුහු ඔවුන් විසින් කී වචනය නොපිළිගෙන - රජතුමා වෙත ගොස් මහරජ, කුණ්ඩධාන තෙරුන් එක් ස්ත්‍රියක් සමග නිතර සැරිසරමින් සියළු භික්ෂූන්ට අපකීර්තිය ඇතිකරයි. එනිසා මහරජ ඔබ විසින් මේ භික්ෂුව ඔබතුමන්ගේ බල ප්‍රදේශයෙන් (විජිතයෙන්) පිටමන් කරන්න යයි පැවසුහ. රජතුමා ස්වාමීනි ඔහු කොහේ සිටිද? මහරජ දෙව්රම් විහාරය තුළ සිටී. කිනම් ආවාස කුටියේ සිටිද? අසවල් කුටියේ යයි පැවසුහ. හොඳයි එසේනම් ඔබ වහන්සේලා යන්න මම ඔහුව අල්වාගන්නෙමියි පැවසීය. රජතුමා සවස විහාරයට ගොස් එම සෙනසුන මිනිසුන් ලවා වටකරවා තෙරුන් සිටින කුටියට අභිමුඛව සිටියේය. තෙරුන් වහන්සේ මහා ශබ්දය අසා විහාරයෙන් නික්මී දොරටුව ඉදිරියේ සිටියහ. ඒ ස්ත්‍රී රුවද පිටුපස සිටිනු රජ දුටුවේය.

තෙරුන් වහන්සේ රජුගේ පැමිණීම දැන නැගි සිටියහ. රජතුමා තෙරුන් නොවැන්දේය. ඒ ස්ත්‍රීරූපය ද නො දුටුවේය. ඔහු දොර අස්සේද ඇඳයටද බලන්නේ නොදැක තෙරුන්ට මෙසේ කිවේය. ස්වාමීනි ! මෙතැන එක් ස්ත්‍රියක් දුටුවෙමි. ඇය කිනම් කෙනෙක්දයි විමසීය. මහරජ මම නොදකිමි. මම දැන් ඇය ඔබවහන්සේ පිටුපස සිටුනු දුටුවෙමි. කීවිට - නොදනිමි මහරජයයි පැවසුහ. රජු මේ කුමක් දැයි සිතමින් ස්වාමීනි ! මෙහි ඉන්නයයි පවසා, තෙරුන් වහන්සේ එහි සිටිවිට නැවත ඇය තෙරුන් පිටුපස සිටියාය. රජු ඇය දැක නැවත උඩ තලයට නැගුනි. ඇය ගියබව දැන තෙරුන් වාඩිවිය. නැවතද රජු ඇය සියළු තැන්හි බලන්නේ නොදැක - ස්වාමීනි ඇය කවර කෙනෙක්දැයි නැවත විමසීය. මම නොදකිමියි තෙරුන් පැවසුහ. ස්වාමීනි දැන් ඇය ඔබ පිටුපස සිටිනු දුටුවෙමි. එසේය මහරජ - මහජනයා ද මා පසුපස කාන්තාවක් යන්නේයයි කියති. මම නම් නොදකිමි පැවසුහ. රජතුමා ප්‍රතිරූපයක් යයි සිතා නැවත තෙරුන් වහන්සේට නැගී සිටින්නැයි පවසා තෙරුන් ඉදිරි පස සිටියේ නැවත ද ස්ත්‍රීරූපය තෙරුන් පිටිපස දැක ඉදිරියෙන් නැගී සිට බලන්නේ ඒ රුව නොදුටුවේය. නැවත තෙරුන්ගෙන් දුටුවේ දයි විමසා මම නො දුටුවෙමියි පැවසුවිට ප්‍රතිරූපයක් යයි නිශ්චය කරගෙන තෙරුන්ට පැවසීය.

ස්වාමීනි මෙබඳු කෙලෙසීමක් ඔබ වහන්සේගේ පිටුපසින් හැසිරෙන කළ කිසිවෙක් ඔබ වහන්සේට ආහාර නොදෙන්නේනම් නිතර මගේ මාළිගයට

පිවිසෙන්න මම ම ඔබවහන්සේට සිවුපසයෙන් උවටැන් කරමියි ආරාධනා කොට ගියේය.

භික්ෂූන් වහන්සේලා - බලන්න ඇවැත්නි - රජුගේ පවුකාරකම මේ තැනැත්තා විහාරයෙන් බැහැර කරන්නැයි කීවිට, මෙහි පැමිණ සිවුපසයෙන් උවටැන් කිරීමට ආරාධනාකර ගියේ යැයි සෝඟාකළහ. ඒ තෙරවරු එම්බා දුස්ශීලය ඔබ දැන් "රාජකුණ්ඩ" බවට පත්වූයේයි කිහ.

ඒ භික්ෂුව ද කලින් භික්ෂූන්ට කිසිවක් කියන්නට අසමත්වූයේ දුස්සීලයෝ තෙපිය. කුණ්ඩයෝ තෙපියි තෙපි ගැහැනියක් සමග හැසිරෙන්නෝයි සිනා චෝදනා කළහ. එම භික්ෂූන් එවිට බුදුන් හමුවට ගොස් ස්වාමීනි කුණ්ඩධාන අප දුසිල්වතුන් ආදිය කියමින් නින්දා කරයි යනුවෙන් පැවසුහ. බුදුරජාණන් වහන්සේ කුණ්ඩධාන තෙරුන් කැඳවා ඔබ භික්ෂූන්ට මෙලෙස නින්දා කරන්නේ දැයි විමසුහ. ස්වාමීනි ඇත්ත. මම මෙලෙස චෝදනා කළෙමි. කුමක් නිසා එලෙස නින්දා කළේදැයි විමසුහ. මට කියන ලද චෝදනාව නිසායයි පැවසීය. එවිට බුදුරජාණන් වහන්සේ මහණෙනි. කුමක් හෙයින් මේ භික්ෂුවට චෝදනා කලේදැයි විමසුහ. එහිදී මොහු පසුපස එක් ගැහැණියක් හැසිරෙන හෙයින් යයි පැවසූ විට - එසේ නොවූවු ඔබ මේ භික්ෂූන්ට එලෙස නොදැක චෝදනා කිරීම වරදක්බව පෙන්වාදී ඔබ පෙර අත් බවයකදී කළ වරදක් නිසා මෙසේ සිදුවීයයි පවසා කවර හෙයින් නැවත එබඳු දෘෂ්ටියක් ගන්නේදැයි ප්‍රශ්නකළහ. භික්ෂූන් වහන්සේලා මොහු විසින් පෙර කුමක් කරණ ලද්දැයි බුදුන්ගෙන් විමසුහ. බුදුරජාණන් වහන්සේ ඔහු විසින් පෙර (දේවතාවියක්ව සිටියදී) කළ බැරෑරුම් කර්මය විස්තරකර දී එම පාපකර්මය නිසා මෙබඳු පාපී දෘෂ්ටියක් (විප්‍රකාරයක්) ඇතිවීයයි පවසා දැන් නැවත එබඳු පාප දෘෂ්ටියක් ගැනීම යුතු නොවේයයි පෙන්වා එම භික්ෂුවට කිසිවක් නොකියන ලෙසට නියමකොට නිහඬව මුවවිට බිඳුන කස්ලෝ තලියක්සේ නිහඬ වන්නැයි පැවසුහ. මෙසේ කරන්නේ නිවන් පසක් කරන්නෙක් බවයි වදාරා පිළිවෙළ කථාව සබඳකොට අවවාද කර මේ ගාථාව දේශනාකළහ.

10

නො කියනු අනුන්හට කිසිවිට පරුස වදන්
එකටෙයක කිම නුසුදුසුමය එකට ඉඳන්
දබරය කරනු ඇත ඔබගේ සතුට නිඳන්
නිසලව සිටින්නට හැකි අය අනති උදන්

කිසිවෙකුටත් රළු වදනක් නොකියන්න. එසේ කියන්නාට පෙරළා රළුවදනක්ම අසන්නට ලැබේ. යම් හෙයකින් එකටෙක කියාගැන්ම නිසා ඒ ප්‍රති වචන විඳින්නට සිදුවේ.

කිසිවෙකුට එරුෂ වචන නො කියව කට කැඩුණු ලෝහ තලියක් සේ, තමන් නිශ්චල කොට රැකගත හැක්කේ නම් එසේ වූ අය නිවන් ලැබීමට සුදුස්සෝය.

එහි **මාවොච එරුසං කඤ්චි** - එක් පුද්ගලයෙකුට ද නපුරු වචන නොකියන්න **වුත්තානි** අන් අයට දුසිල්වතුන් යයි කීවිට තමන්ටද එලෙසම චෝදනා කරති. **සාරම්භකථානි** - මෙබඳු එකට එක කීම දුකෙකි. **පටිදණ්ඩානි** - කායදණ්ඩ ආදී අන්අය නසන - පීඩාකරණවිට එබඳුම පීඩනයකට තමන්ද නතුවෙ **සවෙ නෙරෙසීති** - ඉදින් තමා නිසල කරන්නට හැකිවේද? **කංසො උපහතො යථාති** - ගැටිය කැඩුන - කළය පමණක් ඉතිරිවූ **කස්ලෝ** තලියකට අත්පාවලින් හෝ - දණ්ඩකින් හෝ පහර දුන්විට ශබ්ද ඇති නොවේ. **එස පත්තොසීති** - එබඳු නිහඬ ස්වරූපයට පත්වීමට හැකිවේද? මේ ප්‍රතිපදාව ගෙනයනවිට (පුරණවිට) මෙලොවදී නිවන් නොලැබුවද නිවන් ලැබුවේ නම් වේ.

සාරම්භොතෙ නවිජානී - මෙසේ ඇතිවිට නුඹ දුසිල්ය මම දුසිල්ය - යන මේ ආදී පිළිතුරු ලෙස කියන වදන් එකට එක කියා ගැනුම් නැත. නො වන්නේය. දේශනාව කෙළවර බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පත්වුහ. කුණ්ඩධාන තෙරුන් ද බුදුන් විසින් දෙන ලද අවවාද අසා රහත් වුහ. නොබෝ දිනකින්ම අහසේ සිට පළමු දානය පිළිගත්හ.

කුණ්ඩධාන තෙරුන්ගේ කතා පුවතයි.

10-5

"**යථා දණ්ඩෙන හි**" - මෙම ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත්නුවර පූර්වාරාමයේ වැඩසිටිය දී විශාඛා ආදී උපාසිකාවන්ගේ පෙහෙවස් සමාදන්වීම නිමිති කරගෙන දේශනා කළහ.

සැවැත් නුවර එක් මහා උපෝසථ දිනයෙක පන්සියයක් පමණ ස්ත්‍රීහු පෙහෙවස් සමාදන්ව විහාරයට ගියාහුය. විශාඛාව - ඔවුන් අතරින් මහළු ස්ත්‍රීන් වෙතගොස් මෑණිවරුණි. කුමක් නිසා පෙහෙවස් සමාදන් වුවේ දැයි විමසුවාය. ඔවුන් දිව්‍ය සැපය ප්‍රාර්ථනා කරගෙන යයි කීවිට, මධ්‍යම වයසේ අයගෙන් විමසුවාය. තම සැමියන්ගේ අන් බිරියන් කෙරෙහි පවත්නා සපත්නි රෝෂයෙන් මිදීම සඳහා යයි පැවසුහ. තරුණ ස්ත්‍රීන්ගෙන් විමසුවාය. ඔවුන් විසින් පළමු ගැබ් ගැනීමේදී ම පුතෙක් ලබාගැනීම සඳහා යයි පැවසුහ. අනතුරුව කුඩා කුමාරිකාවන්ගෙන් විමසුවාය ඔවුන් තරුණ වියේ දීම පතිකුලයට යාම සඳහා යයි පැවසුවිට

ඒ සියළුම කථා අසා ඔවුන් රැගෙන බුදුන් වෙත ගොස් පිළිවෙලින් දැනුම් දුන්නාය. ඒ අසා බුදුරජාණන් වහන්සේ විශාඛාවනි ! මේ සත්ත්වයන්ගේ ඉපදීම් ආදියනම් දණ්ඩක් අතින් ගත් ගොපල්ලන් වැනිය. ජාති ජරා ආදියෙන් යුත් ජරා ව්‍යාධි ආදියෙන් යුත් ව්‍යාධි මරණ සමීපයට යවා කෙටේරියෙන් සිඳින්නාසේ ජීවිතය සිඳගනී. නිවණ පතන්නෝ නම් නැත. සසර පතන්නෝ නම් වෙතියි, පවසා අනුපිළිවෙල වදාරා දහම් දෙසමින් මේ ගාථාව දෙසුහ.

ගොපල්ලා කෙව්වෙන්
හරක් ගෙන යයි කෙත වෙත
ලෙඩ, දුක්, ජරාවෙන්
ඔබත් ගෙනයයි මරණෙ දොර වෙත,

යම්සේ ගොපල්ලා දණ්ඩ යොදාගෙන ගවයන් ගාලට යවයිද එසේම ජරාව හා මරණය සත්ත්වයන්ගේ ආයුෂ පාලනය කරයි.

එහි **පාචෙතිනි** - දක්ෂ ගොපල්ලා කුඹුරු අතරින් ඇතුළුවන ගවයින් දණ්ඩෙන් **චලකා** එයින් තලමින් - ජලය - තණකොල සුලඟ ඇති තැන්වලට මෙහෙයවයිද "ආයුං පාචෙනති" ජීවිතින්ද්‍රිය සිඳිති. හැරයති. ගොපල්ලා මෙන් ජරාවද - මරණයද ගොණුන්මෙනි **ජීවිතින්ද්‍රිය ගෝචර භූමිය වැන්න** එහි ජාති නම් සත්ත්වයන්ගේ ජීවිතින්ද්‍රිය ජරාව සමීපයට යවයි. ජරා - ව්‍යාධි සමීපයට යවයි. ව්‍යාධිය මරණ සමීපයට යවයි. එලෙසම මරණය නමැති කෙළවරියෙන් සිඳ යන්නේයයි මෙසේ උපමා කරමින් - දේශනය නිමාකළ විට බොහෝ දෙන සෝවාන් ඵලයට පැමිණුනාහ.

විශාඛා ආදී උපාසිකාවන්ගේ උපොසථ සමාදන්වීම පිළිබඳ කථා පුවතයි.

10-6

අනතුරුව **"අථ - පාපානි කම්මානි"** - යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ රජගහනුවර වේළුවනයෙහි වැඩ සිටියදී අජගර ප්‍රේතයෙකු නිමිති කරගෙන දේශනා කළහ.

එක් සමයෙක මහමුගලන් තෙරණුවෝ ලක්ඛන තෙරුන් සමග ගිජුකුළු පව්වෙන් බසින විටදී යොදුන් විසිපහක් දිග පිඹුරු ප්‍රේතයෙක් දිවැසින් දුටුවහ. ඔහුගේ හිසෙන් ගිනිජාල නැගී කෙළවරට පැතිරයයි අවසානයෙන් පටන්ගෙන හිස දක්වාත් ගමන්කරයි. දෙපසින් ගිනිජාලා ඇතිවී මැදට පැමිණේ තෙරුන්වහන්සේ මේ දැක සිනා පහළ කළහ.

ලක්ඛණ තෙරුන් විසින් සිනා පහළ කිරීමට හේතු විමසා සිටි විට ඇවැත්නි මෙය විස්තර කිරීමට කාලය නොවේ. මේ ප්‍රශ්නයට පිළිතුරු බුදුරජාණන් වහන්සේ හමුවේදී මගෙන් විමසන්න යයි පැවසුහ. එසේ පවසා රජගහනුවර පිඩු පිණිස හැසිරී බුදුන් වෙත ගියවිට ලක්ඛන තෙරුන් විසින් විමසන ලදුව මෙසේ පැවසුහ.

ඇවැත්නි එක් ප්‍රේතයෙක් දුටුවෙමි. ඔහුගේ මෙබඳු ආත්මභාවයක් විය. මම ඔහු දැක ම විසින් මෙබඳු ආත්මභාවයක් මෙයට පෙර නොදුටුවෙමියි මට සිනා පහළ විය. බුදුරජාණන් වහන්සේ ඇස් ඇති ශ්‍රාවකයින් (දිවැස්) වාසය කරත් යයි පවසා තෙරුන්ගේ කථා වේ පිහිටා මහණෙනි ! ම විසින්ද බෝධි මණ්ඩපයේදීම දුටුවේ වෙමි. මෙය නොපිළිගන්නා අය ගේ අහිත පිණිස පවතී යයි සිනා නොපැවසීමි. දැන් මුගලන් ඇස්ලැබ කියමියි කියා භික්ෂූන් විසින් ඔහුගේ පෙර කර්මය විමසුවේ පැහැදිලි කර දුන්හ. කාශ්‍යප බුද්ධ කාලයේදී සුමංගල නම් සිටුවරයෙක් රන්ගඩොල් බිම අතුරා එකසිය විසි රියනක් දිගට එපමණ ධනයක් විසුරුවා මහා විහාරයක් කළේය. එපමණම වියදම්කර උත්සවයක් කළේය. ඔහු උදේම බුදුන්වෙත (කාශ්‍යප) යන්නේ නුවර දොරටුවේ එක් ශාලාවක කසාවතක් හිසට පෙරවාගෙන මඩ නැවරුණු පාදයෙන් යුතුව නිදාසිටි එක් සොරෙක් දැක. මඩනවරාගෙන

රාත්‍රියේ ගමන්කර දවල් නිදන්නෙකැයි කීවේය. සොරා මුහුණ විවරකර සිටුතුමා දැක බලා - හොඳයි කරන්න ඕනදේ දැනගත්තා යි වෛරයක් බැඳ හත්වරක් (සිටුතුමාගේ) කුඹුරට ගිනි තැබුවේය.

සත්වරක් ගවගාලේ ගවයින්ගේ පාසින්දේය සත්වතාවක් ගෙය දවාලීය. හේ මෙපමනකින්වත් කෝපය නිවාගන්නට අසමත් වන්නේ ඔහුගේ සුළුසේවක යා සමඟ මිත්‍රත්වයක් ඇතිකරගෙන ඔබේ සිටුවරයාට වඩාත් ප්‍රිය දෙය කුමක්දැයි විමසා - බුදුන්ගේ ගඳකිලියට වඩා ප්‍රියදෙයක් නැතැයි අසා එසේ වේවායි. ගඳකිලිය දවා කෝපය නිවාගනිමියි සිතා බුදුරජාණන් වහන්සේ පිඬුසිඟා වැඩිවිට - පානය හා පාරිභෝගය සඳහා තිබුන ජලය තිබූ කළ බිඳදමා ගන්ධ කුටියට ගිනි තැබීය. සිටු තුමා ගඳකිළිය ගිනිගන්නේ යයි අසා ගිනි ඇවිලෙන විට ඇවිත් ගඳකිළියේ දැවෙන හැටිබලා කෙස් ගහක තරම්වත් දොම්නසක් ඇතිකර නොගෙන වම් අත හකුළුවා දකුණතින් මහත් අත්පොළසන් දුනි. අනතුරුව ඔහු අසල සිටි අය ස්වාමීනි මෙපමණ ධනයක් වැයකර කරණ ලද ගඳකිළිය දැවෙද්දී සතුටු වෙන්නේදැයි විමසුහ.

දරුවනි මේ ගිනිවලට අසාධාරණවූ බුදුසසුනේ ධනය නිධන් කිරීමට ලැබෙන හෙයින් නැවතද මෙබඳු ධනයක් වියදම්කර බුදුරදුන්ට ගඳකිලියක් කරන්නට ලබන්නෙමියි සතුටු සිත් ඇත්තේ අත්පොලසන් දුනිමි. පැවසුවේය. හේ නැවතද එබඳුම ධනයක් වැයකර ගඳ කිලියක් කරවා විසිදහසක් භික්ෂූන් සහිත බුදුරදුන්ට දානයක් පිරිනැමුවේය.

මේ දුටු සොරා මම මොහු නොමරා නිහඬව කරවන්නට නොහැකි වේ යැයි සිතා මොහු මරන්නෙමියි ඉණෙහි කිනිසි බැඳ දිනහතක් විහාරයේ හැසිරෙන්නේ ඉඩක් නොලැබුනි. මහසිටුවරයාද දින හතක් මහදන් දී බුදුරජාණන් වහන්සේට නමස්කාර කොට ස්වාමීනි එක් පුරුෂයෙක් විසින් මගේ ගේත් සත්වරක් දවාලීය. ගවගාලේ ගවයන් ගේ පා හත්වරක් සිඳදැම්මේය. සත්වරක් ගෙය දවාලීය. දැන් මේ ගඳකිලියද ඔහු විසින් දවන ලදී. මම මේ දානයේ පළමු කොටස ඔහුට දෙමි. එය අසා සොරා මවිසින් බැරුරුම් ක්‍රියාවක් කරණ ලද්දෙමි. මෙපමණ අපකාර කළේද මා කෙරෙහි කෝපමාත්‍රයක් වත් නැත. මේ මහා දානයේ ප්‍රථම කොටස මට දෙයි මම

ද්‍රෝහියෙක්මි. මෙබඳු කෙනෙකුගෙන් ක්ෂමාව නොගැනීම නිසා දේව දඩුවම්ද මගේ හිසමත පතිතවේයි සිතා සිටුවරයාගේ පාමුළ වැටී ස්වාමීනි මට සමාවන්නැයි ඉල්ලා සිටිවිට මේ කුමක්දැයි සිටුවරයා විමසීය. මෙබඳු අයුතු දෙයක් මවිසින් කරණ ලදැමි ඒ මට සමාවන්නැයි ඉල්ලා සිටියේය.

අනතුරුව සිටුවරයා මේ මේ දේත් කරණ ලද්දේ නුඹ විසින් දැයි? විමසීය. සියල්ල විමසා - එසේය මා විසින් කරණ ලදැයි පිළිතුරු දුන්විට නුඹ ම විසින් නොදැක තිබියදී කුමක් නිසා මෙසේ කිපී කරණ ලද්දේදැයි විමසීය. ඔහු එක්දිනක් නගරයෙන් නික්මෙන්නේ ඒ අතරතුර කියන ලද වචනය සිහිකර කෝපය ඇතිවූයේයයි පැවසුවේය. සිටුවරයා එදින එබඳු වචනයක් කිව බව සිහිපත්වී දරුව, එසේ කීවෙමි. මට සමා වන්නැයි පැවසීය. එසේ සමාව දී දරුව නැගිටින්න. ඔබට මම සමාව දෙමි. දරුව යන්නැයි පැවසුවේය. ඉදින් උතුමනි මට සමාව දෙන්නේනම් දූදරුවන් සමග මා ඔබ නිවසේ දාසයන් කරගන්න. දරුව ඔබ, මම මෙපමණක් කීවෙන් මෙපමණ විනාශයන් කරණ ලදී. ගෙතුල වාසය කිරීමෙන් කිසිවක් කියන්නට නොහැකිවේ. ඔබ මගේ ගෙයි විසීමෙන් ප්‍රයෝජනයක් නැත. ඔබට සමාවදෙමි යන්නැයි කීවේය.

සොරා එම කර්මය සිදුකොට ආයුකෙලවර අවීචි නරකයේ උපන්නේ බොහෝ කලක් එහි පැසී. විපාක කෙළවර දැන් ගිජුකුළු පව්වේ පැසේයයි පැවසුවේය. මෙසේ බුදුහු ඔහුගේ පූර්වකර්මය පවසා මහණෙනි !

අඥානයෝ පවුකරන්නේ අවබෝධ නොකරති පසුව තමා කළ කර්මයෙහි දැවෙන්නේ තමා තමන්ට ලැවී ගින්නක් සේ වේයයි පවසා පූර්වා පර සන්ධි ගලපා දහම් දෙසන්නේ මේ ගාථාව පැවසුහ.

චටහා නොගෙන පව්කම්වල නිබෙන දොස
පව්කම් කරති අනුවණයෝ මිහිරි ලෙස
ඒ කම් සසර පල දී ගිනි රගෙන හිස
දැවිනෙකු වගේ පව් විඳවති නිරයෙ බැස

නත්ථ පාපානිහි - අනුවණයා හුදෙක් ක්‍රෝධවශයෙන් පව් කරති. කරණ **කළද** අවබෝධ කර නොගනී පව් කරන්නේද පවක් කරමියි අවබෝධ කරගන්නෙක් නැත. මෙම කර්මයට මෙබඳු විපාක ලැබේයයි නොදන්නා හෙයින් අවබෝධ නැතැයි කියන ලදී **සෙහීහි** - හේ තමා විසින් කරණ ලද කර්මයෙන් **දුම්මෙධොහි** නුවණ නැත්තා - නිරයේ ඉපිද ගින්නෙන් දවුනෙකු සේ තැවේ යන අර්ථය දෙයි. දේශනය අවසානයේ බොහෝ දෙන සෝවාන් ආදි ඵලයන්ට පැමිණියහ.

අජගර නම් ප්‍රේතයාගේ කථා පුවතයි.

10-7

"යො දණ්ඩෙන" යන මෙම ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ රජගහ නුවර වේළුවනා රාමයේ වැඩ සිටියදී මහමුගලන් තෙරුන් නිසා දේශනා කළහ.

එක සමයෙක තීර්ථකයින් එක්රැස්වී රහස් සාකච්ඡාවක් කළහ. යහළුවනි ! කුමන කරුණක් නිසා ශ්‍රමණ භවත් ගෞතමයන්ට මහත් ලාභසත්කාර ලැබෙදැයි දනිමිද? අපි නොදනිමු. නෙපි දනිවි ද? එසේය. මම දනිමි. මුගලන් නම් වූ එක් අයෙක් නිසා ලැබේ. ඔහු දෙව්ලොව ගොස් දෙවියන් ගෙන් ඔවුන් කළ කුශල කර්ම විමසා දැනගෙන අවුත් මිනිසුන්ට කියාදෙයි. මේ තැනැත්තා මෙබඳු කුශල කර්මයක් කොට මෙබඳු සම්පත් ලබා තිබේ යනුවෙන් විස්තර කරදෙයි.

මිනිස්සු ඔහුගේ මේ කථා අසා මහත් ලාභ සත්කාර පවරා දෙති. මේ නිසා ඔහු මරන්නේනම් අපට එම ලාභසත්කාර ලබාගත හැකිය. ඔවුහු එක් උපායක් ඇතැයි සියල්ලෝ ඒකඡන්දයෙන් අනුමත කොට කිසියම් දෙයක් කොට ඔහු මරවුයයි. තම අනුගාමිකයන් එකඟ කරවාගෙන කහවනු දහසක් ගෙන - මිනිසුන් මරණ සොරුන් කැඳවා මහමුගලන් තෙරුන් කළුගල් කඩ වසතියි කියා ඔහු ඝාතනය කරන්නැයි ඔවුන්ට කහවනු දුන්හ. සොරු ධන ආශාවෙන් පිළිගෙන තෙරුන් වහන්සේ මරන්නෙමුයි ගොස් උන්වහන්සේ වසන ස්ථානය වටකොට සිටියහ. තෙරුන් වහන්සේ ඔවුන් වටකොට ඇතිබව දැන යතුරු සිදුරෙන් නික්මී ගියහ. ඔවුන් මුගලන් තෙරුන් නොදැක නැවත දිනයක පැමිණ වටකළහ. තෙරුන් වහන්සේ මෙය දැන කැණිමඩල හිඳගෙන අහසට පැන නැග්ගේය. මේ අයුරින් පළමු මාසයේද මැද මාසයේද තෙරුන් ගන්නට නොහැකි වුහ. අන්තිම මාසය එළඹිවිට තෙරුන්වහන්සේ තමන් විසින් කරණ ලද කර්මය ඉදිරියට අදින බව දැන නොගියේය. සොරුන් ගොස් තෙරුන්ගෙන සහල් ඇට තරමට ඇට කඩමින් සිරුර බිඳුහ.

ඊට පසු මැරුනේයයි යන හැඟීම ඇතිව එක් වන ලැහැබක දමා ගියහ. තෙරුන් බුදුන් දැක පිරිනිවන් පාමියි ආත්ම භාවය ධ්‍යාන වෙළුමෙන් වෙළා ස්ථිර කොට අහසින් බුදුන්වෙත ගොස් බුදුන් වැඳ ස්වාමීනි. පිරිණිවන් පාමියි පැවසුහ. මොග්ගල්ලාන ඔබ පිරිනිවන් පාන්නේද? ස්වාමීනි එසේය. කොතැනට ගොස් පිරිනිවන් පාන්නේද? කලුගල් පෙදෙසට ගොස් පිරිනිවන් පාමී. එසේ නම් මුගලන් මට ධර්මය කියව ! මෙබඳු ශ්‍රාවකයෙකුගේ දර්ශනය මින්මතු හැකිවේදැයි පවසා එනිසා ධර්මය දේශනා කරන්නැයි පැවසුවිට ස්වාමීනි මම එසේ කරමියි කියා බුදුන් වැඳ අහසට පැනනැඟි පිරිනිවන් පාන දින සැරියුත් තෙරුන් සේ නොයෙක් සෘධි ප්‍රාතිහාර්යයන් දක්වා ධර්මය කියා බුදුන්වැඳ කාළසිලා පර්වතයට ගොස් පිරිනිවන් පෑහ. සොරුන් විසින් -තෙරුන් මරණ ලදැයි යන කථාව මුළු දඹදිව පැතිරුනේය. අජාසත් රජ සොරුන් සෙවීම සඳහා චරපුරුෂයන් යෙදවීය. එම සොරුන් සොර සුරා සැළකින් රා බොන අතර එකෙක් එකෙකුගේ සුරාබදුනට ගසා බිමහෙළීය ඔහු අනෙකාට තර්ජනය කර එම්බා - වනචරය නුඹ කුමක් නිසා මගේ ඔඩම බිමහෙලුවේද කිම දෘෂ්ට චෞරය නුඹ පළමුවෙන්ම මහමුගලන් තෙරුන්ට තැලුවා නේද?

ඇයි මම පළමුව තැලුව බව නුඹ නොදන්නේද? මෙලෙස මමත් තැලුව මමත් තැලුව යයි කියන්නන්ගේ වදන් අසා ඒ චරපුරුෂයෝ ඒ සියළු සොරු අල්ලාගෙන රජුට දැන්වීය. රජු සොරුන් කැඳවා තෙපි විසින් තෙරුන් ඝාතනය කරණ ලද්දේදැයි විමසීය. දේවයන් වහන්ස එසේය. තොප ඒ සඳහා යොදවන ලද්දේ කවරෙකු විසින්ද දේවයන් වහන්ස නිඝණ්ඨ ශ්‍රමණයින් විසින්යයි පැවසුහ. රජු පන්සියයක් නිඝණ්ඨයින් හා පන්සියයක් සොරුන්ද ගෙන රජගෙයි මළුවේ නැබ පමණට යටකොට පිදුරුවලින් වසා ගිනි ඇවිල්ල විය. ඊටපසු ඔවුන් දුවුන බව දැන යකඩ නගුලෙන් කඩින් කඩ සාවවා සියල්ලන් කැබලි කැබලිවලට පත්කළේය. භික්ෂූහු දම්සභා මණ්ඩපයේදී මහමුගලන් තෙරුන්ට නුසුදුසු වූ මරණයක් සිදුවීයයි කථාවක් ඉපිද වුහ.

තථාගතයන් වහන්සේ පැමිණ මා පැමිණීමට පෙර මහණෙනි. ඔබ කිනම් කථාවකින් යුතුව සිටියෝදැයි විමසා මේ මුගලන් මහතෙරුන් ගැනයයි පැවසුවිට මහණෙනි මුගලන් තෙරුණුවෝ මේ ආත්ම භාවයට නුසුදුසු

වුවක් පෙර භවයකදී ඔහු විසින් කරණ ලද කර්මයකට අනුරූපවුම (යෝග්‍යවු) මරණයකට පත්වුයේ යැයි පැවසූහ. ස්වාමීනි උත්වහන්සේ විසින් කරණ ලද පුර්ව කර්මය කුමක්ද? යනුවෙන් විමසුහ. එවිට විස්තර වශයෙන් පැවසුහ.

අතීතයේ බරණැස වාසී එක් කුළ පුත්‍රයෙක් තමන් විසින්ම සහල් කෙටීම්, ඉවීම් ආදිය කරමින් දෙමාපියන් පෝෂණය කළේය. මේ අතර දෙමාපියෝ දරුව ! ඔබ තනියම ගෙයිවැඩද, කැලෑවේ වැඩද, කරමින් වෙහෙසට පත්වේ. ඔබට එක් දරියක කැඳවාගෙන එමුයි කියා කිහ. මෑණියනි. පියානණි මට එබඳු බිරිඳකගෙන් වැඩක් නැත. ඔබ දෙපළ ජීවත්ව සිටින තාක් සියතින්ම උවටැන් කරමි. මෙසේ ඔහු ප්‍රතික්ෂේප කරද්දීම නැවත නැවත ඇවටිලි කර කුමාරිකාවක් කැඳවාගෙන ආවාහුය.

ඇය දින කීපයක් ඔවුන්ට උවටැන් කර පසුව ඔවුන් දැකීමටද අකමැති වන්නී ඔබේ දෙමාපියන් සමඟ එකතැන වාසය කිරීමට නොහැකි යයි කෑගසා ඔහු (සැමියා) තමන්ගේ කථා ගණන් නොගන්නාවිට ඔහු බැහැරක ගිය අවස්ථාවේදී නියඳ කෙදි කැබලි හා කැඳපෙන ගෙන තැන් තැන්වල දමා - ඔහු ආපසු පැමිණිවිට මේ මොනවාදුයි විමසු අවස්ථාවේදී ඇය මේ මහළු අන්ධයෝ මේ ගෙය හැමතැන කිලිටි කරමින් සිටිති. මොවුන් හා එකට විසීම කළ නොහැකිය. මෙසේ ඇය නැවත නැවත කියන්නේ පුරණ ලද පාරමිතා ඇත්තෙක් වුවද මා පියන් කෙරේ සිත බිඳුනි. ඔහු හොඳයි කළ යුතුදේ දනිමියි. ඔවුන්ට කෑම දී මෑණියනි, පියාණෙනි, අසුවල් තැන් ඥාතිහු ඔබලාගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටිති. එහි යමුයි ඔවුන් කරත්තයකට නංවාගෙන යන්නේ කැලෑව මැදට පැමිණිවිට පියාණනි රැහැන ගන්න ගොන්නු පාසලකුණු අනුව යති. මෙතැන සොරු සිටිති මම බසිමියි. පියා අතට රැහැන් දී ගැලෙන් බැස යන්නේ හඬ පරිවර්තනය කර සොරුන් පැමිණ විලාශයක් දැක්විය.

දෙමාපියෝ ශබ්දය අසා සොරුන් පැන්නේයයි යන සඤ්ඥාවෙන් දරුව අපි මහළු අයයි. ඔබ රැකෙන්නැයි කීවාහුය. ඔහු දෙමාපියන් එසේ කියද්දීත් සොරුන්ගේ සෝෂාව කරමින් තලා පෙළා කැලෑවට දමා ආපසු ගියේය.

බුදුහු මේ ඔහුගේ පූර්ව කර්මය කියා දී මහණෙනි මුගලන් මෙබඳු කර්මයක් කොට නොයෙක් වර්ෂ ලක්ෂගණනාවක් නිරයේ පැසී විපාක කෙලවර ආත්මභාව වශයෙන් මෙසේම තැලිම් වලට ලක්ව කුඩු කුඩු වූයේ මරණයට පත්විය. මෙසේ මුගලන් විසින් තමා කළ කර්මයට අනුරූපවූම මරණයක් ලබන ලද්දේයයි පන්සියයක් සොරුන් හා නිවටුන්ද මගේ පුතුන්ට අපරාධකර ලදහ. නිරපරාධ අයට අපරාධකරණ අයට කරුණු දසයකින් ව්‍යසනය සිදුවේයයි පවසා අනුපිළිවෙල සසඳා දහම් දෙසන්නේ මේගය දෙසුහ.

දඬුවමට නුසුදුසු අයට දඬුවම් දීමත්
නිවරද කෙනෙකුනට - වරදක් දැන කිරීමත්,
කළ අයට ජීවිතේ - දසවරද පැමිණේමැයි

සිරුරේ බිඳීමද - වේදනා ඇතිවීම ද
රෝදුක් වැඩීම ද - අවසන උමතුවීමද,
රජුන්ගෙන් වන බිය - නෑයින් නැතිව යාමත්
සිය ධනය වැනසී - ලබයි නෙක් රුදු චෝදනාවන්,
නිවෙස ගිනි ගනු ඇත. - නැන්පත් ධනය වැනසී
හිත මිතුරු නැති වී - අපායට යයි හුදෙකලාවම

මෙහි අදණ්ඩසු යනු - කායික දඬුවම් කිසිවෙකුටත් නොදෙන රහතුන් කෙරෙහි අදහස දෙයි. **අපා දුග්ගෙසු** - යනු තමන්ටත් අන් අයටත් අපරාධ නොකරණ නොසිතන , අක්‍ඛඤ්ඤතරං ඨානං - දුක් සහිත කරුණු දහයෙන් එක් කරුණකට වෙද නං යනු සිස රෝග ආදී දරුණු වේදනාවන්ට ගොදුරුවේ. ජානිං යනු ධන හානිවේ භෙදනං යනු අත්පා සිදීම් ආදියයි. **ගරුකං** යනු පක්‍ෂපාත - ඇස් අන්ධවීම - කොරබව - කුෂ්ඨ රෝග ආදී ගරුකාබාධයන්ට ලක්වේ. **චිත්තකෙඛපං** - යනු උමතුම්බවයි. **උපසසගගං** යනු කිර්තිය නැතිකිරීම සේනාපති තනතුරු ආදිය භාවිතා කර ලීම රජුගෙන් උවදුරු ඇතිවීම - අඛකඛානං නොදුටු නො ඇසු නොසිතූ දේ මේ සැකි සිදීම ආදිය කළේයයි. රාජ අපරාධ නා විසින් කරණ ලද්දේයයි මෙබඳු වූ දරුණු චෝදනාවන්ට ලක්වේ.

පරිකඛයංච ඤාතීනං - යනු තමාට අත්‍යවශ්‍ය ඥාතීන්ගේ පිරිහීම සිදුවේ. **පභඞ්ගුරං** යනු - විනාශභාවයට නරක්වූ බවට ගෙයි තබන ධාන්‍ය කුණු වීමට හේතුවේ. රන් අඟරු බවටද මුතු - කපු ඇට බවට හෝ කහවනු - හිස් කැබලි බවට දෙපා සිවුපා සතුන් අතට -ගොළු කොරබවට පත්වීමද සිදුවේ. **අගාරි ඩහති** යනු එක් වසරකදි දෙතුන් වරක් අනෙක් ඒවා නොදැවෙද්දී තමන්ගේ ගෙය අකුණු සැරවලින් ගිණි ගෙය ගිනි වායුවෙන් හෝ ගිනි ගනී. **නිරයං** යනු මෙලොවදීම මේ කරුණු දහයෙන් එකකට හෝ පත්ව එක් ආකාරයෙන් හෝ දුක්වීමට **නිරයං - සො උපපජ්ජති** යනුවෙන් දක්වුනි. දේශනාවගේ කෙළවර බොහෝ දෙනා සෝවාන් ආදි ඵලයන්ට පත්වුහ.

මහ මුගලන් තෙරුන්ගේ කථා පුවතයි.

10-8

"න නගරවරියා" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත්නුවර දෙවිරම් වෙහෙර වැඩසිටියදී බහුභාණ්ඩික (අධික බඩු ඇති) භික්ෂුනමක් අරමුණු කොට දෙසුහ.

සැවැත් නුවර සිටි එක් කෙළෙඹි පුත්‍රයෙක් බිරිඳ කලුරිය කළ පසු පැවිදි වුයේය. හේ පැවිදි වනවිට තම පිරිවෙණද ගිනිහල් ගෙයද බඩුගබඩාවද ගිතෙල් මීපැණි තෙල් ආදියෙන් පුරවා පැවිදිවුයේය. පැවිදි වුවාට පසුවද තමන්ගේ සේවකයින් කැඳවා කැමතිලෙස ආහාර පිළියෙල කරගෙන අනුභව කරයි. බොහෝ පිරිකර ආදී බඩු ද විය. රාත්‍රියේ අනෙක් වසන තැනකද දිවාකල විහාර ප්‍රත්‍යන්තයේද වාසයකරති. එහි එක් දිනක් සිවුරු - ඇතිරිලි පලස් ආදිය වේළීම සඳහා දමාතිබුනි. සෙනසුන් චාරිකාවේ යන භික්ෂුන්වහන්සේලා ඒවා දැකබලා ඇවැත්නි මේවා කාගේදැයි විමසා මගේයයි පැවසුවිට. ඇවැත්නි බුදුරජාණන් වහන්සේ සිවුරු තුනක් අනුමත කර ඇත. නමුත් ඔබ මේ අපිස් බුදුසසුනේ පැවිදිවි මෙසේ බොහෝ පිරිකර භාවිතාකරයි. කියා ඔහු බුදුන්වෙත රැගෙන ගියහ. ගොස් ස්වාමීනි මොහු බොහෝ භාණ්ඩ අයත්ව සිටින්නෙකැයි දැක්වුහ. බුදුහු මහණෙනි ඇත්තදැයි විමසා ස්වාමීනි ඇත්ත යයි පැවසුවිට මහණ මම අල්පේච්ඡතාදි ගුණය ගැන ධර්මය දේශනා කරද්දී මෙසේ ඔබ බහු භාණ්ඩික වීදැයි විමසුහ. ඔහු මෙයින් කෝපයට පත්වුයේ මේවා බැහැර කොට හැසිරෙමියි පෙරවන සිවුර විසිකොට පිරිස මැද එක සිවුරෙන් සිටියේය. ඉක්බිති තථාගතයන් වහන්සේ ඔහුට පිටුවහල් මහණ නුඹ පෙර හිරිඔතප් සොයන රකුසු කාලයේද හිරිඔතප් සොයමින් දොළොස් වසරක් වාසය කලේද, කුමක් හෙයින් දැන් ගෞරවණීය බුදුසසුනේ පැවිදිව සිවි පිරිස් මැද පෙරවු සිවුර විසිකර ලජ්ජා බිය අත්හැර සිටියේද? ඔහු බුදුන්ගේ වදන් අසා ලජ්ජා බය සිහිකර ඒ සිවුර පෙරවා බුදුන් මැද එකත් පසෙක වාඩිවිය.

භික්ෂුන් වහන්සේලා එහි අරුත් විමසනු සඳහා බුදුන්ගෙන් විමසුහ. බුදුහු අතීත පුවත ගෙන හැර දැක්වුහ.

අතීතයේදී බරණැස් රජුගේ බිසවගේ කුස බෝසතාණෝ පිළිසිඳ ගත්හ. ඔහුට නම් තබන දින මහිංසාසක කුමාර යයි නම් තැබුහ. ඔහුගේ කණිටු සොහොයුරු වඤ්ඣ කුමාර නම්විය. ඔවුන්ගේ මවු කළුරිය කළ කල්හී රජු අන් බිසවක අගමෙහෙසුන් තනතුරේ තැබීය. ඇය පුතෙකු බිහිකළාය. ඔහුට සුරිය කුමාර යන නම කළහ. ඔහු දැක රජු සතුටුවූයේ පුතා වෙනුවෙන් වරයක් දෙමියි පැවසුවේය. ඇය කැමති කාලයක එය ගන්නෙමියි කියා කල් දී පුතු වැඩිවියට පැමිණිකළ රජුට මෙසේ පැවසුවාය. මහරජ පුතු ඉපදුනවිට වරයක් දෙනලදී. දැන් මගේ පුතුට රාජ්‍යය දෙන්නැයි කීවාය. මගේ පුතුන් දෙදෙනා ගිනි කඳන් සේ දිලෙමින් හැසිරෙති එනිසා ඔහුට රාජ්‍යය දීම කළ නොහැකියයි ප්‍රතික්ෂේප කළේය. එහෙත් නැවත නැවත ඇය ආයාචනා කරද්දී මේ තැනැත්තිය මගේ පුතුන්ට අනර්ථයක්ම කරනු ඇතැයි සිතා පුතුන් දෙදෙනා කැඳවා දරුවනි මම සුරිය කුමාර උපන්දින වරයක් දෙන ලදී. දැන් ඔහුගේ මව රාජ්‍යය ඔහුට ඉල්ලයි. මම ඔහුට රාජ්‍යය දීමට කැමති නොවෙමි. එහෙත් ඔහුගේ මව නුඹලාට අනතුරක් කරණු ඇත. ඒනිසා තෙපි ආරණ්‍යයට ගොස් මගේ ඇවැමෙන් පැමිණ රාජ්‍යය ගන්නැයි උනන්දු කළේය.

ඔවුන් පියාට වැඳ ප්‍රාසාදයෙන් බැසයන කළ රජමිදුලේ ක්‍රීඩා කරමින් සිටි සුරිය කුමාරයා දැක ඒ කරුණ දැන ඔවුන් සමගම නික්ම ගියේය. ඔවුන් හිමවතට පිවිසි අවස්ථාවේදී බෝසතාණන් වහන්සේ මගින් බැස එක්තරා ගසක් මුල වාඩි වී සුරිය කුමාරයට මෙසේ කීවේය. දරුව - එක් විලකට ගොස් නාගෙන ජලය බී අපටද නෙළුම් කොලවල ජලය ගෙන එන්න යනුවෙනි. එම විල වෛශ්‍රවණ සමීපයේ එක් ජල රකුසෙක් විසින් අරක් ගත්තේ වෙයි. වෙසසවණ යක්ෂයාද ඔහුට මෙසේ කියාතිබුනි. දේවධර්මය දන්නවුන් හැර අනෙක් අය මේ විලට බැස්සවිට ඔබට ආහාරයට ගත හැකිය. එතැන් සිට මේ රකුසා විලට බැස්ස අයගෙන් දේවධර්මය විමසා නොදන්නා අය භක්ෂණය කරයි. සුරිය කුමරයාද එය නොවිමසාම විලට බැස්සේය. එහිදී දේවධර්මය දනීදැයි විමසා සිටියේ. දේවධර්මය නම් හිරු සඳුයි පැවසුවේය. එසේනම් ඔබ දේවධර්මය නොදනීයයි ජලය තුලට ගෙන ගොස් තම වාසභවනෙහි තැබීය. බෝසතාණෝද ඔහු ප්‍රමාද බව දැන වඤ්ඣ කුමරු යැවිය. ඔහුගෙන්ද දේව ධර්ම විමසුවිට දේව ධර්මනම් සතර දිසා යයි

පැවසුවේය. ජල රකුසාද ඔහු ද ගෙන ගොස් එහිම තැබීය. බෝසත් තෙම ඔහුද ප්‍රමාදය නිසා අනතුරක් යයි සිතා තමන් ගොස් දෙදෙනාම විලට බසින ලද පාසටහන් දැක මේ විල ජලරකුසෙකුගේ ස්ථානයක් යයි දැන කඩුව අමෝරාගෙන දුන්න ගෙන සිටියේය. රකුසා ඔහු නොබසින බව දැන වනචර මිනිසෙකුගේ වෙසින් පැමිණ

එම්බා පුරුෂය නුඹ ගමන් විඩාවට පත්වූයේ කුමක් නිසා මෙම විලට බැස නා දිය පානයකොට නෙළුඹුදුල් කා නෙළුම් මල් පැළඳ නොයන්නේ කුමක් නිසාදැයි විමසීය. බෝ සතාණන් වහන්සේ ඔහු දැක මේ රකුසෙකැයි දැන නුඹ විසින් මගේ සොහොයුරන් ගන්නා ලද දැයි විමසුවේය. ඔව් මා විසින් ගන්නා ලද්දෙමි. කුමක් නිසාදැයි විමසීය. මේ විලට බසින්නන් ගැනීමේ අයිතිය මට ඇත. කෙසේද ඔබ සියල්ලන්වම ලබයිද? නැත දේවධර්මය දන්නවුන් හැර අනෙක් අය ගනිමි. කී කල ඔබට දේව ධර්මයෙන් ප්‍රයෝජනයක් ඇත්දැයි විමසීය. ඔව් මට අර්ථයක් ඇතැයි පැවසුවිට මම දේවධර්මය දනිමියි කීය. එසේ නම් කියව කිලිටි සිරුරෙන් යුතුව දේවධර්මය කිව නොහැකියයි පැවසුවිට රකුසා විසින් බෝසතුන් නාවා පැන්පොවා අලංකාර කොට සරසන ලද මණ්ඩපයක පළඟක් නගා හිඳුවා තමන් පාමුල සිටියේය. අනතුරුව බෝසත්තෙම හොඳින් අහගන්නැයි මේ ගාථාව පැවසූහ.

ලජ්ජාව සහ බිය නැතහොත් හිරි ඔතප් දෙක
දෙවියන් අතර රැඳි දහමයි කියති පඬුවෝ

රකුසා දම්දෙසුම අසා පැහැදී බෝසතුන්ට කීවේ ඤාණවන්තය, මම නා කෙරෙහි පැහැදුනේ වෙමි. එක සොහොයුරෙක් ගෙනඑමි. කණිටු සොහොයුරා ගෙන එන්නැයි කීවේය. නුවණැත්තාණනි, ඔබ හුදෙක් දේව ධර්මය දන්නේ මුත් එසේ නොපවතින්නේ කුමක් නිසාදැයි විමසීය. යම් හයකින් ජ්‍යෙෂ්ඨ සොහොයුරා තබා බාලයා ගෙන එන්නේ ජ්‍යෙෂ්ඨ උපකාරක කර්මය නොකරන්නේ වෙයි. යක්ෂය - මම දේවධර්මය දනිමි. ඒ දහම අනුගමනයද කරමි.

අපි මේ තැනැත්තා නිසා කැලයට ආවෙමු. මොහුගේ මව මොහුට මොහු නිසා රාජ්‍යය ඉල්ලුවාය. අපේ පියා ඔහුට රාජ්‍යය නොදී අපව ආරක්ෂා කරණු සඳහා වන වාසය අනුමත කළේය. ඒ කුමරුද නොනැවතී අප සමඟම ආවේය. ඔහු වනයේදී එක් යකෙක් කෑවේයයි කිව්ටදී කිසිවෙක් අදහන්නේනැත. එනිසා ගැරවීම් ලැබීමේ බියෙන් ඔහුට අවශ්‍ය බව පැවසුවේය. යක්‍ෂයා බෝසතුන් කෙරෙහි පැහැදී යහපති. ඎණවන්තය. ඔබ දේව ධර්මය දන්නේයයි සොහොයුරන් දෙදෙනාම ගෙනවුත් දුන්නේය. අනතුරුව බෝසතුන් යක්‍ෂ භාවයේ ආදීනව පෙන්වාදී පන්සිල්හි පිහිටුවීය. ඔවුන් යක්‍ෂයා විසින් මැනවින් ආරක්‍ෂාකරණ ලද්දේ ඒ වනයෙහි වාසය කොට පියා මියගියවිට යක්‍ෂයාද සමග බරණැසට ගොස් රාජ්‍යය ලබාගෙන චන්ද කුමරුට යුව රජ තනතුරද සුරිය කුමරුට සේනාපති තනතුරදී යක්‍ෂයාට රමණීය ස්ථානයක ආයතනයක් කරවා ඔහුට ලාභ ලැබෙන ලෙසට කටයුතු යොදවා ලීය. බුදුහු මේ දම් දෙසුම ගෙන හැර දක්වා ජාතකදේශනය සැසඳ වුහ. එදා රකුසා බහු හණ්ඩික විය. සුරිය කුමාර ආනනද විය. චන්ද කුමරු සැරියුත් මහතෙරුන්ය. මහිංසාසක කුමාර නම් මම ම වේදැයි මෙසේ බුදුහු ජාතකය දේශනා කර මහණෙනි මෙසේ පෙර දේවධර්මය සොයමින් ලජ්ජා බය ඇතිව හැසිරී. දැන් සිව්වනක් පිරිස්මැද මේ අයුරින් සිට මා ඉදිරිපිටදී අල්පේච්ඡයයි කියමින් අයුතු දෙයක් කළේය. සළුපිළි ප්‍රතික්ෂේප කිරීමෙන්ම ශ්‍රමණයෙක් නොවේයයි කියා අනුපිළිවෙල සම්බන්ධ කර දහම් දෙසමින් මේ ගාථාව පැවසුහ.

නිරුවත්ව ඉඳුමෙන් - ජටා ගෙන හිස බැඳුමෙන්
සිරුරේ මඩ ගෑමෙන් - බඩ ගින්නේ ඉඳීමෙන්
උක්කුටිකව ඉඳන් - බලු ඈ වෙස් ගැනීමෙන්
පිරිසිදු නොවේ කිසිවෙක් - මහණෙක්ද නොම වේමැයි.

නොනැසූ සැක ඇති සත්ත්වයා නග්නව හැසිරෙමින් තපස්රූක සැකය ශුද්ධ නොකරති. ජටාවෙන් ද ඇඟ මඩ තැවරීමෙන් ද ආහාර නොගැනීමෙන් ද බිම වැතිරීමෙන්ද සියලඟ වූ දූලිගාගෙන කරණ තපසින් ද උක්කුටිකව හිඳ වෑයම් කිරීමෙන් ද සැකය ශුද්ධ නොකරති.

එහි **නානාසකානි** - අහර නොගන්නෝයි අහාරබත් ප්‍රතික්ෂේප කරණ යන අර්ථයි. ඨණ්ඩිලසායිකා. භූමියේ වැතිරගෙන සිටින අයයි. රජොව **ජල්ලං** මඩවැතිරගත් දුවිලි වැකුණ අයයි. **උක්කුටිකප්පධාන** - උක්කුටිකයෙක් වෙරවඩන්නෝයි යම් මනුෂ්‍යයෙක් මෙසේ මම ලෝක **නිස්සරණ** සංඛ්‍යාත සුද්ධිය ලබවැයි මේ නිරුවත් චර්යාවන්හි යම්දෙයක් සමාදන්ව පවතීද ඔහු හුදෙක් මිත්‍යා දර්ශනයක් මෙන්ම ක්ලාන්ත බවක්ම ලබයි. මේ සුසමා දින්න නම් අෂ්ට වස්තුකවූ සැකයෙන් තොර නොවූ මිනිසා සෝධනයට පත්නොවේ. දෙසුම් අවසන බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

බහුභාණ්ඩික තෙරුන්ගේ කථා පුවතයි.

10-9

"අලඞ්කතො චෙපි" යන මෙම ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටියදී සන්තති මහා ඇමතියන් ඇරබ දේශනාකළහ.

මේ සන්තති මහ ඇමතිවරයා එක් අවස්ථාවක පසේනදී රජුගේ ප්‍රත්‍යන්තයේ ඇතිවූ කුපිතවීමක් සන්සිඳවා පැමිණියේය. මේ නිසා රජු සතුටුවූයේ දින හතක් රාජ්‍යය දී ගායනයට හා නැටීමට දක්ෂ එක් ස්ත්‍රීයක් ද දුන්නේය. ඔහු දින හතක් සුරාමදයෙන් මත්ව හත්වැනි දිනයේ සියලු අලංකාරයෙන් සැරසුනේ ඇතෙකු පිටනැග නාන තොටට යන්නේ පිඬුපිණිස පිවිසෙන බුදුරජාණන් වහන්සේ දොරටුව අසල සිටිනු දැක ඇතුපිට සිටියදීම හිසසලා ගෞරව දක්වා ගියේය.

බුදුරජාණන් වහන්සේ සිනා පහළ කොට, සිටියදී ආනන්ද හිමියෝ ස්වාමීනි කුමක් නිසා සිනා පහළ කලේ දැයි විමසුහ. එයට හේතු පැහැදිලි කරණ බුදුහු ආනන්ද සන්තති මහ ඇමති අද සියළු අබරණ වලින් සැරසී මා වෙත පැමිණ සිව්පද ගාථාවක් අවසන රහත්වී නල්ගස් හතක් පමණ අහසට නැගී සිට පිරිනිවන් පාන්නේයයි සිනාපහළ කළ බව පැවසුහ. මහජනයා බුදුන් හා ආනන්ද තෙරුන් අතර පැවති කථාව අසා - මිථ්‍යාදෘෂ්ටික අය සිතූහ. බලන්න ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ක්‍රියාව කටට ආවක්ම කිසයි. අදම ඔහු බොරුවෙන් ගරහමුයි පැවසුහ. සම්‍යක්දෘෂ්ටික අය මෙසේ සිතූහ. අහෝ බුදුන්ගේ මහානුභාවනාව අද බුද්ධලීලාව ද සන්තති මහ ඇමතිගේ ලීලාව දක්නට ලබමුයි සිතූහ. සන්තති මහ ඇමතිද නාන තොටදී දිවාකාලයේ ජල ක්‍රීඩාවේ යෙදී උයනට ගොස් අවන්හල භූමියේ වාඩිවිය. ඒ ස්ත්‍රියද රඟ මඩලට බැස නැටුම් ගැයුම් දක්වන්නට පටන් ගත්තීය. ඇගේ ශරීර ලීලාව දැක්වීම සඳහා දින හතක් අල්ප ආහාර ගැනීම නිසා එදවස නැටුම් ගැයුම් දක්වන්නේ කුසතුළ පැසෙන වායුව නැගී හදය මාංසය ඇඹරී ගියහ. ඇය එකෙනෙහි කට ද දූස් ද විවර වී (මුඛය හා ඇස්) විවර වීම මියගියාය.

සන්තති මහ ඇමති ඇය ගැන සොයාබලන්නැයි කී විට ස්වාමිනි ඇය මියගියා යයි පැවසුවිට බලවත් ශෝකයෙන් මඩනා ලදුයේ එකෙනෙහිම දින හතක් බොනලද රා රත්වූ කබලක ජලබිදු මෙන් සිදිගියේය. හේ මගේ ශෝකය නිවාලන්නට බුදුන්හැර කිසිවෙකුටත් නොහැකියයි බලකායද පිරිවරා ගෙන හැන්දෑවේ බුදුන් වෙත ගොස් වැඳ මෙසේ පැවසුවේය. ස්වාමිනි මෙතරම් දරුණු ශෝකයක් ඇතිවුනි. එය නිවීමට ඔබවහන්සේට හැකි වන්නේ යයි සිතා ආවෙමි. මට පිළිසරණ වනු මැනවැයි පැවසීය. අනතුරුව බුදුරජාණන් වහන්සේ ශෝකය නිවාදැමීමට දක්ෂයා වෙතම ආවේයයි පවසා මෙම කාන්තාව මේ ආකාරයෙන්ම විට පෙර ආත්මවලදීද මියගිය විට ඔබ විසින් හෙළූ කඳුළු සිව්මහා සයුරු ජලයට වඩා වැඩියයි පවසා මේ ගාථාව දේශනා කළහ.

යමෙක් පෙර වියැලේද පසුව එය දුකකැයි කියති මධ්‍යම අවස්ථාවේදී එය නොගනිද එනිසාම උපශාන්තව හැසිරෙන්නේය.

ගාථාව අවසානයේ සන්තති මහාමාත්‍යයා රහත්බවට පත්ව තමන්ගේ ආයුසංස්ඛාරය බලන්නේ එය නොපවත්නා බව දැන බුදුන්ට මෙසේ පැවසීය. ස්වාමිනි මට පිරිනිවන් පෑමට අනුදැන වදාරන්න. බුදුරජාණන් වහන්සේ ඔහු විසින් කරණ ලද කර්මය දන්නේ මුසාවාදයෙන් ගැරහූ නිග්‍රහ කිරීම පිණිස පැමිණි එක්රැස්වූ මිථ්‍යා දෘෂ්ටිකයින්ට අවකාශයක් නොදීමටත්, බලන්නට රැස්වූ සම්‍යක් දෘෂ්ටිකයෝ මේ ඇමති විසින් කළ කර්මය අසා පින්කිරීමේ ආදරය කැමැත්ත දියුණු කරනියි සලකා එසේ නම් ඔබ විසින් කළ කර්මය මට පවසන්නැයි කියමින් බිම සිට නොකියා තල්ගස් හතක් උසට අහසට නැගී කියන්නැයි පැවසුහ. හේ ස්වාමිනි යහපතැයි බුදුන් වැඳ එක් තල්ගසක් පමණට නැගී බැස නැවත බුදුන් වැඳ උඩට නැගෙන්නේ පිළිවෙලින් තල්ගස් හතක් උසට නැගී අහසේ පලක් බැඳ වාඩිවී ස්වාමිනි මගේ පෙර කර්මය අසන්නැයි පැවසීය.

මෙයින් අනුළුක් කල්පයකට පෙර විපස්සී බුද්ධ කාලයේදී මම බන්ධුමති නුවර එක් කුළයක ඉපිද මෙසේ සිතුවෙමි. අන් අය සිදීම හෝ පෙළීම නොකර ක්‍රියාවක් ඇත්දැයි සිතමින් ධර්මය කියාදීම දැක එතැන්පටන් ධර්ම

සෝෂා පවත්වමින් මහජනයා සතුටු කොට පිංකරමි. බුද්ධාදී රත්නත්‍රය සමාන වෙනත් රත්නයක් නැතැයි රත්නත්‍රයට සත්කාර කරමු. යනුවෙන් සෝෂා කරමින් හැසිරුනෙමි. ඒ මගේ හඬ අසා බුදුරජාණන් වහන්සේගේ පියාණෝ "බහුමතී මහරජ" මා කැඳවා දරුව කුමක් කරමින් හැසිරෙන්නේදැයි විමසා දේවයනි! තෙරුවන්හි ගුණය ප්‍රකාශ කරමින් මහජනයා පිංකමිහි සමාදන් කරවමින් යොදවමින් හැසිරෙමියි කීකළ කොහිසිට හැසිරෙන්නේදැයි විමසා පයින් ගමන් කරමින් යයි කිව්ට දරුව ඔබට මෙසේ ගමන් කිරීම සුදුසු නොවේයයි පවසා මේ මල්දම ගෙන පැළඳ අසුපිට නැගී හැසිරෙන්නැයි කියා මට මුතුදමක් සමාන මල්දමක් දී අශ්වයෙක් ද දුන්නේය. ඉක්බිති මා රජතුමා දුන් යානයෙන් එලෙසම සෝෂා කොට හැසිරෙන්නේ නැවත ද රජතුමා කථාකොට දරුව කුමක් කරමින් හැසිරෙන්නේදැයි විමසා සිටිවිට එය ඔබට සුදුසු නොවෙයි. කියා අශ්වයින් සිව්දෙනෙක් යෙදවූ අශ්ව රථයක් දීන. තෙවැනි වර මහරජු මගේ ශබ්දය අසා නැවතද මා කැඳවා දරුව කුමක් කරමින් හැසිරෙන්නේදැයි විමසා පෙරසේම කරණ බව පැවසු විට දරුව ඔබට රථයද සුදුසු නොවේයයි පවසා මහත් වස්තුවද, සියළු අබරණින් සැරසු එක් ඇතෙක් ද දුන්නේය. ඒ මම සියළු අබරණින් සැරසු ඇතුපිට වාඩිවී අවුරුදු අසූදහසක් ධර්මය භාඩනගා කීමි ඒ මගේ සිරුරෙන් එපමණ කලක් සඳුන් සුවඳ පැතිරුනි. මුවින් උපුල් සුවඳ හමයි. මේ මවිසින් කරණ ලද කර්මයයි මෙලෙස ඔහු විසින් පෙර භවයේදී කරණ ලද කර්මය කියා අහසේ සිටියදීම තේජෝධාතුවට සමවැදී පිරිනිවන් පෑහ. සිරුරින් ගිනි ජ්වලා පැනනැගී මස් ලේ දැමීය. දැසමන් මල්සේ ශාරීරික ධාතු ඉතිරි විය. බුදුහු සුදු වස්ත්‍රයක් දිගහැරියහ. ශාරීරික ධාතු ඒ සුදුවතට වැටුනි. එම ධාතු පාත්‍රයේ තබාගෙන සතරමඟ වීටිවල ස්තූප කළහ. මහ ජනයා වඳනා මාන කොට පින් රැස් කළහ. මේ පිළිබඳ කථාවක් ධම්සභා මණ්ඩපයේ දී ඇති කළහ. සන්තති මහඇමති බුදුන්ගෙන් බණ අසා අවසානයේ රහත් බවට පත්ව අලංකාර වස්ත්‍රයෙන්ම සැරසී සිට අහසේදීම පිරිනිවන් පැවේය. කිම ඔහු ශ්‍රමණයෙක් කීමට වටීද නැත හොත් බ්‍රාහ්මණයෙක් කීමට වටීද? යනුවෙනි බුදුරජාණන් වහන්සේ එහි පැමිණ මා ඒමට පළමු කිනම් කථාවකින් යුතුව සිටියේ දැයි විමසා

මෙවැනි කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හී මහණෙනි ! මගේ පුත්‍රයන් ශ්‍රමණයන් වීමට වටනේ යයි කියා ධර්මය දෙසීම සඳහා මේ ගාථාව වදාළහ.

නොයෙක් අගනා සළු පිලින් හා රන් රිදියෙන් බැබළුණත්
සාන්තව සිට රකින ඇත්තා බුදු සසුන් බඹසර උසස්
සියළු දඬු හා අවිමුගුරු හැර චිතැන් චේවිද යුද්දයෙන්
ඔහුම මහණෙකි. ඔහුම බමුණෙකි. ඔහුම තවුසෙකි යයි කියත්

එහි අලඞ්කතො - අගනා වස්ත්‍ර වලින් මනාව සැරසීමයි. එහි අර්ථය වස්ත්‍රාදියෙන් සැරසීමයි. **සමංචරෙය්‍ය** - රාගාදී ව්‍යුපසමනයයි. **සන්තෙසු** - සන්සුන් බවයි. කෙලෙස් තුනී කිරීමට තැත් කිරීමයි. **දන්තෙසු** - දැමුණු බවයි. හික්ම වූ ඉඳුරන් ඇති බවයි. **නියතෙසු** - සෝවාන් ආදී සතරමග නියමයෙන් නියම වූ ඉපැදීමයි. **බ්‍රහ්මචාරී** - ශ්‍රේෂ්ඨ චරියාවයි. සබ්බෙසු **භූතෙසු** - සියළු දඬුවම් සත්ත්වයන්ට හිංසා පීඩා කිරීම වැළැක් වීමයි. **බ්‍රාහ්මණෝ** මෙවැනි වූ සියලු පාපයන්ගෙන් වෙන්වූ තැනැත්තායි. **සමණෝ**- සියළු පව් සන්සිඳවූ පුද්ගලයායි. **භික්ඛු** - සියළු කෙලෙස් ප්‍රහාණය කළ තැනැත්තායි. යනුවෙන් කියන ලදී.

දේශනාවසානයේ දී බොහෝ දෙනා සෝවාන් ආදී ඵලයන්ට පැමිණුනාහු වෙති.

සන්තති මහ ඇමැතැන්තාගේ කථා පුවතයි.

10-10

"**හිරිනිසෙධොති**" - යන මෙම ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදි පිලෝතික තෙරුන් ඇරඹ දේශනා කළහ. එක් දිනෙක ආනන්ද තෙරුන් එක් රෙදි කැබැල්ලක් ඇඳ කබලක් අතින් ගෙන ඇවිදයන දරුවෙකු දැක ඔබ මෙසේ අවිදිමින් ජීවත් වනවාට වඩා පැවිදිබව උත්තරීතර නොවේදැයි විමසු විට - ස්වාමීනි කවරකෙනෙක් නම් මා පැවිදි කරන්නේදැයි පැවසු කල්හි මම පැවිදි කරන්නෙමියි ඔහු රැගෙන ගොස් සියතින් නාවා කර්මස්ථානයක් දී පැවිදි කළහ. ඔහු වනාහි තමන් පළමු ඇදිවත දිගුකර විචාරා බලන්නේ පෙරහනක් කිරීමට තරම් වූ දෙයක්වත් ගැනීමට කිසි පෙදෙසක් නොදැක කබල සමග වස්ත්‍රය එක් ගස් අත්තක තැබුවේය. ඔහුද පැවිදිව ලබන ලද උපසම්පදා ඇත්තේ බුදුන් වෙනුවෙන් ලැබෙන ලාභ සත්කාර පරිභෝග කරමින් වටිනා සිවුරු ඇඳපැලඳ තරවු සිරුරක් ඇතිව හැසිරෙන්නේ කළකිරී මහජනයා ශ්‍රද්ධාවෙන් දෙන දේ පරිභෝග කිරීමෙන් කවර ප්‍රයෝජනයක්දැයි සිතා මගේම ඇඳුම අදිමියි. එතැනට ගොස් වස්ත්‍රයගෙන තමන්ටම අවවාද කරගනිමින්. ලජ්ජා නැත්ත, මෙබදු වටිනා වස්ත්‍ර අඳින තැන අත්හැර මේ රෙදි කැබැල්ල හැඳ කබල අතට ගෙන සිඟමනේ යාම ගැන සිතයිද? එම අරමුණ කොට තමන් තමන්ටම අවවාද දී සිත සනසාගෙන එම රෙදිකඩ එතැනම තබා නැවත විහාරයටම ගියේ දිනකිපයකට පසුව නැවතද කළ කිරී එසේ කියා නැවතුනි. මෙසේ නැවත නැවත යනුදැක භික්ෂූන් වහන්සේලා ඇවැත්නි කොහේ යන්නේ දැයි විමසති. එවිට ආචාර්යන් වහන්සේ ලඟට යමියි කියා මේ අයුරින් තමන්ගේ රෙදිකඩ ට අරමුණු කොට ආත්මය නිෂේධනය කොට දින කීපයකින්ම රහත් බවට පත්වුනි. භික්ෂූන් වහන්සේලා ඇයි ඇවැත්නි දැන් ආචාර්යන් වහන්සේ වෙත නොයන්නේද? මේ ඔබේ විවෘත (පළපුරුදු) මාර්ගය නේද්දැයි විමසුහ. එහිදී ඇවැත්නි ගුරුවරයා සමග ඇලීම ඇතිවිටම එහි ගියෙමි දැන් මගේ සංසර්ගය සිඳ ඇත්තෙමි. (එකට ඇසුර) දැන් උන් වහන්සේ වෙත නොයමි. භික්ෂූන් වහන්සේලා මේ කථා පුවත තථාගතයන් වහන්සේට දැන්වූහ.

ස්වාමීනි පිලෝතික තෙරුන් අනෙකක් කියයි. මහණෙනි කුමක් කියයිද? ස්වාමීනි මෙයයි පැවසුවිට එසේය ඇවැත්නි මගේ පුත්‍රයා (රහත් භික්ෂුව) ඇල්මක් ඇතිවිට ගුරුවරයා ලඟට ගියේය. දැන් ඔහුගේ ඇලීම සිඳ දවා ඇත. තමාම තමා වලක්වා රහත් බවට පත්වුයේයයි පවසා මේ ගාථාව පැවසුහ.

"කසපහර වලකන උතුම් අසෙකු ලෙස යම්කෙනෙක් නින්දාව දුරු කර ගනිද ලජ්ජාවෙන් අකුශලයන් දුරුකරණ කිසියම් පුද්ගලයෙක් ලොව ඇත.

කස පහර වළකා - ලජ්ජාවෙන් ම හික්මුණු
අසකු මෙන් ඒ තෙම සිටී දුරුකොට ඇලුම් සසරේ

ලැබ කස පහර ලජ්ජාවෙන් නොවන	පමා
අස් පැටවෙකු වගේ සිත කය වචන	දමා
විරියද සමාදිය විදසුන් නුවණ	යොමා
සැදෑහෙන් සුසිල් වත් වී ලද යුතුය	අමා

කසයෙන් තලන ලද උතුම් අයෙකුසේ වීර්ය ඇත්තේද සසර කළකිරීම ඇත්තේද වේවි. ශ්‍රද්ධාවෙන්ද සිලයෙන්ද වීර්යයෙන්ද සමාධියෙන්ද විදර්ශනා ප්‍රඥාවෙන්ද සම්පුර්ණ වූ විද්‍යාචරණ ඇතිව සිහියෙන් යුතුව බොහෝ වූ මේ සසර දුක දුරුකරමි.

එහි තමාතුළ උපන් අකුශල විතර්ක ලජ්ජා නැති කරයි යනුවෙන් **හිරිනිසෙධො** නම් වේ. කොවි **ලොකස්මිං** යනු මෙබඳු දුර්ලභ කිසිවෙක් ලොව විද්‍යමාන වේ. **යො නිදෙනති** - අප්‍රමාදිව ශ්‍රමණ ධර්ම කරණ තැනැත්තා තමන්ට ඇතිවූ නින්දාව බැහැර කරමින් අවබෝධ කර ගනිනුයි **අපබොධති කසාම්වානි** යම්සේ යහපත් අශ්වයා තමාකෙරෙහි වැටෙන කසපහර දුරුකරයි. තම සිරුරට වැදෙන්නට ඉඩ නොදේ. යමෙක් එසේම නින්දාවක් ලැබීමට ඉඩ නොතබයි ද එවැන්නෝ දුර්ලභය. යන අරුතයි. දෙවන ගාථාවේ මේ සංක්ෂෙප අරුතයි. මහණෙනි යම්සේ යහපත් තරුණ අශ්වයා ප්‍රමාදයට පැමිණ කසයෙන් පහර නැවැත්වීද මමද එලෙස කසයෙන් පහර ලදුයේ පසුකලෙක එල්ලවන්නේයයි සංවේගයට පත් වේද?

මෙසේ සිතා එලෙස නෙපිද කෙලෙස් තවවී, හැගුම්බර වවී, මෙලෙස ලෞකික ලෝකෝත්තර දගවිධවූ ශ්‍රද්ධාවෙන් ද සිටි පිරිසිදු සිල්වලින්ද කායික චෛතසික වීර්යයෙන්ද යුතුව අෂ්ට සමාපත්ති ඤාණයෙන් කරුණු නොකරුණු දන්නා ලක්ෂණය ධර්ම විනිශ්චයෙන් ද යුතුව ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යා පසලොස් වර්ණ ධර්ම සම්පත්තියෙන් යුක්තව විද්‍යා චරණයන් ගෙන් යුතුව එළඹ සිටි සිහියෙන් මේ අපමන සසර දුක දුරුකරවී දේශනය අවසානයේ බොහෝ දෙන සෝවාන් ඵලයට පත්වූහ.

පිලෝතික ථේර පුවතයි.

10-11

"උදකං හි නයන්ති" - යන මෙම ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී "සුබ" සාමණේරයන් වහන්සේ නිමිත්තකරගෙන දේශනා කළහ.

අතීතයේදී බරණැස සිටු වරයාට ගන්ධ කුමාරනම් පුතෙක් සිටියේය. රජතුමා ඔහුගේ පියා අභාවප්‍රාප්තවූ විට ඔහු කැඳවා සනසා මහත් සත්කාරයෙන් ඔහුටම සිටුතනතුර දුන්නේය. ඔහු එතැන්සිට ගන්ධ සිටු තුමායි ප්‍රසිද්ධ විය. අනතුරුව භාණ්ඩාගාරික තැන භාණ්ඩාගාරයේ දොරවල් විවෘත කොට පෙන්වීය. ස්වාමීනි ඔබගේ පියාසන්තක ධනය මෙපමණ ඇත - මුතුන් මිත්තන්ගේ ධනය මෙපමණයිද වෙන්කොට දැක්වීය. ඔහු එම ධන රැස දැක කිම මෙපමණ ධනය ඔවුන් හැර නොගියහයි පැවසීය.

ස්වාමීනි ධනය නම් රැගෙන යන්නෝ නම් නැත. තම තමන් කළ කුශල කර්මයන්ම සත්ත්වයෝ රැගෙන යන්නෝය. ඔහු මෙසේ සිතුවේය. මුතුන් මිත්තෝ නොදන්නා බැවින් ධන තබා මියගියෝය. මම නම් මේ ධනය අරගෙනම යන්නෙමි. මෙලෙස සිතා දාන හෝ දෙමි පින් කම් හෝ කරමියි නො සිතා මේ සියල්ල පරිභෝග කරමි යන්නම සිතුවේය. ඔහු ලක්ෂයක් වියදම් කොට පළිගුමය නාන කොටුවක් කළේය. ලක්ෂයක් වියදම් කොට පළිගුමය නහන ඵලකයක් - ලක්ෂයක් දී වාඩිවන ආසනයක් කරවිය, ලක්ෂයක් දි ආහාරගන්නා භාජනයක්ද පැන් ගන්නා භාජන තබන තැනක්ද කරවිය. ලක්ෂයක් වියදම් කර මැදුරේ සීමදුරු කවුළුවක්ද සැදවීය. තමන්ගේ උදේ ආහාරය සඳහා දහසක් දුන්නේය. රාත්‍රි ආහාරයටද දහසක්ම දුන්නේය. පසළොස්වක් දිනට නම් ආහාර සඳහා ලක්ෂයක් දුන්නේය. ඒ බත වළඳන දින ලක්ෂයක් වියදම් කර නගරය අලංකාරකොට අණ බෙර ගැස්සවීය. ගන්ධ සිටුවරයා ආහාරගන්නා ආකාරය බලන්න කියා අණ බෙර ලෑමෙන් මහජනයා ඇඳක් පිට ඇඳක්තබා බැඳ රැස්වුහ. සිටුපුත්‍රයා ද ලක්ෂගණනක් වටිනා දියකොටුවේ ලක්ෂගණනක් වටිනා පළඟේ වාඩිවී සුවඳකළ පැන් කළ දහසයකින් හා ඒ සීහ පඤ්ජරය - (සිව්මැදුරු කවුළුව) ඇර එම පළඟෙහි වාඩිවිය ඉක්බිති එහි තබන ලද කුහරයේ භාජනය තබා ආහාර බෙදුහ. ඔහු

නළුවන් පිරිවරා මෙබඳු සම්පතින් ඒ භෝජනය අනුභවකරයි. ඊට පසු එක් දිනෙක එක් ගම්වැසි මිනිසෙක් තමාගේ වියදම් උපයාගනු සඳහා දර ආදිය රථයක තබාගෙන නුවරට ගොස් මිතුරෙකුගේ නිවසක නැවතුනි. එදින පසළොස්වක් දිනයකි. ගන්ධ සිටුවරයාගේ අහර ගැනීමේ ලීලාව බලන්නැයි නගරයේ අණ බෙර ලැවුහ.

අනතුරුව ඒ මිතුයා මෙසේ පැවසුවේය. ගන්ධ සිටුවරයාගේ ආහාර ගැනීම දැක තිබේද? යහළුව දැක නැත. එසේනම් එන්න බලමුයි ඔහු නගරයේ බෙර හසුරුවයි. මහ සම්පත් බලමුයි නුවර වැස්සෝ ජනපද වාසින්ද රැගෙන ගියහ. මහජනයා ඇදන්පිට ඇඳන් බැඳ නැගී බලති. ගම්වැසි ජනයා බත් සුවඳ ආඝ්‍රාණය කොට නුවර වැස්සන්ට කීහ. මට මේ තලියෙන් බත් පිඩක් කන්නට ආශාවක් ඇතිවිය. යහළුව මෙසේ ප්‍රාර්ථනා නොකරන්න එය ලබාගන්නට නොහැකිය. යහළුව ඉදින් නොලබන්නේනම් ජීවිතය නොරැකෙන්නේ ය. ඔහුට ඒ පුද්ගලයා වලකාලන්නට නොහැකි විය. පිරිස කෙලවර සිටි ඔහු ස්වාමීනි මම ඔබට වඳිමියි තෙවරක් මහා හඬින් කිය. මේ කවුදයි විමසුවිට ස්වාමීනි මම ඇයි මේ යයි විමසුවිට - මේ එක් ගම් වැසියෙකි. ඔබගේ භාජනයෙන් බත් පිඬක් ලැබීමේ ආශා ඇතිකරගත් අයෙකි. එක් බත් පිඩක් දෙනුමැනව. ලබන්නට නොහැකියයි පැවසුවිට කිමයහළුව ඇසුවේද? ලැබුනොත් ජීවත්වෙමි. නොලැබුනහොත් මාගේ මරණය සිදුවන්නේය. හේ නැවත ද විලාප නැගීය.

ස්වාමිනි මොහු මැරෙන්නේ ය ඔහුට ජීවත්වීමට ඉඩ දෙන්න. එම්බල ! බත් පිඩක් සියයක් වටී. දෙසියක්වටී. යම් යම් කෙනෙක් ඉල්ලයිද ඒ ඒ අයට දීමෙන් අප කුමක් අනුභව කරමුද? ස්වාමිනි මෙය නොලැබන්නේ මැරෙන්නේ ය. ඔහුට ජීවිතය දෙන්න. නැවත නොලබන්නේනම් ජීවත් නොවේ. වසරතුනක් මගේ ගෙයි බැලමෙහෙ කරණු. එවිට ඔහුට බත්පත දෙන්නෙමි. ගම්වැසියෝ එය අසා එසේ වේවායි යාළුවාට කියා අඹු දරුවන් අත්හැර - බත් පතක් වෙනුවෙන් අවුරුදු තුනක් සේවාකම් කරන්නෙමියි සිටුවරයාගේ ගෙට පිවිසියේය. හේ බැලමෙහෙ කරමින් සියළු කටයුතු හොඳින් කළේය. නිවසේ හෝ වනයේ හෝ දවල්හෝ රාත්‍රි හෝ කළයුතු සියළු කටයුතු කලාසේ පෙනුනි. බත් බැලයායයි මුළු නුවරම ප්‍රකට විය.

ඉක්බිති දිනය පිරුණ විට සේවකයා කිවේය. සේවකයාගේ නියමිත දිනය පිරුනි. ඔහු විසින් දුෂ්කරවූ දෙයක් කරණ ලදී. වසර තුනක් බැලමෙහෙ කරන්නා එක ක්‍රියාවකදු නොපිරි හෙලා කරණ ලදී. ඉක්බිති සිටුවරයා තමාගේ උදේ ආහාරය සඳහා දෙදහසක්ද රාත්‍රි ආහාරය සඳහා දහසක් දයි තුන් දහසක්දී මෙසේ කීවේය.

අද මට කළයුතු සේවය (මෙහෙය) ඔහුටම කරන්න. මෙසේද කියා එක් සිතුමිණි රුවනක් නම් ප්‍රිය භාර්යාවයි. අවශේෂ ජනයා අද ඔහුව පිරිවරා ගන්නැයි කියා සියලු සම්පත් පවරා දුනි. ඔහු (ගැමියා) සිටුවරයාගේ නාන ජලයෙන් එම ජල කොටුවේ සිට ස්නානය කර ඔහුගේම නාන ඇඳුම් ඇඳ එම අසුනේම වාඩිවිය. සිටුවරයාද නුවර අණබෙර වාදනය කරවා බත් බැලයා සිටුවරයාගේ නිවසේ වසර තුනක් බැලමෙහෙ කොට බත් පත ලැබුවේය. ඔහුගේ ආහාර අනුභව සම්පත්තිය බලන්න. මිනිස්සු - ඇඳන් මත ඇඳන් තබා නැග බලති. බැලු බැලු තැන කම්පන ස්වරූපයක් දක්නට ලැබුනි. නළුවන් පිරිවරා සිටියහ. ඔහු අත බත් බඳුන වඩා තැබුහ. ඉක්බිති ඔහු අත සෝදන වේලාවේ ගන්ධමාදන පර්වතයේ එක් පසේ බුදුවරයාණ නමක් සත්දිනක් සමවතින් නැගිට අද කොහි පිඬුපිණිස යන්නේ දයි සිහිකරමින් බත් බැලයා දුටුවහ. ඉක්බිති ඔහුට මෙබඳු අදහසක් විය. මේ තැනැත්තා වසර තුනක් බැලමෙහෙකර බඳුනක් ලැබුවේය. මොහුට ශ්‍රද්ධාව ඇත්තේදයි සිහිපත් කරන්නේ ඇතිබව දැන ඇතැම් අයට ශ්‍රද්ධාව ඇතද සංග්‍රහ කරන්නට නොහැකි වෙති. මොහුට සංග්‍රහ කරන්නට හැකිවන්නේදයි විමසා ඔහුට හැකි වන්නේයයිද මට සංග්‍රහ කර මහා සම්පත් ලබන්නේයයි දැන සිවුර පෙරවා පාත්‍රය ගෙන අහසට පැන නැගී පිරිස් අතරින් පැමිණ ඔහු ඉදිරියේ සිටිමින් තමන් පෙනෙන්නට සැලැස්වීය. ඔහු පසේ බුදුන් දැක මෙසේ සිතුවේය. මම පෙර නොදුන් බැවින් මෙපමණ බත් පතක් සඳහා වසර තුනක් අන්‍යයගේ ගෙදරක බැලමෙහෙ කළෙමි. දැන් මේ බතින් එක් දිනක් රැකෙමි. ඉදින් මම මෙය ආර්යයන් වහන්සේට දෙන්නෙනම් නොයෙක් කල්ප කෝටි දහස් ගණනාවක් මාව රකින්නේය. ආර්යයන් වහන්සේටම එය දෙමියි වසර තුනක් බැල මෙහෙ කර ලැබූ බතින් එක් පිඩක් හෝ කටේ නොතබා තෘෂ්ණාව දුරුකොට තමන්ම භාජනය ඔසවා පසේ බුදුන් වෙත ගොස් භාජනය අනෙකකුගේ අත තබා පසඟ

පිහිටුවා වැඳ භාජනය වම් අතින් ගෙන දකුණතින් උන්වහන්සේගේ පාත්‍රයේ බත් හෙළීය. පසේ බුදුහු බත් අඩක් ඉතිරි වූ විට පාත්‍රය අතින් වැසූහ. ඉක්බිති ඔහු බුදුන්ට මෙසේ කීවේය. ස්වාමීනි එක් කොටසකින් දෙකක් කරන්නට නොහැකිය. මට මෙලොවින් සංග්‍රහ නොකරන්න පරලොවින් සංග්‍රහ කරන්න. කිසිවක් ඉතිරි නොකර සියල්ලම දෙමි. තමන්ට ටිකක් හෝ ඉතිරි නොකර දීම නිරවශේස දානය නම් වෙයි. එය මහත්ඵල වන්නේය. ඔහු මෙසේ කර නැවතද මෙසේ කීවේය. ස්වාමීනි මම එක් බත් පතක් නිසා වසර තුනක් බැලමෙහෙ කළෙමි. එනිසා දුක් වින්දෙමි. මේ නිසා මේ දානයෙන් උපන් සියළු තැන යහපතක්ම වේවා. ඔබ වහන්සේට මෙලොව ප්‍රතිඵලම වේවා. පසේ බුදුවරයන් වහන්සේ එසේ වේවා සිතුමිණ සේ සියළු කැමති දේ දෙන මැණිකසේද සිතේ අදහස් සියල්ල පුන් සඳ සේ ද සපිරේවායි අනුමෝදනා කරන්නේ

සිතන පතන දේ ඔබට	ලැබේවා
පුන් සඳ සේ සව් ඉසුරු	වැඩේවා
කැමති කැමති හැම දෙයම	ලැබෙවා
සියලුම අදහස් නිති	සපිරේවා
සිතුමිණි රුවනක් අත ඇත්තෙකු සේ	
සිතන පතන හැම දෙයින්	පිරේවා

මෙසේ දේශනාකර - මම ගන්ධමාදන පර්වතයට යනතුරු මේ මහ ජනතාව බලාසිටීවායි අදිටන් කොට අහසින් ගන්ධමාදන පර්වතයට වැඩම කළහ. මහජනයාද උන්වහන්සේ දෙස බලමින් සිටියහ. උන්වහන්සේ එහි ගොස් එම පිණ්ඩපාත දානය, පන්සියයක් පසේ බුදුවරයින්ට බෙදා දුන්නේය. සියල්ලෝම තම තමන්ට ප්‍රමාණවත් තරම් ගත්හ. අල්පවූ පිණ්ඩපාතය කෙසේ ප්‍රමාණවත් වේදයි නොසිතිය යුතුය. අචින්තෙය්‍ය කරුණු සතරෙකි. එලෙසම පසේ බුද්ධ විෂයද අචින්තෙය්‍යහ මහජනයා පසේ බුදුවරුන්ට බෙදාදෙනු දැක සාධුකාර දහසක් පැවැත්වූහ. හෙන සියයක් වැටෙනසේ මහ හඬ විය. මේ අසා ගන්ධ සිටුවරයා සිතුවේය බත්බැලයා මා දුන් සම්පත් දරනු නොහැකිවිය.

එනිසා මහජනයා අපහාස කරමින් එක්රැස්වී කෑගසති. ඔහු එම පුවත දැනගනු සඳහා මිනිසුන් යැවීය. ඔවුන් පැමිණ සම්පත් දරන්නෝනම් එලෙසවේවායි සිතා නාදකරණ බව පැවසුහ. සිටුවරයා එය අසා පස්වනක් ප්‍රීතියෙන් ස්පර්ශ වූ ශරීර ඇතිව අහෝ දුෂ්කරවූ දෙයක් විය. මම පෙමණ කලක් මෙබඳු සම්පතකින් කිසිවක් දෙන්නට නොහැකි වියයි ඔහුව කැඳවා ඔබ මෙබඳු දෙයක් කළා සැබෑ දැයි විමසා එසේය ස්වාමීනි යයි කිව්ට

දහසක් ගෙන ඔබේ දානයේ පිං මටද දෙන්නැයි කීවේය. ඔහු එසේ කළේය. සිටුවරයාද තමා සතු සියල්ල දෙකට බෙදා දුන්නේය. සතර සම්පදානම් - වත්ථු සම්පදා - පච්චය සම්පදා චේතනා සම්පදා ගුණාතිරේක සම්පදා එහි නිරෝධ සමවතින් නැගිසිටි අර්හත් හෝ අනාගාමී හෝ දක්ඛිණාව පිදියයුතු උතුමා වත්ථු සම්පදා නම් වෙයි. ප්‍රත්‍යයන්ගේ ධර්මයෙන් සමයෙන් උපන් ප්‍රත්‍යය සම්පදාවනම්. දානයට පෙරද - දන්දෙන අතරද දානයෙන් පසුවද අවස්ථා තුනේදී පිරිසිදු චේතනාවෙන් සොම්නස් සහගත ඤාණ සම්පයුත්ත ස්වභාවය චේතනා සම්පදානම්. දක්ඛිණාව සඳහා සමාපත්තියෙන් නැගිසිටිබව - ගුණාතිරේක සම්පදා නම්වේ. මෙහිදී ඛ්ණාශ්‍රව හෝ පසේ බුදුබව දක්ඛිණෙය්‍ය නම් බැලමෙහෙ කොට ලැබුනිසා ප්‍රත්‍යය ධර්මයෙන් දෙය්‍ය වෙයි මුල - මැද - අග තුන්කල්හි පිරිසිදු වූ සිත චෙතනා සම්පදා නම් මේ සතර සම්පත් නිපන් මේ ආනුභාවයෙන් මෙලොව දීම මහා සම්පත් පැමිණෙති. එනිසාම ඒ සිටු වරයාගෙන් සම්පත් ලැබුනි. ඉන් පසුව රජුද මොහු විසින් කරණ ලද කර්මය අසා කැඳවා දහසක් දී පිං ගෙන සතුටු සිතින් මහත් භෝගසම්පත් දී සිටු තනතුරක් දුන්නේය. ඇති හේ **හත්ත හනික සෙට්ඨී** නමින් ප්‍රකට විය.

ඔහු ගඩ සිටුවරයා සමග මිත්‍රවී එකට අනුභව කරන්නේ කමින් බොමින් නිදමින් දිවි ඇති තෙක් සිට ඉන් චුතවුයේ දෙව්ලොව ඉපිද එක් බුද්ධාන්තරයක් දිව්‍යමය සම්පත් අනුභව කර මේ බුද්ධෝත්පාද කාලයේදී සැවත් නුවර සැරියුත් තෙරුන්ට උවටැන් කරණ කුළයක ප්‍රතිසන්ධි ගත්තේය. ඉක්බිති ඔහුගේ මව ලබන ලද ගබ් පෙලහර ඇත්තේ දින කිපයකින් මෙබඳු දොළදුකක් ඇතිවිය. පන්සියයක් භික්ෂුන් සමග සැරියුත් මහ තෙරුන්ට සියගණන් රස බොජුනක් දී කහපාට වතත් ඇඳගෙන රන්

බදුනක් ගෙන භික්ෂූන් වහන්සේලාගේ අසුන් කෙළවර හිඳ එම භික්ෂූන් වහන්සේලා ඉතිරිකරණ ලද. (ඉඳුල් බත් කන්නෙමියි) යන දොළඳුක ඇතිව - එසේම කර දොළඳුක දුරු කර ගත්තාය. ඇය සෙසු මංගල අවස්ථා වලදීද එලෙසම දන් දී දරුවකු බිහිකර නම් දෙන දිනයේදී ස්වාමීනි මගේ පුතුට සික්ඛාපද දෙන්නැයි තෙරුන්ට පැවසුවාය. තෙරුන් වහන්සේ මොහුගේ නම කුමක්දැයි විමසුහ. ස්වාමීනි මේ දරුවා පිළිසඳගත් තැන්සිට මේ නිවසේ කිසිවෙකුටත් දුකක් නම් නොවීය. එනිසා මොහුට සුඛුම කුමාර යන නම යෙදිය යුතුයයි පැවසුවිට එම නම යොදා පන්සිල් පද දුන්නේය. එදින මවට මම පුතුගේ අදහස නොබිඳිමියි සිතක් ඇතිවිය. ඇය ඔහුගේ කණ විදින මංගල අවස්ථාවලදී ද එසේම දන් දුන්නාය. කුමරුද වයස අවුරුදු හතේදී මෑණියනි මම තෙරුන් ලඟ පැවිදි වීමට කැමතියයි පැවසුවේය. හොඳයි දරුව මම ඔබගේ ප්‍රාර්ථනය නොබිඳිමියි තෙරුන්ට ආරාධනා කොට ස්වාමිනි මගේ පුතු පැවිදිවීමට කැමතියි මම ඔහු සවස විහාරයට ගෙන එන්නෙමියි පැවසුවාය.

තෙරුන් වහන්සේ උනන්දුකර ඤාතීන්ට දැනුම්දී රැස්කරවා මගේ පුතුට ගිහිකාලයේ කළයුතු වතාවන් අදම කරමියි කියා පුතු සරසා මහත් සිරිසරින් යුතුව විහාරයට ගෙන ගොස් තෙරුන්ට පාවා දුන්නාය. තෙරුන්වහන්සේද දරුව පැවිදිවීමනම් දුෂ්කරය. පැවිදිවීමට කැමතිදැයි විමසුවෝය. ස්වාමීනි ඔබ වහන්සේගේ අවවාද රකිමි. පැවසුවිට කමටහනක් දී පැවිදි කළහ.

ඔහුගේ දෙමාපියෝ පැවිදි තැනැත්තාට සත්කාර කරන්නේ ඇතුළු විහාරයේම දින හතක් බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට සියගණනින් රස අහරදී සවස තමන්ගේ ගෙට ගියහ. අටවැනි දින සැරියුත් තෙරුන් භික්ෂුසංඝයා ගමට පිවිසිවිට විහාරයේ කළයුතු වතාවත් කොට සාමණේර ලවා පා සිවුරු ගෙන්වාගෙන ගමට පිඬුපිණිස නික්මුණහ. අතරමගදී සාමණේරයන් වහන්සේ දියාලුවන් ආදීන් දක පණ්ඩිත සාමණේරයන් ලෙසට නොයෙක් ප්‍රශ්න විමසුහ. තෙරුන් වහන්සේද එලෙසටම විසඳුහ. සාමණේරයන් මම කරුණු අසා ඉදින් ඔබ වහන්සේගේ පාසිවුරු මගෙන් ගන්නේනම් මම නවතින්නෙමියි කියා තෙරුන්වහන්සේ ඔහුගේ අදහස නොබිඳ පාසිවුරු ගෙනෙන්නැයි ලබාගෙන සිටිවිට තෙරුන් වැඳ නවතිමින් ස්වාමීනි මට ආහාර ගෙනෙනවිට සත රස ආහාර ගෙනත් දෙන්නැයි පැවසුවේය.

මම කොහින් ලබන්නේද? තමන්වහන්සේගේ පිතෙන් නොලැබෙන බව පැවසුවිට තමන්ගේ පිතෙන් ලැබෙනබව පැවසුවේය. ඉක්බිති තෙරුන් වහන්සේ යතුර දී ගමට පිඬුපිණිස වැඩම කලහ.

ඒ සාමනේරයන් වහන්සේ විහාරයට අවුත් තෙරුන්ගේ කාමරය විවරකර - නැවත දොරවසා තමන්ගේ සිරුර පිළිබඳ ඤාණයට බැස වාඩිවිය. ඔහුගේ ගුණ තේජසින් ශක්‍ර දේවේන්ද්‍රයාගේ අසුන උණුසුම්විය. සක්දෙවිඳු මේ කුමක් දැයි විමසන්නේ සාමණේරයන් දැක සුබ සාමණේර තුමාගේ උපාධ්‍යයන් වහන්සේට පා සිවුරු දී සමණ දහම් කරන්නට විධි නැවතුනි. මාවිසින් එහි යායුතුය වෙයි. සිතා සතරවරම් මහරජවරු කැඳවා දරුවනි යන්න. විහාරය ආසන්න වනයේ නරක ශබ්ද කරණ පක්ෂින් පළවා හරින්නැයි උනන්දුකළේය. ඔවුන් එසේ කොට හාත්පස ආරක්ෂාව සැලසුහ. සඳහිරු දෙදෙනා තමන්ගේ විමානවලටවී සිටින්නැයි අණකළේය. ඔවුන්ද එසේ කළහ. තමන්ද ස්ථානයේ සිට ආරක්ෂාව සැලසිය. විහාරයේ සිටි සාමණේරයන් වහන්සේ එකඟ සිතින් විදසුන් වඩා මාර්ග ඵලයන්ට පත්වුනි. සාමණේරයන් වහන්සේ සතරස භෝජනය ගෙන ඒමට තෙරුන්ට තීහෙයින් කාගේ නිවසින් ලබාගත හැකිදැයි බලන්නේ එක් යහපත් අපේක්ෂා ඇති කුළයක් දැක එහි ගොස් ස්වාමීනි ඔබ වහන්සේ විසින් යහපතක් කරණ ලදි. අද අපේ නිවසට වඩින්නැයි කියා සතුටු සිතින් පාත්‍රය ගෙන වඩාහිඳුවා කැඳ කැවිලි ආදිය දී දානය වළඳන තෙක් ධර්ම කථාවක් ඉල්ලා සිටියෙන් සිහි කටයුතු දහැමි කථාවක් කර කාලය ගැන සලකා දේශනය නිමාකළහ. ඉක්බිති උන්වහන්සේට සතරසභෝජනය පිළිගන්වා සිටිවිට එය රැගෙන යනු කැමති බව දැන තෙරුන් වහන්සේට ස්වාමීනි මෙහි සිට වළඳන්න. පසුව ගෙනයාම සඳහා දෙන්නෙමැයි කියා තෙරුන්ට වැළඳවීය නැවත දෙවනුව පාත්‍රය පුරා සතරස භෝජනය බෙදුහ. තෙරුන් වහන්සේ එය ලබාගෙන සාමණේරයන් කුසගින්නේ සිටින්නේයයි සිතා වහවහා වැඩම කළහ. එදවස බුදුරජාණන් වහන්සේ උදැසනම නික්මී ගඳ කිළියේ සිටිමින්ම ආවර්ජනා කළහ. අද සුබ සාමණෙරයන් වහන්සේ උපාධ්‍යායන් වහන්සේට පාත්‍රා සිවුරුදී මහණ දම් කරන්නෙමියි නැවතුනේ ඔහු කාර්යය සම්පූර්ණ වුවේදැයි බලන්නේ මාර්ගඵල තුනට පත්වූ බව දැක අද දින ඔහුට රහත් වීමට හැකිදැයි තවදුරටත් විමසුවේ රහත් බවට පත්වන බව දැන බුදුරජාණන්

වහන්සේ සැරියුත් තෙරුන් දානය ලබාගෙන වහ වහා විහාරය බලා එනබව දැන රහත් වීමට පෙර බාධාවක් වන නිසා තමන් වහන්සේ කල් ඇතිව ගොස් දොරකඩ සිටිය යුතුයයි සිතා ගඳ කිළියෙන් නික්මී ගොස් සාමණේරයන් සිටි ආරාමය දොරටුවේ සිට ආරක්ෂාව සැලසුහ.

සැරියුත් තෙරුන් වහන්සේද සතරස භෝජනය රැගෙන වැඩම කළහ. පෙර කී ලෙසටම ප්‍රශ්න සතර විසඳා අවසන සාමණේරයන් වහන්සේ අර්හත්වයට පත්විය බුදුහු සැරියුත් තෙරුන් අමතා සැරියුත් යන්න. සාමණේරයන්ට බත් දෙන්නෙයි පැවසුහ. තෙරුන් වහන්සේ ගොස් දොරට තට්ටුකළහ. සාමණේර නික්මී උපාධ්‍යායන් වහන්සේට වතාවත්කර බත් කිස කරන්නැයි කීකළ තෙරුන්ට දානය අනවශ්‍ය බව දැන සත් වයස් වූ කුමරු එකෙනෙහිම රහත්බවට පත්වූයේ නිවන ප්‍රත්‍යවේක්ෂා කරමින් බත් කිස කර පාත්‍රය සේදුවේය. එම අවස්ථාවේදී සතර වරම් රජවරු අරක්ෂාව විසරවූහ. හිරු අහස් මැද පසුකරව - සවස් කාලය දක්වීය. භික්ෂූන් වහන්සේලා සවස් භාගය ඇතිවිය. සාමණේරයන් වහන්සේද දන් බත්කිස නිමවීය. කුමක් නිසා අද දිවාකාලය වැඩි වීද. බුදුහු පැමිණ මහණෙනි මා පැමිණීමට පෙර කිනම් කථාවකින් යුතුව සිටිනේදැයි විමසුහ.

භික්ෂූන් වහන්සේලා පිළිතුරු දෙමින් ස්වාමීනි අද පෙරවරුව බලවත්විය. (වැඩිවිය) සවස් කාලය අඩුවිය. සාමණේරයන් වහන්සේ දන් වළඳා අවසන්විය. එමෙන්ම හිරුද මධ්‍යාහ්නයෙන් නික්මී තිබෙනු දක්නට ලැබෙයි. යනුවෙන් පැවසුවිට මහණෙනි එසේ සිදුවේ. පින්වත් අය මහණ දම් කරණවිට අද සතරවරම් රජවරු හාත්පස ආරක්ෂාව සැලසුහ. සඳහිරු දෙදෙන විමන්වලටවී සිටියහ. සක්දෙව් රජ දොර අගුලු වෙත ආරක්ෂාව ගත්හ. මම ද දොර කොටුවේ සිට ආරක්ෂාව සැලසිමී. අද සුබ සාමණේරයන් වහන්සේ දියාලුවෝ ජලය ගෙන යන අයුරුන් වඩුවෝ ලී ඇද අරින අයුරින් - හිවඩුවෝ හි ඇද අරින අයුරින්ද වඩුවො ඇද නැති රිය සක හදන අයුරින් දැක බලා තම සිත දමනය කර රහත් බවට පත්වීයයි පවසා මේ ගාථාව පැවසුහ.

ගොවියෝ දිය ගෙනෙති නමනට රිසි	තැනට
හියේ ඇද හරි කම්මල්කරු	යසට
වඩුවෝ ලී නමති සක හසුරන	ලෙසට
දමනය කරයි සිත සද්දන	සිව්මගට

දිය ඇලි කපන්නෝ කැමති තැනට ජලය ගෙනයති. හී වඩුවෝ කැමතිලෙස හීය ඇද යවති වඩුවෝ දැව රිසිසේ නවාගනිති. සුචව වුවෝ තම සිත සුදුසු ලෙස හසුරුවා ගනිති.

එහි - සුබ්බනා -යනු සුවසේ අවවාද අසන අනුශාසනා පිළිගන්නා අයයි. ඉතිරිය පෙර කී පරිදිය. දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පත්වුහ.

සුබ සමණේර කථාපුවත
දහවැනි වර්ගය නිමි.

දසවැනි දණ්ඩ වර්ගය නිමියේය.

11-1

"කොනුහාසො කිමානන්දෝ" යන මෙම ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම් වැඩසිටියදී විශාඛාවගේ යෙහෙළියන් නිමිති කරගෙන දේශනා කළහ.

සැවැත් නුවර පන්සියයක් කුළ පුත්‍රයෝ තම තමන්ගේ භාර්යාවන් පන්සියයක් අප්‍රමාදීව කටයුතු කරණ අයලෙසට හඳුන්වා විශාඛා මහා උපාසිකාවට පවරා දුන්හ. මෙම කාන්තාවෝ විශාඛාව උයනට හෝ විහාරයට යනවිට ඇය සමගම යති. මෑලා එක් අවස්ථාවක දින හතක් සුරා උත්සවය පවත්වන්නේ යයි දැනුම් දුන් පසු තම තමන්ගේ සාමි පුත්‍රයන්ට රා බීමට අවස්ථාව ලබා දුන්හ. ඔවුහු දින හතක් රා බී මධුපානෝත්සවය අවසන්කර අටවැනි දින වැඩ සඳහා යාමට අණබෙර නාදකළ විට ඔවුනොවුන්ගේ කර්මාන්ත සඳහා නික්ම ගියහ.

මේ ස්ත්‍රීනු ද අපගේ ස්වාමීවරුන් ඉදිරියේ සුරාපානය කළ නොහැකියයි ද ඉතිරිවූ සුරා ඇතිහෙයින් පානය කරමුයි කියා විශාඛාව වෙත ගොස් ආර්යාවනි උයන් නැරඹුමට යමුයි යෝජනාකර හොඳයි මෑණිවරුනි ! කළයුතුදෑ කර පැමිනෙන්නැයි පැවසුවිට, පසුව පැමිණ විශාඛාව සමග ගොස් සැඟවී රහසිගතව සුරා පානය කර මත් වී හැසිරුනාහ. විශාඛාව ද මොවුන් විසින් අයුතු දෙයක් කරණ ලදී. දැන් බුදුන්ගේ ශ්‍රාවිකාවූ විශාඛාව රා බී හැසිරෙනියි තීර්ථකයෝ ද ගර්හා කරන්නේ යයි සිතා එම ස්ත්‍රීන්ට මෙසේ කිවාය. මෑණිඹරුනි ඔබලා අයුතු දෙයක් කරණ ලදී. මටද අපකීර්තියක් ඇතිවිය. ඔබලාගේ ස්වාමීවරු ද කිපෙනු ඇත. දැන් කුමක් කරමුද? ආර්යාවනි අපි ගිලන් වූ බවත් පෙන්නා සිටිමු. එසේ නම් එලෙස ගිලන්වූ බවක් පෙන්නා සිටුව්, අෑලා නිවෙස්වලට ගොස් ගිලන්වූවන් සේ සිටියහ. ඇලාගේ ස්වාමී පුත්‍රවරු - එකිනෙකාගැන විමසා සියළු දෙන ගිලන් බව අසා - මෑලා ඉතිරිවූ සුරා බොන්නට ඇතැයි සලකමින් ඔවුන්ට තලා පෙලා හිංසාවන් කළහ. ඔවුන් ඊට පසුව ද මධුපාන උත්සවයකදී රාබොනු කැමතිව විශාඛාව වෙත එළඹ ආර්යාවනි අපව උයනට ගෙනයන්නැයි කියා සිටිවිට.

නුඹලා පෙරදින අපකීර්තියක් ඇතිකළහ. යන්න මම නම් නුඹලා ගෙනයන්නේ නැතැයි ඇය පැවසුවාය. එසේ කියා ප්‍රතික්ෂේප කළවිට මෙවර එලෙස නොකරමියි පොරොන්දු දී නැවත ඇය වෙත පැමිණ මෙලෙස කීහ. ආර්යාවනි අපි බුද්ධ පූජා කරන්නට කැමැත්තෙමු. අපව විහාරයට ගෙනයන්නැයි කිවාහුය. හොඳයි - මෑණියෙනි විහාරයට යාම වටියි. වත්‍ාවත් කරමු යනුවෙන් පැවසුවාය. ඈලා මල්ගොමුවල සුවඳ ද්‍රව්‍ය හා මල් ගෙන රා පිරුණ කළ ගෙන එක් අතකින් එල්ලාගෙන ලොකු රෙදි කඩකින් වසාගෙන විශාඛාව සමග විහාරයට ගියාහුය. විහාරයට පිවිසෙන අතරතුර අහුමුලුවට ගොස් මුට්ටි වලින් රා බී භාජන විසිකර ගොස් දම්සභා මණ්ඩපයේදී බුදුන් ඉදිරියේ වාඩිවූහ. විශාඛා මහෝපාසිකාව ස්වාමීනි මෑලාට ධර්ම දේශනා කරන්නැයි පැවසුවාය. ඈලාද සුරාමතින් යුතුව සැලෙන වැනෙන සිරුරින් නටන්නෙමු ගයන්නෙමු යයි සිතූහ. අනතුරුව මාරකායික දේවතාවියක් බුදුන් ඉදිරියේ විකාර රඟදක්වන්නෙමියි සිතා ඈලාගේ සිරුරුවලට ආවේෂ වුවාය. එම කාන්තාවන් අතරින් එකියක්, ශාස්තෘන් වහන්සේ ඉදිරිපස - අත්පුඩි ගසා සිනා සීමට ද තව එකියක් නැටීමට ද පටන් ගත්හ. බුදුහු මේ කුමක්දැයි විමසා මාරකායික දෙව්දුවගේ ආවේශවීම දැක මොවුන්ට මාරකායික දෙව්දුවට ඉඩදීම නුසුදුසු යයි සිතා සංවේග ඇතිකරලිම සඳහා ඌර්ණ රෝම ධාතුවෙන් රශ්මිය පිටකළහ. එකෙණෙහි අන්ධකාර මවාලූහ. මරණබියෙන් ඔවුහු බිය පත්වූහ. එනිසාම කුසතුළ රා වියලී ගියේය. බුදුහු අසුනේ සිටියදීම අතුරුදහන්ව මහමෙර මුදුනේ සිට ඌර්ණ රෝම ධාතුවෙන් රශ්මිය විහිදවූහ. එකෙනෙහි චන්ද්‍රයන් දහසක් පැයුලෙස ආලෝකමත් විය. අනතුරුව එම ස්ත්‍රීන් අමතා තෙපි මා ඉදිරියට එනවිට පමාවුවන් ලෙසට පැමිණීම සුදුසු නොවේ. තොපගේ ප්‍රමාදී බව නිසා මාරකායික දේවතාවියට අවස්ථාව ලැබී අනුචිත ස්ථානයේ දී සිනාසීම් ආදිය කරවූවාය. දැන් තොපගේ රාගාදි ගිනි නිවනු පිණිස උත්සහ කිරීම වටනේ යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

නිතර දැවෙනා නැවෙන කල්හී
කොහෙද සතුටක් කවර නැටුමක්
අඳුරු ලෝකෙන් එතෙර වන්නට
ඇයිද පහනක් නොදල්වන්නේ

එහි - **ආනන්දෝ** යනු සතුටයි මෙසේ කියන ලද්දේ වේ. මෙලොව ජීවිතයේදී රාග - ආදී එකළොස් ගින්නෙන් නිතර **පජ්ජලිතෙ** දැවෙන විටදී **කොනු** ඔබලාට කිනම් සිනාවෙක් ද - සතුටක්ද? මෙබඳු දැ නොකළයුතු දැ නොවේද? අෂ්ට වස්තුක අවිද්‍යා අන්ධකාරයෙන් වෙළුනාවු තෙපි එම අවිදු අඳුර දුරුකර ගැනීම පිණිස කුමක් නිසා නැණ පහන නොසොයවිද? නොකරවිද? ධර්මදේශනාවසානයේ පන්සියයක් වූ ඒ ස්ත්‍රීහු සෝවාන් ඵලයෙහි පිහිටියාහුය. බුදුහු ඔවුන් අචල ශ්‍රද්ධාවේ පිහිටි බව දැන මහමෙර මුදුනින් බැස බුද්ධාසනයෙහි වැඩ සිටියහ. අනතුරුව විශාඛාව මෙසේ පැවසුවාය ස්වාමීනි ! මේ ස්ත්‍රීහු පාපී සුරාපානය නිසා ඔබ වහන්සේ ඉදිරියේ මෙබඳු අශෝභන ලෙස හැසුරුනේයයි පවසා ස්වාමිනි මේ සුරා කවදා ඇතිවිදුයි විමසුවාය. බුදුහු අතීත කථාව ගෙනහැර දක්වා කුම්භ ජාතකය දේශනාකළ වදාළහ.

විශාඛා උවසියගේ පන්සියයක් යෙහෙලියන්ගේ කථා පුවතයි.

11-2

"**පඤ්ඤ විත්තකත**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ සිටියදී සිරිමා අබිසරුලිය නිමිති කරගෙන දේශනා කළහ.

ඇය රජගහනුවර සිටි රූමත් වෙසඟනක වූවාය. එක් කාලයක සුමන සිටු පුතුගේ භාර්යාව වූවාය. පුණ්ණක සිටුදියනිය වන උත්තරා උපාසිකාවට ඇය වරදක් කොට උරණවී සිට, පසුව ඇය සමා කරවාගෙන පහදනු සඳහා, ඇගේ නිවසේ භික්ෂු සංඝයා සමග කරණ ලද බත්කිසට අනතුරුව බුදුන් සමාකරවා එදවස බුදුරදුන්ගේ භුත්තානු මෝදනය අසා

> ක්‍රෝධය කෝප නොවීමෙන්ද - යහපත් බවින් අයහපතද
> ලෝභය දානයෙන්ද, සත්‍යයෙන් අසත්‍යයද ජයගන්න.

මෙම ගාථා දේශනයෙන් සෝවාන් ඵලයට පත්වුනි. මෙය කෙටි අදහසයි. විස්තරකථා ක්‍රෝධ වර්ගයේ අනුමෝදනා වර්ණනාවේ සඳහන්වේ. මෙලෙස සෝවාන්ඵලයට පත් සිරිමා අභිසාරිකාව දෙවන දිනට බුදුරජාණන් වහන්සේට ආරාධනාකර මහදන් දී සංඝයා වහන්සේලාට සළාක අට බතක් නිතර පුජාකළාය. මුළ පටන්ම නිතර භික්ෂූන් අටනමක් නිතර යති. ගිතෙල් ගන්න. දිකිරි ගන්නැයි මේ ආදිය කියා උන්වහන්සේලාගේ පාත්‍ර පුරවයි. එක්නමක් ලබන පිණ්ඩ දානය තුන්, හතර දෙනෙකුට ප්‍රමාණවත්වේ. දින පතා කහවනු සොළසක් වියදම් කරමින් පිණ්ඩපාතය දෙනු ලැබේ. ඉක්බිති එක් දිනක් එක් භික්ෂුවක් ඇගේ නිවසේ අටනමකට දෙන ආහාර පිණ්ඩදානය වළඳා යොදුන් තුනක් පමණ දුර විහාරස්ථානයකට වැඩමකළේය. අනතුරුව සවස තෙරුන්ට උවටැන් කරන්නෝ ඇවැත්නි කොහින් භික්ෂාව ගෙන වැඩමකලේද යනුවෙන් විමසූහ සිරිමා - උපාසිකාවගේ අධික බත් වැළඳූ බව උන්වහන්සේ පැවසූහ. ඇවැත්නි එම දානය මනාපයෙන් දෙන්නක්ද? ඇයගේ දානය වර්ණනා කළ නොහැකිය ඉතාම ප්‍රණීත ලෙස දානය දෙති. එක් භික්ෂුවක් ලබන දානය තුන් හතර දෙනෙකුටම ප්‍රමාණවත් වේ.

ඇගේ දානවස්තූන් දැකීමට උත්තරිතර වේ. එම කාන්තාව මේ මේ ආකාර යයි ඇගේ ගුණ කියයි. අනතුරුව එක් භික්ෂුවක් ඇගේ ගුණ කථාව අසා නොදැකම ඇයකෙරෙහි ස්නේහයෙන් බැඳුනි. එසේ ස්නේහයක් උපදවා ගෙන මා ඇය වෙත ගොස් දැකිය යුතු යයි තමන්ගේ වස් ප්‍රමාණය කියා එම භික්ෂුව සිටින බව දැන ඇවැත්නි හෙට එමනිවසේ ඔබ වහන්සේ සංඝථෙර වී බත් අටක් ලබන්නේයයි අසා එම අවස්ථාවේදීම පා සිවුරු ගෙන පිටත් වූයේද අළුයම අරුණ නැගෙනවිට සලාකයේ මුලට පැමිණ සිටියේ සංඝ ස්ථවිර බවට පත්වී ඇගේ නිවසේ දී අටයක බත් ලැබුවේය. යම් භික්ෂුවක් ඊයේ වළඳා පිටත්විද එම භික්ෂුව ගිය අවස්ථාවේදී ඇගේ සිරුරේ ආබාධයක් හටගත්තේය. එනිසා ආභරණ ගලවා තබා වැතිරුණාය. අනතුරුව අටකොටස් බත ලැබ වැඩමකළාවු භික්ෂූන් දැක සේවිකාවෝ ඇයට දැනුම් දුන්හ. එවිට ඇය - පාත්‍රය සියතින්ගෙන වාඩිකරවීමට හෝ දානය පිළිගැනීවීමට නොහැකිව දාසින්ට අණ කළෝය. යෙහෙළියෙනි ! තෙරුන්ගෙන් පාත්‍රය ලබාගෙන වාඩිකරවා - කැඳ පානයට දී කැවිලි වර්ග පිළිගන්වා බත් වළඳන අවස්ථාවේදී පාත්‍රය පුරවා දෙන්නැයි කිවාය.

ඇලා ආර්යාවනි යහපතැයි කියා භික්ෂූන් වහන්සේ ගෙතුලට කැඳවා කැඳ පොවා කැවිලි වර්ග පිළිගන්වා බත් වළඳන අවස්ථාවේදී පාත්‍රය බතින් පුරවා ඇයට (සිරිමා අබිසාරිකාවට) දැනුම් දුන්හ. ඇය මාව වත්තන් කරගෙන ආර්යන් වහන්සේලා වෙත වඳින්නට ගෙන යනලෙසට කිවාය. ඇලා විසින් භික්ෂූන් වෙත ගෙන යන ලද්දී වෙවුලන ගතින් භික්ෂූන් වැන්දාය. එම භික්ෂුව - වර්ෂ කෝටි ගණනක සිට රැස් කළ කෙළෙස් ඇත්තේ උකටලීව බත් අනුභව කළ නොහැකිව පාත්‍රය ගෙන විහාරයට ගොස් පාත්‍රය වසාතබා සිවුරු කොන අතුරා වැදහොත්තේය. ඉක්බිති එක් මිතුවු භික්ෂුවක් ඇවිටිලි කළේද වළඳවන්නට නොහැකිවිය. එම භික්ෂුව නිරාහාර වුවෙක් විය.

එදිනම සවස සිරිමා වෛශ්‍යාව අභාවප්‍රාප්ත වුවාය. රජතුමා බුදුන්වෙත පණිවුඩයක් යැවුවේය. ස්වාමීනි ! ජීවක වෛද්‍ය වරයාගේ නැගණිය වූ සිරිමාව කළුරිය කළාය. යනුවෙන් එහි සඳහන්විය. බුදුරජාණන් වහන්සේ මේ කරුණ දැන රජුට පණිවුඩයක් යැවුහ. එහි සඳහන් වූයේ සිරිමා දේහය-

ආදාහන කිරීමෙන් පළක්නැත. ඇගේ සිරුර අමුසොහට ගෙනගොස් බලු කපුටු ආදීන්ට කෑමට නොහැකි ලෙසට මෘත ශරීරය ආරක්ෂා කරන්න යනු වෙනි. රජතුමා ද එලෙස කළේය. පිළිවෙලින් මරණයට පත්වී දින තුනක් ගතවිය. සතරවැනි දින සිරුර ඉදිමුනි. නව දොරෙහි සැරව ගැලුරුනි. මුළු සිරුර බිඳුන බත් සැළියක් සේ විය. රජු නගරයේ ගෘහ ආරක්ෂකයින් හා ළඳරුවන් හැර සියළුදෙන එනලෙසටත් - සිරිමා වෛශ්‍යාවගේ මෘත සිරුර බැලීමට නොඑන අයට කහවනු අටක් දඩ නියමකරණ බවත් නියමකර අණ බෙර ලැබිය. බුදුරජාණන් වහන්සේ වෙතද බුදුන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා සිරිමාගේ මෘත ශරීරය නරඹන්නට එන්නැයි පනිවිඩ යැවිය.

බුදුහු භික්ෂූන්ට දන්වා ලූහ. ඒ තරුණ භික්ෂුව ද දින හතරක් කිසිවෙකුගේ වදන් නොපිළිගෙන නිරාහාරව නිදාසිටියේ ය. පාත්‍රයේ බත් කුණුවිය. පාත්‍රයේ මලකඩ ද මතුවිය. අනතුරුව වෙත එළඹ ඇවැත්නි, බුදුරජාණන් වහන්සේ සිරිමා ගේ මළ සිරුර බැලීම සඳහා යතියි පැවසුහ. ඔහු එසේ නිදාගෙනම සිරිමා යන වචනය ඇසුන විගස වහා නැගිට කුමක් කියන්නේදැයි විමසීය. බුදුහු සිරිමා දකින්නට වඩිනා බවත් යන්නේදැයි විමසුවිට ඔව් මමත් යන්නෙමියි බත් විසිකර පාත්‍රය සෝදා පැසේ දමාගෙන භික්ෂූන් සමග පිටත්විය. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් පිරිවරාගෙන එකත් පසෙක සිටියේය. භික්ෂු භික්ෂුණී සංඝයා පිරිවරාගෙන සිටි අතර අනෙක් පස උපාසක උපාසිකා පිරිස් සිටියහ. බුදුහු රජුන් ගෙන් විමසුවේය. මහරජ මෑය කිනම් තැනැත්තියක්ද? ස්වාමීනි ඇය ජීවකගේ සොහොයුරි වූ "සිරිමා"ය. මැය සිරිමා වද? එසේය ස්වාමීනි, එසේනම් සිරිමා දහසක් දී ගන්නැයි අණ බෙර යවන්නැයි පැවසුහ. රජු එසේ කළේය.

එකෙකුදු හා - හුම්- යන ශබ්දයක් නොකළේය. රජතුමා බුදුන්ට කිසිවෙක් නොගන්නේයයි පැවසීය. එසේ නම් මහරජ වටිනාකම අඩුකරන්නැයි පැවසුහ. රජු සිරිමාගේ සිරුර පන්සියයකට ගන්නැයි අණබෙර ලැවීය. කිසිවෙක් නොගන්නාබව දැක තුන් සියයකට ගන්නැයි ඉල්ලීය. අනතුරුව කහවනු විස්ස - දහය - පහ - පසුව එක් කහවනුවකටද මිළ කළේය. අඩකට - පාදයකට - මස්සකට හෝ ගැනීමට අකමැතිවිය. නොමිළයේ ගැන්නැයි බෙර ලැවීය. කිසිවෙකුගේ හා හුවක් නැතිවිය. රජු ස්වාමීනි නොමිළයේ

ගන්නෝ ද නැතැයි පැවසීය. බුදුරජාණන් වහන්සේ මහණෙනි බලන්න. මහජනයාට ප්‍රියවූ මේ කාන්තාව දිනකට මසුදහසක් ගෙවා පහස ලැබුහ. දැන් නොමිලයේ ගන්නෙක් ද නැත. මෙබඳු රූව ක්‍ෂයවීමට වැයවීමට පත්වී අනතුරුවූ සිරුර බලන්නැයි මේ ගාථාව පැවසුහ.

දහසක් ගෙවා දිනකට ඇය ළඟම වැටී
විසිතුරු ලෙසට සැරසුණු මේ සිරුරෙ ගැටී
කුණු වී සැරව නවදොරකින් ගලන හැටී
නරඹනු මැනැවි - අනිසය සිහි කරනු වටී.

මෙහි **චිත්තකතං** යනු වස්ත්‍රාභරණ මල්ලතු ආදීන්ගෙන් විසිතුරු කරණ ලද යන අරුතයි. බිම්බනති - දීර්ඝ ආදී ඒ ඒ තැන ආ ප්‍රත්‍ය ඇත්තා වූ අරුකායං නව දොරටුවකින් කුණු වැහෙන්නාවූ නමුත් සිත් ඇඳ බැඳගන්නා වූ මේ සිරුරේ තිරබවක් නැත.

සමුස්සිතං - ඇට කැබලි තුන්සියයකින් යුතු ආතුරං සෑම කල්හිම ඉරියව් පරිහරණයේදී නිතර නිතර රෝගාබාධ යන්ට ගොදුරු වන්නාවූ **බහුසඞ්කප්පා** - මහ ජනයා බොහෝ සේ රූප කායෙහි බැඳී යන්නාවූ - **යස්සනත්ථි ධුවංඨිති** - යනු යමක් කෙරෙහි ස්ථාවරව හෝ ස්ථිර බවක් නැත් ද ඒකාන්තයෙන් බිඳෙන විසිරෙන වැනසි යන ස්වභාවය බලන්න. යන අරුතයි.

දේශනාව අවසානයේ අසුහාර දහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය විය. ඉහත කී භික්ෂුවද සෝවාන් ඵලයෙහි පිහිටියේය.

දෙවැනි සිරිමා පුවතයි

11-3

"**පිරිජිණ්ණ මිදං** " යන මෙම ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී උත්තර නම් භික්ෂුණියක් නිමිත්තකරගෙන දේශනා කළහ.

තෙරණිය අවුරුදු විසි හතක්ම පිඬුසිඟා ලබන ලද පිණ්ඩපාත ඇත්තී - අතුරුවිථියේදී එක් භික්ෂුනමක් දැක පිණ්ඩපාතය දෙන්නදැයි විමසා ප්‍රතික්ෂෙප නොකළ බව නිසා සියළු දෙය දී නිරාහාරව සිටියාය. මෙලෙස දෙවැනි දිනයේදී ද තුන්වැනි දිනයේදීද එම භික්ෂූන් වහන්සේටම එම ස්ථානයේදීම බත් දන් දී නිරාහාරව සිටියාය.

සිව්වැනි දිනයේදී ඇය පිඬුපිණිස යන්නී එක් බාධාසහිත තැනකදී බුදුරජාණන් වහන්සේ දැක අයිනකට එල්ලෙන තම සිවුරු කොණ පැහී සිටගෙන සිටීමට නොහැකිව පෙරළී වැටුනාය. බුදුරජාණන් වහන්සෙ ඇය වෙත වැඩමකරවා සොහොයුරිය ඔබේ ආත්මභාවය (සිරුර) දිරාගොස්ය නොබෝ කලකින්ම බිඳෙන්නේයයි පවසා මෙම ගාථාව දේශනාකළහ.

ලස්සණ දැකුම්කළු මේ සුදු සිරුර	**ඔබේ**
රෝදුක්වලට නිතරම ඉඩ තබනු	**ලැබේ**
කුණුවන, දිරන, බිඳෙන ගති එමට	**තිබේ**
එය මරණයෙන් කෙළවර වෙයි සිතනු	**ඉබේ**

මෙහි අරුත - නැගණිය **ඉදං** ඔබගේ සිරුර නම්වූ **රූපං** රූපය මහළු බැවින් **පරිජිණ්ණං** - දිරා යයි. මෙම සිරුර සියළු රෝගා බාධයන්ට වාසස්ථාන වන බැවින් **රොගනිඩ්ඩං** නම් වේ. යම්සේ තරුණවූ හිවලෙක් වූ ඡරසිඟාල නමින්ද තරුණවුද රසකිඳ වැල තිලතා නමින්ද හැඳින්වෙයි. එමෙන්ම එදින උපන් රන්වන් වූ රූව වැගිරෙන හෙයින් පුතිකාය නම් **පභඞ්ගුරං** - මේ කුණුකය ඔබේ සිරුරට සමාන වේ **භිජ්ජති** නොබොකලකින්ම බිඳෙන්නේය. යනුවෙන් දැනගත යුතුය. කුමක් නිසාද? **මරණන්තං හි ජීවිතං** එහෙයින් සියළු සත්ත්වයින්ගේම ජීවිත කාලය මරණයෙන් කෙළවරවේ

යන වදන කියන ලදී. දහම් දෙසුම අවසානයේ එම තෙරණිය සෝවාන් ඵලයට පත්වූවාය. මහජනයාටද ඉතා සාර්ථක දම්දෙසුමක් විය.

උත්තරී තෙරණියගේ පුවතයි.

11-4

"**යානි මානි**" යන මෙම ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී අධිමානික (අධිකමානය ඇති) භික්ෂූන් සත්සියයක් දෙන නිමිති කරගෙන දේශනා කළහ.

පන්සියයක් භික්ෂූන් වහන්සේලා බුදුන්වෙතින් කර්මස්ථාන ලබාගෙන අරඤ්ඤයට පිවිස මහත් උත්සාහයෙන් වෙහෙසී. ධ්‍යානයක් උපදවාගෙන කෙළෙස් නොමැති හෙයින් අපගේ පැවිදිවීමේ අරමුණු ඉටු වුයේයයි තමන් ලද ගුණය බුදුරදුන්ට දන්වමු යයි පැමිණියාහුය.

බුදුරජාණන් වහන්සේ ආවාසයෙන් පිටත දොරටුවේදීම ආනන්ද තෙරුන්ට මේ පැමිණි භික්ෂූන් - ආරාමය තුළට පිවිස මා දැකීමෙන් ප්‍රයෝජනයක් නැත. අමුසොහොනට ගොස් අවුත් අනතුරුව මා දකිත්වායි පැවසුහ තෙරුන් ගොස් එම භික්ෂූන්ට මෙකරුණ දැනුම් දුන්හ. එම භික්ෂූන් අපට අමුසොහොනකින් කවර ප්‍රයෝජනයක් දැයි නොකියා දුරදිග දකින බුදුරජාණන් වහන්සේ විසින් කරුණක් දක්නට ඇතැයි අමුසොහොනට ගොස් එහි මළකුණු බලන්නේ දින එකක් දින දෙකක් ගතවූ පිළිකුල් සහගත මළකුණු දැක අප්‍රසාදයක්ද එවේලේ ගෙනත් දමන ලද අළුත් මළ සිරුරු දැක ඇලීමක් ඇතිකරගත්හ. එකෙනෙහි තමන් කෙලෙස් සහිත බව තේරුම් ගත්හ. බුදුහු ගඳකිලියේ සිටම ආලෝකයක් පතුරුවා ඔවුන් ඉදිරියේ කථාකරණ ලෙසට මහණෙනි ! තොපට සුදුසු නොවේ. මෙබඳු සම්මස් ඇටවලින් සැදුන සිරුරක් දැක රාග රති ඉපදවීමට සුදුසුනැතැයි පවසා මෙම ගාථාව දේශනා කළහ.

සරත් කල විසි කළ - හිස් ලබු කබල් වැනි වූ
පරෙවි පැහැ ඇති ඇට - දැක කවුරු එහි ඇලෙනිද

එහි **අපත්ථානිනි** - විසිකරණ ලද **සාරදෙ** සරත් කාලයේ සුළං වැසි අව්වෙන් තැවුන ඒ ඒ තැන විසුරුවා දමන ලද ලබුකබල් වැනි **කාපොතකානී** පරෙවි පාට ඇති **නානිදිසාානානි** මෙබඳු ඇට කැබලි දැක ඔබට කවර ඇල්මක්ද

මෙබඳු මිනී දැක ඔබම ඇල්මක් ඇතිකර ගැනීම සුදුසු නොවේ.

මෙම දේශනාව අවසන එම භික්ෂූන් සිටිලෙසම රහත් බවට පත්ව බුදුන් වහන්සේට ස්තුති කරමින් වැන්දාහුය.

හතර වැනි අධිමානක භික්ෂූන්ගේ කථා පුවතයි.

11-5

"අඤ්ඤතං නගරං කතං" යන මෙම ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩසිටියදී ජනපද කළ්‍යාණීනම් වූ රූප නන්දා තෙරණිය නිමිත්තකරගෙන දේශනාකළහ.

ඕ එක්දිනක් මගේ වැඩිමහළු සහෝදරයා රජ සිරි සැප අත්හැර පැවිදි වී ලොව ශ්‍රේෂඨ පුද්ගල වූ බුදුබවට පත්වූහ. උන්වහන්සේගේ පුත් රාහුලද පැවිදිවිය. මගේ ස්වාමීයා ද පැවිදිවිය. මගේ මව ද පැවිදි වුවාය. මෙපමණ ඤාතීන් පැවිදිවී සිටියදී මම ගිහි වැ සිට කුමක් කරම්ද, පැවිදි වන්නෙමියි සිතුවාය. මෙලෙස සිතා භික්ෂුණී අරමට ගොස් පැවිදි වුවාය. පැවිදි වූයේ තනිවූ නිසා මිස ශ්‍රද්ධාවෙන් නොවේ.

ශෝභාවත් රූපයනිසා ඇය රූප නන්දා නමින් ප්‍රසිද්ධ වුවාය. බුදුරජාණන් වහන්සේ රූපය අනිත්‍යය දුකය. අනාත්ම යයි යනුවෙන් දේශනා කරතියි අසා ඇය මෙබඳු දර්ශනීය වූ ප්‍රසාදජනක වූ මගේ රූපයේද දොස් කියන්නේයයි බුදුන් හමුවට නො යන්නීය. සැවැත් නුවර වාසීහු උදේම දන් දී පෙහෙවස් සමාදන්ව සුදුවත් උතුරු සළුකොට භික්ෂුණී සංඝයාද සුවඳ මල් ආදිය ගත් අත් ඇතිව සවස දෙව්රමට එකතුවී ධර්මය අසති. භික්ෂුණී සංඝයාද බුදුන්ගේ ධර්මය අසනු කැමතිව විහාරයට ගොස් බණ අසති. බණ අසා නගරයට ඇතුල් වන්නෝ බුදුගුණ කියමින්ම ඇතුළුවෙති. ලොව වෙසෙන සතුන්ගෙන් හතරෙන් එකෙන් ස්වල්පවූ දෙනෙක්ම බුදුන් දැක සතුටු නොවෙති. රූපය ප්‍රමාණ කොට ඇති බුදුරජාණන් වහන්සේගේ අසූ අනු ව්‍යඤ්ජන ලක්ෂණයන්ගෙන් යුතුවූ රන්වන්වූ ශරීරය දැක. පැහැදෙති. හැඩම ප්‍රමාණය කරගත් අය නොයෙක් ජාති සියගණනක් නිසා පවතින බුදුන්ගේ ගුණ සෝෂාව කරුණු අටකින් සමන්විත ධර්ම දේශනා සෝෂාවද අසා පැහැදෙති

රළුබවට පැහැදෙන්නෝ චීවර ආදී රළු දේ දැක පැහැදෙති. ධර්ම ප්‍රමාණයෙන් පැහැදෙන්නෝ දශබලධාරීන් වහන්සේගේ සීලය මෙබඳුය

සමාධිය මෙබඳුය. ප්‍රඥාව මෙබඳුය. භාග්‍යවතුන් වහන්සේගේ සීලාදී ගුණ වශයෙන් අසමසමය, ඒහා සමාන වෙනත් අයකු නැත්තේය ආදී වශයෙන්, ඔවුන්ගේ මුව නෙසෑහෙන තරම් බුදුගුණ කියති.

රූපනන්දා - භික්ෂුණීන්ගෙන් මෙන්ම උපාසිකා වන්ගෙන් ද බුදුගුණ අසා මෙසේ සිතුවාය.

මගේ සොහොයුරාගේ ගුණ කථනය අතිශයෙන් සිදුවෙයි. එක දිනක් හෝ මගේ රූපයේ දොස් කීමෙන් කුමක් වේද? යම්සේ භික්ෂුණීන් සමග ගොස් මම නොපෙනෙන ලෙසට ශාලාවට ඇතුළුවී ධර්මය අසා එන්නෙමියි සිතා ඇය - මමද අද එන්නෙමියි බණ අසන්නට යන්නෙමියි භික්ෂුණීන්ට දැනුම් දුන්නාය. භික්ෂුනීන් වහන්සේලා මෙසේ සිතූහ. බොහෝකලකින් රූපනන්දා බුදුන්ට උවටැන් කිරීමට යනු කැමැත්තී වුවාය. බුදුරජාණන් වහන්සේ අද ඇය වෙනුවෙන් කවරාකාර ධර්මයක් දේශනා කරන්නේදැයි එය කෙතරම් ඇයට ගැලපෙන්නේදැයි සිතා ගියහ. බුදුන් වහන්සේද ඇය රූපය පිළිබඳව ඇති බලවත් ස්නේහය කටුවෙන් කටුවක් ගලවන්නාසේම රූපයෙන්ම රූපය පිළිබඳ මදය රූපයෙන්ම නැති කරනු ඇතැයි සනිටුහන් කරගෙන විහාරයට වැඩමකළහ. ඇය විහාරයට පිවිසෙන අවස්ථාවේදී එක් සොළොස් වියැති අභිරූපි යුවතියක් රතුපාට වස්ත්‍රයක් හැඳ පෙරවා සියළු අලංකාර අබරණ වලින් සැරසී විජිනි පතක් ගෙන බුදුන් වෙතම සිට පවන්සලන ස්වරූපයක් සෘද්ධි බලයෙන් මවා බුදුන්ද රූපනන්දාටද පෙනෙන සේ දක්වූහ. රූපනන්දා භික්ෂුණීන් සමග විහාරයට ඇතුළුවී භික්ෂුණීන්ගේ පිටුපස සිට පසඟ පිහිටුවා බුදුන් වැද' භික්ෂුනීන් වහන්සේලා මැදටවී සිටියාය. එලෙස සිටින අතර පාදාන්තයේ සිට බුදුන් බලන්නේ උන්වහන්සේගේ මහාපුරුෂලක්ෂණයන්ගෙන් යුත් අනු ව්‍යඤ්ජනයන් ගෙන් බබලන ව්‍යාමප්‍රභා වෙන් වටකරණ ලද බුදුන්ගේ සිරුර දක පුන් සඳක් බඳු ශෝභාවන් මුහුණ බලන්නේ ආසන්නයේ සිටි ස්ත්‍රී රූපය දුටුවාය. ඇය ඒ ස්ත්‍රීරුව බලන්නී තමන් ගේ රුව පිළිබඳව සිතන්නේ ඇගේ රුව අනුව තමන් රාජ හංසියක ඉදිරියේ කෙවිඩක සේ තමන්ටම අවමානයක් ඇතිවිය.

ඍද්ධියෙන් මවන ලද රූපය දුටුතැන් සිට මාගේ ඇහිබැම හා ඇස් සැලුනි. ඇය මෙසේ සිතුවාය අහෝ මැගේ කෙස් ශෝභනය නළල් තලය ශෝභාමත්ය. මුළු සිරුරේ ශෝභාමත්බව රූසිරින් අදනා ලද සිතනිසා ඇගේ රූව කෙරෙහි බලවත් බැඳීමක් ඇතිවිය. බුදුහු ඇගේ බලවත් ඇල්ම දැනගෙන ධර්මදේශනය කරමින්ම ඇගේ රූව සොළොස්විය ඉක්මවා විසිවයස් බවට පත්කළහ. දැන් මේ රූව මුලින් තිබූ තරම්ම නැත. ටිකක් වෙනස් වුයේයයි සිතුවාය. බුදුහු අනුපිළිවෙලින් එම ස්ත්‍රියගේ රූපය වෙනස්කොට මධ්‍යම වයසේ කෙනෙකුගේ රූප ස්වභාවයෙන් පසුව ජරා ජීර්ණ මැහැලි ස්ත්‍රියකගේ ස්වභාවයෙන්ද දක්වීය. ඇයද අනුපිළිවෙලින් මෙය අන්ත රහිතය. දිරාගිය කල එය නොඇලෙන්නේ වැටුන දත් ඇති පැසුන කෙස් අති නැවුන අත්පා ඇතිව සැරයටියට බරවී වෙවුලන සිරුරකින් යුතුව පෙනුම දැක අතිශයින් කලකිරුනි. අනතුරුව බුදුහු රෝගයෙන් පෙළෙන තැනැත්තියක ලෙසට දැක්වුහ.

ඇය එකෙනෙහිම සැරයටියද තල් අත්තද විසිකර මහ හඬින් විලාපදෙමින් බිම පතිතවි තමන්ගේම මල මුත්‍රවල ගැලී ඒ මේ අත පෙරලුනි. මෙය බලාසිටින රූපනන්දා බලවත් කළකිරීමට පත්වුවාය. බුදුහු ඇය මියගිය අයුරු මවාපෙන්නුහ. ඇය එකෙනෙහිම ඉදිමී ගිය බවටත් නව දොරින් කුණු සැරව වැගිරෙන අයුරු දක්වුනි. කවුඩු ආදින් පැමිණ සිරුර සිදුරු කර කඩා දැමුහ. රූපනන්දා ද එයබලා මෙම ස්ත්‍රිය මෙතැනදීම ජරා - ව්‍යාධි - මරණ තත්ත්වයට පත්වුවාය. මටද මේ ආත්මභාවයේදීම මේ ජරා ව්‍යාධි මරණ එන්නේය. මෙසේ තමා පිළිබඳව අනිත්‍යතාව බැලුවාය මෙලෙස අනිත්‍යතාවයෙන් බැලීමයනු දුක් වශයෙන්ද අනාත්ම වශයෙන්ද සැලකීමක් වේ. ඉක්බිති ඇගේ තුන් භවය දැල්වී ගියාක් බඳුවිය. ගිහිගෙයි වාසය ගෙලබැඳි සර්පයෙක් කුණපයක් බඳුවිය. කර්මස්ථානයට අභිමුඛ වූ සිත ඇතිවිය. බුදුහු ඇයගේ සිත අනිත්‍ය තාවයට නැඹුරුවුබව දැන ඇයට තමන්ව පිහිට කොට ගතහැකිදැයි බලන්නේ නොහැකි වේ. බාහිර උපකාර ඇයට අවශ්‍යවේ. දැන ඇයට උපයෝගීවන ධර්මයක් දේශනා කරමින් නඳතෙරුන්ට දේශනා කළ කරුණු රූප නන්දාට ඉදිරිපත් කරමින්

ලස්සනට බබළන - මේ කය අපිරිසිදු වේ
අසුචියෙන්, සැරවෙන් -ලෙයින් හා මළ මූයෙන්
දුගඳ හමනා නිතරම - සිරුර තිර නැත නැගනියේ
ධාතු වසයෙන් හා - හිස්වසයෙන් ද බලමින්
බවයෙන් එතෙර වන්නට - සිත යෙදුම කළ යුතු වේ
මේ සිරුර මැනැවැයි - පිළිදගිති අනුවණයෝ

ආතුරවූ අපිරිසිදුවූ - දුගඳ හමන්නාවූ මේ සිරුර නසනා බලන්න සැරව වැගිරෙන අපිරිසිදුව, මේ සිරුර අසුණයෝ ඇළුම් කරති. මෙය යම්සේද එය එසේය. එය එසේ වේ. මේ සිරුර ධාතු වශයෙන්ද හිස් වශයෙන්ද බලන්න - එසේ තේරුම්ගෙන මෙලොවට නැවත නොඑන්න. භවය පිළිබඳව කැමැත්ත දුරුකොට උපශාන්ත වූවක් ලෙස හැසිරෙන්න.

බුදුරජාණන් වහන්සේ නසනා තෙරණියන්ට මෙම ගාථා පවසා නසනා තෙරණිය දේශනය අනුව ඤාණය දල්වා සෝවාන් ඵලයට පැමිණිය. අනතුරුව ඇය මත්තෙහි මාර්ග ඵලයන්ට අනතුරුව විදර්ශනා සඳහා කර්මස්ථාන කියන්නට- නසනාවනි මේ සිරුරේ සාරයක් ඇතැයි නොසිතන්න. අල්පමාත්‍රයක් හෝ මේ සිරුරේ සාරයක් නැත. ඇටකැබලි තුන්සියයකින් ඔසවන ලද මෙම සිරුර ඇටකැබලි වලින් කරණ ලද නගරයත් වන්නැයි කියා මේ ගාථාව පැවසුහ.

නව සියයක් නිබේ සිරුරක මස් වැදලී
තුන් සියයක්ම එකතුව ඇත ඇට කැබලී
ලෙඩබව මහළු බව මරණය ඇත බැඳිලී
මෙය නුවරක්ය හුදු විදුලියකින් බැබලී.

එහි අර්ථය ගෙයක් නගරයක් කැමති අයෙක් ලී දඬු ඔසවා පරාල බැඳ මැටි ඔබා නගර සංඛ්‍යාත වූ බැහැරින් ගෙයක් කරන්නේය. එසේම ඇතුළත ඇට තුන්සියයක් ඔසවා. ඒවා නහරවලින් බැඳ නබා මස්, ලේ තවරා සමකින් වසා දිරණ ස්වභාවයෙන්, ජරාවට පත්වන ස්වභාවයෙන් මරණ ස්වභාවයෙන් මාරයා විසින් ගන්නා ලද මේ සිරුර පිළිබඳව ආරෝග්‍යය නිසාද, රූපවත්

58

බව නිසාද යහපතකැයි සිතා මානය ඇති කිරීම **නගරකෙතං** මෙබඳු වූ මේ රූපයේ ගතයුතු කිසිවක් නැත කායික චෛතසික ආබාධ වලින් ඔසවන මේ ශරීරයේ ගත යුතු කිසිවක් නැත.

දේශනාවසානයේ නන්දා තෙරණිය අර්හත් ඵලයට පැමිණියාය. මහාජනයාටද දේශනාව සාර්ථක දේශනයක් වූයේය.

රූපනන්දා තෙරණියගේ කථා පුවතයි.

11-6

"පිරුනහි වෙ රාජරථා" - යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සෙ සැවැත්නුවර ජේතනවන විහාරයේ වැඩ සිටියදී මල්ලිකා දේවිය අරමුණුකර ගෙන දේශනා කළහ.

ඕ තොමෝ එක්දිනක් නාන කොටුවේ දී මුහුණ සෝදා සිරුර නවාගෙන කෙණ්ඩා සේදීමට පටන්ගත්තාය. ඇයත් සමගම ඇතුළුවුන එක් කිකරු සුනඛයෙක් ඇය එසේ නැමී සිටිනු දැක අසද්ධර්ම සහචය. කරන්නට පටන්ගත්තේය. ඇය ස්පර්ෂය ඉවසමින් සිටියේය. රජුද මතුමහලේ වා කවුලුවෙන් බලමින් සිටියදී මෙය දැක ඇය පැමිණිකළ වසලිය වැනසේවා කුමක් නිසා මෙබඳු දෙයක් කළාදැයි විමසුවාය.

දේවයන් වහන්ස මාවිසින් කුමක් කළේද? සුනඛයන් සමඟ සංවාසයේ යෙදුනේ නොවේදැයි පැවසුවේය. නැත දේවයන් වහන්ස, මගේ සියැසින් දුටුදේ ඔබ විශ්වාස නොකරන්නේද ! වසලිය නැසේවායි කීවේය. මහරජ යමෙක් මේ දිය කොටුව පිවිසිවිට මේ වා කවුලුවෙන් බලනවිට එක් අයෙක් දෙයාකාරයට පෙනෙයි. යනුවෙන් සිදුනොවුවක් (බොරුවක්) පැවසුවාය. ඉදින් මාව විශ්වාස නොකරන්නේනම් ඔබ මේ දියකොටුවට පිවිසෙන්න. මම කවුළුවෙන් බලාසිටිමියි ඇය කීවාය. ඇය වාකවුළු දොර බලාසිටින්නී ඒ අතර ඇගේ වචනය විශ්වාස කරගෙන රජුද දියකොටුවට පිවිසියේය. ඇය ජන්ලයෙන් බලාසිට අන්ධ බාලවූ මහරජ කුමක් නිසා ඔබ කොටළුදෙනක හා සංවාසයේ යෙදුනේද? විමසුවාය. නැත සොඳුරිය මම එවැන්නක් නොකරමි. කී විට මා විසින්ද දකිනලද දෙය ඔබ නොඅදහන්නේදැයි පැවසුවේය. මෙය අසා රජු ඒකාන්තයෙන් මේ කොටුවට පිවිසි කෙනෙක් දෙකක් ලෙසට පෙනේ යයි විශ්වාස කළේය. මල්ලිකා මෙසේ සිතුවාය. මේ රජු අඥාන නිසා මගේ වචනය පිළිගෙන රැවටීමට වැටුනි. මම පවක් කළෙමි මේ කර්මය බුදුරජාණන් වහන්සේද දනගනු ඇත. අසූමහ ශ්‍රාවකයින්ද අග්‍රශ්‍රාවකයින්ද දැනගනු ඇත. අහෝ මවිසින් බැරුම්පවක්කරණ ලද්දේමි. මේ රජ අසදිස මහා දානය දීමේදී උපකාරීවීමි. එක් දිනකදී කරණ ලද පරිත්‍යාගය දාහතර කෝටියක් විය.

බුදුරජාණන් වහන්සේට සේසත වාඩිවන පුටුව, මේසය, හා පාද පීඨය යන මේ වැදගත් මහාර්ඝ වස්තු පූජාකලෙමි. ඇය මරණ මඤ්චකයේදී මෙබඳු පරිත්‍යාග සිහි නොකර ඒ පච්චකම සිහිපත් කරන්නී කළු රිය කොට - අවීචියේ උපන්නාය. රජුට ඇය ඉතා ප්‍රිය විය. ඔහු බලවත් ශෝකයෙන් යුතුව ඇගේ සිරුර ආදාහනයකර ඇය උපන්තැන විමසමියි බුදුන් වෙත ගියේය. බුදුහු ඔහු ආ කරුණ අමතක වනලෙස අදිටන් කළහ. ඔහුට බුදුන් සමීපයේ සිහිකටයුතු කථා අසා ගෙන ගියවිට සිහිකොට මම මල්ලිකාවගේ උපන් ස්ථානය විමසමියි ගොස් දෙවන දවස් අසමියි දෙවන දවස්ද ගියේය. බුදුහු පිළිවෙලින් දින හතක් යන තුරු ඔහුට සිහිපත් නොවීමට සැලසුහ ඇයද දින සතක් නිරයේ පැසි අටවන දින ඉන් චුතව තුසිත භවනෙහි උපන්නාය. බුදුහු කුමක් හෙයින් දින හතක් මේ කරුණ රජුට සිහිපත් නොවීමට පත්කළේද? ඇය වනාහි රජුට අතිශය ප්‍රිය වූවාය. එනිසා ඇය නිරයේ උපන්බව අසා ඉදින් මෙතරම් ශ්‍රධාවත් කෙනෙක් නිරයේ උපන්නේ නම් දන් දී කුමක් කරමිද? කියා මිථ්‍යා දෘෂ්ටිගෙන පන්සියයක් භික්ෂූන්ට ගෙදර දුන් දානය වලක්වා නරකයෙහි ඉපදේය යන අදහසිනි. මේ අදහස නිසා ඇය පිළිබඳව රජුට විමසීමට සිහිය ඇතිනොවන ලෙසට යටපත් කරණ ලදී. එසේ කොට අටවැනි දින බුදුහු පිඬුසිඟා වඩින අතර රාජමන්දිරය අභියසට වැඩමකළහ.

රජු බුදුන් වැඩියේයයි අසා නික්මී පාත්‍රයගෙන ප්‍රසාදයට නැග යාමට පටන් ගත්තේය. බුදුහු රථ සාළාවේ වැඩසිටින ආකාරයක් දැක්වීය. රජු බුදුන් එහිම වාඩිකරවා කැඳ හා කැවිලි වර්ගවලින් සංග්‍රහ කොට වැඳ වාඩිවී ස්වාමීනි මම මල්ලිකා දේවියගේ උපන්තැන විමසන්නට ගියේ අමතක විය. ස්වාමීනි ! ඇය කොතැන ඉපදුනාද? මහරජ තුසිත භවයෙහියයි පැවසුහ. රජු ස්වාමීනි ඇය තුසිත භවයේ නුපන්නානම් අන් කවරෙක් එහි ඉපදෙන්නේදැයි ස්වාමීනි ඇය හා සමාන ස්ත්‍රියක් නැත. ඇය සිටින තැන බුදුන්ට මෙය දෙමි. මෙය කරමි යනුවෙන් දානය සංවිධානය කිරීම හැර අන් දෙයක් නැත. යනුවෙන් පවසා ස්වාමීනි ඇය පරලොව ගියතැන් සිට සිරුර පමණක් නැතය පැවසුවේය. බුදුහු මහරජ එලෙස නොසිතන්න. සියල්ලන්ගේ ඒ කාන්ත ධර්මය මෙයයි පවසා මහරජ මේ රථය කාගේ රථයද ස්වාමීනි සියාගේය. මෙය කාගේද මහරජ මේ මගේ පියාගේ රථයයි.

මෙම රථය කාගේද මහරජ මෙය මගේය ස්වාමීනි පැවසුවේය. මෙසේ පැවසුවිට බුදුහු මහරජ ඔබගේ සීයාගේ රථය ඒ අයුරින්ම පියාගේ රථය මෙන් නොවීය. ඔබගේ පියාගේ රථය ඔබේ රථය ස්වරූපයට නොපැමිණියේය. මෙබඳු දූවදඬු ලී කොට ආදියද දිරා යාමට පත්වේ. ආත්ම භාවයට කුමක්වේද? මහරජ සත්පුරුෂ ධර්මයට ජරාවක් නැත. සත්ත්වයෝනම් නොදිරන්නේ නැතැයි පවසා මෙම ගාථාව දේශනාකළහ.

මැනවින් විසිතුරු කරණ ලද රාජකීය වාහන වුවද දිරායයි මැනවින් විසිතුරුකළ ශරීරයද ජරාවට පත්වේ. යහපත් පුරුෂයන්ගේ ධර්මය ජරාවට පත්නොවේ මේ කරුණ සත්පුරුෂයෝම සත්පුරුෂයන්ට ඒකාන්තයෙන් පවසා සිටිති.

මේ රිය පෙනේ පිය මුතු පුතු රජුන් සතු
සොබාදහම ලෙස ඒ හැම දිරිය යුතු
සපුරිස් දහම් පමණක් කර ලොවම නතු
නොදිරා තිබෙන බව මහරජ සිතිය යුතු

නත්ථ එහි වෙ යන අවධාරණ අර්ථයේ නිපාත පදයකි." **සුචිත්තා**" සප්තරත්න වලින් විවිධ අයුරින් අලංකාර යන්ගෙන් සැරසූ රාජරථද දිරායත්. **සරිරමපි** හුදෙක් රථ කරත්ත පමණක්නොව මැනවින් පිළිදැගුම් කළ සිරුරද කැඩි බිදී ජරා බවට පත්වේ. **සනෑඳවානි** - බුද්ධාදීන් විසින් සත්ත්වයන්ගේ යහපත සඳහා දෙසන ලද නවවිධ ලෝකෝත්තර ධර්මය වනාහි එලෙස විනාශ නොවේ. **පවෙදයනති** - යනු බුද්ධාදී උතුමෝ සියළු සත්පුරුෂයන් පණ්ඩිතයන් සමග කරණ ප්‍රකාශයයි මේ දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පත්වූහ.

මල්ලිකා දේවියගේ කථා පුවතයි.

11-7

"අපපඤ්ඤතා යං" යන මෙම ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ජේතවනාරාමයේ වාසය කරණ අතරතුරදී ලාළුදායී තෙරුන් නිමිති කරගෙන දේශනා කළ සේක.

මෙම තෙරණුවෝ මඬගල කටයුතු කරණ නිවෙස්වලට ගොස් තිරොකුඩ්ඩසු තිටීනති ආදී මියගියවුන් පිළිබඳ අවමඬගල කථා කියති.

අවමඟුල් පවතින නිවෙස් වලට ගොස් තිරොකුඩ්ඩසූ ආදිය කියයුතු තැන්වල "දානංච ධම්මචරියා" ආදී මඬගල කථා රතන සුත්‍රය වැනි කරුණු ද පවසති. ඒ ඒ තැන්වලට ගොස් කියයුතුදෙයට වඩා වෙනත් දෙයක් කියති. මෙබඳු නොගැලපෙන දෑ කියන නිසා භික්ෂූන් වහන්සේලා මේ තෙරුන්ගේ කථා අසා බුදුන්වහන්සේට දැනුම් දුන්හ. ස්වාමීනි මේ ලාළුදායී තෙරුන් සමග මංගල අවමඟුල් ඇති ස්ථානවලට යාමෙන් කවර ප්‍රයෝජනයක්ද? කිවයුතු දෙය වෙනුවට වෙනත් දෙයක්ම කියයි, මෙයට පිළිතුරු දෙන තථාගතයන් වහන්සේ, මහණෙනි මේ තැනැත්තා දැන් පමණක් නොව පෙරද එකක් කිවයුතු තැන අනෙකක්ම කීවේයයි කියා, අතීතය ගෙනහැර දැක්වුහ. අතීතයේදී බරණැස "අගගිදත්ත" නම් බ්‍රහ්මණයාගේ පුතා "සෝමදත්ත" කුමරු රජුට උපට්ඨාන කළේය. ඔහු රජුට ප්‍රිය මනාප විය. පිය බමුණා කෘෂිකර්මයෙන් ජීවත් වෙයි. මේ බමුණාට ගොනුන් දෙදෙනෙක් වුහ. ඔවුන් දෙදෙනාගෙන් එකෙක් මියගියේය. බ්‍රාහ්මණයා තම පුතාට මෙසේ කීවේය. "දරුව" සෝමදත්ත රජුගෙන් ඉල්ලාගෙන මට ගොනෙක් අරගෙනඑන්න කියා සෝමදත්ත ඉදින් මම රජුගෙන් ගොනෙක් ඉල්ලන්නේනම් මගේ ලඝුබව මතුවන්නේ යයි සිතා පියාණනි ඔබම රජුගෙන් ඉල්ලා ගන්නැයි කීවේය. මෙලෙස කියා සිටියදී එසේනම් දරුව මා ගෙන ගොස් රජු වෙත පමුණුවන්නැයි කීවේය. මෙසේ කිවිට පුතා මේ බ්‍රාහ්මණයා (පියා) අනුවණයෙකි. ඉදිරියට යන්න පස්සට යන්න ආදී වචනයක්වත් දන්නේනැත. කිවයුතු දෙය වෙනුවට වෙනත් දෙයක් කියනු ඇත. ඔහුට පුහුණුවක් දී රජු ඉදිරියට ගෙනයන්නෙ මැයි සිතා බමුණා

බ්‍රහ්මදත්තමහක නම් සොහොනට ගෙන ගොස් තණබිම් බැඳ තබා මේ රජුය. මේ යුවරජුය, මේ හමුදාපතිය යනුවෙන් නම්කර පිළිවෙලින් පියාට පෙන්වාදී ඔබ රාජසභාවට ගොස් මෙලෙස ඇතුළුවිය යුතුය. මෙසේ පිටවිය යුතුය, මේ ලෙසට රජුට කථාකළ යුතුය. මේ ලෙස යුවරජුට කථාකළ යුතුය. රජුවෙත එළඹ "ජයතු භවං මහරජ ඔබ දිනේවා" යනු වෙන් සුබපතා මෙසේ සිට මේ ගාථාව කියා ගොනෙක් ඉල්ලා ගන්නැයි ඉගැන්වීය. "දෙව මෙගොණා මහාරාජ" මහරජ මගේ ගොනුන් දෙදෙනෙක් කුඹුරේ සී සෑහ එකෙක් මියගියේය. එනිසා මට ගොනෙක් ලබා දෙන්න. ඒ බමුණා අවුරුද්දක් පමණ එම ගාථාව ප්‍රගුණ කොට එහි ප්‍රගුණ බව පුතාට පෙන්වා (පාඩම්දී) එසේ නම් දරුව මට කිසියම් පඬුරක් අරගෙන එන්න. මම පළමුව ගොස් රජුගේ සමීපයේ සිටින්නෙමියි කීවිට හොඳයි පියාණනි පඬුරක් ගෙනත් දුන්විට එය රැගෙන සෝමදත්ත රජු සමීපයේ සිටිවිට උත්සාහයෙන් රජකුලයට ගොස් රජුවිසින් සතුටු සිතින් පිළිසඳර කථා කොට දරුව පැමිණ බොහෝකල් මෙනි, මේ අසුනේ වාඩිවී කියන්න කුමක් නිසා පැමිණියේදැයි පවසන්න. මේ ගාථාව කිවිය.

"මහරජ මගේ ගොනුන් දෙදෙනෙක් කුඹුරු සීසෑවෝය.
මහරජ ඉන් එකෙක් මියගියේය. මහරජ දෙවැන්නා ගන්න."

රජතුමා දරුව කුමක් කියන්නේ ද නැවත කියන්නැයි පැවසූවිට එලෙසම ගාථාව කීවිය. රජු ඔහු විසින් වරදවමින් කී බව දැන සිනාසී. සෝමදත්ත ඔබගේ නිවසේ බොහෝ ගොනුන් වෙත්දැයි කරුණු විමසා අනතුරුව බෝසතුන්ට සතුටුවී බමුණාට ගොනුන් දහසයක්ද අලංකාර භාණ්ඩ නිවසක් හා බ්‍රහ්මදෙය්‍ය වස්තූද දී මහත් කීර්තියෙන් බමුණා උනනත්දු කළේය. බුදුහු මේ දේශනය ගෙනහැර දක්වා එදා රජු ආනන්ද ස්ථවිරයන්විය. බ්‍රාහ්මණයා ලාළුදායි තෙරුන්විය සෝමදත්ත මම ම වීමි යි ජාතක දෙසුම ගලපා මහණෙනි දැන් පමණක් නොව පෙර ද මොහු තමන්ගේ අපහසුතාව නිසා කටයුතු දෙය වෙනුවට වෙනත් දෙයක්ම කියයි. අල්ප දැනුම ඇත්තා ගවයෙකු වැනියයි පවසන මේ ගාථාව වදාළහ.

සිරුර අලි මහනට -මස් ගොඩම ලොකුවන්නේ
හරක්මෙන් දිවිසරති -උන්ගේ නුවණ නොවැඩේ

එහි දී අපසසුත නම් - පඤ්ඤායක 50 හේ කොටස් අතුරෙන් පණණසකයක් හෝ දෙකක්, වර්ග එකක් හෝ දෙකක්, අවම වශයෙන් සුත්‍ර දෙකක් හෝ එකක් හෝ නොදන සිටින භික්ෂුව අල්පශ්‍රැත - අසාදෘනගත් දැනුම නැති තැනැත්තෙකි. කර්මස්ථාන ඉගෙන එහි යෙදෙන තැනැත්තා බහුශ්‍රැත නම් වේ.

බලිවද්දාව - ජීරති - යම්සේ මස් වැඩෙන්නේ මව පියා - සෙසුඤාතින්ගේ ප්‍රයෝජනය සඳහා නොවැඩේ. ප්‍රයෝජනයක් නොමැතිවම වැඩේ. එලෙසම මෙතෙම උපාධ්‍යාය වත් නොකරයි. ගුරුවරයාගේ වතාවත් නොපුරයි. අගන්තුක වතාවක්ද නොකරණ ඔහු භාවනානු යෝගීව පසුවෙතැයි පවසමින් නිරර්ථක ලෙස වැඩේ. **"මංසානි තස්ස වඩ්ඪනති"** - යම්සේ ගොනුන් වියගහ නගුල් උසුලන්නට නොහැක්කාසේම වනයේ අත්හැර දැමූ ගවයාගේ මස් වැඩේ. එලෙසම වතාවත් නොකර අචාර්ය උපාධ්‍යායන්ට ලැබෙන සිවුපසය හොඳින් වළඳා මහත් සිරුරු ඇතිව හැසිරේ. "පඤ්ඤානි" ලෝකිය ලෝකෝතර ඤාණය එක අඟලක් හෝ නොවැඩේ. "නවඩ්ඪති" - වනයේ ගස් වැල් ආදිය මෙන් ඔහුගේ සදොරනිසා තන්හාවද නවවිධ මානයද වැඩේ යන අරුතයි. මේ දේශනය අවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී මාර්ගඵලවලට පත්වූහ.

ලාලුදායී තෙරුන්ගේ කථාපුවතයි.

11-8

"**අනෙකජාති සංසාර**" යන මේ දහම් දෙසුම ශාස්තෘන් වහන්සේ බෝරුක මුල වැඩසිටියදී උදානවශයෙන් ප්‍රකාශකොට, පසු අවස්ථාවකදී ආනන්ද තෙරුන් විසින් විමසුවිට පැවසුහ. උන්වහන්සේ බෝරුක් මුල වැඩසිටියදී හිරු උදාවීමට පෙරම මාර පරාජය කොට පළමු යාමයේ පුර්වේනිවාසානුස්මෘති ඥානය මතුකරගෙන මධ්‍යම යාමයේදී දිවැස පිරිසිදු කරගෙන - පැසුලු අවස්ථාවේදී සත්ත්වයන් කෙරෙහි ලෝසතුන් කෙරෙහි මහ කරුණාවෙන් හේතු ප්‍රත්‍ය ධර්ම කෙරෙහි ඤාණයට බැස එය අනුලෝම පටිලොම වශයෙන් සිහිකරමින් අරුණ නැගෙනවිට සම්මා සම්බුද්ධත්වය පසක් කරගෙන අපමණ බුදුවරු සියදහස් ගණනක් අත්නොහළ උදානය දක්වමින් මේ ගාථාව දේශනාකළහ.

අපමණ සසර දුක්විඳ දිවයමින් සිට
අපසතු සිරුරු ගෙය සාදන විටින් විට
වඩුවා සොයා යළි යළි ගිය ගමන් පිට
හඳුනාගනිමි ඔහු "තණ්හා" නමින් සිට

නැවත ගේ තනනට
බැරිලෙස ඔහුට මොනවට
කැණිමඩල ලී කොට
කඩා බිඳ ගේ දැමිණ පොළවට

"තතෝ එහි ගහකාරකං ගවෙසන්තොනි " මම මෙම ආත්මභාව නමැති ගෙය කරණ තෘෂ්ණානැමති වඩුවා සොයමින් යම් නුවණකින් ඔහු දැක ගැනීමට හැකිවේද ඒ බෝධි ඤාණය සඳහා දීපංකර බුදුන්පාමුල කරණ ලද අභිනීහාර ඇතිව මෙතෙක් කල් **අනෙකජාතිසංසාරං**" නොයෙක් ජාති ලක්ෂයක් මේ සසරවට **අනිබ්බිසං** ඤාණ නොදන්න ඤාණය නොලැබම - **සන්ධාවිස්සං** - සැරිසැරීම් මැරෙමින් ඉපදෙමින් සැරිසැරීමයි. "**දුක්ඛාජාති පුනප්පුනන්නි මේ** ගේ කරන්නා සොයමින් නැවත නැවත ඉපදීම - මැරීම යන දුක් යම්

භෙයකින් ජරා ව්‍යාධි මරණ මිශ්‍රවූ දුක නැවත නැවත ඇතිවන දුක් එය නොදුටුවිට නොනැවතේ එනිසා නොනිමෙන දුක් සොයමින් ඇවිද්දෙමි යන අර්ථය දේ. "**දිට්ඨොසිනි**" සර්වඥතා ඥානය අවබෝධ කරගත් මවිසින් මෙය දුටුවෙමියි. "**පුනගෙහනනි**" නැවත මේ සසර දුකේ ආත්මභාව සංඛ්‍යාත වූ මගේ ගෙය නැවත ඉදිකළ හැකි නොවේ. **සබබා තෙ ඵාසුකා** ඔබගේ සියළු ඉතිරි කෙලෙස් පහසුකම් මවිසින් වනසා දමන ලදී. **ගහකූටං විසංඛිතනනි** මේ ඔබ විසින් කළ ආත්මභාව ගෙයි අවිද්‍යා සංඛ්‍යාතවූ කැණිමඩලද මවිසින් වනසාදමන ලදිමි. "**විසඞ්ඛාර ගතං චිත්තනනි**" - දැන් මගේ සිත සංස්කාර රහිතවූ නිවන අරමුණු වශයෙන් ගෙන තබන ලදිමි. "තණ්හානං බයමජ්ඣගාති" තෘෂ්ණා ක්ෂය වූ අර්ථය අවබෝධ කර ගතිමි.

ආනන්ද තෙරුන්ගේ උදාන ගාථා පුවතයි.

11-9

"අචරිත්වා" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ඉසිපතනා රාමයේ වැඩ සිටියදී මහාධන සිටුතුමා අරමුණු කරගෙන දේශනා කළහ.

මහධන සිටුපුත් තෙම බරණැස අසුකෙලක් ධනය ඇති කුලයක උපන්නේ ය. ඔහුගේ දෙමාපියෝ මේලෙස සිතූහ. අපගේ කුලයේ මහාභෝග සමුහය පරිභෝග කරණු මිස අනෙක් කටයුත්තකින් ප්‍රයෝජනයක් නැත. එනිසා මේ සිටු පුතුට ගීතවාදනය පමණක්ම ඉගැන්වුහ. දෙමාපියන් මහළු වයසට පත්වන විට පුතුට ආවාහයක්ද කරදෙන ලදී. අනතුරුව ටික කලකින් දෙමාපියෝ කළුරිය කළහ.

අසුදෙකෝටියක් ධනය තිබුන එම නගරයේම කුළ දුවක් ඇතිවිය. ඇගේද දෙමාපියෝ එලෙසම සිතා නැටුම් ගැයුම් පමණක්ම ඉගැන්වුහ. ඔවුන් දෙදෙන වැඩිවියට පත්වුවිට විවාහ වුහ. අනතුරුව එම දෙමාපියන්ද පරලොව ගියහ. දෙ අසූ කෝටියක් වූ ධනය එකම ගෙයි තැබුනි. සිටුපුත් තෙම දිනකට තෙවරක් රාජසේවය සඳහා යයි.

මේ අතර නගරයේ ධූර්තයෝ - මේ සිටුපුත් සුරාලෝලී කෙනෙක් වන්නේනම් අපට පහසු වන්නේය. ඔහුට සුරාලෝලී බව ඇතිකරනෙමුයි ඔවුන් සුරාගෙන බඳින ලද මස්ද ලුනු හා හකුරු ද දසරුවේ බැඳගෙන අලයක් (පුලුස්සා) ගෙන එම රාජ කුලයෙන් ආපසුඑමින් සිටින මග රැක බලාසිට සිටුකුමරුට රා පොවා ලුණු හා හකුරු කටට දමා පුලුස්සන ලද අලය සපා සිටුපුත්‍රය සියවසක් ජීවත් වන්නැයි සිටුපුත්‍රය ඔබ නිසා අපට කෑමට බීම ලැබෙන්නේයයි කීවාහුය. හේ ඔවුන්ගේ වදන් අසා පසුපස එන්නාවූ සුලු සේවක යාගෙන් විමසුවේය. මේවා බොන්නද? ඔහු ස්වාමීනි. එක්වරක් බොන්න. සුරා ඉතා ප්‍රියමනාපය. ස්වාමිනි. මෙලොව මේ හා සමවූ පානය කලයුතු වෙන දෙයක් නැත. ඔහු ද මම ද පානය කිරීම වටී යයි කියමින් ටික ටික ගෙන්වාගෙන බොයි. අනතුරුව නොබෝකලකින් එම සුරාධූර්තයෝ බොන බව දැන ඔහු පිරිවරා ගත්හ. කල්ගතවන විට පිරිවර

බොහෝ විය. ඔහු සියයකින්ද කහවනු දහසකින්ද සුරා ගෙන්වාගෙන බොන්නේ පිළිවෙලින් හුන්නැන කහවනු ගොඩගසා රාබොමින් මේ මල් ගෙන එන්න මේ සුවඳ දූ ගෙන්වන්න.

මේ ජනයා සුදුවෙහි දක්ෂය මේ ජනයා නැටීමේ දක්ෂයෙකි මේ නැනැත්තා ගීතයෙහි වාදනයෙහි දක්ෂය මොහුට දහසක් දෙන්න. මොහුට දෙදහසක් දෙන්න. මේ ලෙසින් වියදම් කරන්නේ නොබෝදිනකින්ම තමාසතු අසුකෙලක් ධනය වැයකොට ස්වාමිනි ධනය අවසන්වීයයි පැවසුවිට ඇයි මගේ බිරිඳසතු ධනය නැත්දැයි විමසා ඇති බව පැවසුවිට ඒවාද ගෙන්වාගෙන ඒවාද එලෙසම වැය කොට පිළිවෙලින් ආරාම උයන් වතු සියල්ල විකුණා පිළිවෙලින් භාජන පොරෝණ හා ඇඳ පුටු පවා විකුණා සුරාවට වැය කළේය. අන්තිමට තම නිවසපවා විකුණා දමා පාරට බසින්නට සිදුවිය. හේ බිරිඳ සමග අත් අයගේ ගෙවල් වල අගපිල්වල වාසය කරමින් මැටි කබලක් ගෙන පිඬු පිණිස හැසිරී ඉඳුල් බත් කන්නට විය. එක් දිනක් ආසන ශාලාවේ දොරටුව සිට කුඩා සාමනේර හිමිවරු විසින් දෙන ඉඳුල්බත් පිළිගන්නා අයුරු දැක බුදුන් වහන්සේ සිනා පහළ කළහ. එය දුටු ආනන්ද තෙරුන් සිනා පහළ කිරීමට හේතු වීමසුහ. එයට හේතු දැක්වූ බුදුරජාණන් වහන්සේ ආනන්ද බලන්න මේ මහධන සිටුපුත් තෙම මෙ නගරයේම දෙඅසුකෙලක් ධනය විනාශකර භාර්යාවත් සමග අනුන්ගෙන් සිඟා කන අයුරු

ඉදින් මේ තැනැත්තා පළමු වයසේදී සම්පත් විනාශකර නොගෙන කර්මාන්තයෙහි යෙදුවුයේ නම් මොහුට අගසිටු වරයා වන්නට තිබුනි. ඉදින් ගිහිගෙහි නික්ම පැවිදි වුයේනම් අර්හත් වන්නට තිබුනි. ඔහුගේ බිරියද අනාගාමී වන්නට තිබුනි. ඉදින් මධ්‍යම වයසේදී භෝග සම්පත් විනාශ නොකර කර්මාන්තයෙහි යෙදෙව්වේනම් දෙවැනි සිටුවරයා වන්නට තිබුනි. ගිහිගෙයින් නික්ම පැවිදි වුයේ නම් අනාගාමී වන්නට තිබුනි. භාර්යාවටද සකෘදාගාමී ඵලයට පත්වන්නට තිබුනි. ඉදින් පශ්චිම වයසේදී කර්මාන්තයෙහි යෙදෙව්වේ නම් තුන්වන සිටු තනතුරටද, පැවිදි වුයේනම් සකෘදාගාමී වන්නට ද තිබුනි. භාර්යාවද සෝවාන් වන්නට තිබුනි දැන මොවුන් දෙදෙන ගිහි සම්පත්වලින්ද පැවිදි සම්පතින්ද පිරිහී වියලුනු මඩ

ගොඩක කොස්වා ලිහිනියෙකු සේ වැනසි යයි පවසා මේ ගාථාව දේශනාකළහ.

නො සොයා දනය රැකියා කොට තරුණ වියේ
නො ලබා දහම් ඇස පැවිදිව මැදුම් වියේ
පතිනිය සමග සිඟමින් යන පැසුළු වියේ
කොස්ලිහිණියෙකු වැනි කුඩ මසු නොමැති දියේ

යොවුන්විය බඹසර
නොරැක දනයද නොසොයා
කෙළි දෙලෙන් මත් වී
සිට අද සිඟා කන්නේ
දුන්නකින් විදලු
හියක් වැන්න වනමැද

"යොවුන්වියේදී බ්‍රහ්මචරියාවේ නොහැසිරී ධනය නොලැබ මසුන් නැති වියලී මඩ වගුරක මහළු කොස්වා ලිහිණියෙකු සේ තැවේ.

බ්‍රහ්මචරියාවේ නොයෙදී යොවුන්වියේදී ධනය නො ලැබ මැදුම් වියේදී බ්‍රහ්මචරියා වේ නොහැසිරී පෙරකළ දෑය සිහි කරමින් සුසුම් ලමින් හොවිත්.

එහි - **අචරිත්වා** යනු බ්‍රහ්මචරියාවේ නොයෙදී **යොබ්බනෙ** ඇති නොවූ භෝග ඉපදවීමටද උපන්ධන ධාන්‍ය ආරක්ෂා කිරීමට සමත් කාලය - **ධනම්පි** ධනයද නොලැබ **ඕණමෙජති** ඒ එබඳු වූ අඥානයා ජලය නැති නිසා මාළු නැති මඩවගුරේ ජරාවටපත්වූ කොස්වා ලිහිණියෙකුගේ තැවීමට අත්වේ. **පල්ලලෙ** මෙසේ කියන ලද මඩෙහි ජලය නැතිවූ සේ මේ භෝග සම්පත් නොමැති නිසා මත්ස්‍යයන් නැතිසේ මේ භෝග අභාවය නිසා ජරාවූ කොස්වා ලිහිණියන්ගේ ගමන් ස්වභාවය වේ. ජල ඵල ආදියේ භෝග රැකගැනීමට නොහැකිසේ එනිසා ජලය නැති වගුරේ බලාසිටින කොස්වාලිහිණියන් වැන්න. **චාපාතිඛිත්තාවාති** - යම්සේ වේගයෙන් ගිය ඊතලය වැදී ආපසු ඇදගත්විට ඇතිවන තුවාලයක්සේ එලෙසම බාල

තරුණ මහලු තුන් වියේදීම සම්පත් නොලැබුනවිට ඊතල පහරින් මියයන්නාසේ නිරර්ථකම මියයාමට හේතුවේ.

"සෙනති චාපාකිඛිනනාවානා පුරාණානි අනුසඤඤනනති"

පෙර මෙබඳු දේ කැවෙමි. මෙබඳු දේ බීවෙමි මේලෙස පෙර කල කී දේ සිහිකරමින් තැවෙමින් සිටිති. දේශනය අවසන බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පැමිණියහ.

මහධන සිටුපුතුගේ කතා පුවතයි.

ජරා වර්ග වර්ණනාව අවසානයි

එකොළොස් වැනි වර්ගයයි.

12-1

"අත්තානඤ්ඤේව" යන මේ දම්දෙසුම ශාස්තෘන් වහන්සේ භේසකලා වනයෙහි වැඩසිටියදී බෝධිරාජ කුමරුන් නිමිති කරගෙන දේශනා කළහ.

මේ රාජ කුමරු පොළෝතලයෙහි අනෙක් ප්‍රාසාදවලට අසමාන අහසේ ගුරුළෙකු මෙන් කෝකනද නම් ප්‍රාසාදයක් කරවා එය කළ වඩුවාගෙන් ඔබ මෙයට පෙර මෙබඳු ප්‍රාසාදයක් කරණ ලද්දේ ද? නැතහොත් මේ පළමු ප්‍රාසාදයද යනුවෙන් විමසීය. දේවයන් වහන්ස මෙය පළමුවැන්නයි. පැවසුවිට මෙසේ සිතුවේය. ඉදින් මේ වඩුවා වෙනත් කෙනෙකුට මෙබඳු ප්‍රාසාදයක් කරන්නේනම් මෙහි ඇති ආශ්චර්යමත් බව නැතිවේ. මේ වඩුවා මැරීම අත්පා කපා දැමීම ඇස් උපුටා දැමීම හෝ කළයුතුයයි සිතුවේ, අනෙකෙකුට මෙබඳු ප්‍රාසාදයක් කළ නොහැකිවන ලෙසටය. මෙසේ සිතා එය ඔහුගේ හිතවත් මිතුරුවූ "සඤ්ජීතා පුත්ත" නම් රජ කුමරුට පැවසීය. මානවකයා නිසැකවම මොහු මේ දක්ෂ ශිල්පියා මරවන්නේයයි සිතා, මාකෙරෙහි පැහැදුන මේ වඩු ශිල්පියා බේරා ගන්නට නොරතුරු කියන්නෙමියි සිතා වඩුවා වෙත ගොස් ප්‍රාසාදයේ නිමවීම් අවසන් දැයි විමසා නිමාකළ බව පැවසූවිට රජ කුමරු නුඹ මැරීමට සිතයි. නුඹ විසින් ආරක්ෂා වියයුතුයයි කීය. වඩුවා ඒ බව දැනුම් දීම හොඳයයි පවසා මම කළ යුතු දේ දනිමියි පවසා රජ කුමරු වැඩ අවසාන දැයි විමසූ අවස්ථාවේදී බොහෝ කටයුතු තව ඇතැයි කීය. තව ඉතිරිව ඇත්තේ කවරේදැයි කුමරු ඇසීය. දේවයන් වහන්ස පසුව කියන්නෙමියි පවසා දැවගෙනත් දෙන්නැයි ඉල්ලා සිටියේය. කුමක් සඳහාදැයි කුමරු විමසීය. දේවයනි. අරටු නොඹැති වියළි දැව ගෙනත් දෙන්න. ඔහු ගෙන්වා දුන්නේය. දේවයනි මෙයින් පසු මා සමීපයට නොඑන්න. කුමක් නිසාද සියුම් කර්මාන්ත කරණ විට අනෙක් අය හා කථාකිරීම මගේ කර්මාන්තයට බාධාවකි. කෑම වේලාවේ මගේ බිරිඳ කෑම ගෙනෙනු ඇත. රජකුමරුද හොඳයයි පිළිගත්තේය. වඩුවාද එක් කාමරයකටවී එම දැව රැස තමන්ගේ අඹු දරුවන්ට ඇතුලත වාඩිවීමට යෝග්‍යසේ ගුරුළුකුගේ ස්වරූපයට සාදා කෑම ගන්නා අවස්ථාවේදී බිරියට මෙසේ කීවේය. ගෙදර චිකිණිය හැකි සියල්ල විකුණා දමා රන් රිදී පමණක්

එක් රැස් කරගන්න. රජ කුමරුද වඩුවාට නික්මීමට නොහැකිලෙසට ගෙය වටකොට ආරක්ෂාව තැබීය වඩුවාද ගුරුලු පක්ෂියාගේ නිමකිරීම අවසන්කර, අද සියළු දරුවන් ගෙන එන්නැයි බිරිඳට කියා උදැසන ආහාරගෙන අඹුදරුවන් ලී පක්ෂියාගේ කුස වාඩිකරවා සුලං කවුලුවෙන් නික්මී පළා ගියේය.

හේ දේවයිනි වඩුවා පළා යන්නේයයි පවසමින් ගොස් හිමවත් පෙදෙසෙහි බැස, එක් නුවරක් තනාගෙන කටයුතුවාහන රජුයයි ප්‍රසිද්ධවිය. රජ කුමරුද ප්‍රාසාද උත්සවය කරන්නෙමියි බුදුන්ට ආරාධනාකර අළුත් මැදුර සුවඳවර්ග හතරකින් සුවඳවත්කොට පළමු මහලේ සිට පිරුවටයක් එලුවේය. මේ බෝධිරාජ කුමරුට දරුවන් නොමැතිහෙයින් දරුවන් ඇතිවන්නේනම් බුදුරාජාණන් වහන්සේ මේ පිරුවටය පාගමින් වඩිනු ඇතැයි සිතුවේය. රජකුමරු බුදුන් වැඩමකළවිට පසඟ පිහිටුවා වැද ස්වාමීනි පාත්‍රය දෙන්නැයි ඉල්වාගෙන ස්වාමීනි ඇතුලුවන්නැයි පැවසීය. බුදුහු නොපිවිසී සිටියහ. ඔහු දෙවන තුන්වැනි වරද ආරාධනා කළේය. තථාගතයන් වහන්සේ නොපිවිසම ආනන්ද තෙරුන් දෙස බැලුහ. තෙරුන්වහන්සේ බැලු සංඥාවෙන්ම පාවඩ වස්ත්‍රය නොපාගනබව දැන රාජ කුමාරය පාවාඩ වස්ත්‍රය අකුලන්න තථාගතයන් වහන්සේ එය පාගා නොවඩින්නේයයි පැවසූහ. පශ්චිම ජනතාට බුදුන් බලා සිටීය දීම වස්ත්‍රය බැහැරකළේය. ඔහු පාවඩ වස්ත්‍ර අකුලුවා බුදුන් ඇතුළු නිවසට වැඩමකරවා කැඳබත් ආදියෙන් සංග්‍රහකර එකක් පසෙක වාඩිවී ස්වාමීනි මම ඔබ වහන්සේට උපකාර කරන්නෙක්මි. තෙවතාවක් සරණ ගිය කෙනෙක්මි.

එක්වර මව්කුස සිටියදිය - දෙවන වර තරුණ අවස්ථාවේදිද තෙවැනි වර මුහුකුරාගිය කලද සරණ ගිය මගේ වස්ත්‍රය කුමක්හෙයින් පාවඩ වස්ත්‍රය මැඩ නොවැසීදයි විමසුවේය. කුමාරය ඔබ කුමක් සිතාගෙන වස්ත්‍රය ඇතුරුවේද? ස්වාමීනි මම ඉදින් පුතෙක් හෝ දුවනියක් ලැබෙන්නේ නම් තථාගතයන් වහන්සේ මැඩගෙන යන්න කියා සිතුවෙමි. එනිසා මම නොපෑගුවෙමියි බුදුහු පැවසූහ. ඇයි ස්වාමීනි පුතෙක් හෝ දුවක් මට නොලැබෙන්නේද? කුමක් නිසාද ස්වාමීනි. කුමාරය පෙර ආත්මයකදී ස්වාමී දුවනිය සමග ඇතිවූ ප්‍රමාද දෝෂයක් හේතුවෙනි. ස්වාමීනි කවර කාලයකද

අනතුරුව බුදුහු අතීත සිදුවීම පෙන්වා දුන්හ. පෙර භවයකදි නොයෙක් සියගණන් මිනිස්සු මහත් නැවකින් මුහුදු ගියහ. ඒ නැව සාගරය මැදදී සිඳුනි. අඹුසැමි දෙදෙන එක් ලැල්ලක් අල්ලාගෙන කුඩා දිවයිනකට ගොඩබැස්සාහ. අනෙක් සියළුදෙන මුහුදේ ගිලී මළහ. එම දිවයිනේ මහත් පක්ෂි සමූහයක් විසුහ. මේ දෙදෙන වෙන කෑ යුතු දෙයක් නොමැතිහෙයින් සාපිපාසාවෙන් යුතුව කුරුළු බිජු අඟුරුවල තම්බා කෑවාහුය. එවා අවසන් වූ විට කුඩා කුරුළු පැටවුන්ගෙන කෑවාහුය. මෙලෙසින් පළමුවන දෙවන තෙවන අවස්ථාවලදීද මේ දෙදෙනාම මේ පිළිබඳව සිතා අප්‍රමාදී නොවුහ. මේ පෙර කර්මය දක්වා ඉදින් රාජකුමාරය එක් අවස්ථාව හෝ භාර්යාව සමග අප්‍රමාදී වූයේ නම් පුතෙක් හෝ දුවක් උපදින්නට තිබුනි. දෙදෙනාගෙන් එක් අයෙක් හෝ මෙසේ නොකලෙන් දරුවෙක් නොලැබුනි. මේ නිසා තුන්වයසින් එක් වයසකදී හෝ තමන් ප්‍රවේශම් වියයුතු යයි පවසා මේ ගාථාව දේසුහ.

මිනිසකු සතුව පවතින තුන් විය	අතර
එක් වියකදී වත්පවි කළයුතු	නතර
තුන් විය තුළදීම පවි කළහොත්	නිතර
දුක් කරදර නොයෙක් පීඩා වෙයි	සසර

තමා තමන්ට ප්‍රිය වේනම් ආත්මය සුරකින්නේය බාල තරුණ මහළු අවස්ථාවලදී නුවණැත්තා අකුසලින් මිදී කුසල් කරමින් රැකෙයි.

එහි **යාම** යනු බුදුරජාණන් වහන්සේ ධර්මයෙහි අධිපති නිසාත් දේශනයේ දක්ෂතාව නිසාත් වයසේ අවස්ථා තුනෙන් එක්යාමයක හෝ යනුවෙන් දක්වුහ. ඉදින් **අත්තානං පියං** - දැන ගන්නේය. **රක්ඛෙය්‍යනං සුරක්ඛිතං** - යම් සේ කෙනෙක් තමන් සුරකින්නේද එසේම අනුන්ද රැකිය යුතුය එහි ඉදින් යම් ගිහියෙක් නම් තමා රකින්නෙමියි ප්‍රාසාදයක උපරිම තලයක කාමරයක ආරක්ෂාවෙන්ද? පැවිද්දෙක්නම් හොඳින් වසන ලද ජනෙල් දොරවල් සහිත ලෙනක වාසයකළද එය තමන් නො රැක්කේම වන්නේය. ගිහියෙක් නම් ශක්ති පමණනින් දාන සීලා දී පින්කම් කළ යුතුය. පැවිද්දෙක්

නම් වත් පිළිවෙත් පිරිය යුතුය. යෝනිසෝ මනසිකාරයෙන් යුක්තව වීර්යය වඩා ප්‍රාප්තියට පැමිණිය යුතුය. මෙසේ තුන් වයසේදී පින් රැස් කිරීමට නොහැකිවන්නේ නම් අන්‍යයන් අතුරින් නැණවතා තමන් ආරක්ෂා කරගත්නේමය. අනෙක් වයසේදී තමන් කුසලින් රක්ෂිත වේ ඉදින් ගිහියෝ නම් පළමු වයසේදී ක්‍රීඩාවෙන් පසුවී කුසල් දහම් නොකරයි නම් මධ්‍යම වයසේදී අප්‍රමාදීව කුසල් කළයුතුයි. ඉදින් මධ්‍යම වයසේදී අඹුදරුවන් පෝෂණය කරමින් කුසල් කිරීමට නොහැක්කේ නම් පශ්චිම වයසේදී කුසල් කල යුතුය. මෙසේ කිරීම තමන් පිළිදැගුම් කිරීමක්ම වන්නේය. එලෙස නොකරන්නාට තමන්ම ප්‍රිය නොවේමය ඔහු එසේ ඇති විට අපාය ගාමී බවටම පත්වේ. ඉදින් පැවිදි වුවෙක්නම් පළමු වයසේදී පාඩම් කරමින් මතක තබාගනිමින් කියවමින් වත් පිළිවෙත් කරමින් ප්‍රමාදවේද? මධ්‍යම වයසේදී මහණදම් කළ යුතුමය. ඉදින් පළමු වයසේදී උගත් ධර්මය අර්ථතතා විනිශ්චය කරුණු නොකරුණු විමසමින් මධ්‍යම වයසේදීත් ප්‍රමාද වේනම් පච්ඡිම වයසේදී මහණ දම් පිරිය යුතුය. මේ ලෙස තමන් සුරක්ෂිත කරගන්නේනම් වෙයි. මේලෙස නොකරන්නාට වනාහි තමා ප්‍රියනම් නොවේ. පසුව පසුතැවිලි වීමට හේතුවේ.

දේශනාව කෙලවර රාජ කුමාරයා සෝවාන් ඵලයෙහි පිහිටියේය. පැමිණි පිරිසටද දේශනය සාර්ථක ප්‍රතිඵල විය.

බෝධිරාජ කුමරුගේ කථා පුවතයි.

12-2

"අත්තානමෙව පඨමං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී ශාක්‍ය පුත්‍ර උපනන්ද තෙරුන් නිමිත්තකරගෙන දෙසුහ. එම තෙරුන් ධර්දේශනයෙහි දක්ෂයෙක් වීය. උන්වහන්සේගේ **අපසිච්චතාදි** ගුණ කථා අසා බොහෝදෙන තුන්සිවුරුවලින් පුජාකර ධුතාංග සමාදන්වුහ. ඔවුන් විසින් අතහරණ ලද පිරිකර ඔහුම ගත්තේය. ඔහු වස්කාලය ඇතුලත උපකට්ඨ (නියමිත) ජනපදයට වැඩමකළේය. ඉක්බිති එක් විහාරයක තරුණ සාමණේරවරු ව්‍යක්ත ධර්ම දේශකයෙක් නිසා මෙහි වස් සමාදන් වෙන්නැයි පැවසුහ. මෙහි කොපමණ වස්සිවුරු ලැබේදැයි විමසුවිට එක සළුවකැයි පැවසුයෙන් එහි පාවහන් තබා අනෙක් ආවාසයකට වැඩියේය.

දෙවන විහාරයේදී කොපමණ සළු ලැබේදැයි විමසුවිට සළු දෙකක් යයි පැවසුවිට සැරයැටිය එහි තැබීය. තුන්වැනි ආවාසයට ගොස් මෙහි කොතෙක් සළු ලැබේදැයි සළු තුනෙකැයි පැවසුවිට, දියකළයක් තැබුවේය. හතරවැනි විහාරයට ගොස් කොපමණ ලැබේදැයි විමසා සළු හතරකැයි පැවසුවිට හොඳයි මෙහි වස් වසමියි. එහි වස් සමාදන්මී. ගිහි පැවිදි දෙපිරිසටම ධර්මදේශනා කළහ. ඔවුහු බොහෝ වස්තු හා සිවුරු පුජාකළහ. ඔහු වස් සමාදන්වූ අනෙක් විහාරවලට ද ලියුම් යවා මගේ පරිෂ්කාර තැබුහෙයින් වස්සාවාසිකය ලැබියයුතු යයි ඒවා මට එවන්නැයි සියල්ල ගෙන්වාගෙන ගැලක තබා පුරවා යැවීය. මේ අතර එක් තරුණ භික්ෂු දෙනමක් සළු දෙකක් හා පලසක් ලැබ බෙදා ගැනීමට නොහැකිව වාදකරමින් සිට බෙදාදෙන්නැයි ඉල්ලාසිටියහ. ඔබම බෙදාගන්නැයි පැවසීය. ස්වාමීනි නොහැකිය ඔබවහන්සේ බෙදා දෙන්නැයි ඉල්ලාසිටියහ. එසේනම් මගේ වචනය පිළිගන්නේද? එසේය සිටිමුයයි කීවිට එසේනම් යහපතැයි කියා එම සාමණේර භික්ෂූන් දෙනමට සාටක දෙක දී මම ධර්මකථික නිසා පොරෝණය මට සුදුසු යයි කියා වටිනා කම්බිලිය ගෙන ගියේය විපිළිසරවූ තරුණ භික්ෂූන් බුදුන්වෙත ගොස් මේ කරුණ දැන්වුහ.

බුදුරජාණන් වහන්සේ මහණෙනි දැන්පමණක් නොව පෙරද ඔබ විපිළිසර කළේයයි අතීත කථාව ගෙනහැර දැක්වුහ. ඇත අතීතයේ අනුනීර වාරී ද

ගම්හිර වාරි ද යන දියබල්ලෝ දෙදෙනෙක් මහත්වූ රතුපාට මාළුවෙක් ගෙන මට ඔළුව පෙදෙස වේවා ඔබට වල්ග පෙදෙස වේවායි වාදකරගනිමින් බෙදාගැනීමට නොහැකිව එක් සිවලෙක් දැක මෙසේ කීවාහුය. මාමේ මෙය අපට බෙදාදෙන්න එසේ පැවසුවිට මේ සිවලා මම රජුගේ විනිශ්චය කරුවෙකි. එහි බොහෝ වේලාවක් වාඩිවිසිට ශරීරසුවය සඳහා ඇවිදීමට ආවෙමි. දැන් වේලාවෙක් නැ. යනුවෙන් පැවසුවේය. එවිට දියබල්ලෝ දෙදෙනා මාමේ එසේ නොකරන්න. අපට බෙදා දෙන්නැයි පැවසුහ. එසේනම් මගේ වචනයේ පිහිටන්නේදැයි විමසා එසේය අපි ඔබේ වචනය පිළිගන්නෙමුයයි පැවසුවිට ඔහු යහපතැයි පවසා හිස සිඳදමා එක පැත්තකටද වලිගය තවත් පැත්තකටද දමා යමෙක් අනුතීරේ හැසිරේද ඔහුට නගුටද ගම්හිරේ හැසිරේද ඔහුට හිසද වේවා. මම විනිශ්චය කළ නිසා මැදකොටසද වේවායි පැවසිය.

අනුතීරවාරිට නගුටයි, ගම්හිර වාරිට හිසයි, ධර්ම විනිශ්චය දුන් තැනැත්තාට ශරීරයේ මැද කොටසයි.

මෙම ගාථාව කියා මාළුවාගේ මැදකොටස ගෙන නරියා ගියේය. ඔවුන් දෙදෙනා විපිලිසරට පත්ව බලමින් සිටියහ. බුදුහු මේ අතීත කථාව පෙන්වාදී මේලෙස තොප අතීතයේද විපලිසරට පත්විය. යනුවෙන් එම භික්ෂූන් දෙනමට පැහැදිලි කරදී උපනන්ද තෙරුන්ට ගර්හා කරන්නේ මහණෙනි අන්අයට අවවාද කරන්න විසින් පළමුව තමන් සුදුසු සාධාරණත්වයේ පිහිටා අන් අයට දෙවනුව අවවාද කළයුතුයයි පවසා මේ ගාථාව දේශනාකළහ.

නිවරද වී තමන් - සාධාරණව සිනමින්
අනුන්හට ඔවදන් - දීම උගතුන්ගේම ගනියයි.

තමන් පළමුව ආදර්ශමත් බැව්හි පිහිටා සිට අන්අයට අවවාද කරණ නුවණැති භික්ෂුව කිලුටු බවට පත් නොවන්නේය. ඔවාදෙනු පරහට තමා සම්මතෙහි පිහිටා සිට

එහි **පතිරූපෙ නිවෙසයෙ** - යනු සුදුසු ගුණයේ පිහිටීමයි. මෙසේ කියනලදී. අල්පේච්ඡතා ආදී ගුණයන්හි මෙන්ම, අරියවංස ප්‍රතිපදාවේ පිහිටිය යුතුය. එසේ පිහිටා සිට **අඤ්ඤං** එම ගුණයෙහි, **අනුසාසෙය්‍ය** - තමන් වනාහි එවැනි ගුණයන්හි නොපිහිටා නුදෙක් ගුණයන්හි අනුන් පිහිටුවීමට අවවාද අනුශාසනා කරන්නේනම් අන්අයගෙන් නින්දා අපවාද ලැබ කිලිටුබවට පත්වේ. එසේ නො මැති පළමුව තමන් ගුණයෙහි පිහිටා අනුන්ට අනුශාසනා කරන්නෝ අනුන්ගේත් ප්‍රශංසාව ලබති. එහෙයින් **කිලිසෙය්‍ය** නුවණැත්ත තමගුණයන්ට අන් අය පවසන නිසා කිලිටි නොවේමය. දේශනාවසානයේ ඒ භික්ෂු දෙනම සෝවාන් ඵලයෙහි පිහිටියහ. බොහෝ දෙනාට දේශනය සාර්ථක විය.

ශාක්‍ය පුත්‍ර උපනන්ද තෙරුණ්ගේ කථා පුවතයි.

12-3

"අතතානඤ්ඤෙව" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී පාධානික තිස්ස තෙරුන් නිමිතිකරගෙන දේශනා කළහ.

හේ බුදුන්ගෙන් කර්මස්ථාන ලබාගෙන පන්සියයක් භික්ෂූන්ගෙන ආරණ්‍ය වාසයට ගොස්, ඇවැත්නි ජීවමාන බුදුන් වැඩසිටියදීම ඔබලා කර්මස්ථාන ලබාගෙන සිටින හෙයින් අප්‍රමාදීව ශ්‍රමණ ධර්ම කරන්නැයි අවවාද දී තමන් ගොස් වැතිරී නිදාගනී. එම භික්ෂූන් පළමු යාමය සක්මන්කර, මධ්‍යම යාමයේදී විහාරයට පිවිසෙති. ඔහු නිදාගෙන අවදිවූ අවස්ථාවේදී ඔවුන් සමීපයට ගොස් කීම ඔබ වහන්සේලා වැතිරී නිදන්නෙමුයි අවේද? වහා නික්මී ශ්‍රමණ ධර්මය කරන්නැයි කියා තමන් ගොස් පළමුලෙසටම නිදාගනී. අනෙක් තෙරවරු මධ්‍යම යාමයේද පිටත සක්මන්කර අළුයම් වේලේ පන්සලට පිවිසෙති. අරතෙරුන් නැවත අවදිවී ඔවුන් වෙත ගොස් ඒ භික්ෂූන් ආරාමයෙන් බැහැර කොට නිදාගනී. මේ නිසා එම භික්ෂූන් වහන්සේලාට සජඣායනාවක් හෝ කර්මස්ථානයක් හෝ සිහිපත් කිරීමට නොහැකිවුහ. සිත අන් අතකට ගියේය. එම භික්ෂූහු අපේ අචාර්යන් වහන්සේ ඉතා අධිකලෙස පටන්ගත් වෙර ඇතිව අප වෙහෙසවා ඔහු කරණ නිදාගැනීමේ ක්‍රියාව දැක ඇවැත්නි අපිනැසුනෙමු. අපේ ගුරුවරයා හිස් තැනැත්තෙකි බොරුවට අපට කෑගසතියි කීවාහුය. එම භික්ෂූන් අතිශයින් නිදිමතින් ක්ලාන්තව එක භික්ෂුවකටද විශේෂ අධිගමයක් ලබාගැනීමට නොහැකිවිය. එම භික්ෂූන් වහන්සේලා වස් පවාරණය කිරීමෙන් අනතුරුව තථාගතයන් වහන්සේ සමීපයට ගොස් බුදුන් සමග පිළිසඳර කථාකොට අනතුරුව බුදුරජාණන් වහන්සේ කිම මහණෙනි අප්‍රමාදීව මහණ දම් පිරුවාහුදැයි විමසුහ. ඔවුහු තමන්ට සිදුවූ ගැහැට පිළිබඳවත් ගුරුවරයාගේ ස්වරූපයත් පෙන්වා දුන්හ. බුදුරජාණන් වහන්සේ මහණෙනි දැන් පමණක් නොව පෙරද මේ තැනැත්තා ඔබට අනතුරක්ම, බාධාවක්ම කළේයයි පවසා සිටිවිට එම භික්ෂූන්ගේ ආයාචනය පරිදි, අකාලරාව් කුක්කුට ජාතකය විස්තර කොට වදාළසේක.

මව්පියන් සමීපයේ නො වැඩුනු, ගුරුවරයකු සමීපයේ පුහුණු නොවූ මේ කුකුළා හැඬිලිය යුතු කාලය හෝ නො හැඬිලිය යුතු කාලය නො දනී.

එදා නොකල්හි නාදකළ කුකුළා මේ පධානිකතිස්ස තෙරුන්විය. මේ පන්සියයක් භික්ෂුහු ඒ තරුණයෝ වූහ. දිසා පාමොක් ආචාර්ය වූයේ මම යි. බුදුහු මෙම ජාතකය විස්තර කර මහණෙනි! අන් අයට අවවාද කරණ තැනැත්තා තමා සුදනෙක් වියයුතු යයි පවසමින් මේ ගාථාව දේශනාකළහ. අන් අයට අනුශාසනා කරණුයේ තමන්ද එසේ කළ යුතුය තමන් දමනය නොවී අන්අය දමනය කළ නොහේ.

තමන් පළමුව සුදුස්සෙකු වී - අනුන් දෙවනුව හික්ම වියයුතු
තමන් නො දැමී දුදනෙකුම වී - අනුන් සුදනන් කෙසේ කරමුද?

මෙහි අදහස යම්සේ භික්ෂුව ප්‍රථම යාමය ආදියේ සක්මන් කළයුතුයයි පවසා අවවාද කරයි. තමන් එසේ නොකරයි. **අත්තාන ඤෙව තථා කයිරා යථඤඤමනුසාසති** අන්අයට උපදෙස් දෙනලෙසට තමන්ද පිළිපැදිය යුතුය. **සුදන්තො වත දමෙථාති** යම් ගුණයකින් අන්අයට අවවාද කරන්නේද තමන්ද ඒ ලෙස දමනය වියයුතුය.

මෙම දෙසුම අවසානයේ පන්සියයක්වූ එම භික්ෂූන් වහන්සේලා අර්හත්වයට පැමිණියහ.

පධානික තිස්ස තෙරුන්ගේ පුවතයි.

12-4

"අත්තාහි අත්තනෝ නාථෝ" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ සැවත දෙව්රම්වෙහෙර වැඩසිටියදී කුමාරකාශ්‍යප තෙරුන්ගේ මෑණියන් අරමුණු කරගෙන දේශනා කළහ.

ඇය රජගහනුවර සිටුදුවක්ව ඉපිද යමක් තේරුම් ගැනීමට හැකි තත්ත්වයට පැමිනි තැන් සිටම පැවිද්ද ඉල්ලා සිටියාය. මේ අතර ඇගේ දෙමාපියන් ඉදිරියේ නැවත නැවතද ඉල්ලා සිටියත් පැවිදිවීමට අවස්ථාව නොලැබුනි. වැඩි වියට පත්ව පතිකුලයට ගොස් සැමියාගේ නිවසේ පතිනිය වී වාසය කළාය. මේ අතර වැඩිකල් නොගොස්ම ඇගේ කුස තුළ දරුගැබක් පිහිටියේය. ඇය ගැබ පිහිටි බව නොදන සැමියාගෙන් පැවිද්දට අවසර ඉල්ලීය. පැවිදිවීමට අවස්ථාව ලබාගත්තාය. එම සැමියා මහත් සත්කාරයෙන් භික්ෂුණී සංඝයා වෙත පමුණුවා නොදනුවත්වම දෙව්දත් තෙරුන්ගේ පක්ෂයේ භික්ෂුණීන් වෙත පැවිදී කරවීය.

පසු අවස්ථාවකදී භික්ෂුණී හු ඇගේ ගර්භණීභාවය දැනගෙන, මේ කුමක් නිසා සිදුවීදැයි විමසා සිටියහ. ඇය ආයාසීවනි මම නොදනිමි මගේ සීලයට හානියක් නොවීයයි පැවසුවාය. අනෙක් භික්ෂුණීන් ඇය දෙව්දත් තෙරුන්වෙත ගෙනගොස් මේ භික්ෂුණිය ශ්‍රද්ධාවෙන් පැවිදි වූ තැනැත්තියකි. මැය ගැබිනියක බව දනිමු. එහෙත් කාලය නොදනිමු. දැන් කුමක් කරන්නදැයි විමසුහ. දෙව්දත් තෙරුන් මගේ අවවාදයේ පිහිටන භික්ෂුණීන්ට අපකීර්තියක් සිදුවේයයි පවසා ඒ ගැන පමණක් සිතා ඇය උපැවිදි කරන්නැයි පැවසීය. එම තීරණය අසා මේ ගැබිණි භික්ෂුණිය ආයාසීවනි මාව නොනසවයි ද මම දෙව්දත්ත වෙනුවෙන් පැවිදි නොවූ නිසා බුදුන්වෙත දෙව්රමට ගෙනයන්නැයි ඉල්ලාසිටියාය. එම භික්ෂුණිනු ඇය සමග ගොස් දෙව්රම් වෙහෙරේ දී බුදුරදුන්ට දන්වා සිටියහ. බුදුරජාණන් වහන්සේ ඇය ගිහිව සිටියදී මේ ගර්භය පිහිටිබව දැන අන් අයගේ චෝදනාවෙන් ගලවාගැනීම සඳහා - පසේ නදී කෝසල, අනාථ පින්ඩික සිටුතුමා සුළු අනේ පිඬු සිටුතුමා, විසාඛා උපාසිකාව සහ අනෙක්

බලවත් කුලවල අයද කැඳවා උපාලි තෙරුන් ඇණවීය. යව මේ සිව් පිරිස මැඳ ඇය පිළිබඳව විනිශ්චයක් කොට ඇගේ පිරිසිදු බව සනාථ කරන්නැයි නියම කළහ. උපාලි තෙරුන්වහන්සේ කොසොල් රජු ඉදිරියේ විසාඛාව කැඳවා ඇයට ඇය පරීක්ෂා කිරීමට නියම කළහ. එතුමිය වටතිර ඇද ඇයව පරීක්ෂාකරමින් අත්පා නැබ. උදරය ආදිය පරීක්ෂාකර බලා දින මාස පිළිබඳව තීරණය කර ඇය ගිහිව සිටියදී ගැබ පිහිටිය එකක් බව තීරණය කර තෙරුන්ට ඇගේ නිරවද්‍යබව පැවසුවාය. මෙහිදී අධිකරණ විනිශ්චය කළ තෙරුන් වහන්සේ විසින් පිරිස මැද ප්‍රකාශකළහ. ඒ අනුව ඇගේ පවිත්‍රත්වය ප්‍රසිද්ධියට භාජනවුනි. අනතුරුව ඇය දරු ගැබ මුහුකුරා ගිය පසු පදුමුත්තර බුදුන් පාමුල කරණ ලද ප්‍රාර්ථනය අනුව මහත් ආනුභාව ඇති පුතනුකෙනෙකුන් බිහිකළාය. ඉක්බිති එක් දිනක් කොසොල් රජු හිඤ්ඡණි ආරාමය අසලින් යද්දී දරුවකුගේ ශබ්දය අසා මේ ළදරු හඬ කුමක්දැයි විමසා දේවයන් වහන්ස ඒ හිඤ්ඡණියට දරුවෙක් ලැබුනේ යයි පැවසුවිට එම කුමරු රජු ගෙන ගොස් කිරිමවුවරුන්ට බාරකළේය. නම් තබන දින ඔහුට කස්සපයයි නම් තබා කුමාරයෙක් ලෙසට වැඩුන නිසා කුමාරකස්සප නමින් හැඳින්වුනි. ඔහු සෙල්ලම්කරනවිට අනෙක් ළමයින්ට පහරදුන් විට මව පියා නැති එකා අපට තැලුවේයයි ඔවුන් කී කල්හී, ඔහු රජු වෙත එළඹ දේවයනි අනාථයයි කියා පවසති එබැවින් මගේ මව කවුදැයි කියන්නැයි ඉල්ලා සිටියේය. කොසොල් රජු මේ ඔබේ මවුවරුන් යයි කිරිමවුවරුපෙන්විය නැත දේවයනි මෙයින් එක් අයෙක් මගේ මව වියයුතුමය. එනිසා ඒ මගේ එකම මව කියන්නැයි පැවසුවිට මොහු රැවටීම අපහසුයයි සිතා දරුව ඔබේ මව හිඤ්ඡණියකි. මම මෙහෙණවරින් ඔබ රැගෙන ආවෙමියි පැවසුවේය. ඔහු එතෙනින්ම සංවේගයට පත්ව දේවයනි පියාණනි ! මා පැවිදි කරවන්නැයි ඉල්ලා සිටී. නිසා රජු දරුව ඉතා යහපතියි මහත් උත්සවයකින් ඒ කුමරු බුදුන් වෙත පැවිදි කරවීය. උපසම්පදාවද ලත් පසුව කුමාරකාශ්‍යප තෙරුන්යයි ප්‍රසිද්ධවිය. හේ බුදුන්වෙතින් කර්මස්ථාන ඉගෙන ආරඤ්ඤවාසිව උත්සාහ කර අධිගමයක් ලබා ගැනීමට නොහැකිව නැවත කමටහන් ලබාගන්නෙමියි බුදුන්වෙත ගොස් අඩ වනයේ වාසය කළහ. අනතුරුව කාශ්‍යප බුද්ධ කාලයේදී එකට මහණ දම් පිරූ අනාගාමී ඵලයට පත්වූ බඹලොව උපත ලද හිඤ්ඡුවක් බඹලොවින් පැමිණ ප්‍රශ්න පහළොවක් විමසා මේ ප්‍රශ්න බුදුන්හැර වෙනත් කෙනෙකුට විසඳිය නොහැකියයි පවසා

බුදුන්වෙත ගොස් ඉගෙන ගන්නැයි උනන්දු කළේය. ඔහු එලෙසම බුදුන්වෙත ගොස් ප්‍රශ්ණ විසඳුම් අවසානයේදී රහත්වූහ.

මේ කුමාරකාශ්‍යප තෙරුන් නික්මුන දින සිට දොළොස් වසක් මව් භික්ෂුනියගේ නෙතින් කඳුලින් වැගුරුනි. ඇය පුතුගේ වියෝ දුකින් කඳුළු වැගුරුන මුහුණින් යුතුව පිඬුසිඟා වඩින්නී දිනක් පුතුදැක අතුරු පාරක පුත - පුත - යනුවෙන් අමතමින් යන්නී පය පැකිලී වැටුනාය. ඇගේ පියවුරුවලින් කිරි වැගිරෙමින්ම සෙනෙහසින් ගැලවුන සිවුරද අල්ලාගෙන දුවගොස් තෙරුන්ගේ අතින් අල්ලාගත්තේය. තෙරුන්වහන්සේ මෙලෙස සිතූහ. ඉදින් මම ඇය මිහිරිවචන නොදුන්නොත් ඇගේ සෙනෙහස වැනසේ. තදබවක් පෙන්වාම මැය සමග කථාකරමියි සිතා මෙසේ පැවසුවේය. මොකද මේ කරන්නේ තවත් ස්නේහය නැතිකරගන්න බැරිවුනාද? යනුවෙන් තදින් විමසුවිට - අහෝ තෙරුන් මෙලෙස කථාකරයි. පුත කුමක් කියන්නේද? දෙවැනි වරද තෙරුන් දැඩිලෙසම කථාකලෙන් මව මේ ලෙස සිතුවාය. මම අවුරුදු දොළහක් මේ පුතු නිසා කඳුලු නොහෙලා සිටීමට නොහැකි වීමි. මොහු තද හදවත් ඇත්තෙකි. මට මොහුගෙන් කවර ප්‍රයෝජනයක්ද පුත්‍රප්‍රේමය සිඳදමා එදිනම රහත්වුවාය.

පසුකාලයකදී ධර්මසභාවේදී කථාවක් ඇතිවුනි මේ දෙවිදත් තෙරුන් මෙපමණ උපනිශ්‍රය සම්පන්නවූ කුමාර කාශ්‍යප තෙරුන් හා මව නසාදමන ලදි. බුදුරජාණන් වහන්සේ ඔවුන්ට පිහිටවූහ. බුදුවරුනම් ලොවට අනුකම්පා ඇත්තෝය. බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩමකරවා මහණෙනි මා එන්නට පළමු ඔබ කවර කථාවකින් සිටියේදැයි විමසූහ. මේ ප්‍රවෘත්තිය යයි පැවසූහ මහණෙනි දැන් පමණක්නොව මොවුන්ට මම පෙරද පිහිටවීමී.

නිග්‍රෝධ නම් මුවාවම ඇසුරු කරන්න. සේවනය කරන්න. සාඛ මුවා වෙත නොයන්න. ඔහු සේවනය නොකරන්න. සාඛ මුවා සමීපයේ ජීවත්වීමට වඩා නිග්‍රෝධ මුවා ළඟ මරණය යහපත්ය.

මෙම නිග්‍රොධ ජාතකය විස්තරවශයෙන් දේශනාකර එකල ශාඛාමිග දෙවිදත්විය. ඒ පිරිස දෙවිදත්ගේ පිරිසවිය. මරණයට වාරය පැමිනි මුවදෙන තෙරණියයි.

එදා මරණයට මුහුණ දී සිටි, මිග ධේනුව කුමාර කාශ්‍යප මාතාවයි. ඇයට ජීවිතය ලබාදී මරණයට යොමු වූ නිග්‍රෝධ මිග රාජයන් මම වෙමි.

ජාතකය සසඳා දරුසෙනහස සිඳි ථේරිය තමන්ට තමන්ම පිහිට බව ඔප්පුකළාය. මහණෙනි යමෙකුට ලොව් ලොවිතුරා සැප ලබා දීමට වෙනත් කෙනෙකුට පිහිට විය නොහැකිබවත්, තමන්ට පිහිට තමන්ම බවත් අන් අය විසින් කළ යුත්තක් නැතිබවත් පෙන්වා මේ ගාථාව දෙසුහ.

තමන් හිසට තම අතමය	සෙවනැල්ල
අනුන් බලා සිටියොත් වේ	වැනසිල්ල
කළ හොත් මනා කොට සය ඉඳුරන්	මෙල්ල
ලැබ ගත හැකිය ලොවිතුරු අම	සැනසිල්ල

තත්ථ නාථො මෙහි නාථ - නම් පිහිටයි. තමන්විසින්ම අර්ථවත් කුසල් කර ස්වර්ගයට හෝ පැමිනේ. මාර්ගයන් ලබන්නට හෝ ඵලයක් සාක්ෂාත් කරන්නට හෝ හැකිවන්නේය. එහෙයින් තමා මැ තමාට පිහිට වන්නේය. කෙසේ නම් වෙනත් අයකු පිහිට වන්නද? නොවේමැය.

සුදන්තෙන - මැනවින් දැමුන නැනැත්තා **අර්හත් ඵලය නම් වූ දුල්ලභං නාථං - ලභති** - අර්හත් භාවය සඳහා - **නාථං ලභති දුල්ලභං** යන්න කියන ලදී.

දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ඵලාදියට පත්වූහ.

කුමාර කාශ්‍යප මාතාවගේ කථා පුවතයි.

12-5

"අත්තනාව කතං පාපන්ති" යනමේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී, සෝවාන් වී සිටි මහාකාල නම්වූ උපාසක වරයෙක් නිමිති කරගෙන දේශනා කළහ.

මේ උපාසක තෙම මාසයකට දින අටක් පෙහෙවස් සමාදන්ව විහාරයේ සිට මුළු රාත්‍රියම ධර්ම කථා අසයි. එක්තරා දිනක රාත්‍රියේ සොරුන් එක් නිවසක බිත්ති සන්ධියක් බිඳ භාණ්ඩ පැහැරගෙන සිටියදී, ලෝභභාජන ශබ්දවීමේ හඬඅසා අවදිවූ ගෙහිමියන් විසින් ලුහුබදින්නේ ගත් ගත් භාණ්ඩ ඒ ඒ තැන දමමින් දුවන්නට වූහ. එක් සොරෙක් පන්සලට යන පාරෙන් පලායන්නේ රාත්‍රියේ බණ අසා මහාකාල උපාසක අළුයම පොකුණු තෙර මුණ සෝදමින් සිටිනැනට භාණ්ඩ විසිකර දමා පලා යන්නේය. සොරුන් ලුහුබැඳ ආ පුරුෂයෝ විසිකරණ ලද භාණ්ඩ දැක හා අපේ ගෙය බිඳ භාණ්ඩගෙන දැන් ධර්මය රකින්නෙක් ලෙසට ඉන්නේදැයි කියා හොඳට තලා පෙළා මරා විසිකර ගියහ.

අළුයම - පැන්කළ ගෙන ඒමට පොකුණට ගිය කුඩාසාමණේරවරු එය දැක විහාරයේ ධර්මය අසා නිදාගත් උපාසකට අයුතු මරණයක් ලැබුවේයි බුදුන්වෙත දන්වාසිටියහ. මහණෙනි එසේය මේ ආත්ම භාවයේදී නොසුදුසු මරණයක් ලබන ලදී පෙර කරණ ලද කර්මය අනුව යුතුවූ මරණයක් ලබන ලදී පවසා එම භික්ෂූන්ගේ ඉල්ලීම අනුව අතීත පුවත දේශනාකළහ.

පෙර බරණැස් නුවර අගනුවරින් බැහැර එක් ප්‍රත්‍යන්තවූ පිටසර ගමක වනයට පිවිසෙන තැන සොරු කොල්ලකනි මේ බව දත් රජතුමා වන මුව දොර මුරකාවල් යෙදීය. හේ මිලගෙන වන අඩවියෙන් එතරට මිනිසුන් ගෙනයයි. එතර සිට මෙතරටද ගෙනඑයි. මේ අතර එක්තරා පුරුෂයෙක් තමන්ගේ රූමත් බිරිඳ කුඩා යානයක නංවාගෙන මෙතැනට පැමිණියේය. රාජ පුරුෂයා එම රූමත් ස්ත්‍රිය දැක සිත් ඇලුනේ. එතර කරවන්නැයි ඉල්ලා සිටිවිට දැන් කාලය නොවේ අළුයම එතරට පමුණුවමියි පැවසුවේය. ස්වාමීනි දැන් කාලය සුදුසුයි දැන්මම අපව වනයෙන් එතර කරවන්නැයි ඉල්ලා සිටියේය. නවතින්න පින්වතුනි දැන් අපේ ගෙදරටම ඔබලා ගෙනයමි

ඉඳුම් හිටුම්ද ආහාරයද ඇතැයි පැවසුවේය. ඔහු නතරවීමට කැමති නොවීය. රාජ පුරුෂයා පුරුෂයන්ට සඤ්ඤා දී යානය නවතා අකමැතිව සිටියදීම දොරටු කොටුවේ නවාතැන් දී ආහාරද දෙවීය. ඔහුගේ ගෙදර මැණිකක් ඇත. එම මැණික කරත්තය අසල දමවා උදැසන සොරුන් පැමිණි ආකාරය දුක්ටීය. ඔහුගේ පුරුෂයෝ ස්වාමීනි සොරු ඔබේ මැණික සොරකම් කරගෙන ඇතැයි දැනුම් දුන්හ.

ඔහු ගම්දොර ආරක්ෂාව තබවා ඇතුළු ගම සොයන්නැයි විධාන කළේය. අනෙක් තැනැත්තාද උදේම රථය යොදවා යැවීය. අතර මගදී රථය පරීක්ෂා කරන්නේ තමන් තැබූ මැණික දක තර්ජනය කර තෝ මැණික ගෙන පලා යන්නේයයි තලා පෙලා දමා ස්වාමීනි සොරා අල්ලා ගත්තේයයි ගාමභෝජකට දක්වුහ. ඔහු මම නවාතැන් දී කැමදී උපකාර කළ තැනැත්තා පාපියා යයි තලා පෙළා මරා විසිකළේය. මේ ඔහුගේ පෙර කළ කර්මයයි ඔහු අවීචියේ බොහෝකලක් පැසිවිපාක කෙලවර ආත්ම භාව සියයක් එසේම පෙළීමෙන් මරණයට පත්විය. මෙසේ ශාස්තෘන් වහන්සේ මහාකාලගේ පුර්ව කර්මය වදාරා මේ සත්ත්වයෝ තමන් විසින් කරන ලද පාප කර්මයන් නිසා සතර අපායන්හි උත්පතීය ලබන්නේ යයි වදාරා මෙම ගාථාව වදාළහ.

තමන් කළ පාපය තමන් පසු පස ඒමය
බලවත් විදුරු මිණකින් - මැණිකක් නසන්නා සේ
මේ දෙක්හි නිජ්බිම - එකම මහ පොළවමැයි

අත්තනා කතං - තමන් විසින්ම උපදවන ලද **අත්ත සම්භවං පාපං දුම්මේධං** - අනුවණ පුද්ගලයා සතර අපායන්හි (වැටී) **අභිමත්ථති** දරුණු සේ වැඩේ. වැනසේ

දේශනාවසානයේ පැමිණ සිටි භික්ෂූහු සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියාහුය.

මහාකාල උපාසකගේ කථා පුවතයි.

12-6

" යස්ස අච්චන්ත දුස්සීල්‍යන්ති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩසිටියදී දෙව්දත් තෙරුන් නිමිති කරගෙන දේශනාකළහ.

එක් දිනක් භික්ෂූන් වහන්සේලා ධර්ම සභාවේදී දෙව්දත් තෙරුන් පිළිබඳව කථාවක් ඇතිකළහ. ඇවැත්නි දෙව්දත් තෙර පවුකරන්නෙකි දුසිල් කරණ වඩන ලද තන්හාවෙන් අජාසත් රජු සතුටු කරගෙන මහත් ලාභ සත්කාර උපදවාගෙන අජාසත්ගේ පියාට වධ පමුණුවා ඔහු සමග එකතු වී නොයෙක් ආකාරයෙන් තථාගතයන් වහන්සේට වධ කරයි. මෙසේ කථාකරමින් සිටින අතර තථාගතයන් වහන්සේ පැමිණ මහණෙනි. ඔබ කිනම් කථාවකින් යුතුව සිටියේදැයි විමසා දෙව්දත් තෙරුන් පිළිබඳව බව දැනගත්විට මෙසේ පැවසුහ.

මහණෙනි දෙව්දත් තෙර දැන් පමණක් නොව පෙරද නොයෙක් ආකාරයෙන් මට වධ පැමිණ වීයයි පවසා කුරුංග මිග ජාතක ආදිය දේශනාකර, අනන්ත දුසිල් පුද්ගලයා, දුසිල්වත් කම නිසා ඇතිවූ තන්හාව නිසා සල් රුකක් වැළඳ සිටි මාළුවාවැල සල් රුක නසන්නා සේ මරණින් මතු වැඩි බැදී නිරය ආදීන්හි වැඩෙයයි. පවසා මම ගාථාව දේශනා කළහ.

මාළුව වැළක් එතුනොත් සල් ගසක	බැඳී
සල් ගස මැරී යයි එහි අතු රිකිලි	සිදී
නො පුරා වත් සිරින්, අකුසල් වලම	යෙදී
නිවසන මහණ හට සිව් මහ නිරය	මදී

මෙහි **අච්චන්ත දුස්සීල්‍යං** - ඒකාන්ත දුස්සිල භාවය ගිහියෙක් හෝ පැවිද්දෙක් උපන්තැන සිට දශ අකුශල කර්මපථයන් සිදුකොට, උපසම්පද වූ දින සිට ගරුකාපත්ති ආදීන්ට පත්වීම අත්‍යන්ත දුස්සීල නම් වේ. මෙහිදී ඔහු ආත්මභාව දෙක තුනකදී ගතියෙන් පැමිණි දුසිල්බව අදහස් කෙරෙයි. දුස්සීලයාගේ දොරටු හයෙන් උපන් තෘෂ්ණාව දුසිල්බව ලෙස තේරුම් ගත

යුතුය. **මාළුවා සාලමිවොත්තං** - සල් ගසක් වැළඳ ගෙන සිටින මාළුවා වැළක් මෙන්, දුශ්ශීල භාවය ඔහු වැළඳ ගෙන සිටියේ සතුරෙක් සතුරාට අනර්ථ කරණු කැමති වේද, ඒ දුශ්ශීල **තෙමේ තථා අනතා නං කරොති** - තමන්ටම අනර්ථ කරගනී.

සල් රුකක මාලුවා වැලක් එතුන විට වැසි කාලයේදී, ගොටු සේ උඩ බලාගත් මාලුවා පත්වල වතුර පිරී ඒ දිය බරින් සල් රුක විනාශ වේ. පුද්ගලයා වැළඳ සිටින දුශ්ශීල භාවයද ඒ පුද්ගලයා විනාශ කරයි.

දේශනය අවසානයේ බොහෝ දෙන සොතා පත්හි ඵලා දියට පැමිණියහ.

දේවදත්ත කථා පුවතයි.

12-7

"සුකරානි" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ රජගහනුවර වේළුවනා රාමයේ වැඩසිටියදී සංඝභේද කිරීම අරභයා දේශනාකළහ.

එක් දිනක් දෙවිදත්තෙර සංඝභේදයට උත්සහ කරමින් පිඬු සිඟා වඩින ආනන්ද තෙරුන් වහන්සේ දැක තම අදහස දන්වා සිටියේය. මෙය අසා දැනගත් ආනන්ද තෙරුන් බුදුන් වෙත ගොස් මෙසේ පැවසුහ. ස්වාමීනි මම හවස් වේලාවේදී සිවුරු හැඳ පෙරගෙන පාත්‍රය ගෙන රජගහ නුවර පිඬු සිඟා වැඩියෙමි. ස්වාමීනි එහිදී රජගහනුවර පිඬුසිඟායන දෙවිදත්තෙරුන් දැක දෙවිදත් තෙරුන් මා වෙත එළඹියේය. එළඹ මට මෙසේ කිවේය. ඇවැත්නි අද පටන් මම භාග්‍යවතුන් ගෙන් බැහැරව භික්ෂුසංඝයා සමග උපෝසථය කරමි. සංඝ කර්මද කරන්නෙමි.

ස්වාමීනි අද දෙවිදත් තෙර සංඝයා බිඳවන්නේ ය උපෝසථය කරයි සංඝ කර්මයද කරන්නේය. මෙසේ දන්වා සිටිවිට තථාගතයන් වහන්සේ යහපත්ය.

සත්පුරුසයන්හට - හොඳ දේ කරනු	පහසුයි
ඔහුට නපුරක් කරනට කිසිදා සිත්	නොදේමැයි
පව්කාරයා නිති - කරනුයෙ පව්	පිරිමයි
අරිය මහා සඟනට - පව්කම් නො කළ	හැකිමැයි

මෙම උදානය ප්‍රකාශකොට ආනන්දය තමාට අහිතවූ ක්‍රියාවන් කිරීම පහසුය. හිත පිණිස පවතිනදේ කිරීම දුෂ්කරයයි පවසා මෙම ගාථාව පැවසුහ.

රටටම අහිත දේ - කරනට බොහොම	පහසුයි
අමාරුම දේ නම් යහපත් දේ	කිරීමයි
අයහපත පහසුය හිත දෙනුයේද	එයටය
යහපත අපහසුමය හිත නොයෙදෙන්නේ	එහිමය

එහි අරුත යම් කර්මයක් **අසාධුනි** - අයහපත්ද ඒ වැරදිදෙය අපායේ වැටීමට හේතුවේ. **අත්තනො අහිතානිච** - තමන්ට අහිතදේ කිරීම පහසුය. යම් දෙයක් සුගතිය සඳහා හේතුවේද තමන්ට හිතකරවේද - නිවන් සුව සඳහා හේතුවේද එම කර්මය බටහිරට ගලායන ගංගාවක පසුපසට පටිසෝතයට පිහිනා යාමක් සේ ඉතා දුෂ්කරය දේශනය අවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පත්වූහ.

සංඝභේදය ඇතිකරලීමේ කතා පුවතයි.

12-8

"යො සාසනංනි" යනමේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී කාලතෙරුන් අරමුණු කරගෙන දේශනා කළහ.

සැවැත්නුවර එක් ස්ත්‍රියක් මවක්ලෙසට එම තෙරුන්ට උවටැන් කරන්නීය. ඇගේ අසල් වැසි ගෙයක මිනිස්සු බුදුන් වෙනින් ධර්මය අසා අවුත් අහෝ බුදුවරුන්නම් ආශ්චර්ය වේ. ධර්ම දේශනා ඉතා මිහිරිවේ. යනුවෙන් ප්‍රශංසා කරති. එම ස්ත්‍රිය මේ බුදුගුණ අසා ස්වාමීනි මමත් බුදුන්ගේ බණ ඇසීමට කැමැත්තෙමියි උන්වහන්සේට දැනුම් දුන්නාය. එම තෙරුන් එහි නොයන්නැයි ඇය වලක්වාලීය. එහෙත් ඇය නැවත නැවත තුන්වරක් කියා වලකාලුවිට බුදුන්ගෙන් ධර්මය අසන්නට කැමති වූවාය. මේ භික්ෂුව විසින් මෙලෙස ඇය වලක්වා ලීමට කුමක් හේතුවීද? බුදුන් වෙනින් ධර්මය අසා මා කෙරේ භක්තිය බිඳෙනු ඇත. යන සිතුවිල්ල ය එහෙත් මේ උපාසිකාව එක් දිනක් අළුයම උදේ ආහාරය ගෙන පෙහෙවස් සමාදන්වී දරුව ආර්යන් වහන්සේට හොඳින් දානය දෙන්නැයි දුවණියන්ට නියමකර විහාරයට ගියාය. දුවණියද තෙරුන් පැමිණිවිට දන්දී වළඳවා සිටිවිට මහ උවැසිය කොහි දැයි විමසීය. ඇය ධර්මශ්‍රවණය සඳහා විහාරයට ගියබව පැවසූවිට කුසට ඩහදිය දමමින් බෙහෙවින් තැවෙමින් දැන් ඇය මාකෙරෙහි බිඳුනේයයි වේගයෙන් ගොස් - ඇය බුදුන්වෙත ධර්මය අසමින් සිටිනුදක බුදුන්ට මෙසේ පැවසුවේය. ස්වාමීනි මැය මෝඩයි සියුම් ධර්මකථා නොදන්නීය මැයට ස්බන්ධ ආයතන පිළිබඳ සියුම්කතා නොකියා දානය පිළිබඳව හෝ සීලය පිළිබඳව හෝ කියා දීම සුදුසුය. බුදුරජාණන් වහන්සේ ඔහුගේ අදහස තේරුම්ගෙන මහණ නුඹ අඥානය පව්කාර දෘෂ්ටි නිසා බුද්ධශාසනය අවඥාවට ලක්කරයි. තමාම නසාගැනීමට උත්සාහ කරන්නේ යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

සිව්පසය ලොබි නේ - අර්හත් දහම නස නේ
අනුවණ කමින් තම - බුදුන් ඔවදන හරනේ
පල හැඳුනු උණගස - එයින් නැසෙනා සේ
අනුවණ පැවිදිදද - අනුවණ කමින් වැනසේ.

"ආර්යවූ ධර්ම ජීවීවූ අර්හත් ශාසනය යමෙක් අඥාන පාපී වූ දෘෂ්ටි නිසා අවඥාවට භාජනකෙරේද ඇතැම් වෘක්ෂයන්හි ඵල හට ගැනීම එහි විනාශයට හේතුවන්නා සේම තමාද වැනසී යාමට හේතුවේ.

එහි අර්ථය - **සො දුම්මේධො** - යම් අණුවනයෙක් තමන්ට ලැබෙන සත්කාර නැතිවේය යන බියෙන් **පාපිකං දිට්ඨිං නිස්සාය** - පාපී දෘෂ්ටින් නිසා ධර්මය හෝ අසමු - දානය හෝ දෙමුයි පවසන විට දොස්නගා ධර්මජීවී අර්හත් ආර්යයන්ගේ බුදුසසුන නින්දාවට ලක්කෙරේද? **කට්ඨසසඵලානි** ඔහුගේ ඒ නින්දාබස් උණ ගස් ආදියේ ඵල හටගැනීම ගසේ විනාශයට හේතුවන්නාසේම **අත්ත සඤ්ඤාය ඵලානි** තම විනාශය සඳහාම හේතුවේ මේ ලෙසට එම්හික්ෂුවද තම විනාශයට එබඳු අදහස් ඇතිකරගනී. මෙසේ කියන ලද්දේ. කෙසෙල් ගස ඵලහටගැනීම විනාශයට හේතුවේ. උණගස් බට ගස් ඵල හටගැනීම විනාශයට හේතුවේ. නින්දිත පුරුෂයාට කරණ සත්කාරය ඔහුගේ විනාශයට හේතුවේ.

උණ බට කෙසෙල් පුදින්නේ විනාසෙටයි.
සැප සත්කාර අනුවණයගෙ අබාවෙටයි

මෙම දේශනය අවසානයේදී උපාසිකාව සෝවාන් ඵලයට පත්වූවාය. පැමිණි පිරිසටද සාර්ථක ප්‍රයෝජනවත් දේශනයක් විය.

කාල තෙරුන් පිළිබඳ කථා පුවතයි.

12-9

"**අත්තනාව කතන්නි**" යන ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ සැවැත්නුවර ජේතවන විහාරයේ වැඩසිටියදී චුලකාල උපාසක නිමිති කරගෙන දේශනා කරණ ලද්දකි.

එක් දිනක් මහාකාල කථාවේ කියන ලද පරිදි උමං සොරු ධන හිමියන් විසින් ලුහුබඳින ලද්දේ රාත්‍රියෙහි ධර්මකථා අසා අළුයම නික්මී සැවතට යන්නාවූ උපාසක තුමා ඉදිරියේ භාණ්ඩ විසිකර පලාගියහ. මිනිස්සු එය දැක මේ තැනැත්තේ රාත්‍රි කාලයේ සොරකම් කර ධර්මයේ හැසිරෙන ලෙසට අඟවයි. මොහු ගත්තැයි කියා තලා දැමුහ. දියගෙන යන දාසීන් මේ දැක ඔහුගේ ජීවිතය බේරා ගත්හ. බුදුන්ට මේ කරුණ දන්වුවිට ඔවුන්ගේ මේ කථා පුවත අසා මහණෙනි චුලකාල උපාසක කළගෙන යන දාසියන් නිසාත් - තමන් නොකළ අකුශලය නිසාත් ජීවිතය ලබන ලදී. මේ අයුරින් සත්ත්වයෝ තමන්විසින් අකුශලකම් කොට නිරය ආදීන්හි තමන්ම කිලුටට පත්වෙත් කුසල් කොට සුගතීන්හි ඉපිද නිවන් ලැබීමද වදාරා මේ ගාථාව වදාළහ.

පවිකම් නිසා ඉඳහිටවත් තමන් කළ
අවසානයට පත්වේමැයි කලින් කළ
සිල්වත් දනා දස අකුසල් සිතින් හළ
සම්මානයට පත්වේ උපනුපන් කල

මේ ලෙස වැඩ අවැඩ
දෙකරුණු තමන් සතුමය
කෙනෙකු හට නවෙකෙක්
පිරිසිදු කරනු බැරිවෙයි.

එහි අර්ථය **අත්තනා** - යම් කිසිවෙකු විසින් අකුසල කර්මය කරන්නේ වේද? හෙතෙම සතර අපායන්හි දුක් අනුභව කරන්නේ වේ. **අත්තභාව**

සඞ්කිලිසසති. - යම් කෙනෙකු වනාහි **අත්තනා අකතං පාපං** - තමන් විසින් අකුසල ධර්මයන් නො කරන්නේ වේද? හෙතෙමේ සුගතියට මෙන්ම නිවණටද පැමිනෙන්නේ **අත්තනාව විසුජ්ඣති**, කුසලධර්ම සංඛ්‍යාත පිරිසිදු බව, ද අකුසල කර්ම සංඛ්‍යාත අපිරිසිදු බව ද තමන් පිළිබඳවම පවති. අනෙක් පුද්ගලයෙක් සතු නොවේ. **න විසොධයෙ** - පිරිසිදු නොකිරීමය. අනිකෙකු විසින් පිරිසිදු බවට නොපැමිණ වීමයි. නො කෙලෙසීමය යයි කියන ලදී.

දේශනාවසානයෙහි චුලකාල තෙමේ සෝවාන් ඵලයෙහි පිහිටියේය. සහභාගී වූ පිරිසට ධර්ම දේශනාව සාර්ථක විය.

චුලකාල උපාසක පුවතයි

12-10

"අසථ දසථංනි " මෙම ධර්මදේශනය **ශාස්තෘන් වහන්සේ** සැවත් නුවර දෙව්රම් වෙහෙර වැඩ සිටියදී **අත්තදත්ථ** තෙරුන් **නිමිත්තිකරගෙන** දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේ විසින් පිරිනිවන් පෑමට සමීප කාලයේදී මහණෙනි මම මෙයින් මාස හතරකින් පිරිනිවන්පාන්නෙමියි පැවසූවිට උපන් සංවේග ඇතිව භික්ෂූන් හත් සියයක් බුදුන් සමීපයේ විසිම අත්හැර ඇවැත්නි අපි කුමක් කරන්නමෝදැයි කතිකා කරමින් හැසිරෙති. අත්තදත්ථ තෙරුන් වනාහි මෙසේ සිතූහ. බුදුන් වහන්සේ මාස හතරකට පසුව පිරිනිවන් පාන්නාහ. මමද විරාගී වූ බුදුන්වහන්සේ ජීවත්ව සිටියදීම අර්හත්වය සඳහා උත්සාහ කරන්නෙමි. උන්වහන්සේ භික්ෂූන් වහන්සේවෙත නොයයි. එහිදී භික්ෂූන් වහන්සේලා ඇවැත්නි ඇයි ඔබවහන්සේ අපවෙත නොඒමටත් කිසිවක් කථා නොකිරීමටත් හේතුව කුමක්ද? මෙසේ කියා බුදුන්වෙත ගෙන ගොස් මෙසේ පැවසූහ ස්වාමීනි මේ අත්තදත්ථ තෙරුන් මේලෙස හැසිරෙයි. යනුවෙන් පැවසුවිට උන්වහන්සේ - බුදුන්ට කරුණු දක්වමින් ස්වාමීනි ඔබ වහන්සේ සිව්මසකින් පිරිනිවන් පානහෙයින් මම ඔබවහන්සේ සිටියදීම අර්හත් වීමට උත්සාහ කරන්නෙමි. බුදුහු උන්වහන්සේට සාධුකාරදී මහණෙනි මට ස්නෙහ ඇත්තෝ අත්තදත්ථ තෙරුන්මෙන් වීමමවටියි. සුවඳ දුම් මල් ආදියෙන් මා සිදිම මට පුජා කිරීමක් නොවේ. ධර්මානු ධර්ම ප්‍රතිපත්තියේ යෙදීම මටපුජා කිරීමක් වන්නේ ය. එනිසා අනෙක් භික්ෂූන් විසින්ද අත්තදත්ථ තෙරුන්ලෙසට වියයුතුයයි පවසා මෙම ගාථාව දේශනා කළහ.

තමනට බොහො ඇතත් - කටයුතු අනුන් සඳහා
අනපසු කෙරුම තම වැඩ - නොකළ යුතුමය උතුමෝ
අත්වැඩ ද පර වැඩ - වෙසෙසින් හැඳින ගතයුතු

එහි අර්ථය - ගිහියෙක් වසයෙන් අනුන්ට දහසක් වටිනා ප්‍රයෝජනනිසා

තමන්ට වන්නාවූ දෙවියට හමාරක් පමණ වූ ප්‍රයෝජනයද අත් නො හළ යුතුය. තමන්ට වැඩදායක දේ අත් නො හැරීමය. කෑ යුතු පිය යුතු දේ නිපදවීම පරාර්ථය නො වන්නේය. එවැනි දේ වශයෙන් නොව මෙය වදාරා ඇත්තේ කර්මාස්ථාන වශයෙනි. එබැවින් භික්ෂුවක් විසින් චෛත්‍ය ප්‍රතිසංස්කරණාදිය උපාධ්‍යාය වත් ආදිය නො පිරිහෙළා, ආභිසමාචාරික වත් ආදිය පුරමින් සතර ආර්ය ඵලයන් ලබා ගැනීම සඳහා අද අදම ප්‍රතිවේධ ධර්ම පිරියයුතුය. සතර ආර්ය ඵලයන් ලබා ගැනීම සඳහා අද අදම ප්‍රතිවේධ ධර්ම පුරමින් හැසිරෙන්නා විසින් උපාධ්‍යාය වත් ආදිය බැහැර කොට හෝ තම කෘත්‍යයම කළ යුතුයි. **අත්තදත්ථ මභිඤ්ඤාය** තමන්ගේම ශුභ සිද්ධියම සලකමින්, "**සදත්ථපසුතො සියා**" ස්වකීය අර්ථය සඳහා කය සිත දෙකින්ම වෙර වැයම් දරිය යුතු වන්නේය.

දේශනාව අවසානයේ එම තෙරුන් අර්හත් ඵලයෙහි පිහිටියේය. සහභාගී වූ භික්ෂූන්ටද ධර්ම දේශනාව සාර්ථක වූයේය.

අත්තදත්ථ තෙරුන්ගේ කථා පුවතයි

දොළොස්වැනි අත්තවර්ගය නිමියේය.

13-1

"හීනං ධම්මං නති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී එක්තරා තරුණ භික්ෂූන් වහන්සේ නමක් නිමිත්තකරගෙන දේශනා කළහ.

එක්තරා භික්ෂූන් වහන්සේ නමක් ළාබාල භික්ෂුවක් සමග අළුයම විසාඛාවගේ ගෙට වැඩමකළේය. විශාඛාවගේ නිවසේ පන්සියයක් භික්ෂූන් වහන්සේලාට කැඳ නිතර සකස් කර තිබේ. තෙරුන් වහන්සේ කැඳ පානය කර ළාබාල භික්ෂුව එහි වාඩිකරවා වෙනත් නිවසකට වැඩමකළේය. මේ කාලයේදී විශාඛාවගේ පුතෙකුගේ දුවණියක් ආර්යාවගේ තනතුරේ සිටිමින් භික්ෂූන් වහන්සේලාට වතාවත් කරයි. ඇය ඒ කුඩා භික්ෂුවට ජල භාජනයක් පිරිනමන්නට සුදානම් වෙද්දී දිය සැළියේ තම මුහුණ පිළිඹිබුව දැක සිනාසුනාය.

දහර භික්ෂුවද එය දැක සිනාසුනේය. ඇය එම කුඩා භික්ෂුව සිනාසෙනු දැක මේ හිස මුඩු කළ තැනැත්තා මට සිනාසෙන්නේ යයි කීවාය. මෙහිදී සාමණේර භික්ෂුව ඔබත් ඔබගේ දෙමාපියන්ද හිස මුඩුකළ තට්ටයෝයයි අපහාසලෙස කීවේය. එවිට ඇය හඬද්දී මිත්තනිය වෙත ගොස් ඇය කරුණු විමසන විට සිදුවුදේ දැනුම් දුන්නාය. විශාඛාව ඒ සාමණේරයන් වෙත ගොස් ස්වාමීනි නොකිපෙන්න. කෙස් - රවුල් - නිය සිඳ කපන ලද සිවුරු පෙරවන තෙරවරුන් මැද සිඳින ලද පාත්‍රයක් ගෙන පිඬුසිඟා යන ආර්යන් වහන්සේලාට අගෞරව කළා නොවේ. යයි පැවසුවාය. එසේය මහා උපාසිකාව ඔබ - මගේ කෙස් - රවුල් - නිය කපා ඇතිබව දනී නමුත් මැයවිසින් මගේ මුඩුහිස ගැන කියා මට අපහාස කිරීමට වටින්නේද? විශාඛාවන්ට සාමණේරයන්ද - දූරියද දැනුවත් කිරීමට නොහැකි විය.

මෙම මෙහොතේ ගුරුහිමියන් පැමිණ ඇයි උපාසිකාවනිය විමසා සිදුවුදෙය දැනගෙන සාමණේරයන්ට අවවාද කරමින් මෙසේ පැවසුහ. ඇවැත්නි

පිටවීයන්න. හිස මුඩුකර පාත්‍රයක්ගෙන කඩකළ රෙදිවලින් මැසූ සිවුරක් ඇඳ පිඬු සිඟා යන්නාට ආක්‍රොශයක් නොවේ. නිහඬවන්න ස්වාමීනි - ඔබවහන්සේ ඇයි ඔබ ගේ උපස්ථායිකාවට තර්ජනය නොකර මට තර්ජනය කරන්නෙ, මට මේ ලෙසින් හිස මුඩුකළ නැනැත්තායයි අපහාස කිරීම වටින්නේද? මේ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ පැමිණ විසාඛාවගෙන් විමසා සියල්ල මුළපටන් දැනගෙන සාමණේරයන්ගේ සෝවාන් ඵලයට හේතු සම්පත් ඇතිබව දැන සාමනේර භික්ෂුවගේ පැත්තගෙන විසාඛාවට මෙලෙස පැවසුහ. ඇයි විසාඛාවනි ! ඔබේ දැරියට හිසමුඩුකළ මගේ ශ්‍රාවකයින්ට අපහාස කිරීම වටින්නේද? දහර වූ සාමණේර භික්ෂුව නැගිට ඇදිලිබැඳ ස්වාමීනි මේ ගැටලුව ඔබවහන්සේම හොඳින් දන්නේ ය. මගේ උපාධ්‍යායන් වහන්සේද මහා උපාසිකාවද හොඳින් නො දන්නාහයි. පැවසීය බුදුරජාණන් වහන්සේ දහර සාමණේරයන් තමන්ට අනුකූලබව දැන කාමගුණයන් පිළිබඳ සිනාසීමනම් පහත්ය මේ සිනාසීම් ආදී පහත් ක්‍රියා ඇසුරු කළ යුතු නොවේ. ප්‍රමාදයෙන් කල් ගත කිරීමද සුදුසු නොවේයයි පවසමින් මේ ගාථාව දේශනාකළහ.

නො සෙවියුතුමය සුවය පස්කම්
නොපැවතිය යුතුමය පමාවෙන්
ඉවත හළ යුතු වැරදි දුක්මන්
නොදික් කළයුතු සසර පැවතුම්

එහි හීනං ධම්මනති - යන පඤ්චකාම ගුණ ධර්මයි මේ පහත් ධර්මනම් යටත් පිරිසයෙන් ඔටුවන් ගොනුන් ආදීන් විසින්ද සේවනය නොකළයුතුය හීන ධර්ම නම් නිරය ආදී ස්ථානයන්හි උපදවන නිසා හීන නම්වේ. **නසෙවෙය්‍ය** නොසෙවිය යුතුය. **පමාදෙන** සිහියෙන් නොසිටීම ප්‍රමාදයයි **නසංවසෙ** එය සේවනය නොකළ යුතුය. **මිච්ඡාදිට්ඨි** ඒ මිථ්‍යා දෘෂ්ටියත් නොගත යුතුය. **ලොකවද්ධනො** යමෙක් වනාහි එසේ කරන්නේ නම් හෙතෙමේ ලෝකවර්ධන නම් වේ. සසර දික් කරන්නෙක් වේ. **නසා එවං අකරණෙන** නසියා ලොකවඩ්ඪනොති එහෙයින් ලෞකික ලෝකය වැඩන දෙයින් බැහැර වී ලෝකෝත්තර දේ සෙවිය යුතුය.

98

මේ දෙසුම අවසානයේ ඒ ළාබාල සාමණේරයන් සෝවාන් ඵලයෙහි පිහිටියේය. එතැනට පැමිණි අයටද ධර්ම දේශනය සාර්ථක විය.

නමින් ප්‍රසිද්ධ නැති ළාබාල භික්ෂුවගේ කථාපුවතයි

13-2

"ඤාතියෙ" යනමේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ නිග්‍රෝධා -රාමයේ වැඩ සිටියදී තමන් වහන්සේගේ පියාණන්ට දේශනා කළහ.

එක් සමයක තථාගතයන් වහන්සේ කපිලවත්තු පුරයට වැඩමකළ පළමු ගමනේදී ඤාතීන් විසින් පිළිගැණීම් කරණ ලද්දේ නිග්‍රොධාරාමයට පැමිණ ඤාතීන්ගේ මානය බිඳීම සඳහා අහසේ රුවන් සක්මන් මවා එහි සක්මනේ යෙදෙමින්ම ධර්මය දේශනා කළහ. පැහැදුන සිත් ඇති සුද්ධෝදන මහරජු ඇතුළු ඤාතීහු වැන්දාහුය. එම ඤාති සමාගමයේදී පොකුරු වැස්සක් වැස්සේය. මෙහිදී වෙස්සන්තර ජාතකය දේශනාකළහ.

ධර්මදේශනය අසා පිටත්වූ ඤාතීන් කිසිවෙක් පසුදින දානයට ආරාධනා නොකළහ. මහරජුද මගේ පුතු මගේ ගෙට නොපැමිණ කොහියන්න දැයි සිතා ආරාධනා නොකරම ගියේය.

එසේ ගොස් භික්ෂූන් විසි දහසකට කැඳබත් ආදිය පිළියෙළකර අසුන්ද පැනවීය. දෙවන දිනයේ බුදුන් පිඬු සිඟා වඩින්නේ - පෙර බුදුවරු තම නගරයට වැඩමවා ඤාතීන්ගේ නිවෙස්වලට වැඩියේද නැතහොත් පිණ්ඩපාතයේ වැඩම කළේදැයි විමසාබලා ගෙපිළිවෙලින් ඒ බුදුවරු පිඬුසිඟා වැඩිය බව දිවැසින් බලා පළමු ගෙයි සිට පිඬුපිණිස වඩින්නේ රාහුලමව (යසෝදරාදේවිය) මතුමහලේ සිටීමින් මෙය දැක එම පුවත රජුට දන්වා සිටියාය. රජතුමා සළුව සඳමින්ම වේගයෙන් පිටත්වී බුදුන් වැඳ දරුව! "කිම මා විනාශ කරන්නේ ඔබ පිඬු සිඟා යනවිට මට අතිශයින් ලජ්ජාඇතිවිය. ඔබ පෙර මේ නගරයේ රන් සිවිකා වලින් ගමන්කර දැන් මේලෙස පිඬුසිඟා යාම යුතුවේදැයි ද මට ලජ්ජා ඇතිකරන්නේ ඇයි දැයි" විමසීය.

නැත, මහරජ, මම ඔබට ලජ්ජා ඇති නොකරමි. මගේම කුලවංශය අනුව මම පවතිමි. ඇයි දරුව මගේ වංශය පිඬු සිඟායයිද? නැත මහරජ ඔබේ වංශය මගේ වංශය නොවේ. මගේ වංශයේ දහස් ගණන් බුදුවරු පිඬුපිණිස හැසිරී පිණ්ඩපාතයෙන්ම යැපුනාහුයයි පවසා ධර්මය දේශනා කරමින් මේ ගාථාව පැවසුහ.

නැගිටිනු මැනැවි කය සිත දෙක වැර ඇතිව
හැසිරෙනු කුසලයෙහි නොපමාවම බැතිව
සුචරිත දහම් සළකා එයටම ගැතිව
සුවසේ වෙසෙනු මිනිසත් බවෙ පල සතුව

දහමෙහිම හැසිරෙනු
දුසිරිත තුරන් කර ලොවැ
දහම්හිම හැසිරෙන්නා
දෙලොවම වෙසේ සුවසේ.

නැගි සිටින්න. ප්‍රමාදනොවන්න සුචරිත ධර්මයේ හැසිරෙන්න. ධර්ම චාරී පුද්ගලයා මෙලොවද පරලොවද සුවසේ පසුවනු ඇත.

සුචරිත ධර්මයේ යෙදෙන්න. දුශ්චරිතයෙන් වලකින්න. දැහැමියා මෙලොවද පරලොවද සුවසේ පසුවේ.

තත්‍ථ **උත්තිට්ඨෙනි** - එහි උත්තිටය යනු අන්අයගේ ගෙදොර සිට ගෙපිළිවෙළින් යනුවෙන් ගත යුතුය. **නප්පමජ්ජෙය්‍ය** යනු පිඬුසිඟා යාම අත්හැර ප්‍රනීත ආහාර සොයායාමයි. ඒ සඳහා ප්‍රමාදයේ යෙදීමයි. ගෙපිළිවෙලින් පිඬුසිඟා යාම ප්‍රමාදනොවීමකි. ධම්මං යනු ගෙපිළිවෙලින් ගොස් එම භික්ෂු චරියා ධර්මය සුචරිතයේ යෙදීමකි. මෙහිලා භික්ෂා චරිය ධර්මය කරන්නේ එම ධර්ම චාරී තැනැත්තා සිව් ඉරියාපථයන් සැපසේ විහරණය කරයි යන අර්ථයි **න නං දුච්චරිතං චරෙ** - යනු වෙසඟනන් වෙසෙන ගෙවල අගෝචර ස්ථානයන්හි හැසිර භික්ෂා චරිය ධර්මය නරකලෙස හැසිරීමයි එලෙස නොහැසිරී ධර්මයේ හැසිරෙන අයුරු පවසන ලද්දේය.

රජතුමාට පවසන්නේ අධර්මයෙන් නොව ධාර්මිකව රජකිරීම සැපගෙන දීමට හේතුවන බවය. මේ දෙසුම අවසානයේදී රජු සෝවාන් ඵලයේ පිහිටි අතර පැමිණි පිරිසට සාර්ථක දෙසුමක් වූ බවයි.

සුද්ධෝදන රජුගේ කථා පුවතයි.

13-3

"යථා බුබ්බුලකංනි" - යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙවරම සිටියදී පන්සියයක්වූ විපස්සනා ධුරී භික්ෂූන් නිමිති කරගෙන දේශනා කළහ.

එම භික්ෂූන් වහන්සේලා බුදුන්ගෙන් කර්මස්ථාන ලබාගෙන අරණ්‍යයට පිවිස වෙහෙසමින් උත්සාහ දරමින් විශේෂතාවයකට නොපැමිණ විශේෂ කමටහන් ගන්නෙමුයි බුදුන් වෙත එළඹෙන අතරමග මිරිඟුව පිළිබඳව කමටහන් වඩමින්ම පැමිණියහ. උන්වහන්සේලා විහාරයට පිවිසි කෙනෙහිම මහවැස්සක් වැටුනි. එම භික්ෂූන් ඒ ඒ තැන ඉදිරිපස සිට වැසිධාරා වේගයෙන් හටගත් දිය බුබුළු දැක මේ අපේ සිරුරද ඇති වී නැති වන්නේ යයි ද එනිසාම දියබුබුළු වලට සමාන යයිද අරමුණු කරගත්හ. බුදුරජාණන් වහන්සේ ගඳ කිළියේ සිටියදීම එම භික්ෂූන් බලා ඔවුන් හා කථාකරන්නේ ආලෝකයක් විහිදුවා මේ ගාථාව දේශනා කළහ.

ඇතිව නැති වී යන - දිය බුබුළක්ය අත්බැව්
මිරිඟුවක් ලෙස දිස්වේ - නොතිරයෑ දකින නුවණින්
යුතුවූ අය පසුපස - මාරයා නැත එන්නේ.

එහි **මරීචිකං** යනු මායාවකි - මුලාවකි. දියබුබුලක් ලෙසට සිරුරගැන සිතා - මිරිඟුවක් ලෙසට සිතා මේ ආත්මභාව සංඛ්‍යාත ලොවගැන බලන්නේ මාරයා නොබලන තත්ත්වයට පත්වේ. **තසෝ මරීචිකනති** එහි මිරිඟුවයි. එය දුරසිට බලනවිට පෙනේ. ලඟට යන විට හිස් බවද නොමැනිබවද මායාවක් බවද පැහැදිලි වේ. එලෙසම ඇති වී නැතිවී යන ස්වභාවය **බුබ්බුලකං** බුබුලක - දියබුබුල වැන්න. හිස්බව තුච්ඡ බව බලන්න. මේ ලෙසට පඤ්චස්කන්ධා දී ලෝකයද විමසා සසඳාබලනවිට **අවෙක්ඛතං මච්චුරාජස්ස න පස්සති** මාරයාට නොපෙනෙන තත්වයට පත්විය හැකිය. මෙම දෙසුම අවසානයේදී එම භික්ෂූහු සිටිස්ථානයේම අර්හත්වයට පත්වූහ.

**විදර්ගනා ධුරී පන්සියයක් භික්ෂූන් වහන්සේලා
පිළිබඳ කථා පුවතයි.**

13-4

"එථ පස්සථීමං ලොකංනි" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩ සිටියදී අභය රාජ කුමරු නිමිති කරගෙන දේශනා කළහ.

අභයරාජකුමාරයා පසල් දනව්වක ඇතිවූ අරගලයක් සංසිඳවා පැමිණිවිට බිම්බිසාර පියරජු සතුටුවී නැටීම ගීගැයීම ආදියෙහි දක්ෂ නිලියක් දී දිනහතක් රාජ්‍ය ශ්‍රීය විඳීමට අවස්ථාව සලසාදුනි. මේ කුමරු දින හතක් ගෙයින් බැහැර නොවී රාජශ්‍රී අනුභව කරමින් සිට අටවැනි දින ගංතෙරට ගොස් ස්නානය කර උයනට පිවිසී සන්තති මහ ඇමති සේ එම ස්ත්‍රියගේ නෘත්‍ය ගීත ආශ්වාද ලබමින් සිටියේය.

ඇයද එකෙණෙහි සන්තති මහා ඇමතිගේ නිළිය ලෙසටම බලවත් වාතරෝගයක් ඇති වී කළුරිය කළාය. කුමරු ඇය මියයාමේ ශෝකයෙන් පෙළීමේ ශෝකය බුදුන් හැර වෙනත් කෙනෙකුන්ට නිවාලිය නොහැකියයි. සිතා බුදුන් වෙත පැමිණියේය. පැමිණ ස්වාමීනි මගේ ශෝකය නිවා දෙන්නැයි ඉල්ලාසිටියේය. බුදුහු ඔහු සිත සනසා කුමාරය ඔබ මේ ස්ත්‍රිය නිසා මෙබඳුම මරණවලින් ඇඩුකඳුලු ප්‍රමාණයක් නැතැයි පවසා කුමාරය නොතැවෙන්න. බාල අඥාන ජනයන්ගේ හැඩීම ශෝක කිරීම් ප්‍රයෝජනයක් නැතැයි පවසා මෙම ගාථාව දෙසුහ.

මේ අත්බව සිරුර - විසිතුරු දෙයින් සැරසූ
මහරජුගෙ රියමෙන් - දිලිසෙමින් බබළන්නේ
එය මමය මාගෙයි - ඇලුම් කරනා පුහුලා
සසර සැරි සරමින් - විපතටම පත්වන්නේ

යම් ආත්ම භාවයක අණුවනයෝ තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ගැලේද නුවණැත්තවුන්ට රාගාදී සංගයක් නැත. විසිතුරුවූ රාජ රථයක් බඳු මේ ආත්මභාවය බලන්න.

එහි **එථපස්සථ** - යනු රාජකුමාරයාටම පැවසීමයි **ඉමංලොකං** මේ ස්කන්ධ ධාතු ආදී ලෝකය සංඛ්‍යාත ආත්මය **චිත්තං** යනු සප්ත රත්නවලින් විසිතුරු කරණ ලද රජුගේ වාහනයක්සේ වස්ත්‍ර ආභරණවලින් විසිතුරු වීමයි. **යත්‍රබාලා** යම් ආත්ම භාවයක අනුවණයෝම ඇලි සිටිති. **විජාන තන්ති** - නුවණ ඇති පඬිවරු එහි රාගාදි වශයෙන් ඇල්මක් නැත. යන අර්ථයි මේ දෙසුම කෙළවර අභයරාජකුමරු සෝවාන් ඵලයේ පිහිටියේය. පැමිණි අයටද සාර්ථක දෙසුමක් විය.

අභය රාජ කුමරුගේ කථාපුවතයි.

13-5

"**යොච පුඛෙනි**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී සම්මුඤ්ජනී තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

උන්වහන්සේ උදේ හෝ හවස හෝ වෙලාවක් නොමැතිව නිතර නිතර අතුගාමින් හැසිරෙයි උන්වහන්සේ එක් දිනක් ඉදලගෙන දවල්කළ සිටි රේවත තෙරුන්වෙත ගොස් මේ මහා කුසීත කෙනෙකි. මහජනයා ශ්‍රද්ධාවෙන් දෙන දෙය වළඳා අවුත් වාඩිවී සිටියි. ඇයි මොහුට ඉදලගෙන එක් තැනක් අතුගෑම නොවටීදැයි පැවසීය. තෙරුන් වහන්සේ මොහුට අවවාදයක් දෙන්නෙමියි සිතා ඇවැත්නි මෙහි එන්නැයි පැවසුහ. ඇයි ස්වාමීනි, යන්න ස්නානය කර එන්න. එම තෙරුන් දිය නා පැමිණියේය. අනතුරුව තෙරුන් එක තැනක වාඩිකරවා අවවාද දෙන්නේ මෙසේ කීවේය. ඇවැත්නි භික්ෂුවක් විසින් හැමවිටම අතුග ගා සිටීම නො වටී අළුයම අවදි වී අතුගා පිඬුසිඟා ගොස් වළඳා අවසානයේ අවුත් රාත්‍රි ස්ථාන හෝ දිවාස්ථානයක හෝ වාඩි වී දෙතිස් කුණප ගැන කියවා තම ආත්ම භාවයේ හටගැනීම් හැකිලීම් සිහිකර සවස භාවනාවෙන් නැගිට අතුගෑම සුදුසුය. නිතර නිතර අතුනොගා තමන්ටද අවකාශයක් තබාගත යුතුය. උන්වහන්සේ මේ අවවාදයේ පිහිටා නොබෝ දිනකින් අර්හත්වයට පත්වුහ. අනතුරුව තැන් තැන් වල කොලරොඩු එකතුවුනි. මේ නිසා භික්ෂූන් වහන්සේලා ඇවැත්නි දැන් තැනින් තැන කොළ රොඩු එකතුවී ඇත සම්මුඤ්ජනී තෙරුන් පෙරමෙන් අතුනොගාන්නේ කුමක් හෙයින්ද?

එවිට සම්මුඤ්ජනී තෙරුන් ස්වාමීනි මම පෙරදින ප්‍රමාද වූ කාලයේ එසේ කළෙමි. දැන් මම අප්‍රමාදීව සිටිමි. භික්ෂූන් වහන්සේලා මේ තෙරුන් දැන් වෙනත් දෙයක් කියයි කියා බුදුන්ට දැන්වුහ බුදුරජාණන් වහන්සේ ඇන්ත මහණෙනි, මගේ පුතා පෙර ප්‍රමාද ව සිටි කාලයේදී අතුගාමින් හැසුරුනි. දැන් මාර්ග ඵල සුවයෙන් කල් යවා අතු නොගාන්නේයයි පවසා මේ ගාථාව පැවසුහ.

පමාවූවද කලින් - දිරියෙන් කෙළස් හළ පසු
වළාවෙන් මිදුණු සඳසේ - බබළති රහත් උතුමෝ

යම්කෙනෙක් පෙර ප්‍රමාදවී පසුව ප්‍රමාද නොවේද වළාවෙන් මිදුන හඳසේ ඔහු මෙලොව ආලෝකමත් කරයි.

එහි අරුත නම් යම් පුද්ගලයෙක් වත් පිළිවෙත් කරමින් හෝ සඡ්ඣායනා කිරීම් ආදියෙන් ප්‍රමාදවී පසුව මාර්ග ඵල සුවයෙන් කල් ගෙවමින් ප්‍රමාද නොවී සිටි එබඳු තැනැත්තා කඵවලාවෙන් බැහැරවු සඳමෙන් අවකාශලෝකය මාර්ග ඤාණයෙන් මේ ස්ඛන්ධ ආදී ලෝකය බබුලුවයි ආලෝක ධාරාවෙන් එකඵකරයි. දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පත්වුහ.

සම්මුඤ්ජනි තෙරුන් පිළිබඳ කථා පුවතයි.

13-6

" **යසස පාපනති**" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර දෙවිරම් වෙහෙර වැඩසිටියදී අංගුලිමාල තෙරුන් නිමිති කරගෙන දේශනාකළහ.

අංගුලිමාල කථා පුවත සුත්‍රයේ සඳහන් පරිදි දැනගත යුතුය. අංගුලිමාල තෙරුන් බුදුන් වෙත පැවිදි වී රහත් බවට පත්වූයේ අනතුරුව උන්වහන්සේ රහසිගතව හුදකලාව විමුක්ති සුවය විඳිමින් සිටියදී මේ උදානය පැවසුහ.

"යම් කෙනෙක් මුලදී ප්‍රමාද වෙමින්සිට පසුව ප්‍රමාද නොවේද? ඔහු මෙලොව ආලෝකමත් කරන්නේ වළාවකින් නික්මුන ප්‍රභාමත් සඳක්මෙනි."

මේ අයුරින් උදානය ප්‍රකාශකර අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑහ. මේ අතර ධම්සභා මණ්ඩපයේදී ඇවැත්නි අඟුල්මල් තෙර කොහි උපන්නේ දැයි කථාවක් ඉපිදවුහ. බුදුන් වැඩමකර මහණෙනි මම පැමිණීමට පෙර කිනම් කථාවකින් යුතුව සිටියෝදැයි ප්‍රශ්න කළහ. එම භික්ෂූන් වහන්සේලා ස්වාමීනි අඟුල්මල් තෙරුන් උපන් ස්ථානය පිළිබඳවයයි පැවසුවිට - මහණෙනි මගේ පුතු පිරිනිවන් පෑවේයයි පැවසුහ. ස්වාමීනි ! මෙපමණ මිනිසුන් ඝාතනය කර උන්වහන්සේ පිරිනිවන් පෑවේදැයි ප්‍රශ්නකළහ. එසේය මහණෙනි. ඔහු පෙර එක් කල්‍යාණ මිත්‍රයෙක් නොලැබී මෙපමණ පව් කළේය. පසුව කල්‍යාණ මිත්‍ර සේවනය ලැබ අප්‍රමාදී විය. එනිසා ඔහුගේ පාපකර්මය කුශලබලයෙන් වැසී ගියේයයි පවසා මේ ගාථාව පැවසුහ.

අකුසලයන් ඇතත් පෙරදී කරන ලද
පසුකල කුසල් කළහොත් ඉන් මිදෙන ලෙද
අවබෝදයෙන් පසු සිව්සස් අමත පද
බබළයි වලාවෙන් ගිලිහුණු ලෙසට සඳ

යම්කෙනෙක් කරණ ලද පාපකර්මය කුසලයෙන් වසයිද ඔහු මෙලොව වළාවෙන් මිදිගිය හඳසේ ප්‍රභාමත් වේ.

එහි දී **කුසලෙන** සඳහා කියන ලදී. අර්හත් මාර්ග ය. **සෙස්ස** පෙර කියන ලද අයුරින් දතයුතුය. මේ දෙසුම අවසන බොහෝදෙන සෝවාන් ආදී මාර්ගඵලයන්ට පත්වුහ.

අංගුලිමාල තෙරුන්ගේ කථා පුවතයි.

13-7

"අඤ්ඤ භූතානි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ අග්ගාලව චෛත්‍යස්ථානයේ වැඩසිටියදී එක් පේශකාර දුවනියක් අරමුණු කොට පැවසුහ.

එක් දිනක් අලව්නුවර වැසියෝ බුදුහු අලව් නුවරට පැමිණි පසුව ආරාධනාකර දානයක් පිරිනැමුහ. බුදුරජාණන් වහන්සේ දන්වළඳා අවසන අනුමෝදනා කරමින් ජීවිතය ස්ථිර නොවේ. මරණය ස්ථිරය. අප විසින් අවශ්‍යයෙන්ම මරණයට පත්විය යුතුය. මගේ ජීවිතය මරණයෙන් කෙළවර වේ. ජීවත් වීම නියත නොවේ. මරණය නියතය. යනුවෙන් මරණ සතිය වඩන්න. යම් කෙනෙක් මරණ සතිය නොවඩන ලද්දේද? ඔවුන් පසුකලෙක ආශිර්විශයෙකු දැක බියවූ පුරුෂයෙක් ලෙසට සන්තාපයට පත්ව බියකරු හඬ නංවමින් කළුරිය කරති. යම් කෙනෙක් මරණ සතිය වඩන ලද්දේද ඔවුහු නාගයෙකු දුරදීම දැක දණ්ඩකින් ගෙන විසිකරණ පුද්ගලයෙක් සේ අවසන් කාලයේදී තුස්ත නොවෙති. එනිසා මරණ සති භාවනාව වැඩිය යුතුයයි පැවසූහ. මෙම ධර්ම දේශනය අසා අනෙක් ජනයා තම කටයුතුවල යෙදෙමින්ම සිටියහ. නමුත් එක් සොළොස් වියැති පේෂකාර දුවනියක් අහෝ බුද්ධ දේශනය නම් කෙතරම් ආශ්චර්යද, මවිසින් මරණ සතිය වැඩිය යුතුයයි සිතා දිවාරාත්‍රි මරණ සති භාවනාව වැඩුවාය. බුදුරජාණන් වහන්සේද අග්ගාලව චෛත්‍ය ස්ථානයෙන් නික්මී දෙව්රමට වැඩම කළහ. එම යුවතිය ද අවුරුදු තුනක් මරණ සතිය ම වැඩුවාය. එක් දිනක උදැසන බුදුරජාණන් වහන්සේ ලොව බලන්නේ එම කුමරිය තමන් වහන්සේගේ ඤාණ දැලට හසුවුවාය. මෙසේ දැක කුමක් වන්නේදැයි සිහිකරන්නේ මෙම කුමරිය විසින් මගේ ධර්මදේශනයෙන් පසුව වසර තුනක් මරණ සති භාවනාව පුරුදු කරණ ලද්දේය. දැන් මම ඇය වෙතගොස් ඇගෙන් ප්‍රශ්න හතරක් විමසා ඒවාට ඇය පිළිතුරු දුන්විට සිව්වරක් සාධුකාරදී මෙම ගාථාව පවසන්නෙමි. ගාථාව අවසන ඇය සෝවාන් ඵලයේ පිහිටන්නේ යයිද එහියාම මහජනතාවටද සාර්ථක දේශනයක් වන්නේයයි දැන පන්සියයක් භික්ෂූන් පිරිවරා දෙව්රමින් නික්මී පිළිවෙලින් අග්ගාල විහාරයට වැඩම

කළහ. ආලවි ගම් වැසියෝ බුදුන් වැඩම කළහයි අසා විහාරයට ගොස් ආරාධනා කළහ. ඒ කුමරියද බුදුන්ගේ ආගමනය අසා මගේ පියා මගේ ස්වාමීවූ ආචාර්යන් වහන්සේ පුන්සඳවන් මුහුණ ඇති ගෞතම බුදුපියාණන් වහන්සේ වැඩම කළේ යයි සතුටු සිත් ඇතිව මෙයට වසර තුනකට පෙර දුටු ඒ රන්වන් බුදුරජාණන් වහන්සේගේ රන්වන් සිරුර දැකීමටත් මිහිරිවූ උතුම් ධර්මය ඇසීමට ලැබෙන්නේ යයි සිතුවාය.

මෙහිදී ඇගේ පියා ද එදින වැඩට පිටත් වෙමින් දියනියනි අන් කෙනෙකුට දියයුතු සළුවක් විවීමට පටන් ගෙන ඇත. වියතක් පමණ තව ඉතිරිවී තිබේ. එය අදම අවසන් කරන්නෙමි. ඉක්මනින් නුල් ඔතා ගෙන එන්නැයි පැවසුවේය. ඇය මෙසේ සිතුවාය. මම බුදුබණ අසනු කැමතිය. පියාද නසරය ගැන කිවේය. මම බණ අසමිද? නැතහොත් නුල් ඔතා ගෙනයන්නේද නුල් පන්දුව ගෙන ගියේ නැත්නම් පියා මට තලන්නේය. පහරදෙන්නේය. ඒනිසා නුල්පන්දුව ඔතා ගෙන ගොස් ඔහුට දී පසුව ධර්මය අසන්නෙමියි. පුටුවක වාඩිවී නුල් පන්දුව එතුවාය. අලවි වාසින්ද බුදුන්ට දන් පිළිගන්වා පාත්‍රයගෙන අනුමෝදනය ඇසීමට වාඩිවීසිටියහ. බුදුරජාණන් වහන්සේද, මම යම් කුල දුවක් නිසා තිස්යොදුන් මග ගෙවාගෙන මෙහි පැමිණියේද අදත් ඇයට අවකාශ නො ලැබෙන්නේය ඇයට ඉඩ අවකාශ ලැබුනවිට ධර්ම දේශනය කරන්නෙමියි නිහඬව සිටියා මෙලෙස නිහඬව සිටින විට දෙවියන් සහිත ලොව කිසිවෙකුටත් කිසිවක් කියන්නට නො හැකිය. ඒ කුමාරිකාවද පන්දුව නුල්ඔතා පැසක තබා පියා සමීපයට යන්නි - පිරිස් කෙළවරට ගොස් බුදුන් දෙස බලමින්ම සිටියාය. බුදුරජාණන් වහන්සේද ගෙල ඔසවා ඇය දෙස බැලුහ. ඇය බලාසිටින අයුරින්ම දැනගත්තාය. බුදුහු මෙබඳු පිරිසක අතර සිටියදී මදෙස බලන්නේ මගේ ගමන අපේක්ෂා කරති. ඇය නුල් පන්දුව ඇති පැස තබා බුදුන් වෙතට ගියාය. බුදුරජාණන් වහන්සේ ඇය දෙස බැලුවේ කුමක් හෙයින්ද? උන්වහන්සේට මෙබඳු අදහසක් ඇතිවිය. ඇය මෙසේ යාමෙන් පුහුදුන් කෙනෙක් ලෙසට කලුරිය කොට අනියත ගතික වන්නීය. මා වෙත පැමිණ යන්නේනම් ඇය සෝවාන් ඵලයට පත්ව ඒකාන්ත ගතිකව මරණයෙන් පසුව තුසිත දෙව්ලොව උපදින්නීය. ඇගේ එදින මරණයෙන් මිදීමක් නැත. ඇය බුදුන් බැලූ පමණින් බුදුන්වෙත එළඹ ෂඩ්වර්ණ රශ්මිය අතරට පිවිස වැඳ එකත් පසෙක සිටියාය. එබඳු පිරිසක් අතර වාඩිවී නිහඬව සිටි

තථාගතයන්වහන්සේ වැඳ සිටි අවස්ථාවේදීම බුදුරජාණන් වහන්සේ මෙලෙස විමසුහ. දරිය කොහිසිට ආවේද? ස්වාමීනි නොදනිමි. කොහියන්නේද? ස්වාමීනි නොදනිමි. නොදන්නේද? දනිමි ස්වාමීනි. නොඑසේනම් දන්නේද? නොදනිමි ස්වාමීනි. මේලෙසට බුදුහු ප්‍රශ්න හතරක් විමසුහ. මහජනයා සෝෂාකලහ.

අපොයි බලන්න මේ පේසකාර දුවනිය සම්මා සම්බුදුන් වහන්සේ සමග කැමති කැමති ලෙස කථාකරයි. කොහිසිට ආවේදැයි විමසුවිට පේසකාර ගෙයි සිටයයි කිවයුතුය. කොහි යන්නේදැයි විමසුවිට පේශකාර ශාලා වටයයි පැවසිය යුතුය. බුදුහු මහජනයා නිහඬකරවා දරිය ඔබ කොහිසිට ආවේදැයි විමසුවිට ඇයි නොදන්නා බව පැවසුවේ. ස්වාමීනි ඔබ වහන්සේ විමසුවේ කොහිසිට අවුත් මේ භවයේ උපන්නේදැයි යනුවෙනි, ස්වාමීනි මම කොහේසිට අවුත් මෙහි උපන්නේදැයි නොදනිමි. ඉක්බිති බුදුරජාණන් වහන්සේ සාධු - සාධු කුමාරිකාවනි ! ඉතා හොඳයි මවිසින් අසන ලද ප්‍රශ්නයටම ඔබ විසින් පිළිතුරු දෙන ලදී. යනුවෙන් සාධුකාරදී තවදුරටත් විමසුහ. කොහි යන්නේදැයි විමසුවිට නොදනිමියි පැවසුවේ කුෂ්ක්හෙයින්ද? ස්වාමීනි ඔබ වහන්සේ මා නුල් පන්දුවගෙන පේශකාර ශාලාවට යනබව දැන සිටිති. එහෙත් ඔබ වහන්සේ මෙයින් පසු කොහි උපදින්නේදැයි විමසුහ. මම ද මෙයින් චුතව කොහේ උපදින්නේදැයි නොදන්නෙමි. තථාගතයන් වන්සේ මවිසින් අසන ලද්දටම ඔබ පිළිතුරු දුන්නායයි දෙවැනිවරද සාධුකාර දුන්හ. ඊලඟට මම ඔබ නොදන්නේදැයි විමසුවිට දන්නේයයි පිළිතුරු දුන්නේ කුමක් හෙයින්දැයි විමසුහ. ස්වාමීනි මම මරණයට පත්වන බව දනිමි එනිසා එලෙස පිළිතුරු දුනිමි. එසේ නම් ඔබ දන්නේ දැයි විමසුවිට නොදන්නෙමියි පැවසුවේද ස්වාමීනි මම මැරෙන බව දනිමි එහෙත් රාත්‍රියේද දවල්කාලයේද අසවල් කාලයේදැයි නොදනිමි. එනිසා නොදන්නාබව පැවසීමි. අනතුරුව බුදුරජාණන් වහන්සේ මවිසින් ඇසූ සියළු ප්‍රශ්නවලට නුඹ විසින් පිළිතුරු දුන්නේයයි සිව්වැනි වරද සාධුකාරදී පිරිස ඇමතූහ. මෙපමණකින් නුඹලා මැය කියුදේවල් නොදනිමු. එසේ නොදනම තේරුම් නොගෙනම සෝෂාකළහ. යමෙකුට ප්‍රඥාව නැතිනම් ඔවුන් අන්ධයින් වැන්න. යමෙකුට ප්‍රඥා ඇස තිබේද ඔවුන් ඇස් ඇත්තෝමයයි කියා මේ ගාථාව පැවසූහ.

පුහුදුන් අතර ඇති
වැඩිදෙන බාලයෝ වෙති
බැලිය යුතු සත්‍යය
දෙසද ඔව්හු නොබලති
ටික දෙනෙකි සුගතියට යන්නේ
දැලෙන් මිදෙනා කුරුල්ලන් සේ.

අන්ධ වූ මේ ලොව කවරෙක්නම් විශේෂයෙන් බලත්ද දැලෙන් මිදුන පක්ෂීන් මෙන් ඉතා අල්ප දෙනෙක් දිව සම්පත් ලබති.

මෙහි අයං ලොකොනි - මේ ලෞකික සාමාන්‍ය ජනයා ප්‍රඥා ඇස නොමැති නිසා අන්ධභූතො තනුකෙත්ථ යනු බොහෝ දෙනා අනිච්චාදී වශයෙන් නොබලයි. විපස්සති ජාලමුත්තෙනාවා යනු යම් දක්ෂ පක්ෂියෙක් දැලෙන් ගැලවීයයි සසර දැලින් කිසිවෙක් මිදේ අනෙක් අය දැලේම සිරවී සිටිති. ස්වල්ප දෙනෙක් ස්වර්ගයට යති. තව කෙනෙක් නිවනට පත්වේ. මේ දෙසුම අවසානයේ කුමාරිකාව සෝවාන් ඵලයේ පිහිටියාය. මහජනයාට ද දෙසුම සාර්ථක විය. ඇයද නූල් පන්දුව ගෙන පියා වෙත ගියාය. ඇගේ පියාද වාඩි වී සිටිමින්ම නිදා සිටියේය. ඇයත් ඒ ගැන නොසිතාම නූල්පන්දුව ලංකළාය එම නූල් පන්දුවේ කෙලවර ඇති කැඟඟමින් වැටුනි. ඔහු අවදිවී ගන්නාලද නිමිත්ත අනුවම පන්දුව ඇද්දේය. ලීකෙලවර ගොස් ඇගේ උරපත්තේ වැදුනි. එනිසා අය එහිම මියගොස් ඇද වැටුනි. අනතුරුව ඇගේ පියා මෙය බලා මුළු සිරුර ලෙසින් වැරි වැටෙනු දැක මහා ශෝකයක් ඇතිවුනි. කිසිවෙකුටත් මගේ ශෝකය නිවන්නට නොහැකියයි ඇඬමින් බුදුන්වෙත ගොස් මේ ප්‍රවෘත්තිය පැවසුවේය. ස්වාමීනි මගේ ශෝකය නිවන්නැයි අයැද සිටියේය. බුදුන් වහන්සේ ඔහු සනසා ශෝක නොකරන්න. කෙළවරක් නොමැති මේ සසර ඔබගේ දුවනියගේ මරණය නිසා හැඬූ කඳුලු මේ සිව් මහසයුරේ ජලයටත් වඩා අධිකයයි දේශනාකර සසර ස්වභාවය පැවසුහ. මේ දැඩි සොව නිසාම ඔහු බුදුන්වෙත පැවිදි වී පසුව උපසම්පදාව ද ලබා නොබෝ දිනකින්ම අර්හත්වයට පත්විය.

පේසකාර දුවනිය පිළිබඳ කථා පුවතයි.

13-8

"හංසාදිච්චපථෙ" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී භික්ෂූන් තිස්නමක් නිමිතිකර ගෙන දේශනාකළහ.

එක් දිනක් ප්‍රාදේශිය දිසා වාසී භික්ෂූන් වහන්සේලා තිස් නමක් බුදුන්වෙත පැමිණියහ. ආනන්දතෙරුන් බුදුන්ට උවටැන් කරණ අවස්ථාවේදී පැමිණි එම භික්ෂූන් දැක බුදුරජාණන් වහන්සේ මේ අයසමග පිළිසඳර කථා කළ කල්හි වතාවත් කරමියි දොරටුවේ සිටියහ. බුදුරජාණන් වහන්සේද පිළිසඳර කථාකොට ඔවුන්ට සිහිකටයුතු ධර්ම කථාවක් පැවසුහ. එම කථාව අසා සියල්ලෝම රහත්බවට පත්ව ඉහල අහසට නැග අහසින් වැඩම කළහ. ආනන්ද තෙරණුවෝ උන්වහන්සේලා ප්‍රමාදවෙනු දැක. බුදුන් වෙත එළඹ ස්වාමීනි මෙතැනට භික්ෂූන් තිස්නමක් පමණ පැමිණියහ. එම භික්ෂූන් කොහිදයි විමසුහ. ආනන්ද ඔවුන් ගියහ. ස්වාමීනි මොන පාරෙන්ද? ආනන්ද ආකාශ මාර්ගයෙන් ඇයි ස්වාමීනි උන් වහන්සේලා රහත්හුදැ? එසේය ආනන්ද මගෙන් බණ අසා රහත්වුහ. එම අවස්ථාවේදීම හංසරාජයන් අහසින් පියඹා ගියහ. ආනන්ද යම්කෙනෙක් මැනවින් සතර ඍද්ධිපාද වඩන ලද්දේද ඔහු හංසයින්ලෙස අහසින් යන්නේයයි පවසා මෙම ගාථාව දෙසුහ.

රණහංසයෝ පියඹායති අහස් කුස
රහතුන් අහස් ගැබ යති ලැබ ඒර්දි බල
නුවණැත්තෝ දිනා ගෙන ලොව නිවන් රස
පරදා මරුන් මෙලොවින් යති උසස් ලෙස

"හංසයෝ අහසේ යති. ඍද්ධිමත්හුද අහසින් යති. ශ්‍රේෂ්ඨයෝ ලොව දිනා මරසෙනඟ පරදවා ලොවින් එතර වෙති.

එහි අරුත **ඉමෙහංසා ආදිච්චපථෙ** මෙම හංසයෝ අහසින් පියඹා යති යම්කෙනෙක් ඍද්ධිපාද මැනවින් වඩන ලද්දේද ඔවුන්ද **"ආකාසෙ යන්ති ඉද්ධියා** - ඍද්ධිබලයෙන් අහසින් ගමන්කරති. **ධීරාපි** - නුවණැත්තෝ

සේනාසහිත මාරයා පරාජය කොට - මේ සංසාර වට්ටයෙන් නික්මයති. නිවණට පැමිණෙති යන අරුතයි දේශනය කෙලවර බොහෝදෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පත් වුහ.

භික්ෂූන් තිස්නමක් පිළිබඳ වූ කථා පුවතයි.

13-9

"එකං ධම්මං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී විඤ්ඤව මානවිකාව නිමිත්තකරගෙන දේශනා කළහ.

ප්‍රථම බෝධියේ දීම දශබලධාරීන් වහන්සේට ඇති වූ පෘථුල ශ්‍රාවක පිරිස නිසාද ආර්ය භූමියට පත් දෙවි මිනිසුන් නිසාද, ඇති වූ මුනිගුණ සමුදාය නිසාද, ගුණ කීර්තනය නිසාද මහත් ලාභ සත්කාර උපන්හ. තීර්ථකයෝ සූර්යයා පායන විට කලාමැදිරියන් සේ වූහ. ලාභසත්කාර නැති ව තීර්ථකයෝ විටිය මැද වාඩිගෙන කිම ශ්‍රමණ භවත් ගෞතමයන් පමණක්ද බුද්ධ වූයේ අපිදු බුදුන් වෙමු. එනිසා ඔහුට පමණක් නොව අපට දුන්දෙයද මහත්පල වන්නේ ය. අපට ද දන් දෙන්න. අපට ද සත්කාර කරන්න. යනුවෙන් මිනිසුන් දැනුවත් කළද ලාභ සත්කාර නොලැබ රහස් තැනක එක් රැස්වී කවර උපායකින් ශ්‍රමණ භවත් ගෞතමයන්ට මිනිසුන් අතර අපහාසයක් කර අපකීර්තියක් ඇතිකර ලැබෙන ලාභ සත්කාර නැති කරවුයි නිගමනය කළහ.

ඔවුහු මෙය උපායකැයි පිළිගත්හ. එකල සැවැත් නුවර විඤ්ඤා නම්වූ පරිබ්‍රාජක රෑමත් දෙවඟනකට සමානවූ මෙනෙවියක් සිටියාය. ඇගේ සිරුරින් රශ්මිය විහිදේ අනතුරුව රළුවූ ස්වභාව ඇති එකෙක් විඤ්ඤා මානවිකාව නිමිති කරගෙන ශ්‍රමණ භවත් ගෞතමයන්ට අවමන් කොට ලාභ නසාදමමුයි කතිකා කරගත්හ. මෙය අර්ථවත් උපායකැයි ඔව්හු කල් පනා කළහ. මේ වනවිට ඇය තීර්ථකාරාමයට ගොස් වැඳසිටියාය. තීර්ථකයෝ ඇය සමග කථානොකළහ. ඕ තොමෝ මගේ කිසියම් දෝෂයක් වරදක් ඇත්දැයි සිතා ආර්යන් වහන්ස තුන්වරක් වැන්දාය. ඇය හා කථා නොකළහ. ආර්යන් වහන්ස මගේ කවර වරදක්ද ඇයි මා හා කථා කරන්නේ නැත්තේ මෙලෙසින් ප්‍රශ්නකළ විට පිළිතුරු දෙමින් සොහොයුරිය ශ්‍රමණ ගෞතමයන් අපව පෙළෙමින් ලාභසත්කාර නැතිකරමින් හැසිරෙන අයුරු නොදන්නේද? නොදනිමි ආර්යයන් වහන්ස, අපවිසින් කුමක් කරමුද? ඉදින් නැගණිය අපට සැප කැමත්තිනම් ඔබ නිසා ශ්‍රමණ ගෞතමයන්ට

අපකීර්තියක් උපදවා ලාභ සත්කාර නසා දමන්න. හොඳයි ආයුෂ්මත් මට එහි වගකීම භාරයි. ඒ ගැන නොසිතන්නැයි කියා ගොස් ස්ත්‍රීහු මායම්පෑමට දක්ෂ නිසා එදින සිට සැවැත් නුවර වාසින් ධර්ම කථා අසා දෙව්රමින් නික්ම යන අවස්ථාවේදී රතිඳුගොව්වන්ගේ පාටින් සළුවක් පොරවා ගෙන සුවඳ වර්ග මල් ආදියගත් අතින් දෙව්රම් වෙහෙර දෙසට යන්නීය. මේ වෙලාවේ කොහේ යන්නේදැයි ප්‍රශ්න කළ විට ඔබලාට මොකද? මම යන තැනින් වැඩක්තිබේදැයි කියා දෙව්රම අසල තිර්ථක ආරාමයක සිට අළුයම උතුම් වූ වන්දනාව වඳින්නෙමුයි නාගරිකයෝ දෙව්රමට යන අවස්ථාවේදී උපාසක ජනයාට දෙව්රම ඇතුලේ සිට එන්නියක ලෙසට අඟවා නගරයට ඇතුළුවෙයි. කොහි සිටියේදැයි විමසූ විට මම සිවි තැන් නුඹලාට මොකටදැයි කියා මාස එක හමාරක් පමණ ගියවිට එසේ අසන අයට මම දෙව්රම ගන්ධ කුටියේ බුදුන්හා එකට සිටියෙමියි පවසයි. පුහුදුන් අයට මෙය ඇත්තක්ද? නැත්දැයි සැකයක් ඇති කරවීය.

තෙමසක් සිවුමසක් ගතවුවිට රෙදිවලින් බඩ ඔතා ගැබිණියකගේ ස්වරූපය දක්වමින් උඩින් රතුපටක් පෙරවාගෙන ශ්‍රමණ ගෞතමයන් නිසා දරුගැබක් ඇතිවි යයි. අඳබාලයන් ග්‍රහනය කරගෙන අට මසක් නව මසක් ගතවුවිට උදරයේ දර මිටියක් බැඳ ඒ මත තවත් සළුවක් පෙරවාගෙන අත් පා පිට ගොන් හක්කකින් තලා උඩට නෙරා ඇති ලෙසට දක්වා උඩින් සළුවක් පෙරවාගෙන ක්ලාන්තවූ ස්වරූපයක් පෙන්වමින් සවස් යාමයේ තථාගතයන් වහන්සේ අලංකාර ධර්මාශනයේ වැඩහිඳ ධර්මය දේශනා කරමින් සිටින අතර ධම්සභා මණ්ඩපයට ගොස් බුදුන් ඉදිරියේ සිට මහා ශ්‍රමණය මහජනයාට ඔබ ධර්මය පමණක් දේශනාකරයි. ඔබේ හඬ බොහෝ මිහිරිය, මැනවින් දත් පිහිටා තිබේ. මම ඔබනිසා දරුගැබක් පිහිටා දැන් එය මෝරා ඇත. ඇයි මට තිබිරිගෙයක් නොදනීද? කොසොල් රජු හෝ, අනේපිඬු සිටු හෝ විශාඛා උපාසිකාව හෝ කැඳවා, මේ කාන්තාවට අවශ්‍ය කටයුතු කාර්යයන් ඉටුකරන ලෙස කියන්නැයි, ගැබ් පෙරහැර සකස් කරන ලෙස කියන්නැයි, තෙල් ගිතෙල් ආදි ගබ් පෙළහරට අවශ්‍ය දේ නොදනීද? මේ ලෙස අසුරු පිඬක් ගෙන සඳමඬලනැති කරණලෙසට උත්සහ කරන්නියක සේ පිරිස මැද බුදුරජාණන් වහන්සේට අපහාස කළාය.

බුදුරජාණන් වහන්සේ ධර්මදේශනය නවතා සිංහයෙකු ලෙසට හඬනගමින් නැගණිය, ඔබ කීදෙහි සත්‍යය බව හෝ බොරුබව මමත් ඔබත් පමණක් දනිමු යනුවෙන් පැවසුහ. එසේය මහා ශ්‍රමණය ඔබ හා මම පමණක් දන්නා බව කවරෙක් නො දනීද? මේ අවස්ථාවේදී සක්දෙවිඳුගේ අසුන උණුවිය. ඔහු විමසා බලන්නේ විඤ්ඤා බුදුන්ට අහුන චෝදනා කරන්නේයයි දැන මෙය පිරිසිදු කරමියි දෙව්පුතුන් හතර දෙනෙක් සමග පැමිණියේය. දෙව්පුතුන් සිව්දෙන මී පැටවුන් සිව්දෙනෙකු වී දර මිටිය බැඳි රැහැනත් සමග එකවරම කපාදැමුහ. පෙරවාසිටි සළුව සුලඟින් එසවුනි. ලිහුණු දරමිටිය ඇඟේ පාපිට පතිතවිය. පාදෙකේම ඇඟිලි කැඩුනි. මිනිස්සු නින්දිත කාලකණ්ණිය බුදුන්ට අපහාස කරන්නේයැයි හිසට කෙළගසා ගල් දඬු ආදියෙන් පහර දී දෙව්රමින් නෙරපා හැරුහ. ඉක්බිති බුදුන්ගේ ඇස්හමුවෙන් ඉවත් වී යන විට මහපොළව විවර වී අවීචියෙන් ගිනි දළු මතුවී දැඩි කම්බලයක් පෙරවන්නාසේ ගිනිදළු වලින් වෙළී අවීචියේ උපත ලැබිය.

අන්‍ය තීර්ථකයන්ගේ ලාභ සත්කාර පිරිහුනි. බුදුරජාණන් වහන්සේට ලාභ වැඩි විය. දෙවන දින දම්සභාවේදී කථාවක් උපනි. ඇවැත්නි විඤ්ඤා මානවිකාව මෙලෙස උදාරගුණ ඇති අග්‍ර දක්ෂිණාර්හවූ සම්මා සම්බුදුන්ට අමූලික වූ බොරුවෙන් අපහාස නින්දා කර මහා විනාශයකට පත්වූවාය. මෙලෙස කථා කරමින් සිටියදී තථාගතයන් වහන්සේ පැමිණ මා පැමිණීමට පෙර කිනම්කථාවකින් යුතුව සිටියාහුදැයි විමසුහ. මේ සිදුවීමයයි පැවසූ විට මහණෙනි මැය දැන් පමණක් නොව පෙරද මට අහුතචෝදනා වෙන් අපහාසකර විනාශයට පත්වූවායි පවසා මේ ගාථාව පැවසුහ. රජු අන් අය පිළිබඳ ලොකු කුඩා කවර දොශයක් හෝ හැමඅයුරින් නොදැක නො විමසා තමා මැ පරීක්ෂා නොකර දඩුවම් නො පමුණුවන්නේය.

මේ දොළොස් වැනි නිපාතයේ දී මහපදුම ජාතකය විස්තරකර දේශනාකළහ. එකළ මේ විඤ්ඤා බෝධිසත්ව මහා පදුම කුමාරයා ගේ පියාගේ දෙවැනි බිරිඳ හා අගමෙහෙසිය වී බෝසතුන්ට අසද්ධර්මයෙන් ආරාධනාකර ඔහුගේ සිත් එකඟකරවා ගැනීමට නොහැකිව තමන් තමන්ටම විනාශයක් කර ගිලන්වූබව පෙන්වා ඔබේ පුතා මම අකමැතිව මේ

විපතට හෙළීයයි (බොරුගොතා) රජුට දැනුවුවාය. රජු කිපී මහසත් චෝර පබ්බතයෙන් හෙලීය.

පර්වත කුහරයක වැසි දෙවියෙක් පිළිගෙන නාරාජයාගේ පෙන මතුවේ තැබීය නා ඔහු නාලොවට ගෙන ගොස් රාජ්‍යයෙන් අඩක් දී පිදීය. ඔහු නාලොව වසරක් වාසයකර පැවිදි වෙනු කැමතිව හිමාල ප්‍රදේශට ගොස් පැවිදිවී ධ්‍යාන අභිඥා ඇතිකරගත්තේය. අනතුරුව එක් වනචර පුද්ගලයෙක් ඔහු දැක රජුට ඒ පිළිබඳව දැන්වීය. රජු ඔහුවෙත ගොස් පිළිසඳර කථාකොට සියලු ප්‍රවෘත්තිය දැනගෙන බෝධිසත්වයන්ට රාජ්‍යය බාරගන්නට නියමකලේය. එහි දී බෝසත් පුතනුවන් මට රාජ්‍යයෙන් වැඩක්නැත. නුඹ දසරාජ ධර්මයන් අවුල්නොකර අගති ගමනය අත්හැර ධර්මයෙන් රාජ්‍යයකරන්නැයි අවවාද දුන්පසුව රජු අසුනෙන් නැගිට හඬා වැලපී නුවරට යන්නේ අතර මගදී ඇමතියන්ගෙන් විමසුවේය. මම කවුරුනිසා මෙබඳු ආචාර සම්පන්නයාගෙන් වියෝගයට පත්වුවේ දැයි දේවයන් වහන්ස ඔබතුමාගේ අගබිසව නිසාය. රජු ඇය හිස යටට සිටින සේ දෙපසින් අල්ලා චෝර පබ්බතයෙන් හෙලා නුවරට පිවිස ධර්මයෙන් රාජ්‍යය කලේය. එදා මහාපදුම කුමරු බෝසතුන්විය. සපත්නී මව (කුඩම්මා) චිඤ්ඤි මානවිකා වුවාය. බුදුහු මේ එකම අර්ථය ප්‍රකාශ කොට මහණෙනි එකම ධර්මය වන සත්‍යය අත්හැර බොරුකියන්නන් පරලොව නසාගෙන නොකළහැකි කිසිදු පාපකර්මයක් නම් නැතැයි මේ ගාථාව දේශනාකළහ.

පරලොවක් නොසිතා
ඇත්ත සඟවන
බොරුම කියනා මහ දනන්හට
නොකළ හැකි වෙන
පව්කමක් නැත.

"එකම වාක සත්‍යය ධර්මය ඉක්මවා බොරුකියන, හරණලද පරලෝඇති සත්තවයා විසින් කළනොහැකි වූ පාපයක් නැත.

එහි දී **එකං ධම්මං** - යනු සත්‍යයයි. මුසාවාදිස්ස යනු යමෙකුගේ වචන දහයක එකම සත්‍යයක් නැත්ද මෙබඳු බොරුකියන්නා **විනිණ්ණපරලොකස්ස** අත්හරණ ලද පරලොව ඇති එනම් මනුෂ්‍ය සම්පත්තිය - දෙව්ලොව අවසානයේ නිබ්බාණ සම්පත්තිය යන සම්පත් තුනම නොලබයි. මෙබඳු බරපතල වෙනත් පවක්නැත.

විඤ්ඤා මානවිකාව පිළිබඳ කථා පුවතයි.

13-10

"නවෙ කදරියා" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී අසදෘෂ දානය පිරිනැමීම පිළිබඳව දේශනා කළහ.

එක් දිනක් බුදුරජාණන් වහන්සේ චාරිකාවේ යෙදී පන්සියයක් භික්ෂූන් පිරිවරාගෙන දෙවිරම් වෙහෙරට පිවිසියහ. රජතුමා විහාරයට ගොස් බුදුන්ට ආරාධනාකර දෙවන දිනයේ ආගන්තුක දානය සාදා මගේ දානය ඇවිත් බලන්නැයි නගර වැසියන් කැඳවිය. නුවර වැස්සෝ අවුත් රජුගේ දානය දැක දෙවන දිනය සඳහා බුදුන්ට ආරාධනාකර දානය සකසා අපදෙන දානය රජතුමා දකිවායි රජුට පණිවිඩ යැවුහ. රජතුමා නාගරිකයන්ගේ දානය දැකබලා - මෙම දානය මගේ දානයටවඩා උතුම් යයි නැවත දානයක් දෙන්නෙමියි ඊළඟදින දානයක් සුදානම් කළේය. එය බලා

නාගරිකයෝද නැවත දානයක් සුදානම් කළහ. මෙලෙසින් රජුට නුවරුන් පරාජය කිරීමට නොහැකිවිය. හයවැනි වාරයේදී නුවර වැස්සෝ සියදාහස් ගුණයෙන් වැඩිකර වඩා උතුම් දාන පිරිනැමුහ. රජු මේ දාන දැක මොවුන්ට වඩා වැඩිදාන පිරිනැමීමට නොහැකිය මගේ ජීවිතයෙන් වැඩක් නැතැයි සිතුවේය. මේලෙස කලකිරී උපායක් සිතමින් නිදාගත්තේය. මේ අතර මල්ලිකා දේවිය පැමිණ ඇය මහරජ මෙලෙස වැතිරී සිටින්නේ ඇයි ! ඔබ කලාන්ත වී මෙන් සිටින්නේ කුමක් නිසාදැයි විමසුවාය. රජතුමා දේවිය ඔබ නොදනීද මම දන්නේ නැත දේවයනි. ඔහු ඇයට සිදුවුදෙය පැවසුවේය. අනතුරුව මල්ලිකා දේවිය මෙසේ පැවසුවාය.

දේවයනි නොසිතන්න. පෘථුවිශ්වර වූ ඔබ නාගරිකයින්ට පරාජය වීමක් අසන්න දකින්න ලැබෙයිද? මම ඔබතුමන්ගේ දානය සංවිධානය කරන්නෙමි. අනතුරුව අසදෘෂ දානය සංවිධානය කරමින් සල් ලෑලිවලින් පන්සියයක් භික්ෂූන්ට වැඩසිටීම සඳහා රවුමට අසුන් පනවන්න. පන්සියයක් කුඩ තබන්නැයි පැවසුවාය. මේ කුඩ පන්සියයක් ඇතුන් විසින් දරණු ඇත. මැණික්මයවූ හෝ රන්මය වූ නැව් අටක් හෝ දහයක් කරවන්න. ඒවා

මණ්ඩපය මැද තබනු ලැබේ. භික්ෂූන් වහන්සේලා දෙනමක් අතර ක්ෂත්‍රිය **කන්‍යාවක්** වාඩිකරවා සුවඳ අඹරනු ඇත. එක් එක් ක්ෂත්‍රිය කන්‍යාවක් **විජිනි පතක්** ගෙන පවන්සලනු ඇත. අනෙක් ක්ෂත්‍රිය දුවනිවරු ඇඹරූ සුවඳ නැවට දමනු ලැබේ. ඔවුන් අතරින් එක් දුවක් නිල් උපුල් කළඹක් ගෙන රන් නෞකාවල දමන ලද. සුවඳ කුඩු කළඹා සුවඳ පතුරුවති. නගර වාසින්ට ක්ෂත්‍රිය දුවනිවරු නැත. සුදු කුඩද නැත. ඇතුන්ද නැත. මෙම කරුණු නිසා නුවරවැසියෝ පරාජයට පත්වෙති. ඔබ විසින් යහපත් දෙයක්ම කියනලදී. ඔබ කිවු අයුරින්ම සියල්ල කරමි. මෙලෙස සුදානම් කරන අතර එක් භික්ෂුවකට ඇතෙක් මදිවිය. කුමක් කියන්නේද? ඇතුන් පන්සියයක් නැතිද? දේවිය ඇතුන් ඇත. එනමුත් අනෙක් ඇතුන් සැඩපරුෂය. ඔවුන් භික්ෂූන් වහන්සේලා දැක වේරම්භ වාතයක්සේ සැඩවන්නෝය. දේවයනි. මම එක් සැඩ එරුස ඇතෙක් සේසත දරමින් නැබියයුතු තැනක් දනිමි. ඒ කොහිද දේවිය. අංගුලිමාල ආර්යන් වහන්සේ ලඟයයි පැවසුවාය. රජතුමා එසේ නැබවීය. ඇත් පෝතකයා වලිගය කලවා අතර රුවාගෙන දෙකන් පොලාගෙන ඇස් වසා ගෙන සිටියේය. මහජනයා මෙබඳු සැඩ ඇතුන්ට නියම ආකාරයයි ඇතා දෙසම බලාසිටියහ. රජතුමා බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට වළඳවා දමා බුදුන්ට වැඳ ස්වාමීනි ! මේ දානයේ කැපභාණ්ඩ හෝ අකැප භාණ්ඩ හෝ සියල්ල ඔබවහන්සේටම පූජාකරමියි පැවසුවේය.

මෙම දානයේදී එකදිනකට වැයකළ මුදළ කෝටි දාහතරක්විය. බුදුරජාණන් වහන්සේට පැනවූ සේසත වාඩිවන පුටුව මේසය පාපිඨය යන මේ භාණ්ඩ හතර ඉතා අධික වටිනාකමක් විය. එනිසාම අසදිස දාන නමින්ම ප්‍රසිද්ධවිය. එබඳු දානයක් බුදුවරුන්ට එක්වරක් පමණක් පවතී. සියල්ලම ස්ත්‍රීන් විසින් ම සංවිධානය කෙරෙති.

මේ කොසොල් රජතුමාට කාල හා ජුණ්හ යනුවෙන් ඇමතිවරු දෙදෙනෙක් සිටියහ. ඒ දෙදෙනා අතරින් "කාල" මෙලෙස සිතුවේය. අහෝ රාජකුලයේ පරිහානිය සිදුවේ. එකදිනකට කෝටි දාහතරක් වැයවේ. මෙම භික්ෂූන් මේ දානය වළඳා ගොස් වැතිරී නිදාගන්නාහුය. අහෝ රාජකුලය වැනසේ. යනුවෙනි. ජුණහ මෙසේ සිතුවේය. අහෝ රජුගේ දානය රජ නොවන

කෙනෙකුට මෙබඳු දානයක් සියළු සත්ත්වයන්ට ප්‍රාප්ති දෙන්නෝනම් නැත එනිසා මම මේ දානයේ පිං අනුමෝදන්වෙමියි යනුවෙනි. බුදුරජාණන් වහන්සේ දන්වළඳා අවසානයේ අනුමෝදනය කරමියි පාත්‍රය ගත්හ. බුදුරජාණන් වහන්සේ මෙලෙස සිතූහ. මහරජ මහා සැඩපහරක් මෙන් මහාදානයක් දෙන ලදී. මහජනයාට සිත ප්‍රසාදයට පත්වීමට හේතු විද නොවීදැයි විමසා බලමින් ඇමතිවරු දෙදෙනා ගේ සිත් ස්වභාය දැන ඉදින් රජුගේ දානයට සුදුසු අනුමෝදනයක් කරන්නේනම් කාල ඇමතිගේ හිස සත්කඩකට පැලේ. ජුණිහ ඇමති සෝවාන් ඵලයට පත්වන්නේයයි දැන - කාල කෙරෙහි අනුකම්පාවෙන් මෙතරම් මහත් දානයක් පිරිනැමූ රජුට සතර පද ගාථාවක් පමණක් පවසා අසුනින් නැගිට විහාරයට වැඩමකළේ භික්ෂූන් විසින් අංගුලිමාල තෙරුන් විමසූහ. ඇවැත්නි. දුෂ්ටවූ ඇතා ජත්‍රය දරා සිටියදී ඔබ වහන්සේට බියක් ඇති නොවුවේද? නැහැ ඇවැත්නි මට බියක් ඇතිනොවීය. එම භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට ස්වාමීනි අංගුලිමාල තෙරුන් අනෙක් කරුණක් පවසන්නේ යයි පැවසූහ. මහණෙනි ! අංගුලිමාල බිය නොවේ රහත් උතුමෙකි. උතුම් වෘෂභ රාජයන් අතර ජෙෘෂ්ඨ වෘෂභයා සමානව මගේ පුත් අංගුලිමාල බිය නොවේයයි පවසා බ්‍රාහ්මණ වර්ගයේ මේ ගාථාව පැවසූහ.

නැති ගැන්මක් නොමැති
උතුම් වෙර හා තෙද ඇති
දිනූ සතුරන් ඇති
කෙළෙස් මල සෝදා හැරී
සිව්සස් දහම් දත්
රහතන් වහන්සේ
බමුණෙකු වේය අරුනින්

ආජානීය වෘෂභ රාජයකු වැනි උතුම්වූ වීර්ය වත්වූ මහර්ෂි වූ මරුන් දිනූ තෘෂ්ණා රහිත කෙළෙස්මල ශෝධා හල චතුරාර්යයට මුණිවරයා පත් බ්‍රාහ්මණයෙකැයි මම පවසමි.

රජුද දොම්නසට පත්ව මෙබඳු පිරිසකට දන්දී සිටි මට සුදුසු අනුමෝදනයක් නොකොට ගාථාවක් පමණක් පවසා නැගිට යන ලදී මවිසින් බුදුන්ට සුදුසු දානයක් නොකොට නුසුදුසු කථාවක් වන්නේය. කැප වූ භාණ්ඩ නොදී අකැපභාණ්ඩ හෝ දෙන ලද්දේදැයි බුදුන් වහන්සේ මාකෙරෙහි කුපිතවූයේ වන්නේයැයි ද සිව්කෙනෙකුන්ට දානයට අනුරූපවූ අනුමෝදනා කිරීම වටීයයි විහාරයට ගොස් බුදුන් වැඳ මෙලෙස පැවසීය.

ස්වාමීනි ඇයි මවිසින් දියුතු දානයක් නොදෙන ලද්දේද නොඑසේනම් නොදියයුතු අකැපවූ දේ දෙන ලද්දේද ඇයි මහරජ මම ඔබට සුදුසු වූ අනුමෝදනයක් කරණ ලදී ඔබ විසින් සුදුසුවූ ම දානයක් දෙනලදී මෙබඳු අසදිස දානයක් බුදුකෙනෙක්ට ලැබෙන්නේ එක්වරක් පමණි. නැවත මෙබඳු දානයක් පිරිනැමීම අපහසුය. එසේ නම් ස්වාමීනි දානයට සුදුසුවූ අනුමෝදනයක් නොකරණ ලද්දේ කුමක් හෙයින්ද?

මහරජ පිරිස අපිරිසිදු හෙයිනි. ස්වාමීනි පිරිසේ කවර වරදක්ද මෙසේ විමසුවිට බුදුහු ඇමතිවරු දෙදෙනාගේ අදහස් සිතුවිලි දන්වා කාල කෙරෙහි අනුකම්පාවෙන් අනුමෝදනා දේශනය නොකළබව පැවසුහ. රජතුමා කාල ඇමතිගෙන් මෙලෙස සිතුවේදැයි විමසා සත්‍යය බව පැවසුවිට ඔබ අයත් දේ නොගෙන මගේ අඹුදරුවන් සමග මා සතු දේ දෙනවිට ඔබට කවර පීඩාවක්ද? ම විසින් දෙන ලද දෙය එලෙසමවේවා මගේ රටින් පිටවයන්නැයි. ඔහු රටින් පිටුවහල්කර ජුණ්හ ඇමති කැඳවා ඔබ මෙලෙස සිතීම සත්‍යක් දැයි විමසා සැබෑ බව පැවසුවිට තොප කෙරෙහි මම පැහැදුනෙමි. ඔබ මගේ සේවකයින් පරිවාර ජනයා සමග මම දෙන ලද ක්‍රමයෙන්ම සත් දිනක් දන්දෙන්න යයි සත්දිනකට රාජ්‍යය පවරාදී බුදුන්ට මෙසේ පැවසුවේය.

ස්වාමීනි බලන්න අඥානයින්ගේ ස්වභාවය මා වසින් මෙලෙස දෙන ලද දානයට පහර ගැසීය. එසේය මහරජ අනුවණයෝනම් අන් අයගේ දන්දීමට අසතුටුවී දුගති පරායන වෙති. උතුමෝනම් අන් අයගේ දානයද අනුමෝදන් වී ස්වර්ග පරායන වෙතියි පවසා මෙම ගාථාව දේශනා කළහ.

ලෝභී අය කිසි දින දෙව්ලොව නොයති අනුවණයෝ කිසිදා දානය ප්‍රශංසා නොකරති.

පරලොව සුවලබා
සැනසෙති නුවණ ඇත්තෝ
දන් නො දෙන ඉසුරෝ
දෙව් ලොව නොයති මසුරෝ

නුවණැත්තෝ දානය අනුමෝදන්වී අන්අයගේ පිනෙන් පරලොවදී සුවය ලබති. එහි **කදරියානි** - තද මසුරු අයයි. **බාලාති** මෙලොව පරලොව නොදන්නා අයයි. **ධීරොති** නුවණැති අයයි. **සුඛී පරත්ථාති** - දන් අනුමෝදන් වන පිණෙන් පරලොව දිව්‍ය සම්පත් අනුමෝදන්ව සුවයට පත්වෙති. දේශනය අවසන ඒ ජුණ්හ ඇමති සෝවාන් ඵලයට පත්විය. පැමිණි පිරිසද යහපතට පත්වුහ. ජුණ්හද සෝවාන් ඵලයට පත්ව සත්දිනක් රජකුමා දෙන ලද ආකාරයටම දන් දුන්නේය.

අසදිස දානය පිළිබඳවූ කථා පුවතයි.

13-11

"පඨවිඃ එක රජ්ජන" යන මෙම ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවත ජේතවනාරාමයේ වැඩසිටියදී අනේ පිඬු සිටුවරයාගේ පුත් කාල නම් සිටුපුතා නිමිති කරගෙන දෙසුහ.

මේ සිටුවර පුතා ඉතා ශ්‍රද්ධාවත් සිටුවරයාගේ පුතා වුවත් බුදුන්වෙත යාමටත් සිටු මැදුරට වැඩමකළ විට භික්ෂූන් දකිමට හෝ ධර්මය ඇසීමටත් සංඝයා වහන්සේට වතාවත් කිරීමටත් කැමති නොවීය. පියා විසින් දරුව මෙසේ නොකරන්නැයි පැවසුවද ඔහුගේ වචනය පිළිගත්තේ නැත. ඇහුම්කම් නොදෙයි. මේ නිසා පියා මෙසේ සිතුවේය. මෙබඳු දෘෂ්ටියක් ඇතිව හැසිරීමෙන් අවිචි පරායණ වන්නේය. මෙය මට සුදුසු නොවේ. මා බලා සිටියදී මගේ පුතු නිරයට යාම නොගැලපෙයි. මෙලොව ධනය දීමෙන් නොකළ හැකි දෙයක් හෝ කෙනෙක් නම් නැත. ධනය දීමෙන් වෙනස්කරමියි ඉක්බිති සිටුවරයා ඔහුට මෙසේ කීවේය. දරුව පෙහෙවස් සමාදන්වී විහාරයට ගොස් ධර්මය අසා එන්න ඔබට කහවනු සියයක් දෙන්නෙමි.

පියාණනි, ඔබ දෙන්නේද දෙන්නෙමි පුත- ඔහු තෙවරක්ම ප්‍රතිඥාගෙන පෙහෙවස් සමාදන් වීමට විහාරයට ගියේය. ඔහුට ධර්මය ඇසීමෙන් ප්‍රයෝජනයක් නැත. පහසු ඇති තැනක නිදාගෙන උදයේම නිවසට ගියේය. අනතුරුව පිය සිටුවරයා මගේ පුතා පෙහෙවස් සමාදන් වීයයි වහ වහා ඔහුට කෑද ආදිය දෙන්නැයි කියා දුනි. හේ කහවනු නොගෙන ආහාර නොගනිමියි ගෙන ආ සියළු දේ ප්‍රතික්ෂෙප කළේය. අනතුරුව පියාණන් පීඩාව අකමැති වන්නේ කහවනු පොදිය දුන්නේය. ඔහු එය අතින් ගෙනම ආහාර ගත්තේය. අනතුරුව දෙවැනි දිනයේදී සිටුතුමා පුත ඔබට කහවණු දහසක් දෙන්නෙමියි බුදුන් ඉදිරියේ සිට එක දහම් පදයක් ඉගෙන එන්නැයි යැවීය.

ඔහුද විහාරයට ගොස් බුදුන් ඉදිරියේ සිට එකම පදයක් ඉගෙන පලායාමටි සිතුවේය ඉක්බිති තථාගතයන් වහන්සේ සිහියේ නොරඳන ලෙසට කටයුතු

යෙදිය. ඔහු පළමුපදය නොසලකා දෙවැනි පදය ගන්නෙමියි. සිතා ඇසුවේය. ගනිමියි සලකා සිටීම සකසා මැනවින් ඇසීමක් නම් වෙයි. මෙලෙස අසන විට සෝවාන් ආදී මාර්ග ඵලයන් ලබා දෙයි. හෙතෙමේද උගනිමියි ඇහුම්කන් දෙයි. ශාස්තෘන් වහන්සේද, ඔහුට මතක නො සිටින සේම කරයි. හෙතෙම මතු පදයම උගනිමියි අසන්නේම, සෝවාන් පෙලෙහි පිහිටියේය. ප්‍රමුඛ සංඝයා සමගම සැවතට පිවිසියේය. මහ සිටුවරයා එය දැක අද මගේ පුතුගේ ස්වරූපය ප්‍රියවේ. යයි සිතුවේය. ඔහුටද මෙසේ සිතුනි. අහෝ මගේ පියා අද බුදුන් ඉදිරියේ කහවනු නොදේද? කහවනු නිසා මම පෙහෙවස් සමාදන් වූ ආකාරය පවසයිද එහෙත් බුදුපියාණන් වහන්සේ බෙහෙවින් කහවනු නිසාම ඔහු පෙහෙවස් සමාදන් වූ ආකාරය දැනගත්හ.

මහ සිටුවරයා බුද්ධප්‍රමුඛ සංඝයාට කැඳ පිළිගන්වා පුතුටද ප්‍රදානය කරවීය. ඔහු වාඩිවී නිහඬව කැඳ පානය කළේය. කෑ යුතු දෑ කා බත්ද අනුභවකළේය. මහසිටුවරයා බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට දන් පිරිනමා අවසානයේ පුතනුවන් ඉදිරියේ දහසක් බැඳි පියල්ල තබා දරුව මම ඔබට කහවනු දහසක් දෙන්නෙමියි කියා පෙහෙවස් සමාදන් කරවා විහාරයට යවන ලද්දේය. මේ ඒ පොරොන්දුවු දහස ගන්නැයි පැවසුවේය. පුතා බුදුන් ඉදිරියේ කහවනු දෙනවිට ලජ්ජාවුයේ මට කහවනු වලින් වැඩක් නැතැයි පවසා ගන්නැයි බලකරද්දීත් නොගත්තේය. අනතුරුව පියා බුදුන් වැද ස්වාමීනි අද මගේ පුතාගේ ස්වරූපය ප්‍රසන්න යැයි කියා මහ සිටුවරය හේතුව කුමක්දයි ප්‍රශ්න කළ විට ස්වාමීනි මොහු පළමුදින කහවනු සියයක් දෙමියි කියා විහාරයට යැවුවිට - පසුදින කහවනු අතට ගන්නා තුරු ආහාර නොගත්තේය. අද මම දෙන විටද නොගනී. එසේය සිවුවරය. අද ඔබේ පුතුට සක්විති සම්පත දෙව්ලොව බඹලොව සම්පත්තියටත් වඩා සෝවාන් ඵලයම ශ්‍රේෂ්ඨ යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

මහ පොළව අදිපති -අගරජ කමට වැඩියෙන්
දෙදෙව්ලොව අදිපති -සක් දෙව් කමට වැඩියෙන්
සෝවාන් ඵලයම - උතුම්මයැ සව් සත්නට

"මේ මහ පොළවේම අධිපති රාජායන් දිව්‍යලෝක ගමනටත් මුළු ලොවම අධිපති බවටත් වඩා සෝවාන් ඵලය වඩාත් වැදගත්වේ.

එහි **පථව්‍යා එකරජ්ජෙ** යනු - සක්විති රාජ්‍යයයි. **සඟසසඟමනෙන** සවර්ග ගමණ විසිහය ආකාර හෝ දිව්‍යලෝක ගමන අදහස් කරයි. **සබ්බලොකාධිපච්චෙන** සවර්ග - නාග - සුපර්ණ -වෙමානික ප්‍රේත ලොව සමග සියළු ලොව අධිපති බවට වඩා **සොතාපතති ඵලං වරං** - සෝවාන් ඵලය උසස් බව රජ තනතුරු ලැබුනද නිරය උපත නොවැලකෙයි. සෝවාන් වුවිට අටවැනි භවයක් ඇතිනොවේ මය ඒනිසා උතුම්මය.

දේශනය අවසන බොහෝදෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

අනේපිඬු සිටුගේ කාල නම් පුතනුවන්
පිළිබඳ කථා පුවතයි.

ලෝක වර්ග වර්ණනාව නිමි.
දහතුන් වැනි වර්ගය නිමාවිය

14-1

"යස්ස ජිතං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ බෝධි මණ්ඩපයේ වැඩසිටියදී මාර දූවරුන් ඇරබ පිහිටුවා පසුව කුරු රට මාගන්දිය බ්‍රාහ්මණයාට පැවසුහ.

කුරු රට මාගන්දිය බ්‍රාහ්මණයාට මාගන්දී නම් දුවක් සිටියාය ඕ අතිශය රූප සම්පන්නය. ඇය ප්‍රාර්ථනා කරමින් නොයෙක් ක්ෂත්‍රිය - බ්‍රාහ්මණ මහාසාල කුලවලින් ඔබේ දුවනිය අපට දෙන්නැයි පණිවිඩ යැවූහ. මාගන්දිය බ්‍රාහ්මණයා ඔබ අපේ දියණියට සුදුසුනොවේ යයි සියල්ලන් ප්‍රතික්ෂේප කළහ. ඉක්බිති එක්දිනක් තථාගතයන් වහන්සේ ලොවබලන්නේ තමන් වහන්සේගේ ඤාණ ජාලයට මාගන්දිය බ්‍රාහ්මණයා හා බ්‍රාහ්මණිය පිවිසුනි. ඒ දෙදෙන මාර්ග ඵලයන්ට පත්වීමේ හේතු සම්පත් දැක්කාහ. බ්‍රාහ්මණයා ද ගමෙන් පිටත නිරන්තර යෙන් ගිනිදෙවියා පුදයි. බුදුන්වහන්සේ උදයේම පාසිවුරු ගෙන එම ස්ථානයට වැඩමකළහ. බ්‍රාහ්මණයා බුදුන්ගේ රූපශ්‍රීය බලා මෙලොව මේ තරම් සමාන පුරුෂයෙක් නම් නැත. මොහු මගේ දුවනියට ඉතා සුදුසු කෙනෙකි. මොහුට මගේ දුවනිය දෙන්නේ මියි සිතා. බුදුරජාණන් වහන්සේට පැවසීය. ග්‍රාමණය මට එක් දියණියක් සිටී. ඇයට ගැලපෙන පුරුෂයෙක් නොදුටු නිසා ඇය කිසිවෙකුට නො දුන්නෙමි. නුඹනම් ඇයට සුදුසු වේ. මම ඔබට මගේ දුවණිය පාදපරිවාරිකා කොට දෙනු කැමැත්තෙමි. මම ඇයව කැඳවාගෙන එන තුරු මෙහිම සිටින්නැයි පැවසුවේය. බුදුහු ඔහුගේ කථාව අසා සතුටු නොවීය. ප්‍රතික්ෂේප ද නො කළේය.

බ්‍රාහ්මණයා ද ගෙටගොස් බ්‍රාහ්මණියට කථා කොට පිංවතිය අද මගේ දුවණියට සැබවින්ම සුදුසු පුද්ගලයෙක් දුටුවෙමි. මම ඇය ඔහුට දෙන්නෙමි. දුව අලංකාර ලෙස සරසවා බැමිණිය සමග එතැනට ගියේය. මහජනයා ද කුතුහලෙන් යුතුව නික්මුනි. බුදුරජාණන් වහන්සේ ද බමුණා කීව ස්ථානයේ නොසිට එහි පා සලකුණු තබා අනෙක් තැනෙක වැඩසිටියහ. බුදුවරුන්ගේ

පා සටහන - මෙය අසවල් තැනැත්තා දකිවායි අධිටන් කොට තැබුවිට තැබූ තැනම දක්නට ලැබෙයි. අනෙක් තැනක දකින්නේනම් නැත. බ්‍රාහ්මණයා සමග ගිය බැමිණිය ඒ පුරුෂ ය කොහිදැයි විමසුවාය. මෙතැන සිටින්නැයි මම ඔහුට කීවෙමි යි බමුණා පැවසීය. කියා බලන අතර පාද සටහන දක. මේ ඔහුගේ පාසටහන යැයි දැක්වීය. ඇය ලක්ෂණ පාඨපැවසීමේ දක්ෂ කෙනෙක් නිසා බ්‍රාහ්මණය මේ පා සලකුණ කාමභෝගී කෙනෙකුගේ නම් නොවන බව කියා සිටිවිට බමුණා හොඳයි වේවා, ඔබ ජලබිඳුවේ කිඹුලන් දකින තැනැත්තියකි. මම ඒ ශ්‍රමණයාටම දුවණිය දෙන්නෙමියි පැවසුවිට හොඳයි මමත් එය ඉවසන්නම් කී විට බ්‍රාහ්මණය එසේ කිවත්. මේ පා සටහන නම් නිකෙලෙස් පුද්ගලයෙකුගේ යයි කියා මේ ගාථාව පැවසුවාය.

"රාගී කෙනෙකුගේ පා උක්කුටිකයි. දෘෂ්ටිකෙනෙකුන්ගේ පාසටහන වේගයෙන් තබන ලද්දකි. මුළාවුවෙකුගේ පා සටහන කැඩී ඇත. මේ පාසටහන විවරනොවී මැනවින් පිහිටියේය.

ඉක්බිති බ්‍රාහ්මණයා - භවතිය - සෝභා නොකරන්න නිහඬව එන්නැයි කියා යන විට තථාගතයන් වහන්සේ දැක මේ ඒ පුරුෂයායි ඇයට පෙන්වා බුදුන් වෙත එළඹ ශ්‍රමණය මේ දුව ඔබට දෙන්නෙමි. පැවසුවේය. බුදුහු ඔබේ දුවගෙන් මට වැඩක් නැතැයි නොකියා බමුණ ඔබට එක් කරුණක් කියන්නෙමි. අසන්නැයි පවසා, කියන්න පින්වත අසන්නෙමියි පැවසුවිට අභිනිෂ්ක්‍රමණයේ සිට අතීත තොරතුරු පෙන්වාදුනි. මේ එම දෙසුමේ. සාරාංශයයි. බෝසතාණන් වහන්සේ රාජශ්‍රීය අත්හැර දමා කපුටක අසුපිට නැගී ඡන්න ඇමති සහාය කරගෙන මහබිනික්මන් කරන්නේ නගර දොරටුවේ සිටි මාරයා විසින් "සිද්ධත්ථ නවතින්න. මෙයින් සත්වැනි දවස ඔබට සක්විති රජුට ලැබෙන චක්‍ර රත්නය පහල වන්නේ යයි පැවසුවිට මාරය මම ඔබ හඳුනමි. මට ඉන් ප්‍රයෝජනයක් නැතැයි පැවසුවේය. එසේනම් කුමක් සඳහා නික්මෙන්නේදැයි විමසුවිට - සර්වඥතා ඥාණය සඳහායයි පැවසීය. එවිට මාරයා එසේනම් අද සිට කාමවිතර්ක ආදී එකම විතර්කයක්හෝ ඇතිකර ගන්නේනම් ඔබට කළයුතුදේ දිනිමි යි පැවසුවේය. මාරයා එතැන් සිට සත් අවුරුද්දක් වරදක් සොයමින් ලුහු බැන්දේය.

තථාගත බෝසතාණන් වහන්සේද? වසර හයක් දුෂ්කරක්‍රියාවේ හැසිරී වෙන් වූ පුරුෂයෙකු සේ බෝමැඩ දී සර්වඥතාඥානය අවබෝධ කර විමුක්ති සුවය විඳිමින් පස්වැනි සතියේ අජපල් නුගරුක් මුල වැඩසිටියහ. මාරයා ද මම මෙතෙක් කල් ලුහුබැඳ වරදක් සොයන්නේ මොහුගේ කිසිදු කිළුටක් නොදුටුවෙමි. දැන් මාගේ විශය අතික්‍රමණය කර ඇතැයි. දොම්නසට පත්ව මහමග වාඩිවිය. අනතුරුව ඔහුගේ - තන්හා - රති - රඟා - යන මේ දුවරුනිදෙන අපේ පියා දක්නට නැත. මේ වෙලාවේ කොහේ සිටීදැයි බලන්නේ ඔහු එසේ වාඩිවී සිටුනු දැක ලඟට පැමිණ පියාණනි කුමක් හෙයින් දුකිබිතව දොම්නසින් සිටීදැයි විමසුහ.

ඔහු ඈලාට මේ කරුණ දක්විය. ඉක්බිති දුවරු පියාණනි නොසිතන්න. අපි අපේ වසඟයට ගෙන එන්නෙමුයි පැවසුහ. දරුවනි. කළ නොහැකිය. කිසිවෙකුටත් එය කළ නොහැකිය. පියාණනි ! අපි ගැහැණුන් වෙමු. දැන් ඔහු රාග පාසයෙන් බැඳ ගෙන්වන්නෙමු යි කීහ. තෙපි නොසිතවු කියා බුදුන්වෙත එළඹ ස්වාමීනි අපි ඔබ පා පිරිවරමුයි පැවසුහ. බුදුරජාණෝ ඔවුන්ගේ වචන සිහිනොකළහ. ඇස් දල්වා නොබැලුහ. නැවත මාරදූවරු මිනිසුන්ගේ අදහස් උස් පහත් වශයෙන් පවතී. කිසියම් කුමරියකට ප්‍රේමයක් වේනම් කෙසේද? පළමුවයසේ (තරුණවියේ) කෙසේද? මධ්‍යම වයසේ සිටියදී කෙසේද? පසු වයසේ සිටියදී කෙසේදයි නොයෙක් ආකාරයෙන් බුදුන් පොළඹවමියි එක් එක් කුමරිය සියය සියය බැගින් ආත්මභාව මවා ගෙන මෙණෙවියන් ලෙස දරුවන් නොවැදූ ළඳුන්ලෙස එක් වරක් දරුවන් ලැබූ කතුන්ලෙසට දෙවරක් වැදුවන් ලෙසම මධ්‍යම වයසේ ළඳුන්ලෙස වැඩිවයසටපත් ළඳුන්ලෙස සියවතාවක් බුදුන්වෙත එළඹ ශ්‍රමණ ඔබ පා පිරිවරමුයි පැවසුහ. එයද බුදුන් සිහිනොකළහ. යම්සේ අනුත්තර උපධි සංඛ්‍යාත විමුක්තිය ලබාසිටි හෙයිනි. අනතුරුව බුදුහු මෙතරම් සුන්දර කතුන් කරා නොගිය මට මෙසේ වෑයම් කරමුද? මෙබඳු දේ රාගික අය ඉදිරියේ කිරීම වටී. බුදුවරුන් රාගාදිය ප්‍රහීණ කළ අයයි. කිනම් කරුණකින් තමවසඟයට ගෙනයන්නේදැයි පවසා මේ ගාථාව දෙසුහ.

කෙළෙසුන් නසා බුදු බව ලද කෙනෙකු විසින්
දසබිම්බරක් මරු පරදා සිටිනි නොසින්
මර දු වරුන් ආවත් කළඹවන රිසින්
ගෙන යා හැකිද මරු වෙත මට සිලුටු බසින්

අරමුණු පිළිබඳව
ආසා දුරින් දුරු කළ
බුදු හිමි කෙනෙකු ලොව
වසඟ වේවිද ඉතිරි රුවකට !

"යම් කෙනෙක් දිනන ලද කෙලෙස් නපුරු කොට දිනන ලද නම් නොවේද ඒ බුදුන් විසින් දිනන ලද ලොව කිසි කෙල්ශයක් අනුව නොයේද අනන්ත ගෝචර ඇති රාගාදි පද රහිත ඒ බුදුන් කවර පදයකින් ගෙනයවිද?

යම්කෙනෙක් කිසි භවයකට පමුණුවන්නට ජාලිනී නම් වූ ද වියත්තිකා නම්වූද තෘෂ්ණාව නොවේද ඒ බුදුන් කවර පදයකින් (රාගආදී) ගෙන යමුද?

"**එහි දී යස්ස ජිනං නාවජ්ජයති** " යනු යම් සම්බුදු වරයෙකු ඒ ඒ මාර්ගයෙන් දිනන ලද රාගාදි කෙලෙස් නැවත ඇතිනොවන සේ වේද එය නරක දිනීමක් නොවේ. **නොයාති** - දිනනලද ක්ලේශයන් නොයයි ලුහුබඳින්නේ නැත. **අනන්තගොචරං** - අනන්තා පරිමාන සර්වඥතාඥාණයට **පරිජින්න** නොවේ. **කෙනපදෙනා** - රාගයද ආදී එකදු පදයක් ඇත්නම් එයින් ගෙනයයි. බුදුන්ට එකපදයකුදු නැත. එබඳු පද රහිත බුදුන් කවර පදයකින් තෙපි ගෙනයවිද? දෙවැනි ගාථාවෙන් තෘෂ්ණාව මසන ලද දුලකට උපමාකරයි. රූපා දී අරමුණුවල වැටෙන හෙයින් විසතතිකා නම්. විෂබර විෂඵල - විෂමල් ආදියමෙන් පරිභෝග කළ නොහැකි නිසා විසතතිකා නම් **තණ්හායස්ස කුහිඤ්චි** එබඳු තෘෂ්ණාව කිසිභවයකට ගෙනයාමට නොහැකිද එබඳු බුදුන්තොපගේ වශයට ගෙනයා නොහැකිය.

ධර්මදේශනය කෙලවර බොහෝ දෙවියන්ට ධර්මාවබෝධය ඇතිවිය. මාරදුවරු අතුරුදහන් වූහ. බුදුහු මේ ධර්ම දේශනය දෙසමින් මාගන්දියාට

132

මම මේ මාර දුවරු දුටුවෙමි. සෙම් ආදී පිළිබෝධ නොවූ රන් කඳක් බඳුවූ ආත්මභාවයෙන් යුතු වූ ආත්මභාවයෙන් යුත් ඒ දුවරු දැක සේවනයට කැමැත්තක් ඇතිනොවීය. එහෙත් ඔබගේ දුව - දෙතිස් කුණප ඇති පිටතින් විසිතුරු කැළ අසුචි කළයක් වැන්න. ඉදින් මගේ පයේ අසුචි තැවරේ එහෙයින් දොරටුවේ පාපිස්නක් සේ සිටියද මගේ පයින් හෝ ස්පර්ශ නොකරමියි පවසා මේ ගාථාව පැවසුහ. මාර දුවරු කෙරෙහිත් රාගයක් ඇතිනොවුමට මේ කුණු සිරුර විසින් ස්පර්ශ කිරීමට ද කැමති නොවෙමි. දෙසුම කෙළවර අඹුසැමි දෙපල අනාගාමී ඵලයේ පිහිටියහ.

මාරදූවරුන් පිළිබඳ කථා පුවතයි.

14-2

"යෙඤ්ඤාන පසුතා ධීරා" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සංකස්ස නගර ද්වාරයේදී බොහෝ දෙවි මිනිසුන් නිමිති කරගෙන දේශනාකළහ. මෙම දේශනය රජගහ නුවරදී ඇතිවිය. එක් අවදියක රජගහනුවර සිටුවරයා පිරිසට ඇතිවන උවදුරු දුරුකරණු සඳහාත් ප්‍රමාදයෙන් ගැලවීයන ආභරණ ආදිය රැක ගැනීම සඳහාත් දැලක් බැඳ ගංගාවේ ජලක්‍රීඩාවේ යෙදුනි.

මේ අතර ගංගාවේ ආරම්භක ප්‍රදේශයේ ගං ඉවුරේ හටගෙන නිබු රත්සඳුන් ගසක මුල්සේදී ගඟට වැටී අතු කැඩී බිඳී ගල් වල ගැටී ජල රළ නිසා ඔපමට්ටම් වී පාත්‍රයක් මෙන් රවුමට සැදී ජලයේ පාවෙමින් දිය සෙවල බැඳී අවුත් ගඟ හරහා දමාතුබු ආරක්ෂක දැලේ රැඳුනි. සිටුවරයා මේ කුමක්දැයි කියා (දැව) ලීගැටයකැයි දැනගෙන එය ගෙන්වා ගෙන කුමක්දැයි තේරුම් ගැනීමට පිහිතුඩකින් සැස බැලීය එකෙනෙහි ලාකඩ පැහැයෙන් රත්සඳුන් බව හඳුනා ගත්තේය. මේ සිටුවරයා සම්‍යග්දෘෂ්ටිකද මිත්‍යාදෘෂ්ටික ද නොවේ. මධ්‍යම අදහස් ඇත්තෙකි. ඔහු මෙසේ සිතුවේය. මගේ නිවසේ රත් සඳුන් බහුලව ඇත. මෙයින් කුමක් කරමිද? ඔහුට මෙබඳු අදහසක් ඇතිවිය. මෙලොව අපි රහත් වෙමු. අපි රහතන් වෙමුයි. බොහෝ දෙන පවසති. මම එක රහත් නමක් හෝ නොදනිමි. ගෙට ගෙන ගොස් පාත්‍රයක් ලියවා පසුම්බියක දමා උණගස් බැඳ හැටරියනක් උස අහසේ එල්ලා ඉදින් රහත්වරු සිටිනම් මෙය අහසින් අවුත් ගන්නැයි කියමි.

යමෙක් එලෙස ලබාගන්නේනම් දූ දරුවන් සමග සරණකොට යන්නෙමි. ඔහු සිතුලෙසටම කළේය. ෂට් ශාස්තෘවරු මෙය අපට සුදුසුය. මෙය අපටම දෙන්නැයි කීහ. සිටුවරයා අහසින් පැමිණ ගන්නැයි පැවසුවේය. නිඝණ්ඨනාථ පුත්ත මෙය ගනු කැමතිව භයවැනිදින අතවැසියන් යැවීය. අහසින් ගමන් කිරීම අප්‍රමාදීන්ගේ කාර්යයකි - අපේ ආචාර්යන් වහන්සේට මෙය සුදුසුය එනිසා මේ පාත්‍රය දෙන්නැයි ඉල්වීය. එහි දී සිටුවරයා අහසින් පැමිණ ගන්නැයි පැවසීය. නාථ පුත්ත ගනු කැමතිව අන්තේ වාසිකයින්ට මෙසේ පැවසුහ. මම එක් අතක් හා පයක් ඔසවා අහසට නැගෙනු කැමැත්තෙක් ලෙසට අඟවන්නෙමි. නෙපි ආචාර්යන් වහන්ස කුමක්

කරවුද? දැව පාත්‍රයක් නිසා සඟවා සිටින අර්හත්වය මහජනයාට නොදක්වවූ කියමින් මගේ අත්පාවලින් අල්ලා ගෙන ඇද බිමදමන්නැයි පැවසීය ඔහු එහි ගොස් සිටුවරයාට මෙසේ කීවේය. මහසිටුවරය ! මෙම පාත්‍රය මට මිස අන් අයට සුදුසු නොවේ. මෙය ප්‍රමාද කිරීමට කරුණක් නොවේ. මට අහසට නැගීමට කැමැත්ත දෙන්න. සිටුවරයා ස්වාමීනි අහසට නැගීම ගන්නැයි පැවසුවේය. ඔහු එක් පාදයක් හා අතක් එසවීය අනතුරුව අතවැසියෝ ආචාර්යන් වහන්ස කුමක් කරමුද? නොවටිනා මේ ලී පාත්‍රය වෙනුවෙන් වසාගෙන සිටින ඔබේ ගුණ මහ ජනයාට ප්‍රදර්ශනය කිරීමෙන් කවර ප්‍රයෝජනයක්ද? යනුවෙන් පවසා අත්පාවලින් ඇද බිම දැමුහ. ඔහු සිටුවරයාට - මහ සිටුතුමනි ! මොවුන් මට අහසට නැගීමට නොදෙති. මට පාත්‍රය දෙන්නැයි කිවේය. ස්වාමීනි අහසට නැගී ගන්නැයි සිටුවරයා පැවසුවේය. මෙලෙස දින හයක්ම තීර්ථකයෝ උත්සාහ කොටත් පාත්‍රය නොලැබුන. හත්වන දිනයේ ආයුෂ්මත් මොග්ගල්ලාන ද ආයුෂ්මත් පිණ්ඩෝල භරද්වාජ තෙරුන් ද රජගහ නුවර පිඬු පිණිස පිටත් වෙමුයි ගොස් එක් ගල්තලාවක සිට සිවුරු පොරවන විට ධුර්තයන්ගේ කථාවක් පැතිරුනි. පින්වන්නි ! පෙර ශාස්තෘවරු සදෙනෙක් අපි රහතුන් වෙමුයි හැසිරුනහ. රජගහ සිටුවරයා පාත්‍රයක් ඔසවාතබා දිනහතක් ගතවීත් අහසින් පැමිණ එකද රහත් කෙනෙක් එය නොගත්තේය. අද රහතන් වහන්සේලා ලොව නොමැති බව දැන ගත්තෙමු" මෙම කථාව අසා ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ආයුෂ්මත් පිණ්ඩෝල භාරද්වාජ තෙරුන්ට කීහ.

ඇවැත්නි භාරද්වාජ ! මොවුන්ගේ කථාව ඇසුවේද? මොවුන් බුදුසසුනට නිග්‍රහ කරමින් මෙන් කථාකරති. ඔබද මහා ඍද්ධි මතෙකි. මහත් ආනුභාව ඇත්තෙකි. යව් අහසින් ගොස් එම පාත්‍රය ගන්න. ආයුෂ්මත් මුගලන් තෙරණුවනි. ඔබ වහන්සේ ඍද්ධිමතුන් අතර ශ්‍රේෂ්ඨයයි ප්‍රසිද්ධය. නුඹ එය නොගන්නේනම් මම ගන්නෙමි. ඇවැත්නි ගන්න. මෙසේ පැවසූවිට ආයුෂ්මත් පිණ්ඩෝල භාරද්වාජ අභිඤ්ඤා පාදක චතුර්ථ ධ්‍යාන යට සමවැදී නැගිට තුන් ගව් පමණ පැතලි ගලක් පාදාන්තයෙන් ගෙන කපුපුළුන් පිඩක්ලෙස අහසේ ඔසවා රජගහ නගරයමත අහසේ හත්වරක් හැසිරුනි. උන්වහන්සේ තුන්ගව් පමණවූ නගරයේ පියනක් මෙන් දක්නට ලැබුනි. නගර වාසීන් ගල්තලාව අපට මැඩගනියයි බියෙන් කුළු ආදිය හිස

තබා ඒ ඒ තැන්වල සැඟ වුනහුය. හත්වැනිවර තෙරුන් පැතලිගල පලා තමන් දැක්විය. මහජනයා තෙරුන්දැක ස්වාමීනි පිණ්ඩාලභාරද්වාජ ගල දැඩිකොට ගන්න අප සියලු දෙන නොනසන්නයි කීහ. තෙරුන් ගල්තලාව පා කෙළවරින් විසිකර දැමුවිට තිබුනැනම පිහිටියේය. තෙරුන්වහන්සේ, සිටුවරයාගේ ගේ මතුයේ වැඩසිටියහ. ඒ දැක සිටුවරයා දණ්ඩ නමස්කාරයෙන් වැඳවැටී ස්වාමීනි වඩින්නැයි ආරාධනා කොට අහසින් බට තෙරුන් වාඩි කරවා පාත්‍රය බිමට ගෙන චතුමධුර පුරවා තෙරුන්ට පිළිගැන්වීය. තෙරුන් පාත්‍රය ගෙන විහාරය දෙසට පිය නැගුහ. ආරණ්‍ය ගතවූත් ශූණ්‍යාගාර ගතව සිටියාවුත් අය මේ ප්‍රාතිහාර්යය නොදුටුවහ. ඔවුන් රැස්වී ස්වාමීනි අපට ද ප්‍රාතිහාර්යය දක්වන්නැයි තෙරුන් පසුපස ගියහ. තෙරුන් වහන්සේ ඒ ඒ අයට ප්‍රාතිහාර්යයන් දක්වා විහාරයට වැඩමකළහ. බුදුරජාණන් වහන්සේ පසුපසින් එන මේ ජනතාවගේ උසස් නාදය අසා ආනන්ද තෙරුන්ගෙන් මේ ශබ්දය කාගේ දැයි විමසුහ.

ස්වාමීනි, පිණ්ඩාල භාරද්වාජ තෙරුන් විසින් අහසට පැනනැගී සඳුන් පාත්‍රය ගන්නා ලදී. උන්වහන්සේගේ වටා සිටින පිරිස මෙලෙස උසස් හඬ ඇති කරති. බුදුරජාණන් වහන්සේ තෙරුන් කැඳවා මෙය සත්‍යයදැයි ඔබ විසින් පාත්‍රය ගත්තේදැයි විමසුහ. එසේය ස්වාමීනි පැවසුවිට ඇයි භාරද්වාජ එසේ කළේ තෙරුන්ට ගර්හාකොට එම පාත්‍රය කැබලිකර භික්ෂූන්ට අදුන් වශයෙන් ගැනීමට දී ශික්ෂාපදයක් පැනවුහ. තීර්ථකයෝ - ශ්‍රමණ ගෞතමයන් තෙරුන්ට ගර්හාකර පාත්‍රය බිඳදමා ප්‍රාතිහාර්යය නොදක්වන්නට ශික්ෂාපදයක් පැනවුහ. මෙම ශික්ෂාපදය ජීවිතය ගියත් නොකඩති. එනිසා ශ්‍රමණභවත් ගෞතමයන් ද එය රකිනු ඇත. දැන් අපට අවකාශ ලැබෙයයි නගර වීථි අදියෙහි ප්‍රචාරය කරමින් හැසිරුනහ. අපි තමන්ගේ ගුණය රකිමින් පෙර දාරුමය පාත්‍රය නිසා තමන්ගේ ගුණය මහජනයාට නො දැක්වුමු ශ්‍රමණ භවත් ගෞතමයෝද තමන්ගේ පාණ්ඩිත්‍යය නිසා ඒ පාත්‍රය බිඳදමා සිබපදයන් පැනවූහ. අපි ඔහු සමග ප්‍රාතිහාර්ය කරන්නෙමු.

බිම්බිසාර රජු මේ කථාව අසා බුදුන්වෙත ගොස් ස්වාමීනි ඔබ වහන්සේ ශ්‍රාවකයින්ට ප්‍රාතිහාර්ය නොකරණ ලෙසට සිබ පදයක් පැනවුවේද? මහරජ එසේය. දැන් තීර්ථකයෝ ඔබ වහන්සේ සමග ප්‍රාතිහාර්ය කරන්නෙයි

කියති. දැන් කුමක් කරන්නහුද? ඔවුන් කරන්නේනම් මම ද කරමි. මහරජ ! ඔබවහන්සේ ශික්ෂාපදයක් පනවා තිබෙනවා නේද? නෑ මහරජ මට ශික්ෂාපදයක් පනවා නැත. එය මගේ ශ්‍රාවකයින්ට පනවන ලද්දකි. ස්වාමීනි ! ඔබ වහන්සේ අත්හැර සිබ පදයක් පනවන ලද්දේද? එසේ නම් මහරජ ඔබෙන් පැනයක් පෙරළා අසමි. මහරජ ඔබේ උයනේ අඹ ආදී පළතුරු මහජනයා අනුභව කරන්නේනම් කුමක් කරන්නේද? දඬුවම් පමුණුවමි. එසේනම් ඔබට අඹ කන්නට ලැබේද? එසේය ස්වාමීනි මට දඬුවම් නැත. මට මාසතුදේ අනුභව කිරීමට ලැබේ. මහරජ යම්සේ ඔබ ගේ තුන්යොදුන් පමණවූ රාජ්‍යයේ ආඥාව පවතිද තමන්ගේ උයනේ අඹ ආදිය කෑවාට දඬුවම් නැත්ද? අන් අයට දඬුවම් ලැබේද? එලෙසම කෙළ ලක්ෂයක් සක්වල මගේ ආඥාව පවතී අන් අයට මෙන් ආඥාව ඇතිකළ මට ප්‍රඥප්තිය ඉක්මවායාමක් සිදුනොවේ. මම ප්‍රාතිහාර්ය දක්වන්නෙමි.

තීර්ථකයෝ මේ කථාව අසා දැන් අපි විනාශයට පත්වෙමු. ශ්‍රමණ ගෞතමයන් විසින් ශ්‍රාවකයින්ට පමණක් ශික්ෂාපද පනවා තිබේ. තමන්ට නොවේ. තමන්ම ප්‍රාතිහාර්ය කරණු කැමතිය. කුමක් කරමුදැයි මන්ත්‍රණය කළහ. රජු බුදුන්ගෙන් විමසූහ. ස්වාමිනි කවර දිනෙක ප්‍රාතිහාර්ය දක්වවුද? මෙයින් සිවුමසක් ගියතැන ඇසළ පුණු මාසයේදි, ස්වාමීනි, කොතැන්හිද? මහරජ සැවැත් නුවරදී කුමක් හෙයින් මෙපමණ දුරදී පවත්වත්ද සියලුම බුදුවරු මහා ප්‍රාතිහාර්යය දක්වන තැනයි. එමෙන්ම රැස්වන මහාජනයාට දුර සිටම දකිය හැකිය. තීර්ථකයෝ ඒ කථාව අසා මෙයින් සිවුමසකට පසුව ශ්‍රමණ භවත් ගෞතමයන් සැවැත්නුවර ප්‍රාතිහාර්ය කරන්නේයයි කියා දැන් ඔහු වෙන්නොකරම ලුහුබඳිමු එවිට මහජනයා අප දැක මේ කුමක්දැයි විමසති. එවිට අපි ශ්‍රමණ භවත් ගෞතමයන් සමග ප්‍රාතිහාර්යය දක්වන්නෙමුයි පවසමු. එවිට ඔහු පලායන්නේය. අපි ඔහුට පළායාමට නොදී ලුහුබඳින්නෙමුයි පවසමු.

බුදුරජාණන් වහන්සේ රජගහනුවර පිඬු පිණිස හැසිරී පිටත්වූහ. තීර්ථකයෝ ද පසුපසින් පැමිණ දන්වළඳන තැනට එති. වසන තැන දෙවනදා උදේ ආහාරය ගනිති. මහජනයා මේ කුමක්දැයි විමසනවිට මුලින් කීලෙසටම කියති. මහජනයා ද ප්‍රාතිහාර්ය දකිමුයි ලුහු බැන්දනුය.

බුදුරජාණන් වහන්සේ පිළිවෙළින් සැවැත් නුවරට වැඩම කළහ. තීර්ථකයෝද ඒ සමගම ගොස් උපස්ථායකයින් පහදවා ලක්ෂයක් උපයා කිහිරි කොටවලින් මණ්ඩපයක් කර නිල් උපුල් වලින් වසා මෙහි ප්‍රාතිහාර්ය දකවන්නෙමුයි වාඩිගත්හ. පසේ නදී කෝසල රජු බුදුන්වෙත එළඹ ස්වාමීනි තීර්ථකයන් විසින් මණ්ඩපයක් කරවන ලදී. මම ද තොපට මණ්ඩපයක් කරවමි. මහරජ වැඩක් නැත. මට මණ්ඩප කරන්නෙක් ඇත. ස්වාමීනි මම හැර වෙනත් කිසිවෙක් අන් කවරෙක් නම් මණ්ඩපයක් කරන්නට හැකිවන්නේද? මහරජ ඇයි සක් දෙව්රජ ස්වාමීනි කොහිදී ප්‍රාතිහාර්ය දක්වන්නේද? මහරජ ගණ්ඩඛ්ඛ රුක් මුලදීය. සර්වඥයන් වහන්සේ අඹගසක් යට ප්‍රාතිහාර්ය දක්වන්නේයයි අසා තීර්ථකයෝ තමන්ගේ දායකයින්ට දන්වා යොදුනක් ඇතුලත අන්තිම වශයෙන් එදා හටගත් අඹපැලද උදුරා දමා කැලයට විසීකළහ. බුදුරජාණන් වහන්සේ ඇසළ මාසයේ පුණුපොහෝදින ඇතුළු නගරයට පිවිසියහ. රජුගේ ගණ්ඩ නම්ඵයන් පල්ලා එක් තඹවන් පැහැයෙන් යුතු දිගී ගොටුවක ඇතුළත මහත් අඹගෙඩියක් දැක එහි සුවඳ රසලෝභයෙන් පැමිණි කපුටන් පළවා හැර රජුට පිරිනැමීම සඳහා ගෙනයමින් සිටියදී අතරමගදී බුදුන් දැක මෙසේ සිතුවේය. රජතුමා මේ අඹගෙඩිය අනුභවකර මට කහවනු අටක් හෝ සොළසක් දෙනුඇත. එය ඒකාන්තයෙන් ජීවිතය පවත්වා ගැනීමට ප්‍රමාණවත් නොවේ. ඉදින් මම බුදුරජාණන් වහන්සේට දෙන්නේනම් අවශ්‍යයෙන්ම එය අප්‍රමාණ කාලයක් හිත සුව පිණිස වන්නේ ය. ඔහු එය බුදුරජාණන් වහන්සේට පිරිනැමීය.

බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් දෙස බැලුහ. අනතුරුව සිව්වරම් දෙවි රජවරුන් පිරිනැමූ පාත්‍රය ගෙන අතේ තැබූහ. බුදුහු පාත්‍රය එළවා අඹ ගෙඩිය පිළිගෙන එහිම වාඩිවීමේ අදහසක් දක්වීය. ආනන්ද තෙරුන් සිවුර නවා ආසනයක් ලෙසට පැනවූහ. ඉක්බිති තෙරුන් පැන් පෙරා එම අඹගෙඩිය මිරිකා පානයක්කර පිරිනැමීය. බුදුරජාණන් වහන්සේ ගණ්ඩඛ්ඛට මෙසේ කීවේය. මේ අඹ ඇටය මෙහිම පස් ඈත් කොට සාරා රෝපණය කරන්න.ඔහු එසේ කළේය. බුදුහු එම තැනට අත සෝදා හළහ. එසේ සේදුවිටම නගුලිසක් පමණ උසට නැගී උසින් රියන් පනහක් උසට අඹ රුකක් ඇතිවුනි. සතර දිසාවන්ට එකිනෙකට උස් විශාල අතු පහක්

ඇතිවිය. එම අතු ද රියන් පනහක් දිගට පැතිරුනි. එම ගස මල් ගෙඩි වලින් යුක්තවී, එක් තැනක හොඳින් පැසුන අඹ පොකුරක් ඇතිවිය. පසුපස වඩින භික්ෂූන් අඹගෙඩි වළඳමින්ම වැඩම කළහ. රජතුමා මෙබඳු අඹ ගසක් ඇතිවියයි අසා එය කිසිවෙක් නොකපන්නැයි. ආරක්ෂාව යෙදීය. එම ගස ගණ්ඩ නම් උයන් පල්ලා විසින් රෝපිත නිසා ගණ්ඩබ්බ නමින් හැඳින්වුනි. ධූර්තයෝ ද අඹගෙඩි කා අරේ දුෂ්ට - තීර්ථකයන් ශ්‍රමණ ගෞතමයන් ගණ්ඩම්බ රුක්මුල ප්‍රාතිහාර්ය දක් වන්නේයයි තෙපි යොදුනක් දුර එදින හටගත් අඹ පැලද උගුලුවා දමන ලදී. ගණ්ඩබ්බ නම් මේයයි කියා ඔවුන් විසින් කනලද ගෙඩිවල ඇට වලින් දමා ගැසුහ. සක්දෙවිරජ සුළං දෙවිඳුන්ට (වාතවළාහක) අණකළේය. තීර්ථකයින්ගේ මණ්ඩපය සුළඟින් උඩට ඔසවා දමා කුණුවලකට හෙලන ලෙසට නියම කළේය. වායු දෙවියා එලෙස කළේය. සූර්ය දෙවියන්ට ද දැඩිලෙස රශ්මි විහිදුවන ලෙසට නියෝග කළේය. ඔහු ද එලෙස කළේය. නැවත වයුදෙවියන්ට දැඩි සුළඟක් ම වන්නැයි නියෝග කළේය. එසේ කරණ විට දාඩිය වැකුණ සිරුරු දුවිලිවලින් වැසී ගියේ ය. ඔවුහු තඹවන් පැහැ ඇත්තෝ වුහ. වැසිවළාහක දෙවියන් ද අණ ලැබ ඉතාමහත් වැහි බිඳු හෙළීය. අනතුරුව ඔවුන්ගේ ශරීර කබර ගොයින් මෙන් විය. ඒ නිවටුන් ලජ්ජාවට පත්ව ඉඩ ඇති තැන් තැන්වලින් පළා ගියහ. මෙසේ පළායන අතර පුර්ණ කාශ්‍යපගේ දායක ගොවියෙක් දැන් මගේ ආර්යන් ප්‍රාතිහාර්ය දක්වන වේලාව යයි ගොස් ප්‍රාතිහාර්ය බලමියි ගොණුන් මුදාහැර උදේම ගෙනෙන ලද කැද මුට්ටිය හා ලණුවද ගෙන එනවිට අතරමග පළායන පුර්ණ කස්සප දෑක ස්වාමීනි මම ආර්යන් වහන්සේලාගේ ප්‍රාතිහාර්යය බලන්නෙමියි ආවෙමි. තෙපි කොහි යමිද? ඔය මුට්ටියත් තඹයත් දෙවයි කියා අරගෙන ගංතෙරට ගොස් ඒ මුට්ටිය කඹයෙන් ගෙලේ බැඳගෙන ලජ්ජාවෙන් කිසිවක් නොකර දියට පැන දිය බුබුලු නංවමින් කලුරිය කොට අවීචියෙහි උපන්නේ ය. ශක්‍රයා අහසේ රුවන් සක්මනක් මැවීය. එහි එක් කෙළවරක් බටහිර සක්වල ක්ෂිතිජයේ කෙළවර විය. එක කෙළවරක් නැගෙනහිර කෙළවර ක්ෂිතිජයේ විය. තථාගතයන් වහන්සේ එක් රැස්වූ යොදුන් තිස් හයක් දුර වැඩෙන සෙවනැල්ලේ දැන් ප්‍රාතිහාර්ය දක්වීමට දැන් වේලාවයයි ගඳකිලියෙන් නික්මී ඉදිරියේ සිටිය හ. අනතුරුව ඍද්ධිමත් අනාගාමී ඵලයටපත් සරණී නම්වූ උපාසිකාව පැමිණ.

ස්වාමීනි ! මා බඳු දුවණියක් සිටිය දී ඔබ වහන්සේ වෙහෙසට පත්වීමෙන් ඵලයක් නැත. මම ප්‍රාතිහාර්ය දක්වන්නෙමි පැවසුවාය. සරණිය ඔබ කෙසේ කරන්නේද? ස්වාමීනි මම සක්වල ගැබ මහපොළව ජලය දක්වා දියකාවකු ලෙස කිමිදි නැගෙනහිර දිසාවේ මගේ ආත්මය (මා) දක්වන්නෙමි. එලෙසම බටහිර දිගන්තයේද එලෙසට උතුරු දකුණු දිසාවන්හිද එසේම මැද ද කිමිදෙමි. ඇය කවරෙක්දැයි විමසුවිට ඇය සරණියයි මෙබඳු ගැහැණියකගේ ආනුභාව මෙතෙක් නම් බුද්ධානු භාවය කෙතෙක්ද එවිට තීර්ථකයෝ ඔබවහන්සේ නොදකම පළායති. ඉක්බිති තථාගතයන් වහන්සේ සරණිය මෙබඳු ප්‍රාතිහාර්ය පෑමේ ඔබගේ දක්ෂතාවය මම දනිමි. මේ ප්‍රාතිහාර්ය පෑම ඔබ සඳහා ඔබට සම්බන්ධ නොවේයි පවසා ප්‍රතික්ෂෙප කළහ. ඇය බුදුනු මගේ ප්‍රාතිහාර්ය පෑම අනුමත නොකරයි. ඒකාන්තයෙන් මට වඩා වැඩි ප්‍රාතිහාර්ය පෑමේ දක්ෂයෙක් කෙනෙක් සිටිනු ඇතැයි සිතමින් එකත් පසෙක සිටියාය. බුදුරජාණන් වහන්සේ ද මෙලෙස මොවුන්ගේ ගුණය ප්‍රකට වන්නේයයි. මෙසේ සතිස් යොදුන් වූ පිරිස මැද සිංහනාද කරන්නේ යයි හඟිමින් නැවතද විචාළේය. තෙපි කෙසේ ප්‍රාතිහාර්ය පාන්නේද ඕ තොමෝ ස්වාමීනි මෙසේ කරන්නෙමියි පෙර කී පරිද්දෙන් ම කියා සිංහනාද කළාය. කියා ඔවුන් අතර චුල්ල අනාථ පිණ්ඩික ද මා හා සමාන අනාගාමී වූ උපාසක පුතෙක් සිටිය දී බුදුන්වහන්සේ කලාන්ත කිරීමක් නැතැයි සිතා ස්වාමීනි මම ප්‍රාතිහාර්යක් කරන්නෙමි යි කියනවිට කෙසේ කරන්නේ දැයි විමසුවිට ස්වාමිනි මම යොදුන් දොළසක් වූ බ්‍රහ්ම ආත්ම භාවයක් මවා මේ පිරිස මැද මහා මේඝ ගර්ජනා හා සමාන ශබ්දයෙන් බ්‍රහ්ම සමාන අත්පොලසන් නම් අත්පුඩි ගසන්නෙමි. මහජනයා මේ කිනම් ශබ්දයක්දැයි අසා චුල්ල අනාථ පිණ්ඩික බ්‍රහ්ම අත්පුඩි ශබ්දයයි කියති. තීර්ථකයෝ ගෘහ පතියාට මෙබඳු අනුභාවයයි තථාගතයන් වහන්සේගේ බුද්ධානුභාවය කෙබඳු වන්නේද? ඔබ වහන්සේ නොදකම පලායන්නේය. බුදුරජාණන් වහන්සේ ඔබගේ ආනුභාව දනිමි. ඔහුටද එසේම කියා ප්‍රාතිහාර්ය පෑමට අනුමත නොකළහ. ඉක්බිති එක් පටිසම්භිදා ලාභී වයසින් සත්වසක් වූ වීරසාමණේරිය බුදුන් වැඳ ස්වාමීනි මම ප්‍රාතිහාර්ය කරන්නෙමියි පැවසුවාය කෙසේ කරන්නේදැයි විමසුහ.

ස්වාමීනි, මහාමේරුව ද සක්වල පර්වතය ද හිමාලය ද ගෙනවුත් මෙතැන පිළිවෙළින් තබා මම හංසධේනුවක් මෙන් ඒ ඒ තැනින් නික්මී නොගැවී

යන්නෙමි. මහජනයා මේ කවුදැයි විමසා චිර සමණේරයයි දැනගත්තී තීර්ථකයෝ වයස හතක් වූ සාමණේරියක ගේ ආනුභාව මෙතෙක් නම් බුද්ධානු භාවය කෙබඳු වන්නේදැයි ඔබවහන්සේ නොදකම පලායති. මෙයින් පසුව රූප හා වචන කියන ලද පරිදි දතයුතුය. ඇයට ඔබේ ආනුභාව දනිමියි පවසා ප්‍රාතිහාර්ය දැක්වීමට අවසර නුදුන්හ.

අනතුරුව මහමුගලන් තෙරණුවෝ බුදුන් වැඳ ස්වාමීනි ප්‍රාතිහාර්ය කරන්නෙමි යි. පවසා කෙසේ කරන්නේදැයි විමසුවිට මහමේරු පර්වත රාජයා දත් අතර තබා මද ඇට ලෙසට කපා දමමි. වෙන කුමක් කරන්නේද? මේ මහපොළොව - කලාළයක් ලෙස වෙලා ඇඟිලි අතර තබමි. වෙන කුමක් කරන්නේද? මහපොළව කුඹල් සකක් සේ කරකවා පෙරළා පඨවි ඔජය (පැණි) මහජනයාට කවන්නෙමි. අන්කුමක් කරන්නේද? වමත පඨවිය තබා දකුණතින් මේ සත්ත්වයින් දකුණතින් ගෙන අනෙක් දිවයිනක තබන්නෙමි වෙනත් මොනවා කරන්නේද?

මහමේරුව කුඩ මිටක් සේ ගෙන මහපොළව ඔසවා ඒ මත තබා කුඩයක් අතින්ගත් භික්ෂුවක්ලෙසට එක අතකින් ගෙන අහසේ සක්මන් කරන්නෙමි. බුදුහු ඔබේ ආනුභාවය දනිමියි. පවසා උන් වහන්සේගේ ප්‍රාතිහාර්ය පෑමද අනුමත නොකළහ. අනතුරුව තථාගතයන් වහන්සේ මගේ කුශලතාව දන්නේයයි සිතා එකත් පසෙක වැඩසිටියහ. අනතුරු තථාගතයන් වහන්සේ මොග්ගල්ලාන මේ මල්ගොටුව ඔබට බැඳුනේ නොවේ. අනතුරුව සිව්පිළිසිඹියා පත් අර්හත් සත්හැවිරිදිව වූන්ද සාමණේරයන් බුදුන්වැඳ ස්වාමීනි මම ප්‍රාතීහාර්ය දක්වන්නෙමියි පැවසුහ. කෙසේ දැයි විමසුවිට ස්වාමීනි මම ජම්බු ද්වීපයට කොඩියක් වැනි වූ මහදඹ ගස සොල්වා මහ දඹගෙඩි ගෙනවුත් මේ පිරිසට කන්නට දෙන්නෙමි. පරසතු රුකේ මල් ගෙනවිත් ඔබවහන්සේට පුදමි.

බුදුහු දනිමි ඔබේ ආනුභාව යයි පවසා ඒ ප්‍රාතිහාර්යය ද ප්‍රතික්ෂෙප කළෝය. අනතුරුව උප්පලවණ්ණ තෙරණිය ප්‍රාතිහාර්ය දක්වන්ට විමසා කරණ පිළිවෙත විමසුවිට යොදුන් තිස්හයක් දුර විහිදී ජනතාව පිරිවරා සක්විති රජවී පැමිණ ඔබවහන්සේගේ පා වඳිමි.

මම වනාහි අසම ධුරය. මගේ ධුරය දැරීමට සමත් වෙනස් කිසිවෙක් නැත. මගේ ධුරය දැරීමට සමත් කෙනෙක් ඇතිවන්නේනම් එය ආශ්චර්යයකි. අහේතුක තිරවඡාන යෝනියක උපන් කාලයේද මගේ ධුරය ඉසිලීමට සමත් කිසිවෙක් නොවීයයි පවසා කවර දිනෙක කවර දාදැයි විමසුවිට අතීත පුවත තථාගතයන් වහන්සේ පෙන්වා දුන්හ.

"යම් යම් සේ වඩා බර ගැඹුරුවේද? එවිට කණ්හ යොදන්නැයි ඔහු ධුරය උසුලනු ඇත"

මේ කණ්හ වෘෂභ ජාතකය විස්තර කර නැවත එහි අර්ථය විශේෂ කොට දක්වමින්

"වහාම වචනයම කියන්නේය. අමනාප වදනක් කිසිදා නැත. මනාපවූ ප්‍රියවචන කියන විට වඩාත් බර ඉසිලීමි. සතුටු සිතින් ධනය ද ලබාදුන්නේ වෙයි.

මේ නැදිවිශාල ජාතකය විස්තරකර පැවසුහ. මෙසේ ද පවසා තථාගතයන් වහන්සේ රුවන් සක්මනට බැසගත්හ. ඉදිරියෙන් දොළොස් යොදුනක් පිරිස විය. එසේම පසුපසින් ද උතුරු දෙසින් ද දකුණු දෙසින් ද පිරිස එතරම් සිටියහ. සෘජුලෙස - ඉදිරියෙන් යොදුන් විසිහතරක් ඒ පිරිස මැද භාග්‍යවතුන් වහන්සේ යමක පටිහාරිය කළහ. එය පාලි භාෂාවෙන් මෙසේ දතයුතුයි.

ඒ තථාගතයන් වහන්සේගේ යමක ප්‍රාතිහාර්ය ඥාණය කෙසේද? ශ්‍රාවකයන්ට අසාධාරණවූවුවුම ප්‍රාතිහාර්ය කෙසේ ද යනු සිරුරේ උඩකොටසින් ගිනි කඳක් පවත්වයි. සිරුරේ යට කොටසින් දියකඳක් නිකුත්කරයි. සිරුරේ උඩකොටසින් ගිනිකඳක් ද යට කොටසින් ජල කඳක් ද නිකුත්කරයි.

ශරීරයේ ඉදිරි කොටසින් ද පසුපසින්ද දකුණු ඇසින් ද වම් ඇසින්ද - දකුණු කණින්ද - වම් කණින් ද - දකුණු නැහැයෙන් ද - වම් නැහැයෙන් ද දකුණු අංශ යෙන් ද - වම් අංශයෙන් ද දකුණු අතින් ද - වම් අතින් ද - දකුණු පසින්

ද වම්පසින් ද දකුණු පාදයෙන් ද වම් පාදයෙන් ද ඇඟිලිවලින් ද - ඇඟිලි අතරින් ද - එක් එක් රෝමකූපයකින් - ගිනිකඳක් ද ජලකඳක්ද මුළු සිරුරෙහි - නීල -පීත - ලෝහිත - ඔදාත මාංඤ්ජෂයි ප්‍රභාස්වර රශ්මිධාරා විහිදුවමින් සක්මන්කළහ. නිර්මිත බුද්ධ රූපය. සිටී ද - වාඩිවී ද - සයනය කරයි ද බුදුන් කරණ ලෙසින්ම එම බුදුරුව අනුගමනය කරයි. මෙය බුදුන්ගේ යමක ප්‍රාතිහාර්ය ඤාණයයි. බුදුහු මෙම ප්‍රාතිහාර්යය එදා ගණ්ඩඛ වනයේදී සිදුකළහ. උන්වහන්සේගේ තේජෝ කසින සමාපත්ති වශයෙන් උඩුකයින් ගිනි කඳක් ද - ආපොකසින සමාපත්තියෙන් යටිකයින් දියකඳක් ද පවත්වති. දියදහරා පිටවන තැනින් ගිනිජාල නික්මෙන්නේ නොවේ. සියළු ප්‍රදේශයන්හි ජල - ගිනි - ධාරා මිශ්‍රම නොපවතී.

මෙම ජල - ගිනි ජාලා බ්‍රහ්මලෝකය දක්වාම ගමන්කර චක්‍රවාට මුවවිට පැවතුනි. ෂඩ්වර්ණය කළයකින් වත්කරණ දියකළ රන් දියරයක් වැනිවිය. යන්තු නාලයකින් නික්මෙන රන්රස ධාරාවක් මෙන් එක් සක්වල ගැබකින් නික්ම උඩට ගොස් බඹලොව හැපී නැවතුනි. නැවත චක්‍රවාට ගැබින් උඩට ගොස් මුවවැටියේම ගැසුනි. එක් සක්වල ගැබක් එක් වහළ මුදුනක් සේ බෝධි ඝරයක් විය. එකම ආලෝකයක් විය. එදවස බුදුහු සක්මන් කරමින් ප්‍රාතිහාර්ය පාන්නේ. අතරතුර මහජනයාට ධර්මකථා පැවසුහ. මෙලෙස දේශනා කරමින් ද ජනයාට ආශ්වාශයට ඉඩදී එකෙනෙහි මහජනයා සාධුකාර පැවැත්විය. ඒ සාධුකාර දෙන අවස්ථාවේ දි තථාගතයන් වහන්සේ මහා ජන පිරිසේ සිත් විමසා බලන්නේ එකිනෙකාගේ සිත සොළොස් ආකාරයෙන් සිත් හසර දැනගත්හ. මෙලෙස ඉතා ඉක්මනින් බුදුන්ගේ පෙරෙළෙන සිත යම් යම් කෙනෙක් යම් ධර්මයක් යම් ප්‍රාතිහාර්යක් ප්‍රියකරයි ද ඔවු නොවුන්ගේ අවශ්‍යතා වශයෙන් ධර්මය දේශනා කිරීම ද ප්‍රාතිහාර්ය දැක්වීම ද කළහ. මෙලෙස ධර්ම දේශනා කිරීමෙන් ද ප්‍රාතිහාර්ය කිරීමෙන් ද මහත් ධර්මාවබෝධයක් සිදුවිය.

තථාගතයන් වහන්සේ මේ රැස්වීමේදී තමන්ගේ සිත්ගෙන අනෙක් ප්‍රශ්නයක් විමසීමට පටන් කෙනෙක් නොදැක බුද්ධ කායක් නිර්මානය කළහ. එම නිර්මිත බුදුන්ගෙන් විමසූ ප්‍රශ්නවලට තථාගතයන් වහන්සේ පිළිතුරු දුන්හ. බුදුන් සක්මන් කරණ අතර බුදුරජාණන් වහන්සේ ඉඩ සලසා නිර්මිත

බුදුරුවට ද සක්මන් කරයි. මේ ලෙස කරණවිට බුදුන්ගේ ධර්මය අසා ප්‍රාතිහාර්ය ද දක ප්‍රාණකෝටියකට ධර්මාභිසමය වීය. බුදුරජාණන් වහන්සේ ප්‍රාතිහාර්ය දක්වමින්ම අතීත බුදුවරු කවර තැනක වස් සමාදන්වීදැයි ආවර්ජනා කරන්නේ තාවතිංස භවනයේදී වස් සමාදන් වූ බව සිහිපත් කොට තාවතිංස භවනයේදී වස් සමාදන් වී මවු දෙවියන්ට අභිධර්මපිටකය දේශනා කළ බව දක දකුණු පාදය ඔසවා යුගාන්ධර පර්වතය තබා අනෙක් පාදය ඔසවා මහමෙර මත තැබුහ. මෙලෙස - යොදුන් සැටඅට ලක්‍ෂයක් දුර ත්‍රිපද වික්‍රමයෙන් කළහ. පියවර දෙක අතර බුදුහු පා දිගහැර පයතැබියයි නොසැලකිය යුතුය. උන්වහන්සේ පාතබන විට පර්වතය පාමුලට පැමිණ එය පිළිගත්තේ ය. මෙලෙසට යොදුන් හැට අට ලක්‍ෂයක් දුර පාද තුනකින් (ත්‍රිපද වික්‍රමයෙන්) ඉටුකළහ. සක්දෙව්දු බුදුන් දක මෙලෙස සිතුහ. පාණ්ඩුකම්බල සිලාසනයේ බුදුහු මේ වස්කාලය වැඩසිටින සේක. බොහෝ දෙවියන්ට උපකාර වන්නේ ය. බුදුරජාණන් වහන්සේ වස් සමාදන් වන විට අනෙක් දෙවියන්ට අත තැබීමට පවා නොහැකිවන්නේ ය මේ පඬුපුල් අස්න දිගින් යොදුන් හැටකි. පළලින් යොදුන් පනහකි. ගනකමින් යොදුන් පනහකි. බුදුන් වාඩිවූ විට හිස්වූයේ වන්නේ ය. බුදුහු සක් දෙවිදුගේ මේ අදහස දැනගෙන තමන්වහන්සේගේ සඟල සිවුර ගල්තලාව වසමින් හෙලුවෝය. ශක්‍රදේවේන්ද්‍ර මෙසේ සිතුවේ ය. සිවුර අස්න වසමින් හෙළුවේ ය. උන්වහන්සේ ඉතා සුළු තැනක වාඩිගනු ඇත. බුදුහු ඔහුගේ ඒ අදහස දැන කුඩාපුවත මහා පාංශකූලය දැමුයේ - පඬුපුල් අස්න වසාසිටින සේ අතුරා සිවුර මතම වැඩසිටිය හ. මහජනයා මේ අතර බුදුන් නොදක හඳ අවරට ගියාසේ හිරු බැසගියාසේ අඳුරු සහිත විය. ලෝකයේ ශ්‍රේෂ්ඨවූ ජෙෂ්ඨවූ තථාගතයන් වහන්සේ චිත්‍රකූට පර්වතයට කෙලාස කූටයට හෝ යුගන්ධර පර්වතයට වැඩම කලෝ ද දක්නට නැතැයි පවසමින්.

ගතෝ නු චිත්‍ත කූටං වා - කෙලාසිං වා යුගන්ධරං
න නෝ දංඝවෙ සම්බුද්ධං - ලොක ජෙට්ඨං නරා සභං

මෙම ගාථාව කියමින් හැඬුහ. අනෙක් අය බුදුරජාණන් වහන්සේ විවේකයට කැමතිය. උන්වහන්සේ මෙබඳු පිරිසක් අතර මෙබඳු ප්‍රාතිහාර්ය කරණ ලද්දේ යයි ලජ්ජාවෙන් අනෙක් රටකට ජනපදයකට හෝ යන්නට ඇත ඉඟින් අපට දක්නට නොලැබේ යයි හඬම්ව් මේ ගාථාව පවසමින්

පවිවෙක රතෝ ධීරෝ - නයිමං ලෝකං පුනෙහිති
න නෝ දක්ඛෙම සම්බුද්ධං - ලෝක ජෙටයං නරා සභං

විවේකයෙහි යෙදෙන තථාගතයන් වහන්සේ නැවත ලොවට නොඑන්නේ ය. ලෝක ජ්‍යෙෂ්ඨ උතුම් සම්බුදුන් වහන්සේ නැවත නොදකින්නෙමු. ඔවුහු මහ මුඟලන් තෙරුන්ගෙන් විමසුහ. ස්වාමීනි බුදුරජාණන් වහන්සේ කොහිද? උන්වහන්සේ තමන් වහන්සේ දැනගෙන සිටිය ද අන් අයගේ ද ගුණ ප්‍රකට වේවායි සිතමින් අනුරුද්ධ තෙරුන්ගෙන් විමසන ලෙසට පැවසුහ. ඔවුහු තථාගතයන් වහන්සේ කොහිදැයි අනුරුද්ධ තෙරුන්ගෙන් විමසුහ. උන්වහන්සේ තාවතිංස භවනේ පණ්ඩුකම්බල ශෛලාසනයේ වස් සමාදන්වී මාතෘ දිව්‍යරාජයාට අභිධර්ම පිටකය දේශනා කිරීමට ගියබව අනුරුද්ධ හිමියෝ දැනුම් දුන්හ. අනතුරුව ස්වාමීනි උන්වහන්සේ කවරදිනක ආපසු වඩින්නේදැයි විමසුහ. තුන් මසක් අභිධර්මය දේශනා කර මහාපවාරණය කරණ දින ආපසු වඩිනබව පැවසුහ. ඔවුහු බුදුන් නොදක නොයන්නෙමු යි එහිම කඳවුරු බැඳගත්හ. ඔවුන්ට වහලය වුයේ අහසයි. එතරම් මහත් පිරිසකට සිරුර පීඩාවක් නොවිය. පොළොතලය විවරවිය. හැමතැනම පොළව පිරිසිදු විය. තථාගතයන් වහන්සේ පළමුව මේ මහා ජනකායට ධර්මදේශනා කරන්නැයි පැවසුහ. මූල අනාථපිණ්ඩික ද ආහාර දෙනු ඇත. මේ නිසා ඒ තෙමස තුළ චුල අනාථපිණ්ඩික සිටුවරයා ද මෙතරම් පිරිසට යැපිම සඳහා කැඳ බත් කළයුතුද බුලත් සුවඳ ද මල් ආභරණ ආදිය පිරිණැමුහ. මහමුගලන් තෙරුන්වහන්සේ පිරිසට ධර්මය දේශනා කළහ. ප්‍රාතිහාර්ය නැරඹීමට පැමිණි අය විසින් විමසු ප්‍රශ්න වලට පිළිතුරු ද දුන්හ. බුදුරදුන් ද පඬුපුල් අස්නේ වස් සමාදන් වුයේ දසදහසක් සක්වල දෙවියෝ පිරිවරාගත්හ.

"යම් දිනෙක තථාගතයන් වහන්සේ පණ්ඩුකම්බල ශෛලාසනයේ පරසතු රුක් මුල වැඩ සිටියදී දසදහසක් සක්වල දෙවිවරු එක්වී බුදුරදුන් සේවනය කළහ.

කවර දෙවියෙක් හෝ පැහැයෙන් බුදුන් තරම් බැබලුනේ නැත. සියළු දෙවියන් අභිභවා බුදුරජාණන් වහන්සේ බැබලුනහ.

මෙලෙස සියළු දෙවියන්ගේ ශරීර ප්‍රභාව යටකොට බුදුන් වැඩ සිටිනවිට මාතෘ දෙවියා තුසිත භවනයෙන් පැමිණ දකුණු පස වාඩිවිය. ඉන්ද්‍ර දෙවියා ද පැමිණ දකුණු පැත්තේම වාඩිවිය. අංකුරදෙවි වම් පස වාඩිවිය. ඔහු මහේ ශාක්‍ය දෙවියන් රැස් වන විට වෙන්වී ගොස් යොදුන් දොළසක් ඇති ස්ථානයක ඉඩ ලබාගත්තේ ය. ඉන්ද්‍ර දෙවියා ද එහිම වාඩිවිය. බුදුරජාණන් වහන්සේ මේ දෙදෙනාම දැක තම ශාසනයේ දන්දුන් පුද්ගලයන්ට දුන් දානයේ මහත් ඵල භාවය දැනුවත් කරණු කැමතිව මෙසේ පැවසුහ.

අඬකුර හා ඉන්ද්‍ර දෙවියන් බලා දක්ෂිණාව අගය කරමින් මේ වදන පැවසුහ.

අඬකුර ඔබ දිගුකලක් මහදන් දෙනලද්දේ ය මා සමීපයට පැමිණ ඉතා දුර සිටින්නේ ය. මේ ශබ්දය පොළොතලයට පැමිණියේ ය. ඒ සියළු පිරිස ඇසුවේ ය.

චෝදනාලත් අඬකුර දෙවියා මෙසේ පැවසීය ඒ මගේ දානයෙන් කවර ප්‍රයෝජනයක්ද මේ ඉන්ද්‍ර දෙවියා සුළු දානයක් දුන්නේය. එහෙත් අපට වඩා සඳතරු සේ වඩාත් බබලන්නේ ය.

එහි **දක්ඛා** - යනු දුන්නේ ය යන අරුතයි. මෙසේ පැවසුවිට බුදුහු ඉන්ද්‍ර දෙවියාට පැවසුවේ ය. ඉන්ද්‍රය ඔබ මගේ දකුණු පස වාඩිවුයේ කුමක්හෙයින් ඉවත්ව නොගොස් වාඩිවී සිටිද? ස්වාමිනි මම යහපත් කෙතක ඉතා සුළු බීජ කොටසක් වැපුරූ ගොවියෙක් වැන්න. දක්ෂිණෙය්‍ය සම්පත් ලැබුවෙමි. දක්ෂිණාර්හයන් පැහැදිලිකරමින් පැවසීය.

සරුසාර නොවූ කුඹුරක බොහෝකොට බීජ වැපුරුවේද විපුල අස්වැන්න නොලැබේ ගොවියා ද සතුටු නොවේ. එලෙසම දුසිල්වත් අයට පිරිනමන ලද දානය විපුලඵල නොවේ. දායකයා ද සතුටු නොවේ.

යම්සේ යහපත් කුඹුරක් අල්පවූ බීජ රෝපණය කරයි ද මැනවින් අස්වනු ලැබේ. ගොවියා ද සතුටට පත්වේ. සිල්වත් ගුණවත් උතුමන්ට සුළු හෝ කළ උපකාරය මහත්ඵල පූණ්‍යයක් විය.

මොහු විසින් කරණ ලද. පූර්ව කර්මය කුමක් ද ඇතුළගම පිඬුපිණිස වැඩමකළ අනුරුද්ධ තෙරුන්ට තමාසතු හැන්දක් පමණ භික්ෂාවක් දන්දුනි. ඔහුගේ මේ කුඩා පිනෙන් දසදහසක් වර්ෂ යොදුන් දොළසක් උඩම නැග දෙන ලද දානයෙන් මහත්ඵල කරවිය. එනිසා මෙසේ පැවසුහ. අනතුරුව අඩකුර දානය නම් සකසා දියයුතුය. මෙසේ මනා කෙතෙ වපුරණලද බීජය මෙන් මහත්ඵල වෙයි, ඔබ එලෙස නොකෙළේ ය. එනිසා ඔබේ දානය මහත්ඵල නොවිය, මේ කරුණ පැහැදිලිකරමින්

විමසා බලා දානය දියයුතුය. යමෙකුට දීමෙන් මහත් ඵල වේදැයි විමසා දියයුතුය.

"තථාගතයන් වහන්සේ විමසා දෙන දානය ප්‍රශංසා කළහ. මේ ජීව ලෝකයේ දක්ෂිණාර්හයන් වෙත දෙන දානය මහත්ඵල වන්නේ යහපත් කෙතක වපුල බීජයක් මෙනි,

මෙසේ පවසා තවදුරටත් ධර්මය දේශනා කරමින් තෘණ දෝෂයෙන් යුත් කෙතුසේ මේ ප්‍රජාව රාගදෝෂයන්ගෙන් යුක්තය එනිසා වීතරාගීන්ට දෙන දානය මහත්ඵල වේ. තෘණදෝෂ කෙතසේ මේ ප්‍රජාව දොෂයෙන් යුතුවේ. එනිසා වීතදෝෂීවු උතුමන්ට දෙනදානය මහත්ඵලවේ. තෘණදෝෂ වූ කෙතසේ මෝහයෙන් යුතු ප්‍රජාව අතර මෝහයෙන් තොරවූ උතුමන්ට දෙන දානය මහත්ඵලවේ. තෘණ දෝෂ කෙතසේ මේ ප්‍රජාව ඉවජාදෝෂයෙන් යුතුවේ. එනිසා ඉවජා වන්ගෙන් තොරවූ රහතුන්ට දෙනලද දානය මහත්ඵල වේ.

මේ දෙසුම අවසානයේදි අඩකුර ද ඉඳ ද සෝවාන් ඵලයේ පිහිටියහ.

ඉක්බිති බුදුහු දේව සමාගමයේදී මාතෘදෙවියන් නිමිතිකරගෙන - කුසලා ධම්මා - අකුසලා ධම්මා අව්‍යාකථා ධම්මා - යනුවෙන් අභිධර්ම පිටකය පැනැවුහ. මේ අයුරින් තෙමසක් නොකඩවා අභිධර්ම පිටකය දේශනා කළහ. දේශනය පවත්වන අතර පිඬුසිඟා යන අවස්ථාවේදී - මම එනතුරු මේ ධර්ම කොටස දේශනා කරන්නැයි නිර්මිත බුදුරුවට පවසා හිමවතට වැඩමකර නාගලතා දූහැටි වළදා අනෝතත්ත විලෙන් ඔහුණ සෝදා උතුරු

කුරු ප්‍රදේශයේ පිණ්ඩපාතය රැගෙන මහාසල් මාලකයේ සිට වැළඳීම කළහ. සැරියුත් තෙරණුවන් එහි ගොස් බුදුන්ට උවටැන් කළහ. බුදුහු බත් කිස අවසානයේ සැරියුත් තෙරුන් අමතා සාරිපුත්ත අද මම මෙපමණ ධර්මයක් දේශනාකළෙමි. මෙය ඔබගේ පන්සියයක් පිරිවර භික්ෂූන්ට උගන්වන්නැයි පැවසුහ. යමක ප්‍රාතිහාර්යයේ පැහැදී කුලපුතුන් පන්සියයක් තෙරුන්වෙත පැවිදි වූහ. ඔවුන් පෙනුවෙන් බුදුහු මෙසේ පවසා දෙව්ලොවට වැඩමකර නිර්මිත බුදුන් විසින් දේශනාකළ ස්ථානයේ සිට තමන් වහන්සේ ධර්මය දෙසුහ. සැරියුත් තෙරුන්ද ගොස් භික්ෂූන්ට ධර්මය දේශනා කරති.

තථාගතයන් වහනසේ දෙව්ලොව වැඩසිටියදී ම සප්ත ප්‍රකරණ උගත්හු වූහ. ඔවුහු කාශ්‍යප බුද්ධ කාලයේදී කුඩා කිරිවවුලන්වී එක් පර්වත බෑවුමක පර්වත පාදයක එල්බී සිට තෙරවරුන්දෙනමක් සක්මන් කරමින් අභිධර්මය සජ්ඣායනා කරණ ස්වරයේ නිමිති ගෙන ඇසුහ. ඔවුහු මේ ස්කන්ධය යි මේ ධාතුයි යනුවෙන් නොදැන හඬ ඇසීමෙන් පමණක්ම ඉන් චුතවූ දෙව්ලෝ ඉපිද එක් බුද්ධාන්තරයක් දිව සැපවිඳ සැවැත්නුවර කුලගෙවල ජනිත වී යමක ප්‍රාතිහාර්යයෙන් පැහැදි පැවිදිවූහ. පැවිදිවී සියල්ලන්ට පළමුව අභිධර්මය උගෙන සප්ත ප්‍රකරණීකයෝ වූහ. බුදුන් ද මේ අයුරින්ම තුන්මසක් අභිධර්මය දේශනාකළහ. දෙසුම කෙළවර අසුකෝටි දහසක් දෙවියන්ට ධර්ම අවබෝධය විය. මහාමායා දෙවිතුමා ද සෝවාන් ඵලයෙහි පිහිටියහ. ඇය ද යොදුන් තිස් හයක් පරිමණ්ඩල පිරිස් ඇතිව සත්වෙනි දින පවාරණය වන්නේයයි මහමුගලන් තෙරුන්වෙත පැමිණ පැවසුවාය. ස්වාමීනි තථාගතයන් වහන්සේ දිව්‍ය ලෝකයෙන් වඩින දිනය සැලකිරීම වටින්නේය. මහමුගලන් තෙරණුවෝ මෙම කථාව ඇවැත්නි ! යහපතැයි කියා එහිම පොළවේ කිමිද මහමේරුවට නගින මා මහජනයා දකීවායි අදිටන් කොට මැණිකක් අමුනන නූලක්ලෙස පෙනෙන රූපය ඇතිව මහමෙර මුදුනට නැග්ගෝය. මිනිස්සු ද එක යොදුනක් දෙකක් නැග්ගේයයි කියමින් බලාසිටියහ. තෙරුන් වහන්සේ ද බුදුන්ගේ පා පිට හිස තබා වැන්දාහුය. වැඳ ස්වාමීනි ඔබ වහන්සේ දැක මිස නොයමියි රැස්ව සිටින පිරිස කවදා පොළවට බසින්නේ දැයි බලා සිටිති.

---

1. සප්ත ප්‍රකරනිකයෝ නමින් හඳුන්වා ඇත්තේ අභිධර්ම පිටකයට අයත් ප්‍රකරණ සත (ග්‍රන්ථ) උගත් පිරිසයි.

තථාගතයන් වහන්සේ ඔබගේ ජ්‍යෙෂ්ඨ සහෝදර සැරියුත් තෙර කොහේදැයි විමසුවිට පිළිතුරු දෙමින් ස්වාමීනි සංකස්ස පුර දොරටුවේ වස් සමාදන් වුහ. මොග්ගල්ලාන මම මෙයින් සත් වැනි දිනයේදී මහා පවාරණය සඳහා සංකස්ස පුර දොරටුවට බසින්නෙමි. මා දකිනු කැමැත්තෝ එතැනට පැමිණෙත්වා, සැවැත්නුවර සිට සඬ්කස්ස නගරයට යොදුන් තිහකි. මෙපමණ දුර මාර්ගයේ කිසිවෙකුටත් මාර්ග පිළිබඳ කටයුතු නැත. පෙහෙවස් සමාදන්වී විහාරයට ධර්මශ්‍රවනයට යන අයුරින් පැමිණෙන ලෙසට පැමිනේවායි ඔවුන්ට දැනුම් දෙන්න. තෙරුන් ස්වාමිනි යහපත්දැයි ගොස් එලෙසින් දැනුම් දුන්හ.

තථාගතයන් වහන්සේ වස් පවාරණය කර සක් දෙවිඳුට දැනුම් දුන්හ. මහරජ මිනිස් පියසට යන්නෙමි. සක්දෙවිඳු රන්මය - මැණික්මය හා රිදීමය ඉනිමන් තුනක් මැවිය, ඒවායේ පාද සඬ්කස්ස නගරයේ දොරටු මුළ පිහිටියහ. ඒවායේ හිස මහමේරු පර්වතයේ මුදුනේවිය. ඒවායෙන් දකුණුපස රන් හිණිමඟ දෙවියන්ට විය. වම් පස රිදීඉණි මග මහා බ්‍රහ්මයන්ට විය. මැද පිහිටි මැණික් ඉණිමග තථාගතයන් වහන්සේට විය. බුදුරජාණන් වහන්සේ ද මහමෙර මුදුනේ සිට දෙව්ලොවින් බැසීමේ යමක පාටිහාරිය කොට උඩ බැලූහ. බ්‍රහ්මලෝකය දක්වාම එකම අංගනයක්විය. යට බලනවිට අවීචි නරකයේ සිට එකම අංගනයක්විය අනෙක් දිසා අනුදිසා බැලූහ. නොයෙක් චක්‍රවාටයන් ලක්ෂයක එකම අංගනයක් වුහ. දෙවියෝ මිනිසුන් පැසසුහ. මිනිස්සු දෙවියන් පැසසුහ. භාග්‍යවතුන් වහන්සේ ඝඩි වර්ණ විහිදවූහ. එදවස බුද්ධශ්‍රීය බලා යොදුන් තිස්හයක් අවට පිරිස බුද්ධත්වය නොපැතූ එකද පුද්ගලයෙක් නොවීය. රන් ඉණිමගින් දෙවියෝ බැස්සාහුය. රිදී ඉණිමගින් බ්‍රහ්මයෝ බැස්සාහුය. මැණික් ඉණිමගින් මේ තථාගතයන් වහන්සේ බැස්සාහුය. පංචසිඛ ගාන්ධර්ව දෙවියා බේලුව පණ්ඩු විනාව ගෙන දකුණු පසින් සිට බුදුන්ට ගාන්ධර්ව පූජාවකරමින් බැස්සේය. මාතලි ද සංගාහක ද වම්පස සිට දිව්‍යමය මල් ගඳ ගෙන වඳිමින් බැස්සාහුය. මහා බ්‍රහ්මයා ඡත්‍රය ධරයි. සුයාමදෙව් සෙමෙර සැලීය බුදුහු මේ පිරිස් පිරිවරා ගෙන බැස සඬ්කස්ස නුවර දොරටුවේ පිහිටියහ. සැරියුත් තෙරුන් ද පැමිණ බුදුන් වැඳ මෙයට පෙර සැරියුත් තෙරුන් ද මෙබඳු බුද්ධ ශ්‍රීයක් යුතුව වඩින බුදුන්ගේ ශෝභාමත් බවත් දැක නොසිටියහ.

එහෙයින්

මවිසින් මෙයට පෙර දී කිසිදිනෙක මෙබඳු බුද්ධ ශ්‍රීයක් දැක හෝ අසා නැත. මෙබඳු සිරියෙන් ප්‍රියවාදී තථාගතයන් වහන්සේ තුසිත භවනයෙන් වැඩම කළහ.

මේ ආදී ප්‍රකාශවලින් තමන් වහන්සේගේ සතුට ප්‍රකාශ කරමින් ස්වාමිනි අද සියලුම දෙවි මිනිසුන් ඔබ වහන්සේ ප්‍රියකරති. බුද්ධත්වය ප්‍රාර්ථනා කරතියි පැවසුහ. ඉක්බිති බුදුන්වහන්සේ සාරිපුත්ත ! මෙබඳු ගුණයන්ගෙන් යුතු බුදුවරු නම් දෙවි මිනිසුන්ට ප්‍රියවේයයි පවසා ධර්මය දේශනාකරමින් මේ ගාථාව පැවසුහ.

දූහැනෙහි ද නිවනෙහි
ඇලුණු සම්බුදු උතුමන්
කෙරෙහි නිලොවම සත්වග
පිය වඩත්මැයි නිතැතින්

ධ්‍යානයෙන් යුතු නෙක්ඛම්මයේ ඇලුන ප්‍රාඥයෝ රහත්හු දෙවියෝද ප්‍රියකරති බුදුරජාණන් වහන්සේලා දෙවිමිනිසුන්ට ප්‍රියවන්නාහ.

එහි **ඣානපසුතා** - යනු ලක්ෂණ උපනිජ්ඣාන ආරම්මණ උපනිජ්ඣාන යන මේ ධ්‍යාන දෙකේ ආවර්ජන (හමුවුන අරමුණ පිළිගැනීමට ඉඩ සැළැස්වීම) සමාපජ්ජන (සමවැදීම) අධිට්ඨාන (මෙය මෙසේ වේවායි පැතීම) උට්ඨාන (උනන්දුව) ප්‍රත්‍යවේක්ෂණය කල්පනා කිරීම සිතා බැලීම, "නෙක්ඛම්මූප සමෙරතා" මෙහි **නෙක්ඛම්ම** යනු - කෙලෙස් සමනය නිවන් රසය නිවනෙහි ඇලීම සඳහා කියන ලදී. දෙවාපි දෙවියෝ ද මිනිස්සු ද ඔවුන් **පීහයන්ති ප්‍රිය** කරති. ප්‍රාර්ථනා කරති. **සනීමනං** - මෙබඳු ඔවුන්ගේ සිහියෙන් යුතු බුදුන්ගේ ගුණ දැක අපි ද බුදුවන්නේමුයි බුද්ධත්වය කැමතිවෙමින් සිටී යන අර්ථයි.

මේ දෙසුම අවසානයේ කෝටි තිහක් පමණ ප්‍රාණීන්ට ධර්මාවබෝධය සිදුවිය. සැරියුත් තෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික භික්ෂූන් පන්සියයක් රහත් ඵලයෙහි පිහිටියහ. බුදුවරු නම් යමක ප්‍රාතිහාර්ය කරණ අතරම දෙව්ලොවට වැඩම කොට වස් සමාදන් වී සඬ්කස්ස නගරයට බැසීම නොකඩවා සිදු කෙරෙති. එහි දී බුදුන්ගේ දකුණු පා පිහිටන තැන අවලඥේතිය ස්ථාන නම් වේ. බුදුවරු එහි සිට පුථග්ජනාදීන්ගේ ප්‍රශ්න විමසති පුහුදුන් අය තමතම දැනුම අනුව ප්‍රශ්න විසඳා ගති, ඔවුන්ට සෝවාන් මාර්ගයේ ප්‍රශ්න විසඳීමට නොහැකිවූහ. එලෙසට සකෘදාගාමීන් ගේ ප්‍රශ්නවලට සෝවාන් වුවන්ට පිළිතුරු දිය නොහැකිය. මුගලන් තෙරුන්ගෙ විෂය අතැත් මහතෙරවරුන්ට ද සැරියුත් තෙරුන්ගේ විෂය මුගලන් තෙරුන්ට ද බුදුන්ගේ විෂය සැරියුත් තෙරුන්ට ද විසඳිය නොහැකිය. තථාගතයන් වහන්සේ බටහිර දෙස ආදී සියළු දිසාවන් බැලූහ. හැමදෙයම එකම අංගනයක් විය. අට දිසා වන්හි දෙවිමිනිස්සු උඩ බ්‍රහ්මලෝක නවයක යට බුමාටු නාග සුපර්ණයෝ ඇඳිලි බැඳ ස්වාමීනි ! මෙහි මේ ප්‍රශ්නයට විසඳුමක් නැත. මෙහි මා ගැනද සලකන්නැයි කීවානුය. බුදුහු සැරියුත් වෙහෙසට පත්වේ. "යම් සංඛත ධර්මය රහත්හු බොහෝ නිසාද මේ ප්‍රාඥ ස්වභාවය විමසනලද්දේ කියනු මැනව"

මෙ බුද්ධ විෂයේ විමසන ලද ප්‍රශ්නය අසා ශෛක්ෂ අශෛක්ෂයින්ගේ ආගමනය පිළිබඳව විසඳයි. ප්‍රශ්නයේ නිසැක ස්ඛන්ධාදීන්හි කාගේ මුවකින් මේ ප්‍රතිපදාව කියන්නේ මම බුදුන්ගේ අදහස ගැනීමට නොහැකි වන්නෙමියි මගේ අදහස ගැන සැකකරයි මවිසින් න්‍යාය නොදුන්විට කථාකිරීමට නොහැකි වන්නේද න්‍යාය පමණක් දක්වන්නෙමියි න්‍යාය දක්වමින් සාරිපුත්ත මෙය සිදුවීදැයි බලනලෙසට පැවසුහ. මෙබඳු අදහසක් ඇතිවිය. සැරියුත් තෙර මගේ අදහස ගෙන කියන්නේ ස්ඛන්ධ වශයෙන් කියන්නේ යයි තෙරුන්ට න්‍යාය දක්වමින් එම ප්‍රශ්නය න්‍යාය සියයකින් න්‍යාය දහසකින් උවටැන් කළේය. ඔහු බුදුන් විසින් දෙනලද න්‍යායෙහි පිහිටා එම ප්‍රශ්නය කිවේය. බුදුරදුන් හැර අනෙකෙකුට සැරියුත් තෙරුන්ට ප්‍රශ්න පැවරීමට සමතෙක් නම් නැත. එනිසාම සැරියුත් තෙරුන් බුදුන් ඉදිරිපස සිට සිංහනාද පැවැත්වූහ. ස්වාමීනි මම මුළු කල්පයක් වැස්ස වැටෙන විට මෙපමණ වැහිබිඳු මුහුදට වැටුනි. මෙපමණ බිමට වැටුනි.

මෙපමණ පර්වතයට වැටුනි යයි ගණනය කර ලියා දක්වන්නට සමත් වෙමි. බුදුන් ද මම එය දනිමි සාරිපුත්ත යයි පැවසුහ. මේ සැරියුත් තෙරුන්ගේ ප්‍රඥාවට උපමා නැත.

"ගඟක වැලි පරයා මුහුදේ දියබිඳු පරයා පොළවේ මැටි පරයා මගේ බුද්ධියෙන් ලක්ෂණ දැක්විය හැකිය.

ඉදින් ස්වාමීනි බුදුටි සම්පන්න ලෝකනාතයන් වහන්ස මම එක පැනයක් විසඳුවිට එක වැලි ඇටයක් එක ජල බිඳුවක් එක පස් බිඳක් නොහැර ප්‍රශ්න සියයක් හෝ දහයක් හෝ විසඳමින් මෙසේ කියන ලදි ගඞ්ගා වැලි ආදියේ එක් එක් වැලි කැටය ගෙන එකත් පසෙක තබන්නේද එවිට ගංගා ආදියේ වැලි අවසන් වනු ඇත. එහෙත් මගේ ප්‍රශ්න විසඳීම අවසන් නොවේ. මෙලෙස මහා ප්‍රාඥවූ භික්ෂුව බුදුන් විෂයෙහි තබන ලද ප්‍රශ්නයට කෙලවර හෝ අන්තය හෝ නොදැක බුදුන්විසින් දෙන ලද න්‍යායට අනුව සිට ප්‍රශ්න විසඳුවේය. මෙය අසා කථාවක් ඇතිකළහ. භික්ෂුව යම් ප්‍රශ්නයක් විමසුවේ සියලු ජනයෝ කථාකිරීමට නොහැකිවුහ. එම ධර්මය සේනාපති සාරිපුත්ත තෙරණුවෝ එකළාව පැවසුවේය. බුදුහු මෙම කථාව අසා දැන් පමණක් නොව සැරියුත්තෙරුන් මහජනයාට විසඳිය නොහැකි ප්‍රශ්න පෙරද විසඳුවේයයි පවසා අතීත කථාව ගෙනහැර දැක්වුහ.

රැස්වූ දහසකට වැඩි පිරිසක් අණුවන ලෙස වසර සියයක් අඩුවේද මහාප්‍රාඥවූ එක් ශ්‍රේෂ්ඨ පුරුෂයෙන් කියන ලද වචනයේ අර්ථය දැනගනී.

මෙම ජාතකය විස්තර වසයෙන් දැක්වුහ.

යමක පාටි හාරිය කථා ප්‍රවෘත්ති.

පරෝ සහ සසමති සමාගතානං - කඤ්ඤයසුං නෙ වයසාසනං අපඤ්ඤා
එකොව සෙයෙය්‍යා පුරිසෝ සපඤ්ඤෝ - යෝ හාසිතස්ස විජානාති අත්ථං

දහසකට අධික වූ ප්‍රඥා රහිත වූ මිනිසුන් අවුරුදු සියයක් අඩන්නාහු නමුත් කාරණය වටහා නොගනිති. යමෙක් ප්‍රකාශිත වචනයාගේ අර්ථය දනීද, ඒ එක ප්‍රඥාවන්තයා උතුම් වේ.

14.3

"කිච්ඡා මනුස්ස පටිලාභෝ'නි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ බරණැස මහරිරුක් සතක් අතරින් එක් රුක්මුලක වැඩසිටියදී ඒරක පත්ත" නම් නාරජු නිමිතිකරගෙන දේශනා කළහ.

හේ වනාහි පෙර කස්සප සම්මා සම්බුද්ධ ශාසනයෙහි තරුණ භික්ෂුවක් ලෙස සිටියදී ගංගාවක නැවක නැගී වඩින අතර ඒරක නම්වූ තණ පඳුරක කොලයක් අල්ලාගෙන සිටියදී සැඩ පහරින් වේගයෙන් නැවයන විටද එය අත් නොහලේය. ඒරක පඳුරත් කඩාගෙන ගියේ, ස්වල්ප මාත්‍ර වූ එම ඇවත දේශනා මගින් ශුද්ධ නොකොට වර්ෂ විසිදහසක් කල් අරණ්‍යයේ මහණ දම් කරද අපවත්වන විට ඒරක පඳුරේ ගැනිම මහ බරක්ම සිතා (කොලයේ ගෙලින් ගත්තාසේම) ඇවත දෙසීමට කැමති වුවත් අනෙක් තෙරනමක් නොදැක - මගේ ශීලය පිරිසිදු නොවේයයි උපන් විපිළිසර ඇත්තේ ඉන් චුත වී එරක ගසක නැවක් (ඔරුවක්) පමණ නාගරාජයෙක් වී උපන්නේ ය. ඔහුගේ නමද "ඒරක පත්ත" නම් විය. ඔහු උපන් කෙනෙහි ආත්මභාවය බලා මෙපමණ කලක් මහණ දම් පුරා අහේතුක ආත්මභාවයක මැඩියන් කන ස්ථානයක උපන්නේ යයි විපිළිසර විය ඔහු පසුකලෙක එක් දුවක ලැබ ගඟමැද දියමත මහ පෙනය ඔසවා දුවනිය ඒ පෙනය මත නටවමින් ගායනා කළේය. ඔහුට මෙබඳු අදහසක් විය. ඒකාන්තයෙන් මම මේ උපායෙන් බුදුන් උපන්විට ඔහුගේ උපන්බව අසන්නෙමි. යමෙක් මගේ ගීයට පිළිතුරු ගීයක් පටන්ගනීද ඔහුට මහත් සම්පත් සමග මේ දුවනිය දෙන්නෙමි අඩ වසකට වරක් පෙහෙවස් දින ඒ දියණිය පෙනයේ තබයි. ඇය එහි සිට නටමින් මේගාථාව කීවාය.

කුමක් හෙයින් රජ අධිපතිවේද කුමකින් රජ ප්‍රධාන රජෙක් වේද? කෙලෙස රජස් නැත්තෙක් වෙයිද? කෙලෙසක අඥානයෙක් යයි කියනු ලැබේද?

මෙය ගීයක් ලෙසට ගායනා කරයි.

මුළු දඹදිව් වැසියෝ නාග කන්‍යාව ගන්නෙමි සිතා ගොස් තම තමන්ගේ ඍද්ධි බලයෙන් ප්‍රතිගීත කොට ගායනා කරති. ඇය එය ප්‍රතික්ෂේප කරයි මෙලෙස අඩමසක් පෙනයේ සිට ගායනා කරන්නේ එක් බුද්ධාන්තරයක් ඉක්මගියේය. අනතුරුව බුදුන් ලොව පහළ වී එක් දිනක ඉතා උදැසන ලොව බලන්නේ ඒරකපත්ත ආදිකොට උත්තර මානවකයා තමන්ගේ ඍද්ධි ජාලයට පිවිසි අයුරු දැක කුමක් වන්නේදැයි ආවර්ජනා කරන්නේ අද ඒරක පත්ත නාරජ තම දුව පෙනයේ තබා නටන දිනයයි. මේ උත්තර මානවක මම දුන් ගීතය ගයන්නේ සෝවාන් වී එය ගෙන නාරජු සමීපයට යන්නේය. ඔහු එම ගාථාව අසා බුදුන් උපන්බව දැන මා සමීපයට එන්නේය. මම ඔහු පැමිණිවිට මහා සමාගමයේදී ගාථාවක් කියන්නෙමි. ගාථාව කෙලවර අසුහතර දහසක් ප්‍රාණීන් ධර්මාවබෝධය ලබන්නේය යයි දුටහ. බුදුහු එතනට ගොස් බරණැසට නොදුරේ මහරි රුක් සතක් ඇති තැන ස්ථායෙන් එකක් මුලට ගොස් වැඩසිටියහ. දඹදිව් වැස්සෝ ප්‍රතිගී ගෙන රැස්වුවාහුය. බුදුහු නොදුරෙන් ගමන්කරමින් සිටි උතුරුමානවකයා දැක උත්තර යයි ඇමතූහ. ඇයි ස්වාමීනි ! උත්තර මෙහි එන්න. අනතුරුව ඔහු පැමිණ නමස්කාර කර වාඩිවූ ඔහුට ඔබ කොහි යන්නේද? ඒරක පත්තගේ දුවනිය ගායනා කරණ ස්ථානයට යමිය පැවසීය. ඔබ ගීතයට ප්‍රති ගීතය දන්නේද? ස්වාමීනි දනිමි. එසේ නම් එය කියන්න. අනතුරුව ඔහු දන්නා පමණින් කියනවිට උත්තරට මෙය ප්‍රතිගීතය නොවේ. මම ඔබට ප්‍රතිගීතය දෙමි. මෙය ගෙන යන්න. හොඳයි ස්වාමීනි, නාග මානවිකාව ගයනවිට මේ ප්‍රති ගීතය ගයන්න.

"ඡද්වාරාධිපති රාජා - රජ්ජ මානෝ රජීසසරෝ
අරජ්ජං විරජෝ හොති - රජ්ජං බාලෝති වුච්චති"

මානවිකාවගේ ගීතයේ අර්ථය නම් **කිංසුඅධිපති රාජාති** - අධිපති රජු නම් කවුද? **"කිංසු රාජා රජීසසරොති කථං පන රාජා රජීසසරෝ නාමහෝති** ප්‍රධාන රජු වන්නේ කෙලෙසද? කෙසේනම් විරජනම් වේද? පටිගීතයේ අදහස.

ඡද්වාරාධිපති - යමෙක් ඡඩිඉන්ද්‍රියන්ට අධිපති වේද? ඡට් ද්වාරාදියෙන් එකම

දොරටුවකින් වත් රූපාදී අරමුණුවලින් යටත්නොවේද මොහු රජ නම් වේ. **රජිඤ්ඤරනම්** යමෙක් වනාහි ඒ අරමුණු ඇලේද, ඔහු ඇලෙන බැවින් රජිඤ්ඤර නම් වේ. **අරජ්ජං** - නො ඇලෙන තැනැත්තා විරජ නම් වේ. **රූපාදී රජස්හි** ඇලෙන තැනැත්තා බාලයා යයි කියනු ලැබේ. මෙලෙස - ඔහුට ප්‍රතිගීතය දී උත්තර ඔබ මේ ගීය ගැයූපසු මේ ගීතයට මේ ප්‍රතිගීතය ඇය විසින් ගයන්නේය.

"කෙනඤ්ඤ වුඤ්ඤති බාලෝ - කථං නුදති පණ්ඩිතෝ
යොගක්ඛෙමී කථං හොති - තං මෙ අක්ඛාහි පුච්ඡිතෝ"

මෙහි අර්ථය :- කාමඔඝ ආදී සතරාකාර ඕඝයෙන් ගිලෙන, පාවෙන තැනැත්තා බාලයා නම් වේ. (ගිලේ) එම ඕඝය නුවණැත්තා සම්‍යක් ප්‍රධන් වීර්යසංඛ්‍යාත යෝගයෙන් ජයගනී. ඔහු සියළු කාමයෝග ආදී යෙන් වෙන්වූයේ **යොගක්ඛෙමී** නමින් හඳුන්වයි. උත්තර ද මේ - පිළිතුරුගීය ගනිමින් සිටියදීම සෝවාන් ඵලයේ පිහිටියේය. ඔහු සෝවාන් වී එම ගාථාව ගෙන එහි ගොස් පින්වතිය - මම ප්‍රතිගීත ගෙනඅමි. මට අවකාශයක් (ඉඩක්) දෙන්න. යයි කියා නිතර ගැවසීගත් ජනයා අතර ඔවුන් පාගමින් ගියේය. නාග මානවිකාවිය ද පියාගේ පෙනයේ සිට නටමින් **කිංසු ආධිපතී** රාජා යන ගීය ගායනා කළාය. එවිට උත්තර **ජද්වාරාධිපති** - යන ගීය ගායනා කළේය නැවත - නා මෙණෙවිය - "**කෙනඤ්ඤ වුඤ්ඤති** - යන ගීතය ගායනා කළාය. එහි පිළිතුරුගීය ගැයීය. උත්තර එයට පිළිතුරු වශයෙන් **ඔඝෙනවුඤ්ඤති** යන පිළිතුරු ගීය කීවේය. නා රජු එය අසා බුදුන් උපන් බව දැන මවිසින් එක් බුද්ධාන්තරයක් මෙබඳු පදයක් නො ඇසුවෙමි. බුදුන්ලොව පහළවියයි සතුටින් වලිගයෙන් ජලයට පහර දුන්නේය. මහා රළක් ඇතිවිය. ගංගාවේ ඉවුරු දෙකම බිඳීගියේය. ඔබ මොබ ගවයෙක් තරම් උසට ජලයේ මිනිස්සු ගිලිගියහ. ඔහු එපමණ මහජනයා පෙනයේ තබා උඩට නැගී ගොඩබිම තැබුහ. ඔහු උත්තර සමීපයට පැමිණ ස්වාමීනි බුදුන් වහන්සේ කොහිදයි විමසුවේය. මහරජ එක් මහරි ගසක් මුළ වැඩසිටිති. පැවසීය. එන්න ස්වාමීනි කියා උත්තර සමගම ගියේය. මහජනයා ඔහු සමගම ගියෝය. නා රජු ෂඩ්වර්ණ රශ්මි අතරට පිවිස බුදුන් වැඳ අඬමින් සිටියේය. අනතුරුව බුදුරජාණෝ මේ කුමක්ද මහරජයයි විමසුහ. ස්වාමීනි මම ඔබ

වහන්සේ සමාන බුදුකෙනෙකුන් ලඟ ශ්‍රාවකයෙක් ලෙසට විසඳහසක් අවුරුදු මහණදම් පිරුවෙමි. මට ශ්‍රමණ ධර්මය නිමකරන්නට නොහැකිවිය. ප්‍රමාදයකින් ඒරක කොලයක් කැඩීම් පමණකින් අහේතුක ප්‍රතිසන්ධියක් ගෙන බඩගාගෙන යන ස්ථානයක උපන්නෙමි. එක් බුද්ධාන්තරයක් මනුෂ්‍ය ආත්මභාවයක් නො ලැබීමි. ධර්මය ඇසීමක් නොවීය. ඔබවහන්සේ වැනි බුදුකෙනෙකුගේ දැකීමක් නොවීය. බුදුහු ඔහුගේ කථාව අසා මහරජ මනුෂ්‍ය ආත්මය යනු ඉතා දුර්ලබය, බණ ඇසීම ද එසේමය. බුද්ධෝත්පාදය ද දුර්ලබය මෙය ඉතා දුකසේ අපහසුවෙන් ලැබිය යුතුයයි කියා ධර්මය දේශනා කලේ මේ ගාථාව පැවසුහ.

මිනිස් බව ලැබුමද
එය රැක දිවි ගෙවීමද
සඳහම් ඇසීමද
බුදු කෙනෙකු ඉපදීමද
දුලබ දේවල් මෙන්
උසස් කටයුතු සතර වේමැයි

"මනුෂ්‍යත්වයක් ලැබීම අපහසුය. මිනිස් ජීවිතය අපහසුය. ධර්මය ඇසීම ද දුලබය. බුදුවරුන්ගේ පහලවීම ද දුලබය.

මෙහි අරුත මහත් උත්සාහයෙන් මහත් කුශලයෙන් ලැබියයුතු නිසා මනුෂ්‍යාත්ම ප්‍රතිලාභය නම් **කිච්ඡෝ** දුල්ලභෝ - කෘත්‍යය අපහසුය. දුලබය. නිතර කෘෂි කර්මාන්තාදිය කොට ජීවිත වෘත්තිය සකසාගැනීම ස්වල්ප නිසා **මචචානං ජීවිතං කිච්ඡං** ජීවිතය අපහසුය. නොයෙක් කල්පවල ධර්මය දේශනා කරණ පුද්ගලයන්ගේ අඩුබව නිසා දුර්ලභ නිසා **සද්ධම්ම සවණම්පි කිච්ඡං** - ධර්මය ඇසීම ද අපහසුය මහත් ව්‍යායාමයෙන් - අභිනීහාර සමෘද්ධියෙන් සමෘද්ධිමත් වූ අභිනීහාරයෙන් අපමණ කෝටි දහස් කල්පයකින් බුදෙධාන්පාදය දුර්ලභය. **කිච්ඡ** නම් - අතිශයින්ම දුල්ලභය. **බුද්ධානං උප්පාදෝ** කෘත්‍යයන් අතුරෙන් අතිශය දුර්ලභ කෘත්‍යයයි.

දේශනයේ කෙලවර අසුහතර දහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය විය. නාරජුද එදින සෝවාන් ඵලයට පත්වන්නට තිබුනි. තිරිසන් ගතිය නිසා එය නොලැබුනි. ඔහු හැව භව ඇරීම - නිදා ගැනීම මෙථුන සේවනය - චුතිය යන අවස්ථා පහේදි නාග සිරුරම ගෙන පීඩාවට පත්වේ. එම නොමැතිවිට තරුණයෙකුගේ රූපයෙන් හැසිරීමට අවස්ථාව ලැබේ.

ඒරක පත්ත නාරජුගේ කථා පුවතයි.

14-4

"සබ්බ පාපස්ස අකරණං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ජේතවන විහාරස්ථානයේ වැඩසිටියදී ආනන්ද තෙරුන්ගේ ප්‍රශ්නයක් අරමුණු කරගෙන දේශනා කළහ.

තෙරුන් වහන්සේ දිවාස්ථානයේ සිටිමින් මෙසේ සිතූහ. බුදුරජාණන් වහන්සේ විසින් සත්බුදු වරයන්ගේ දෙමාපියෝ, ආයුෂ ප්‍රමාණය, බෝධිය, ශ්‍රාවක සන්නිපාත, අග්‍රශ්‍රාවකයින්, උපස්ථායක, මේ සියල්ල පවසා තිබේ. උපොසථය කියා නැත. මෙයට හේතුව කුමක්ද? ඒ උතුමන්ගේ මේ උපෝසථයද අනෙකක්දැයි උන්වහන්සේ බුදුන්වෙත එළඹ මේ කරුණ විමසූහ. යම් සේ ඒ බුදුවරයින්ගේ කාලභේදය පමණක් ද ගාථා භේදයක් නොවීද? විපස්සි බුදුරජාණන් වහන්සේ වසර හතකට වරක් උපෝසථය කළහ. එක් දිනෙක දෙනලද අවවාදය වසර 7කට යෝග්‍ය වේ. සිඛි හා වෙස්සභූ බුදුවරු වසර 6කට වරක් උපොසථය කළහ. කකුසඳ කෝණාගම බුදුවරු වසරක් පාසා ද කාශ්‍යප බුදුහු මාස 6කට වරක් උපෝසථය කළහ. එක් දිනෙක දෙනලද අවවාදය මාස හයකට ප්‍රමාණවත්විය. මේ නිසා බුදුරජාණන් වහන්සේ කාල ප්‍රභේද පවසා සියල්ලන්ගේ උපෝසථ එකම උපෝසථයක් කරමින් මේ ගාථාව පැවසූහ.

නො කරනු පවක් දිවි හිමියෙන් කිසි	විටක
රැස් කළ මැනවි දස කුසලම හැම	දිනක
පිරිසිදු කරනු සිත - සිහිවිලි හැම	නැනත
බුදු අනුසසුන මෙය පිහිටනු මැන	සිතක

නවුසන්ගේ ගුණය ඉවසුම නමැති	දෙයයි
නිවනම සුවය බව තුන්බුදුවරුම	කියයි
අන් පණ නසන්නා පිරිවැජියකුද	සැකයි
වයිරය සිත ඇතොත් ඔහු මහණෙකුද	නොවෙයි

දෑ කුල බෙයින් අන් අය පහතට නොහෙළා
පාමොක් දෙසා සංවර සීලය රැකලා
වැඩිපුර නොකා සමවත් මග පල ලබලා
සැනසුම, මහණකම බව ඇත බුදුහිමි දෙසලා

1. සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං එතං බුද්ධාන සාසනං

2. ඛන්ති පරමං තපොති තික්ඛා
නිබ්බා නං පරමං වදන්ති බුද්ධා
නහි පබ්බ ජිතෝ පරූප ඝාති
සමණෝ හොති පරං විහෙඨයන්තෝ

3. අනූපවාදෝ අනූපඝාතෝ පාතිමොක්ඛෙච සංවරෝ
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තඤ්ච සයනාසනං
අධිචිත්තෙච ආයොගෝ එතං බුද්ධාන සාසනං

සියළු පවු නොකිරීම කුසල් රැස් කිරීම තම සිත පිරිසිදුව තබාගැනීම මෙය බුදුවරුන්ගේ අනුශාසනයයි ඉවසීම පරම තපසයි. බුදුවරු නිවන පරම සුවය ලෙසට දක්වති. පැවිදිවරු අන්අය ඝාතනය නොකරති අන් අයට හිංසා කිරීම පැවිද්දෝ නොකරති. චෝදනා නැගීම පරපන නැසීම නොකරති. ප්‍රාතිමොක්ෂ සංවරය, භෝජනයේ ප්‍රමාණය දැනගැනීම විචිත්ත සෙනසුන් ඇසුර අධිචිත්තය වැඩීමේ ගති බුදුන්ගේ අනුශාසනයයි. එහි **සබ්බපාපස්සති** - සියළු අකුශල කර්මයි. **උපසම්පදා** - අභිනිෂ්ක්‍රමණයේ සිට අර්හත් මග දක්වා කුසල් ඉපදවීම. උපන් කුසල වැඩීම අදහස් කෙරේ. **අනූපවාදෝ** - යනු උපවාද රහිත වීම ම අනුපවාදයයි. **අනූපඝාතෝ** යනු අනුන්ට පහර නොදීමම අනුපඝාතයයි. **සචිත්ත පරියෝදපනං** - පංචනීවරණයන් දුරුකොට තමන්ගේ සිත තුළ පිරිසිදුකම ඇතිකරලීමයි. **එතං බුද්ධාන සාසනං** - මෙය සියළු බුදුවරයින්ගේ අනුශාසනයයි. **ඛන්ති** - යම් ඒ ඉවසීම සංඛ්‍යාත ක්ෂාන්තිය පරමං උතුම් තපෝ තපසයි **නිබ්බාණං පරමං වදන්ති බුද්ධා** බුදු පසේ බුදු අනුබුදු යන තුන් බුදුවරු නිවන උතුම්

යයි පවසති. **නහි පබ්බජිතො** - පැවිදි අය අත් ආදියෙන් **පරං** අන් අය **උපහනන්නෙ** වෙහෙසට පත් නොකරති. ඝාතනය නොකරති. **පරූපඝාති** අන් අයට උපවාද නොකරති. ඝාතනය නොකරති. **සමණො** - ශ්‍රමණයෝද පෙර කී අයුරින් අනුන් වෙහෙසට පත් නොකරති. **පාතිමොක්ඛ** යනු - ජ්‍යෙෂ්ඨ සීලයයි **සංවරොති** සංවරයනම් වසා තැබීමයි **මත්තඤ්ඤුතා** - මාත්‍රඥතාව නම් පමණ දැනගැනීමයි. **පන්තං** යනු විවේකයයි. අධිචිත්ත යනු අෂ්ඨසමාපත්ති සංඛ්‍යාත අධි චිත්තයයි. ආයොගො - පයොග කරණයයි. **අනුපවාදන** නම් වාචසික සීලයයි. **අනුපඝාත කායික සීලයයි. පාති මොක්ඛව** සංවර නම් ප්‍රාතිමොක්ෂ සීලය මෙන්ම ඉන්ද්‍රිය සංවරයයි. පමණ දැනීම සුදුසු සෙනසුන් ඇසුර **අධිචිත්ත** නම් අෂ්ඨ සමාපත්තියි මෙයින් ත්‍රිශික්ෂා කියැවේ. දෙසුම අවසන බොහෝදෙන සෝවාන් ආදී ඵලයන්ට පත්වූහ.

අනන්ද තෙරුන්ගේ උපෝසථ ප්‍රශ්න පුවතයි.

14-5

"න කහාපන වඤ්ඤන" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙවරම වැඩසිටියදී එක් උකටලී වූ භික්ෂුවක් නිමිති කරගෙන දේශනා කළහ. ඔහු ශාසනයේ පැවිදිවී උපසම්පදාවී අසවල් තැනට ගොස් ඉගෙන ගන්නැයි උපධ්‍යායන් විසින් යවන ලද්දේ එතැනට ගියේය. ඉක්බිති පියාට රෝගයක් ඇතිවිය. ඔහු පුතා දකිනු කැමතිව ඔහුව කැඳවීමට සමත් කිසිවෙක් නොලැබ දරුවුකින් හඬමින් ම මරණා සන්න වී මෙය මගේ පුතාට පාසිවුරු ගැනීමට යොදන්නැයි කහවණු සියයක් බාල දරුවා අත තබා කළුරිය කළේය. ඔහු වැඩිමල් සහෝදර භික්ෂුව පැමිණි විට පාමුල වැටී පෙරළී අඬා ස්වාමීනි අපේ පියා වැලපෙමින් ම මියගියේ ය. මා අත ඔහු විසින් කහවනු සියයක් අතේ තබන ලදි. ඉන් කුමක් කරන්නේදැයි විමසීය. දහර භික්ෂුව මට කහවණු වලින් අර්ථයක් නැතැයි ප්‍රතික්ෂේපකර පසුව සිතුවේය. මම මෙලෙස අනුන්ගේ ගෙදොර පිඬු පිණිස ගොස් ජීවත් වීමෙක් වැඩක් වේද? මේ කහවණු සියයෙන් ජීවත් විය හැකිදැයි විමතියට පත්ව ඔහු අනභිරතියෙන් පෙළී විසිරුණු ඉගෙනීම් බණදහම් කිම්, කමටහන් වැඩිම් ආදියෙහිදී, පාණ්ඩු රෝගියෙකු ලෙස සුදුමැලි විය. අනතුරුව කුඩා සාමණේර වරු මෙසේ වෑරුනේ කුමක් නිසාදැයි විමසා උකටලී වූයෙමි යි කිවිට ආචාර්ය උපාධ්‍යායන්ට දැනුම් දුන්හ. ඉක්බිති ඒ ගුරුවරු ඔහු බුදුන් වෙත කැඳවාගෙන ගොස් බුදුන් දක්වූහ. බුදුහු ඔබ උකටලීව සිටීම සැබෑදැයි විමසුහ. ඇත්තයයි පැවසුවිට ඔබ එලෙස කිරීමට හේතුව කුමක්ද? ඔබට ජීවත් වීමට කිසිවක් ඇත්දැයි විමසුවිට ස්වාමීනි ඇත. ඔබට තිබෙන්නේ කුමක්ද? ස්වාමීනි කහවනු සියයක් එසේනම් එක්තැනකින් ගල්කැට ටිකක් අරගෙන එන්න. ගණනයකර දැනගනිමු මේ කහවනු සියයෙන් ජීවත්විය හැකිද නොහැකිද යන්න සොයාබලමු. පරිභෝගය සඳහා පහනක් වෙන්කරන්න. දෙගුණයක් ගොනුන් මිළදීගැනීමට වෙන්කරන්න. විසි හතරක් බීජ ගැනීමට වෙන්කරන්න. විස වියගස් නඟුල් සඳහා වෙන්කරන්න. උදළු වෑ පොරෝ සඳහා වෙන් කරණවිට මෙලෙසට වියදම් ගණනය කරණවිට කහවනු සියය ප්‍රමාණවත් නොවේ. අනතුරුව බුදුහු මහණ ! ඔබගේ කහවනු ස්වල්පය කෙසේ නම් තෘෂ්ණාව පුරන්නේද? අතීතයේ දී සක්විති රාජ්‍යය කර අත්පුඩි ගැසීම් පමණකින් යොදුන්

දොළසක් දුර උකුළ ප්‍රමාණයට රන් වර්ෂා වැස්සවීමට සමාර්ථ වූ සක්විති රජු, සක්විති රජකමට වඩා ශක්‍ර සම්පත් උතුමැයි සිතා, ශක්‍රයාව ඉපිද, සතිසක් ශක්‍රයන්ගේ ආයු කාලය කලක් දේවරාජ්‍යය කර මරණ අවස්ථාවේදී තන්හාව සම්පූර්ණ නොකරම කළුරිය කළේයයි පවසා ඔහුගේ ඉල්ලීම අනුව අතීත මහාමන්ධාතු ජාතකය විස්තර කර පැවසීය. යම්තාක් සඳහිරු දෙදෙනා දිසාවන්හි පැතිර බබලත්ද ඒසාවිශාල ප්‍රදේශයක සියළු ප්‍රාණීහු දාසයෝ වුහ.

මෙයින් අනතුරුව ගාථා දෙකක් පැවසුහ. කහවණු වැස්සෙන්ද කාමයන්හි තෘප්තියක් ඇති නොවේ. කාමයෝ මද සැප ඇතියෝය. බොහෝ දුක් ඇත්තෝය. නුවණැත්තෝ මෙසේ දැනගෙන දිව්‍ය කාම සම්පත්තීන් හි ද ඇල්මකට නොපැමිණ, බුද්ධ ශ්‍රාවක තෙමේ නිවනෙහි ඇලුණෙක් වේ.

මිනිසකු සිතෙහි ඇති වන වස්තු කාමය
වැස්සන් සත් රුවන් ඉන් ඇති නොවේමය
පස්කම් සැපත නම් මද සුව ගෙනේමය
බුදුබණ දහම පිළිපැදි අය නිවේමය

න කහපණ වස්සෙන - එහි කහාපණවස්සෙන යනු - හෙතෙමේ අත්පොළසන් ගසා සත්රුවන් වැස්සක් වස්සවයි එය කහවණු වැස්සක් යයි කියයි ඒ විසින්ද වස්තුකාම ක්ලෙශ කාමයෙන් තෘප්තියක් නම් නොවීය. තෘෂ්ණාව පිරීම අපහසුය. **අපපඤ්ඤාදා** යනු සිහින හා සමාන අල්ප සුවයකි. දුක්ඛා යනු **දුක්ඛදුක්ඛාඤ්ච** ආදියේ ආවාවු දුක් ලෙස දක්වන බොහෝ දුක් වේ **ඉති විඤ්ඤායා** යනු මෙලෙස කාමය දැනඅපි **දිබ්බෙසු** යනු යම්සේ දෙවියන් පිළිබඳ ලබන කාමයන්හි ආරාධනයක් ඇත ද ආයුෂ්මත් සම්ද්ධි තෙරුන් මෙන් ඒ කාමඡන්දයන්හිද රතියක් ඇල්මක් නැත නො විඳින්නේමය.

" නණ්හක්ඛයරතෝ "

තෘෂ්ණා ක්ෂය කිරීමේ රතිය නම් අර්හත්වයේ මෙන්ම නිවනේද? ඇලුනේ එය පතමින් වාසයකරයි. **සම්මාසම්බුද්ධ සාවකෝ** සම්මා සම්බුද්ධයන් වහන්සේ විසින් දේශිත ධර්මය ඇසීමෙන් බිහිවූ යෝගාවචර භික්ෂුවයි.

162

දේශනය අවසන ඒ භික්ෂුව සෝවාන් ඵලයේ පිහිටියේය. පැමිණි පිරිසටද එම දෙසුම සාර්ථක විය.

උකටලී භික්ෂුව පිළිබඳ කථා පුවතයි.

14-6

"බහුං වෙ සරණං යන්ති" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී කොසොල් රජුගේ අග්ගිදත්ත නම් පුරෝහිත බමුණා වැලි ගොඩක් ඇසුරු කරමින් සිටි අවදියේ ඔහු ආරම්භ කොට වදාළසේක.

ඔහු වනාහි මහ කොසොල් රජුගේ පුරෝහිත විය. කොසොල් රජුගේ පිය රජුගේ පුරෝහිතයා වුයේ මේ පුරෝහිතයාගේ පියා ය. (ඒ දෙදෙනාම නැතිවීමෙන් පසුව) එයට ගරු කිරීමක් වශයෙන් කොසොල් රජු මොහු ඒ තනතුරෙහි පිහිටුවීය.

ඔහු තමන් වෙත උවටැනට එන විටදී රජු පෙරගමන් කරයි. ඇඳුරුතුමනි මෙහි වාඩිවෙන්නැයි සමාන අසුනක් තැබවීම කරවයි. ඔහු මෙසේ සිතුවේය.

මේ රජු මට බෙහෙවින් ගෞරව පුදකරයි. එහෙත් නිතරම රජවරුන්ගේ සිත් ගැනීම පහසු නොවේ. සමාන වයස් ඇත්තේ නම් රාජ්‍ය සැප නියම සැපය වේ. මා වනාහි දැන් මහළුය. ඒ නිසා පැවිදිවීමට යෝග්‍යය ඔහු රජුගෙන් අනුමැතිය ලබාගෙන නගරයේ බෙර හසුරුවා දින හතකින් සියළු ධනය පරිත්‍යාග කර බාහිර පැවිද්දෙන් පැවිදිවිය. මේ නිසා දස දහසක් පුරුෂයෝ ඔහු අනුව පැවිදි වුහ. ඔහු ඔවුන් සමග අංග මගධ හා කුරු රට අතර වාසය කරමින් මේ අවවාදය දෙයි. දරුවනි ! යම්කෙනෙකුට කාම විතර්ක ආදිය ඇතිවේද? ඔහු වහා එකිනෙකා වැලි ගොටුවක් බැගින් මේ ස්ථානයේ විසිරවන්න. ඔවුහු යහපතැයි පිළිවදන් දී කාම විතර්ක ආදිය ඇතිවූ විට එලෙස වැලිගොඩ ගැසුහ. පසු කාලයේ දී මහා වැලි ගොඩක් ඇතිවිය. ඒ වැලිගොඩ අභිඥත්ත නම් නාගරාජයෙක් අල්ලා ගත්තේය. අඞ්ග මගධ හා කුරුරට වාසීහුද මසක් පසා ඔවුන්ට මහත් සත්කාර දක්වා දන් දෙති. ඉක්බිති ඔවුන්ට අග්ගිදත්ත මේ අවවාදය දුන්නේය. පර්වත සරණ වනසරණ යව් හැසිරෙවු. ආරාම සරණයවු. ගස් සරණ යවු. මෙලෙස සියළු දුක් වලින් මිදෙවු. තම තමන්ගේ අන්තේවාසිකයන්ට ද මේ අවවාද දෙව්

බෝසතාණන් වහන්සේද අභිනිෂ්ක්‍රමණය කොට සම්මාසම්බෝධියට පැමිණ එකළ සැවැත් නුවර නිසා දෙව්රම වැඩ වසමින් උදැසන ලොව බලන්නේ අගගිදත්ත බ්‍රාහ්මණයා සමග අතවැසි පිරිස තම ඤාණ ජාලයට පිවිසුනි. මේ සියල්ලෝම රහත් ඵලයට හේතු සම්පත් ඇතැයි දැන සවස් වේලේ මහමුගලන් තෙරුන්ට මොග්ගල්ලාන අග්ගිදත්ත බ්‍රාහ්මණ තෙමේ මහජනයා නොතෙරක නො තොටක බස්වන බව ඔබට නොපෙනේද? යන්න ඔවුන්ට අවවාද කරන්න. මම ද පසුව එමි. ඔබ පළමුව යන්න. එවිට මුගලන් තෙරණුවෝ බොහෝ වූ මොවුන් එකට පිවිසීම මට විෂය නොවේ. ඔබ වහන්සේද පැමිනේනම් මට විෂය වේ. මුගලන් මම ද එන්නෙමි. ඔබ පෙරටුව යන්න. තෙරුන් වහන්සේ යන අතරමගදී සිතූහ.

මොවුන් පිරිස් වශයෙන්ද බලවත් ය පිරිස විශාල ය මේ පිරිසට යමක් කියනවිට සියල්ලෝම වර්ග වර්ග වශයෙන් නැගී සිටිති. අනතුරුව තමන්ගේ ආනුභාවයෙන් පොද පොද වැස්සක් ඇති කළහ. ඔවුහු ටික ටික තෙමේදිම සිටි තැන්වලින් නැගී සිටිමින් තමතමන්ගේ පන්සල් කුටිවලට පිවිසුණහ. තෙරුන් අග්ගිදත්ත බමුණාගේ පන්සල් දොරටුව සිට අග්ගි දත්ත යයි ඇමතූහ. ඔහු තෙරුන්ගේ ශබ්දය අසා මෙලොව මගේ නමින් ඇමතීමට කෙනෙක් නැත. මට නමින් අමතන්නේ කවරෙක්ද? මානයෙන් තද නිසා මොහු කවුදැයි විමසීය. බ්‍රාහ්මණය මම ය. කුමක් කියන්නේද? අද මෙහි එක රැයක් වසන්නට මට ඉඩ දෙන්න. මෙහි රැයක් වසන්නට තැනක් නැත. එක අයෙකුට එක පන්සලක් බැගිනි. අග්ගිදත්ත මිනිස්සු මිනිසුන්ටය, ගවයන් ගවයන්ටය පැවිද්දෝ පැවිදි අයටය, මේ අය ළඟට එති. මට එසේ නොකරන්න. මට වාසයකිරීමට තැනක් දෙන්න. ඔබ පැවිද්දෙක්නම් ඔබේ කත්බඩු කොයිද? කෝ පැවිදි පිරිකර මට පැවිදි පිරිකර තිබේ. වෙන්කරගෙන යාම අපහසු නිසා අභ්‍යන්තරයේ තබාගෙන යමි. බමුණ ඒ පිරිකර නොගෙන යාම පිළිබඳව කිපුනි. අනතුරුව ඔහු මෙයින් වෙන්වී පිටව යන්නැයි කීය. අග්ගිදත්ත මට නොකිපෙන්න මට ඉන්න තැනක් දෙන්න. මෙහි ඉන්නට තැනක් නැත. මේ වැලි ගොඩේ සිටින්නේ කවරෙක්ද? එක් නාගරාජයෙකි. හොඳයි එතැන මට දෙන්න. බැහැ එතැන දීමට නොහැකිය. ඔහුගේ ක්‍රියාව බැරෑරුම්ය. කමක්නැත එය මට දෙන්න. හොඳයි ඔබම එය වගකීම බාරගන්න. තෙරුන් වහන්සේ වැලිගොඩ දෙසට

යනවිට නාගරාජයා උන්වහන්සේ දැක මේ ශ්‍රමණයා මෙහි එයි. මම සිටින බව දන්නේ නැතිව ඇති දුම් පිට කර මරමියි කියා දුම්පිට. කළේය. තෙරුන් වහන්සේ මේ නාගරාජයා මට පමණයි දුම් යවන්නට හැකිවන්නේ අන් අයට එය කළ නොහැකි බව සිතයි. මෙසේ සිතා දුම් පිටකළේය උන්වහන්සේ ද දුම් යවන්නට විය. දෙදෙනාගේම සිරුරුවලින් පිටවූ දුම් බඹලොව දක්වා පැතුරුනි. මෙම දුම් වලින් තෙරුන්ට බාධාවක් නොවිය. නාගයාටම බාධකයක් විය. නාගරාජයා දුම්වේගය ඉවසීමට නොහැකිව දිලිසුනි. තෙරුන්ද තේජෝ ධාතුසමාපත්තියට සමවැදී ඔහු සමගම දැල්වුනි. එම ගිනි ජලාව ද බඹලොව දක්වා පැතිරුනි. මුළු සිරුර ගිනි පන්දමක් ලෙසට දැල්වුනේ විය. ඍෂිවරු සමූහය බලා මෙලෙස සිතූහ. නාරජු ශ්‍රමණයා දවාලයි. යහපත් ශ්‍රමණයෙකි අපේ වචනය නො අසා විනාශයට පත්විය. තෙරුන් වහන්සේ නාරජු දමනය කර විෂනසා වැලිගොඩේ හුන්නේය. නා රජු වැලිගොඩ දරණ වලින් ඔතා වටකොට ගෙයක කුලුගෙයක් තරම් පෙනයක් මවාගෙන තෙරුන් මුදුනේ දරා සිටියේ ය. ඍෂිවරු තෙරුන් මළ නොමළ බව දැනගැනීමට තෙරුන්වෙත ගොස් ඒ වැලිගොඩ මත සිටිනු දැක ඇඳිලි බැඳගෙන ස්තුති කරමින් මෙසේ පැවසූහ. ශ්‍රමණය නාරජුගෙන් පීඩාවක් නොවීද? බාධා නොවීද? ඇයි බලන්න මොහු මගේ හිසමත පෙණය ධරා සිටින අයුරු අශ්චර්යකි ශ්‍රමණය මෙබඳු දරුණු නාරජු දමනය කළේද? තෙරුන් පිරිවරා ගෙන සිටියහ. එකෙනෙහි බුදුහු වැඩමකළහ. බුදුන් දැක තෙරුන් නැගිට වැන්දේය. අනතුරුව ඍෂිවරු මේ තැනැත්තේ ඔබට වඩා මහත්ද? මේ භාග්‍යවතුන් වහන්සේයි. මම මුන්වහන්සේගේ ශ්‍රාවකයෙකි. බුදුහුද වැලි ගොඩේ වැඩසිටියහ.

ඍෂිවරු මේ ශ්‍රාවකයාගේ ආනුභාවයි. මුන් වහන්සේගේ ආනුභාවය නෙබඳු වේදැයි ඇඳිලි බැඳ බුදුන්ට ස්තුති කළහ. බුදුහු අග්ගිදත්තට අමතා පැවසූහ. ඔබ ඔබේ ශ්‍රාවකයින්ට අවවාද දෙන්නේ කුමක් කියා අවවාද දේද ! මේ පර්වතය. මේ වනය මේ ආරාමය, මේ ගස, සරණ යන්නැයි අවවාද දෙමි. එසේ ඒවා සරණ ගොස් සියලු දුක්වලින් මිදෙන්නැයි අවවාද දෙමි. අග්ගිදත්ත එසේ නොවේ. මේවා සරණ ගොස් සියළු දුක්වලින් නොමිදේ බුද්ධ ධම්ම සංඝ සරණගොස් සියළු සසර දුකින් මිදෙවයි මේ ගාථාව පැවසූහ.

අවි වැසි සුළං ඈ දේකින් බිය පත්වූ.
සත්වග සසර බිය දැක්මෙන් බිය පත්වූ
පරුවත අරමි - මහ සෑ සරණට එක්වූ
අනුවණයෝ නොයති නිවණට සුව පත්වූ

මේ සරණ රැකවරණ සහිත වූවක් නොවේ. එය උත්තම සරණක්ද නොවේ. සසර දුකින් මිදීමට මේ සරණ යාමෙන් නුපුළුවන යමෙක් බුදුන් - දහම් - සඟුන් සරණ යන්නේද. චතුරාර්ය සත්‍යය මනා නුවණින් දකින දුකය, දුක ඉපදීමේ හේතුවය, දුක නැති කිරීමය. දුක් නසන්නාවූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, මේ සරණම රැකවරණ සහිතය. එය උතුම් සරණය ම වේ. මේ සරණගොස් (තුනුරුවන්) සියලු දුක්වලින් මිදිය යුතුය.

එහි බහුනන්නි - බොහෝ **පබ්බතානි** - යනු ඒ ඒ තැන පිහිටි ඉසිගිලි වෙපුල්ල වෙහාර ආදි පර්වතයෝය. මහාවනය - ගොඩිසිඬිග වනය - සාලවනය ආදියයි. **වනානි** - වනයන් වෙළුවන, ජීවකම්බවන ආදියයි. **ආරාමේ** - (උයන්ද) උදේනි චේතිය - ගෝතම චේතිය ආදියයි **රුක්ඛචෙත්‍යානි** යනු වෘක්ෂ චෛත්‍යස්ථානද **මනුස්සා** ඒ ඒ බිය නිසා තර්ජිතවූ මිනිස්සු **තජ්ජිතා** බියෙන් මිදෙනු කැමතිව, පුතුන් දරුවන් ලැබීම් ආදිය සඳහා. ප්‍රාර්ථනා කරමින් **සරණං යන්ති සරණ** යති. යන අර්ථයි. **නෙතං සරණං** යනු මේ සියළු සරණ රැකවරණ සහිත නොවේ. උතුම් නොවේ. මේ සරණ යාම නිසා ජාති ජරා ආදි ධර්මයන්ගෙන් නොමිදේ. යන අර්ථයි **යොච** - යනු යමෙක් මේ රැකවරණ රහිතවූ, අනුත්තර නොවූ, සරණ දක්වා ඒවා ක්ෂමවූ - උතුම් වූ සරණයයි දැක් වීම සඳහා කියන ලදී **යොච** ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ **ඉතිපි සොභගවා අරහං සම්මා සම්බුද්ධෝ** ආදි බුද්ධ - ධම්ම - සංඝ නුස්සතිය කර්මස්ථාන නිසා ශ්‍රේෂ්ඨ වශයෙන් **බුද්ධං ධම්මං සඞ්ඝං ච සරණං** ගතො ඔවුන්ගේ ඒසරණා ගමනය, අන්‍යතිර්ථක වන්දනා ආදින් හා කිපේ. පැලෙයි එහි අචල බව දැක්වීමට මාර්ගයෙන් ආ සරණ ප්‍රකාශ කරමින් **චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය** පස්සති. යනාදිය කිහ. යමෙක් වනාහි මේ දර්ශන වශයෙන් එවැනි සරණ ගියේ නම් ඔවුන්ගේ සරණය රැකවරණ සහිතය. උතුම් ය. ඒ පුද්ගලයා මේ සරණගමන හේතුවෙන් සමස්ත සංසාර වෘත්තයෙන් මිදේ. **එතං බො සරණං ඛෙමං** යනු එහෙයින් කියන ලදී.

දෙසුම අවසන ඒ සියළු ඍෂිවරු සිව්පිළිසිඹියා සහිත අර්හත්වයට පත්ව බුදුන් වැඳ පැවිද්ද ඉල්ලුහ. බුදුහු සිවුර තුළින් අත මෑත්කොට මහණෙනි. එන්න "එථ භික්ඛවො" බඹසර හැසිරෙන්නැයි පැවසුහ. ඔවුහු එකෙනෙහි අටපිරිකර දරා වස් සියයක් ගතවූ තෙරවරු මෙන් වුහ. හෙතෙමේ අංග - මගධ කුරුරට වාසින්ගේ සත්කාර ලබා එන දවසක් විය. එසේ සත්කාර රැගෙන එනඅය ඒ ඍෂිවරු පැවැදිවී දැක කිම අපේ අග්ගිදත්ත බ්‍රාහ්මණ ද නැතහොත් ශ්‍රමණ භවත් ගෞතමයන් වඩා ශ්‍රේෂ්ඨදැයි සිතූහ. ශ්‍රමණ භවත් ගෞතමයන් පැමිණි හෙයින් අග්ගිදත්තම වඩාත් උතුම් යයි සිතූහ. බුදුහු ඔවුන්ගේ අදහස දැනගෙන අගගිදත්ත පිරිසගේ සැක සිඳලන්නැයි පැවසුහ ඔහුද මෙපමණකින්ම පහදාදෙන්නෙමියි පන්සලෙන් උඩ අහසට පැනනැගි නැවත නැවත බැස බුදුන් වැඳ බුදුන් මගේ අනුශාසක වරයායි ද මම ශ්‍රාවක වෙමියිද පැවසුහ.

අග්ගි දත්ත බමුණන්ගේ කථා පුවතයි.

14-7

"දුල්ලභෝ" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම විහරණය කරමින් ආනන්ද තෙරුන්ගේ ප්‍රශ්න නිමිති කරගෙන වදාළහ.

තෙරුන් වහන්සේ එක් දිනක් දිවාවිහරණයේ සිටිමින් සිතූහ. ආජානීය ඇතුන් ජද්දන්ත කුලයේ හෝ උපෝසථ කුලයේ හෝ උපදිති. ආජානීය අසුන් සෛන්ධව කුළයේ හෝ වළාහක රාජකුළයේ හෝ ඇතිවන්නේද දක්ෂිණා පථයේද? ආදිය කියනවිට බුදුරජාණන් වහන්සේ විසින් ආජානීය ඇතුන් ආදීන්ගේ උපන්තැන් පවසන ලදී ආජානීය පුරුෂයන් කොහේ උපදින්දැයි උන්වහන්සේ බුදුන්වෙත එළඹ වැඳ මේ කරුණ විමසූහ. බුදුරජාණන් වහන්සේ ආනන්ද අජානීය පුරුෂයෝ හැමතැනම පහළවන්නේ නැත. සෘජුව දිගින් යොදුන් තුන්සියයක් පළලින් යොදුන් නවසීයයක් පමණ වූ මජ්ඣිම ප්‍රදේශයේ පහළ වෙති. ඒ ඒ කුලවලත් පහළ නොවෙති. බත්තිය මහා සාල කුළයේ හෝ බ්‍රාහ්මණ මහාසාල කුළයේ උපදිතියි පවසා මේ ගාථාව දේශනාකළහ. " දුල්ලභෝ පුරිසාජඤ්ඤා"

ධීර වීර දු පුතුන් - ඉපදුම ලොවේ දුලබයි.
එසේ උපදින පවුල - යසස්පිරි මහාසාලය

දුල්ලභෝ යනු ආජානීය පුරුෂයන් දුර්ලභය ආජානීය ඇතුන් අසුන් මෙන් සුලභ නොවේ. **නසෝ සබ්බත්ථ** - ප්‍රත්‍යන්ත දේශවල හෝ පහත් කුළවල හෝ පහළ නොවේ. මධ්‍යම දේශයේ මහජනයා වැදීම් පිදීම් ආදිය කරණ ස්ථානවල ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ආදී කුලවලින් එකක පහළ වේ. **යත්ථ සෝ ජායති ධීරෝ** මෙසේ ඇතිවන ඒ උතුමන් මහාප්‍රාඥ සම්මා සම්බුද්ධයි **තං කුලං සුඛමෙධති** යනු සුවයටපත් වේය යන අර්ථයි. මේ දේශනය අවසානයේ බොහෝදෙන සෝවාන් ආදී ඵලයන්ට පැමිණියහ.

ආනන්ද තෙරුන් විමසූ ප්‍රශ්න පිළිබඳ කථා පුවතයි.

14-8

"සුඛො බුඞ්ඛානං" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී බොහෝ භික්ෂූන්ගේ කථාවක් නිමිති කරගෙන දේශනා කළහ.

එක්දිනක් පන්සියයක් භික්ෂූන් උවටැන්ගාලාවේ සිටියේ ඇවැත්නි මෙලොව සැපනම් කුමක්දැයි කථාවක් ඇතිකළහ. කෙනෙක් රාජ්‍යසැප සමාන සුවයක් නැතැයි කීවාහුය. කෙනෙක් කම් සුව ආදිය සමාන සුවයක් නැතැයි පැවසුහ. බුදුහු ඒ භික්ෂූන් සිටිතැනට වැඩමකර මා පැමිණීමට පෙර කිනම් කථාවකින් යුතුව සිටියෝදැයි විමසා වෙනම කථාවකැයි පැවසූ විට කුමක් පවසව්ද මේ සියළු සැප සසර දුකට පිළිපන්නේ ඒවායි. පවසා මෙලොව බුද්ධොත්පාදය, ධර්මය ඇසීම, සංඝ සමගිය සතුටු සාමිචි බව මෙයම සැපයැයි පවසා මේ ගාථාව පැවසුහ.

බුදුන් ලොවැ ඉපදුම
නිතර බුදුබණ ඇසුමද
මහ සඟනැ සමගිය
සමගි සඟනගෙ තපස සුවමය.

"බුදුවරුන්ගේ උපත සැපයකි. ධර්මදේශනය සැපයකි සංඝයාගේ සමගිය සැපයකි. සමගි වුවන්ගේ තපස සැපයකැයි පැවසුහ.

එහි යම් හෙයකින් බුදුන් ඉපදෙනවිට මහජනයා රාග කාන්තාර ආදියෙන් එතර කරති. මේ නිසා **බුද්ධානං උප්පාදො සුඛො** බුදුන්ගේ උපත සුවයකි. යම් හෙයකින් ධර්ම දේශනය ජාත්‍යාදි ධර්ම යන්ගෙන් මිදෙති මේනිසා **සද්ධම්ම දෙසනා සුඛා** ධර්මදේශනය සුවයකි. **සාමග්ගි** යනු සම චිත්තයයි. ඒ එක සිත් ඇතිබව ද සුවයකි. සමගි වුවන්ගේ එකඟවූ සිත නිසා බුද්ධ වචනය ඉගෙනීමට ධුතංග දැරීමට ශ්‍රමණ ධර්ම කිරීමට හැකිවේ. එහෙයින් **සමග්ගානං තපො සුඛො** යන්න කියන ලදී. එනිසාම බුදුරජාණන් වහන්සේ විසින් යම්සේ භික්ෂූන් සමගිව රැස් වේද, සමගිව විසිරයේද සංඝ කරණීය

කරන්නේද වෘද්ධියක්ම ඇතිවේ. එයම අපේක්ෂා කළයුතුය. පරිහානියක් ඇතිනොවේ.

දේශනය අවසානයේ ඒ භික්ෂුහු රහත් ඵලයට පත්වුහ. මහජනයාටද දේශනය සාර්ථක වුහ.

බොහෝ භික්ෂූන්ගේ කථා ප්‍රවතයි.

14-9

"පූජාරහෙනි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ චාරිකාවේ යෙදෙමින් කාශ්‍යප දසබලයන් වහන්සේගේ රන්වන් සෑයක් නිමිති කරගෙන දේශනාකළහ. තථාගතයන් වහන්සේ සැවැත් නුවරින් නික්මී පිළිවෙලින් බරණැසට වඩින්නේ අතරමග තෝදෙය්‍ය ගම සමීපයේ පිහිටි එක්තරා දේවස්ථානයකට මහාසංඝයා පිරිවරාගෙන වැඩම කළහ. එහි තථාගතයන් වහන්සේ වාඩි වී ආනන්ද තෙරුන් යවා නොදුරේ ගොවිතැනේ යෙදී සිටි බමුණෙක් කැඳ වුහ.

එම බමුණා පැමිණ බුදුන්ට නොවැඳම ඒ දේවස්ථානයට වැඳ සිටියේය. සුගතයන් වහන්සේද? බ්‍රාහ්මණය මේ ප්‍රදේශය කවර ස්ථානයක් ලෙස සිතන්නේදැයි විමසුහ. අපගේ ප්‍රවේණියෙන් පවතින චෛත්‍ය ස්ථානයකි එනිසා වඳිමියි පැවසීය. මේ ස්ථානය ඔබ වැඳීමෙන් යහපතක් කරණ ලැදැයි බ්‍රාහ්මණයා පසසා සතුටු කළේය. මේ කරුණ අසා භික්ෂූන් වහන්සේලා කිනම් කරුණක් නිසා බුදුහු ප්‍රසාදයට පත්කලේදැයි සැකයක් ඇතිකර ගත්හ. අනතුරුව තථාගතයන් වහන්සේ උන්වහන්සේලාගේ සැකය දුරු කරණු සඳහා මජ්ඣිම නිකායේ සඳහන්වන සාටිකාර සූත්‍රය දේශනා කර සෘධි බලයෙන් කාශ්‍යප බුදුන්ගේ යොදුනක් උස් වූ රන් චේතිය හා අනෙක් චෛත්‍යයක් අහසේ මවා මහ ජනයාට දක්වා බ්‍රාහ්මණය මෙබඳුවූ පූජාර්හ පුද්ගලයන්ට පූජා කිරීම යුතුකමකැයි පවසා මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් වන පරිදි බුද්ධාදීන්ට සතර ස්තූප කිරීමට සුදුසු ථූපාරහා පුද්ගලයන් සිව්දෙන පවසා - ශාරීරික චෛත්‍ය උද්දෙසික චෛත්‍යය පාරිභෝගික චෛත්‍යය විශේෂයෙන් විස්තර කර දී මේ ගාථාව පැවසුහ.

පිදුමට සුදුසු අරහාදි ගුණෙන් යුතු
බුදුවරු රහත්වරු නිතරම වැඳිය යුතු
තුන් බුදුවරුන් වැඳුමෙන් යම් දිනක මතු
දුක් ගිනි නිවී සුව අත්වෙයි සසර පැතූ

උපදිනි කුසල් තුන් බුදුවරු නැමදීමෙන්
සැප දෙයි සසර දුක කරදර නිම වීමෙන්

එහි පූජාකිරීමට සුදුසු පූජා කිරීමට යුතු යන අර්ථයි. **පූජාරහෙ පූජයතො** - වැඳීම් ආදී ද සිවුපසයෙන් ද පූජා කරන්නහුට පූජා කිරීමට යෝග්‍යවූවෝ බුදුන් ආදීන් දක්වයි. **බුද්ධෙ‍නි** - සම්මා සම්බුදුන් වහන්සේ **යදිනි** - යදිවා නැතහොත් යන අර්ථයි. එහි පසේ බුදුන් යනු කියන ලද. **සාචකෙච පපඤ්ච සමතික්කනෙනි** - ඉක්ම වූ තෘෂ්ණා දිටඨිමාන පපංචයන් තරණය කළ තිණණසොකපරිද්දවේ ශෝක වැලපිම් පරිදාවයන් මේ දෙකම ඉක්මවා සිටි යන අරුත ගෙනදෙයි. මෙයින් පූජාවට සුදුසු බව දක්වන ලදී. **තෙනි** - බුද්ධාදීන්ය **නාදිස** යන කී දේ ගැනීම් වශයෙනි. **නිබ්බුතෙ** - රාගාදි නිවීමයි නත්ථි නැත භව වශයෙන් හෝ රාගාදි වශයෙන් නැත. ඒ නිසා **අකුතොභය** නම් **න සක්කා පුඤ්ඤ සඞ්ඛාතුං** - පින් ගැනීමට නොහැකිය. **ඉමෙත්තමපි කෙනචි** - අපි ශබ්දය මෙහි සබඳ කළයුතු **කිසියම්** පුද්ගලයකු විසින් මානයෙන් හෝ එහි පුද්ගලයා විසින් ඒ බ්‍රාහ්මයා ආදීන් විසින් කියා ගැනේ. මානෙන යනු ත්‍රිවිධ මානයෙන් **තීරන ධාරණ** - පුරණ මෙය මෙපමණ යයි නය්‍යාය වශයෙන් තිරණය වේ. **ධාරණ** යනු තරාදියෙන් දැරීමයි. පිරීම නම් අඩක් පිරුණු සැලියක් සේ පිරීමයි. කිසියම් පුද්ගලයෙක් විසින් මේ තුන් මානයෙන් බුද්ධාදි උතුමන් පුදන්නේ පිං විපාක වශයෙන් ගැනීමට නොහැකිය. පරියන්ත රහිත නම් ස්ථාන දෙකකදී පූජා කරන්නේ. පළමුව දානය යොදන්නේ කුමක් හෙයින්ද? බුදුන් වැඩ සිටියදී බුදුනි පුදන්නේ පිං රැස් කිරීම කළ නොහැකිය. නැවත කෙලෙස් පරිනිර්වාණයේදී නිමිති වුවද ස්කන්ධ පරිනිර්වාණයෙන් නිවුන විටද (පිරිනිවන් පෑමට පසුවද) දැරීම භේදය යෙදේ මේ නිසා විමානවත්ථු ඨපකථාවේ - මෙලෙසම සඳහන් වෙයි.

"නියතෙන නිබ්බුතෙ වාපි - බුදුරජාණන් වහන්සේ වැඩ සිටියදී ද පිරිනිවන් පෑ විටද සම සිතම සමඵල ඇතිවේ. සිතේ ප්‍රසාදය නිසා පින්කරණ පුද්ගලයෝ සුගතියට යති.

දේශනාවසානයේ ඒ බ්‍රහ්මණයා සෝවාන් ඵලයට පත්විය. යොදුනක් උස රන් චේතිය දින හතක්ම අහසේ සිටියේය. මහත් සමාගමයක් එක් රැස් වීමක් සිදුවිය. සත් දිනක් නොයෙක් ආකාරයෙන් පූජා කළහ. විවිධ ආගමිකයින්ගේ ලබ්ධි බිඳිමක්ද සිදුවිය. බුද්ධානු භාවයෙන් එම චෛත්‍යය සිඳස්ථානයේම රැඳුනි එහිම එකෙනෙහි මහත් ශෛලමය චෛත්‍යයක් ඇතිවිය. එම මහජන රැස්වීමේදී අසුහතර දහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය සිදුවිය.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ රන්චේතිය පිළිබඳ කථා පුවතයි.

15-1

"සුසුඛං වතා" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ශාක්‍ය ජනපදයේ වැඩ සිටියදී කෝලාහල සංසිඳවනු සඳහා ඤාතීන් නිමිත්තකරගෙන දේශනාකළහ.

ශාක්‍ය කෝලිය වැසියෝ කපිල වත්ථුව හා කෝලිය නගර අතර රෝහිණී නම් නදියේ එකම බැම්මක් බැඳ කුඹුරු ගොවිතැන් කරති. පොසොන් මස ගොයම් මැලවියනවිට දෙනුවර වාසී කම්කරුවෝම රැස්වූහ. එහිදී කෝලිය නගරවාසීන් මෙසේ කීහ. මේ ජලය දෙනුවරටම ගෙනයාමේදී ඔබට ද අපට ද ප්‍රමාණවත් නොවේ. මෙ ජලය අපට එකජල ලාභයකින්ම ශෂ්‍ය සම්පත ලැබේ. අනෙක් අය මේ ජලය අපට දෙන්න. අනෙක් අය එවිට තෙපි අටුකොටු පුරවා සිටින විට අපි රන් රුවන් නිල්මිණි කළු කහවනු ගෙන පැසී මලු ගත් අත් ඇතිව ඔබගේ ගෙවල් දොරවල් ලඟ වී ඉල්ලා බලාසිටිය නොහැකිය. අපගේ අස්වැන්නද එකම ජලයකින් ඇතිවේ. එනිසා ජලය අපට දෙන්න. නැහැ අපිනොදෙමු එසේනම් අපිද ජලය නොදෙමු. මෙලෙස වැඩි වාදවිවාද කර එකෙක් නැගිට එකෙකුට පහර දුන්නේය. ඔහු ද අනෙකාට පහර දෙමින් එකිනෙකා පහරදී රාජකුලයන්ට ජාතියෙන් අපහාස කරමින් කෝලාහලය වර්ධනය කළහ. කොලිය නුවර කම්කරුවෝ තෙපි කපිලවත්ථු වාසීන් ගෙන යව්. යමෙක් නරි - බලු ආදීන් තමන්ගේ සොහොයුරියන් හා සහවාසයේ යෙදුනේද. එවැනි නොපගේ ඇතුන්ද අශ්වයෝද කඩු පලිහි ආදී ආයුධ අපට කුමක් කරත්ද? එවිට ශාක්‍ය කම්කරුවෝ කුෂ්ට රෝගයෙන් පෙළන තොපි දරුවන් ද ගෙන අනාථවූ ජන්මයක් නැති තිරිසනුන් සේ කොළොම් ගස්යට විසුවෝ තොපගේ කඩු පලිහ ඇත් අස් සේනා අපට කුමක් කෙරෙත්ද? මෙසේ දොස් නගාගත් විට එම කර්මාන්තයේ යෙදූ ඇමතිවරුන්ට කිව්හුය. ඇමතිවරු රාජ කුලයන්ට කීහ. අනතුරුව ශාක්‍යයෝ සොහොයුරියන් හා සංවාසයෙන් ඇති වූ වන්ගේ ශක්තියත් බලයත් පෙන්වන්නෙමුයි යුද්ධයට සැරසී නික්මුනාහුය. කෝලිය වාසීන්ද කොළොම් ගස්යට විසුවන්ගේ ශක්තිය බලය පෙන්වන්නෙමුයි යුද්ධයට සැරසී නික්මුනාහුය. බුදුරජාණන් වහන්සේ ද

අළුයම ඤාතීන් දැක මා නොගියොත් මොවුන් නැසෙන්නෝයයි ම විසින් යාම වටියයි සිතා හුදකලාවම අහසින් වැඩමවා රෝහිණී නදියේ මැද අහසේ පළක් බැඳ වාඩි වුහ. නැයෝ බුදුන් දැක ආයුධ විසිකර වැන්දාහුය. අනතුරුව බුදුහු ඔවුන්ට මෙසේ පැවසුහ. මහ රජ මේ යුද්ධය කුමක්ද? ස්වාමීනි අපි නොදනිමු. මෙය දන්නේ කවරෙක්ද? හමුදාපති දනී. සේනාපති යුවරජ දන්නේ යයිද උපායෙන් දාස කම් කරුවන් දක්වා ම විමසා ස්වාමීනි ජලය පිළිබඳ යුද්ධයකැයි පැවසුහ. ජලය කෙතරම් වටිද මහරජ ස්වාමීනි ස්වල්පයකි. මහරජ ක්ෂත්‍රියෝ කෙතරම් අනර්ඝද? ස්වාමීනි ක්ෂත්‍රියෝ නම් බෙහෙවින් අනර්ඝ වුවෝ වෙති. එසේ නම් සුළු වටිනා කමක් ඇති ජලය නිසා වටිනා ක්ෂත්‍රියයන් විනාශ කිරීම සුදුසු නොවේමය. ඔවුහු නිහඬවුහ. අනතුරුව බුදුහු ඔවුන් අමතා ඇයි මහරජ වරුනි මෙබඳු දේ කරන්නෙ, මම නොසිටියේ නම් අද ලේ ගඟක් ගලනු ඇත. ඔබවිසින් නොසුදුසු දෙයක් කරණලදී තෙපි පස්විධ වූ වෛරයෙන් යුතුව වාසයකර වූ මම අවෛරීව වාසය කරමි. තෙපි කෙලෙස් වලින් රෝගිව වාසය කරවු. මම කෙලෙසුන් ගෙන් තොරව නිරෝගීව වෙසෙමි තෙපි කාම ගුණයන් සොයමින් වාසය කරවු. මම කාමගුණයන්ගෙන් බැහැරව අනාතුරව වාසය කරමියි පවසා මේගාථාව දේශනාකළහ.

ජීවන්වන්න ඕනෑනම් ඔබ සුවසේ
මෙත් සිත් උපදවනු මැන වයිර වෙනුවට
මිනිසුන් අතර කෙළෙසුන්ගෙන් නිති ලෙඩ වූ
නැති කොට කෙළෙස් නිරෝගිවැ සිටිය යුතු
පස්කම් සුව සොයන අයගෙන් එක පිම්මේ
වෙන්වී අනාතුරවමැ දිවි ගෙවිය යුතු

වෛරීන් අතර අවෛරීව සුවසේ ජීවත් වෙමු. වෛරී මිනිසුන් අතර අවෛරීව වාසය කරමු. ආතුර වූ මිනිසුන් අතර අනාතුරව සුවසේ ජීවත් වෙමු රෝගී වූ මිනිසුන් අතර නිරොගීව වාසයකරමු. කෙලෙසුන් සෙවීමට උනන්දුවන මිනිසුන් අතර පස්කම් නො සොයන අයලෙසම වාසය කරමු.

එහි **සුසුඛ නම්** - සුදුසු සුවයයි. මෙය කියන ලදී යම් ගිහිවු අය අත්පා සිඳදමමින් හෝ, පැවිදි වුවෝ වේදකම් ආදිය වශයෙන් ජීවන වෘත්තිය උපදවා සුවසේ ජීවත්වෙමු යයි කියත්ද? වෛරී මිනිසුන් අතර අවෛරීවද කෙළෙසුන්ගෙන් ලෙඩවූවන් අතර කෙළෙසුන්ගෙන් තොරව නිරෝගීවද පස්කම් සුව සොයන රෝගීන් අතර එයින් නිරෝගීවද ජීවත්වෙමු. සෙස්ස කියන ලද පරිද්දෙන්මය. දෙසුම අවසන බොහෝදෙන සෝවාන් ඵලයේ පිහිටියහ.

ඤාති කළහය සංසඳවීම පිළිබඳ කථා පුවතයි.

15-2

"සුසුඛං වත" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ පඤ්චපාල නම් බ්‍රාහ්මණ ගමෙහි වැඩසිටියදී මාරයා අරමුණු කරගෙන දේශනා කළහ.

එක් දිනක් බුදුහු පන්සියයක් කුමරියන්ගේ සෝවාන් ඵලයට හේතු සම්පත් දැක ඒ ගමම ඇසුරු කොට ගෙන වැඩවාසය කරති. මේ කුමාරිකාවෝද නැකැත් දවසේ ගඟට ගොස් නා සැරසී, නගරය දෙස බලා පිටත්වූහ. බුදුරජාණන් වහන්සේ ද එම ගමට පිවිස පිඬුපිණිස හැසිරෙති. අනතුරුව මාරයා මුළු ගමේම මිනිසුන්ගේ සිරුරුවලට ආවේශ වී බුදුන්ට බත් හැන්දක් තරම්වත් නොලැබෙන ලෙසට කටයුතු කළේය. මෙසේ කොට පාත්‍රය සෝදා ගෙන වඩින බුදුන් වෙත ගම් දොරදී මෙසේ පැවසුවේය. ශ්‍රමණය පිණ්ඩපාතය නොලැබුනේද? බුදුහු ඇයි මාරය එබඳු දෙයක් ඔබ කළේ. එසේනම් ස්වාමිනි නැවත වඩින්න. එහිදී නැවත බුදුන් වැඩම කළේනම් සියල්ලන්ගේ සිරුරට ආවේශ වී බුදුන් ඉදිරියේ අත්පුඩි ගසා කෙලිකවටකම් කරන්නෙමියි සිතීය මේ අවස්ථාවේදීම ඒ කුමාරිකාවරු ගමට පිවිස බුදුන් දැක වැඳ එකත් පසෙක සිටියාහුය. මාරයා ද ස්වාමිනි පිණ්ඩපාතය නොලැබීමෙන් බඩගිනි දුකෙන් පෙළෙන්නේද කියා විමසීය. බුදුහු පාපි මාරය ! අපි කිසිවක් නොලැබද බඩගිනි දුකෙන් නොපෙළී ආහස්සර ලොව මහබඹු ලෙස ප්‍රීතිසුවයෙන්ම කල් ගත කරන්නෙමුයි පවසා මේ ගාථාව පැවසුහ.

රා දොස් මෝහ ඈ
කිසිවක් නොමැති උතුමෝ
"ආබස්සර" බඹුන් මෙන්
සැපෙන් සතුටෙන් සිටිති හැමදා

යම්බඳු අපට රාගාදි කිසි පලිබෝධයක් නැත් ද එසේ වූ අපි ඒකාන්තයෙන් ඉතාසුවසේ ජීවත් වෙමු. ආභස්සර බ්‍රහ්මයන් ලෙස ප්‍රීතිය ආහාර කොට ඇත්තෝ වෙමු.

නත්ථි යෙසං නොති - එහි යම් අපගේ පළිබෝධ වශයෙන් රාගාදි බාධකයක් නොමැතිද **පීතිභක්ඛා ආභස්සර** දෙවියන්ලෙසට ප්‍රීතිය අනුභව කරමින් ප්‍රීතිසුව කමින් කල් ගත කරන්නේද එසේම කල්ගත කරමු. අපිද මෙසේ වන්නෙමු. යන අර්ථයි. මේ දේශනය අවසානයේ පන්සියයක් කුමරියෝ සෝවාන් ඵලයේ පිහිටියහ.

මාරයා පිළිබඳවූ කථා පුවතයි.

15-3

"ජයං වෙරං" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී කොසොල් රජුගේ පරාජයවීමක් නිමිත්ත කරගෙන දේශනා කළහ.

මේ රජු කාසි ගම නිසා බැහැ වූ අජාසත් කුමරු සමග යුද්ධ කර ඔහු විසින් තෙවරක්ම පරාජය කරණ ලද්දේ තෙවැනිවර මෙසේ සිතුවේය. මට කිරිසුවඳ කටින් නොගිය බාලයෙකු පරාජය කිරීමට නොහැකිවීමි. මේ ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක්ද? මෙසේ සිතමින් උපවාස කරමින් ඇඳේ වැතිරී සිටියේය. මෙම ආරංචිය මුළු විහාරයේත් නුවරත් පැතිරගියේය. භික්ෂූන් වහන්සේලා ස්වාමීනි ! කොසොල් රජු කාසි ග්‍රාමය සඳහා තුන් වරක් යුද්ධ කොට පරාජය වී, කටින් කිරි සුවඳ නොගිය කෙනෙකු පරාජය කිරීමට මට නොහැකි වී යයි, ද එනිසා මේ ජීවිතයෙන් වැඩක් නැතැයි ද ආහාර වර්ජනය කර ඇඳෙහි හොත්තේ යයි, බුදුරදුන්ට දැනුම් දුන්හ. බුදුරජාණන් වහන්සේ උන්වහන්සේලාගේ කථාව අසා මහණෙනි, ජයගැනීමෙන් වෛරය ඇතිවේ. පැරදීමෙන් දුකක් ඇතිවේ. යනුවෙන් පවසා මේ ගාථාව දේශනාකළහ.

දිනුවොත් යුද්ධයෙන් වයිරය ඇති	**වේවී**
පැරදුන හොත් දුකින් වැතිරී නිදි	**යාවී**
වෙන් වූ මේ දෙකින් සාමය ලැදියා	**වී**
දුක් කරදර කිසිත් නැතිවම	**සැනසේවී.**

අනුන් පරාජය කිරීමෙන් වෛරය ඇති කෙරෙයි. පරාජයට පත් නැනැත්තා දුකසේ හොවී උපශාන්ත නැනැත්තා සුවසේ සිටී. එතුමා ජය පරාජය දෙකම අත්හරින ලද්දේ වේ.

ජය යනු අන්අය පරාජය කිරීමෙන් වෛරයට ලක් වේ. පරාජිත නැනැත්තා කවදා හෝ පස මිතුරා පිටු දකිමිදුයි දුක් විඳි **දුක්ඛංසෙති** - සියළු ඉරියාපථ යන්ගෙන් දුකම ලබයි. යන අරුතයි උපසනතා යනු අභ්‍යන්තරයේ ඇතිවන

රාගාදි කෙලෙස් නැති රහතන් වහන්සේ ජය පරාජය දෙකම අත්හැර සුවසේ සිටී. සියළු ඉරියාපථයන්හි සුවසේම වාසය කරයි. යන අරුතයි. දේශනය අවසානයේ බොහෝදෙන සෝවාන් ආදීඵලවලට පත්වූහ.

කොසොල් රජු පරාජය වීම පිළිබඳ කථා පුවතයි.

15-4

"**නත්ථි රාගසමෝ'නි**" ඉමං යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩසිටියදී එක්තරා කුල දූරියක් නිමිති කරගෙන දේශනාකළහ.

ඇගේ දෙමාපියෝ ඇය විවාහකර දෙන මංගල උත්සව දිනයේදී බුදුරදුන්ට ආරාධනා කළහ. බුදුහු භික්ෂුසංඝයා පිරිවරා ගෙන එහි වැඩමකර වැඩසිටියහ. එම මනාලියද? මැනවින් භික්ෂූන් වහන්සේලාට ජලය පෙරීම් ආදිය කරමින් ඔබ මොබ හැසිරෙයි. ඇගේ ස්වාමීයා ද ඒ ඒ දේ බලමින් සිටියේය. ඇය දෙස රාගික වශයෙන් බලාසිටි ඔහුගේ ඇතුලත කෙළෙස් මුදාහැරියේය. ඔහු නුනුවණින් පෙලුනේ බුදුරජාණන් වහන්සේට හෝ අසුමහ ශ්‍රාවකයින්ට උවටැන් නො කළේය. අත දිගහැර ඒ මනාලිය ගන්නෙමියි සිතුවේය. බුදුහු ඔහුගේ එම අදහස දැනගෙන එම ස්ත්‍රිය නොපෙනෙන ලෙසට අදිටන් කළහ. ඔහු බිරිඳ නොදැක බුදුන් දෙස බලා සිටියේ. ඔහු බලා සිටින විට බුදුහු කුමාරය, රාග ගින්න හා සමාන වෙනත් ගින්නක් නැත. දේව්ශය හා සමාන කිලුටක් නැත. ස්ඛන්ධ පරිහරණය තරම් දුකක් නැත. නිවන් සුවය හා සමාන සැපයක් නැතැයි පවසා මෙම ගාථාව පැවසුහ.

රාගය වැනි වූ ගින්නක් තුන් ලොවේ	නැත
තරහව වැනි වූ කැලලක් තුන් ලොවේ	නැත
පස්කඳ දුරුම සැරසුම වැනි දුකක්	නැත
පරමවූ සුවය නිර්වාණය නමින	ඇත

එහි - **නත්ථි රාග සමෝ** - දුම ජලය හෝ අඟුරු හෝ නොදක්වා ඇතුලතම දවා අළුමිටක් කිරීමට පටන් රාගය හා සමවූ අනෙක් ගින්නක් නම් නැත. **කලී** යනු දොශය හා සමාන අපරාධයක් ද නැත. **ඛන්ධසමා** යනු පඤ්චස්කන්ධය හා සමාන පරිහරණයෙන් ඇතිවන වෙනත් දුකක් නැත.

182

සන්තිපරං යනු නිවන හා සමානවූ වෙනත් උත්තරීතර සැපයක් ද නැත. **නිබ්බාණං** පරමං සුඛං යන්නේ අදහස එයයි.

දේශනය අවසන මනාල කුමරිය සෝවාන් ඵලයේ පිහිටියහ. එම අවස්ථාවේදී බුදුහු එකිනෙකා පෙනන ආකාරයට අදිටන් කලහ.

එක්තරා කුලදුවක පිළිබඳවූ කථාපුවතයි.

15-5

"පිගඑජා" - යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ අලවි නුවර වැඩසිටියදී එක් උපාසක කෙනෙකුන් නිමිති කරගෙන දේශනා කළහ.

එක් දිනක් බුදුහු දෙව්රම ගඳකිළියේ වැඩසිටියදී අළුයම ලොව බලන්නේ අලවි නුවර වැසි එක්තරා දුගී මිනිසෙකු දැක ඔහුගේ හේතු සම්පත් දැක පන්සියයක් භික්ෂූන් පිරිවරාගෙන අලවිනුවරට වැඩමකළහ. අලවි පුර වැසියෝ බුදුන්ට ආරාධනාකළහ. ඒ දුගී මිනිසා ද බුදුන් වැඩියේය අසා බුදුන්වෙත එළඹ ධර්මය අසන්නෙමියි සිතක් ඇති කර ගත්තේය. එදිනම ඔහුගේ එක් ගවයෙක් පළා ගියේය. එනිසා ඔහු ගවයා සොයා යන්නේද ධර්මය අසන්නේදැයි සිතා ගවයා සොයාගෙන පසුව ධර්මදේශනය අසමියි සිතා අළුයම ගෙයින් නික්මුනේය. නගර වැසියෝ බුදුන්ට ආරාධනාකර වඩා හිඳුවා බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට දන් පිරිනමා අනුමෝදනය සඳහා පාත්‍රය ගත්තාහුය. බුදුරජාණන් වහන්සේ යමෙක් උදෙසා තිස්යොදුන් මග ගෙවා පැමිණියේද ඔහු ගොනෙක් සොයමින් වනයට ගිය නිසා ඔහු පැමිණිවිට ධර්මය දේශනා කරන්නෙමියි නිහඬ වුහ. එම පුරුෂයා ද දවල්වී ගොනා දැක ගවගාලට ගෙනගොස් දමා ඉදින් අනෙකක් නැත බුදුන් දැක වැඳීම් පමණක් හෝ කරමියි. බඩගින්නෙන් පෙලුනේද ගෙදර යාමට නොසිතා පැමිණ බුදුන් වැඳ එකත් පසෙක සිටියේය. බුදුහු ඔහු වාඩිවී සිටියදී උපස්ථායකයින්ගෙන් භික්ෂුසංඝයා වළඳා ඉතිරිවූ දෙයක් තිබේදැයි විමසා ස්වාමිනි සියල්ල ඇත යැයි පැවසුවිට එසේ නම් මේ තැනැත්තාට කෑම දෙන්නැයි පැවසුහ. ඔහු බුදුන් පැවසූ තැනම ඔහු වාඩි කරවා කැඳ බත් ආදී කෑයුතු පානය කළ යුතු ආදියෙන් හොඳින් සැලකුහ. ඔහු බත් අනුභව කොට කට සේදුවේය. මෙතැන හැර ත්‍රිපිටකයේ කවර තැනකවත් බුදුරජාණන් වහන්සේගේ ආහාර පිළිබඳ විමසීමක් දක්නට නොලැබේ. ඔහුගේ කරදර නිසා විසිරී ගිය සිත එකඟවිය. අනතුරුව බුදුහු අනුපිළිවෙල කථාව කර සිව්සස් දේශනය කළහ. ඒ තැනැත්තා දේශනය අවසානයේ සෝවාන් ඵලයේ පිහිටියේය. බුදුන්ද අනුමෝදනා කර නැගීසිට වැඩම කළහ. මහජනයා බුදුන් පසුපස ගමන්කර නැවතුනහ. භික්ෂූන් වහන්සේලා බුදුන් හා ගමන් කරමින්ම උස්හඬින් කථාකරමින් බලන්න ඇවැත්නි බුදුරජාණන් වහන්සේගේ ක්‍රියාව

අනෙක් දිනවල මෙබඳු දෙයක් නොකරති. අද එක් මිනිසෙක් දුටුවිටම කැඳබත් ආදිය ගැන විමසා දෙවීය. බුදුහු නැවතී සිටගෙන මහණෙනි කුමක් කියවුදැයි විමසා එම කරුණ දැනගෙන එසේය මහණෙනි. මම තිස් යොදුන් මගගෙවා කතර පසුකර පැමිණියේ ඒ උපසකගේ හේතුසම්පත් දැනගෙනය. ඔහු අළුයම සිට අතිශයෙන් කුසගිනි වී ගොනෙකු සොයමින් කැලෑවේ හැසිරුනේ ය. කුසගින්නෙන් වේලී සිටියදී ධර්මදේශනා අවබෝධ කර ගැනීමට නොහැකි යයි සිතා මෙලෙස කළෙමි. කුසගින්න තරම් තවත් රෝගයක් නැතැයි පවසා මෙම ගාථාව දේශනා කළහ.

හැම රෝ අතර බලවත් රොව බඩගින්නයි.
අන් හැම දුකට වැඩියෙන් එයදුක දන්නයි
බඩගිනි කෙනා බුදුබණ දහමත් පන්නයි
බඩගිනි නිවුම මුල් වශයෙන් කළයුත්තයි.

ජිගච්ඡා පරමා රොගා බඩගින්න බලවත් රෝගයයි පඤ්චඋස්කන්ධය බලවත් දුකයි. මෙ ඇති සැටියෙන් දැන නිවන පරම උතුම්ම සැපයයි දැනගන්න. එහි ජිගච්ඡා පරමා රොගා - බලවත් රෝගය නම් අනෙක් රෝගාබාධ වරක් හෝ සුව කළ හැකිය. දෙවන වශයෙන් යටපත්වේ. බඩගින්න නම් නිතරම පිළියම් ප්‍රතිකාර කළ යුතුමය. රෝගයන් අතර මෙය පරම රෝගයයි සඞ්ඛාරා - යනු පඤ්චස්කන්ධයයි එතං ඤත්වා මෙය දැන බඩගින්න තරම් රෝගයක් නැත. ස්කන්ධ පරිහරණය සමාන දුකක් නැත මේ කරුණ ඇති සැටියෙන් දැන නුවණත්තා නිවණ අවබෝධ කරයි. නිබ්බාණං පරමං සුඛං නිවන පරම සුවයයි එය සියලු සුව අතර උසස්ම සුවය යන අර්ථයි දෙසුම අවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

එක්තරා උපාසකයෙකුගේ කථා පුවතයි.

15-6

"ආරෝග්‍ය පරමා ලාභා" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩ සිටියදී පසේනදී කොසොල් රජු නිමිති කරගෙන දේශනා කළහ.

කොසොල් රජු සහල් දොණයක (නැලි සොළසක) බත් ද එයට අනුරූප ව්‍යඤ්ජන ද අනුභව කරයි. රජු එක දිනක් උදේ ආහාර අනුභව කොට බත් මතය දුරුනොකර ම බුදුන් වෙත ගොස් ක්ලාන්ත ස්වරූපයෙන් එහා මෙහා පෙරළෙමින් සිටියේය. නිදිමතින් පෙලුනේ සෘජුලෙස නිදාගැනීමට නොහැකිව එකත්පසෙක වාඩිවිය. අනතුරුව බුදුරජාණන් වහන්සේ මෙසේ පැවසුහ. ඇයි මහරජ විවේක නොගෙනම පැමිණියේද? එසේය ස්වාමීනි අනුභව කළ තැන්සිට මට මහා දුකක් ඇතිවේ. අනතුරුව බුදුහු මහරජ බොහෝ ආහාර ගැනීම දුකක් වේ යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

මිද්ධි යදා හොති මහඝසොව
නිද්දායිතා සම්පරිවත්තත යායී
මහා වරා හොව නිවාප පුටෝ
පුනප්පුනං ගබ්භ මුපෙති මන්දෝ

"මිඬි යදා හොති" - නිදිමත තැනැත්තා දැඩි නිදිමතින් නිදාගන්නේද පෙරෙළෙමින් නිදාගනී. කෑමගත් මහා ඌරෙකු සේ නැවත නැවත ප්‍රමාදයෙන් නිදන තැනටම පැමිණේ.

මෙම ගාථාවෙන් අවවාද දී මහරජ භෝජනය නම් පමණ දැන ගතයුතුය. පමණ දැන ගැනීමෙන් සුවය වේ. තවදුරටත් අවවාද දෙමින් මේ ගාථාව පැවසුහ. සිහි ඇති මිනිසා ලද භෝජනයේ පමණ දැන පමණට ආහාර ගනී. එලෙස නොවී මෙන් ඔහුගේ සිරුර වේදනා ඇතිකරයි ඉක්මනින් දිරායයි ආයුෂ ද සීමා වේ.

මනුජ සස සදා සතිමතො
මතතං ජාන තො ලඳධ හොජතෙ
තනුතසස භවනති වේදනා
සනිකං ජීරති ආයු පාලයනති

රජුට ගාථාව ඉගෙන ගැනීමට නොහැකිවිය. ලඟ සිටි සුදස්සන නම් බෑනා වූ තරුණයාට ගාථාව ඉගෙන ගන්නැයි පැවසුවේය ඔහු මේ ගාථාව ඉගෙන ගෙන මම කුමක් කරනේදයි බුදුන් ගෙන් විමසුවේය. එහිදී බුදුරජාණන් වහන්සේ පැවසුහ. රජු ආහාර ගන්නා විට අවසාන බත්පිඬුව ගන්නාවිට මේ ගාථාව කියන්න. රජු අර්ථය සලකා අවසාන පිඬුව විසි කරණු ඇත. එම පිඬුවේ බත්ඇට ගණනට සිරිලන සේ රජුට බත් උයන අවස්ථාවේ සහල් ප්‍රමාණය අයින් කරන්න. ඔහු ස්වාමීනි යහපතැයි සවස ද උදේ ද - රජු ආහාර ගන්නා විට අවසාන බත් පිඬුව ගන්නා අවස්ථාවේදී ගාථාව පැවසුවේය. එවිට අත්හරින බත් පිඬුවේ ඇටගණන අනුව සහල් අඩුකළේය. රජුද ඔහුට ගාථාව අසා දහසක් පරිත්‍යාග කළේය. ඔහු පසුකාළයේදී නැළියක් පමණ බත් ගැනීමෙන් සිහින් සිරුරක් ඇතිවිය. සුවයට පත්විය. අනතුරුව රජු දිනක් බුදුන්වෙත ගොස් බුදුන් වැඳ මෙසේ පැවසුවේය. ස්වාමිනි දැන් මට සුවයක් ඇතිවිය. මම දැන් මුවෙක් හෝ අශ්වයෙක් ලුහුබැඳ අල්ලාගැනීමට හැකිවෙමි. මෙයට පෙර බෑනා සමග මගේ සටනක් විය. දැන් මගේ වජිර කුමාරි නම් දුව සහෝදරියගේ පුතාට දී ඒ ගම ඇයට නෑමට ගන්නා සුවඳ වර්ග සඳහා දෙන ලදිමි. ඔහු සමග අරගලය විවාදය සන්සිඳුනි මේ කරුණ නිසාද සුවයක් ඇතිවිය. කුසරාජ සමයේ පැවති මාණික්‍ය රත්නයද මුලදී නැතිවිය. එයද දැන් මගේ අතට පත්විය. මෙයද සැපයට කරුණකි. ඔබ වහන්සේගේ ශ්‍රාවකයින්ගේ විශ්වාස වන්තකම කැමතිවන මම ඔබගේ ඥාති දියණියක් ආවාහ කර ගනිමි. මෙයද මගේ සැපයට හේතුවේ. බුදුහු මහරජ නිරෝගිකම නම් උතුම් ලාභයකි. ලදදෙයින් සතුටට පත්වීම තරම් ධනයක් නැත. විශ්වාස වන්තයා සමාන ඥාතියෙක් නැත. නිවණ තරම් සුවයක් ද නැතැයි පවසා මේ ගාථාව පැවසුහ.

උතුම් ලාභය මිනිසෙකුට ඇති - නිරෝගී බව ම යයි දතයුති
සිතේ සතුටම උතුම් සම්පත නිවන් සුවමයි උතුම් සුවසෙත
විස්වාසයයි හොඳම නෑයා - බුදුන් දෙසුවේ කොසොල් රජුහට

එහි **ආරෝග්‍ය පරමා**" නිරෝගීබව උතුම් ලාභයයි. රෝගී බව දක්නට ලැබුනද ලාබ අලාභ සිදුවේ. එහෙත් නිරෝගී බව සියළු ලාභ ගෙන ආයේ වෙයි. ආරොග්‍ය පරමා ලාභා යන්න එහෙයින් කියන ලද්දේ

සන්තුට්ඨි පරමං ධනං ගිහි පැවිදි කාටත් තමා ලබන සතුට අන් ධනයන්ට වඩා උතුම් ධනයයි සතුට ඛනාහි සෙසු සියළු ධනයන්ට වඩා උතුම් වූ පරම ධනයයි. **විස්සාස පරමාඤාති** මව හෝ පියා හෝ ඔහු සමග ලබන තමන් සතු විශ්වාසය නැතද ඤාති නොවන කෙනෙක් සමග හෝ පවතින විශ්වාස වන්ත බව උතුම් ඤාතිත්වයයි **විස්සාස පරමා ඤාති** යන්න එහෙයින් කියන ලදී. නිවන හා සමවූ සුවයක් නම් නැත. **නිබ්බාණං පරමං සුඛං** යන්න එහෙයින් කියන ලදී.

දේශනය අවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

පසේනදී කොසොල් රජුගේ කථාපුවතයි.

15-7

"පවිවෙකරසං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ විශාලාවේ වැඩසිටියදී එක්තරා භික්ෂුවක් නිමිති කරගෙන දේශනා කළහ.

ශාස්තෘන් වහන්සේ මහණෙනි මම මෙයින් මාස හතරකට පසුව පිරිනිවන් පාන්නෙමියි පැවසුවිට බුදුන් ළඟ සත් සියයක් භික්ෂූන් වහන්සේලා සන්ත්‍රාසයට පැමිණියාහු වෙති. රහතන් වහන්සේලාට ධර්ම සංවේගය ඇතිවිය. ප්‍රථජ්ජන භික්ෂූහු කඳුළු වැගුරූහ. භික්ෂූන් වහන්සේලා වර්ග වෙමින් කුමක් කරන්නෙමු දැයි කථාකරමින් හැසිරෙති. මේ අතර තිස්ස තෙරුන් නම් එක්නමක් බුදුරජාණන් වහන්සේ සිවි මසකින් පිරිනිවන් පාන්නාහ. මම කෙළෙස් සහිතය බුදුරජාණන් වහන්සේ වැඩසිටියදීම මවිසින් අර්හත්වය ගැනීම වටනේයැයි සිතා සිවු ඉරියව්වෙන් එක ඉරියව්වකින් වාසය කළේය. භික්ෂූන් වහන්සේලා සමග ගමන් කිරීමක් හෝ කිසිවෙකු සමග කථා කිරීමක් හෝ නැත. අනතුරුව උන්වහන්සේට භික්ෂූන් වහන්සේලා මෙලෙස පැවසුහ. ඇවැත්නි තිස්ස කුමක් හෙයින් මෙලෙස කරමුදයි විමසුහ. එම කථා නො ඇසුනිසා උන්වහන්සේ පිළිබඳව බුදුන්ට දැනුම් දුන්හ. ස්වාමීනි තිස්ස තෙරුන් ඔබ වහන්සේට ස්නේහයක් නැත. බුදුහු එම තෙරුන් කැඳවා තිස්ස ඔබ මෙසේ කරන්නේ කුමක් හෙයින්ද? එම තෙරුන් විසින් තමන්ගේ අභිප්‍රාය දැනුම් දුන්විට සාධුකාරදී මා කෙරෙහි ස්නේහය ඇත්තෙක් වේ නම් ඔහු තිස්ස හා සමාන කෙනෙක් වේවා. සුටඳමල් ආදිය පුජා කරන්නා මා පුජා කරන්නේ නොවේ. ධර්මානු ධර්ම පිළිපදින් නෝම මට පුජාකරන්නෝ වෙති. වදාරාමේ ගාථාව වදාළහ.

හුදෙකලා රසය ද - නිවන් රසය ද යන
දෙරස බොන ඇත්තා - දාහ නැති කොට පව් ද නස්නේ.

එහි **පවිවේකරසං** යනු විවේකයෙන් උපන් රසයයි හුදෙකලා බවට සැපයයි යන අර්ථයි. **පීතිපා** - යනු දුක අවබෝධ කරන්නේ අරමුණු වශයෙන් අවබෝධ කර ගනිමින් නිවන සාක්ෂාත් කිරීම් නම් වූ රසය බී. උපසම්සසව

- යනු ක්ලේශ උපසමනය නම් වූ නිවන් රසයමයි **නිඳුරොහොනි** මේ රස දෙකම පානය නිසා ක්ෂිණශ්‍රව භික්ෂුව අභ්‍යන්තරයේ රාගාදි කරදර නැති නිසා කෙලෙස් දාහ නැත්තෙක් ද පව් නැත්තෙක් ද වේ. **රසං පිබං** නවවිධ ලෝකෝත්තර ධර්ම වශයෙන් උපන් ප්‍රීති රසය පානයකරමින් කරදර නැත්තෙක් ද පවිකම් නැත්තෙක් ද වේ අර්ථය දෙයි. දේශනය අවසන තිස්ස තෙරුන් අර්හත්වයට පත්වුනි. මහජන යාට ද දේශනය සාර්ථක විය.

එක්තරා භික්ෂුවක් පිළිබඳ කථා පුවතයි.

15-8

"සාහු දස්සන" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ බේලුව ගමේ වැඩ සිටියදී සක්‍රදේවේන්ද්‍රයා නිමිති කරගෙන දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේ ආයු සංස්කාර අත්හැරීමෙන් පසු ලේ පාචනය ඇතිවූ බව දැනගෙන සක් දෙවිරජ ම විසින් බුදුන්වෙත ගොස් ගිලානෝපස්ථානය කිරීම වටීයයි සිතා තුන් ගවු පමණ වූ ආත්මභාවය අත්හැර දමා බුදුන් වෙත එළඹ අත් පා පිරිමැදීය. අනතුරුව බුදුහු මේ කවරෙක් දැයි විමසුහ. ස්වාමීනි මම ශක්‍රදෙවියායි. කුමක් නිසා පැමිණියේද? ඔබවහන්සේ ගිලන්වූ නිසා උවටැන් කිරීමට පැමිණියෙමි. ශක්‍රය දෙවියන්ට මිනිස් ගඳ යොදුන් සියයක් දක්වා (හමයි) ගෙලබැදි කුණපයක් ලෙසට මිනිස් ගඳ වෙයි. ඔබ යන්න මට උවටැන් කිරීමට භික්ෂූන් ඇත. ස්වාමීනි මම යොදුන් අසුහතර දහසක් දුර සිටිය දී ඔබවහන්සේගේ සිල් සුවඳ ආශ්වාදනය කර ආවේමි. මම ම උවටැන් කරන්නෙමි. බුදුරජාණන් වහන්සේ ශරීර මළ පහකරණ භාජනය අන් අයට අතින් අල්ලන්නටවත් නොදී හිසේ ම තබාගෙන බැහැර කරන්නේ මුහුණ ඇකිලීම් පමණවත් නොකළේ ය. සුවඳ බඳුනක් ගන්නාක් මෙන් විය. සිරුර මල භජනය හිසෙන් ගෙන ගොස් බැහැර කළේය. උවටැන් කළේය. බුදුහු ඔහුගේ කථාව අසා මහණෙනෙනි කුමක් කියවු ද මෙය අශ්චර්යක් නොවේ. ශක්‍රදේවේන්ද්‍ර තෙමේ මා කෙරෙහි ස්නේහ කරයි ද මේ සක් දෙවිඳු මා නිසා මහළු ශක්‍ර භාවය දුරු කර සෝවාන් වී තරුණ ශක්‍ර බවට පත්විය. මම ඔහුට මරණ භය තර්ජන ඇතිවුවිට පංචසිඛ ගාන්ධර්ව විද්‍යාපුත්‍රයා පෙරටු කොට පැමිණිවිට ඉන්ද්‍රසාල ගුහාවේදි දෙව් පිරිස් මැද සිටියදී.

"ශක්‍රය ඔබ කැමති යම් ප්‍රශ්නයක් වේ නම් පිළිතුරු මගෙන් විමසන්න ඒ ඒ ප්‍රශ්න වලට මම විසඳුම් දෙන්නෙමි"

මෙලෙස පවසා ඔහුගේ දුක දුරුකරන්නේ ධර්මය දේශනා කළෙමි. දේශනය අවසානයේ දාහතර කෝටියක් ප්‍රාණීන්ට ධර්මාව බෝධය සිදුවිය. ශක්‍රයාද වාඩිවී සිටියදීම සෝවාන් ඵලයට පත් වී තරුණ ශක්‍රයෙක් විය. මෙලෙස මම

ඔහුට බොහෝ උපකාර කළෙමි. එනිසා මා කෙරෙහි ස්නේහය කිරීම අරුමයක් නොවේ. මහණෙනි. ආර්යයාගේ දර්ශනය ද සුවයෙකි. ඔවුන් හා එක් තැනක වාසය කිරීම ද සුවයකි. බාලයන් හා ඇසුර නම් හැමකින්ම දුකකැයි පවසා මේ ගාථා වදාළහ.

දැක අරී සඟ ගණ
උහු හා එක්ව විසුමෙන
බාලයන් දුර ලන
කෙනා සැපයම ලබයි නිතියෙන.

බාලයන් සම ගින්
හැසිරෙන කෙනා නොම ගින්
නෙක කරදර මගින්
විපත් වේමැයි උනට නිසගින්

නැණවතුන් ඇසුරද
නිතර ගරු සිල් රැකුමද
සත්පුරුස ඇසුරද
උදාරයි පැවසුහ බුදුරද

නැණවතුන් සිත සේ
පිළිවෙත් පුරා මනසේ
අහස මැද සඳසේ
සදා බැබළෙනු මැනව සුවසේ.

සානුදස්සන මරියානං ආර්යන්ගේ දර්ශනය හා ඔවුන් සමග විසීම හැම කල්හි සුවයකි. බාලයන් නොදැක්මෙන් ඇසුරු නොකිරීමෙන් සැප ඇත්තෙක් වන්නේය. බාලයන් හා එක්ව හැසිරෙන්නා බොහෝ කල් දුකින් ජීවත්වේ. බාලයා හා එක්ව විසීම සතුරන් සමග විසීමක් වේ. නැණවතා සමග සැපවත් සහවාසය ඥාති සමාගමයක් වැන්න.

මේ නිසා ධිරවු ප්‍රාඥවු බොහෝ ඇසුපිරු තැන් ඇති සීලයෙන් යුත් කෙලෙස් වමාරා දැමු නැණවත් සත්පුරුෂයන් සඳ අහස සේවනය කරන්නාක් මෙන් සේවනය කළ යුතුය.

එහි **සාහු** - යනු සොඳුරු යහපත් **සනතිවාසො** හුදු දැකීම් පමණකි. ඔවුන් සමග එකමතැන වාඩිවීම් ආදී ඔවුන්ට වතාවත් **කිරීම**, යහපතක්ම ය බාලසඬ්ගතචාරී යමෙක් බාලයන් හා ඇසුරු කෙරේද **දීඝමඬ්ඩානං** - යනු යමෙක් බාලයන් හා අත්පා සිදීම් ආදිය කරමු යයි **කීවිට** එවැන්නා හා එකට එකතුවී කරත් ද බොහෝකල් දුක්විදී. **සබ්බ** - යනු යම් **සේ** කඩුගත් අතින් හෝ අවිත්‍ර වූ ආශිර්විෂයන් සමග හෝ එකට විසිම නම් එය නිතර දුකට හේතුවේ. **ධිරොච සුඛ සංචාසො** - මෙහි සුවසේ විසීමනම් එකට එකතු වීමයි. නුවණැත්තන් සමග වාසය සුව ගෙනදේ. **සමාගමො** - ඥාතීන්හා එකතු විම සුව එළවයි. **තසමාහි** යම් හෙයකින් බාලයන් සමග සංවාසය දුකමැයි නුවණැත්තන් හා වාසය සුවය. එහෙයින් උත්සාහ වන්ත වේ. ලෞකික ලෝකෝත්තර ප්‍රඥා සම්පන්න වීමයි. **පඤ්ඤඤං** - අධිගම සම්පන්න වීමයි. බහුස්සුත නම් - අර්හත්වයයි. කෙළෙසුන්ගෙන් දුරුවීම ආර්යත්වයවේ සීලමය වූ බර ඉසිලීම **ධොරයහ සීලං** - සිල්වන්ත බවද, ධුතඬ්ග දූරීම ද, **වනවනතං** ක්ලේශය දුරින් දුරු කිරීම **අරියං** එබඳුවූ **සප්පුරිසං** නිර්මල වූ ශෝභන ප්‍රඥාව අහස සඳ ඇසුරු කරණ ලෙසට සත්පුරුෂයන් ඇසුරු කරන්න. යන අරුතයි. දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පත්වුහ.

සක්දෙව්රජ පිළිබඳ කථා පුවතයි.

සුඛ වර්ග වර්ණනාව නිමියේය.

පසළොස්වැනි වර්ගයයි.

16-1

"අයොගෙ" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවරම වැඩ සිටියදී පැවිද්දන් තිදෙනෙක් නිමිති කරගෙන දේශනා කළහ.

සැවැත් නුවර එක්තරා කුළයක මව්පියන්ට ප්‍රිය වූ එක් පුතුයෙක් සිටියේය. එක් දිනක් ගෙට ආරාධනා කළ භික්ෂූන් වහන්සේලා ගේ අනුශාසනයක් අසා ඔහු පැවිදිවනු කැමතිව මවු පියන්ගෙන් පැවිදි වීමට අවසර ඉල්ලීය. ඔවුහු අනුමත නොකළහ. අනතුරුව ඔහුට මෙබඳු අදහසක් ඇතිවිය. මම දෙමාපියන්ට නොපෙනී පිටත ගොස් පැවිදි වන්නෙමි. අනතුරුව පියා බැහැර යන විට මොහු රැකබලා ගන්නැයි මවට පැවරුවේය. මව බැහැර යන විට ඔහු රැක ගැනීමට පියාට පැවරුවේය. මේ අතර දිනක් පියා ගිය විට මව පුතා රැකගන්නෙමියි. එක දොරක් අතින්ද අනෙක පයින් ද මැඩ ගෙන සෙවනේ වාඩිවී නුල් කටිමින් සිටියදී ඔහු ඇය රවටා යන්නෙමියි සිතා මෑණියෙනි ටිකකට සිරුරු කිස කිරීමට ඉඩදෙන්නැයි ඇගේ පා පාගාගෙන එළියට ගොස් වේගයෙන් පන්සලට ගොස් භික්ෂූන්ගෙන් ස්වාමිනි මා පැවිදිකරන්නැයි ඉල්ලා සිටියේය. පසුව එම භික්ෂූන් වෙත පැවිදි විය. අනතුරුව ඔහුගේ පියා ගෙදර පැමිණ මගේ පුතා කොහේදැයි විමසීය. ස්වාමීනි ! දන් මේ අසල සිටියේය. මගේ පුතු කොහේදැයි විමසා බලමින් ඔහු නොදක විහාරයට යන්නට ඇතැයි සිතා එහි ගොස් පුතු පැවිදිවී සිටිනු දැක හඬා දරුවා මා නැසුවේ ඇයිදැයි කියා, මගේ දරුවා පැවිදි වූ විට මම ගෙදර කුමක් කරන්නදැයි ඔහු ද භික්ෂූන්ට ආයාචනාකර පැවිදි විය. අනතුරුව ඔහුගේ මව දරුවා හා සැමියා විහාරයේ පැවිදි වී සිටිනු දැක මට ද ගෙදර සිටීමෙන් ප්‍රයෝජනයක් නැතැයි භික්ෂුණී අරමකට ගොස් පැවිදිවුවාය. ඔවුහු පැවිදි වූවද වෙන්වී සිටීමට නොහැකි විය. මේ නිසා විහාරයේදී ද භික්ෂුණී අරමේදී ද එකට වාඩිවී කථාකරමින් දිවාකල ගතකරති. මේ නිසා භික්ෂූන් අතරත් භික්ෂුණීන් අතරත් කරදරයක් විය. මේ නිසා දිනක් භික්ෂුවක් ඔවුන්ගේ මේ ක්‍රියාව බුදුන්ට දැනුම් දුන්හ. බුදුහු ඔවුන් කැඳවා ඔබ මෙසේ කරන්නේ සැබෑදැයි විමසා එය සැබෑ යයි පවසා සිටිවිට මෙසේ කරන්නේ කුමක් හෙයින්ද මෙය පැවිද්දන්ගේ ස්වභාවය නොවේ. ස්වාමීනි වෙන්වී

සිටීමට නොහැක්කෙමු. පැවිදි වූ තැන්සිට මෙලෙස කිරීම යුතු නොවේ. ප්‍රියන්ගේ නොදැකීම ද අප්‍රිය වූවන්ගේ දැකීම ද දුකක්මය. එනිසා සත්ත්වයන් කෙරෙහි සංස්කාර කෙරෙහිත් ප්‍රිය හෝ අප්‍රිය හෝ කිරීම සුදුසු නොවේ. යයි පවසා මේ ගාථාව පැවසුහ.

නුසුදුසු තැන තමන් යෙදීම ද සුදුසු නැන නොයෙදීම ද පුද්ගල තෙම අර්ථය හැර දමා ප්‍රිය දෙයම ගන්නාවූ ආත්මාර්ථයේ යෙදුනහු පතයි. ප්‍රියකරයි.

ප්‍රිය වූවන් සමග ද අප්‍රිය වූවන් සමගද කිසිදිනෙක එක් නොවවු. ප්‍රියයන්ගේ නොදැක්ම ද අප්‍රියයන්ගේ දැකීම ද දුක් ඇති කරයි.

එනිසා කිසිවක් ප්‍රිය නොකරන්න යම් කෙනෙකුට ප්‍රිය හෝ අප්‍රිය බවක් නැත්ද එවැනි අයට ගැටළු ඇති නොවේ.

යෙදිය යුතු තැන	නුවණ
නොයොදන දනා	අනුවණ
මහණදම් නො	පුරණ
කෙනා දෙව්ලොව ගමන	අවුරණ

පියයන්ගේ වියොව	ද
අප්පියයන්ගෙ ඇසුර	ද
දුක් උපදවයි	තද
දෙපිරිසෙන් වෙන්වීමයි	හොඳ

එහි අයොග - නම් නොයෙදිය යුතු සිහි නුවණින් තොර වීමය. වෛශ්‍ය ආදී නොයෙදිය යුතු ස්ථාන හයක යෙදීමයි. සිහිනුවණින් තොරව තමන් යෙදවීම යන අරුතයි. **යොගයනු** විපරීත වූ සිහිනුවණින් නොයෙදීමයි. **අත්තංහිත්වා** අරුත අත්හැර පැවිදි වූ තැන් සිට අධිසීල ආදී ශික්ෂාත්‍රය යන අරුතයි. එය අතහැර, **පියගාහී** - පඤ්චකාම ගුණ සංඛ්‍යාත ප්‍රිය දෙයම ගන්නේ **පිහෙතත්තානුයොගින** එම ප්‍රතිපත්තියෙන් සසුනෙන් චුත වූයේ ගිහි බවට පත්ව පසුව ආත්මයෝගයේ යෙදුනේ සිල් ආදිය සපුරා

දෙව්මිනිසුන් අතර සත්කාර ලබති. ඔවුන් කෙරේ ප්‍රියවේ. **මා පියෙහි** අහෝ මම ද මෙබඳු ආත්මයක් ලබන්නේ නම් යනුවෙන් කැමති වෙති. ප්‍රිය සත්ත්වයන් අතර සංස්කාර කෙරෙහි හෝ කිසිදින එක්ෂණයකවු නොයෙදේ. අප්‍රියන් කෙරෙහි ද එසේමය. ප්‍රියයන් වියෝග වශයෙන් නොදැකීම ද අප්‍රියයන් එළඹීම් වශයෙන් දැකීම ද දුකකි. **තසමා** - යම් හෙයකින් මේ දෙකම දුකකි. එනිසා කිසි සතෙක් හෝ සංස්ඛාරයන් හෝ ප්‍රිය නොකරන්න. **පියාපායොහි** ප්‍රියයන්ගෙන් වෙන්වීම වියෝගයයි. පාපක - නම් ළාමකයි. **ගච්ඡා තෙසං න විජ්ජනති** - යමෙකුට ප්‍රියක් නැත්ද ඔවුන්ගේ අභිධ්‍යා කාය ග්‍රන්ථ පිරිහේද යමෙකුට අප්‍රිය බවක් නැත් ද ඔවුන්ගේ අභිධ්‍යා කාය ග්‍රන්ථ පිරිහේ. යමෙකුට අප්‍රිය නැත්ද ඔවුන්ට ව්‍යාපාද කාය ග්‍රන්ථ වේ. මේ ප්‍රශ්න යම්තාක් පවතී ද ඒතාක් අනෙක් ග්‍රන්ථ පිරිහේ එනිසා ප්‍රිය හෝ අප්‍රිය හෝ නොකළ යුතුය.

දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පත්වූහ. ඒ තිදෙන අප තිදෙනාම වෙන්වී සිටීමට නොහැකි යයි උපැවිදි බවට පත්ව ගෙදර ගියාහුය.

භික්ෂූන් තිදෙනාගේ කථාපුවතයි.

16-2

"පියතො ජායති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම සිටියදී එක්තරා කෙළඹියෙක් නිමිති කරගෙන දේශනා කළහ.

ඔහු තමන්ගේ පුතුන් කළුරිය කළ විට දරු දුකින් ආකුලව ආදාහන කරණ සොහොනට ගොස් හඬයි. දරු දුක ඉවසා ගැනීමට නොහැකිය. බුදුහු අළුයම් වේලේ ලොව බලන්නේ ඔහුගේ සෝවාන් ඵලයට පත්වීමේ හේතු සම්පත් දැක පිණ්ඩපාතයෙන් වැලකී එක් භික්ෂුවක් පසුපස ගමන් කිරීමට ගෙන ඔහුගේ ගෙදොරට වැඩම කළහ. ඔහු බුදුන් වැඩම කළ බව අසා මා සමග පිළිසඳර කථාවට කැමති යයි සිතා බුදුන් ගෙතුලට පිවිසවා ගේ වැද අසුනක් පනවා බුදුන් හුන්කළ පැමිණ වැඳ එකත් පසෙක වාඩිවිය. ඉක්බිති බුදුහු ඇයි උපාසක දුක්වන්නේ යයි විමසා ඒ දරුවන් ගෙන් වෙන්වීමේ දුක නිසා යයි දන්වුවිට උපාසකය නොසිතන්න. මේ මරණය නම් එකම තැනක එක් අයෙකුටම සිදුවන්නක් නොවේ. භවයේ ඇතිවූ හැම කෙනෙකුටම මේ මරණය සිදුවේ. එක සංස්කාරයක් වුවද නිත්‍ය නොවේ. එනිසා මරණ ධර්මය භේදයකි. සිදුනේ යයි නුවණින් ප්‍රත්‍යවේක්ෂා කළ යුතුය. ශෝක නොකළ යුතුය. පැරණි නුවණැත්තෝ ද දරුවන් මියගිය විටදී මරණය උරුමය. බිඳෙන සුළුයයි ශෝක නොකර මරණ සතියම වැඩුහයි පවසා සිටිවිට ස්වාමීනි ! කවරදා මෙසේ කළහුද? කවුරුන් මෙසේ කළාහුදැයි පවසන ලෙසට ඉල්ලා සිටිය නිසා එය ප්‍රකාශ කරණු සඳහා අතීතය ගෙනහැර දක්වුහ. "උරගොව තචං ජීණං" සර්පයා දිරාගිය හැව අත්හැර යයි. මෙලෙසම මියගිය විට දී තමන් පරිහරණය කළ මේ සිරුර අත්හැර දමයි.

සිරුර දැවෙන විට දී නොදනේ. ඥාතීන් අඬන විට නො ඇසේ. එනිසා ශෝක නොකරම් මියගිය තැනැත්තා යා යුතු තැනට යයි.

මෙසේ පස්වෙනි නිපාතයේ උරග ජාතකය විස්තර කර දී මෙලෙස පෙර නුවණැත්තෝ ප්‍රිය පුතුන් කළුරිය කළ විට යම් සේ හැසිරුනේ ද ඔබ

කර්මාන්ත අත්හැර නිරාහාරව අඬමින් හැසිරේ ද එලෙස නොකර මරණ සති භාවනා බලයෙන් ශෝක නොකර ආහාර ගන්න, කර්මාන්ත කරන්න. එනිසා මගේ ප්‍රිය පුතුන් කළුරිය කළේයයි නොසිතන්න. උපදින සැමට ශෝකයක් බියක් දෙකම ප්‍රිය බව නිසාම උපදියයි පවසා මේ ගාථාව පැවසුහ.

පියයන් නිසා නිතරමසෝ දුක්	ඇතිවේ
පියයන් නිසාවෙන් නිතරම බිය	ඇතිවේ
ප්‍රියයන් හා බැඳුම නැති කැරැමම	සුව වේ
බව දුක නිසා මග පල ලැබුමට	මග වේ

ප්‍රියබව නිසා ශෝකය ඇතිවේ. ප්‍රියයන් නිසා බිය ඇතිවේ. ප්‍රියයන්ගෙන් මිදුනවිට ශෝකයක් නැත. බියක් නැත.

එහි **පියතො** යනු සංසාර වට්ටය මුල්‍යකොට ඇති ශෝකයක් හෝ බියක් හෝ උපදින්නේ ප්‍රිය වූ සත්ත්වයන් නිසා හෝ සංඛාර නිසා ඇතිවේ. එනිසා ඉන් මිදුන තැනැත්තාට මේ දෙකම නැත. යන අරුතයි.

දේශනය අවසානයේ කෙළෙඹියා සෝවාන් ඵලයෙහි පිහිටියේය. පැමිණ පිරිසට ද දේශනය සාර්ථක විය.

එක්තරා කෙළෙඹියෙක් පිළිබඳ වූ කථා පුවතයි.

16-3

"**පෙමතො ජායතීති**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර දෙවිරම් වෙහෙර මැඩ සිටිය දී විශාඛා උවැසිය නිමිති කරගෙන දේශනා කළහ.

ඇය විශාඛාව පුතෙකුගේ දුවක්වූ දන්තානම් කුමරියක තමන්ගේ ස්ථානයේ තබා නිවසට වැඩමවන භික්ෂූන්ට වතාවත් කරවීය. ඇය ටිකකලකින් කළුරිය කළාය. විසාඛාව ඇගේ සිරුරු කිස නිමවා ශෝකය දරාගැනීමට නොහැකිව දුකින් දොම්නසින් කඳුලු වැකුන මුහුණින් යුතුව අඬමින්ම බුදුන්වෙත ගොස් වැඳ එකත් පසෙක වාඩිවුවාය.

මෙහිදී තථාගතයන් වහන්සේ විශාඛාව දැක දුකින් දොම්නසින් කඳුලු පෙරා අඬමින් සිටින්නේ කුමක් නිසාදැයි විමසුහ. ඇය ඒ සියළු තොරතුරු පවසා මට ඉතා ප්‍රියවූ මනා ගතිපැවතුම් ඇති ඇය නැතිවීම නිසා, එබඳු ගති පැවතුම් ඇති වෙනත් කෙනෙක් සොයාගැනීම අපහසුය. බුදුහු සැවැත්නුවර කොතරම් ජනකායක් සිටිදැයි ඇගෙන් විමසුහ. ස්වාමීනි ඔබවහන්සේ මට පැවසූ ලෙසට සත්කෝටියක් ජනතාව සිටිති. ඉදින් මෙපමණ වූ ජනයා ඔබගේ මිණිබිරියන් හා සමාන වන්නේ නම් එලෙස වීමට කැමතිද? එසේය ස්වාමීනි. මේ සැවැත් නුවර දිනකට කීදෙනෙක් මියයත්ද? බොහෝදෙන මියයති. ඉදින් ඒ සියලු දෙන වෙනුවෙන් හඬන්නේනම් එසේ හඬන්නට ඔබට දිවා රෑ වේලාවක් ඉතිරි වන්නේද? එසේ වේවා ස්වාමීනි මම තේරුම් ගනිමි. මට වැටහිණ අනතුරුව බුදුරජාණන් වහන්සේ එසේ නම් ශෝක නොකරන්න. ශෝකය බිය ඇතිවන්නේ ප්‍රේමය නිසාය යයි පවසා මේ ගාථාව පැවසුහ.

දුකට හා බියට ද
මුල්ම හේතුව ප්‍රේමයයි
ප්‍රේමය නොමැති තැන
ඇතිවන්නෙ අම සුවයයි

ප්‍රේමය නිසා ශෝකය ඇතිවේ ප්‍රේමයෙන් බිය ඇතිවේ ප්‍රේමයෙන් මිදුන තැනැත්තාට ශෝකයක් කොහින්ද බියක් කොහින්ද

මෙහි ප්‍රේමය නම් දු පුතුන් නිසා ඔවුන් කෙරෙහි කරණ ලද ප්‍රේමයම වේ.

දේශනය අවසානයේදී බහුජනයා සෝවාන් ආදී ඵලයන්ට පත්වුහ.

විශාඛාව පිළිබඳ කථා පුවතයි.

16-4

"රතියා ජායති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ විශාලාවේ කූටාගාර ශාලාවේ වැඩසිටියදී ලිච්ඡවි කුමාරවරුන් නිමිති කරගෙන දේශනා කළහ.

ඔවුන් එක් දිනක් එකිනෙකාට අසමාන ඉතා අලංකාර වස්ත්‍රා ආභරණ වලින් සැරසී උයනට යාම සඳහා නගරයෙන් නික්මුනාහුය. බුදු රජාණන් වහන්සේ ද පිඬුපිණිස පිටත් වෙමින් ඔවුන් දැක භික්ෂූන් ඇමතූහ. මහණෙනි යම් කෙනෙක් තාවතිංස දෙවියන් නුදුටුවෝනම් මොවුන් බලන්නැයි පවසා නගරයට පිවිසුණහ. ඔවුන් උයනට යන්නේ එක් නගර ශෝභිනියක් ගෙන ගොස් ඇයනිසා ඊර්ෂ්‍යාවෙන් පෙළී එකිනෙකාට පහරදී ලේගඟක් මෙන් විය. අනතුරුව ඔවුන්ව ඇඳන්වල තබා ඔසවාගෙන ආපසු ආවාහුය. බුදුහු ද දානය වළඳා නගරයෙන් නික්මුණිහ. භික්ෂූන් ද මෙලෙස ගෙන යන ලිච්ඡවි කුමාර වරු දැක ස්වාමීනි. ලිච්ඡවී කුමාරවරු උදයේ දෙව්වරු මෙන් සැරසී නගරයෙන් නික් මී දැන් එක් ස්ත්‍රියක් නිසා මෙබඳු ව්‍යසනයකට පත්වුහ. බුදුහු මහණෙනි. ශෝකය හෝ බිය රතිය නිසාම ඇතිවේ. යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

පස්කම් රතියෙ ඇල්මද
ඉතිරින් කෙරෙහි බැල්මද
බිය දුකට මුල් වෙද
එයින් වෙන්වීම මයි නිවරද

රතිය නිසා ශෝකය ඇතිවේ. රතිය නිසා බිය ඇතිවේ. රතියෙන් මිදුනවිට ශෝකයක් නැත. බියක් නොසින්ද

එහි රතිය යනු - පඤ්චකාම ගුණයේ ඇතිවන රතියයි. මේ දේශනය අවසානයේ බොහෝ දෙන සෝවාන් ඵලය ආදියට පත්වුහ.

ලිච්ඡවි කුමාරවරුන්ගේ කථා පුවතයි.

16-5

"කාමනෝ" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී නම් අනිත්ථිගන්ධ කුමාරයෙක් නිමිති කරගෙන දේශනා කළහ.

ඔහු නම් බඹලොවින් චුතවී සැවැත් නුවර මහත් සම්පත් ඇති කුළයක ඉපදුනේ උපන් දින සිටම ස්ත්‍රියක් ලඟට එනුත් නොකැමති වෙයි. ගැහැනුන් වඩාගත් විට හඬන නිසා කඩ කැටියකින් (රෙදිතිරයකින්) වසා ගෙන කිරි පොවති. ඔහු වයසට පත්වූ විට දෙමාපියන් දරුව ! විවාහයක් කරදෙමියි පැවසුවිට මට ගැහැනුන්ගෙන් ප්‍රයෝජනයක් නැතැයි ප්‍රතික්ෂේප කර නැවත නැවත ආයාචනා කරන්නේ පන්සියයක් රන්කරුවන් ගෙන්වා ඔවුන්ට රන් කලං 25ක් සහ කහවනු පන්සියයක් දෙවා ඉතා විසිතුරු ඝනරන් ස්ත්‍රී රුවක් සාදවා නැවත දෙමාපියන් දරුව ඔබ විවාහයක් කරව්. යුවතියක් ගෙන එන්නෙමියි පැවසුවිට එසේනම් මේ රන්රුවට සමාන ස්ත්‍රියක් ගෙන එන්නේ නම් ආවාහය කරන්නෙමි යි රන්රුව දක්විය. අනතුරුව ඔහුගේ දෙමාපියෝ ප්‍රසිද්ධ ප්‍රකට බ්‍රාහ්මණයින් ගෙන්වා අපේ පුතු මහා පින්වතෙකි. එනිසා මෙබඳු යුවතියක් වන්නේ ය. මේ රන්රුව ගෙන ගොස් මෙබඳු තරුණියක් ගෙන එන්න යයි යැවුහ. ඔවුන් යහපතැයි කියා චාරිකාවේ යෙදී මධුරට සාගල නුවරට ගියෝ එනුවර සොළොස් වියැති අභිරූපී කුමරියක් සිටියේය. ඇගේ දෙමාපියෝ ඇය සත්මහල් ප්‍රාසාදයක උඩම තලයේ තබා ආරක්ෂා කළහ. එම බ්‍රාහ්මණයෝ රන්රුව නගරයේ තබා ගෙන ඉදින් මෙබඳු යුවතියක් නගරයේ සිටි නම් මිනිස්සු මේ රන්රුව දැක මෙය අසවල් කුල දුවනිය හා සමානයයි කියති. ඔවුන් එම රුව ගෙන ගොස් තොටුපලට යන මාර්ගයේ තබා එකත් පසෙක වාඩිවී සිටියහ.

අනතුරුව එම කුමරිගේ කිරිමව ඇය නහවා සිටුවා. ඇය ද නානු කැමතිව එහි පැමිණියේ එම රූපය දැක මේ මගේ දුවණියයි සිතා අහෝ අවිනීත තැනැත්තිය. ඔබව නහවා නික්මුණ විට නුඹ මට පළමුව මෙහි ආවානේදැයි අසා අතින් පහර දී තදබව දැන චලනයද නොමැතිබව දැන මට මගේ දුවයයි සිතුවෙමි. මේ කුමක්දැයි පැවසුවාය. අනතුරුව එම බ්‍රාහ්මණයෝ - මෑණිය නි ඔබේ දුවනිය මේ ආකාර දැයි විමසුහ. මෙය මගේ දුවණිය ළඟ මෙය

මොන අගයක් දෑයි පැවසුවාය. එසේ නම් ඔබේ දුවණිය මට පෙන්වන්න යයි කිහ. ඇය ඔවුන් සමග ගෙට ගොස් ස්වාමීදුවට දැනුම් දුන්නාය. ඔවුන් බ්‍රාහ්මණයන් සමග පිළිසඳර කථා කොට දියණිය ප්‍රාසාදයෙන් බස්වා යට මහලේ තැබූ රත්රුවළඟ තැබුහ. රත්රුව ප්‍රභා නැතිවිය. බමුණෝ රත්රුව දෙමාපියන්ට දී කුමරිය රඳවා ගොස් අනිත්ථිගන්ධ කුමරුගේ දෙමාපියන්ට දැනුම් දුන්හ.

ඔවුහු සතුටු සිතින් යව් ඇය වහා කැඳවාගෙන එන්නැයි මහත් සත්කාර කර පිටත් කළහ. කුමරු ද එම ප්‍රවෘත්තිය අසා රන්රුවටත් වඩා රූමත් යුවතියක් ඇතැයි අසා ඒ ඇසු පමණකින් ස්නේහය උපදවා වහා ගෙන එන්නැයි පැවසුවේය. ඇය ද යානයක නංවා ගෙන එන්නී ඉතා සිවුමැලි බැවින් රථයේ කම්පනය නිසා හටගත් වාත රෝගයකින් අතරමගදිම කළුරිය කළාය. කුමරු ද එන එන අයගෙන් නිතර ප්‍රශ්න කරයි. ඈ කෙරෙහි දැඩි සෙනෙහසින් විමසන නිසා මැරුණ බව නොදන්වා දින කීපයක් පසුකොට මේ කරුණ දැනුම් දුන්හ. ඔහු එබඳු රූමත් යුවතියක් සමග සමාගමය නොලැබුවේ යයි දොම්නසට පත්වූයේ දඩි සේ කම්පනයට පත්වූයේය. බුදුහු ඔහුගේ හේතු සම්පත් දැක පිඬු පිණිස හැසිරෙමින් ඔහුගේ ගෙට වැඩම කළහ. අනතුරුව කුමරුගේ දෙමාපියෝ උන්වහන්සේ ගෙතුලට වැඩමවා හොඳින් සත්කාර කළහ. බුදුහු බත්කිස නිමවා අනිත්ථිගන්ධ කුමරා කොහිදැයි විමසුහ. ස්වාමීනි ඔහු ආහාර නොගෙන කාමරය තුළටවී සිටියයි පැවසුහ. ඔහුට කථාකරන්නැයි පැවසුහ. කුමරු පැමිණ බුදුන් වැඳ එකත් පසෙක සිටියේය. ඇයි කුමාරය ඔබ බලවත් ශෝකයෙන් පෙළෙන්නේදැයි විමසුහ. එසේය ස්වාමීනි. මෙබඳු රූමත් කාන්තාවක් අතර මගදී කළුරිය කළේයැයි මට බලවත් ශෝකයක් ඇතිවිය මට කෑමත් අප්‍රිය වෙයි.

එහිදී බුදුරජාණන් වහන්සේ ඔබට මෙතරම් ශෝක වේදනාවක් ඇතිවුයේ කුමක් නිසාදැයි ඔබ දන්නේදැයි විමසුහ. ස්වාමීනි මම නොදනිමි. කාමය නිසා කුමරුනි ඔබට මෙබඳු ශෝකයක් ඇතිවිය. ශෝකයත් - බියත් - කාමය නිසාම ඇතිවේ. යයි පවසා මේ ගාථාව දෙසුහ.

පුහුදුනගෙ කාමය
සෝ බිය ඇතිකෙරේමය
දුරු කොට කෙලෙස් කම්
කළයුතු නිවන් යාමය.

මෙහි **කාමතො** - යනු වත්ථුකාම ක්ලේශකාම යන දෙයාකාර කාමය අදහස් කෙරෙයි. මෙම දේශනය අවසානයේදී අනිත්ථිගන්ධ කුමරු සෝවාන් ඵලයට පත්වුහ.

අනිත්ථිගන්ධ කුමාරයා පිළිබඳ කථා පුවත නිමි.

16-6

"නණ්හාය ජායතී" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී එක්තරා බමුණෙක් නිමිති කරගෙන දේශනා කළහ.

මිථ්‍යාදෘෂ්ටික වූ මේ බ්‍රාහ්මණයා එක් දිනක් ගංතෙරට ගොස් කුඹුරක් ශුද්ධ පවිත්‍ර කරයි. බුදුහු ඔහුගේ හේතු සම්පත් දැක ඔහු වෙත වැඩමකළහ. ඔහු බුදුන් දැකද සතුටු සාමිචියේ පවා නොයෙදී නිහඬව සිටියේය. අනතුරුව බුදුහු පළමුවෙන් කථා කොට බමුණ කුමක් කරන්නේ දැයි විමසුහ.

භාග්‍යවත් ගෞතමයන් වහන්ස කෙතක් එළිපෙහෙළි කරමියි පැවසීය. බුදුහු ඔහු හා මෙපමණක් කථාකොට වැඩම කළහ. දෙවැනි දිනයේ දී කුඹුර සීසෑමට පැමිණිවිට බ්‍රාහ්මණය කුමක් කරන්නේදැයි විමසා - කුඹුර සීසාමියි පැවසුවිට පිටත්ව ගියහ. ඊට පසුදින වලද - පැමිණ වැපිරීම පැලසිටුවීම - රැකීම ආදිය ගැන විමසා පිටත්ව ගියහ. මෙලෙස යන විට එක් දිනක් බමුණා - භාග්‍යවත් ගෞතමයනි ඔබ මගේ කෙත ශුද්ධ කරණ දිනයේ සිට ආවේය. ඉදින් මගේ අස්වැන්න සරුවේද ඔබට ද බෙදා දෙමි. ඔබට නොදී මම පමණක් නොකන්නෙමියි මෙතැන් පටන් ඔබ මගේ යහලුවෙකි. අනතුරුව පසු දිනෙකදී ශෂ්‍ය සම්පත පැසුනි. දැන් කුඹුර පැසී ඇත. හෙට දිනයේ දෙන්නෙමියි ගොයම් කැපීමට සුදානම් කර තිබියදී රාත්‍රී මහා මෙඝයක් ඇති වී සියලු ගොයම් ගසාගෙන ගියේය. කෙත සහින ලද බිමක් වැනිවිය. බුදුරජාණන් වහන්සේ පළමු දිනයේදීම එම අස්වැන්න ලබාගත නොහැකියයි දැනගත්හ. බමුණා උදයේම කුඹුර බලන්න ගියවිට හිස් කුඹුර දැක බලවත් ශෝකයක් ඇතිවී, මෙසේ සිතුවේය. ශ්‍රමණ භවත් ගෞතමයන් මම කෙත ශුද්ධ කරණ අවස්ථාවේ සිට පැමිණියේය. මම ද මේ ගොයම් පැසුනවිට ඔබට ද බෙදා දෙමියි තනියම නොගනිමියිද ඔබ මගේ මිතුරායයිද පැවසුවෙමි. එහෙත් මගේ අදහස ඉටුනොවීය. මෙසේ සිතා ආහාර නොගෙනම ඇදේ වැතුරුණි. අනතුරුව බුදුහු ගෙදොරට වැඩම කළහ. ඔහු බුදුන් වැඩම කළබව අසා මගේ මිතුරා ගෙට කැඳවා මෙහි වාඩි කරවන්න යැයි පැවසුවේය. පිරිවරා ජනයා එසේ කළෝය. බුදුහු වැඩ හිඳ

බ්‍රාහ්මණයා කොහිදැයි විමසුහ. කාමරයේ නිදා සිටියයි පැවසුවිට ඔහුට කැඳවන්නැයි කැඳවා වාඩිවූවිට මෙසේ පැවසුහ. බමුණ කුමක්ද? ස්වාමීනි ඔබ වහන්සේ මම කුඹුර කැළෑකපා ශුද්ධ කරණ අවස්ථාවේ සිට වැඩම කළ හෙයින් මම අස්වැන්න පැසුන විට දෙනබවත් පැවසුවෙමි. ඒ මගේ අදහස ඉටු නොවීය. එනිසා මට මහත් ශෝකයක් ඇතිවිය. කැම පවා මට දැන් රුචිනොවේ යයි පැවසීය. අනතුරුව බුදුරජාණන් වහන්සේ බමුණාගෙන් බ්‍රාහ්මණය ඔබට මෙතරම් ශෝකයක් ඇතිවුයේ කුමක් නිසාදැයි දන්නේදැයි විමසුහ.

භාග්‍යවත් ගෞතමයන් වහන්ස මා නොදනිමි. පැවසුවිට ඔබ දන්නේය එසේය බ්‍රාහ්මණය ශෝක - බිය ඇතිවන්නේ තෘෂ්ණාව නිසාය යනුවෙන් පවසා "තණ්හාය ජායති සෝකො" යන ගාථාව දේශනා කළහ.

සෝකයට හා බියට
තන්හාව මුල් වේමැයි
ආශාව දුරු කළවිට
සෝ බිය දෙකම නැතිවේ.

එම තෘෂ්ණාව සදොර නිසා - ඇතිවන්නේ යයි පැවසුහ. දේශනාවසානයේ බ්‍රාහ්මණයා සෝවාන් ඵලයට පත්විය.

එක්තරා බ්‍රාහ්මණයෙකුගේ කථා පුවතයි.

16-7

"**සීල දස්සන සම්පන්නං**" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩ සිටිය දී අතරමග පන්සියයක් දරුවන් නිමිති කරගෙන දේශනාකළහ.

එක් දිනක් බුදුරජාණන් වහන්සේ අසූමහා තෙරවරුන් සමග භික්ෂූන් පන්සියයක් පිරිවරකොට ගෙන රජගහනුවර පිඬුපිණිස පිවිසුනේ එක් උත්සව දිනෙක පන්සියයක් දරුවන් කැවුම් කුඩා උස්සාගෙන නුවරින් නික්ම උයනට යන්නෝ දුටුවාහුය. ඔවුන් ද බුදුන්දැක වැඳ ගියාහුය. එකම භික්ෂුවකට ද කැවුමක් ගන්නැයි නොකිවාහුය. ඔවුන් පිටත්ව ගිය පසු බුදුහු භික්ෂූන්ට පැවසුහ. මහණෙනි කැවුම් වළඳන්නැයි පැවසුහ. ස්වාමීනි කැවුම් කොහිද? ඇයි දරුවන් කැවුම් කුඩ ඔසවාගෙන ගියා නොදක්කාහුද? ස්වාමීනි මෙබඳු දරුවෝ කාට හෝ කැවුම් දෙති. මහණෙනි ! මට හෝ ඔබට හෝ කිසිවෙකුට කැවුම් දීමට ආරාධනා නොකළහ. කැවුම් අයිති කරුවෝ භික්ෂූන් පසුපසින් පැමිනේ කැවුම් වළඳාම යාම වටී බුදුවරුන් තුළ එක් පුද්ගලයෙකුට ද ඊර්ෂ්‍යාවක් හෝ ද්වේශයක් හෝ නැත. මෙලෙස පවසා භික්ෂූන් සමග එක් ගසක් මුල සෙවෙනේ වාඩිවුහ. මහාකාශ්‍යප තෙරුන් පසුපසින් වඩිනු දැක දරුවන් සෙනෙහස උපදවා **ප්‍රීති** වේශයෙන් පිරිපුන් ශරීර ඇතිව වටිටි පහත් කොට තෙරුන්ට පසඟ පිහිටුවා වැඳ කැවුම් සමගම වටිටි වැසුම් හැර ස්වාමීනි ගන්නැයි වැන්දාහුය අනතුරුව තෙරුන් ඔවුන්ට අර ගසක් මුල භික්ෂූන් සමග තථාගතයන් වහන්සේ වැඩසිටිති. තෙපි දියයුතු දෑ රැගෙන ගොස් භික්ෂු සංඝයාට පිළිගන්වන්නැයි පැවසුහ. ස්වාමීනි යහපතැයි කියා තෙරුන් සමගම ගොස් කැවුම් පිළිගන්වා බලාසිට වළඳා අවසානයේ ජලය දුන්නාහුය. භික්ෂූන් හඬනැගුහ. දරුවන් විසින් මුහුණබලා භික්ෂාවක් දෙනලදී. සම්මා සම්බුදුන් හෝ මහතෙරුන් හෝ කැවුම් දෙන්නදැයි නොවිමසා මහා කාශ්‍යප තෙරුන් දැක පැස සමගම ගෙනගොස් ගියෝයැයි පැවසුහ. බුදුහු ඔවුන්ගේ හඬ අසා මහණෙනි මගේ පුත් මහා කාශ්‍යප සමාන භික්ෂුවක් දෙව්මිනිසුන්ට ද ප්‍රිය වේ. ඔවුහු තෙරුන්ට සිවුපසයෙන්ම පූජා කරතියි පවසා මේ ගාථාව පැවසුහ.

සිව් සස් දහම් දැන පිරිසිදු සිල්	රකින
තම සේවාව නිසි පරිදිම ඉටු	කරන
සංවර ගතිය පිරිපුන් දැනමන	වඩන
"මහණම" තමයි කවදත් මහජන	සරණ

එහි **සීලදස්සන** සම්පන්නං - යනු චතුපාරිශුද්ධි සීලයෙන් හා මග්ගඵලයන්ගෙන් යුත් - සම්‍යග් දර්ශනයෙන් යුත් - **ධම්මට්ඨ** - නම් නවලෝකෝත්තර ධර්මයේ පිහිටි අවබෝධ කරගත් ලෝකොත්තර ධර්ම ඇති. යන අරුතයි. **සච්චවේදිනං** - යනු චතුරාර්ය සත්‍ය සොළොස් ආකාරයෙන් අවබෝධ කරගත් සත්‍ය ඤාණයෙන් දැනගත් **අත්තනෝ කම්ම කුබ්බානං** - යනු තමන්ගේ කර්ම නම් ත්‍රිශික්ෂාවන් පුරණ යන අරුතයි. **තංජනෝ** යනු ඒ පුද්ගලයායි. ලෞකික මහජනයා ප්‍රියකරයි යනු දකිනු කැමැත්ත. වඳින කැමැත්ත. ප්‍රත්‍ය සිවුපසය පිදීමට කැමැත්ත වේය යන අරුතයි.

මේ දේශනය කෙලවර ඒ සියලු දරුවෝ සෝතාපත්ති ඵලයෙහි පිහිටියහ.

පන්සියයක් දරුවන්ගේ කථා පුවතයි.

16-8

"ජඤ්ඤාතොති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩසිටියදී එක් අනාගාමීවූ තෙරනමක් නිමිති කරගෙන දේශනා කළහ.

එක් දිනක් එම තෙරුන්ගේ සද්ධි විහාරික භික්ෂූන් ස්වාමීනි ඔබවහන්සේට විශේෂ අධිගමයක් ඇති දැයි විමසුහ. තෙරුන්වහන්සේ අනාගාමී ඵලය නම් ගිහියන්ට ද ඇත. අර්හත්වයට පත්වුවිට ඔබලා සමග කථාකරන්නෙමියි ලජ්ජාවෙමින් කිසිවක් නොකියාම අපවත් වූයේ සුද්ධාවාස දෙව්ලොව පහළවුහ. අනතුරුව එකට වාසයකරණ සද්ධි විහාරික භික්ෂූහු හඬා වැලපී බුදුන්වෙත ගොස් වැඳ හඬමින්ම එකත් පසෙක වාඩිවුහ. මේනිසා බුදුරජාණන් වහන්සේ මහණෙනි කුමක් නිසා අඬන්නෝදැයි විමසුහ. ස්වාමිනි. අපේ උපාධ්‍යායන් වහන්සේ අපවත් වුහ. එසේ වේවා. මහණෙනි ඒ ගැන නොසිතන්න මරණය අනිවාර්යයෙන් සිදුවිය යුතු දෙයකි. ස්වාමීනි එසේය අපි එය දනිමු. එහෙත් උපාධ්‍යාය තෙරුන් ගෙන් විශේෂ අධිගමයක් ඇත්දැයි විමසුවෙමු. උන්වහන්සේ කිසිවක් නොකියාම අපවත්වුහ. එනිසා අපි දුකට පත්වීමු. බුදුහු මහණෙනි ශෝක නොකරවු. ඔබගේ උපාධ්‍යාය වරයා අනාගාමී ඵලයට පත්වුහ. අනාගාමී ඵලයට ගිහියෝ ද පත්වෙති. අර්හත්වයට පත්වීම ඔබලාට කියන්නෙමියි ලජ්ජාවන්නේ ඔබට කිසිවක් නොකියා කළුරිය කොට සුද්ධාවාසයේ පහළ වුයේය. ඒ නිසා සැනසෙව්. මහණෙනි ඔබලාගේ උපාධ්‍යායන් වහන්සේ කාමයන්හි නොබැඳුන සිත් ඇති හෙයින් නොබැඳුන සිතට පැමිණියේයයි පවසා මෙම ගාථාව දේශනාකළහ.

අවබෝදයෙහි නිවණෙහි ආසා ඇතිව
වඩමින් කමටහන් තුන්මග පල පතිව
අනගැමි මගින් කාමෙහි ආසා නැතිව
උතුමෝ ඉහළ යති ජලපහරින් මතුව

එහි **ජනපජානො** - යනු කරණු කැමති වශයෙන් පමණක් ජනදය ඇත්තේ. උනන්දුවට පත්වූයේ **අනක්ඛාතෙ** තෙ - යනු නිවීමෙහි එය අසවලා විසින් කරණ ලදි. හෝ නීලාදි වශයෙන් මෙබඳු යයි කියා හෝ නොකියනලද්ද අනක්ඛාත නම් වේ. **මනසා ච ඵුටො** සියා යටත් පිරිසෙයින් තුන් මග ඵල සිතින් ස්පර්ශ කළේ පිරුනේ වෙයි. **"අප්පටිබද්ධ චිත්ත"** නම් අනාගාමී මාර්ග වශයෙන් කාමයන්හි නොබැඳුන සිතයි. කාමයන්හි නොබැඳුන සිත් ඇත්තේ **උඩ්ඪංසොතො** - මෙබඳු භික්ෂුව අවිහයේ ඉපදී එතැන් පටන් ප්‍රතිසන්ධි වශයෙන් අකනිට්ඨ බඹලොවට යන්නේ **උද්ධංසොත** යනුවෙන් පවසති. ඔබගේ උපාධ්‍යාය චරයා එබඳු කෙනෙකි යන අර්ථයි.

මේ දේශනය අවසානයේදී ඒ භික්ෂූන් වහන්සේලා අර්හත්වයෙහි පිහිටියාහුය. මහජනයාට ද දේශනය සාර්ථක විය.

අනාගාමී තෙරුන්ගේ කථාපුවතයි.

16-9

"විරජ්ජවාසිං" - යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ බරණැස ඉසිපතනාරාමයේ වැඩසිටිය දී නන්දිය නිමිත්තකරගෙන දේශනාකළහ.

බරණැස සද්ධා සම්පන්න කුළයක නන්දිය නම් පුත්‍රයෙක් වූයේය. හේ මවුපියන්ට අනුරූපවූ ශ්‍රද්ධාවන්ත වූ ප්‍රසන්න භික්ෂු උපාස්ථායකයෙක් වීය. අනතුරුව දෙමාපියන් වයසට පත්වූ විට ඉදිරි පස මාමාගේ නිවසින් රේවතීනම් දියණිය ගෙන එනු කැමතිවිය. ඇය - ශ්‍රද්ධාසම්පන්න නොවූවා දන්දීම ද රුචි නොකළාය. නන්දිය එයට නොකැමතිවිය. අනතුරුව මව රේවතියට මෙසේ පැවසුවාය.

දරුව ඔබ මේ නිවසේ භික්ෂු සංඝයාට වැඩසිටින තැන් පිරිබඩ කොට අසුන් පනවන්න. මේස තබන්න. භික්ෂූන් පැමිණිවිට පාත්‍රය ගෙන වාඩිකරවා පෙරහනකින් පැන්පෙරා වළඳා අවසන පාත්‍රය සෝදා දෙන්න. මෙම කටයුතු කර මගේ පුතු සතුටු කරවා ගන්නැයි පැවසුවාය. ඇය එසේ කළාය. මෙලෙස ඇය කීකරු කෙනෙකැයි පුතාට දන්වා ඔහු පිළිගත්විට ටික දිනකට පසුව ආවාහ කළේය. අනතුරුව නන්දිය මෙසේ පැවසුවේය. ඉදින් භික්ෂු සංඝයාට ද මහළු දෙමාපියන්ට ද උවටැන් කරන්නේනම් මගේ නිවසේ සිටීමට අවකාශ ලැබේ. වස්තුව ද ලබන්නේය. අප්‍රමාද වන්න. ඇය යහපතැයි කියා පිළිගෙන දිනකීපයක් ශ්‍රද්ධාවන්තියක ලෙසට ස්වාමීන්ට උවටැන් කළාය. පුතුන් දෙදෙනෙක් බිහිකළාය නන්දියගේ දෙමව්පියෝ කළුරිය කළහ. නිවසේ සියළු සම්පත් ඇයටම අයත්විය.

නන්දිනෙම දෙමව්පියෝ මියගිය විට එතැන් සිට නන්දිය මහාදාන පතියෙක්ව භික්ෂූන්ට දන් තැබුවේය. කෘපණයින්ට හා පයින් යන්නන්ට ගෙදොර පිසු ආහාර තැබීය. ඔහු පසුකලෙක බණ අසා ආවාස දානයේ අනුසස් අසා ඉසිපතන මහා විහාරයේ කාමර සතරබැගින් ඇති සතරැස් ශාලා කරවා ඇඳ පුටු ආදිය ද සපයා එම ආවාසය පවරාදෙන්නේ බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට දානයක් දී බුදුරජාණන් වහන්සේට දක්ෂිණෝදකය පිරිනැමුවේය. (පැන්වඩා

පිරිනැමීය) බුදුන්ගේ අත පැන් වත්කර දෙන විටම දිව්‍ය ලෝකයේ සියළු දිසාවන්හි පැතිරුණ දොළොස් යොදුනක් පළලට ද යොදුන් සියයක් උසට ද රන්රුවන්මය ප්‍රාසාදයක් ද පරිවාර දිව්‍ය කාන්තාවක් ද පහළ විය. ඉක්බිති එක් දිනක් මහමුගලන් තෙරුන් දෙව් ලොව චාරිකාවේ යෙදෙමින් එම ප්‍රාසාදය අබියස සිටියේ තමන් අබියසට පැමිණි දෙව් වරුන්ගෙන් විමසා සිටියේක. මේ දිව්‍ය අප්සරාවන්ගෙන් පිරුණ දිව්‍ය ප්‍රාසාද කවුරුන් උදෙසා පහළ වී දැයි එම දෙවියන් දිව්‍යවිමානයේ ස්වාමීන්ගෙන් විමසා මෙසේ පැවසුහ.

ස්වාමීනි නැඳියනම් ගෘහපති විසින් ඉසිපතනාරාමයේ බුදුන්ට විහාරයක් කරවා දෙන ලදින් ඔහු වෙනුවෙන් මේ විමානය පහළවිය. දිව්‍ය අප්සරාවන් ද එය දැක ප්‍රාසාදයෙන් බැස මෙසේ කීවාහුය. ස්වාමීනි ! අප නැඳියගේ පරිවාර ස්ත්‍රීහුය. මෙහි පහළ වූ අපි ඔහු නොදැක අතිශයින් උකටලීව සිටිමු. වැළි පාත්‍රයක් බිඳ රන්බඳුනක් ගැනීමට සමාන වූ මිනිස් සම්පත්තිය අත්හැර දිව්‍ය සම්පත් ගැනීමට මෙහි පැමිණීමට ඔහුට කියාදෙන්න. තෙරුන් වහන්සේ දිව්‍යලෝකයෙන් පැමිණ බුදුන්වෙත එළඹ විමසුහ. ස්වාමීනි මිනිස් ලොව සිටියදීම කරණ ලද කුශල කර්ම වලට දිව්‍යලෝකයේ සමාන ප්‍රතිඵල ලැබේද? ඔබ ඒවාදැක මාගෙන් කුමකට විමසයිද? අනතුරුව බුදුහු මොග්ගල්ලාන ඔබ කුමක්නම් කියයිද? බොහෝ ඈතක සිටිකෙනෙක් පුතෙක් හෝ සහෝදරයෙක් හෝ දුරසිට කලකින් පැමිණි විට ගම්දොර සිටි තැනැත්තෙක් දැක වේගයෙන් ගෙට ගොස් අසවල් තැනැත්තා ආවේයයි. දැනුම් දෙන්නේ ද ඔහුගේ ඥාතීන් තුටු පහටුව වේගයෙන් ගෙයින් නික්ම පුතා ආවා පුතා ආවා යනුවෙන් සතුටුවේද එලෙසම යහපත් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ මෙලොව අත්හැර යනවිට දසවිධ දිව්‍ය පඬුරු අරගෙන මම පළමුව මම පළමුව යයි කියා පසුපසින් ගොස් දෙවියන් සතුටු කරතියි මේ ගාථාව පැවසුහ.

බොහෝ කාලයක් දුර සිට සුවසේ	පැමිණි
දරුවෙකු සොයුරෙකු නෑයන් බැනි	සිතිනි
පිළිගන්නා ලෙසට, පින් කළ දන	නොසිනි
දෙව්ලොව දෙවගනන් පිළිගනු ඇත	බැනිනි.

"චිරපවාසිං පුරිසං - දූරතෝ සොත්ථි මාගතං" එහි චිරපවාසිං - යනු බොහෝ කලක් බැහැරසිටි **දූරතෝ සොත්ථි මාගතං** වෙළෙන්දෙක් හෝ රාජ්‍ය පුරුෂ හෝ තනතුරු නිසා ලබන ලද ලාභය හෝ ආදායම ගෙන උවදුරකින් තොරව දුරසිට පැමිණි. ඤාති **මිත්තා** - කුලසබඳතාව අනුව ඤාතීන් ද මිත්‍රයින් ද - සුහද බැවින් සහෘදයන් ද **අභිනන්දන්ති ආගතං** ඤාගතං යන වචනයද ඇදිලි බැඳ විඳගැනීමද ගෙට පැමිණි අයම පුද පඬුරු දීම වශයෙන් සතුටුවීම. තථෙවාහි මේ කරුණු අනුව පිංකළ පුද්ගලයා මේ ලොවින් පරලොව යන විට දිව්‍යමය වූ ආයු -වර්ණ - සැප - කීර්ති - අධිපත්‍යය - දිව්‍යමය රූප - ශබ්ද - ගන්ධ - රස - ස්පර්ෂ යන මේ දසවිධ පඬුරු ගෙන මවු පියන් ලඟ සිටිය දී පින්පමුණු වන්නැයි පිළිගනිති. පියං ඤාතීවාහි මේ ලොව ප්‍රිය ඤාතීන් අනෙක් ඤාතීන් හා සම වේයන අර්ථයි. දෙසුම අවසන බොහෝදෙන සෝවාන් ඇදී මාර්ග ඵලාදියට පැමිණියාහුය.

නන්දිය පිළිබඳ කථා පුවතයි.
පියවග්ගය නිමි

සොළොස් වැනි වර්ගයයි.

17-1

"කොධංජහෙ" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ නිග්‍රොධාරාමයේ වැඩසිටිය දී රෝහිණී නම්වූ ක්ෂත්‍රිය කන්‍යාවක් නිමිති කරගෙන දේශනා කළහ.

එක් සමයක ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ පන්සියයක් භික්ෂූන් වහන්සේලා සමග කපිලවත්ථුවට වැඩමකළහ. අනතුරුව උන්වහන්සේගේ ඥාතීන් තෙරුන්වහන්සේ වැඩම කළහයි අසා තෙරුන් සමීපයට ගියාහුය. රෝහිණී නම් වූ තෙරුන්ගේ සොහොයුරිය කැඳවාගෙන නොගිය නිසා තෙරණුවෝ ඥාතීන්ගෙන් රෝහිණිය කොහේ දැයි විමසූහ. ස්වාමිනි ගෙදර සිටී. ඇයි ඇය මෙහි නොපැමිණියේ දැයි විමසූහ. ඇගේ සිරුරේ චර්ම රෝගයක් හටගත් නිසා ලජ්ජාවෙන් ඇය නොපැමිණියා ය. ඇය දැන් කැඳවන්නැයි කියා ගෙන්වා රෙදි සැට්ටය ගලවා පැමිණියාවූ 1 ඇයට මෙසේ පැවසුවේය. රෝහිණි ඔබ නොපැමිණියේ කුමක් හෙයින්ද, ස්වාමිනි මගෙ සිරුරේ චර්ම රෝගයක් පවතී එනිසා ලජ්ජාවෙන් නොපැමිණියෙමි. ඇයි ඔබ කුසල් කිරීමට අකමැතිද? ස්වාමිනි කුමක් කරමිද? ආසන ශාලාවක් කරන්න. ස්වාමිනි කුමක් ගෙනද කරන්නේ. ඇයි ඔබ ඔබගේ අලංකාරය සඳහා පළඳින භාණ්ඩ නොමැතිද? ස්වාමිනි තිබේ. කොතරම් වටිනා භාණ්ඩ තිබේද? දසදහසක් වටිනා භාණ්ඩ ඇත. එසේනම් ඒවා විකුණා කර ආසන ශාලාවක් හදන්න. ස්වාමිනි මට මෙය කරවා දෙන්නේ කවුද? තෙරුන් ළඟ සිටි ඥාති පිරිස බලා නුඹ මෙහි වගකීම දරිය යුතුය ස්වාමිනි ඔබ වහන්සේ කුමක් කරන්නේ දැයි විමසුහ මම ද එසේ කරන්නෙමි. එසේ නම් මැයගේ භාණ්ඩ සමුහය අරගෙන එන්න. ඔවුහු ස්වාමිනි යහපතැයි රැගෙන ආවාහුය.

තෙරුන් ආසන ශාලාව සංවිධාන කරමින් රෝහිණිට මෙසේ පැවසුහ. තට්ටු දෙකේ ආසන ශාලාවක් කර උඩුමහලේ ලැලි තට්ටුව යෙදූ පසු යට ශාලාව නිතර අතුගා අසුන් පනවන්න. නිතර පැන්කළ තබන්න. ඇය යහපති ස්වාමිනි යි පවසා ස්වර්ණාභරණ විකුණා දෙමහල් ආසන ශාලාව කර

උඩුමහලේ ලෑලි යෙදූ නැන් සිට පිසදැමීම් ආදිය කළාය. නිතර භික්ෂූහු වාඩිවෙති. මේ අනුව අතුගාන විට ඇගේ ඡවිරෝගය සහිප විය. ඇය ආපන ශාලාව නිමවූවිට බුද්ධ ප්‍රමුඛ භික්ෂුසංඝයාට ප්‍රනීත වූ කැඳ කිස භෝජනය ද පිළිගැන්වුවාය. බුදුහු අහර කිස නිමවා මෙය කාගේ දානයක්දැයි විමසුහ. මගේ නැගණිය වූ රෝහිණියගේ යයි පැවසුහ. ඇය කොහිදැයි විමසා නිවසේ සිටිනබව අසා කැඳවන ලෙස දන්වූහ. ඇය ඊට පසු පැමිණ වන්දනා කර සිටියාවූ ඇයගෙන් නොපැමිණිමට හේතුවත් විමසා ජවි රෝගය නිසා බව පවසා සිටි විට ඔබට මෙබඳු රෝගයක් ඇතිවීමට හේතුව කුමක්දැයි දන්නේදැයි විමසා නොදන්නා බව පැවසුවිට ඔබේ ක්‍රෝධය නිසා ඇතිවී යයි පැවසුවිට එය කුමක්දැයි විමසුවෙන් බුදුහු අතීත සිදුවීම දේශනාකළහ.

පෙර බරණැස් නුවර රජුගේ අගමෙහෙසිය රජුගේ එක් නිලියකට වෛරබැඳ ඇයට දුකක් ඇති කරමියි සිතා කසඹිලියා වැනි කසන ගෙඩි ගෙන්වාගෙන එම නිළිය තමන්වෙත ගෙන්වාගෙන ඇයට නොදැනෙන ලෙස ඇගේ සයනයේ ද උතුරු සළුව පටසළුව අතර ද කහඹිලියා කුඩු දැම්මවිය. ක්‍රීඩාවෙන් සිනහවෙන් ඇගේ සිරුරේ ද විසුර වීය. එකෙනෙහිම ඇගේ සිරුරේ ගඩු හටගෙන නින්දට ගියවිට ඒ කහඹිලියා කුඩු නිසා දැඩි වේදනාවට පත්වූවාය. ඒ අගමෙහෙසිය රෝහිණියයි. මේ අතීත පුවත බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඔබ එදා මේ කර්මය කරණ ලදී. ස්වල්ප ලෙස හෝ ක්‍රෝධය හෝ ඊර්ෂ්‍යාව හෝ කිරීම නුසුදුසු යයි පවසා මේ ගාථාව දේශනාකළහ.

කොරෝදය සමග මානය	දුරුකරනු
මමමය මගේමය අදහස	අතහරිනු
සංයෝජන දහය වෙසෙසින් මග	හරිනු
හැසිරී මේ අනුව සසරෙහි දුක	නිවනු

එහි කොධං යනු ක්‍රෝධයනම් සියළු ආකාර ක්‍රෝධයයි මානං නව විධවූ මානය ද අත්හල යුතුය. සඤ්ඤාජනං කාමරාග සංයෝජන දසවිධවූ

1. මෙය සද්ධර්ම රත්නාවලියේ සඳහන් වන්නේ "පටකඩ සැට්ටයක් ඇඟ වසා ලාගෙන" කියායි.

සංයෝජන ඉක්මවා යන්නේය. **අසජ්ජමාන** - මේ නොඇලීමය යමෙක් මගේ රූපය මගේ වේදනාව ආදීවශයෙන් නාම රූපයන්හි ඇලේ මෙසේ නොගැනීමෙන් නොගන්නේ නො ඇලේ. එම පුද්ගලයා නොඇලෙන්නේ රාගාදිය නොමැති හෙයින් දුකට නොවැටේ. යන අර්ථයි. දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ආදි ඵලයන්ට පැමිණියහ. රෝහිණිය සෝවාන් ඵලයට පත්වූවාය. එකෙනෙහිම ඇගේ සිරුර රන්වන් පැහැ ඇතිවිය. ඇය ඉන් චුතව දෙවිවරුන් සතර දෙනෙකුගේ සීමාවේ. පහළවී රූසපුවෙන් අග්‍ර බවට පත්වූවාය. දෙවියන් සතර දෙනාටම සෙනෙහසක් ඇති විය. ඇය මගේ සීමාවේ පහළවූවාය. ඇය මගේ සීමව ඇතුලත පහළ වූවායැයි වාද කරමින් සක්දෙවි රජවෙත ගියාහුය. දේවයනි. මැය නිසා අප අතර රණ්ඩුවක් ඇතිවිය. මෙය විසඳා ලන්නැයි කීවාහුය. සක්දෙවිඳු ද ඇය බලා ස්නේහ ඇති වුයේ මෙසේ පැවසුවේය. මැය දුටු විට සිතේ කුමක් ඇති වුවේද? එහිදී එක් දෙවියෙක් මෙසේ පැවසුවේය. මැය නිසා මට ඇතිවූ ස්නේහය යුද බෙරයක හඬක් ලෙස වාඩිවී සිටිමට නොහැකිවිය. අනවරතයෙන් පැවත්තේයි. දෙවැන්නා හා මගේ සිත ගලක ගලන ගඟුලක් සේ වේගයෙන් ගලායන්නේ විය. තුන්වැන්නා මම ඇය දුටු අවස්ථාවේ සිට කකුළුවෙකුගේ ඇස් ලෙස ඉදිරියට නෙරා ආවෝය. මගේ සිත සෑයක බැඳි කොඩියක් සේ නිසලව සිටීමට නොහැකිවිය. අනතුරුව සක්දෙවිඳු ඔවුන්ට මෙසේ පැවසුවේය. දරුවෙනි ඔබලාගේ සිතුවිලි බලහත්කාර ලෙස පිහිටා තිබේ. මට මැය ලැබුවොත් මම ජීවත් වෙමි. නොලැබුනහොත් මරණය වන්නේයයි පැවසුවේය. දේවපුත්‍රයෝ මහරජ ඔබගේ මරණයෙන් තේරුමක් නැතැයි කියා ඇය සක්දෙවිඳුට පවරා පිටත්ව ගියහ. ඇය සක්දෙවිඳුට ප්‍රිය වූවාය. මනාප වූවාය. අසවල් ක්‍රීඩාවට යමුයයි පැවසුවිට සක් දෙවිඳුට ඇගේ වචනය ප්‍රතික්ෂේප කිරීමට නොහැකි විය.

රෝහිණිය පිළිබඳ කථා පුවතයි.

17-2

"යො වෙළුසතිතං කොධං " යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ අගාලව චෛත්‍ය ස්ථානයේ වැඩ සිටියදී එක්තරා භික්ෂුවක් නිමිති කරගෙන දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට සෙනසුන් අනුමත කළවිට රජගහ නුවර සිටුවරයා ආදීන් විසින් සෙනසුන් කරද්දී එක් අලව්නුවර වැසි භික්ෂුවක් තමන්ගේ සෙනසුන ඉදිකරමින් එක් ප්‍රසන්න ගසක් දැක සිදින්නට පටන් ගත්තේය. එම ගසේ සිටි වෘක්ෂ දේවතාවිය තරුණය ඇය තම පුතු ඇකයේ තබා ගෙන ස්වාමීනි මගේ විමානය නොසිදින්නැයි ඉල්ලා සිටියේය. මගේ පුතුන් ගෙන නිවසක් නොමැතිව මට හැසිරිය නොහැකිය. එම භික්ෂුව මට වෙනත් ගසක් ලබා ගැනීමට නොහැකියයි පැවසුවේය. ඇගේ වචනය නො පිළිගත්තේය. ඇය දරුවා දැක වැලකෙන්නේයයි සිතා දරුවා ගසේ අත්තේ තැබුවාය. භික්ෂුව එසවූ පොරව දරාගැනීමට නොහැකිව දරුවාගේ අත කපා දැම්මේය. දේවතාවිය ඇතිවූ බලවත් කෝපයෙන් පහරදී ඔහු මරමියි. දෙඅත් ඔසවා මෙසේ සිතුවාය. මේ භික්ෂුව සිල්වත්ය. ඉදින් මම ඔහු මැරුවොත් නිරයගාමී වන්නෙමි. අනෙක් දෙව්වරු ද තමන්ගේ ගස් සිදින විට අසවල් දේවතාවිය භික්ෂුවක් ඝාතනය කළාය යනුවෙන් මා ප්‍රමාණ කරගෙන භික්ෂූන් ඝාතනය කරති. මෙසේ සිතා මේ භික්ෂුව ස්වාමීන් සහිත නිසා ඔහුගේ ප්‍රධානියාට කියන්නෙමියි එසවූ අත් බැහැර කොට අඬමින් බුදුන්වෙත ගොස් වැඳ එකත් පසෙක සිටියාය. අනතුරුව බුදුහු දෙව්දුව ඇයි ඔබ හඬමින් සිටියේ යයි විමසුහ. ස්වාමීනි ඔබගේ ශ්‍රාවකයෙක් විසින් මෙබඳු දෙයක් කරණ ලදි මම ද ඔහු මරණු කැමතිව මේ ලෙසට සිතා නොමරාම මෙහි ආවෙමි. මේ සියළු පුවත් විස්තර ලෙසටම පැහැදිළි කළාය. මෙය ඇසූ බුදුහු - සාධු - සාධු - යහපත දෙව්දුව ඔබ යහපතක්ම කරණ ලද්දේය. මෙසේ උස්සන ලද - ඇවිස්සුන කෝපය කම්පනය වූ රථයක් මෙන් සන්සුන් කළා සේ යයි පවසා මේ ගාථාව දේසුහ.

මහ මාවතේ යන රිය නවතන	ලෙසට
දුරලනු කොරෝදය නැග ගෙන එන	සිතට
මානය, කොරෝදය ඔබ ගෙනයයි	දුකට
එය නැති කළොත් එය වෙයි ඔබෙ	යහපතට

එහි **උසානිනං** යනු උපන්, **රජ්ජං හනතවෝ** - යම්සේ දක්ෂ රියදුරා ඉතා වේගයෙන් ධාවනය වන රථය පාලනය කරගෙන කැමති තැනකට (යවයිද) මෙහෙයවයිද එලෙසට යම් පුද්ගලයෙක් උපන් ක්‍රෝධය දරාගැනීමට හැකිවේ නම් තමහං යනු මම ඔහු නියම රියදුරායයි කියමි.

ඉතරොජනෝ - ඉතිරි රජ ආදී ජනයා රැහැන ගන්නේ නම් වේ. ඔහු උතුම් රියදුරෙකු නොවේ.

දේශනය අවසානයේ දේවතාවිය සෝවාන් ඵලයේ පිහිටියේය. පැමිණි පිරිස යහපතට පත්විය. දේවතාවිය සෝවාන් වී අඬමින් සිටියාය. අනතුරුව බුදුහු කරුණු විමසුහ. ස්වාමිනි මගේ විමානය විනාශවිය. දැන් කුමක් කරමි ද ඇසුවිට. කම් නැත දෙවිදුව මම නුඹට විමානයක් දෙන්නෙමි දෙවිරම ගඳකුටිය අසල පෙරදින, දෙවියා චුතවූ එක් ගසක් පෙන්වමින් අසවල් තැන ගස අවකාශය එය විචිත්‍රය එහි යන්නැයි පැවසුහ. ඇය එතැනට ගියාය. එතැන් පටන් බුදුන් දෙන ලද ඇගේ විමානය මහේ ශාක්‍ය දෙවියන්ට ද පැමිණ එය සෙලවීමට නොහැකිවිය. බුදුහු මෙය ඇතිවීම හේතු කොට භික්ෂූන්ට භූතගාම සික්ෂාපදය පැනවුහ.

එක්තරා භික්ෂුවක් පිළිබඳ කථා පුවතයි.

17-3

"අකෙකාධෙන ජිනෙ" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ රජගහනුවර වේළුවනයේ වැඩසිටියදී උත්තරාවගේ නිවසේ දන්වළඳා උත්තරා උපාසිකාව නිමිති කරගෙන වදාළහ.

රජගහනුවර සුමන සිටුවරයාගේ සිටු මැදුරේ පුණ්ණ නම් දිළින්දා බැලමෙහෙකර ජීවත්වේ. උන්ගේ බිරිඳ උත්තරාය ඔවුන් හා දියනියද සිටියාය. මේ අතර දිනක් සත් දිනක් නැකැත් කෙළි පැවැත්විය යුතුයයි රජගෙදරින් අණක් නිකුත් වුනි. මෙය අසා සුමන සිටුවරයා උදේම පැමිණි පුණ්ණ අමතා දරුව අපේ සේවක ජනයා නැකැත් කෙළි කෙළිණු කැමතිය. ඔබ නැකත් කෙළියට කැමතිද නැතිනම් සේවය කරන්නේදැයි විමසීය. ස්වාමිනි නැකැත් ක්‍රීඩාව නම් ධනය ඇත්තවුන්ටය, නමුත් මගේ ගෙදර හෙට දිනය සඳහාද කැඳබත් නැත. මට නැකැත් කෙළියෙන් වැඩක් නැත. ගොන්නු ලැබේනම් මම සී සානු කැමැත්තෙමියි පැවසීය. එසේ නම් ගොණුන් ගන්නැයි පැවසීය ඔහු ශක්තිමත් ගොනුන් ද නගුල ද ගෙන බිරිඳ අමතා - සොඳුර නාගරිකයෝ නැකත් උත්සව කරති. මම දළිදු නිසා බැලමෙහෙ කිරීමට යන්නෙමි. මට ද අද දෙගුණයක් ආහාර පිළියෙළ කරගෙන ආහාර රැගෙන එන්නැයි බිරිඳට කියා කෙතට ගියේය. සැරියුත් තෙරුණුවෝ ද සත්දිනක් නිරෝධ සමාපත්තියට සමවැද එදින ඉන් නැගිට මම අද කාටනම් සංග්‍රහ කරන්නේදැයි බලන්නේ පුණ්ණ දිළින්දා තමන්ගේ නුවණ දැලට හසුවී මොහු ශ්‍රද්ධාවන්තයෙක්ද? මට සංග්‍රහ කිරීමට මොහුට හැකිවේදැයි බලන්නේ. ඔහුගේ සැදැහැති බවත් එනිසාම ඔහුට මහාසම්පත් ලැබෙන බවත් දැන පා සිවුරු ගෙන සීසාන තැනට වැඩමවා ඉවුරුබඩ එක් වන ගුම්හයක් බලමින් වැඩසිටියහ. පුණ්ණ, සැරියුත් තෙරුන් දැක සීසෑම නවතා පසඟ පිහිටුවා වැඳ දන්මැදීමට කෝටු අවශ්‍ය දැයි සිතා දැහැටි කුරක් කැපකර පිළිගැන්විය අනතුරුව තෙරුන් පාත්‍රය ද පෙරහන ද එළියට ගෙන දුන්නේය. ඔහු පැන් අවශ්‍යව ඇතැයි සිතා පැන් පෙරා දුන්නේය. තෙරුන් සිතූහ. මොහු අනුන්ගේ වෙනත් ගෙයක වාසය කරයි. ඔහුගේ ගෙදොරට යන්නෙ නම් මොහුගේ බිරිඳට මා දැකීමට නොහැකි වන්නේය. ඇය බත් අරගෙන මගට පිවිසේද එතෙක් මෙහිම සිටින්නෙමියි සිතූහ. එසේ එහිම

ටිකවේලාවක් කල්යවා ඇය මගට පිළිපන්බව දැන ඇතුළු නුවර දෙස බලා වැඩම කළහ. ඇය අතර මගදී තෙරුන් දැක. මෙසේ සිතුවාය. බොහෝ දිනවල දෙය්‍ය ධර්ම ඇතිවිට දෙන්නට කෙනෙක් නැත. අනෙක් දිනවල දෙන්නට දෙයක් නොමැති විට ආර්යන් වහන්සේ දකින්නට ලැබේ.

නමුත් අද දෙය්‍ය ධර්මයද ආර්යන්ද ඇත. මුන්වහන්සේට සංග්‍රහ කරන්නෙමියි ඇය බත් භාජනය බිමතබා පසඟ පිහිටුවා තෙරුන් වැඳ ස්වාමීනි මෙය රළු හෝ ප්‍රනීත හෝ වේවා නොසිතා ඔබවහන්සේ මේ දාසයාට සංග්‍රහ කරණු මැනවයි. පැවසුහ. තෙරුන් පාත්‍රය පෙන්වා ඇය එක අතකින් භාජනය ඔසවාගෙන එක් අතකින් බත් දෙනවිට බත් බාගයක් දෙන විට ප්‍රමාණවත් යයි පවසා අත වැසුවේය. ඇය ස්වාමීනි ! එක කොටසක් පමණක් නොසෑහෙමි. ඔබවහන්සේගේ දාසයාට මෙලොව ලෝක සංග්‍රහය නොකොට පරලොව සංග්‍රහ කරන්න. ඉතිරියක් නොමැතිවම දෙනුකැමැත්තෙමියි. පවසා සියළුම බත් පාත්‍රයේ තැබීය. තෙපි මෙලොවදිම ලාභීවෙත්වායි පැතුවාය. තෙරුන් වහන්සේ එසේ වේවායි පවසා සිටගෙනම අනුශාසනය කර ජලපහසුව තිබෙන තැනෙක වාඩිවී බත් කිස කළහ. ඇය ද නැවත සහල් සොයාගෙන බත පිසුවාය.

පුණ්ණද අඩකිරියක් පමණ තැන් සී සා බඩගින්න ඉවසා ගැනීමට නොහැකිව ගොනුන් මුදවා එක් සෙවන තැනකට පිවිස මාර්ගය බලන්නේ වාඩිවී සිටියේය. බිරිඳ ද බොහෝවේලා ප්‍රමාදවීයයි පවසා කෝපයට පත්ව මට කෙවිටෙන් තලන්නේ නම් මගේ කුශලකර්මය නිරර්ථක වේයයි කල් ඇතිවම ඔහුට දන්වන්නෙමියි. සිතා මෙසේ හඬනගා කීවේය. ස්වාමීනි අද පමණක් සතුටු වන්න මා කළ කර්මය නිරර්ථක නො කරන්න. සිත පහදවා ගන්න. මම උදේම ඔබට බත් ගෙන එන්නේ අතරමගදි ධර්මසේනාපති සැරියුත් හිමි දැක ඔබේ බත් වේල උන්වහන්සේට පිරිනමා නැවත ගොස් බත් උයාගෙන ආවෙමි. සිත පහදවා ගන්න. ඔහු සොඳුර කුමක් කියන්නිද? විමසා දෙවනුව ද එම කරුණ අසා සොඳුරිය ඔබ යහපතක්ම කරණ ලද්දේය. මගේ බත ආර්යන් වහන්සේට පිරිනැමුවේ. මම ද උදයේම දැහැටි කුරුදු මුව සෝදන ජලය ද දෙන ලද්දෙමි. මෙසේ සිත සතුටු වී එම වචනයට සතුටුව - මහදවල් ලද බත නිසා ක්ලාන්ත වුයේ ඇගේ ඇකයේ

හිස තබා නින්දට වැටුනි. අනතුරුව උදේම සීසෑ නැන පස් කැට සියල්ල රන්වී කිණිහිරි මල් සේ ශෝභාවත් විය. ඔහු අවදිවී බලන්නේ බිරියට මෙසේ කීවේය. සොඳුර මට සීසෑ තැන් රන් සේ පෙනේ. මේ කුමක්ද මට මහදවල් කෑ බත නිසා ඇස් බ්‍රමණයවීද? ස්වාමීනි මට ද එසේ පෙනේ ඔහු නැගිට කුඹුරට බැස එක් පස් පිඬුවක් ගෙන නගුල් ගසා රන් බව දැන අහෝ ධම්ම සේනාපති ආර්යන්වහන්සේට දුන් දානයේ විපාක අදම ලැබුනි. මට මෙතරම් ධනයක් පරිහරණය කිරීමට නොහැකිය. සියල්ල රන් බවට පත්වේ. රන් ගෙන ඒමට වටීයයි ගොස් රජුට දන්වා සිටියේය. ඔබ කවුරුන්දැයි විමසුවිට ම පුණ්ණය. ඔබ අද කුමක් කළේද? අද උදේම ධම්ම සේනාපති සැරියුත් හිමියන්ට දෑහැටි දී පැන් පෙරා දී බිරිඳ විසින් මට ගෙන එන ලද බත පුදන ලද්දේය. මේ තොරතුරු අසා රජු ඔබ ධර්මසේනාපති සැරියුත් හිමියන්ට පිරිනැමූ දානයේ ප්‍රතිවිපාක අදම ලබන ලද්දේයයි පවසා දරුව කුමක් කරමිදැයි විමසුවේය.

බොහෝ ගැල් සියගණනක් යවා රන් ගෙන එන්නැයි පැවසීය. රජු ගැල් යැවීය. රාජ පුරුෂයන් රජු අයත් ඒවායි ගන්නවිට ගත් ගත් රන් මැටි පිඬු විය. ඔවුන් ගොස් මේ කරුණ රජුට දන්වා සිටිය විටදී කුමක් කියා ගත්තේ දැයි විමසා රජුගේයයි කියා ගත් බව පැවසුවිට එලෙස නොව පුණ්ණගේ රන් යයි පවසා ගන්නා ලෙසට කියා නැවත යැවුහ. එසේ කියාගත් විට ගත් ගත් පස් පිඬු රන්විය. ඒ සියලු රන් කැට ගෙනවුත් රාජාඞ්ගනයේ අසුරියනක් උසට ගොඩ ගැසුහ. රජු නගර වාසීන් එක්රැස්කර මෙම නගරයේ මෙතරම් ධනයක් ඇතිකෙනෙක් සිටිදැයි විමසා නැතැයි පැවසුවිට මොහුට කුමක් දීම වටීදැයි විමසීය. සිටුතනතුර යයි පැවසුහ. (සෙටඨීජාතක) රජතුමා ඔහුට බහුධන සෙට්ඨී යනුවෙන් නම් කර මහත් භෝග සම්පත් සමග ඔහුට සිටු තනතුර දුන්නේය.

එහිදී පුණ්ණ රජුට මෙසේ පැවසුවේය. රජතුමනි ! මට මෙතෙක් කල් අනෙක් අයගේ ගෙවල්වල වාසය කලෙමි. මට නිවසක් දෙන්න යැයි පැවසුවේය. එසේනම් මේ වනරොද බලන්න. මේ වන ලැහැබ ශුද්ධකර ගෙයක් කරන්න. එය පැරණි සිටු වරයෙකුගේ මැදුරක් තිබුන තැනක. සාදන්නට කීවේය. ඔහු එතැන දින කීපයකින්ම ගෙයක් කරවා ගෙට

පිවිසෙන උත්සවය ද සිටුතනතුර ලබන උත්සවයද එකට කරන්නේ සත් දිනක් බුද්ධප්‍රමුඛ මහසංඝයාට දන් දුන්නේය. අනතුරුව බුදුහු දාන අනුසස් අනුමෝදනා දේශනය කරමින් අනුපිළිවල කරාව පැවසුහ. ධර්ම දේශනය අවසානයේ පුණ්ණ සිටු වරයා ද බිරිඳ ද - උත්තරා දියණිය ද යන තිදෙන සෝවාන් ඵලයට පත්වුහ. පසුකලෙක රජගහසිටු තුමා තමන්ගේ පුතුට සිටු දියණියන් ආවාහ කරදීමට ඉල්ලීය. ඔහු ඔබට නොදෙමි. පැවසුවිට එසේ නොකරන්න මෙපමණ කලක් අප නිසා වාසය කලේ ඔබට සම්පත් නො ලැබුනි. මගේ පුතුට දුව දෙන්නැයි ඉල්ලා සිටීම නිසා ඔබේ පුතු මිත්‍යා දෘෂ්ටිකය. මගේ දුවට තෙරුවන් හැර පැවතීමට නොහැකිය. ඔහුට මගේ දුව නොදෙන්නෙමියි පැවසුවේය. අනතුරුව බොහෝ සිටුවරු හා ප්‍රධානීන් ඔහු හා විශ්වාසය නොබිඳින්න. ඔහුගේ පුතුට දුව දෙන්නැයි පැවසුහ. පුණ්ණ සිටුවරයා ඔවුන්ගේ වචනය පිළිගෙන ඇසළ මස පුණු පොහෝදින දියණිය දුන්නේය. ඇය පතිකුළයට ගියතැන් සිට භික්ෂුවක් හෝ භික්ෂුණියක් ලඟට යාමට ද බණඇසීමට දන් දීමට අවස්ථාව නො ලැබුනි. මෙලෙස මාස දෙක හමාරක් ගතවුවිට ලඟසිටි පිරිවර ජනයාගෙන් විමසුවාය. දැන් වර්ෂයට මාස කීයක් ඉතිරිව තිබේද ආර්යාවනි අඩමසකි. ඇය පියාණන්ට ලිපියක් යැව්වාය. මා මෙබඳු හිරගෙදරක තැබුවේ කුමක් හෙයින්ද? මෙබඳු මිථ්‍යා දෘෂ්ටික කුලයකට දිම නොවටියි. මෙහි පැමිණ දින සිට භික්ෂූන් දැකීම් ආදිය එක පිණක් හෝ කිරීමට නොලැබුවෙමි. අනතුරුව ඇගේ පියා මගේ දුවණිය දුකින් අසතුටුවී ඇතිබව දැන පහළොස් දහසක් කහවනු යැවීය. මේ නුවර සිරිමා නම් ගණිකාවක් සිටී. දිනකට දහසක් අය කරයි. මේ කහවනු වලින් ඇය ගෙන්වා මේ අඩමස ඔබේ සහයකයාම පරිහරණය කරන්නැයි පැවසුවාය. ඇය යහපතැයි පිළිගත්තාය. ඇය එයගෙන ස්වාමියා සම්පයට ගොස් සිටිවිට ඔහු සිරිමාව දැක මේ කුමක්දැයි පැවසුවිට මේ මගේ සාහායිකාව මේ අඩමස පරිහරණය කරන්නැයි මම මේ අඩමස ධර්මය ඇසිමට දන් දීමට කැමැත්තෙමැයි පැවසුවාය. ඔහු ඒ අභිරූපී කාන්තාව දැක ස්නේහ උපදවා හොඳයැයි පිළිගත්තේය. උත්තරා ද බුද්ධ ප්‍රමුඛ සංඝයාට අරාධනා කර ස්වාමීනි මේ අඩමස වෙනත් තැනක නොගොස් මෙහිම භික්ෂාව පිළිගන්නැයි බුදුන්ගෙන් ප්‍රතිඥා ලබාගෙන පැමිණ මෙතැන් පටන් මහා පවාරණයතෙක් බුදුන්ට උවටැන් කිරීමට ධර්මය ඇසිමට ලැබෙන්නේ යයි සතුටු සිත් ඇතිව මෙසේ කෑද උයන්න. මෙසේ කැවුම් උයන්න.

මුළුතැන් ගෙයි සියළු කටයුතු සංවිධාන කරන්නී හැසිරුණාය. මේ අතර ඇගේ සැමියා සෙට පවාරණය වන්නේයයි කුස්සියට මුහුණ ලා පිහිටි ජනේලයේ සිට ඇය කුමක් කරන්නේ ද ඇය අඥානලෙස හැසිරේදැයි බලන්නේ ඇය දාඩිය දමාගෙන අළු තවරාගෙන අඟුරු දැලි ගාගෙන මෙලෙස සංවිධාන කරමින් හැසිරෙන අයුරු දැක අහෝ අඳ බාල තැනැත්තිය මෙබඳු තැනක මේ ශ්‍රී සම්පත් අනුභව නොකරන්නේ යයි ද මුඛු මහණුන්ට උවටැන් කරමියි තුටු සිතින් හැසිරෙතියි සිනාසී පහයට ගියේය. ඔහු වෙන්වී ගියවිට ඔහු ලඟ සිටි සිරිමා ගණිකාව කුමක් බලා මොහු සිනා සුනේදැයි එම ජනේලයෙන් බලන්නී උත්තරාව දැක මැය බලා මොහු සිනාසුනේය. ඒකාන්තයෙන් ඇය හා සහවාසයක් ඇතැයි සිතුවාය. ඇය වනාහී එම නිවසේ අඩමසක් බාහිර ස්ත්‍රියක් ලෙස වසන්නේ නමුදු ඒ සම්පත් අනුභව කරමින් තමන් බැහැර ස්ත්‍රිය බව නොදැන ගෘහස්වාමි ස්ත්‍රියයි හැඟීමක් ඇති කරගත්තාය. ඇය උත්තරාව කෙරෙහි වෛරයක් බැඳගෙන ඇයට දුකක් දෙන්නෙමියි පහයෙන් බැස කුස්සියට පිවිසි කැවුම් උයන තැන හොඳින් පැසුන ගිතෙල් හැන්දෙන් අරගෙන උත්තරාව දෙසට ගියාය. උත්තරා ඇය එනු දැක මගේ මේ සාහිකාව විසින් බොහෝ උපකාර කරණුලදී. සක්වල සම්බාධ සහිතය බ්‍රහ්මලෝකය පහත්ය. මගේ සහායිකාවගේ ගුණය උසස්වේ. මැය නිසා මට ධර්මය ඇසීමටත් දන් දීමටත් අවස්ථාව ලැබුනි. මෑ කෙරෙහි මගේ ක්‍රෝධයක් පවතිනම් මේ පැසුණු ගිතෙල් මා දවත්වා එසේ නොමැති නම් නොදැවේවායි ඇය කෙරෙහි මෛත්‍රීය පැතුරු වේය. ඇය විසින් උණු ගිතෙල් හිසමත දැමුවිට සිතල ජලයක් බඳුවිය. එහි දී සිරිමා මෙය සීතල වී තිබේ නැවත පැසෙන ගිතෙල් හැන්ද පුරවා ගෙන එනවිට උත්තරා වගේ දාසියෝ දක පලායව දුර්විනිතිය නුඹට අපේ අර්යාවගේ හිසේ ගිතෙල් දැමීමට සුදුසුනැත. යයි තර්ජනය කරමින් එහෙන් මෙහෙන් නැගිට අතින් ද පයින්ද තලා බිම හෙලීය. උත්තරා මෙය වැලැක්වීමට උත්සහ කළ ද නොහැකිවිය. අනතුරුව ඇයගේ සිරුර මත සිට සියළු දාසින් වලක්වා ඇයි ඔබ මෙබඳු බැරුරුම් දෙයක් කලේ විමසමින් සිරිමාවට අවවාද දී උණුදියෙන් නාවා සියක් වර පෙරු තෙලින් ඇස ගැල්වීය. තැවීමද කළාය.

එකෙනෙහි තමන් බැහැර ස්ත්‍රියක් බව තේරුම්ගෙන මවිසින් බැරෑරුම් ක්‍රියාවක් කරණ ලදිමි. ස්වාමීයා සිනාසිම් පමණකින් ඇගේ හිසමත උණුතෙල් වත්කළ මට අල්ලා ගන්නැයි දාසියන්ට අණ නොකළාය. මාව පෙළන අවස්ථාවේදීද සියළු දාසියන් බැහැර කොට මට කළයුතු දෑ කළාය. ඉදින් මම ඇයගෙන් සමාව නොගන්නේනම් මගේ හිස සත්කඩකට පැලෙන්නේය. ඇගේ පාමුල වැටී ආර්යාවනි මට සමා වන්නැයි කීවාය. මම පියා ඇති දුවකි පියා සමාවූ විට මම ද සමාවෙමි. එලෙස වේවා ඔබේ පියා පුණ්ණ සිටුතුමාය එතුමා ගෙන් ද මම සමාව අයදිමි. පුණ්ණ මගේ සාංසාරික පියාය. මගේ ලෝකෝත්තර පියා නම් සම්මා සම්බුදුන්ය. උන්වහන්සේගෙන් සමාව ගත්විට සමාව දෙන්නෙමි. උන්වහන්සේ පිළිබඳ මගේ විශ්වාසයක් නැත. මම එම විශ්වාසය ඇතිකරන්නෙමියි උත්තරා පැවසුවාය. හෙට භික්ෂු සංඝයා සමග මගේ නිවසට වැඩම කරන්නාහ. එහිදි ඔබ ලබනලද සත්කාරය ගෙන මෙහි පැමිණ උන්වහන්සේගෙන් සමාව ගන්න. යහපතැයි කියා ඇය පිළිගත්තාය.

පසුව උත්තරා තම ගෙට ගොස් පන්සියයක් පරිවාර ස්ත්‍රීන්ට අණකර නොයෙක් වර්ගයේ ඛාදනීය මෙන්ම සුප් ආදී පානය කළයුතු දෑ සකස්කොට දෙවන දිනයේදී එම සත්කාරය ගෙන උත්තරාවගේ ගෙට අවුත් බුද්ධප්‍රමුඛ මහා සංඝයාගේ පාත්‍ර පිහිටුවීම නොඉවසන්නී සිටියාය. ඒ සියල්ල ගෙන උත්තරාම සියල්ල සංවිධාන කළාය. සිරිමාව ද බුදුන් වළඳා අවසානයේ පිරිවර සමගම බුදුන් පාමුල වාඩිවුවාය. එසේ වාඩි වූ සිරිමා බුදුන් වැඳ කළ වරදට සමාව ඉල්ලුවාය. අනතුරුව තථාගතයන් වහන්සේ ඔබේ අපරාධය කුමක්දැයි විමසුහ. ස්වාමීනි මම ඊයේ මෙබඳු දෙයක් කළෙමි. මම ඇගේ මේ ගුණ දැන සමාව ගනිමි. එහි දී ඇය ඔබ වහන්සේ ගෙන් සමාව ගත්විට සමාව දෙනබව පැවසුවාය. උත්තරා වෙනි එසේ පැවසුවේද උත්තරා සැබෑවට පැවසුවාය. මගේ හිසට උණු තෙල් මේ සඟයිකාව වත් කළාය ඔබ එවිට කුමක් සිතුවේද උත්තරාවනි ස්වාමීනි මම ඇගේ ගුණ උසස් කොට සැලකීමි. සක්වල සම්බාධ සහිතය. බ්‍රහ්මලෝකය ඉතා පහත්ය මගේ මිතුරියගේ ගුණ වඩාත් මහත්ය. ඇය නිසා මෙසේ ධර්මය ඇසීමටත් දන් දීමටත් ලැබුවෙමි. ඉදින් ඇය කෙරෙහි කෝපයක් පවතිනම් මගේ හිස දෑවේ මා නො එසේ නම් නොදුවෙවායි පැතුවෙමි. මම මැයට මෛත්‍රීය

වැඩුවෙමි. සාධු - සාධු - උත්තරාව එසේ කෝපය ජයගැනීම වටී. ක්‍රෝධය මෛත්‍රියෙන්ද අක්‍රොෂ පරිභව එසේ නොකිරීමෙන් ද තද මසුරුබව තමා සන්තක දෑ පරිත්‍යාග කිරීමෙන්ද බොරුව සත්‍ය වචනය භාවිතයෙන්ද ජයගත යුතුයයි පවසා මේ ගාථාව දෙසුහ.

දුරලනු කොරෝදය මෙන්සිත පැනිරීමෙන්
දුදනා දමනු, යහපත් ගතිගුණ පෑමෙන්
නැතිවෙයි ලෝබ සිත නිතරම දන්දීමෙන්
යටපත් වේ බොරුව ඇත්තම හෙළිවීමෙන්

එහි අක්කොධෙන - ක්‍රෝධ සහිත පුද්ගලයා නො කිපීමෙන් දිනිය යුතුය. අසාධුං අයහපත් තැනැත්තා යහපත් බැවින් දිනිය යුතුය. **කදරියං** තදමසුරු තැනැත්තා තමන් සතුදේ දීමෙන් ත්‍යාග වන්ත සිතින් දිනිය යුතුය. බොරු කියන්නා සත්‍ය වචන භාවිතයෙන් දිනිය යුතුය. මෙම දේශනය අවසානයේ සිරිමා සහිත පන්සියයක් කාන්තාවෝ සෝවාන් ඵලයට පත්වුවාහුය.

උත්තරා උපාසිකාව පිළිබඳ කතා පුවතයි.

17-4

"සච්චං භණෙ" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී මහ මුගලන් තෙරුන්ගේ ප්‍රශ්නයක් නිමිති කරගෙන දේශනාකළහ.

එක් සමයක මුගලන් තෙරුන් දෙවිලොව චාරිකාවේ යෙදී මහේශාක්‍ය දේවතාවියකගේ විමන් දොර සිටියදී ඇය තමන් වහන්සේ වෙත පැමිණ වැඳ සිටි අවස්ථාවේ දිව්‍යාංගනාවනි ! ඔබේ සම්පත් මහත්ය. කවරනම් කුසල කර්මයක් කොට මේ සම්පත් ලැබුවේදැයි විමසුහ.

ස්වාමිනි මගෙන් නො විමසන්න. දේවතාවියෝ තමන්ගේ සුළු කුශල කර්ම නිසා ලජ්ජාවෙන්ම කියති. තෙරුන් වහන්සේ එය කියන්නයයි බලකර සිටිහෙයින් එසේය ස්වාමීනි මම දන් නොදුන්නෙමි. පුජා ද නොකෙළෙමි. ධර්මය ද නො ඇසුවෙමි. නුදෙක් සත්‍ය බස පමණක් ආරක්‍ෂාකළෙමි. තෙරුන් අනෙක් විමන් දොරටුවලට වැඩමකොට පැමිණියා වූ අනෙක් දෙව් දුවරුන්ද විමසුහ. ඔවුහු ද නොසඟවා කරුණු පැවසුහ. තෙරුන් වළකාලීමට නොහැකිව එක් දේවතාවියක් මෙසේ පැවසුවාය.

ස්වාමිනි මම දානාදි පිංකම් නොකෙළෙමි. මම කාශ්‍යප බුද්ධ කාලයේදී දාසියක් වීමි. එකල මගේ සැමියා සැඩ පරුෂ කෙනෙක් විය. ගත් ගත් තැන දන්ඩකින් හෝ දරලියකින් හෝ මගේ හිස පළයි. මට කෝපයක් ඇතිවුවිට ඔබේ සැමියා අත්පා සිදීමක් හෝ නාසාදිය සිදීමට හෝ නොකිපේවායි තමන්මම සිතා කෝප නොකෙළෙමි. එනිසා මේ සම්පත් මම ලදිමි. පැවසුවාය. අන් අප්සරාවක් ස්වාමීනි මම පසුගිය අත්මයේදී උක්හේනක් රකින්නිව සිටියදී භික්‍ෂුවකට උක්ලීයක් දුන්නෙමි. තවත් තැනැත්තියක් තිබිරි ගෙඩියක් දුන්නාය. එකියක් කුඩාගෙඩියක් දුන්නාය. එකියක් උගුරැස්ස ගෙඩියක් දුන්නාය. එකියක් අලමුලක් දුන්නාය. එකියක් කොසඹ විටක් දුන්නාය. මේ ආදී වශයෙන් තම තමන් දුන් ඉතා ස්වල්පවූ දාන පෙන්වාදී මේ මේ කරුණු නිසා අපවිසින් මේ සම්පත් ලබන ලදයි කිවාහුය. තෙරුන් ඔවුන් විසින් කරණලද කුශලකර්ම අසා බුදුන් වෙත එළඹ මෙසේ විමසුහ.

ස්වාමීනි ! සත්‍යවචන කීම් පමණකින්, කෝපය නිවූ පමණකින්, ඉතා කුඩා වූ තිඹිරිගෙඩියක් දීමෙන් දිව්‍ය සම්පත් ලැබිය හැකිද? ඇයි මුගලන් කුමක් නිසා ඔබ මගෙන් මෙසේ විමසයිද? දේව කාන්තාවන් විසින් නොකියන ලද්දේද? එසේය. ඔවුන් කියන ලදි මෙපමණකින් නිවන් සුව ලැබිය හැකිදයි සිතමි අනතුරුව බුදුරජාණන් වහන්සේ මොග්ගල්ලාන සත්‍ය වචන කීම් පමණකින් කෝපය සිඳලූ පමණකින් සුළු දානයක් පිරිනැමූ පමණකින් දෙව්ලෝ යති. මේ ගාථාව දේශනා කළහ.

තරහ ගෙන නොකිපෙනු
කුඩා බොරුවක් වුවද නොකියනු
මදක් වුව දන් දෙනු
මෙපින් ලැබ දෙව්ලොවේ ඉපදෙනු

එහි **සච්චං භණෙ** - සත්‍යයම කියයි - ව්‍යවහාර කරයි. සත්‍යයෙහි පිහිටන්න යන අරුතයි. අන් අයට නොකිපෙන්න. **"යාචිතොකි"** ඉල්ලන්නෝ නම් සිල්වත් භික්ෂූන් විසින් කිසිවක් දෙන්න. ආයාචනා කරමින් ම ගෙදොර සිටිති. අර්ථයෙන්නම් ඉල්ලීමයි මෙලෙස සිල්වතුන් විසින් ඉල්ලා සිටිනවිට ඉතා ස්වල්පවූ දෙයක්වුව තිබේනම් දියයුතුය. මේ කරුණු තුනෙන් දෙව්ලොව යන්නේ ය යන අර්ථයි. දේශනය කෙළවර බොහෝ දෙන සෝවාන් ආදි මාර්ග ඵලයන්ට පත්වූහ.

මුගලන් තෙරුන්ගේ ප්‍රශ්න
පිළිබඳවූ කථා පුවත නිමි.

17-5

"අහිංසකායෙනි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සාකේත නගරය ඇසුරු කොට අඳුන් වන සේ වැඩසිටියදී භික්ෂූන් විසින් විමසු ප්‍රශ්න නිමිතිකර ගෙන දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් පිරිවරා සාකේත නුවර පිඬුපිණිස පිවිසෙන කල සාකේත වාසී එක් බ්‍රාහ්මණ මහල්ලෙක් නගරයෙන් නික්ම යන්නේ ඇතුල් ගෙය දොරටුවේදී දසබලයන් වහන්සේ දැක, දණින් වැටී කෙණ්ඩාවලින් දැඩිසේ අල්ලාගෙන දරුව පුතුන් විසින් දෙමාපියන් දිරා ගියවිට පිළිදැගුම් කළයුතු නොවේද? කුමක් හෙයින් මෙපමණ කලක් අපවෙත නො ආවේ ද මවිසින් ඔබ දක්නලදී, මව දැකීමට එන්න බුදුන් ගේ අතින් අල්ලාගෙන තමන්ගේ ගෙට ගියේය. බුදුහු එහි ගොස් පනවන ලද අසුනේ වාඩිවූහ. භික්ෂූන් වහන්සේලා ද වාඩිවුහ. බැමිණිය ද පැමිණ බුදුන්ලඟ දණින් වැටී දරුව මෙපමණ කලක් කොහි ගියේද? මහලු වියට පත් දෙමාපියන්ට දරුවෝ උවටැන් කළයුතු නොවේද පවසා දූදරුවනි එන්න සොහොයුරාට වඳින්න. ඔවුන් දෙදෙනාම තුටු පහටුව බුදුන් ප්‍රමුඛ සංඝයා වැඳ ස්වාමීනි මෙහිම නිබඳව භික්ෂාව ගණුමැනවයි කියා සිටි විට බුදුවරුනම් එක තැනක නිතර වාසය කරන්නෝ නො වෙති. එක තැනක භික්ෂාව ගන්නෝද නො වෙතිය පැවසුවිට එසේ නම් ස්වාමීනි. යම් කෙනෙක් ආරාධනයට පැමිණෙත්ද ඔහු අප සම්පයට එවන්නැයි කීවානුය. බුදුහු එතැන් පටන් අරාධනා කිරීමට පැමිණිවිට බ්‍රාහ්මණයන්ට දැනුම් දෙන්නැයි එවීය. ඔවුන් ගොස් අපි හෙට බුදුන්ට ආරාධනා කරන්නෙමු යයි බමුණාට කියති. බමුණා දෙවන දිනයේදී තමන්ගේ ගෙදරින් බත් භාජන ව්‍යංජන භාජන රැගෙන බුදුන් සිටින තැනට යයි.

අන් අයගේ ආරාධනයක් නොමැතිවිට බුදුහු බ්‍රාහ්මණයාගේ නිවසට වැඩම කරති. ඔවුන් දෙදෙනාම නිතර දියයුතු දෑ බුදුන්ට දෙමින් බණ අසමින් අනාගාමී ඵලයට පත් වූහ. භික්ෂූන් ද ධර්ම සභාවේ කථාවක් ඉපදවූහ. ඇවැත්නි. බුදුරජාණන් වහන්සේගේ දෙමාපියෝ සුද්ධෝදන හා මහාමායා

දේවීබව දැනගෙනම මෙසේ දැනගෙනම බ්‍රාහ්මණයා හා බැමිණිය තමන් ගේ පුතුයයි බුදුන්ට පවසති. බුදුන් ද එය ඉවසාසිටී. කුමක් නිසා මෙසේ කියත්ද? මේ කථාව ඇසූ බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ මහණෙනි මේදෙදෙනාම තමන්ගේ පුතුට පුතායයි කියතියි අතීත කථාව ගෙනහැර දැක්වීය. මහණෙනි මේ බ්‍රාහ්මණයා අතීතයේදී පන්සියයක් ජාතිවල මගේ පියා විය. පන්සියයක් ජාති සුළු පියා විය. ජාති පන්සියයක් මහ පියා විය. මවද එසේම ඔහුගේ භාර්යාව වෙමින් ජාති පන්සියයක් මව වුවාය. ජාති පන්සියයක් සුළු මව වුවාය. ජාති පන්සියයක් මහ මව වුවාය. මෙසේ එක්දහස් පන්සියයක් (1500) බමුණගේ හා බැමිණියගේ අත මම වැඩුනෙමි. මෙසේ ඔවුන්ගේ පුත්‍ර භාවය දක්වා මේ ගාථාව පැවසුහ.

බුදුහු තෙමෙසක්ම එම කුලය නිසාම වැඩවාසය කළහ. ඒ දෙදෙනාම අර්හත්වයට පත්ව පිරිනිවන් පෑවාහුය. අනතුරුව ඔවුන්ට මහත් සත්කාර කොට දෙදෙනාම එකම කුළු ගෙයකට නංවා බැහැර කළහ. බුදුහු ද පන්සියයක් භික්ෂූන් පිරිවර කොටගෙන ඔවුන්සමගම ආදාහන කළ තැනට වැඩම කළහ. බොහෝ ජනයාද බුදුන්ගේ මවුපියෝයයි පැමිණියහ. බුදුහු ආදාහනය කරණ ස්ථානයේ අසල එක් ශාලාවක වැඩසිටියහ. ඕනිස්සු බුදුන් වැඳ එකත් පසෙක සිට ස්වාමීනි ! ඔබ වහන්සේගේ දෙමාපියෝ කළුරිය කළහයි නොසිතන සේක්වා, ආදිය කියමින් බුදුන් සමගම පිළිසඳර කරති. බුදුහුත් එසේ නොකියන්නැයි ප්‍රතික්ෂප නොකොට පිරිස අතර අදහස් බලා එම අවස්ථාවට උචිත ධර්මයක් දේශනා කරමින්

ජීවිතය ඒකාන්තයෙන් අල්පය. කලල අවස්ථාවේ ද මියයති. ඉන් එහා වර්ෂ සියයකින් වුවද මියයයි යමෙක් සියවස් ඉක්මවා ජීවත්වේද ඔහු ජරාවට පත්වම මිය යයි.

මේ ජරාව පිළිබඳ සූත්‍රය දේශනාකළහ. දෙසුම අවසන අසුහාර දහසක් ධර්මාවබෝධය කළහ. භික්ෂූන් වහන්සේලා බ්‍රාහ්මණයා හා බැමිණිය පිරිනිවන් පෑ බව නොදැක ස්වාමීනි ඔවුන්ට කවර ලෙස පරලොව වීදැයි විමසුහ. බුදුහු මහණෙනි මෙබඳු අගෙක්ෂ මුනිවරුන්ට පරලොවක් නැත.

මෙබඳු අය **අචුතවූ** අමෘත මහා නිවණම පැමිණෙතියි පවසා මේ ගාථාව දේශනාකළහ.

තුන් දොරින් සංවර
අහිංසක වූ මහණ බමුණෝ
සෝක නැති තිර වූ
නිවන් මගටම පැමිණෙති

"**අහිංසකා යෙ මුනයෝ නිච්චං** - අහිංසකවූ ඒ මුනිවරු නිතර කයින් සංවරවී අවරණය ස්ථානයවූ නිවනට ගොස් ශෝක නොකරති. එහි **මුනයෝ** යනු මොනෙයය ප්‍රතිපදා වෙන් මාර්ග ඵලයට පත් අශෛක්ෂ මුනිවරු. **කායෙන** යනු දේශනා මාත්‍රය පමණී. තිදොරින් සංවරවූ යන අර්ථයයි. **අචුත - නම් ශාස්වත ඨානං** - යනු අකෝප්‍ය වූ ස්ථාවර වූ ස්ථානය නිවන - **යත්ථා** යයි තැනකට ගොස් ශෝක නොකරති. නොනැසේ එතැනට යයි යන අරුතයි. දේශනය අවසානයේ බොහෝ දෙනා සෝතාපත්ති ඵල ආදියට පැමුණුනාහ.

සාකේතක බ්‍රාහ්මණයා පිළිබඳ කථා පුවතයි.

17-6

"සදාජාගර මානනති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ගිජුකුළු පර්වතයේ වාසය කරණ අතර පුණ්ණා නම් රජගහ නුවර සිටුවරයාගේ දාසියක් නිමිති කරගෙන දේශනා කළහ.

එක් දිනක් පුණ්ණාට කෙටීම සඳහා බොහෝ වී දුන්නාහුය. ඇය රාත්‍රි කාලයේ ද පහනක් දල්වාගෙන වීකොටමින් සිටියදී විවේකය සඳහා දහඩිය වැගිරිනු ශරීරයෙන් ගෙයින් පිටත සිහිල් සුලඟ හමන තැනක සිටියාය. මේ අවස්ථාවේදී දබ්බමල්ලපුත්ත තෙරුන්, භික්ෂූන්ට සෙනසුන් පනවන ධුරය දරු භික්ෂුවයි. උන්වහන්සේ තම තමන්ගේ සෙනසුන් වලට යන්නාවු භික්ෂූන්ට ඇඟිල්ල දල්වා ආලෝකයක් මැවුහ. එළි මහනේ සිටිය පුණ්ණා මේ ආලෝකයෙන් පර්වතයේ හැසිරෙන භික්ෂූන් දැක මම නම් මගේ දිළිඳු කමින් පෙළුනේ මේ වේලාවේත් නින්දට නොයමි. මේ ස්වාමීන් වහන්සේලා කුමක් නිසා නොනිදා සිටින්දැයි සිතා ඒකාන්තයෙන් කිසියම් තෙරනමකට රෝගිබවක් හෝ සර්පයෙකු හෝ දෂ්ට කිරීමක් (උවදුරක්) වන්නේයයි සිතා උදැසනම සහල් කුඩු රැගෙන දියෙන් තෙමා අත්ලේ කැටුමක් සාදා ගිනි අඟුරුවල තම්බා උකුලේ (ඉනේ) තබාගෙන තොටුපොළට යන පාරේදි කන්නෙමියි කලය ගෙන තොටුපොළ බලා යන්නීය. බුදුරදුන් ද ගමට පිඬුපිණිස වැඩම කිරීම සඳහා එම පාරේම ගමන් කිරීම සඳහා පිළිපන්හ. ඇය බුදුන් දැක මෙසේ සිතුවාය. අන් දිනෙක බුදුන් දකින විට ම විසින් දියයුතු දෙයක් නැත. දියයුතු දෙයක් ඇතිවිට බුදුන් දක්නට නොලැබේ. දැන් දියයුතු දෙයක් ද ඇත. බුදුරදුන් ද හමුවිය. ඉදින් - රළුවු හෝ ප්‍රණීත වු හෝ දියයුතු දෙයක් ඇති නිසා නීරස ද ප්‍රණීත ද මිහිරි බවද නොසිතා ගන්නේනම් දෙන්නෙමියි කළය එකත් පසෙක තබා බුදුන් වැඳ ස්වාමීනි මේ රළු දානය පිළිගෙන මට සංග්‍රහ කරන්නැයි පැවසුවාය. - බුදුහු ආනන්ද තෙරුන් දෙස බලා උන්වහන්සේ සිවුරෙන් මෑත්කර සිවි මහ රජු දුන් පාත්‍රය එළවා කැවුම (රොටිය) ගත්හ. පුණ්ණා ද එය බුද්ධ පාත්‍රයේ තබා පසඟ පිහිටුවා වැඳ ඔබවහන්සේට දීමෙන් මෙහිදීම විපාක දේවායි පැවසුවාය. බුදුහු ඔබේ අදහස ඉටුවේවායි සිටගෙනම පින් අනුමෝදනය

කළහ. පුණ්ණ දාසිය සිතුවාය කිම බුදුහු මට සංග්‍රහ කරමින් රොටියි (පුව) පිළිගත්හ. එහෙත් උන්වහන්සේ මේ රොටිය නොවළඳනු ඇත. එකාන්තයෙන් ඉදිරියේදී කපුටන්ට හෝ දී රජුගේ හෝ රාජපුරුෂයෙකු ගේ මන්දිරයකට ගොස් ප්‍රණීත ආහාර ගෙන වළඳන්නේය. බුදුරජාණන් වහන්සේ ද ඇගේ මේ සිත දැනගෙන ආනන්ද තෙරුන් දෙඉඹුලා වාඩි වීමට සුදානම් වුහ. තෙරුන් සිවුරතමා අසුනක් පනවා දුන්හ. බුදුහු නගරයෙන් පිටත දීම දන්වළඳා (රොටිය) එසේ වළඳන්නට සුදානම් වනවිටී දෙවිවරු සියළු සක්වල ගැබ දෙවි මිනිසුන්ට සුදුසුවූ ඕජස මඬුපටලක් ලෙස කළතා එහි බහාලුහ. පුණ්ණ දාසිය ද බලා සිටියාය. වළඳා අවසන බුදුහු පුණ්ණාට කථාකොට පුණ්ණා ඔබ මගේ ශ්‍රාවකයින්ට කුමක් නිසා පරිභව කරන්නිද? යි විමසුහ. නැත ස්වාමීනි මම පරිභව නොකරමි. එසේ නම් මගේ ශ්‍රාවකයන් දෙසබලා ඔබ කුමක් කිවේද? මම මේ දුක්ඛිත බවනිසා නොනිදා සිටියෙමි. මේ ස්වාමීන් වහන්සේලා කුමක් නිසා නොනිදා සිටින්ද? ඒකාන්තයෙන් උපද්‍රවයක් ඇතිවී තිබේ කිසියම් නමකට අපහසුවක් ඇත දීර්ඝ ජාතික සර්පයයකුගෙන් උපද්‍රවයක් සිදුවන්නට ඇත. ස්වාමීනි මම සිතුවේ මෙපමණකි. බුදුහු ඇගේ වදන් අසා පුණ්ණා ඔබ තම දුප්පත් බව නිසා නිදිවරයි. මගේ ශ්‍රාවකයෝ හැමදා නිදි වැරීමේ යෙදී සිටිතියි මේ ගාථාව දේශනාකළහ.

දිවා රෑ නොනිදා
අවදිව පුරා තුන්සිත
නිවන් මග ඇලුණහු
දුරු කෙරේමැයි සියලු කෙළෙසුන්

හැමදා නිදිවරණ දිවා රාත්‍රි හික්මෙන නිවනේ යෙදෙන ශ්‍රමණයෝ කෙළෙස් නිවීම කරති.

එහි **අභොරත්තානු සික්ඛිතත්ති සඤ්ඤිතං** - යනු රෑදාවල් ත්‍රිශික්ෂා වන්ගෙන් නික්මෙන **නිබ්බාණං අධිමුත්තානං** නිවන අරමුණු කරගෙන සිටින "**අත්ථං ගච්ඡන්ති**" මෙබඳු සියළු කෙලෙස්මල විනාශයට, නැති බවට පත් කරති. යන අරුතයි. දෙසුම අවසන එලෙස සිටි පුණ්ණා සෝවාන් ඵලයෙහි

පිහිටියාය. පැමිණි පිරිසට ධර්මදේශනය සාර්ථක බවට පත්විය. බුදුහු තැබූ රොටියෙන් දවල් ආහාර කිස නිමවා විහාරයට වැඩම කළහ. භික්ෂූන් වහන්සේලා ධර්ම සභාවේදී කථාවක් ඉපදවූහ. ඇවැත්නි දුෂ්කර වූ දෙයක් බුදුරජාණන් වහන්සේ විසින් කරණ ලදහ. බුදුන් පැමිණ කවරකථාවකින් යුතුව මා පැමිණිබව පෙර කිනම් කථාවකින් යුතුව සිටියේ දැයි විමසා මේ පිළිබඳවයයි පැවසුවිට මහණෙනි දැන් පමණක් නොව පෙරද මම තුඹුසහලින් කළ රොටි වැළඳුවෙමියි පවසා අතීත කථාව දක්වූහ.

කා ඉතිරි වූ තණ ද, කැඳ බත් ද කා වැඩුණු හෙයින් මෙය තට භෝජනය විය. දැන් එය කුමක් හෙයින් නො කන්නේ ද?

බමුණානනි ! යම් තැනක බොහෝ දෙනා උපතින් උසස් බව හා ආචාර ශීලයෙන් යුතු බව නො දනිත්ද? එහි දී කැඳ වතුරද කුඩු ද, පරිභෝග කරමි. ඔබ වනාහි මා ශ්‍රේෂ්ඨ අශ්වයෙකැයි හොඳින් දන්නේය. දන්නකු වන ඔබ වෙත පැමිණ දන්නෙක් වන මම ඔබේ කුඩු නො කමි. මේ කුණ්ඩක සිත්ධව පෝතක ජාතකය විස්තර ලෙස දෙසුහ.

පුණ්ණා පිළිබඳ කථාවයි.

17-7

"පොරාණ මෙතං" යනු මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටියදී අතුල නම් උපාසක වරයෙකු නිමිති කරගෙන දේශනා කළහ.

මොහු සැවත් නුවර වැසි උපාසකයෙකි. පන්සියයක් උපාසකවරු පිරිවර කොට ගෙන එක් දිනක් බණ ඇසීම සඳහා විහාරයට ගොස් රේවත තෙරුන් ලඟ බණ අසනු කැමතිව රේවත තෙරුන්ට වැඳ වාඩිවිය. උන්වහන්සේ සිහි නුවණින් යුතුව සිංහයෙක් මෙන් එකලාව හැසිරෙණ කෙනෙකි. එනිසා ඔහු හා කිසිවක් කථා නොකළහ. තෙරුන් කිසිවක් කථා නොකළේයයි කිපී නැගිට සැරියුත් තෙරුන් වෙත ගොස් එකත් පසෙක වාඩිවිය.

සැරියුත් තෙරුන් විසින් කුමක් නිසා පැමිණියේ දැයි විමසුවිට ස්වාමීනි මට මේ උපාසක වරු රැගෙන ධර්ම දේශනයක් ඇසීම සඳහා රේවත තෙරුන්වෙත එළඹුනෙමි. උන්වහන්සේ මට කිසිවක් නොපැවසුහ. මම උන්වහන්සේ කෙරෙහි කිපී මෙහි පැමිණියෙමි. මට ධර්මදේශනා කරන්නැයි පැවසුවිට එසේ නම් උපාසක වරුනි වාඩිවන්න බොහෝ කොට අභිධර්මය දේශනා කළහ. උපාසකවරු අභිධර්ම කථානම් තේරුම් ගැනීමට ඉතා අපහසුය. අපට මෙයින් කවර අර්ථයක්ද? අපට ඉන් ප්‍රයෝජනයක් නැතැයි කීපී. පිරිස ගෙන ආනන්ද තෙරුන් වෙත ගියහ. උන්වහන්සේ විසින් ද උපාසක වරුන් කුමක් නිසා පැමිණිදැයි විමසුහ. ස්වාමීනි අපි ධර්මය ඇසීමට රේවත තෙරුන් වෙත ගියෙමු උන් වහන්සේ වචනයකුදු නො පැවසුහ. එනිසා කිපී සැරියුත් තෙරුන්වෙත ගියෙමු. උන්වහන්සේ බොහෝ කොට අභිධර්මය දේශනා කළහ. ඉන් අරුතක් නැතැයි කිපී මෙහි පැමිණියෙමු. ස්වාමීනි අපට දහම් දෙසන්නැයි ඉල්ලා සිටියහ. එසේ නම් වාඩි වන්න අසන්නැයි ඔවුන්ට ආනන්ද තෙරණුවෝ ඇසියයුතු ස්වල්පවු ධර්මයක් දේශනාකළහ. ඔවුන් ආනන්ද තෙරුන්ට ද කිපී බුදුන් වෙත ගොස් වැඳ එකත් පසෙක වාඩිවුහ. එහිදී බුදුනු උපාසක වරුනි ඔබ පැමිනියේ කුමක් නිසාදැයි විමසුහ. ධර්ම ශ්‍රවණ සඳහා යයි පැවසුහ. ඔබ ධර්මය ඇසුවේ

දැයි විමසුහ. ස්වාමීනි අපි පළමුව රේවත හිමියන් වෙත ද අනතුරුව සැරියුත් තෙරුන් වෙත ද ඊට පසුව ආනන්ද තෙරුන්වෙත එළඹියෙමු. උන්වහන්සේ සුළු ප්‍රමාණයක් දෙසුහ. ඉන් කිපී අපි ඔබවහන්සේ වෙත පැමිණියෙමු. බුදුහු ඔහුගේ කථාව අසා අතුල මෙය පෙරසිට පැමිණි දෙයෙකි. නිහඬව සිටින්නන්ට ද බොහෝ කථාකරන්නන්ට ද මද පමණට කථා කරන විට ද ගරහති. ඒකාන්තයෙන් ගැරහිය යුත්තන් ද ඒ කාන්තයෙන් ප්‍රශංසා කරනු ලබන්නන් ද නැත. රජවරු ද ඇතැම් අය ගරහති ඇතැම් අය ප්‍රශංසා කරති. මහ පොළව ද සඳ හිරු දෙදෙනා ද එසේ නින්දා පැසසුම් ලබති. සිවු පිරිස මැද සිට ධර්මය දේශනා කරණ බුදුන්ට ද ඇතැම් අය ගරහති සමහරු ප්‍රශංසා කරති. අඳබාල අයගේ නින්දාව හෝ ප්‍රසංසාව හෝ සැලකිය යුතු නොවේ. නැණවත් ප්‍රඥාවත් අයගේ නින්දාව නින්දාව නම් ඒ අයගේ ප්‍රශංසාව ද ප්‍රශංසාව නම් මෙයයි පවසා මේ ගාථාව දේශනා කළහ.

නින්දා නොලද කෙනෙකුන් තෙදියතේ	නැත
හැමදා හොඳ නමම රැකගත් කෙනෙකු	නැත
නින්දා පසංසා අටලෝ දහම	මත
කැරකෙයි සදා කල් වෙනසක් නොවනු	ඇත
නුවණින් සීලයෙන් ගුණයෙන්	අපරිමිත
තුන් බුදුවරුද මහණහු හා දුමුණු	සිත
සැලකුම් කරන මෙන් දඹරන් පිඬක	වෙත
හිස බිම තබා දෙවි බඹවරු වඳිනු	ඇත.

අතුල මෙය පෞරාණික ධර්ම තාවයකි. නිහඬ අයට ද බොහෝ කථාකරන්නාට ද පමණට කථා කරණ අයට ද නින්දා කරති. නින්දාවන්ට ලක් නොවුවෙක් නම් මෙලොව නැත. ප්‍රශංසාව ලැබුවෙක් හෝ නින්දාව ලැබුවෙක් ඇති නොවීය. මතු ඇතිවන්නේද නැත. දැනුදු එවැන්නෙක් නැත.

යම් ප්‍රාඥයෙක් නිතර නිතර පැසසුම් ලබත් ද ප්‍රඥා ශීලයෙන් යුත් නුවණැත්තා පැසසුම් ලබත් සිදුරු රහිතවූ පැවැත් මෙන් ද විඳසුන් නුවණින් හා ලොව් ලොවුතුරු නුවණින් ද සිවු පිරිසිදු සිලයෙන් ද යුතු යමෙකුට

නුවණැත්තෝ නින්දාවම හෝ පැසසුම යුතු කරුණු දිනපතා විමසාබලා පැසසුම් කෙරෙත්ද ජාම්බුනද ස්වර්ණයෙන් කළ පළඳනාවකට මෙන් ඒ පුද්ගලයට නින්දා කිරීමට හෝ කවරෙක් සමත් වේද? දෙවියෝ ද නුවණැති මිනිස්සු ද ඔහුට පැසසුම් කෙරෙති. හෙතෙමේ දෙවිමිනිසුන් තබා මහානුභාව සම්පන්න මහා බ්‍රහ්මයා විසින් ද පැසසුම් කරණ ලද්දේමය.

එහි **පෝරාණමෙතං** - යනු පෞරාණික වූ **අතුලං** ඒ උපාසකයාට අමතයි. **නෙතං අජ්ජනාමිව ඉදං** මෙය නින්දා කිරීම හෝ පැසසුම අද ඇතිවූ දෙයක් නොවේ. **තුණ්හිමාසිනං** යනු ගොළුවෙක් බිහිරෙක් ලෙසට කිසිවක් නොදන්නා සේ නිහඬවී සිටිය ද ඔහුට නින්දා කරති. **බහුභාණිනන්ති** - සුළඟට සැලෙන **තල්පතක්** සේ තට තට ගා නිමන් නැති ලෙස කථා කරමින් සිටීමයි. එනිසාද නින්දා ලබයි. **මිතභාණිමපි** මේ තැනැත්තා රන් අමුරන් සේ තමන්ගේ වචනගැන සිතමින් එකක් දෙකක් හෝ කියා නිහඬව සිටියයි ඔහුටද නින්දා කරත්. මෙලෙස සියළු ආකාරයෙන් මෙලොව නින්ද නොලැබුවෙක් නම් නැත යන අරුතයි. නචාහු අතීතයේද නැතිවිය. අනාගත යේද ඇති නොවන්නේය. **විඤ්ඤූහි** බාල අඥාන පුද්ගලයන්ගේ නින්දාව හෝ පැසසුම ප්‍රමාණ කොට නොගත යුතුය. යම් සේ පඬිවරු දිනපතා සොයාබලා නින්දා කිරීම හෝ ප්‍රශංසා කිරීම දැන ප්‍රශංසා කරත්. සිදුරු නොමැති බැවින් ජීවිත ක්‍රමයේ හෝ ශික්ෂාවෙන් සිදුරු නොමැති හෙයින් යුතු අය **අචිරදූවුත්ති** නින්දා කළ නොහැකිය. ධර්මය දත් නුවණින් යුත් අය **මේධාවී** නම් වේ. මේ නුවනැත්තා ලෞකික හෝ ලෝකොත්තර ප්‍රඥාවෙන් ද චතුපාරිශුද්ධ සීලයෙන් ද යුතු නිසා **පඤ්ඤාසීලසමාහිතා** ඔහු පිරිසුදු රන්සේද ගැටීමට වැඩිමට හැකි ජම්බු නදියේ හටගත් රන් ආභරණයක් සේ කිසිවෙකුට නින්දා කිරීමට සුදුසු නොවේ. **දෙවාපි** - යනු දෙවියෝද නුවණැති මනුෂ්‍යයෝ ද එම භික්ෂුවට සතුටුවෙති. පසසති බ්‍රහ්මුනා යනු දසදහසක් සක්වල බ්‍රහ්මයෝ ද මොහු **පසංසති** යන අරුතයි. දෙසුම අවසන ඒ පන්සියයක් උපාසකයෝ සෝවාන් ඵලයෙහි පිහිටියාහුය.

අතුල උපාසකගේ කථා පුවත නිමි.

17-8

"කායපකොපනති" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනයේ වැඩසිටියදී ජබ්බග්ගිය භික්ෂූන් නිමිති කරගෙන දේශනා කළහ.

එක් දිනක් සවග මහණුන් දෙඅතින්ම සැර යටි ගෙන ලී සෙරෙප්පු දෙකකට නැගී නැතිතළා ගල්තලාවක සක්මන් කරද්දී බට බට හඬ නගා යන ශබ්දය බුදුරජාණන් වහන්සේ අසා ආනන්ද මේ කුමක්ද? විමසා ජබ්බගිය භික්ෂූන්ගේ පාවහන් හඬයයි කී කල්හි සික්ෂාපදයක් පනවා භික්ෂූන් විසින් කායාදී සංවරය රැකීම වටීයයි කියා ධර්මය දේශනා කරමින් මේ ගාථා දේශනය කළහ.

අකුසල් තුනම දුරුකොට සිදුකරන	කයින්
වදනින් කරන අකුසල් හතර කර	අයින්
අකුසල් තුනින් වෙන් වී උපදවන	සිතින්
තුන් දොර හසුරුවන නැණතා සිටිති	තොසින්

කාය ප්‍රකෝපය ආරක්ෂා කරන්න කයින් සංවර වන්නේය, කාය දුශ්චරිත අත්හැර කයින් සුචරිතයේ යෙදෙන්නේය. වචී ප්‍රකෝපය රැක වචනයෙන් සංවර වන්න. වචී දුශ්චරිතය අත්හැර වචනයෙන් සුචරිතයේ හැසිරෙන්න. මනෝ ප්‍රකෝපය ආරක්ෂා කරන්, මනසින් දුශ්චරිතයේ නො හැසිර, මනසින් සුචරිතයේ හැසිරෙන්න. කයින් සංවරවූ උතුමෝ වචනයෙන් ද සංවර වෙති මනසින් ද සංවරවූ උතුමෝ මනාසංවරයේ පිහිටියෝ වෙති.

එහි **කායපකොපං** කාය ප්‍රකෝපය යනු - ත්‍රිවිධ වූ කාය දුශ්චරිත ආරක්ෂා කරන්නේය. **කායෙන සංවුතො** කයින් දුසිරිත්හි පිවිසීම වලකා සංවරවූ වසන ලද දොරටු ඇත්තෙක් වන්නේය. යම්හෙයකින් කාය දුශ්චරිත අත්හැර කාය සුචරිතයේ හැසිරෙන්නේ කයවචන දෙකම සංවර කරයි. අනෙක් ගථා දෙකේද මේ ක්‍රමය සඳහන් වේ. **කායෙන සංවුතා ධීරාති** - යම් නුවණැති අය කයින් ප්‍රාණඝාතය ආදිය නොකරන්නේය වචනයෙන් මුසාවාද ආදී නොකියන්නේ සිතින් අභිධ්‍යා අදිය සටහන් නොකරන්නේ

මනසින් සංවර වූයේ ඔවුහු මෙලොව මනාසේ සංවර වූයේ සුරක්‍ෂිත වූයේ අරක්‍ෂාවූයේ වසන ලද දොරටු ඇත්තේ යන අර්ථයයි. දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ඵලය ආදී මාර්ග ඵලයන්ට පැමිණියාහුය.

ඡබ්බග්ගිය භික්‍ෂූන්ගේ කථාපුවතයි.

ක්‍රෝධ වග්ග වර්ණණාව නිමාවිය.

දාහත්වැනි වර්ගයයි.

18-1

"පණ්ඩු පලාසොව දානිසි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදි එක් ගවඝාතකයකු ගේ පුත්‍රයෙකු නිමිති කරගෙන දෙසුහ.

සැවැත් නුවර එක් ගවඝාතකයෙක් ගවයන්ට වධ දී මරමින් රසවත් මාංශගෙන උයවා අඹුදරුවන් සමග වාඩිවී මස් කන්නේය. ඉතිරි මස් මිළකොට විකුණයි. ඔහු මෙලෙස අවුරුදු පනස් පහක් ගවඝාතනය කරමින් අසල විහාරස්ථානයේ බුදුරදුන් සිටියදී එක දිනක් හෝ හැන්දක් පමණවත් කැඳවත් නොදුනි. ඔහු මස් නොමැතිව බත් අනුභව නොකරයි.

ඔහු එක් දිනක් දවල්කල මස් විකුනා තම ප්‍රයෝජනය සඳහා පිසීම සඳහා මස් කැබැල්ලක් බිරිඳට දී නාන්නට ගියේය. මේ අතර සහායකයෙක් ගෙට පැමිණ බිරිඳට මෙසේ කීවේය. විකිනීමට ඇති මස්වලින් ටිකක් මට දෙන්න. මගේ ගෙට ප්‍රමාණවත් පමණි ලැබුනේ. විකිනීමට මස් නැත. ඔබේ සහායකයා මස් විකුණා දැන් නෑමට ගියේය. මට එසේ නොකරන්න මස් කුඩක් තිබේනම් එය මට දෙන්න. ඔබේ සහායකයාට තබන ලද මස් හැර වෙනත් මස් නැත. මස් නොමැතිව ඔහු ආහාර ගන්නේද නැත. ඒ මස්ටික නොදෙමියි කීවිට ඒ මස් ටික සම්පූර්ණයෙන් ඔහු විසින්ම රැගෙන ගියේය. ගෝඝාතකයාද නා ගෙන ආවේ ඇය විසින් පිසින ලද කොළ සමඟ ඔහුගේ බත්පත බෙදා දුන්විට මස් කොයිදයි විමසුවේය. ස්වාමීනි නැත. මම ඉවීම සඳහා මස් දී ගියා නොවේද? ඔබේ මිතුරා පැමිණ තුටු පඬුරකට විකිණිය යුතු මස් තිබේ නම් දෙන්නැයි ඉල්ලා සිටියේය. මස් නැතිබවත් ඔබට පිසීම සඳහා දුන් මස් ටික පමණක් ඇතිබවත් මස් නොමැතිව ඔබ නොකන නිසා එය දෙන්නට නොහැකිබවත් පැවසුවිට. ඔබ දුන් මස් ටික ඔහු විසින් බලහත් කාරයෙන්ම රැගෙන ගියේ යයි පැවසුවාය. මස් නොමැතිව "මම බත් නොකමියි" එය ගෙන එන්න. ස්වාමීනි කෙසේ කරන්නද මේ බත් කන්නැයි කීවාය. මම නොකමියි ඒ බත් බැහැර කොට ආයුධයක් ගෙන ගේ පසුපස සිටි ගොනා සමීපයට ගොස් කටතුළට අත දමා දිව ඇද ආයුධයෙන්

දිව මුලින්ම කපා ගෙන ගොස් ගිනි අඟරුවල පුළුස්සා බත් පතටත තබා එක බත් පිඬුවක් අනුභව කොට එක මස් කැබැල්ලක් කටේ තැබුවේය. එකෙනෙහිම ඔහුගේ දිව කැඩී බත් පතට වැටුනි. එකෙනෙහිම කළ කර්මයට සමාන විපාකයක් ලැබුනි. ඔහු ගොනා මෙන් ලේ ධාරා මුවෙන් ගලමින් ගෙතුලට පිවිසියේ දණින් වැටී දණගාමින් මහහඬ තැලුවේය. මෙවිට ඒ ගෝඝාතකයාගේ පුතු පියා දෙස බලමින් ආසන්නයේ සිටියේය. මෙවිට මව මෙසේ කීවාය. බලන්න පුත මේ තැනැත්තා ගොනෙකුමෙන් දණගාමින් මහඬින් විලාප කියයි. මේ දුක ඔබ මතද වැටෙන්නේය. මා ගැන ද නොබලා තම යහපත කරගනිමින් පලායන්න. ඔහු මරණ බියෙන් තැතිගත්තේ මවට වැඳ පළා ගියේය. එසේ පළාගොස් තක්ශිලාවට පැන ගියේය. ගවඝාතකයා ද එසේ හඬතලමින් ගේමැද දණගා ඇවිදිමින් සිට මැරී අවිචියෙහි උපනි. ගොනාද මැරුණි. ගවඝාතකගේ පුතු තක්ශිලාවට ගොස් රන්කරු කර්මාන්තය උගත්තේය. අනතුරුව ඔහුගේ ගුරුවරයා ගමනක් යද්දී මෙබඳු අලංකාර ආභරණයක් කරන්නැයි කියා ගියේය. ඔහුද එබඳු අලංකාරයක් කළේය. අනතුරුව ඔවුගේ ගුරුවරයා එය දැක මොහු කොහි හිටියත් ජීවත් වීමට සමතෙක් වෙතැයි වැඩිවියට පත්වීසිටි තම දියණියන් ආවාහ කොට දුන්නේය ඔහු දූ පුතුන් සමග වැඩුනි.

අනතුරුව ඔහුගේ පුත් වැඩී ශිල්ප හදාරා පසුකලෙක සැවැත් නුවරට ගොස් එහි ගෙයි වසමින් සිටින්නේ ශ්‍රද්ධාවත් පැහැදුන කෙනෙක් විය. පියා ද තක්ශිලාවේදී කිසිදු කුශලයක් නොකරම ජරාවට පත්විය. එහිදී ඔහුගේ පුතු මගේ පියා දැන් මහළුයයි තමන්ගේ ලඟට කැඳවා පියා වෙනුවෙන් දනක් දෙන්නෙමියි. බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට ආරාධනාකළහ. දෙවැනි දවසේ බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයා වාඩි කරවා මැනවින් වළඳවා බත් කිස අවසන බුදුන්ට මෙසේ පැවසුවේය. ස්වාමීනි අපවිසින් මේ ජීවදානය දෙන ලදී. පියාට අනුමෝදනා කරන්න. බුදුහු ඔහු අමතා උපාසකය ඔබ මහළු වූ මුහුකුරාගිය පඩරුලක්සේ වූ ශරීර ඇත්තෙකි. ඔබගේ පරලොව ගමන සඳහා කුශල් රැස් කිරීමක් නැත. තමා පිහිටකොට ගන්න. නුවණැත්තෙක් වන්න. බාලයෙක් නොවන්නැයි පවසා අනුමෝදනා කරන්නේ මේ ගාථාව පැවසුහ.

ගැළ වී වැටෙන්නට ළං වුණු ඉදී වැටී
කොළයක් ලෙසට ඔබ මරණය ළඟම සිටී
හරණට ගිමන් එහි යන විට තැනක වැටී
නිවසක් නොමැත, මග උවරණ ගැනුම වටී.

තමනට තමන්මය කරගෙන නිති පිහිට
දන්නා බණදහම් ණුවණැත්තකු ලෙසට
යළි ඉපදුම, ජරා විය. මරණය කුමට
මග උපකරණ ගෙන යනු මැන බඹ ලොවට

දැන් පණ්ඩුපලාස වැන්න යමපුරිසයෝ ද එළඹ සිටිති. පරලොව යැම සඳහා මාර්ගෝපකරණ ද දැන් ඔබට නැත. තමන්ට තමන් පහනක් කරගන්න මහා උත්සාහයෙන් නැණවතෙක් වන්න කෙලෙස් රහිතව මල රහිතව අර්යභූමියට පත්වන්න.

පණ්ඩුපලාස නම් - උපාසකය ඔබ දැන් බිඳී බිම පතිතවූ වියළි කොලයක් වැන්න. **යමපුරිසා** - යමදූතයෝයි මෙය මරණය සඳහා කියන ලදී. ඔබට මරණය ලගාවී ඇත. **උයේ‍යාගමුඛෙනි** - පරිහානි මුඛෙ පරහානියට ලංවී සිටී. **පාථෙය්‍ය නම්** ගමනක යෙදෙන්නට සහල් ආදිය මාර්ග උපකරණ අවශ්‍ය වනසේ පරලොව යන විට කුශල් මය වූ මාර්ග උපකරණ නැත යන අර්ථයි. **සො කරොහි** - ඔබ මහසයුරේ නැවක් බිඳුන විටදී දිවයිනක් සොයන්නාසේ තමන්ට කුශල ප්‍රතිෂ්ඨා කරගන්න. වහා උත්සාහ කරන්න වහවහා විර්ය කරන්න තමන්ට කුශල් කර ගැනීමේ දක්ෂව නුවණැත්තෙක් වන්න. කුශල් නොකරණ බාලයෙක් නොවන්න. **දිබ්බං අරිය භූමි** යනු මෙසේ විර්යය කරන්නේ රාගාදි කිළිටි නොමැති හෙයින් නැතිවූ කෙලෙස් ඇත්තේ පඤ්චවිධ සුද්ධාවාස භූමියට පැමිණේ යන අරුතයි.

දේශනය අවසානයේ උපාසක තෙමේ සෝවාන් ඵලයට පත්විය. පැමිණියවුන්ට ද දේශනා සාර්ථක විය. ඔවුහු දෙවන දවස් හිද බුදුන්ට ආරාධනාකර දන්දී බත්කිස අවසන බුදුන්ට අනුමෝදනය කරණවිට කිවාහුය. ස්වාමිනි මෙය ද අපගේ පියාගේ ජීව දානයයි. මොහුටම

අනුමෝදනා කරනුමැනව. බුදුහු ඔහුට අනුමෝදනා කරන්නේ ගාථා දෙකක් පැවසුහ.

1. ඔබ දැන් ඉක්ම ගිය කල් වයස් ඇත්තේය. මරණයට සමීප වී සිටී. පරලොව යන අයට අතරමග නැවතීමක් නැත. ඔබට මග වියදම් ද නැත.

2. ඒ ඔබ තමන්ට පිහිටක් කරගන්න. නුවණැත්තෙක් වී මහා වෑයම් කරන්න. කෙලෙස් නැත්තෙක්ව නැවත ඉපදීමට හෝ ජරාවට පත් නොවීමට මෑයම් කරන්න.

එහි **උපනීතවය** නම් උපාති නිපාත පදයකි. ගතවූ වයස් ඇත්තේ ඉක්මගිය වයස ඇත්තේ ඔබ දැන් තුන් වයසට ඉක්මවා ඇත. මරණ දොරටුවට එළඹ ඇත. **සම්පයාතොසි යමස්ස සන්තිකං** මරණ මුඛයට යාමට පැහැදුන කෙනෙක් ලෙසට සිටින්න යන අරුතයි. **වාසොපි ච තෙ නත්ථි අන්තරායාති** යම්සේ මගට යන්නෝ ඒ ඒ කෘත්‍ය කරන්නේ අතරමග පරලොව යන අයට නවතින්න ටික දිනක් මෙහිනැවති දන්දීම ධර්මය ඇසීම ආදිය කිරීමට නො හැකිය. **පාථෙය්‍යං** උපාසකයාට දැඩි ලෙස අදහස් ඇතිකරලීම සඳහා දෙවරක් පවසන ලදී. රජු තමන්ගේ මුව පමණට කබලිඞ්කාර ආහාර ගත්විට එම කුමරු ඔහුගේ මුවට සරිලන සේ ගනී. මෙලෙස බුදුන් උපරිම වශයෙන් ධර්මය දේශනා කරණ විට උපාසක තමන්ගේ උපනිශ්‍රය බලයෙන් යට සෝවාන් ඵලයට පත්ව මෙම අනුශාසනය අවසානයේ අනාගාමී ඵලයට පැමිණියේය. අනෙක් පිරිසට ද දේශනය ප්‍රයෝජනවත් විය.

ගෝඝාතක පුතුගේ කථාපුවතයි.

18-2

"අනුපුබ්බෙන" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී එක්තරා බ්‍රාහ්මණයෙකු නිමිති කරගෙන දේශනාකළහ.

ඔහු එක් දිනක් උදයේම නික්මී භික්ෂූන් සිවුර පෙරවන තැන භික්ෂූන් සිවුරු පොරවන අයුරු බලමින් සිටියේය. එම ස්ථානය තණකොළ වැඩුන තැනක්විය. ඉක්බිති එක් භික්ෂුවකගේ සිවුරු කොන තණ මත වැටී දියබිඳු වලින් තෙමුනි. බ්‍රාහ්මණයා මෙම ස්ථානය තණ කොළ ඉවත් කිරීම වටීයයි දෙවන දින උදැල්ලක් රැගෙන ගියේ එම ස්ථානය සැස තණ ඉවත් කළ කමතක් සේ කළේය. දෙවන දවසේ පැමිණ භික්ෂූන් සිවුර පොරවන විටදී එක් සිවුරු කොනක් බිම වැටී පස් ගැවීම දුටු නිසා මෙහි වැලි විසුරුවීම වටීයයි සිතා වැලි ගෙන අවුත් විසුරවාලීය. ඒ අතර දිනක් පෙරවරුවේ සෑඩ හිරුඑළිය වැටුනි. එදින ද භික්ෂූන් සිවුරු පෙරවන විට භික්ෂූන්ගේ සිරුරේ දහඩිය පෙරෙනු දැක මණ්ඩපයක් කිරීම වටීයයි සිතා මණ්ඩපයක් කළේය. නැවත දිනෙක අළුයම වැස්සක් පතිතවුනි. අහස වැහි වළාකුළු වලින් බරිත විය. එදිනද බමුණා භික්ෂූන් බලා මෙහිද සාලාවක් කිරීම සුදුසුයයි සිතා සාලාවක් කරවා මෙම ශාලාවේ උත්සවයක් කරන්නෙමියි සිතා බුද්ධ ප්‍රමුඛ භික්ෂුසංඝයාට ආරාධනාකර ඇතුල ද පිටත ද භික්ෂූන් වාඩි කරවා දන් දී බත් කිස අවසන අනුමෝදනා සඳහා බුදුන්ගේ පාත්‍රය ලබාගෙන ස්වාමීනි මම භික්ෂූන් වහන්සේලා සිවුරු පෙරවන අවස්ථාවේදී මෙතැන බලමින් සිටියේ මේමේ කරුණු දැක මේ මේ දේ ඉටු කළෙමිය මුලසිට සියළු පුවත්. දක්වීය. බුදුහු ඔහුගේ වචන අසා බ්‍රාහ්මණ පඬිවරයා ටිකෙන් ටික ක්ෂණයක් පාසා කුශල් කරමින් පිළිවෙලින් තමන්ගේ අකුශල් මුල් බැහැර කරන්නේ යයි පවසා මේ ගාථාව දෙසුහ.

රන්කම් කරන රන්කරු දවසකින්	එක
රන් මාලයක් නො තනන මෙන් රුවන්	රැක
පින්කම් කරන විට කරමින් ටිකින්	ටික
නැණවත් ගනිය අකුසල් මුල් නසන	එක

නුවණැත්තා පිළිවෙලින් ටික ටික රන්කරු රිදියේ කිළිටි හරින්නාක් මෙන් තම අකුශල දුරුකරයි.

එහි **අනුපුබ්බෙන** යනු පිළිවෙලින් **මෙධාවිනි** ධර්මයේ නුවණින් යුතු ක්ෂණයක් පාසා කුසල් කරයි. කම්මාරෝ **රජතස්සෙවා** රන් කරුවා එක්වරම රන් රන්කොට තලා කිලිටි වෙන්කර පළඳනාවක් කිරීමට **සමන් නොවේ** නැවත නැවත තවමින් තලමින් මළ බැහැර කරයි. ඉන් අනතුරුව අනේකවිධ පළඳනා කරයි. මේලෙසට නැවත නැවත කුසල් කරන්නේ නුවණැත්තා තමන්ගේ රාගාදිමළ බැහැර කරන්නේය. මෙසේ බැහැරකළ මළ ඇති තැනැත්තා කෙලෙස් නැති බවට පත්වේ යන අර්ථයි. දෙසුම අවසන බ්‍රාහ්මණයා සෝවාන් ඵලයේ පිහිටියේය. මහජනයාට ද මේ ධර්ම දේශනය සාර්ථක විය.

එක්තරා බ්‍රාහ්මණයෙක් පිළිබඳ කථා පුවතයි.

18-3

"අයසාව මලං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර වැඩ සිටියදී තිස්ස නම්වූ තෙරනමක් නිමිති කරගෙන දේශනා කළහ.

සැවැත් නුවර වාසී එක් කුල පුත්‍රයෙක් පැවිදිවී උපසම්පදා වූයේ තිස්ස තෙරුන් ලෙසට ප්‍රසිද්ධවිය. ඔහු පසුකාලයේදී ජනපද විහාරයක වස් සමාදන් වූවේ අටරියනක් වූ මහ සළුවක් ලැබ වස් පවරා එය රැගෙන ගොස් සොහොයුරියගේ අතේ තැබීය. ඇය මේ සලුව සහෝදරයාට නොගැලපේයයි එය තියුණු දැලි පිහියකින් සිඳ තීරු තීරු බවට පත් කොට වනේ කොටා වෙන්කර පෙලා වට කොට සියුම් නුල් බවට පත්කර කැට සළුවක් මැසීය. තෙරුන් ද නුල් හා ඉදිකටු ද සපයා සිවුරු මසන තරුණ භික්ෂූන් කැඳවා සොහොයුරිය වෙතට ගොස් මට ඒ සළුව දෙන්න. සිවුරක් මසමියි පැවසුවේය. ඈ නවරියන් සළුව බැහැර කොට කණිටුසොහොයුරාගේ අතේ තැබුවේය. ඔහු එය ගෙන විසුරුවා බලා මගේ සළුව මහත්ය රියන් අටකි. මෙය සියුම්ය රියන් නවයකි. මෙය මගේ සළුව නොවේ. මෙය ඔබගේය මට මෙයින් වැඩක් නැ. ඒ මගේ වස්ත්‍රයම දෙන්නැයි ඉල්ලීය ස්වාමීනි මෙය ඔබේමය ගන්නැයි පැවසුවාය. එම භික්ෂුව එයට කැමතිනොවීය. අනතුරුව තමන් කළ සියළු දෑ දැනුම් දී ස්වාමීනි මෙය ඔබවහන්සේගේය ගන්නැයි පැවසුවේය. තෙරුන් එය විහාරයට ගොස් සිවුර කිරීමට තැබීය. අනතුරුව සොහොයුරිය සිවුර මසන අයට කැඳබත් ආදිය පිළියෙළ කළාය. සිවුර නිමකරණ දින අතිරේක සත්කාර කළාය. ඔහු සිවුර දෙසබලා එහි හටගත් සෙනෙහෙ ඇත්තේ මෙය හෙට පොරවන්නෙමියි ගෙන සිවුරු දමන උණලියේ දමා සිටියදී එදින රාත්‍රියේ අජීර්ණයක් සැදී කළුරිය කොට එම සිවුරේ හිණි කුනෙකු වී ඉපදුනි.

සොහොයුරිය ද උන්වහන්සේගේ අපවත්වීම අසා භික්ෂූන් ගේ පා ළඟ වැටී හැඬුවාය. භික්ෂූන් වහන්සේලා අපවත් වූ හිමියන්ගේ දේහය අදාහනය කළහ. පසුව උපස්ථායකයෙක් නොසිටි නිසා මේ සිවුර සංඝයාට අයත් වේ මෙය දෙමියි, සිවුර ගෙන ගියහ. ඒ හිණි කුණා මොවුන් මා සන්තකවූ සිවුර

පැහැර ගනිතිය කැඟසමින් ඔබ මොබ දුවත්. බුදුහු ගඳ කිළියේ සිටිමින්ම දිවකනින් මේ ශබ්දය අසා ආනන්ද තිස්ස තෙරුන්ගේ විවරය සත්දිනක් එක් තැන තබන්නට නියමකරණ ලෙස පැවසුහ. තෙරුන් වහන්සේ එසේ කළහ. හිණි කුණා ද සත්වන දිනයේ කළුරිය කොට තුසිත විමානයේ පහළවිය. බුදුහු අටවැනි දා තිස්ස තෙරුන්ගේ සිවුර බෙදා ගැන්නැයි අණකළහ. භික්ෂූන් වහන්ස්ලා එසේ කළහ. භික්ෂූන් වහන්සේලා කථාවක් ඉපිදවුහ.

තිස්ස තෙරුන්ගේ සිවුර දින හතක් තබා අටවැනි දිනයේ ගන්නට බුදුරජාණන් වහන්සේ නියම කළේ කුමක් හෙයින්ද? මෙහිදී තථාගතයන් වහන්සේ පැමිණ මා ඒමට පළමුව කිනම් කථාවකින් යුතුව සිටියෝදැයි විමසුහ. කථාව අසා මහණෙනි මම දිනහතක් එම සිවුර තබන්නට නියමකලේ තිස්ස තෙරුන් අපවත්වි හිණිකුනෙක් වී සිවුරේ ඉපදී ඔබ සිවුර බෙදන විට කෝපයෙන් කැඟසමින් දුවනවා ඇසූ නිසාය. හිණිකුණාගේ සිත කෝපවී මනස දුෂ්ය ව නිරයේ උපදින හෙයින් සිවුර දිනහතක් තබන්නට නියම කළෙමි. දැන් ඔහු තුසිත දෙව්ලොව පහළ වුනි. එනිසා අටවැනි දිනයේ දී ඔබට සිවුර ගැනිමට අවසර දුන්නෙමි. යි පැවසුහ. එවිට භික්ෂූන් වහන්සේලා ස්වාමීනි තණ්හාව නම් බැරුරුම්ය. යම්සේ යකඩයක මළ බැඳී එයම කාදමයි ද එලෙසම මේ තෘෂ්ණාව මේ සත්වයාගේ ඇතුලත හටගෙන ඒ ඒ සතුන් නිරය ආදියෙහි පහළකරවයි. විනාශයට පත් කරවයි යනුවෙන් පවසා මේ ගාථාව දේශනාකළහ.

යකඩින් මැවූ මළ - යකඩම නසයි හැම කල
පව් කම් තමන් කළ - සසර දි දෙයි තමන්ටම පල

එහි **අයසානි** යනු යකඩින් - ඇතිවූ - මළ එයින්ම ඇතිවී **අතිධොනවාරිනි** - සතර ප්‍රත්‍යයෙන් මෙයින් ප්‍රත්‍යවේක්ෂාකර පරිභෝග ප්‍රඥාව ඉක්මවා හැසිරෙන්නේ **අතිධොනවාරි** වාරී නම්වේ. යකඩින් ඇති වන මළ එයම කන්නා සේ සිව්පසයේ **ප්‍රත්‍යවේක්ෂ** නොකර පරිභෝග කරන්නේ තමන් කළ කර්මයෙන් තමන්ට දුගතියට ගෙනයයි යන අර්ථයි. දේශනාවසානයේ බොහෝ දෙන සෝවාන් ඵලය ආදී මාර්ගඵලයන්ට පත්වූහ.

තිස්ස තෙරුන් පිළිබඳ කථා පුවතයි.

18-4

" අසජ්ඣාය මලා" යන මෙම ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී ලාලුදායි තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

සැවැත් නුවර කෝටි පහක් පමණ ආර්යශ්‍රාවකයෝ පෙරවරුයෙහි දන් දී පස්වරුවේ ගිතෙල් පැණි වස්ත්‍ර ආදිය ගෙන විහාරයට ගොස් බණ අසති. බණ අසා එන අතර සැරියුත් මුගලන් හිමිවරුන්ගේ ගුණ කථා කරති. ලාලුදායි තෙරුන් මේ කථා අසා සිට ඔබලා මේ තෙරවරුන්ගේ ධර්මකථා අසා ගුණ කියති. මගේ ධර්ම කථා අසා ගුණකථාවක් නොකියන්නේ මන්දැයි විමසුහ.

මිනිස්සු ඒ කථාව අසා මුන්වහන්සේ ද ධර්ම දේශකයානන් කෙනෙක් වන්නට ඇත. මුන්වහන්සේගේ ධර්ම කථාව ද ඇසීම වටී. යයි කියා ඔවුහු එක් දිනක් ස්වාමීනි අද අප ධර්මය අසන දිනයක් එනිසා සංඝයාට දන් දී අවසන අද දිවාකාලයේ ධර්මදේශනය කරන්නැයි කීවාහුය. උන්වහන්සේ ද ඔවුන්ගේ ආරාධනය පිළිගත්හ. ඒ පිරිස ධර්මය අසන වේලාවේදී පැමිණ ස්වාමීනි අපට ධර්මය දේශනාකරන්නැයි පැවසුවිට ලාලුදායි තෙරුන් පැමිණ අසුනේ වාඩිවී විසිතුරු විජනිපත ගෙන සොලවමින් එකම ධර්ම පදයක් හෝ නොදැක (සිහිනොවී) මම පසුව පාළි පිරුවා කියමි. දැන් වෙනත් අයෙක් ධර්මපද කියත්වායි කියා අසුනෙන් බැස්සේය. අන් භික්ෂුවක් ලවා ධර්මය දේශනා කරවා මිහිරි ස්වරයෙන් කීමට නැවත ද ආසනයට නැංවුහ. දෙවනුවද කිසිවක් නොදැක (සිහි නොවී) මම රාත්‍රියේ ධර්මදේශනා කරමි. අන් කෙනෙක් පාලි පිරිවුව මැනැවි - යි කියා ආසනයෙන් බැස්සේය. උපාසකවරු අන් තෙරනමක් ලවා පදභානය කරවා නැවත රාත්‍රියේ තෙරුන් අසුනට නැංවුහ. ඔහු රාත්‍රියේද කිසිවක් කියනු නොහී මම අළුයම කියන්නෙමියි රාත්‍රිදේශනය අන්තෙරනමකට පැවරුවේය. නැවත උදැසන දේශනයට ගෙන්වූහ. නැවත ද අළුයම කිසිවක් සිහිනොවීය. මහජනයා ගල් පොලු මුගුරුගෙන අභබාලය නුඹ සැරියුත් මුගලන් හිමිවරුන්ගේ ගුණ කථනය කරණවිට මේ මේ දේවල් කියයි දැන් කුමක් නිසා නොකියන්නේද තර්ජනය කර පළා යනවිට ලුහුබැන්දාහුය. ඔහු පලායන විට එක් පාලු

වැසිකිලි වලකට වැටුනි. මහජනයා කථාවක් ඉපදවූහ. අද ලාලුදායි සැරියුත් මුගලන් තෙරවරුන්ගේ ගුණකථා කරණවිට ඊර්ෂ්‍යාවෙන් තමන්ගේ ධර්ම කථිකභාවය ප්‍රකාශකොට මහජනයා ගෙන් සත්කාර ගෙන ධර්මය අසමුයි කිව්ට සිව්වතාවක් අසුනේ වාඩිවීසිටන් කිවයුතු කිසි දෙයක් නොමැතිව තොප අපේ සැරියුත් මුගලන් කෙරෙහි එකටඑක ගත්තේදැයි දඬු මුගුරුගල් ආදිය ගෙන තර්ජනය කරණවිට පළා ගොස් වැසිකිලි වලක වැටුනේයයි කථාකරණ විට බුදුන් පැමිණ මහණෙනි! කුමක් කථාකරමින් සිටියේදැයි විමසා භික්ෂූන් දැන්වුවාට පසුව දැන් පමණක් නොව පෙරද මොහු අසුචි වලක ගිලුනේයයි පවසා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

"චතුප්පදෝ අහං සම්ම ත්වංපි සම්ම චතුප්පදෝ" යහළුවේ - ඔබ ද සිවුපාවෙකි. මම ද සිවුපාවෙකි සිංහය මෙනි එන්න ඇයි බියෙන් පලායන්නෙ, සුකරය තෝ බඩ අසුචි තැවුරුන ලොම් ඇති දුගඳ හමන්නෙකි ඉදින් යුද්ධ කරණු කැමතිනම් මම ඔබටම ජය දෙන්නෙමි. මෙම ජාතක කථාව විස්තර කොට පැහැදිලි කළහ. එදා සිංහයා සැරියුත් තෙරුන්ය. ඌරා ලාලුදායි තෙරය. බුදුහු මෙම දේශනය ගෙනහැර දක්වා මහණෙනි ලාලුදායි තෙර අප්‍රමාදීව ධර්මය ඉගෙන ගත්තේය. සජ්ඣායනය නොකෙළේය. කිසිවක් පර්යාප්තිය විසින් ගෙන සජ්ඣායනය නොකළ හෙයින් මළ බැඳුනියි. පවසා මේ ගාථාව දෙසුහ.

දහමට මළය පරිවහණය	නොකිරීම
නිවසට මළය වෙර විරිය	පිරිහීම
රූ සපුවට මළය නිති කම්මැලි	වීම
නිවනට මළ පමාදය වෙයි	හැමදාම

මන්තු නොහැදෑරීම නිසා මළ බඳී, ගෙවල් ගෙහිමියන් විර්ය කොට ශුද්ධ නොකිරීමනිසා මළබඳී, ශරීර වර්ණයට කුසීතබව කිලුටකි. යම්දෙයක් රකින්නාට ප්‍රමාදය කිලුටකි. එහි යම් ශිල්පයක්හෝ පර්යාප්ති ධර්මයක් යම්හෙයකින් භාවිතාවේ නොයොදන්නේ නම් එය වැනසියයි නිතර පෝෂණය නොවේ. මේනිසා නොහැදෑරීම මළයක් වේ.

අසජ්ඣාය මලාමන්තා යන්න එහෙයින් කියනලදී. යම් හෙයකින් ගිහි ගේ වාසය කරන්නා නැවත නැවත දිරාගියතැන් ප්‍රතිසංස්කරණ ආදිය නොකරණ විට විනාශ වීයයි. එහෙයින් **අනුට්ඨාන මලා ඝරා** ආදිය කියන ලදී. මේ නිසා උටඨාන නොවිම යනුවෙන් කියන ලදී. යම් ගිහියෙකු හෝ පැවිද්දෙකු හෝ කුසිත බව නිසා ශරීර පිරිසිදු කිරීම පරිභෝගකර සජ්ඣායනය නොකරණ විට කය දුර්වර්ණවේ. එනිසා කිළිටුබව **සරීර වර්ණයට කුසිත** කම යයි කියන ලදී. **මලං ථණ්ඩුස්ස කොසජ්ජං** යන්න කීය. යම් හෙයකින් ගවයන් රකින්නාට ප්‍රමාදය නිසා හෝ නිදා ගන්නට හෝ **ක්‍රීඩා** කරන්නට හෝ තොටුපලින් වෙනස්ව පනින්නට හෝ **ව්‍යාලමෘග** සොර උවදුරු වලින් හෝ අනුන්ගේ ඇල්කෙත් ආදියට බැස කෑම හෝ විනාශ කිරීමට ලක්වේ. තමන් ද දඩුවමට හෝ පරිභාසයට ලක්වේ. පැවිද්දෝ සදොර ආරක්ෂා කරමින් ප්‍රමාදයෙන් කෙලෙස් වලින් බැහැරවී සසුනෙන් බැහැරවේ. **පමාදෝ රක්ඛතෝ මලං** මේ නිසා ප්‍රමාදය අරක්ෂාකරන්නාට කිලුටකි. පටසන ලදී. මේනිසා ප්‍රමාදය විනාශය ඇතිකරණ නිසා කිලුට නිසා මල යන අර්ථය දෙයි.

දෙසුම අවසන බොහෝදෙන සෝතාපන්න ආදී මාර්ගඵලයන්ට පැමිණියාහුය.

ලාලුදායී තෙරුන් පිළිබඳ කථා පුවත නිමි.

18-5

"**මලිත්‍ථියා දුච්චරිතං**" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩසිටියදී එක්තරා කුලපුත්‍රයෙක් නිමිති කරගෙන දේශනා කළහ.

එක් කලෙක මොහුට සමාන කුලගෝත්‍ර ඇති කුළ කුමරියක් ගෙනාවේය. ඇය ගෙන ආ දිනයේ සිට අනාචාරයේ හැසිරෙන කෙනෙක් වුවාය. මේ කුල පුත්‍රයා ඇගේ නොමනා හැසිරීමෙන් ලජ්ජාවට පත්ව කිසිවෙකු හමුවීමට නොහැකිව බුද්ධොපස්ථානාදිය නවතා දින කීපයකින් බුදුන් වෙත එළඹ වැඳ එකත් පසෙක සිටියේය. ඇයි උපාසක පසුගිය දවස්වල නොදැක්කේ යයි පැවසුවිට වැඳ මෙම කරුණ පැහැදිළි කළේය. අනතුරුව බුදුරජාණන් වහන්සේ උපාසක මම පෙරද ස්ත්‍රීහු නම් ගංගා හා සමානය නුවණැත්තන් විසින් ඒ ගැන කෝප නොකළ යුතුය යයි කියන ලද්දේය. නුඹ භවයෙන් වැසිගිය නිසා මේ පිළිබඳව නොසිතිය යයි පවසා ඔහු විසින් විමසන ලදුව මෙසේ වදාළහ.ගංගාව, මහමග අවන්හල, බොහෝදෙනා රැස්වන තැන හැම දෙනාටම පොදුය. එමෙන්ම ස්ත්‍රිය ද අවකාශ ලද පරිදි බොහෝ දෙනාට පොදුවේ. මේ චූළකුණාල ජාතකය විස්තරව වදාරා ස්ත්‍රියගේ නොමනා හැසිරීම ඇගේ චරිතයට කිලුටක් බවද, දන් දෙන්නාට මසුරුකම කිලුටක් බවද අවිද්‍යාව සියල්ලන්ට වඩා ප්‍රබලම කිලුට බවද, එය මෙලොව පරලොව යහපත නැතිකරන බවද වදාරා මේ ගාථාව වදාළහ.

දුසිරිත කිලුට ඉතිරියකට රැවින් බර
දන් දෙන්නට කිලුට ලෝබය නිරන්තර
අනුවණ කම කිලුට හැමටම උසස්තර
සියලුම කිලුටු දුරුකොට යනු නිවන්පුර.

"**මලිත්‍ථියා දුච්චරිතං මච්ඡෙරං දදකෝ මලං**" ස්ත්‍රියව දුශ්චරිතයද දන්දෙන්නාට මසුරු සිත ද කිළුටකි. ලාමක ගතියෙන් යුතු අකුශල ධර්ම මෙලොවටද පරලොවටද කිළිටකි. එනිසා වැඩිම මළය (කිළුටනම්)

අවිද්‍යාවයි. මේ අවිද්‍යා මළය පහකොට මහණෙනි නිර්මල පිරිසිදු බවට පත්වෙමු.

එහි **දුච්චරිත** නම් දුරාචාරයයි ස්වාමිපුරුෂයා ඉක්මවා හැසිරීමයි. ස්ත්‍රියක් ස්වාමියා ද ගෙයින් බැහැරකරයි දෙමාපියන්වෙත ගියද ඔබ කුලයට දැලි අඟුරු මෙන් වියයි ඔබ දසන් දැකීමට ද නොකැමති එළවා දමයි. බැහැර කරයි. ඇය අනාරාධ්‍ය මහදුකට පැමිනේ. මේ නිසාම දුච්චරිතය කිලුටක් ලෙස කියනු ලැබේ. **දදතො** - දායකයා යමෙක් කුඹුරු සීසාන කල මේ කුඹුර පැසුනවිට සලාක බත් ආදිය දෙන්නෙමියි සිතා ශ්‍රෘද්ධ සම්පත් ඇතිවුවිට මසුරුබව ඇතිකරගෙන ත්‍යාගසිත දුරුකරයිද? ඔහු මසුරු ලෙස ත්‍යාග සිත දුරුකිරීම නිසා මිනිස් සම්පත්තිය දිව්‍ය සම්පත්තිය නිවන් සම්පත්තිය යන ත්‍රිවිධ සම්පත් නොලබයි. මෙසේ කියන ලදී. **මච්ඡරං දදතො මලං** යන්න එහෙයින් කියන ලදි අනෙක් මෙබඳු කරුණු වලදී මේ න්‍යායම වේ. **පාපකාධම්මා** - යනු අකුශල ධර්මයි. මෙලොවද පරලොවද කිළිටි බවට වේ. මේ කියන කිලිටි බවින් **තනො** යනු පෙරදී කියන කිලිටිවෙ මල තරං යනු වඩාත් කිළිටිබවයි. **අවිජ්ජා** යනු අෂ්ඨවිධ වස්තූන් අතර එකකි. **මලතරං** - වඩාත් වැඩි කිළිටි බවයි. **පහත්‍ථා** නැති - මේ මළ දුරුකර මහණෙනි තෙපි නිර්මල නොකිලිටි බවට පත්වේ. දේශනය අවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පත්වූහ.

එක්තරා කුල පුතෙකුගේ කථා පුවතයි.

18.6

"**සුජීවනනි**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී සැරියුත් හිමිගේ සද්ධිවිහාරිකයකු වූ ථුල්ල සාරික නම් භික්ෂුවක් නිමිත්තිකරගෙන දේශනා කළහ.

මේ භික්ෂුව දිනක් රෝගියකුට වෙදකම් කොට ප්‍රණීත ආහාර ලබා ඒ ආහාර සැරියුත් තෙරුන්ට පුදා නිතර මෙබඳු ආහාර ගෙන එන්නෙමියි පැවසිය. සැරියුත් තෙරුන් ඔහුගේ වචනය අසා නිහඬවුයේ ඉවත්ව ගියහ. ථුල්ලසාරික භික්ෂුව විහාරයට ගොස් තමන් රෝගියකුට වෙදකම් කළබවත් එතැනින් ප්‍රණීත ආහාර ලද බවත් එය සැරියුත් හිමියන්ට පිදූ බවත් උන්වහන්සේ එය පිළිනොගෙන කිසිත් නොකියා ඉවතට ගිය බවත් බුදුහිමියන්ට පැහැදිළි කළහ. බුදුරජාණන් වහන්සේ මහණෙනි ලජ්ජා නැති තැනැත්තා ගසා කා ඇවිදින කපුටෙක් මෙන්ය. විසි එක් ආකාර අනේසන වස්තු සෙවීමෙන් සිට සුවසේ ජීවත් වේ. හිරි ඔතප් සහිත තැනැත්තා දුකසේ ජීවත් වෙයයි පවසා මේ ගාථාව දේශනා කළහ.

නුහුණම අනුන්ගේ කියමින් හුඹස්	කනා
කපුටෙකු මෙන් ගසා කන ගෙමිදුලක්	පතා
ආජීවයෙන් කිලුටුව මිල මුදල්	පතා
නිවසන අයට පහසුය "මහණකම"	ඉතා

ලජ්ජා බය ඇතිව පව්කමකින්	තොරව
පිරිසිදු ආජීවයෙන් දහමට	බරව
නිවසන මහණහට, සුපසන්	සංවරව
දුකකිය මහණකම රැකගැනුමද	තිරව

ලජ්ජා බිය නැති ගසාකැමේ දක්ෂ කපුටෙකු වැනිවූ අනුන්ගේ ගුණමකාලන සුලු ගෙන් ගෙට දුවයන සුළුවූ බුහුටිවූ කිළිටි දිවි පැවතුම් ඇත්තා විසින් ජීවත්වීම සුවසේකළ හැකිය. ලජ්ජා භය ඇති නිතර පවිතුවූ කාය කර්මාදිය සේවනය කරණ සුළු දිවි පැවත්මේ නො ඇළුනාවූ බුහුටි නොවූ පිරිසිදු

ජීවිතා වෘත්ති ඇති එම දිවිය සාර ලෙස දකින තැනැත්තා විසින් ජීවත් විම පහසු නොවේ.

එහි **අහිරිකෙන** යනු සිඳුන ලජ්ජා බිය ඇති, මෙබඳු මව් නොවන අයට මව වශයෙන්ද පියා නොවන අයට පියා මෙන්ද අමතා නළවා මේ ආදී නීතියෙන් ඒක්විධි අනේසනයන් හි පිහිටි ආහාර සෙවීමේ යෙදී සුවසේ ජීවත් විමට හැකිය. **කාක සූරෙන** යනු දක්ෂ කපුටෙක් යම්සේ ගෙවල් වල බත් මාලු ආදිය ගණු කැමත්තේ බිත්ති ආදියේ වාඩිවී තමා දෙස බලනසේ අනෙක් අරමුණකින් සිටින සේ නිදාගෙන සිටින සේ දක්වා ගෙයි මිනිසුන්ගේ ප්‍රමාදයක් සලකා පැන සෝ - සෝ යයි කෑගසන විටද භාජනයෙන් කෑම සුරාගෙන පලායයි.

මෙලෙසට ලජ්ජා නැති මහණ ද භික්ෂූන් සමග ගමට පිවිස කැඳ බත් ආදිය සොයයි. එහිදී භික්ෂූහු පිඬුපිණිස හැසිර යැපීම් පමණක් ගෙන ගොස් ප්‍රත්‍ය වේක්ෂා කරමින් කැඳ බී. කර්මස්ථාන මෙනෙහි කරත්. ධර්මය සජ්ඣායනා කරත් ආසන ශාලා අමදින් මේ ලජ්ජා නැති තැනැත්තා කිසිවක් නොකර ගමට අභිමුඛවම සිටියි. එම භික්ෂුව මෙය බලන්නැයි බලන්නේ නමුදු නොබලන්නාසේ නිදා ගත්සේ සිට ගණ්ඨිය ලෙහන ලෙස සිවුර හදන ලෙස දක්වා මට අසවල් කාර්යය ඇතැයි කියමින් අසුනෙන් නැගිට ගමට පිවිස උදේම වෙන්කරණ ලද නිවෙස්වලින් වෙනත් නිවෙස් වලට එළඹී ගෙවල්වල මිනිස්සු තරමක් දොර පලුව වසා දොරලඟ වාඩිවී අඬමින් සිටින විටද, එක් අතකින් කවුළුවට පාත්වී ඇතුලතට පිවිසේ. අනතුරුව ඔහු දැක අක මැත්තෙන්ම අසුනක වාඩි කරවා කැඳබත් ආදී යමක් තිබේද? එය දෙති. ඔහු දුන්නක් වළඳා අවශේෂය පාත්‍රයේ තබාගෙන එයි මොහු කාකසුර නම් මෙබඳු තැනැත්තා විසින් ලජ්ජා නොමැතිවම සුවසේ ජීවත් වේ යන අර්ථයි.

ධංසිනාති යනු අසුවල් තෙරුන් අල්පේච්ඡයි ආදිය කියනවිට ඇයි අපි අල්පේච්ඡ නොවේද? ආදි වශයෙන් අන්අයගේ ගුණ මකාලීමට පෙළඹේ. මෙබඳු වචන අසා මොහුද අල්පේච්ඡ තාදී ගුණවලින් යුතු යයි සිතමින් මිනිසුන් විසින් දියයුතුයයි සිතති. ඔහු එතැන් සිට නැණවත් පුද්ගලයින් ගේ සිත සතුටු නොකිරීමට නොහැකිවන්නේ ලාභ යෙන් ද පරිහානියට පත්වේ.

මෙසේ අලජ්ජී පුද්ගලයා තමන්ගේ ද අනුන් ගේ ද ලාභය විනාශකරයි. **පඤ්ඤිනා** යනු පැනගිය පුද්ගලයායි. **පඤ්ඤවාරී** පුද්ගලයා අනුන්ගේ කටයුතු තමන්ගේ කටයුතු ලෙස පෙන්වමින් අළුයම භික්ෂූන් නැගිට **චෛත්‍ය මිදුල්** ආදිය හැමද කර්මස්ථාන මෙනෙහි කරමින් මනසිකාරයෙන් ස්වල්පවේලාවක් ගතකොට ගමට පිවිසෙන විට, තෙමේ මුහුණ සෝදා රන්වන් කොට රතු ගොප්කළ පොරවා ඇසේ අඳුන් හිසෙහි තෙල් ගා ආදී ආත්ම භාවය මණ්ඩනය කොට ගෙන වත්පුරන ආකාරයක් දක්වීම සඳහා ඉදල් පහර දෙකතුනක් ගසා පියා ගම්දොරට පිවිසෙන තැනට පිවිසියේ වෙයි.

මිනිස්සු උදේම චෛත්‍යය වඳිමුයි මල් පූජා කරමුයි පැමිණියද මේ ක්‍රියාව දක මේ විහාරයේ පිරිසිදු කිරීම මේ තරුණ භික්ෂුව නිසාම සිදු වේයයි මොහු වෙන් නොවේවායි පවසා ඔහුටම දියයුතුයයි සිතති. මෙබඳු පනින අයටද ජීවත්වීම පහසුය. **පගබහ** නම් කායික බුහුටි **සුර** මිනිසුන් රැවටීම සඳහා ස්ථානෝචිතව සංකිලිට්ඨෙන ජීවිතට මෙලෙස දිවි ගෙවා ජීවත්වන පුද්ගලයා **කිළිටි** වී ගත කරන එම ජීවිතය දුප්ජීවිතයක් වේ. පච්කාර ජීවිත යක් මේ යන අර්ථයි. හිරිමතාව යනු හිරි ඔතප් යුත් පුද්ගලයා විසින් දුකසේ ජීවත්විය යුතුය. ඔහු අම්මා නොවන අයට අම්මා සමානයයි අදිය නොකියා අසාර්මික ප්‍රත්‍යයන් අසුචි සේ සිතා පිළිකුල් කරන්නේ දැහැමින් සෙමෙන් සොයන්නේ ගෙපිළිවෙලින් පිඬුසිඟා ගොස් ජීවිතය ගතකරන්නේ රූක්ෂ ජීවිතයක් ගත කරයි යන අර්ථයි. **සුචිගවෙසි** නම් පිරිසිදු කායකර්මාදි සොයන්නේ. **අලීනෙනා** - යනු ජීවිත වෘත්තියෙහි නො ඇලී සුඩාජීවෙන පසසනා එබඳු පුද්ගලයා සුද්ධා ජීව නම් වේ. මෙබඳු පිරිසිදු දිවිගෙවීම සාරවශයෙන් බලන්නේ රළු දිවියක් ලෙස දුජ්ජීව නම් වේ. දේශනය අවසානයේ බොහෝදෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

සැරියුත් හිමියන්ගේ සද්ධිවිහාරික භික්ෂුව පිළිබඳ කථා පුවතයි.

18-7

"යො පාණ මතිපාතෙති" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී පන්සියයක් උපාසකවරු නිමිති කරගෙන දේශනාකළහ.

ඔවුන් අතුරින් එක් අයෙක් ප්‍රාණ ඝාතයෙන් වැලකීමේ ශික්ෂාපදය පමණක් ආරක්ෂා කළ කෙනෙකි. (අනෙක් අය අනෙක් ශික්ෂාපද රකින) ඔහු අනෙක් අය රකින ශික්ෂා පදවලට වඩා තමන් රකින ශික්ෂාපදය වැඩියැයි උසස්යැයි සිතුවේය. එක් දිනක් මම ඉතා දුෂ්කරවූ දෙයක් කරමියි. දුෂ්කර දෙයක් ආරක්ෂා කරමියි විවාදකර බුදුන් වෙත ගොස් වැඳ මේ කරුණ පැවසුහ. බුදුහු ඔවුන්ගේ කථාව අසා එක් ශීලයක් කණිෂ්ඨය, එකක් ජ්‍යෙෂ්ඨය නොකියා පන්සිල්ම රැකිය යුතුය එය දුෂ්කරයයි කියා මේ ගාථාව වදාළහ.

සතුන් පණ නැසුම ද අනුන් දේ සොරසිතින් ගැනුමද
පර අඹුවන් සෙවුම - අනුන් නැසුමට බොරු දෙසීමද?
මත් පැන් පානය ද - පස් පව් එක සමානයි.
මේ පව් කරන්නා - මෙලොව දනයෙන් පිරිහී
පරලොව ගියත් ඔහු - පැසෙයි කප් සිය ගණන් නිරයේ

"සොපාණමතිපාතෙ" යනු මුසාවාදඤ්ච භාසති යමෙක් ප්‍රාණඝාතය කරයි ද - බොරුබස් කියයි ද නොදුන්දේ ගනි ද පරඹුවන් සේවනය කරයි ද රහමෙර පානය කිරීමේ යෙදේද මෙලොව දී මෙන්ම පරලොවදී ද තම මුල් සිඳගනී. පුරුෂය මෙය දැනගන්න. අසඤ්ඤතවූ පාප ධර්මය දනිද මේ ලෝභය හා අධර්මය බොහෝ කලක් දුක් රඳවන්නේය.

එහි **පාණ අතිපාතෙ** - යනු යම් කෙනෙක් සියතින් මැරීම ආදි ප්‍රයෝග හයෙන් අන් අයගේ ජීවිතින්ද්‍රිය සිඳියි ද **මුසාවාදං** යනු අන් අයගේ ආත්මය සිඳින බොරුබස් කියයි ද **ලොකෙඅදින්නං ආදියති** මේ සත්ත්ව ලෝකයේ උමං කැණීමාදියෙනී, හොරමිනුම් වලින් කිරීම් - බොරු කහවණු මාරු කිරීම්

ආදී එක් අවහාරයෙන් අන්‍යය සතුදේ ගනීද? **පරදාරං ච ගච්ඡති** අන් අයවිසින් රක්ෂිත පෝෂිත කාන්තාවන් කෙරෙහි වැරදි ලෙස හැසිරේද? **සුරාමෙරයපානං** යමෙකු සුරාවෙන්ම මල් ආදියෙන් පෙරන සුරාව පානය කිරීමේ යෙදේ ද සේවනය කෙරේ ද බහුලව කරයි ද එම පුද්ගලයා මෙලොවදීම යම් කෙත් වතුපිටි දියුණුව සඳහා වෙන්කළ මුදලක් වෙයිද එම මුදල් ද නොතබා සුරා පානය කරයි ද ඔහු මුල් සිඳ අනාථවු - කෘපණ වූ සිඟන බවට පත්ව හැසිරේ **එවමහා** මෙලෙස පස්පවුකරණ පුද්ගලයාට අමතයි. **පාපධම්මානි** - ළාමක ධර්ම අසඤ්ඤතා කායික සංවරය නැති **අචෙතසා** චෙතනාහා නැතිවද නොසිතන්නෝ නම් වෙති. **ලොභෝ අධම්මෝ** ලොභ දොස යන දෙකම අකුශල මුල්ය **චිරං දුක්ඛා රන්ධයං** බොහෝ කාලයක් අපාය ආදී දුක් ගෙන දීමට රැඳේ හේතුවේ යන අර්ථයි. දේශනය අවසන පන්සියයක් උපාසකවරු සෝවාන් ඵලයේ පිහිටියහ. පැමිණි අයට දේශනාව සාර්ථක විය.

පන්සියයක් උපාසකයන්ගේ කථා පුවතයි.

18-8

"දදාති වෙ" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර දෙවිරම් වෙහෙරේ වැඩ සිටියදී තිස්ස නම් ළදරු භික්ෂුවක් නිමිති කරගෙන දේශනා කළහ.

මේ තිස්ස භික්ෂුව අනේපිඬු සිටුවරයා හා විශාඛාවන් පන්සියයක් ආර්ය ශ්‍රාවකාදීන් වෙත දෙන දානයන් ප්‍රතික්ෂේප කරමින් හැසිරෙයි. අසදෘශ මහා දානය ද අවමානයට ලක්කරයි. ඒ ඒ දාන ශාලාවල සීතල ලැබ සීතල යයි නින්දා කරයි. උණුසුම ලැබුනවිට උෂ්ණ යයි නින්දා කරයි. ස්වල්පයක් ලැබුන විට ස්වල්පය කුමක්දැයි නින්දාකරයි. බොහෝ දේ ලත්විට මොවුන්ගේ ගෙවල තබන තැන් නැතැයි සිතයි. භික්ෂූන්ට දියයුතු පමණට දියයුතුයි නේද? භික්ෂූන්ගේ යැපීම් ප්‍රමාණයට වඩා කැද'බත් නිරර්ථක ලෙසට අපතේ දමයි. කියා නින්දා කරයි. තමන් ගේ ඥාතීන් නිමිති කරගෙන අහෝ අපේ ඥාතීන්ගේ නිවෙස්වලට සිව්දිගින් එන යන භික්ෂූන්ට වෙළඳ සැලක් වන්න. උත්සව මණ්ඩපයක් වැන්න. යනුවෙන් ප්‍රශංසාත්මක කථා කරයි. එහෙන් ඔහු දොරටු පාළකයෙකුගේ පුතෙකි. ජනපදයේ හැසිරෙන්නේ වඩුවෙක් සමග හැසිරෙමින් සැවැත් නුවරට පැමිණ පැවිදිවිය. අනතුරුව භික්ෂූන් වහන්සේලා මිනිසුන්ගේ මේ දන්දීම පිළිබඳව නින්දා කරනු අසා එය විමසා බලමුයි සිතා ඇවැත්නි ඔබගේ ඥාතීන් කොහේ සිටිත්දැයි විමසා අසවල් ගමේ යයි පැවසුවිට තරුණ භික්ෂූන් කිපදෙනෙක් යැවූහ. ඔවුන් ඒ ගමට ගොස් ගම්වැසියන් විසින් ආසන ශාලාවක වාඩිකරවා සත්කාර කරණ ලද්දේ මෙසේ විමසූහ. මේ ගමින් පිටත්ව පැවිදිවූ තිස්ස නම් තරුණ භික්ෂුවක් සිටී. ඔහුගේ ඥාතීන් කවුරුන්ද යනුවෙනි. මේ ගමේ කුලගෙවල් වලින් නික්මී පැවිදි වූවෙක් නැත. කවරෙක් ගැන මේ අය කියත්දයි සිතා ස්වාමීනි එක් දොරටුපාල ප්‍රතුයෙක් වඩුවෙක් සමග හැසිරී පැවිදි වූයේ යයි අපි ඇසුවෙමු. ඔහු පිළිබඳව විමසන්නේ යයි සිතමි. තරුණ භික්ෂූන් තිස්ස භික්ෂුවට ධනවත් ඥාතීන් නැතැයි දැන සැවතට ගොස් ස්වාමීනි තිස්ස නිකරුනේ දොඩවතියි ඒ පුවත භික්ෂූන්ට දැනුම් දුන්හ. භික්ෂූන්ද තථාගතයන් වහන්සේට දැනුම් දුන්හ. තථාගතයන් වහන්සේ මහණෙනි මේ තැනැත්තා දැන් පමණක් නොව පෙර භවයේදීද පුරසාරම් දෙඩුවේයයි පවසා පිළිබඳව ඉල්ලා සිටිවිට අතීතය ගෙන හැර දක්වූහ.

"**බහුම්පි සො විකත්තේයා අඤ්ඤං ජනපදං ගතො**" ඒ පුද්ගලයා වෙනත් ජනපදයකට ගියවිට බෙහෙවින් පුරසාරම් දොඩයි. ආපසු පැමිණ (තමාගේ ස්වාමියා) දුෂ්කරයි කටාහකය ආනාචාර ගති හැර පියා සම්පත් අනුභව කරව !

මෙම කටාහ ජාතකය විස්තර කරදී මහණෙනි ! යම් පුද්ගලයෙක් අන් අය විසින් ස්වල්පවූ හෝ බොහෝ කොට හෝ රළුවූ හෝ ප්‍රණීතවූ දෙනලද දෙය අන්අයට හෝ දී තමන්ට නොදීම ගැන වංකවේද මකුවේද ඔහුට ධ්‍යානයක් හෝ විදර්ශනා හෝ මාර්ගඵල ආදී හෝ නුපදීය පවසා ධර්මදේශනා කරන්නේ මේ ගාථාව පැවසුහ.

සැඳහැ පවතින අයුරින් - තමන් වත්කම් පමණට
සැඳහැත්තො දන්දෙති - ගුණ දොස් කුමට ඒ ගැන
සිව්පසයෙ ගුණදොස් - නිතර සොයනා මහණුන්
මග පලකිසිත් නො ලබා - සරති හිස් මිනිසුන් සේ.

එහි **දදාති වෙ යථා සද්ධං** යනු ශ්‍රද්ධාව ඇති මහාජනයා තම වත්කම් පමණින් දන් දේ - යථා පසාදනං යනු ථේර නවකාදී වශයෙන් යම් යම් අය කෙරෙහි පැහැදීම් අනුවම දන්දෙයි

නත්ථ - යනු අන්අයට දීමේදී ම විසින් අල්පවූ හෝ රටවූ හෝ දෙයක් ලැබුනේයයි කලකිරීමට පත්වේද? **සමාධිනති** - යනු ඒ පුද්ගලයා දවල් හෝ රාත්‍රි හෝ උපචාර අර්පනා වශයෙන් හෝ මාර්ගඵල වශයෙන් හෝ සමාධියට නොපත්වේද **යස්සචෙතං** යම් පුද්ගලයෙකුට මේ ස්ථානයන්හි දී කලකිරුණ ස්වභාවයක් ඇති වේද එම අකුශලය සිඳ දමා මුලින්ම උදුරා දැමුවහොත් අර්හත් මාර්ග ඥාණයෙන් සම්පූර්ණයෙන් ඔහු සමාධියට පත්වේ යන අර්ථයි. දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ඵලය ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

අටවැනිවු නිස්ස දහර හිඤුට පිළිබඳ කථා පුවතයි.

18-9

"නත්ථිරාගසමොනි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩ සිටියදී උපාසකවරු පස් දෙනෙක් පිළිබඳව දේශනා කළහ.

ඒ උපාසකවරු ධර්මය අසනු කැමතිව විහාරයට ගොස් බුදුන් වැඳ එකත් පසෙක වාඩිවුහ. බුදුවරුනම් මේ ක්‍ෂත්‍රියෙකි. මේ බ්‍රාහ්මණයෙකි. මේ ධනපතියෙකි. මේ දුගියෙකි. මොහුට උසස් කොට ධර්ම දේශනා කරන්නෙමි. මොහුට එසේ නොවේ. යනුවෙන් නොසිතති. යම් කිසිවෙක් අරමුණු කරගෙන ධර්මය දේශනා කරන්නේ ධර්මයෙහි ගෞරවය පෙරටුකොට අහස් ගඟින් කඩාහැලෙන ලෙස දේශනා කරන්නාහ.

මෙලෙස දේශනා කරණ විට බුදුන් සමීපයේ සිටිය වුන්ගෙන් එක් අයකුට වාඩිවී සිටියදී ම නින්ද ගියේය. එක් අයෙක් ඇඟිල්ලෙන් බිම සාරමින් සිටියේය. එකෙක් ගසක් සොලවමින් සිටියේය. එක් අයෙක් අහස බලමින් සිටියේය. එක් අයෙක් හොඳින් බණ අසමින් සිටියේය. ආනන්ද තෙරුණුවෝ බුදුන්ට පවන්සලමින් සිට ඔවුන්ගේ ස්වරූපය දැක, බුදුන්ට මෙසේ පැවසුහ. ස්වාමීනි ඔබවහන්සේ මහාමේඝ ගර්ජනාවක් කරන්නාසේ ධර්මය දේශනා කරති. මොවුන් ඔබවහන්සේ ධර්මදේශනා කරද්දීත් එකිනෙක දේ කරමින් සිටිති. ආනන්ද ඔබ මොවුන් දන්නේද? ස්වාමීනි මම නොදනිමි. මොවුන් අතරින් මේ නිදන තැනැත්තා පන්සියක් ජාති සර්පයෙක්වී සිට දරණ වැලේ හිස තබාගෙන නිදා ගත්තෙකි. දැනුදු ඔහු නිදාගෙන සිටී. ස්වාමීනි ඔබවහන්සේ පිළිවෙලින් සිදුවුදේ කියත්ද නැතහොත් අතරින් පතර සිදුවූ දෙයක් පවසත්ද? ආනන්ද මොවුන් කාලයක් මනුෂ්‍ය ආත්ම ද කලක් දේවත්වයද කලක් නාග ආත්මද මෙසේ අතරින් පතර උපදිනවිට ඒ උපන් සර්වඥතාග ඤාණයෙන්ම පිරිසිඳ දැනගැනීමට හැකිය. පිළිවෙලින් ජාති පන් සියයක් නාග යෝනියේ ඉපිද නිදාගන්නේ නින්දේ ඇතිවීමක් නම් නැත. ඇඟිල්ලෙන් බිම සාරන තැනැත්තා ජාති පන් සියයක් ගැඩවිලෙක්වී බිම සෑරිය. මෙහි බිමසාරමින් මගේ ශබ්දය නො අසයි. මේ ගස සොලවන තැනැත්තා පිළිවෙලින් ජාති පන්සියයක් වඳුරු යෝනියේ උපති. දැනුදු පෙර පුරුදුලෙසට ගසක්

සොලවයි. මොහුගේ කණට මාගේ ශබ්දය නො පිවිසේ. මේ අහස දෙස බලා සිටින පුරුෂයා පන්සියයක් ජාති නැකැත් පාඨකයෙක්ව, උපනි. දැන් පෙරපුරුදු ලෙසට අදත් අහසම බලා සිටියි. ඔහුගේ කණටද මගේ ශබ්දය නො පිවිසේ. මේ සකසා ධර්මය අසන්නා නම් පිළිවෙලින් පන්සියයක් ජාති ත්‍රිවේදය පාරප්‍රාප්තව මන්ත්‍ර කියන බමුණෙක්ව උපන්නේය. දැන් ද මන්ත්‍ර සසඳනසේ හොඳින් සවන් දෙයි.

ස්වාමීනි ඔබ වහන්සේගේ ධර්ම දේශනා සිව් ආදිය සිඳ ඇටමිදුළු වල හැපී සිටියි. කුමක් හෙයින් මොවුන් ඔබවහන්සේ ධර්මදේශනා කරණවිටත් සකසා නොඅසත්ද? ආනන්ද මගේ ධර්මය මනාසේ ඇසිය යුතුයයි සඤ්ඤා කෙරේද? ඇයි ස්වාමීනි ඇසීමට අපහසුද? එසේය ආනන්ද ඇයි ස්වාමීනි. ආනන්ද බුද්ධ - ධම්ම - සංඝ යන පද මේ සත්ත්වයන් විසින් අප්‍රමාණ කල්ප කෙළදහසක් නො ඇසූ විරිය. යම් හෙයකින් මේ ධර්මය ඇසීමට නොහැකිවන්නේ කෙලවරක් නොමැති සසර මේ සත්ත්වයෝ නොයෙක් ආකාර තිරච්ඡාන කථාම පමණක් අසමින් පැමිණියෝය. එනිසා සුරාසැල් කෙළිමඩල ආදීන්හි ගයමින් නටමින් හැසිරෙත්. ධර්මය ඇසීමට නොහැකිවෙති. ස්වාමීනි කවර කරුණක් නිසා මේ සත්ත්වයින්ට නොහැකිවේද? අනතුරුව බුදුහු ආනන්දය රාගය ද්වේශය මෝහය නිසාය. තණ්හාව නිසා නොහැකි වේ. රාගය ගින්නක් වැන්න. ගිනි අඟුරු ද ඉතිරි නොකර සත්ත්වයා දවාලයි. කෙසේ හෝ සප්ත සුර්යෝද්ගමනය පහළ වීම නිසා උසස් කල්ප විනාශයක ගින්න කිසිවෙක් ඉතිරි නොකරම ලොව දවාලයි. එය කවදා හෝ කෙසේ හෝ දවයි. රාග ගින්නෙන් නොදවෙන කාලයක් නම් නැත. එනිසා රාගසමවූ ගින්නක් හෝ ද්වේශය සමාන ග්‍රහනයක් මෝහය හා සමාන වූ දැලක් තෘෂ්ණාව සමාන ගඟක් නම් නැතැයි පවසා මේ ගාථාව පැවසුහ.

රාගය ගින්නක්ය මුළු දිවියම දවන
නරභව නරකමය නිති නැන නැන ඇලෙන
මෝහය දැලකි - ආසා ගඟුලකි ගලන
දුරුකොට ලබනු මැන ඔබ විදු නැණ පහන

එහි දුම් අගුරු ආදී කිසිවක් නැතිව ඇතුළතින් දැවෙන්නා වූ රාගය හා සමාන ගින්නක් නැත. ආදී කිසිවක් ගැනීමට නොහැකිවන ද්වේශය හා සමාන ග්‍රහණයක් නැත. **මොහසමං** - නැවත නැවත දුක්ගෙන දෙන ගංගා ආදිය පිරුණ කළ ජලය අඩු කාලයේ ද වියළි කාලයේද දක්නට ලැබේ. නිතර අඩුවම දක්නට ලැබේ. **දුප්පූරිය** යන්නෙන් තෘෂ්ණාව සමාන ගඟක් නම් නැත. යන අර්ථයි.

ධර්ම දේශනය අවසානයේදී ඒ සකසා ධර්මය ඇසු තැනැත්තා සෝවාන් ඵලයට පත්විය පැමිණි අයට ද දේශනය සාර්ථක විය.

පඤ්ච උපාසක වරුන් පිළිබඳ කථා පුවතයි.

18-10

"**සුදස්සනාති**" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ භද්දිය නුවර ඇසුරු කොට ජාතියා වනයේ වැඩසිටියදි මෙණ්ඩක සිටුවරයා වෙනුවෙන් දේශනා කළහ.

බුදුහු අඩිගුත්තර පෙදෙසේ චාරිකාවේ යෙදෙමින් මෙණ්ඩක සිටුවරයා ගේද භාර්යාව වූ චන්ද පදුමාගේ ද පුතණුවන් වන ධනඤ්ජය සිටුවරයාගේ ද, ලේලිය වන, සුමනා දේවිය ගේද, මිණිබිරිය වූ, විසාඛා වගේද, දාසයා වූ පුණ්ණගේද, යන මේ අයගේ සෝවාන් ඵලයට උපනිශ්‍රය දැක භද්දිය නගරයට ගොස් ජාතිය වනයේ විසුහ. මෙණඩක සිටුවරයා බුදුන් වැඩමකළ බව ඇසුවේය. මෙණ්ඩක සිටුවරයාට මේ නමලැබුනේ කෙසේද?

ඔහුගේ ගෙදර පිටුපස අට කිරියක් පමණ තැන් ඇත් අස් - ගොන් පමණ රන් බැටළුවෝ පොළව පලා විටෙන් විට ගැටෙමින් ඇතිවුහ. ඔවුන්ගේ කටේ පස් පැහැ ඇති පලස් විවීමට ගන්නා, නුල් ගුලියක් තබන ලද්දේවිය. ගිතෙල් මී පැණි ආදීන් හෝ හඳින පොරෝනා වස්ත්‍ර හෝ රන් - රුවන් - ආදීන්ගෙන් හෝ ප්‍රයොජනයක් ඇති වූ විට ඔවුන්ගේ කටින් දඹදිව වාසින්ගේ ප්‍රයෝජනයට ප්‍රමාණවත් තරම් එම භාණ්ඩ නිකුත් වෙයි. මෙතෙක් බැටළුවන් සිටියත් එකකුගේ කටින් වුවත් නුල් ගුටිය ගැළ වූ නම් මුළු දඹදිව් වැස්සන්ට අවශ්‍ය සම්පත් ප්‍රමාණය ලබාදෙයි. ඒනිසා එතැන් පටන් ඔහුට මේ මෙණ්ඩක සිටුවරයා යන නම ලැබුනි. මොහුගේ පෙර කරණ ලද කුශල කර්මය නම්, විපස්සි බුද්ධ කාලයේදී මොහු අවරෝජ නම් කෙළෙඹියාගේ බෑනා ඒ මාමා ගේ නම හා සමාන නම වූ අවරෝජ යන නම් විය. අනතුරුව මේ මාමා බුදුන්ට ගඳකිළියක් කරන්නට පටන් ගත්තේය. ඔහු මාමා සමීපයට ගොස් අපි දෙදෙනාම සහායෙන් කරමුයි. ඔහු විසින් පිළිගත් කළ මේ ස්ථානයේ කුඤ්ජර ශාලානමින් මණ්ඩපයක් කිරීම වටී යයි සිතා කැලයෙන් දුව්‍ය ගෙන්වා ගෙන එක් කණුවක් රන් ඔබවන ලදී. එකක් රිදී ඔබවන ලදී. එකක් මැණික් ඔබවන ලදී මෙසේ මහත් කණු - දොරකවුළු - ජනෙල් - නොගැස්ස පුවරිටු උළු යන සියල්ල රත්වලින් ඔබ්බන ලද සේ කර ගඳකිලියට ඉදිරියෙහි රන් රුවන්මය කුඤ්ජර ශාලා නම් මණ්ඩපය

කළේය. ඒ මණ්ඩපය මැණික් මය පබලුමය මුදුන් කොන්විය. කුඤ්ජර ශාලාවේ මැද මැණික් මණ්ඩපයක් කරවා ධර්මාසනයක් පිහිටුවීය. එහි සණරත්න සවර්ණමය පාදවිය. එලෙසට සතර පාද වීය. රන් බැටළුවන් සිවුදෙනෙක් කරවා ආසනයේ කකුල් සතරට තැබීය. බැටළුවන් දෙදෙනෙක් කරවා පාපුටු උඩ වට සවිකළේය. රන් බැටළුවන් සදෙනෙක් කරවා මණ්ඩපය වටකොට තැබුවේය. ධර්මාසනය වටකරමින් තැබුවේය. ධර්මාසනය පළමුව රැහැන්වලින් වියවා මැද රන් හුල්මය රැහැන්වලින්ද උඩ පටහුය වලින්ද වියවා එහි මැද සඳුන්මය. හේත්තුවන පිටාවුවක් තැබීය. (ඵලක තැබීය) මෙලෙස කුඤ්ජර ශාලාව නිමවා පුජා උත්සවය කරන්නේ භික්ෂූන් එක්ලක්ෂ සැට අට දහසක් භික්ෂූන් සමග බුදුන්ට ආරාධනාකර සිවිමසක් දන් දී අවසාන දිනයේදී තුන් සිවුරු පිළිගන්විය. එහි අළුත් භික්ෂූන්ට දහසක් වටිනා සිවුර දෙවීය. මේ ලෙසට හේ විපස්සී බුද්ධකාලයේදී පින් සිදුකර ඉන් චුතවුයේ දෙවියන් අතර මිනිසුන් අතරද සැරිසරමින් මේ කල්පයේ බරණැස මහත් භෝග ඇති සිටුකුලයක ඉපදී බරණැස සිටුවරයායයි ප්‍රසිද්ධ විය. ඔහු දිනක් රාජ උපස්ථානයට යන්නේ පුරෝහිතයා දැක කිම ආචාර්යන් වහන්ස ශුභ නැකත් මුහුර්තයක් සිහි කරමුදැයි විමසුවේය. ඔව් සලකාබලමි. කිම අපේ අනෙක් කර්මයක්ද එසේ නම් ජන පද චාරිකා කෙබඳුද? එක් බියක් ඇතිවේ. කවර බියක්ද? සාගතයක් පිළිබඳ බියකි. තව ද සිදුවන්නේද මෙයින් අවුරුදු තුනකට පසුවය. මෙය අසා සිටුවරයා බොහෝ කෘෂි කර්මාන්ත කරවා ගෙදොර ධනය ඇතත් ධාන්‍යම අරගෙන කොටු දොළොස් සියයක් කරවා සියළු කොටුවල වී පුරවාලීය. කොටු නොපොහොනා විට මහසැළි ඇදියෙහි පුරවා ඉතිරිය බිම් වලවල් සාරවා නිධන්කළේය. ඉතිරිය මැටිසමග බිත්තිවල ගැබය. ඔහු පසුකාලයේදී දුර්භික්ෂය පැමිණිවිට තබනලද ධාන්‍ය පරිභෝග කරන්නෙ කොටුවලද සැලී ආදියේද තබනලද ධාන්‍ය අවසන් වූ විට පිරිවර ජනයා කැඳවා මෙසේ කීවේය. දරුවනි යව් යම් පුළු පුළුවන් තැන්වලට පිවිසී ජීවත් වී සුභික්ෂ සමයේ මාලඟට කැමතිඅය පැමිනේවා. නොකමැති අය ඒ ඒ තැන්වලට ජීවත් වේවා. ඔවුහු එසේ කළාහුය. ඔහු අසල වතාවත් කරණ පුණ්ණ නම් එකම දාසයා නැවතුනි. ඔහු සමග බිරිඳ සිටුවරයාගේ පුත් සිටු මිනිපිරියද යන පස්දෙනා වුහ. ඔවුහු බිම වලවල්වල තබන ලද ධාන්‍ය අවසන්වූ විට බිත්ති මැටි හෙලා තෙමා ගන්නා ලද ධාන්‍යවලින් යැපුනාහුය.

මේ අතර බිරිඳ දුර්භික්ෂය පවතින අතර මැටි අවසන් වනවිට බිත්ති පාදවල ඉතිරි මැටි හෙලා තබා අඩපතක් පමණ වී ලබාගෙන කොටා එක් සහල් නැලියක් ගෙන - දුර්භික්ෂ කාලයේ දී බොහෝ සොරු සිටිති. සොරුන්ට බියෙන් එක් කළයක සහල් දමා වසා පොළව සාරා තැබීය. අනතුරුව සිටුවරයා රාජ්‍ය සේවයට ගොස් ආපසු පැමිණ මෙසේ කීවේය. සොඳුර කුසගින්න ඇත. කෑමට කිසිවක් තිබේද? ඇය පෙනෙන්නට කිසිවක් නැතැයි නොකියා එක නැලියක් ඇතැයි කීවාය. කොහේද? සොරුන්ට බියෙන් පොළව සාරා තබන ලදී. එසේනම් එය උඩට ගෙන කිසිවක් උයන්න. ඉදින් කෑද උයන්ගේ නම් දෙවරක් ගත හැකිය. ඉදින් බත් උයන්නේනම් එක් වරක් පමණි. ස්වාමීනි කුමක් උයන්නද? දැයි විමසිය අපට අනෙක් ප්‍රත්‍යයක් නැත. බත් උයා කා මැරෙන්නෙමුයි ඇය බත් උයා කොටස් පහකට බෙදා සිටුවර යාගේ කොටස වේද? ඉදිරියෙන් තැබුවේය. මේ අවස්ථාවේදී ගන්ධමාදන 'පර්වතයේ වසන පසේ බුද්ධ නමක් සමාපත්තියෙන් නැගිසිටියහ. සමාපත්තිය තුළ දී සමාපත්ති **බල**යෙන් බඩගින්න බාධාවක් නොවේ. සමාධියෙන් නැගිසිටි අයට බලවත්සේ උදර පටලය දවේ. එනිසා උන් වහන්සේලා ආහාර ලැබෙන තැනක් බලන්නේ දක බලා වැඩම කරති. එදිනද උන්වහන්සේලාට දන් දී සේනාපති තනතුරු වැනි එක්තරා සම්පත් ලබති. එනිසා (ඔහුද) උන්වහන්සේද දිවැසින් බලන්නේ මුළු දඹදිව සාගත බියක් ඇතිවී තිබේ. සිටුවරයාගේ ගෙදරද පස් දෙනෙකුට බත් නැලියක් පමණ ඇත. ඔවුන්ට මට සංග්‍රහ කිරීමට හැකිදැයි බලා ඔවුන්ගේ ශ්‍රද්ධාවන්ත භාවයද සංග්‍රහ කිරීමේ හැකියාවද දැකබලා පාසිවුරු ගෙන ධනසිටුවරයාගේ ඉදිරියේ දොරලඟ සිටි, තමන් දක්වූහ. ඔහු පසේ බුදුන් දක ප්‍රසන්න සිත් ඇතිව මම පෙරද දන්නොදුන් බැවින් මෙබඳු සාගතයක් ඇතිවියයි මේ බත මා එකදිනක්ම ආරක්ෂා කරයි. ආර්යයන් වහන්සේට දෙනලද දෙය නොයෙක් කල්ප කෝටි ගණනක් මගේ සිත සුව පිණිස වන්නේයයි, එම බත් පාත්‍රය ගෙන පසේ බුදුන් වෙත ගොස් බුදුරජාණන් වහන්සේගේ පාත්‍රයට පිදුවේය. අඩක් දෙනවිට පසේ බුදුහු අතින් පාත්‍රය වැසූහ. අනතුරුව ඔහු - ස්වාමීනි ! එක් සහල් නැළියකින් පස් දෙනෙකුට උයනලද බත්වලින් මේ එක් කොටසකි. මෙය දෙකොටසකට බෙදීම කළ නොහැකිය. මට මෙලොව සංග්‍රහ නො කරණු මැනව. සියල්ල දෙනු කැමැත්තෙමි. කියා බත් මුළු භාජනයම දුන්නේය. දී අවසන

ප්‍රාර්ථනයක් තැබුහ. ස්වාමීනි මා නැවත උපන් සියළු තැන්වලදී මේ ආකාර සාගත බියක් නොදකිවා මෙතැන් පටන් මුළු දඹදිව් වාසින්ට බීජබත් දීමට හැකිකෙනෙක් වේවා සියතින් කර්මාන්තකර ජීවිතය නොරැකේවා. අඩතෙළෙස් කොට සියයක් අඩුනොව (1250) සෝධා දියනා ඔවුන්ගේ ගෙදොර වාඩිවී උඩ බැලුපමණකින් රත්හැල් ධාරා වැටී සියළු කොටු පුරවනු ලැබේවා. උපන් උපන් තැන මේ බිරිඳට මේ පුතාම මේ ලේලියම මේ දාසයාම ලැබේවායි පැතුවේය. ඔහුගේ සිටුබිරිඳද මගේ ස්වාමියා කුසගින්නෙන් පෙළෙද්දී මටද ආහාර ගැනීමට නොහැකියයි සිතා තම කොටස පසේ බුදුන්ට දන් දි ප්‍රාර්ථනසයක් තැබුවාය. ස්වාමීනි උපන් උපන් තැන මෙබඳු සාගතයක නොදකිවා බත් තළියක් පෙරටුකර සියළු දිඹදිව් වැසියන්ට මුළු දඹදිව් වාසින්ට බත් දෙන්නේ යම්තාක් උත්සාහවත් වේවිද ඒතාක් ගත් ගත් තැන්වලින් මුලින් තිබුන ලෙසට පවතීවා මොහුම සැමියා වේවා මොහුම පුතු වේවායි පැතුවාය.

ඇගේ පුතා ද තමන්ගේ කොටස පසේ බුදුන්ට දන්දී මෙලෙසින්ම ප්‍රාර්ථනා කලේය. මගේ මේ දානයෙන් මේ දහසින් බැදි පෙරහංකඩය (සෙම්බුව) ගෙන මුළු දඹදිව් වැස්සන්ට කහවනු ඉවර නොවී නිතර නිතර පසුම්බිය පිරේවායි පැතුවේය. ලේලියද තමන්ගේ කොටස පසේ බුදුන්ට දන් දී සමාන පැතුම් කළ අතර ධාන්‍ය පැස පෙරටුව තබාගෙන මුළු දඹදිව් වැසියන්ට බීජ බත් දුන්නේද ක්ෂයවීමක් නොවේවායි පැතුවාය. දාසයාද එලෙසින්ම ප්‍රාර්ථනා කරගෙන - මට සී සාන විට මොඛින් හී පිටි තැනක්ද ඇතින් හි පිටි තැනක් ද මධ්‍යයෙන් හි පිටි තැනක් හා හී වැල් සතසත යේවා ප්‍රාර්ථනා කළේය. ඔහුට සේනාපති තනතුරු ලැබීමට ප්‍රාර්ථනා කළ හැකිවුවත් - දාසයාමෙයම ප්‍රාර්ථනා කළේය.

පසේ බුදුරජාණන් වහන්සේ සියල්ලන්ගේම වචන අවසානයේ මෙලෙස වේවායි. කියා පසේබුදු වරුන්ගේ ගාථාවන්ගෙන් අනුමෝදනා කර මවිසින් මොවුන්ගේ සිත පැහැදීම විමට වටියයි සිතා ගන්ධමාදන පර්වතය තෙක් මා දකිවායි අදිටන් කොට වැඩම කළහ. ඔවුන්ද බලමින්ම සිටියාහුය. උන්වහන්සේ වැඩම කර එම බත පන්සියයක් පසේ බුදුවරයන් සමග බෙදා වැළඳුහ. උන්වහන්සේගේ ආනුභාවයෙන් සියල්ලන්ටම ප්‍රමාණවත් විය.

ඔවුන්ද බලමින්ම සිටියාහුය. ඇස් හමුවෙන් ඉක්ම ගියපසු සවස සිටුබිරිඳ සැළිය සෝදා වසා තැබුවාය. සිටුවරයාද බඩගින්නෙන් පෙළුනේ නිදා වැටුනේය. ඔහු සවස අවදිවී බිරිඳට මෙසේ කීවේය. අතිශයින් බඩගිනි ඇතිවිය. සැළියේ පතුලේ ශේෂයක් ඇත්දැයි දැමුන බත් තිබේදැයි විමසීය. සෝදා වැස්සේ තිබූබව දැන දැනත් නැතැයි නොකියා සැළිය ඇර බැලුවාය. එකෙනෙහිම සමන්මල් කැකුළු සේ බතින් පිරී සිටියේ පියන උඩට නැගි සිටියේය. ඇය එය දැක සතුටින් උදම් වූ සිරුර ඇතිව මෙය පැවසුවාය. ස්වාමීනි නැගිටින්න මම සැළිය සෝදා නැබීම් දැන් එය සමන් මල් කැකුළුවැනි බතින් පිරී ඇත. පින්කම් කළයුතුය දානයනම් දියයුතුය. ස්වාමීනි නැගිටින්න. ආහාර වළඳන්න ඇය පිය පුත් දෙදෙනාටම දුන්නාය.

ඔවුන් ආහාරගෙන නැගී සිටිවිට බිරිඳ ලේලිය සමග වාඩිවී ආහාර ගෙන පුණ්ණට ආහාර දුන්නේය ගත් ගත් තැන ඉවර නොවේ. හැන්දෙන් එක වරක් ගත්තා වැනි විය. එදිනම වී අටුකොටු ආදිය පෙර පිරීතිබුන අයුරින් නැවත පිරුනි. සිටුවරයාගේ නිවසේ බත් උපනි. බීජ බත්වලින් ප්‍රයෝජන ඇති අය පැමිණ ගනිත්වායි නගරේ ඝෝෂා හඬ ඇති කළහ. මිනිස්සු ඔහුගේ නිවසින් බීජ බත් ගත්තාහුය. මුළු දඹදිව වැසියෝද එනිසා දිවි ලැබුහ. මේ සිටුවරයා ඉන් චුතව දෙව්ලොව ඉපිද පසුව දෙව් මිනිසුන් අතර සැරිසරන්නේ මේ බුදෙඩාත්පාදයේදී හද්දිය නගරයේ සිටුකුලයක ඉපදුනි. ඔහුගේ භාර්යාවද මහා භෝග කුලයක ඉපිද වැඩිවියට පත්ව ඔහුගේ කුලයටම බිරිඳලෙස ගියාය. ඔහු ගේ ඒ පැරණි කර්මය නිසාම ගෙයි පිටුපස මුලින් කීව ආකාරයටම බැටළුවෝ පැන නැගුනි.

පුතාද ඒ සිටි පුතාමය. ඒ පැරණි ලේලියම එහි ඉපදුනි. දාසයාද එහිම ඉපදුනි. අනතුරුව සිටුවරයා තමන්ගේ පින විමසනු සඳහා වී කොටු සෝධා දියනා දොර වාඩිවී අච්ච බැලුවේය. සියල්ල කියන ලද ආකාරයෙන් රත් හැල් වියෙන් පිරුනි, ඔහු අනෙක් පින් විමසනු කැමැත්තේ භාර්යාව පුතුන් ආදීන්ට තොපගේ පිං විමසන්නැයි පැවසුවේය. අනතුරුව ඔහුගේ බිරිය සියළු අලංකාරයෙන් සැරසී මහජනයාට පෙනී පෙනීම සහල් බෙදා බත් උයා - දොර කඩ පනවන ලද අසුනේ වාඩිවී රන් හැන්දක් ගෙන බත් අවශ්‍ය අය පැමිනේවායි පැමිණි පැමිණි අයට ගෙන ආ භාජන පුරවා බත් දුන්නාය.

මුළු දවසක් දෙන්නී බත් ගත් තැන් තැන් වලින් එක හැන්දක් පමණක් අඩුවී පෙනෙන්නට තිබුනි. ඇය පළමු බුදුන් ට දන් දෙනවිට වමතින් සැළියද දකුණු අතින් හැන්දද ගෙන මෙසේම බත් පුරවා බත් පිරිනැමුහෙයින් වම් අත් තලය පුරවා නෙළුමක ලක්‍ෂණ ඇතිවිය. දකුණත පිරෙන ලෙසට සදේ ලකුණු පෙනෙන්නට තිබුනි. වම් අතින් ධම්ම කරකය ගෙන භික්‍ෂු සංඝයාට ජලය පෙරා දුන්බැවින් ඔබිනොබ හැසිරුන නිසා දකුණුපාදය පුරා නෙළුමක ලක්‍ෂණ ඇතිවිය. පහළවිය. වම් පයේ යටි පතුලේ පියුමක ලක්‍ෂණ පිරී පැවතුනි. මේ කරුණ නිසා "චන්ද්‍ර පදුමා" යන නමලැබුනි. පුතාද දිය නා දහසක් ඇති පෙරහන ගෙන කහවනු වලින් ප්‍රයෝජන ඇත්තෝ පැමිනේවායි පවසා පැමිණියවුන්ට ගත් භාජන පුරවා දුන්නේය. එහෙත් පෙරහනේ කහවනු දහසක් නො අඩුව පැවතුනි. ඔවුන්ගේ යෙහෙළිය සියළු අලංකාරයෙන් සැරසී වී පැස ගෙන පස් මිදුලේ සිටියේ බිජ වී අවශ්‍ය පැමිනෙන්වායි පැමිණි අයට ගන්නාලද භාජන පුරවා දුන්නීය. එහෙත් වී පැස පිරිතිබෙනු දක්නට ලැබුනි. බීජ බත් සඳහා අළුත් අය පැමිනේවා ආවාවු සියළු දෙනාම ගන්නාලද භාජන පුරවා දුන්නීය. වී පැස නිතර පිරීම පැවතුනි.

දාසයාද සියළු අලංකාරයෙන් සැරසී රන් වියගස රන් යොතකින් ගොනුන් යොදවා රන් කෙවිට ගෙන ගොනුන් දෙදෙනාට සුවඳ පංච අංගුලි දී අංවල රන් කොපු දමා කෙතට ගොස් ගවයින් දක්කුවේය. මෙයින් දෙඇළ විසින් තුන තුන බැගින් ද මැද එකකින් බැගින් අවශ්‍ය වශයෙන් හී විටි හතක් බිඳී ආවාහුය. ජම්බුදීපවාසීන්ට බීජ රන් රුවන් ආදිය කැමති ලෙස සිටු තුමාගේ නිවසින්ම ගන්නාහුය.

මෙසේ මහානුභාව සම්පන්න සිටුවරයා බුදුහු වැඩමකලාහුයයි අසා බුදුන් වෙත ගමන් කරන්නෙමියි නික්මුනේ අතර මහ තීර්ථකයන් දැක ඔවුන් විසින් ගෘහපතිය නුඹ කුමක් නිසා කිරියවාදීව සිට අකිරිය වාදී ශ්‍රමණ භවත් ගෞතමයන් වෙත යන්නේදැයි වලක්වද්දීම ඔවුන්ගේ වචන නො අදහාම ගොස් බුදුන් වැඳ එකත් පසෙක වාඩිවිය.

අනතුරුව බුදුහු අනුපිළිවල කථාව පැවසුහ. ඔහු දේශනය කෙලවර සෝවාන් ඵලයට පත්ව - බුදුන්ට තීර්ථකයින් බුදුන්ගේ අගුණ කියා තමාගේ ගමන වැලැක් වූ අයුරු දන්වාසිටියේය. අනතුරුව බුදුහු ගෘහපතිය මේ සත්ත්වයෝ නම් මහත්වූද තමන්ගේ දොස් නො දනිති. නොපෙනෙන්නා වූ අන් අයගේ දොස් පරොස් දක්වා ඒ ඒ තැන බොහෝසේ දමත්යයි කියා මේ ගාථාව පැවසුහ.

නම වරද නොදක්නා	- මේ ලොවේ බෝ මිනිස්සු
අන් වරද සොයාලා	- හුවා දක්වයි මහත්සේ.
කොළ අතු හැඳ වනේ	- වැදි දනා සෙළුව වස්නා
මෙන්ම තම තමන් ගේ	- වැරදි සඟවා ගනියි උන්

අනුන්ගේ දොස් දැකීම පහසුය තමන්ගේ දොස් දැකීම අපහසුය. අනුන්ගේ දොස්ම දැක බෙහෙවින් පතුරුවයි. තමන්ගේ දොස් වසයි.

එහි **සුදසුං වජ්ජං** යනු අන් අයගේ ඉතා සුළු වූ ද වරද සුවසේ දකී. තමන්ගේ අති මහත් වුද වරද දැකීම අපහසුය. **දුද්දසං පරෙසං ඵීති** මේ කරුනින් ඒ පුද්ගලයා සංසයා මැඳද අන් අයගේ **වජ්ජානි** වරද උසස් තැන්.... තබා බෙහෙවින් හෙලන්නාක් මෙන් පතුරුවයි. **කලිංව කිතවා සයෝ** එහි පක්ෂීන් මරමින් වැරදි කරන තැනැත්තා කැලේ කොළ අතු කඩා හදිමින් තම සෙළුව වසාගන්නාක් මෙන්ද කපටිවු කුරුළු වැද්දා යම්සේ පක්ෂීන් ගෙන මරණු කැමැත්තේ සඟවන්නාක් මෙන් ඇතිවරද වසයි. තමන්ගේ වරද එයයි යන අරුතයි. දෙසුම අවසන බොහෝදෙන සෝවාන් ආදී ඵලයන්ට පත්වුහ.

මෙණ්ඩක සිටුවරයාගේ කථා පුවතයි.

18-11

"පරවජ්ජානු පස්සිස්සාති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර දෙවිරම වැඩ සිටියදී "උජ්ඣාන සඤ්ඤී" නම් එක් තෙරකෙනෙක් නිමිති කරගෙන දේශනාකළහ.

මෙතෙමේ මෙසේ දවසරියි. මෙසේ අදියි මෙසේ පෙරවයි යනුවෙන් අනෙක් භික්ෂූන්ගේ වැරදීම සොයමින් හැසිරේ. භික්ෂූහු බුදුන් වෙත ගොස් ස්වාමීනි අසවල් තෙරුන් මෙසේ කරන්නේයයි බුදුන්ට දැනුම් දුන්හ. බුදුරජාණන් වහන්සේ වත් පිළිවෙත් මුල්කොට අවවාද කරණ විට (කිසිවකුගෙනත්) වැරදි සිදුනොවේ. යමෙක් වනාහි නින්දාකිරීමේ අදහසින් අනුන්ගේ සිදුරු සොයමින් ඒවා කියමින් හැසිරෙන්නේනම් ඔහුගේ බලාපොරොත්තු අනුව කිසියම් මාර්ග ඵල විශේෂත්වයකට ඔහු පත්නොවේ. හුදෙක් ආශ්‍රවයෝම කෙලස්ම වැඩේ යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

සොයමින් අනුන්	දොස්
නිතර පවසන රළු	බස්
මහණ සිරුරෙන්	උස්
වුවත් මගපල වලින් වේ	හිස්

එහි **උජ්ඣාන සඤ්ඤී** - යනු මෙසේ හිදිය යුතුය. මෙසේ පෙරවිය යුතුය. ආදි වශයෙන් අන් අයගේ වැරදි සොයන නින්දාකිරීම් බහුල පුද්ගලයින්ට ධ්‍යාන ආදී එකම ධර්මයක්වත් නොවැඩේ. එහෙත් **ආසවානඤ්ච ඛඣනති** - යනු ඔහුගේ කෙලෙස් වැඩේ. මේනිසා ඔහු ආසවක්ඛයා ආරා ආර්ය භාවයෙන් බැහැරවේ දුරු වේ. දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පත්වූහ.

"උජ්ඣාන සඤ්ඤී තෙරුන්ගේ " කථා පුවතයි.
(අනුන්ගේ වැරදීම සොයන නිසා උජ්ඣාන සඤ්ඤී යන
ව්‍යවහාර විය)

18-12

"**ආකසෙ**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ කුසිනාරා නුවර උපවත්තන මල්ල රජ දරුවන්ගේ සල්වනයේ පිරිනිවන් පානු සඳහා සැතපෙමින් සිටියදී සුභද්ද පිරිවැජියා නිමිත්තකරගෙන දේශනා කළහ.

මොහු වනාහී අතීතයේදී කණිටු සොහොයුරා එක් අස් වැන්නකින් නව වාරයක් අග්‍රශ්‍රාව්‍ය දන් දෙන්නේ අකමැතිව ප්‍රමාදවී අවසානයේ දුන්නේය. මේ නිසා පළමු බෝධියේදී හෝ මධ්‍යම බෝධියේදී බුදුන් දකිනු නොහැකිව පශ්චිම බෝධියේදී බුදුන් පිරිනිවන්පාන අවස්ථාවේ මම ප්‍රශ්න තුනක් මගේ සැක දුරු කරගැනීම සඳහා මහළු පිරිවැජියන් ගෙන් අසා ශ්‍රමණ භවත් ගෞතමයන් කුඩායයි දහරයයි හැඟීමෙන් නො ඇසුවෙමි. දැන් මම ශ්‍රමණ ගෞතමයන් පිරිනිවන් පෑමෙන් අනතුරුව ශ්‍රමණ භවත් ගෞතමයන් නොවීමසීම පිළිබඳව විපිළිසර ඇතිවේ. මේනිසා බුදුන් වෙත එළඹ ආනන්ද තෙරුන් වලක්වද්දී, බුදුන් ආනන්ද තෙරුන්ට නොවළක්වන ලෙසට පැවසු පසු සුභද්‍ර බුදුන් වෙත ගොස් තමන් තුළ පැවති ප්‍රශ්න විමසුහ. පින්වත් ශ්‍රමණයන් වහන්ස ! කවර හෙයින් අහසේ පාසටහන් නැත්තේද? මේ සසුනේ බැහැරව ශ්‍රමණයෝ ඇත්ද? නොනස්නා වූ ප්‍රත්‍ය සමුත්පන්න ධර්මයෝ ඇත්ද? මේ ප්‍රශ්න විමසුවේය. අනතුරුව බුදුහු එම ප්‍රශ්නවල ආභාවය කියමින් මෙ ගාථාවෙන් ධර්මය දේශනා කළහ.

පියවර ලකුණු නුබ කුස පිහිටනුයෙ	නැත
මග පල ලැබීමක් බාහිර සසුනෙ	නැත
අනියස සකර දමි, එහි නිරගතිය	නැත
ආසා එකක් වත් සම්බුදු සිතක	නැත.

"**ආකාසෙ පදං නත්ථි සමණෝ නත්ථි බාහිරෙ**- අහසේ පියවර සටහන් නැත. බාහිර ශාසනයේ ශ්‍රමණයෝ නැත්තාහ සත්ත්වයෝ තෘෂ්ණාදී ප්‍රපංචයන්හි ඇලේ තථාගතවරු එසේ නොවේ. අහසේ පියවර සටහන් නැත, බාහිර ශාසනවල ශ්‍රමණයන් නැත.

එහි **පදං** යනු මේ අහසේ වර්ණ වශයෙන් රූපයයි පැනවිය යුතුය. කිසිදු පදයක් නැත. **බාහිර** නම් මගේ සසුනෙන් බැහැරව මාර්ග ඵල වලට පත් ශ්‍රමණයන් නැත. **පජානම්** මේ සත් ලොව ප්‍රජාව තන්හාදි ප්‍රපංචයන්හි ඇලුනාහුවෙති. **නිප්ප පඤ්චා** - නම් බෝධි මුලයේදීම සියළු ප්‍රපංච සිඳදැමූ හෙයින් තථාගතවරු ප්‍රපංච රහිතය **සඛ්ඛාරා** පඤ්චස්ඛන්ධය එහි එකක් හෝ ශාස්වත ස්වරූපයක් නැත. **ඉඤ්ජිතං** - බුදුවරුනම් තෘෂ්ණාමාන ආදී ඉඤ්ජිතවල යම් සඞ්කාර වශයෙන් ගන්නේද එකද **ඉඤ්ජිතයක්** හෝ නැත යන අර්ථයි.

දේශනය කෙලවර සුභද්‍ර අනාගාමී ඵලයේ පිහිටියේය. පැමිණි පිරිසටද දේශනය සාර්ථක විය.

සුභද්ද පිරිවැජියා පිළිබඳවූ කථා පුවතයි.

මූල වර්ග වර්ණනාව නිමියේය.

දහ අට වැනි වර්ගයයි.

19-1

"න තෙන හොති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී විනිශ්චය මහ ඇමති නිමිති කරගෙන දේශනාකළහ.

එක් දිනක් භික්ෂූන් වහන්සේලා සැවත උත්තර ද්වාර ගමේ පිඬුපිණිස චාරිකාවේ යෙදී පිණ්ඩපාතයෙන් වැලකුනේ නගරය මැදින් විහාරයට යති. එම අවස්ථාවේදී වැස්සක් පැනනැගුනි. ඔව්හු ළගම ඇති විනිච්චය සාලාවට පිවිස (සිටියදී) විනිශ්චය මහ ඇමති අල්ලස් ගෙන ස්වාමීන් අස්වාමීන් කරණු දැක, අහෝ මේ අධාර්මික අය අපි "ධාර්මික විනිශ්චය කරන්නෙමු"යි සනිටුහන් ඇතිව අධාර්මික විනිශ්චය කරතැයි, වැස්ස පහව ගියවිට විහාරයට ගොස් බුදුන් වැඳ එකත් පසෙක හිඳ මේ කරුනු දැනුම් දුන්හ. ශාස්තෘන් වහන්සේ මහණෙනි, ඡන්ද දෝෂ භය මෝහ යන්ගෙන් මුලාවී සැහැසිව අර්ථ විනිශ්චය කිරීම අධර්ම නම් වේ. ධාර්මික නොවේ, අපරාධ විනිශ්චය කිරීම විද්‍යමාන කරණු අනුව අපරාධයට අනුරූපවූ දරුණ නොවන අන්දමින් විනිශ්චය කිරීමම ධාර්මික විනිශ්චය වන්නේයයි පවසා මේ ගාථාව පැවසුහ.

දැහැමෙන් සෙමෙන් විමසා සියලු	**නොරතුරු**
නඩුවක නීන්දුව දිය යුතුය	**නිරතුරු**
අල්ලස, බිය, තරහ, තමබවම	**සුමිතුරු**
නීන්දුව දෙනොත්, ඔහු අදැමි	**විනිසුරු**

යම් හෙයකින් නඩුව බොරුවෙන් විසඳයිද එපමණින් නීති ධර්මයෙහි පිහිටියෙක් නො වන්නේය. නුවණැති පුද්ගලයා දහමින් ද සමයෙන් ද වරද වූ ලෙසත්ම සළකා විසඳයි ද? විනිශ්චය ධර්ම අනුව රකින්නා ඔහුම වේ. ධාර්මික ලෙස විනිශ්චය දහම් හි පිහිටියේමය.

එහි **තෙන** යනු මේ කරුණින් රජවරු ධාර්මික රජවරුන් වශයෙන් තමන් විසින් කළයුතු විනිශ්චය ධර්මයේ මනාව සිටියේද ධම්මචය වේ. එසේ

නොවන්නේ ධර්මිෂ්ඨ නොවේ. යනු යම් කරුණකින් **අජ්ඣං** යනු විනිසකරු වෙත විසඳීමට පැමිණි නඩු විනිශ්චය කළයුතුයි යන අර්ථයි. **සහසානයෙ** යනු ඡන්දය ආදි අගතීන්හි පිහිටා සැහැසික මුසාවාදයෙන් විනිශ්චය දෙයි ද යමෙක් ඡන්දයේ පිහිටා තමන්ගේ ඥාතීන් කෙරෙහි - යමෙක් ඡන්දයේ පිහිටා වෛරීව බොරුකියා ස්වාමියා - අභිමියා කරයිද, මෝහයේ පිහිටා අල්ලස් ගෙන විනිශ්චය කාලයේ අවධානය වෙනස් වූයේ ඔබ මොබ බලමින් බොරුකියා මොහු විසින් දිනන ලදි. මොහු පරාජය වියයි, අනුන් බැහැරකරයිද? බියෙන් පිහිටා කෙසේ හෝ අයිතිකරුට පරාජය හිමිවී අස්වාමිකයාම ජය ලබාදෙයි ද මෙය නපුරුලෙස අර්ථය පමුණුවයි ද ඔහු ධම්මට්ඨ නම් නොවේ. **අජ්ඣං - අජ්ඣං වානි** - යනු සිදු වූ හෝ සිදුනොවූ කරුණු **උභොවිනි ච්ඡෙය්‍යානි** යම් නුවණැත්තෙක් නුවණැතිව අර්ථ අනර්ථ දෙකේ විනිශ්චය කර කියයි **අසාහසෙන** මුසා වාදයෙන් බොරුවෙන් නොවේ. **ධම්මෙන** යනු විනිශ්චය ධර්මයෙන් ඡන්දාදි වශයෙන් නොවේ. **සමෙන** යනු අපරාධයට අනුරූප වශයෙනි. ඡන්දදොශ වශයෙන් නොවේ. **සමෙන්ති** අපරාධයන්ට අනුරූපවම අන් අයට ජය හෝ පරාජය වෙනස් නොකරයි. **ධම්මස්ස** ගුත්තෙතා - යනු ඔහු ධර්මය රකින්නේ ධර්මානුකූල ප්‍රඥාවෙන් යුතු වූයේ, නුවණැත්තේ විනිශ්චය ධර්මයේ සිටියේය නමැයි කියයි.

දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ඵලාදියට පත්වූහ.

විනිශ්චය මහා ඇමතියන්ගේ කථා පුවතයි.

19-2

"**නතෙන පණ්ඩිතො**" යනු මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩසිටියදි සවග මහණුන් නිමිති කරගෙන මේ දේශනය කළහ.

එම භික්ෂූහු විහාරයේ ද ගමේ ද දන්ගෙවල් ද කසල කරමින් හැඩි කෙරෙමින් හැසිරෙති. අනතුරුව එක් දිනක් ගමේ බත් කිස නිමවා ආවාවු බාල අයගෙන් හා සාමණේර වරුන්ගෙන්ද විමසුහ. ඇවැත්නි. දන් ගෙය කෙසේද? ස්වාමීනි ! ඒ ගැන නොඅසනු මැනව, ජබ්බග්ගිය භික්ෂූන් අපිම වියත් අය වෙමු. අපිම පණ්ඩිත වරු වෙමු. මොවුන් මෙහි දන් වැළදීම අවසන් කරවමු මෙතැනින් නෙරපමු. යන හැගීමෙන් පහර දී අපගේ හිසේ කසළ දමා දන්ගෙය අවුල් කළහ. භික්ෂූන් වහන්සේලා බුදුන්වෙත ගොස් මේ කරුණ දැනුම් දුන්හ. බුදුහු මහණෙනි, මම බොහෝ කථාකොට අන්අය පෙළන්නන් පඬිවරුන් යයි නො පවසමියි. මේ ගාථාව දෙසුහ.

වැඩිපුර කථාවෙන්
පණ්ඩිතයෙක් නොවේමැයි
වයිර නැති - බිය නැති
අනුන්හට උවදුරු නැති
අනුන් ගුණ සලකන
අයම පණ්ඩිතයෝම වෙත්මැයි.

එහි **යාවතා** - යනු උත්සාහයෙන් යම්කරුණක් සංසයා මැද ආදී තන්හි බොහෝ කොට කථා කරයි ද? එයින් ඔහු පණ්ඩිතයෙක් නම් නොවේ. යම් කෙනෙක් **බෙම්** ඉවසන පස් ආකාර වෛරයෙන් තොරව **අවෙරි** නිර්භයව පැමිණි මහජනයාවෙතට බියක් ඇති නොකරයි ද ඔහු පඬිවරයා ම වේ යන අරුතයි.

මේ දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

ජබ්බග්ගිය භික්ෂූන් පිළිබඳ කථා පුවතයි.

19-3

"නනාවතා" යන මේ ධර්මදේශනය බුදුහු දෙව්රම වැඩ සිටියදී ඒකුදාන නම් රහත් තෙරනමක් නිමිති කරගෙන දේශනා කළහ.

උන්වහන්සේ හුදකලාවම එක වන රොදක එකම උදානයක් ප්‍රගුණ කරමින් වැඩ වාසය කරයි.

අධි චේතනා ඇති ප්‍රමාදනොවන මෞණ පථයේ හික්මුණ මුණිවරයා ශෝක නොකරයි. උපශාන්තවූ සදා සිහි ඇති එබඳු තැනැත්තා මනා සිහියෙන් යුතුව වසන ශාන්ත වූ සන්සුන් පැවතුම් ඇත්තෝ වෙති.

උන්වහන්සේ උපෝසථ දිනවල තමන්ම ධර්ම ශ්‍රවණයට සෝෂාකර මේ ගාථාව පවසති. පොළව පැලෙන ලෙසට දෙවියන්ගේ සාධුකාර ශබ්දය ඇතිවේ. අනතුරුව පෙහෙවස් දිනෙක පන්සිය බැගින් පිරිවර කොට ත්‍රිපිටකධාරී භික්ෂූන් දෙනමක්, උන්වහන්සේ වෙසෙන තැනට ගියාහුය. උන්වහන්සේ මේ පිරිස දුටුවිටම සතුටු සිත් ඇතිව මෙහි පැමිණීමෙන් ඔබ වහන්සේලා යහපතක්ම කළාහුයයි පැවසුහ. අපි අද ඔබ වහන්සේලාගේ ධර්මදේශනය අසමුයි කීවෝය. ස්වාමීනි මෙහි බණ අසන අය නැත. ස්වාමීනි මේ වන ලැහැබ බණ අසන දිනයේදී දෙවියන්ගේ සාධුකාර ශබ්දයෙන් එකකින් නාදවේ. ත්‍රිපිටකධාරී භික්ෂූන් දෙනම අතරින් එක් ත්‍රිපිටකධර භික්ෂුවක් ධර්ම දේශනා කිරීම සඳහා ධර්ම සෝෂාව කළහ. එක් භික්ෂුවක් පාලිපාඨ පැවසුහ. එක් දෙවියෙක් හෝ සාධු කාර නොදුන්නේය.

එවිට එම භික්ෂූන් - ඇවැත්නි ඔබ වහන්සේ ධර්මදේශනා දිනයේදී මේ වන ලැහැබ මහත් හඬින් සාධුකාර දෙති. මේ කුමක්දැයි පවසන්නැයි කිවාහුය. ස්වාමීනි අනෙක් දිනවලදී සාධුකාර දීමෙන් එකට සෝෂාවක් පවතී. අද නම් මේ කුමක් විදැයි මම නො දනිමි. ඇවැත්නි එසේනම් ඔබ පළමුව ධර්මය දෙසනු මැනව. උන්වහන්සේ විජිනි පත ගෙන අසුනේ හිඳ වෙනදා කියන ගාථාවම පැවසුවේය. දෙව්වරු මහත් හඬින් සාධුකාර දුන්හ. ඉක්බිති ඒ පරිවාර භික්ෂුහු හඬනැගුහ. මේ වන ලැහැබේ දෙවියෝ මුහුණ බලා භික්ෂාව

දෙන්නාක් වැන්න. ත්‍රිපිටක ධාරී භික්ෂූන් මෙපමණ දේශනා කරද්දීත් කිසි හඬක්. සාධුකාරයක් හෝ නොකියා මේ මහළු තෙරුන් විසින් එකම ගාථාවක් පැවසුවිට මහාහඬින් සාධුකාර දෙති.

ඔවුහු විහාරායට ගොස් බුදුන්ට මේ කරුණ දැන්වුහ. මහණෙනි මම බොහෝ කොට කියන හෝ බොහෝ කොට ඉගෙන ගන්නා අය මම ධර්ම ධරයයි නොකියමි. යම් කෙනෙක් එකම ගාථාවක් හෝ ඉගෙන සත්‍ය අවබෝධකර ගනිද මේ තැනැත්තා ධර්මධර යයි මම කියමි මේ ලෙස පවසා මෙම ගාථාව දෙසුහ.

ටිකක් පවසන්නේ
සිව්සස් මැනව දන්නේ
බොහෝ නො කියන්නේ
ඔහුම දම්දර තෙරහු වන්නේ

බොහෝ කොට කියන්නේද එයින්ම ධර්මධර යෙක් නොවේ. යම් කෙනෙක් ස්වල්පවූ දෙයක් අසා සිව්සස් දකිද එසේ ප්‍රමාදනොවන තැනැත්තා ඒ කාන්තයෙන් ධර්ම ධරයෙක් වන්නේය.

තඤ්ච යාවතානි - එහි යම් පමණකින් ඉගෙනීම දැරීම වාචනා ආදී කිරීමෙන් **බහු භාසති නාවතා ධම්මධරෝ න** ඔහු වංශය රකින්නෙක් ප්‍රවේණිය රකින්නෙක් නම් වේ. යොච **අප්පම්පි** - යම් කෙනෙක් ස්වල්පයක් හෝ අසා ධර්මය දැන - අර්ථය දැන ධර්මය අනුව පිළිපදින්නෙක් වී නාම කායයේ දුක් ආදිය දන්නේ චතුරාර්ය සත්‍යය දක්නේද **සවෙ ධම්ම ධරෝ** - ඔහුම ධර්මධර නම් වේ. **යොධම්මං නප්පමජ්ජති** පටන්ගත් වීර්ය ඇතිව ප්‍රතිවේධය අදයි අදයි අපේක්ෂා කරන්නා. ධර්මයෙහි ප්‍රමාද නොවේ. මේ තැනැත්තාද ධර්ම ධර වේ. යන අර්ථයි

දේශනය අවසානයේ බොහෝ දෙන සෝවාන් ආදි මාර්ග ඵලයන්ට පැමිණියහ.

තුන්වැනි වූ ඒකුදාන තෙරුන්ගේ කථා දුවතයි.

19-4

"නතෙන ථෙරො හොති" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩසිටියදී ලකුණ්ඨක භද්දිය තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

එක් දිනක් එම තෙරුන් බුදුන්ට උවටැන් කර ආපසු එන අතරදී තිහක් පමණ ආරණ්‍යක භික්ෂූන් වහන්සේ දකිමින්ම අවුත් බුදුන් වැඳ වාඩිවුහ. බුදුහු උන්වහන්සේලාගේ රහත් වීමේ හේතු සම්පත් දැක. මේ ප්‍රශ්නය ඇසුහ. මෙයින් පිටත්ව ගිය තෙරුන් වහන්සේ දක්කෝද? නොදැක්කෙමු ස්වාමීනි. කවරෙක්වත් නොදුටුවේද? එක් සාමණෙර නමක් දුටුවෙමු. මහණෙනි ඔහු සාමණේරයෙක් නොවේ. ඔහු ථෙරනමක්මය. ස්වාමීනි ඉතා කුඩාය. මහණෙනි මම මහළු වීම් පමණකින්, ථේර ආසනයේ වැඩිවී සිටීම නිසාම ථේරයයි. නොකියමි. යමෙක් සත්‍යය අවබෝධ කරගෙන මහජනයාට අහිංසක භාවයේ සිටි තැනැත්තා මේ තෙරුන් යයි පවසා මේ ගාථාව දෙසුහ.

කෙස්ටික ඉඳුනු පමණින් මහ තෙර නොවනු
අවිහිංසාව, තිරබව - ඉඳුරන් දමුනු
සිව්සස් දමින් සංයමයෙන් සිත පිරුණු
උතුමානෝම "තෙර" නාමෙන් පිළි ගැණුනු

කෙස් පැසුනපමණින් තෙරනමක් නොවේ. මුහුකුරා ගිය වයස් ඇති. අඥාන මහල්ලායි කියනු ලැබේ.යමෙක් කෙරෙහි සත්‍යයද චතුරාර්ය ධර්මයද අවිහිංසාවද සඤ්ඤමහා දමනය වේද වමාරා දැමූ කෙලෙස් ඇති ප්‍රාඥයා තෙරුන් යයි කියැවේ.

එහි **පරිපක්ක** - නම් දිරාගිය වෘද්ධභාවයට පත්වූ යන අරුතයි. **මොඝජිණ්ණ** නම් ඇතුලත ථෙරකාරී ධර්මයන් නොමැති හෙයින් හිස්වූ වෘද්ධයෙක්. පමණි **යමහි සච්චඤ්ච ධම්මෝ** යයි පුද්ගලයන් කෙරෙහි සොළොස්

ආකාරයෙන් අවබෝධ කරයක් නවවිධ ලෝකෝත්තර ධර්මය ඇති ද. **අහිංසාති**. හිංසා නොකරණ ස්වභාවයයි. දේශනා මාත්‍රය පමණි. යම් කෙනෙක් කෙරෙහි චතුර්විධ නුවණින් අවබෝධකරගත් **අප්ප** මඤ්ඤා භාවනා ඇති. යන අර්ථයි. **සඤ්ඤමෝ** දැමුණු - යනු සීලයෙහි මෙන්ම ඉන්ද්‍රිය සංවරය අදහස් කෙරෙයි. **වනතමල** නම් මාර්ග ඤාණයෙන් ඉවත් කළ කෙළෙස් ඇති යන්නයි. **ධීර** - නම් ධෛර්ය සම්පන්න බවයි. **ථෙරෝ** - ඔහු මේ තුරුණු ස්ථිරභාව කරනයෙන් යුක්ත හෙයින් "ථේර" නමින් හැඳින්වේ යන අර්ථයි. දෙසුම අවසන ඒ භික්ෂුහු රහත්වූහ.

ලකුණ්ටක භද්දිය තෙරුන්ගේ කතා පුවතයි.

19-5

"න වාක්කරණ මත්තෙන" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී බොහෝ භික්ෂූන් අමතා දේශනාකළහ.

එක් අවස්ථාවකදී ළමයින් හා සාමණේරවරුන් තමන්ගේ ධම්මචාරීන් සමග සිවුරු පඬුපෙවීම් ආදී වතාවත් කරන්නන් දැක, සමහර තෙරවරු මෙසේ සිතුවාහුය. අපි අකුරු කිරීමේ දක්ෂයය වෙමු. අපට කිසිවක් නැත. යම්හෙයකින් අපි බුදුන් වෙත එළඹ මෙසේ කියමු.

ස්වාමීනි අපි අකුරු කිරීමේ දක්ෂ අය වෙමු. අන් අය සමීපයේ ධර්මය උගන්නා තෙරණුන් (අප) ලඟම පිරිසිදු නොකර සජඣායනා නොකරවී යයි දහර සාමණේර වරුන්ට අණ කරණු මැනවි. එනිසා අපට ලාභ සත්කාර වැඩෙන්නේය. ඔවුහු බුදුන් වෙත එළඹ එලෙස කීවාහුය. බුදුහු ඔවුන්ගේ වචනය අසා මේ සසුනේ ප්‍රවේණි වශයෙන්ම මෙසේ කීමට ලැබේ. මොවුන් ලාභසත්කාර ඇසුරු කළේයයි දැන මම තොප කථාකිරීම් පමණකින් යහපත් යයි නො කියමි. යම් අයුරකින් ඔබලාගේ ඊර්ෂ්‍යාව ආදි ධර්ම රහත් මගින් විනාශ කලේ ද එයම වඩාත් යහපත් වේ යයි පවසා මේ ගාථාව දේශනා කළසේක.

නළුවන මිහිරි තෙපුලෙන් ගත් නමුදු	සිත
රන්වන් පාට නිබුනත් හැඩ වැඩුනු	ගත
කෙලෙසින් පිරුණු සිත හා නිසි නුවණ	නැත
මේ බුදු සසුනෙ ඔහු යහපත් නොවනු	ඇත.

මිහිරි තෙපුල් ඇති පමණින්. සිරුරේ පැහැය දකුම් කළු වූ පමණින්, අනුන්ගේ යහපත නොඉවසන ඊර්ෂා කර පුද්ගලයා යහපත් නොවේ. යමෙකුගේ මේ ඊර්ෂ්‍යාව සපුරා සිඳින ලද නම්, කෙලෙස් දුරු කරණ ලදනම් නුවණැති ඔහුම යහපත් වේ.,

එහි වාක්කරණ නම් වචන කීම පමණින් ලස්සන සම්පන්න වචන පමණි.

වණණ පොක්ඛරතාය. - ශරීරවර්ණයේ සිත්කළු බැවින් හෝ **නරෝ** යනු මෙපමණකින්ම අන් අයගේ ලාභ ආදිය කෙරෙහි ඊර්ෂ්‍යා කරමින් පස් ආකාර මසුරු බැවින් යුතුවූ කෙරාටික පක්‍ෂය භජනය කිරීමෙන් කපටි වූ මිනිසා යහපත් නොවේ ම ය. **යස්ස චෙතනත්‍ති** - යනු යම් පුද්ගලයෙකුට ඊර්ෂ්‍යා ආදී දෝස අර්හත් මාර්ග ඤාණයෙන් මුලින්ම සිඳ දමා බැහැර කළ දෝස ඇත්තේ ද ධර්ම නුවණින් යුතු වූයේ ද ඔහු **ම සාධුරූප** යයි කියනු ලැබේ යන අර්ථයි.

දේශනය අවසානයේ දී බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

බොහෝ භික්‍ෂූන් පිළිබඳ කථා පුවතයි.

19-6

"න මුණ්ඩකෙන සමණෝ" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩ සිටියදී හත්ථක (නම් භික්ෂුවක්) නිමිත්තකර ගෙන දේශනා කළහ.

ඔහු වනාහි වාදයට නැඹුරුවූ සිතැත්තේ "තෙපි අසවල් වේලාවේදී අසවල් තැනට පැමිණෙව්. වාද කරන්නෙමුයි"කියා ඔවුන් එන්නට පළමුවෙන්ම එතැනට ගොස් බලයි. "තීර්තකයෝ මට බියෙන් නො පැමිණියෝය" ඔවුන්ට පරාජය වේයයි මේ ආදිය කියා වාදයට එළඹෙමින් තැන තැන හැසිරෙමින් සිටියි.

ශාස්තෘන් වහන්සේ "හත්ථක" මෙසේ කරන්නේයයි අසා ඔහුව කැඳවා ඇත්තද ඔබ මෙ ලෙස ක්‍රියාකරන බව ඇත්තක් දැයි විමසුහ. ඔහු එය ඇත්තකැයි පිළිගත් විට ඇයි ඔබ එලෙස කරන්නේ, මෙබඳු බොරු කරන්නෝ හිස මුඩුකිරීම් ආදියෙන් පමණක් ශ්‍රමණයෙක් නොවේ. යම් කෙනෙක් ලොකු හෝ කුඩා පව් නොකොට සිටියේ ශ්‍රමණ නම් වේයයි පවසා මේගාථාව පැවසුහ.

වත් ගුණ නොමැති ලාබයටම කියන	බොරු
ආසාවෙන් වැඩී යසිසුරු සොයන	සරු
හිස මුඩුකොට පමණකින් කහ සිවුරු	දැරූ
මහණෙකු නොවේ ඔහු මේ බුදු සසුනෙ	ගරු

හිස මුඩුකිරීම් පමණකින් මහණෙක් නොවේ. ධුත ගුණයක් නැති බොරු කියන ආශාවෙන් හා ලෝභයෙන් යුත් තැනැත්තා කෙසේ නම් මහණෙක් වන්නේද? යම් භික්ෂුවක් කුඩාවුද මහත්වුද පව්කම් සම්පූර්ණ යෙන්ම සන්සිඳුවාද පව් සංසිඳවූ හෙයින්ම ඔහු ශ්‍රමණ යයි කියනු ලැබේ.

එහි **මුණ්ඩකෙන** - යනු හිස මුඩු කළ පමණින් නම් හිස මුඩුකිරීමයි. **අබ්‍රහ්මා** නම් සිල්වත් බවින්ද. ධුත දැරීමෙන්ද වෙන්වීමයි. **අලිකං** බොරු

කියන්නාවූ, නො පැමිණි අරමුණු කෙරෙහි ආශාවෙන් පෙළුණු තැනැත්තාද ශ්‍රමණයෙක් නොවේ. **සමෙති** යනු යමෙක් ස්වල්පවූහෝ මහත්වූහෝ පව් සංසිඳවයිද ඔහු එසේ සංසිඳවීම නිසා ශ්‍රමණ යයි කියනු ලැබේ.

දේශනය අවසනයේ බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පත්වූහ.

හත්ථක භික්ෂුව පිළිබඳ කථා පුවතයි.

19-7

"න තෙන භික්ඛු හොති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩි සිටියදී එක්තරා බමුණෙක් නිමිත්තිකරගෙන දේශනා කළහ.

ඔහු වනාහි බැහැර ආගමක පැවිදිවී භික්ෂාවෙහි හැසිරෙන්නේ මෙලෙස සිතුවේය. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයන් භික්ෂාවෙ හැසිරෙන හෙයින් භික්ෂුයයි කියන්න වටී. ඒ අනුව මට ද භික්ෂුව කියා ඇමතීම වටනේය. හේ ශාස්තෘන් වහන්සේ වෙත එළඹ භාග්‍යවත් ගෞතමයන් වහන්ස, මම ද භික්ෂාව උදෙසා හැසිරෙන හෙයින් අපට ද භික්ෂු වශයෙන් අමතන්නැයි පැවසුවේය. බ්‍රාහ්මණය මම - පිඬුසිගායාම පමණකින් භික්ෂුවක් වශයෙන් නො හඳුන්වමි. මෙහි යම් ධර්මයක් සමාදන්ව පවතින තැනැත්තා භික්ෂුවක් නම් වේ. යම්කෙනෙක් සියලු සංස්කාරයන්හි සැක සහිතව හැසිරේද ඔහු භික්ෂුවයයි පවසා මේ ගාථාව පැවසුහ.

සියලු පව් අත්හැර
අහිංසා පෙරදැරිවම
සන්සිඳුනු සිත ඇති
අයම මහණෙක් නමැයි පවසති

යම් කෙනෙක් අන් අයගෙන් පිඬුසිඟා යන්නේද එපමණකින් භික්ෂු නම් නොවේ. විෂම වූ පාප ධර්මය අදහා ගෙන කාය කර්මාදිය සමාදන්වී වසන තැනැත්තා භික්ෂු නොවේ. මේ සසුනෙහි යමෙක් කුසල් අකුසල් දෙක බැහැර කොට බඹසරින් යුක්ත වේද ලෝකයෙහි නුවණින් හැසිරේද? ඒකාන්තයෙන් ඔහු භික්ෂුයයි කියමි.

එහි **යාචනා** යනු යම් පමණකින් **පරෙහිඤ්ඤතෙ** ඒ පිඬු සිඟා යාම් පමණකින් භික්ෂු නම් නොවේ. **විසඃ** යනු විෂම ධර්මය විෂම ගන්ධය හෝ කාය කර්මාදී ධර්ම සමාදන්වී හැසිරෙන්නේ භික්ෂුනම් නොවේ. **යොධාති** යනු යමෙක් මේ

ශාසනයේ **පුඤ්ඤං පාපංච**, පින් පවු දෙකම බැහැරකොට මග්ග බ්‍රහ්මචරියෙන මාර්ග බ්‍රහ්ම චරියාවෙන් බ්‍රහ්මචාරී වේද සඞ්ඛ්‍යාත නුවණින් - **ලොකෙනි** - ස්කන්ධාදිලොව මේ ආධ්‍යාත්මික ස්කන්ධයි මේ බාහිර ස්කන්ධයි යනුවෙන් මෙලෙස සියළු ධර්ම දැන හැසිරේ ද ඔහු මෙකී නුවණින් කෙලෙස් බිඳුන හෙයින් භික්ෂු යනුවෙන් හැඳින්වේ. යනු අර්ථයි.

දේශනය අවසන බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණුනහ.

එක්තරා බ්‍රාහ්මණයකු පිළිබඳ කථා පුවතයි.

19-8

" න මොනෙන" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ සිටියදී තීර්ථකයන් අරමුණු කරගෙන දේශනා කළහ. ඔවුහු වනාහි අනුභව කළ ස්ථානයේදී මිනිසුන්ට ක්ෂෙම වේවා. සුවය, සැපතවේවා. ආයු වැඩේවා අසවල් තැන මඩ ඇත. අසවල් තැන කටු ඇත. මෙබඳු තැන්වලට නොයන්නැයි මේ ආදි ක්‍රමයෙන් මංගල කරුණු කියාදී පිටත් වෙති. භික්ෂූන් වහන්සේ පඨම බෝධියේ දී අනුමෝදනා ආදි අනුමත නොවූ කාලයේ වැළඳූ තැන මිනිසුන්ට අනුමෝදනා නොකොට පිටත්ව යති. මිනිස්සු අපි තීර්ථකයන් ලඟ මංගල කරුණු අසමු ස්වාමීන් වහන්සේලා නිහඬවම පිටවී යතියි. උද්ඝෝෂණ කළහ. භික්ෂූන් වහන්සේලා මේ කරුණ ශාස්තෘන් වහන්සේට දැනුම් දුන්හ. බුදුරජාණන් වහන්සේ මහණෙනි මෙයින් පසු දන්වැළඳූ ස්ථාන ආදියේදී පහසුසේ අනුමෝදනා කරව්. උපනිසින්නක කථා ධර්මකථා කරන්නැයි අනුමත කළහ. ඔවුහු එසේ කළාහුය. මිනිස්සු අනුමෝදනා ආදිය අසමින් උනන්දු වී භික්ෂූන්ට ආරාධනා කර සත්කාර කරමින් හැසිරෙති. තීර්ථකයෝ අපි මුනි වරුන්ගේ මොනෙය්‍ය බව නිහඬ බව රකිමු. ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ දානශාලාවල මහා කථා පවත්වතියි ඝෝෂා කළහ. බුදුහු මේ කරුණ අසා මහණෙනි ම නිහඬ වීම පමණකින් මුනිවරයා යයි නො කියමි. ඇතැම් කෙනෙක් නොදන්නා නිසා කථානොකරති. ඇතැම් කෙනෙක් විශාරද නොවන නිසා කථානොකරති. ඇතැම් අය තමන් දන්නා දෙය අනෙක් අය දැන ගනිතියි මසුරු කම නිසා කථා නොකරති. එනිසා මෞණ මාත්‍රයෙන් මුනි නොවේ. පව් දුරලීම නිසාම මුනි නම් වේයයි පවසා මේ ගාථාව දේශනා කළහ.

අනුවණකම නිසා
වැඩිපුර කිසිත් නොදෙසා
"මුනිවන්" රැකි නිසා
මුනී වන්නේද ඔහු කෙලෙසා

සිතින් අකුසල පන්නා
උතුම් දේමම ගන්නා
දෙලොව ගුණ දන්නා
උතුමාම "මුනී" වන්නා

මෝඩ ගති ඇති අනුවණයා නිහඬව සිටි පමණින් මුනිවරයෙක් නොවේ. නුවණැති වූ යමෙක් තරාදියක් ගෙන සිටියෙකු ලෙස උතුම් ගුණය ගෙන, පව් දුරුකරයි ද හේ මුනි නම් වේ. ඒ හේතුවෙන් මුනිවරයෙක් වේ. ආධ්‍යාත්මික වූත් බාහිරවූත් ආයතන සංඛ්‍යාත දෙලොව නුවණින් පිරිසිඳ දනීද ඒ හේතුවෙන් හෙතෙමේ මුනියයි කියනු ලැබේ.

එහි න මොනෙනාති - යනු පඤ්චකාමයන් තුනී කිරීම සඳහා දෙදිනක් එක් වනයක එක් ගමක එක් ගසක් යට නොසිට ක්‍රමයෙන් ඉදිරියට යන යෝගාවචරයාගේ ප්‍රතිපත්ති සංඛ්‍යාත වූ මාර්ග ඤාණයම මොනෙය්‍ය නොහොත් මුනි නම් වේ. මෙහි වනාහි නිශ්ශබ්දතාවය සඳහාම මොනෙන යන්න කියන ලදී. 1

මුළා රූපොති - හරය නැති. **අවිඤ්ඤු** යනු අවිඤ්ඤූ නොදනීම නිසා මෙබඳු වූ තුෂ්ණීම්භූත භාවයෙන් මුනිනම් නොවේ. අනතුරුව නිහඬ බැවින් මුනි නම් නොවේ. හිස් බව හරයක් නැති බවම අවිඤ්ඤු යන්නෙන් අදහස් කෙරේ. යන අර්ථයි. **යොචතුලංව පගඤ්ඤා** යම්සේ තරාදියක් ගෙන සිටියේ අතිරේක දෙයක් අත්හැර ඌණ වූ දෙයක් පුරවන්නා සේ අතිරේක දූ බැහැර කරන්නා සේ පාපය අත් හරිති. දුරුකරයි. අඩුදේ පුරන්නා සේ කුශලය පුරවයි. මෙසේ කරන්නේ සීල - සමාධි - **පඤ්ඤා** විමුක්ති - විමුක්ති ඤාණ දර්ශන සංඛ්‍යාත **වරං** - උත්තම යන අරුනයි. ආදාය පාපානි - අකුසල කර්මයි. **පරිවජ්ජෙති ස මුනීති** අත්හරින එතුමා මුනිවරයා යන අර්ථය දේ. **යෝ මුනාති උභොලොකෙ** යම් පුද්ගලයෙක් මේ **ස්ඛන්ධ** ධාතු ආයතන ඇතිලොව තරාදියට දමා මනින්නා සේ මේ ආධ්‍යාත්මික ස්ඛන්ධයි. මේ

---

1. මොනෙය්‍ය ප්‍රතිපදාව - සුත්‍රනිපාතයේ නාලක සුත්‍රයෙහි දේශිත ප්‍රතිපදාවයි.

286

බාහිර ස්ඛන්ධයි යනුවෙන් මේ දෙවැදෑරුම් අර්ථයෙන් මුනි නම් වේ. මේ කරුණෙන් මුනි නම් වේ. යන අරුතයි. දෙසුම අවසන බොහෝදෙන සෝවාන් ආදි ඵලයන්ට පැමිණියහ.

තීර්ථකයන්ගේ කථා පුවතයි.

19-9

"නතෙන අරියො හොති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩසිටියදී එක් "අරිය" මාළු බිලී බාන්නෙකු මුල්කරගෙන දේශනා කළ සේක.

එක් දිනක් තථාගතයන් වහන්සේ ඔහුගේ සෝවාන් ඵලයට පත්වීමේ හේතු සම්පත් දැක සැවැත් නුවර උතුරු වාසල ගම්දොර පිඬු පිණිස හැසිරී භික්ෂු සංඝයා පිරිවරා වැඩම කළහ. එකෙණෙහි මේ මාළු බිලිබාන්නා බිලී කොක්කෙන් මාළු ගන්නේ බුද්ධ ප්‍රමුඛ භික්ෂුසංඝයා දැක බිලිපිත්ත විසිකොට සිටියේය. බුදුහු ඔහුගේ නොදුරේ සිට ඔබේ නම කුමක්දැයි සැරියුත් තෙරුන් ආදීන්ගෙන් නම් විමසුහ. උන්වහන්සේලා ද මම සැරියුත් මම මුගලන් යනුවෙන් තම තමන්ගේ නම් පැවසුහ. බිලිබාන්නා මෙසේ සිතුවේය. බුදුහු සියල්ලන්ගේ නම් විමසති මගේ නමද අසනු ඇතැයි සිතමි බුදුහු ඔහුගේ අදහස දැන ගෙන උපාසක ඔබගේ නම කුමක්දයි විමසුහ. ස්වාමීනි මගේ නම "අරිය"යි. පැවසුවිට උපාසකය ඔබ වැනි ප්‍රාණඝාත කරණ අය අරියනම් නොවෙති. අරියෝ නම් මහජනයාට අවිහිංසක භාවයේ සිටියෝ යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

දස අකුසල් කරන - පුඟුලා අරි නොවේමැයි
අහිංසාවෙන් යුතු - පුඟුලාම අරිය වන්නේ

ප්‍රාණීන්ට හිංසා පමුණුවන අය ආර්ය නොවෙති සියළු ප්‍රාණීන්ට හිංසා පීඩා නොකරන්නා අරිය නමින් හැඳින් වෙයි.

එහි අහිංසා - යනු හිංසා නොකිරීමෙන් - මෙසේ හැඳින්වේ. යම් කෙනෙකු විසින් සියළු ප්‍රාණීන්ට හිංසා කෙරේද ඉන් ආරිය නම් නොවේ. යම් කෙනෙක් සියළු ප්‍රාණීන්ට අත් ආදියෙන් හිංසා පීඩා නොකර මෛත්‍රී ආදී භාවනා වෙන් පිහිටීම නිසා හිංසා වෙන් වෙන්වී සිටීම නිසාම මෙතෙමේ අරිය නම් වේ. යයි දත යුතු යන අර්ථයි. දේශනය කෙලවර බිලිබාන්නා සෝවාන් ඵලයේ පිහිටියේය. පැමිණි අයට දෙසුම සාර්ථක විය.

බිලී බාන්නා ප්‍රළිබඳ කථා පුවතයි.

19-10

" න සීලබ්බත මත්තෙනා " යන මෙම ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව් රම් වෙහෙර වැඩ සිටියදී බොහෝ සීලාදී ධර්මයන්ගෙන් යුත් භික්ෂූන් නිමිති කරගෙන දේශනා කළසේක.

මෙම භික්ෂූන් අතර ඇතැම් අයට මෙබඳු සිත් ඇති විය. අපි සීල සම්පන්නවෙමු. අපි ධුතාංගධාරීහු වෙමු. අපි බහුශ්‍රැත වෙමු. අපි පන්ත සේනාසන වාසී වෙමු. අපි ධ්‍යාන අභිඥාලාභී අය වෙමු. අපි අර්හත්වය දුර්ලභ නොවෙමු. කැමති දිනෙක රහත් බවට පත්වන්නෙමු. අනාගාමීව සිටිය භික්ෂූන් දැන් අපට අර්හත්වය දුර්ලභ නොවේ. යනුවෙනි.

මේ සියල්ලෝම එක් දිනක් බුදුන්වෙත පැමිණ වැඳ එකත්පසෙක සිටියදී මහණෙනි ඔබ හැම පැවිදි කාර්යයන් ඉටුකර ගත්තා නොවේදැයි බුදුන් විසින් විමසන ලද්දේ, මෙසේ කීවාහුය. ස්වාමීනි අපි මෙබඳු වෙමු මෙබඳුවෙමු. එනිසා අපි කැමති කැමති ක්ෂණයක අර්හත්වයට පැමිණීමට සමර්ථ වෙමුයි සිතා වාසය කරමු. බුදුහු ඔවුන්ගේ වචන අසා මහණෙනි. ! භික්ෂුවක් විසින් නම් පිරිසිදු සිල් ඇති පමණින්ම හෝ, අනාගාමී සුවයට පත්ව සිටීමේ පමණකින්ම භව දුක ස්වල්පයයි දැකීම සුදුසුනොවේ. නොවටී ආශ්‍රවයන් ක්ෂය කිරීමට නොපැමිණ සුවපත් වූ වෙමුයි සිත් ඇතිකර ගත යුතු නොවේ යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

අරහන් මගින් මයි
සසර කෙළවර වන්නේ
ඉන් මෙහා නැවතී
කෙලෙසද සතුටු වන්නේ

සිල්, වත් පිරිම් පමණකින් ඇසු පිරුනැන් ඇතිපමණකින් එසේම සමාධි ලාභයෙන්, විවේක සෙනසුන් හි විසීමෙන් හෝ ආර්යයන් විසින් නෛෂ්ක්‍රම්‍ය සුඛය ස්පර්ශ කරමියි, නොසිතිය යුතුය. භික්ෂුව කෙලෙස් කෙළවර

නොකර, විශ්වාසයට පත්විය යුතු නොවේ. එහි - **සීලබ්බත මත්තෙනානි** - චතුපාරිශුද්ධි සිල් ඇති බැවින්ම හෝ ධුතාංග ඇති බැවින් හෝ බාහු **සච්චෙනවා** ත්‍රිපිටකයට උගත් බැවින් හෝ, **සමාධිලාභෙන** යනු අෂ්ට සමාපත්ති ලාභය නිසා හෝ **නෙකඛම්ම සුඛන්ති** යනු අනාගාමී සුඛය නිසා හෝ **අපුථුජ්ජන සෙවිතං** පුහුදුන් ජනයා විසින් නොසෙවුනා ලද ආර්යයන් සේවනය කළ පමණින් **විස්සා සමාපජ්ජි** - විශ්වාසයට පත් වන්නේද මෙය කියන ලදි. භික්ෂුවක් නම් මේ සිල සම්පන්න බැවින්ම මගේ භවය ස්වල්පයයි ආසවක්ඛය සංඛ්‍යාත රහත්බවට නොපත්ව විශ්වාසයට නොයා යුතුය. යම්සේ ඉතා ස්වල්ප වුවද අශුචි දුගඳය - මෙලෙස අල්පමාත්‍රවුද භවය දුකකි.

දේශනාවසානයේ එම භික්ෂුහු රහත් ඵලයට පත්වුහ. පැමිණි අයට ද දේශනය සාර්ථක විය.

බොහෝ භික්ෂූන් පිළිබඳ කථා පුවතයි.

ධම්මට්ඨ වර්ග වර්ණනය නිමාවිය.

දහනවවෙනි වර්ගයයි.

20-1

"මග්ගානට්ඨඞ්ගිකොනි " යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වෙහෙර වැඩ සිටියදී පන්සියයක් භික්ෂූන් නිමිති කරගෙන දේශනා කළහ.

මේ භික්ෂූන් වහන්සේලා බුදුන් ජනපදචාරිකාවේ යෙදී නැවත සැවතට පැමිණිවිට උපට්ඨාන සාලාවේ වාඩිවී අසවල් ගමේ මාර්ග සමය අසවල් ගමේ මාර්ග විසමය කැටගල් වලින් යුක්තවෙයි. ගල්සහිත නොවේ. මේ ආදී වශයෙන් තමන් ගමන් කළ මාර්ගය පිළිබඳව මාර්ග විස්තර කථා කරමින් සිටියහ.

බුදුහු ඔවුන්ගේ අර්හත්වයට හේතු සම්පත් දැක එතැනට වැඩමකොට පනවන ලද අසුනේ වැඩසිට මම ඒමට පෙර කිනම් කථාවකින් යුතුව සිටියේදැයි විමසා මේ කථාවෙන් යුතුවයයි පැවසුවිට මහණෙනි මේ බාහිර මාර්ගයි. භික්ෂූන් විසින් නම් ආර්ය මාර්ගය පිළිබඳව කටයුතු කිරීම වටී. මෙසේ කිරීමෙන් සියළු දුකින් මිදේයයි පවසා මේ ගාථා පැවසුහ.

මාර්ගයන් අතුරින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය ශ්‍රේෂ්ඨය සත්‍යයන් අතර චතුරාර්ය සත්‍යය ශ්‍රේෂ්ඨවේ. ධර්මයන් අතර විරාගය නිවන ශ්‍රේෂ්ඨය. මිනිසුන් අතර බුදුන් ශ්‍රේෂ්ඨය. (පසැස් නිසා)

නිවන් දැකීම පිණිස මෙයම මගයි අනෙක් මාර්ගයක් නැත. තෙපි මේ මාර්ගයේ පිළිපදිව් මෙය මාරයා මුලාකරණ මාර්ගයයි.

මේ මාර්ගයේ පිළිපන්නාවූ තෙපි දුක් කෙලවර කරන්නාහුය. මවිසින් රාගාදි උල් උපුටාදමන ආර්ය මාර්ගය දැන ඒකාන්තයෙන් ප්‍රකාශ කරණ ලදී.

තොප විසින් කෙළෙසුන් තවන වීර්යය කටයුතුය. තථාගතවරු නිවන් මග ප්‍රකාශ කරන්නෝය. නිවන් මගට පිළිපන් ධ්‍යාන වඩන නැනැත්තෝ මාර බැම්මෙන් මනාකොට මිදෙත්.

එහි **මග්ගානටයඞ්ගිකො** - යනු අඩිපාරවල් හෝ මහාමාර්ග හෝ දෙසැටක් මිථ්‍යා දෘෂ්ටි හෝ යන ඒ සියළු මාර්ග (නිවනට මං නොවේ) **සම්මාදිට්ඨි** ආදී අංග අටකින් මිථ්‍යා දෘෂ්ටි ආදී අංග අට **ප්‍රහාණය** කරන්නේ නිරෝධ අරමුණු කොට චතුරාර්ය සත්‍යයන්හි දුක්ඛාදිය පිළිබඳව ශේෂයෙන් දන්නා නුවණින් ක්‍රියා ඇති කරන්නේ ආර්ය මාර්ගයම ශ්‍රේෂ්ඨය උතුම්ය. **සච්චානං චතුරො පදානි** - යනු **"සච්චං භණෙ"** න කුජ්ඣෙය්‍ය" අදියෙහි ආවාවූ වචී සත්‍යය වේවා, **"සච්චෙ ඨිතියො"** ආදි භේදයන්හි **සම්මුති** සත්‍යය හෝ, "ඉදමෙව සච්චං මොඝ මඤ්ඤං" ආදී තන්හි දිටඨි සත්‍ය "දුක්ඛං අරියසච්චං" ආදී තන්හි (දුක්ඛ ආර්ය සත්‍යය) පරමාර්ථ සත්‍යය හෝ සියල්ල දුනගතයුතු ප්‍රහාණය කළයුතු තැන වැඩියයුතු තැන එකලුවම අවබෝධ කර ගැනීමෙන්ද, යථාර්ථය අවබෝධ කර ගැනීම දුක්ඛ ආර්ය සත්‍යය වේ. මේ ආදී වශයෙන් සතර පද ශ්‍රේෂ්ඨ නම් වේ. **විරාගො සෙට්ඨො ධම්මානං** යනු යම් හෙයකින් මහණෙනි සංඛත හෝ අසංඛත හෝ විරාග ධර්ම අග්‍රයයි ගැනේ. සියළු ධර්මයන් අතර අග්‍රවේ. **දවිපදානං චක්ඛුමා** සියළු දෙවි මිනිසුන් අතර දෙපා ඇත්තවුන් අතර **පස්** ඇස් ඇති බුදුරජාණන් වහන්සේම ශ්‍රේෂ්ඨය, **දස්සනසස විසුද්ධියා** මාර්ග ඵල දර්ශන විසුද්ධිය යමෙක් ශ්‍රේෂ්ඨයයි මවිසින් කියන ලදද **එසොව** මගොහන ත්ථඤ්ඤදා මෙම මාර්ගයට වෙනත් දෙයක් නැත. එයමය, එහෙයින් තෙපි මෙයම **පටිපජ්ජථ පිළිපදිවි මාරසෙසතං පමොහනනනි** යනු මෙය මාර මෝහනය මාර **බන්ධනය** වේයයි කියන ලදී. **දුක්ඛසසනත** යනු සියළුම සසර දුකට අවසානය කරන්නේයයි යන අර්ථයි. **අඤ්ඤාය සල්ලසසථනං** යනු රාගාදී උල් නැසීමට ආයුධයයි. **අබ්බුහනං** මේ මාර්ගය මවිසින් හැර (වෙනත් අයකු විසින් නොදන්නා ලදී) අනුසය වාදීන් විසින් ආත්ම ප්‍රත්‍යක්ෂයෙන් දැන මේ මාර්ගය කියන ලදී. දැන් **තුමෙහහි** තොප විසින් කෙලෙස් නැවීමේ වීර්යයෙන් **ආතපප** තමන් අධිගමය සඳහා සම්‍යක් ප්‍රධන් වීර්යය කාර්යය කරණීය කළයුතුය. **අක්ඛාතාරො තථාගතො** මේ නිසා තෙපි විසින් තථාගතයන් පවසන පරිදි පිළිපන් ධ්‍යාන දෙකෙන් ධ්‍යාන වඩන්නේ ඉන් තෙහුමික විට සංඛ්‍යාත මාරබන්ධනයෙන් මිදේ යන අර්ථයි.

දේශන අවසානයේ එම භික්ෂූන් රහත් බැව්හි පිහිටියාහුය. පැමිණි අයට ද දේශනය සාර්ථක විය.

පඤ්ච සත භික්ෂූන් පිළිබඳ කථා පුවත

20-2

"සබ්බෙ සංඛාරා" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදි පන්සියයක් භික්ෂූන් නිමිති කරගෙන දේශනා කළහ. ඔවුහු බුදුන් වෙතින් කර්මස්ථාන ලබාගෙන වනයේ උත්සාහ කරන්නේද රහත් බවට පත්නොවී විශේෂ වශයෙන් කර්මස්ථාන ගනිමුයි බුදුන් වෙතට පැමිණියානුය. බුදුහු මොවුන්ට කුමක් නම් සප්පාය වේ දැයි විමසන්නේ මෙම භික්ෂූන් කාශ්‍යප බුද්ධ කාලයේ දී අවුරුදු විසි දහසක් අනිත්‍ය ලක්ෂණයේ යෙදුනානුය. ඒ නිසා අනිත්‍ය ලක්ෂණයෙන්ම ඔවුන්ට එක් ගාථාවක් දේශනා කිරීම වටියයි සිතා මහණෙනි කාම භව ආදියේදී සියළු සංස්කාර අභාව වනහෙයින් අනිත්‍ය වේයයි පවසා මේ ගාථාව පැවසුහ.

සව් සකර අනිසය.
නුවනින් දකිය යුතුමය
සව් කෙළස් සිදිනට
මෙයම මහමග වේය නිවනට

සියළුම සංස්කාර අනිත්‍යයි. යම් දිනෙක නුවණින් දකී ද එනිසා දුක කෙරෙහි කලකිරේ මෙය විසුද්ධියට මාර්ගය වේ.

එහි **සබ්බෙ සඞ්ඛාරාති** - යනු සියළු සංස්කාර නම් කාම භව ආදියේ උපන් ස්කන්ධ ඒ ඒ තැන්හි නැති වන්නේ, **අනිච්චාති** යදා අනිත්‍ය යන විදර්ශනාව **පඤ්ඤාය පස්සති** - ප්‍රඥාවෙන් දකිද? ඒ නිසා මේ ස්කන්ධ පරිහරණයේ දී **දුක්ඛෙ නිබ්බින්දති** දුක් කළකිරී බිඳුනේ දුක් දැනගැනීම් වශයෙන් සත්‍යය අවබෝධ කර ගනී.**එස මග්ගො විසුද්ධියාති** යනු මේ මාර්ගය විසුද්ධිය පිණිසය. පිරිසිදු වීම පිණිසය යන අර්ථයි.

දේශනය අවසානයේ එම භික්ෂූහු රහත් වුහ. පැමිණ පිරිසට ද දේශනය සාර්ථක විය.

අනිත්‍ය ලක්ෂණ පිළිබඳ කථා පුවතයි.

20-3

දෙවැනි ගාථාවහිද පළමු වැන්න මෙනි. එදින බුදුරජාණන් වහන්සේ එම භික්ෂූන්ට දුකඛ ලක්ෂණ කථා සුදුසු බව දැන මහණෙනි සියළු ස්ඛන්ධ ප්‍රතිපීළන අර්ථයෙන් දුකසේ මැයි පවසා මෙම ගාථාව පැවසුහ.

සඛෙඛ සඞ්ඛාරා දුක්ඛාති -

සියළු සංස්කාර දුකක්යයි යම් දිනෙක ප්‍රඥාවෙන් බලයි ද එනිසා දුකෙහි කළකිරේ මෙය විසුද්ධි මාර්ගයයි.

එහි **දුක්ඛ නම්** ප්‍රතිපීළන අර්ථයෙන් දුකයි. අන් සියල්ල පෙර දින කථාව මෙනි.

දුකඛ ලක්ෂණ පිළිබඳ කතා පුවතයි.

20-4

" තුන් වැනි ගාථාවේද මෙසේම න්‍යාය වේ. මෙහි භාග්‍යවතුන් වහන්සේ එම භික්ෂූන්ට පෙර අනාත්ම ලක්ෂණය සුදුසු යෝග්‍යබව දැන මහණෙනි සියළුම ස්ඛන්ධ නොපවත්නා නිසා අනාත්මයයි පවසා මේ ගාථාව පැවසුහ.

"සබ්බෙ ධම්මා **අනත්තාති**" සියළුම ධර්ම අනාත්ම යයි යම් දිනෙක නුවණින් දකීද එනිසා දුක පිළිබඳව කළකිරේ මෙය විසුද්ධියට මාවතයි. එහි "සබ්බෙ ධම්මා - යනු පඤ්චස්කන්ධයම අදහස් කෙරේ. **අනත්තාති** - නොදිරාවා - මියනොයේවා යනාදී වශයෙන් පැවත්මට නොහැකිය. නොවසන නිසා ආත්ම ශූන්‍යය අස්වාමිකය. නිස්සාරය යන අර්ථයි. අන් විස්තර පෙරසේමය.

අනාත්ම ලක්ෂණ කථා පුවතයි.

20-5

"උට්ඨාන කාලම්හි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ජේතවනාරාමයේ වැඩවාසය කරද්දී, "පධාන කම්මික තිස්ස" තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ. සැවැත් නුවර වාසී සත්සියයක් කුල පුත්‍රයෝ බුදුන් වෙත පැවිදිවී, කර්මස්ථාන ගෙන ආරණ්‍යයට වැඩම කළහ. ඔවුන් අතර එක් නමක් එහිම නැවතුනි. ඉතිරි අය ආරණ්‍යයේ මහණ දම් පුරමින් රහත්බවට පත්වී ලබාගත් ගුණය බුදුන්ට පවසමුයි නැවත සැවත් නුවරට වැඩම කළහ. ඔව්හු සැවත් නුවරින් යොදුනකට පමණ ඈත. එක් ගමක පිඬු පිණිස හැසිරෙනු දැක එක් උපාසක වරයෙක් කැඳ බත් ආදිය පුදා අනුමෝදනය අසා දෙවන දිනයට ද ආරාධනා කළේය. ඔවුහු එදිනට සැවතට ගොස් පාසිවුරු තබා සවස් කාලයේ බුදුන් වෙත එළඹ වැඳ වාඩි වුහ. බුදුහු ඔවුන් වෙත අතිශය සතුට දන්වමින් පිළිසඳර කථාවෙහි යෙදුනහ. අනතුරුව නැවති සිටි භික්ෂුව මෙසේ සිතුවේය. බුදුරජාණන් වහන්සේ මොවුන් සමග පිළිසඳර කරන්නේ මුවනොපොහොනාසේ සතුටු බව පවසති. මම මාර්ගඵල නොලත් හෙයින් මා සමග කථා නොකරති. අද රහත් ඵලයට පත්ව බුදුන් වෙත එළඹ මා සමග කථා කරවමියි සිතුවේය. එම භික්ෂූන් වහන්සේලා ද ස්වාමීනි අප එන අතරමඟ එක් උපාසක වරයෙකු විසින් හෙට දානය සඳහා ආරාධනා ලදිමු. අඑයම එහි යන්නෙමුයි බුදුන්ගෙන් අවසර ලැබුහ.

මේ අතර උන්වහන්සේලාගේ සහායක භික්ෂුව මුළු රෑ සක්මන් කරන්නේ නිදිමතින් සක්මන් මළුවේ කෙළවර එක් ගල්පුවරුවක වැටුනි. උකුල් ඇටය බිඳුනි. ඔහු මහහඬින් මුරගෑවේය. ඔහුගේ සහායක යතිවරු ශබ්දය හඳුනාගෙන ඔබ මොබ සෙවුහ. පහන් දල්වා ඔහුට කළයුතු කාර්යය කරන්නවුන්ට නොදැනීම පහන් වුනි. උන්වහන්සේලාට යාමට අවකාශ නොලැබුනි. අනතුරුව ශාස්තෘන් වහන්සේ ඔවුන්ගෙන් ඇයි මහණෙනි. භික්ෂාචාර ගමට නොයන්නහුද? ඇසුහ. එසේය ස්වාමීනියි කියා මේ තොරතුරු දැනුම් දුන්හ. මහණෙනි මේ භික්ෂුව දැන් පමණක් නොව පෙරද ඔබ වහන්සේලාගේ ලාභ සත්කාර වැළැක් වීයයි පවසා ඔවුන් විසින්

ඉල්ලන ලද්දේ අතීත පුවත ගෙන හැර දක්වුහ.

යම් කෙනෙක් පළමුව කළ යුතු දේ පසුව කිරීමට කැමති වේද ලුණුවරණ දර තැබූ තැනැත්තා සේ පසුව තැවීමට පත්වේ.

එම වරණ ජාතකය විස්තර කර දුන්හ. එදින එම පන්සියයක් භික්ෂූහු තරුණයෝ වුහ. කම්මැලි තරුණයා මේ භික්ෂුවයි. ආචාර්ය වරයා බුදුරජාණන් වහන්සේය. බුදුහු මෙම දේශනය ගෙන හැර දක්වා මහණෙනි ! යමෙක් උත්සාහවත් කාලයේ උත්සහ නොකර අසම්පන්න සංකප්ප ඇතිව කුසිත වුවේ ධ්‍යාන ආදී භේදයට විශේෂ අධිගමයකුට පත් නොවේයයි පවසා මේ ගාථාව දේශනා කළහ.

වෙර දැරිය යුතුමකල වෙර දිරිය	නොදරා
අලසකම පෙර දැරිව තරුණ කල	දෙදරා
මග නුවණ නොලබා - දනම් මග	අවුරා
කම්මැලිය, මග නැවෙයි කෙලෙස් මල නො	උදුරා

වීර්ය කළයුතු කල්හී විර්යය නොකොට, තරුණයන් වුයේද ශක්තිමත් කෙනෙක් වුවේද අලස බැවින් යුතු වේ නම්, යටපත් කරන ලද තබන ලද සම්‍යග් සංකල්ප හා සිත් ඇති කුසිතවු අලසයා නුවණක් දක්කයුතු ආර්ය මාර්ගය ප්‍රඥාවට උපායක් නො ලබයි.

එහි **අනුට්ඨහානෝ** යනු උත්සහ නොවන්නේ වැයම් නොකරන්නේ, යුවාබලී පයම වයසේ සිටියේ බල සම්පන්නව සිටි වයසේත් අලසබැවින් යම්සේ වෙයි. ආහාරගෙන නිදාගනී. **සංසන්නසඞ්කප්පමනෝති** මිථ්‍යා විතර්ක තුනකින් යහපත් සේ අවසන් වූ සම්මා සඞ්කප්ප සිත් ඇත්තේ **කුසීතෝ** වීර්යය නොමැතිව, **අලසෝ** මහා කම්මැලියෙක්ව පඤ්ඤාය ප්‍රඥාවෙන් දක්විය යුතු **අරියමග්ගං** නොදකින්නේ - **නවින්දති** - නොලබන්නේය ආර්ය මාර්ගය යන අර්ථයි.

දේශනය අවසානයේ බොහෝ ජනයා සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

පධාන කම්මික තිස්ස තෙරුන් පිළිබඳ කථා පුවතයි.

20-6

"චාචානු රක්ඛී" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩසිටියදී සූකර ප්‍රේතයකු නිමිති කරගෙන දේශනා කළහ.

එක් දිනක් මහ මුගලන් තෙරණුවෝ ලක්ඛණ තෙරුන් සමග ගිජිකුළු පර්වතයෙන් බසිමින් එක් පෙදෙසක දී සිනා පහළ කළහ. මෙහිදී ලක්ඛණ තෙරුන් ඇයි ඇවැත්නි කුමක් නිසා සිනා පහළ කළේ ද යනුවෙන් මුගලන් තෙරුන්ගෙන් විමසුහ. දැන් එයට පිළිතුරු දීමට කාලය නොවේ. මෙය බුදුන් හමුවේදී මගෙන් විමසන්නැයි පැවසීය. මෙලෙස පිළිතුරුදී රජගහ නුවර පිණ්ඩපාතයේ ගොස් පසුව වේළුවනයට පැමිණ බුදුන් වැඳ සිටියාහුය. එහි දී ලක්ඛණ තෙරුන් ඒ කරුණ විමසුහ. මුගලන් තෙරුන් මෙසේ පැවසුහ. ඇවැත්නි මම එක් ප්‍රේතයෙක් දුටුවෙමි. ඔහුගේ සිරුර ගව් තුනක් පමණය. එය මිනිස් සිරුරකට සමානය. හිස ඌරෙකුගේ වැනිය. ඔහුගේ කටේ නගුටක් තිබුනි. එයින් පණුවන් ගිලිහුනි. මම මෙබඳු අයෙකු මින් පෙර නොදුටුවෙමි. ඔහු දැක සිනා පහළ කළෙමි. බුදුහු මහණෙනි මගේ ශ්‍රාවකයින් අතර ඇස් ඇති අය සිටිතියි පවසා මම ද මොහු බෝධි මණ්ඩලයේදී දුටුවෙමි. යම් කෙනෙක් මාව නොපිළිගනියයි එය ඔවුන්ගේ අහිත පිණිස පවතී යයි, අන් අය කෙරෙහි අනුකම්පාවෙන් නොකීවෙමි, දැන් මේ මුගලන් සාක්ෂි ලැබ කියමි. මහණෙනි. මුගලන් සත්‍යයක්ම පැවසුවේය එය අසා භික්ෂූහු බුදුන්ගෙන් විමසුහ. ස්වාමිනි ! ඔහුගේ පුර්වකර්මය කුමක්ද? මහණෙනි ! අසාගන්නැයි ඔහුගේ අතීත පූර්ව කර්මය පැවසුහ.

කාශ්‍යප බුද්ධ කාලයේ එක් ගමක ආවාසයක තෙරවරු දෙනමක් සමගිව වාසය කළහ. ඔවුන් අතරින් එකතෙරනමක් වයස සැටකි. එක් නමක් පනස්නවයකි. පනස් නවයක් වයස්වූ තෙරුන් අනෙක් නමගේ පාසිවුරු ගෙන හැසිරුණේය. සමාණේර නමක් ලෙසට සියළු වතාවත් කළේය. ඔවුන් එක මවු කුසකින් උපන් සහෝදරයන් ලෙසට සමගිව වසන තැනට එක් ධර්මකථික නමක් පැමිණියේය. එදින ධර්මය අසන දිනයක් විය. තෙරුන් සලකා අපට ධර්ම කථාවක් කරණලෙසට කීවාහුය.

උන් වහන්සේ ධර්ම කථාව පැවසුවේය. තෙරවරු ධර්ම කථික නමක් අප ලැබුවේයයි සතුටුසිත් ඇතිව දෙවන දින එම තෙරුන් ද ගෙන දුර ගමක පිණ්ඩපාතයේ ගොස් බත්කිස නිමවා ඇවැත්නි ඊයේ සිටි තැනදී කලාක්මෙන් කෙටි ධර්ම කථාවක් කරන්නැයි ඒ ගමේ මිනිසුන්ට බණ කියවූහ. මිනිස්සු බණ අසා පැහැදී දෙවන දිනයට ද ආරාධනා කළහ. මේ ලෙසට මුළු ගම්වල දින දෙක දෙක දේශක තෙරුන් ගෙන පිඬු සිඟා වැඩම කළහ. ධර්ම කථික තෙරුන් මෙසේ සිතුවේය. මේ දෙදෙනා බොහෝ මෘදුය. මවිසින් මේ දෙදෙනාම පළවා හැර මේ විහාරයේ වාසය කිරීම වටී. ඔහු සවස තෙරුන්ට උවටැනට ගොස් භික්ෂූන් නැගිට ගියවිට නැවතී මහාතෙරුන් වෙත එළඹ ස්වාමීනි ! කිවයුතු කිසිවක් ඇතැයි කියා - ඇවැත්නි කියන්නැයි පැවසුවිට ටිකක් සිතා - ස්වාමීනි මහාසාවජ්ජ යයි කියා නොකියාම පිටත්විය. අනු තෙරුන් ලඟටද ගොස් එලෙසටම කළේය. ඔහු දෙවැනි දිනයේද එලෙසටම කර තුන්වැනි දිනයේ දී ඔවුන් අතර දැඩි කුහුලක් ඇතිවුවිට මහතෙරුන් වෙත එළඹ ස්වාමීනි කිවයුතු කිසිවක් ඇත. ඔබ වහන්සේ ලඟ කීමට නොහැක්කෙමි. කියා තෙරුන් විසින් කමක් නැ කියන්නැයි කීවේය. ඇය ස්වාමීනි අනු තෙරුන් ඔබ වහන්සේ සමග සම්භෝගද අපි එකම මවකගේ දරුවන් සේ ය. එක් අයෙකුට ලැබුන දෙය අනෙකාටද ලැබුන සේය. ම විසින් ඔහුගේ අගුණයක් මෙතෙක් නොදක්කෙමි. එසේය ස්වාමීනි. ස්වාමීනි අනුතෙර විසින් මට මෙසේ පැවසුවේය. සත්පුරුෂය ඔබ කුල පුත්‍රයෙකි. මේ මහතෙරුන් ලජ්ජා සහිතය. ප්‍රියජනකය. උන්වහන්සේ සමග එකට කටයුතු කිරීමේදී පරීක්ෂාකර කරන්න. මේ ලෙසට මම පැමිණි දිනයේ සිටම පවසයි. මහතෙර මෙය අසා කිපුන සිත් ඇත්තේ මුගුරකින් පහර ලද මැටි බඳුනක් සේ බිඳුනේය. අනෙකා නැගිට අනුතෙරුන් ලඟට ගොස් මෙලෙසටම පැවසුවේය. ඔහු ද එලෙසටම සිත් බිඳුනි. ඔවුන් අතර කිසිවක් මෙතෙක්කල් එක් අයෙක් හෝ වෙන්වී පිඬුසිඟා නොගියහ. දෙවන දවස වෙන් වී පිණ්ඩපාතයේ ගියේ අනුතෙර කල් ඇතිව පැමිණ උවටැන් හලේ සිටියේය. මහතෙර පසුව පැමිණියේය. එය දැක අනුතෙර මෙසේ සිතුවේය. කිම මොහුගේ සිවුරු ගත යුතුද එසේ නොපිළිගත යතුද? යනුවෙනි. ඔහු දැන් නොපිළිගනිමි. සිතාද ම විසින් එසේ නොකරණ ලදී මවිසින් තමන්ගේ වතාවත විනාශ කිරීම නොවටියයි සිත මෘදු කරගෙන තෙරුන් වෙත එළඹ ස්වාමීනි පාසිවුරු දෙන්නැයි කීවේය.

මහතෙර යව අවිනීතය. ඔබ මගේ පාසිවුරු පිළිගැනීම යුතු නොවේ. අසුරු ගසා එසේනම් හොඳයි ස්වාමීනි මම ද ඔබගේ පාසිවුරු නො ගනිමියි සිතුවේය. කිකළ ඇවත්නි නවක ඔබ තවත් සිතන්නේද? මට මේ විහාරයේ කිසියම් ඇලීමක් ඇතැයි කීය. අනෙකා ද ඔබ වහන්සේලා කුමක් සිතුන්නේද මේ විහාරයේ කිසියම් ඇලීමක් ඇතැයි මේ ඔබේ විහාරයයි. කියා පාසිවුරුගෙන නික්මුනි. අනෙකාද නික්මුනි. ඒ දෙදෙනාම එකම මගකින් නොගොස් එකෙක් බටහිර දොරටුවෙන් ද අනෙක් නම පෙරදිග දොරටුවෙන් ද මාර්ගයට එළඹුනි. ධම්ම කථික තෙර ස්වාමීනි මෙසේ නොකරන්නැයි කියා නවත්තන්නැයි කිව්ට නො නැවතුනි. ඔහු පසුදින දුර ගමකට පිවිසියේ මිනිසුන් විසින් ස්වාමීනි අපේ ස්වාමීන් වහන්සේලා කොහිදයි විමසුවිට ඇවැත්නි මගෙන් නො විමසව, තොපගේ කුලුපග තෙරුන්ද ඊයේ කෝලාහල කොට නික්මුනාහුය. මා ආයාචනා කළේද නැවැත් වීමට නොහැකිවීයයි පැවසුවේය. ඔවුන් අතර ලාබාල අය සිටියහ. නුවනැති අය, අප විසින් මෙතෙක් අපේ හිමිවරුන් අතර කිසි කළහයක් නුදිටුමු. මේ බිය මොහු නිසාම මේ භික්ෂුව නිසා සිදුවීයයි දොම්නසට පත්වුහ. මේ තෙරවරු දෙනම ද ගිය තැනක සිතේ සුවයක් නම් නොලැබුහ. මහතෙරුන් මෙසේ සිතුවේය. අහෝ - නවක භික්ෂුවට බැරෑරුම් දෙයක් කළේය. මොහොතක් දුටු ආගන්තුක භික්ෂුවට කීවේය. මොහු සමග සම්බෝගයක් නොකළේය. ඔවුන්ට සජ්ඣායක් නොවීය. සිහි කිරීමක් නොවීය. ඔවුහු වසර සියයකට පසු බටහිර දෙස එක විහාරයකට ගියාහුය. ඔවුන්ගේ එකම සෙනසුනට වැඩම කළහ. මහතෙර පිවිසි ඇඳක සිටියේ අනෙක් තෙර පිවිසුනි. මහතෙර ඔහු දැක හඳුනාගෙන කඳුලු දරාගැනීමට නොහැකිවිය. අනෙක් තෙරුන් ද මහතෙරුන් හැඳින ගෙන කඳුළු පිරුණ නෙතින් කථා කරමි ද කථා නොකරමිද? සිතා තෙරුන් වැඳ මෙසේ පැවසුවේය. ස්වාමීනි මෙපණකලක් ඔබගේ පාසිවුරු ගෙන හැසුරුනෙමි. කාය ද්වාරාදියෙහි තොප විසින් කිසිදු නොගැලපෙන දෙයක් දැක්කේ නොවේද? ඇවැත්නි නොදක්කෙමි. එසේ නම් කුමක් හෙයින් ධර්ම කථික භික්ෂුවට කීවේද? මොහු සමඟ සම්භෝග නොකරන්නැයි නැත ඇවැත්නි මම එබඳු දෙයක් නොකීවෙමි. ඔබ විසින් මට එබඳු දෙයක් කීවේද? මම ද ස්වාමීනි එසේ නොකීවෙමි. එකෙනෙහි ඔහු විසින් අපව බිඳවනු සිතින් මෙසේ කියන ලද්දේ වනැයි දැනගෙන එකිනෙකාගේ වරද දෙසාගත්හ.

(සමාවගත්හ) ඔවුහු වර්ෂ සියයක් චිත්තාස්වාදයක් නොලබමින් එදවස සමගිවී අපි ඒ විහාරයට යමු. නෙරපා දමමුයි. පිටත්ව ගොස් පිලිවෙළින් එම විහාරයට ගියාහුය. ධර්ම කථික භික්ෂුව ද තෙරවරුන්දැක පාසිවුරු පිළිගැනීම සඳහා සමීපවිය. ථෙරවරු ඔබ මේ විහාරයේ වාසය කිරීම සුදුසු නොවේය. අසුරු ගැසුහ. ඔහු සිටිමට නොහැකිව එකෙනෙහිම පලා ගියේය. අනතුරුව ඔහු අවුරුදු විසි දහසක් කරණ ලද ශ්‍රවණ ධර්මය දරා ගැනීමට නොහැකිවිය. එයින් චුතවී අවීචියේ ඉපදුනේ එක් බුද්ධාන්තරයක් පැසී. දැන් ගිජ්ඣකුළු පව්වේ ප්‍රේතයකු වී කියන ලද ආත්මභාවයෙන් දුක් අනුභව කරයි. බුදුහු මේ පුර්ව කර්මය ගෙන හැර දක්වා මහණෙනි භික්ෂුවක් විසින් කායාදියෙන් සංවර වීම විය යුතුයයි පවසා මෙම ගාථාව පැවසුහ.

වචනය නිසා සිදුවන අකුසල්	**සතර**
නැතිකොට, මනස සංවරකරගෙන	**නිතර**
රැකගතහොත් කය ද සංවර කර	**තිදොර**
නැති කර ගත හැකිය දුක් කරදර	**සසර**

වචනයෙන් ද, මනසින් ද, කයින් ද අකුශල් නොකර සංවර වෙන්න. මේ ත්‍රිවිධවූ කර්මපථ පිරිසිදු කර ඍෂිවරුන් කියන ලද මාර්ගය පිරිසිඳ ගන්න.

මෙහි අරුත චතුර්විධවූ වචී දුශ්චරිතයෙන් වෙන්වී වචනය රකින්න. යනු **වාචානුරක්ඛී** නම් වේ. අභිධ්‍යා ආදි නුපදවා මනසින් ද මනැවින් සංවර වන්න. යනු **සුටයු සංවුතෝ** යයි කියන ලදී. ප්‍රාණඝාත ආදි කයින් කරන කර්ම වලින් ශුද්ධිය ලබන්න. යන්න **කායෙනව අකුසලං න කයිරා**. යනුවෙන් කිය. **එවං එතෙ තයොකම්ම පථෙ විසොධයෙ** - යන්න මේ ලෙසින් පිරිසිදු වන්න සීලක්ඛන්ධ ආදියෙන් බුද්ධාදී ඍෂිවරුන් ප්‍රකාශකළ ආර්ය අෂඨාංගික මාර්ගය පිළිපදින්න.

දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

සූකර ප්‍රේතයා පිළිබඳ කථා පුවතයි.

20-7

"යොගා වෙනි" - යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර ජේතවනා රාමයේ වැඩ සිටියදී "පොයිල" තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

උන්වහන්සේ බුදුවරු සත් නමගේ සසුනේ ත්‍රිපිටකධරව පන්සියයක් භික්ෂූන්ට ධර්මය උගන්වති. බුදුහු මෙසේ සිතූහ. මේ භික්ෂුව ගේ තමන්ගේ දුකින් මිදෙමියි සිතක් හෝ නැත. සංවේගයක් ද නැත. ඔහු තුළ සසර බිය දැක්මක් ඇති කරමියි. සිතා එතැන් සිට එම තෙරුන් තමන් වහන්සේ උවටැනට පැමිණිවිට මෙහි එන්න හිස් පොයිල" හිස්පොයිල වදින්න. හිස් පොයිල වාඩිවන්න හිස් පොයිල ගන්න. මේ ආදී වශයෙන් පිටත්ව ගිය විට ද හිස් පොයිල ගියේය යනුවෙන් පවසයි. ඔහු මෙලෙස සිතුවේය. මම අටුවා සහිත ත්‍රිපිටකය දනිමි. කරමි. පන්සියයක් භික්ෂූන්ට දහඅට ගණයක් සඳහා ධර්මය උගන්වමි. නමුත් බුදුහු නිතරම මට "කුඩපොයිල" යනුවෙන් අමතයි. ඒකාන්තයෙන් ධ්‍යාන ආදිය නොමැති නිසා මෙලෙස අමතනු ඇතැයි උපන් සංවේග ඇත්තේ දැන් වනයට පිවිස ශ්‍රමණ ධර්ම පුරමියි තෙමේම පා සිවුරු ගෙන උදසන සියල්ලන්ට ධර්මය උගැන්වීමෙන් පසුව පිටවියන භික්ෂූන් සමග නික්ම ගියේය. පිරිවෙනේ වාඩිවී පාඩම් කරණ අය අපේ ආචාර්යන් වහන්සේයයි නොසැලකූහ.

ඔහු යොදුන් සියයක් දුරගොස් එක් ආරණ්‍ය ආයතනයක භික්ෂූන් තිහක් වසති. ඔවුන් වෙත එළඹ සංඝ තෙරුන්ට වැඳ ස්වාමීනි මට පිහිට වන්නැයි පැවසුවේය. ඇවැත්නි ඔබ වහන්සේ ධර්මකථිකයෙකි. අපවිසින් එගැන කිසිවක් දතයුතුය. කුමක් නිසා මෙසේ කියයිද? ස්වාමීනි එසේ නොපවසන්න මට පිහිට වන්න. ඒ සියළු දෙන රහත්හුය. ඉක්බිති අපේ මහතෙරුන් මේ ඉගෙනීම නිසා මානයක් ඇතැයි අනුතෙරුන් ලඟට යැවීය. උන්වහන්සේ ද එසේ පැවසුහ. මේ ආකාරයෙන් සියල්ලෝ ඔහු යවන්නේ දවල් කළ වාඩි වී පිරිසිදු කර්මකරණ සියළු නවකයන්ට සත්වසක් වූ සාමණේර නමක් ලඟට ගොස් මේ ආකාරයෙන් මානය දුරුකළාහුය. ඔහු

නිහතමානීව සාමණේර නම අසල ඇඳිලි බැඳගෙන මට පිහිට වේවා. සත් පුරුෂයන් වහන්ස මට පිහිට වේවායි පැවසුවේය. අහෝ ආචාර්යන් වහන්ස කුමක් නම් කියමුද? තෙපි මහළු අයයි. බහුශ්‍රැත කෙනෙකි. ඔබ වහන්සේ වෙතින් ම විසින් යමක් දැනගතයුතුවේ.

එලෙස නොකරන්න. සත් පුරුෂය එසේ නොකරන්න. මට ඔබේ පිහිට අවශ්‍යමය. එසේ නම් ස්වාමීනි ඔබ වහන්සේ අවවාද එය අවශ්‍යමය - හොඳයි මම එසේ වෙමි. මම ගින්නට පිවිසිමට කියන්නේ නම් එසේ කරමි. අනතුරුව සාමණේරනම නොදුරේ විලක් පෙන්වා සිවුරු හැඳ පෙරවාම මේ විලට පිවිසෙන්නැයි කීවේය. උන්වහන්සේ මහත් අනර්ඝවූ දුපට චීවර ඇඳ පෙරවා ඇතිබව දැනදැනම මොහු අවවාද පිළිගන්නේදයන්න විමසනු සඳහා මෙසේ පැවසුවේය. තෙරුන් ද එකම වචනයෙන් ජලයට බැස්සේය. අනතුරුව සිවුරු කොන තෙමුන කළ මෙහි එන්න ස්වාමීනියි පවසා සිටිවිට එක වචනයෙන්ම පැමිණ සිටිය විට මෙසේ කීවේය. ස්වාමිනි මේ තුඹසේ සිදුරු හයෙකි. එහි එක් සිදුරකින් තළගොයෙක් ඇතුළට පිවිසිවිට ඌ අල්ලා ගනු කැමැත්තා ඉතිරි සිදුරු පස වසාදමා සයවැනි සිදුර තබා පිවිසි සිදුරෙන්ම ගනි. එසේ ඔබද ජද්වාරික අරමුණු අතර ඉති සිදුරු පස වසා පස් දොරටු වසා මනෝ ද්වාරයේ ක්‍රියා තබනු මැනව. බහුශ්‍රැතවූ භික්ෂුවට මෙපමණකින්ම පහන් දැල්වීමක් බඳුවිය. මෙපමණක්ම. වේවායි. මේ කුණප කයේ ඤාණය පිහිටුවා ශ්‍රමණ ධර්ම පටන්ගත්තේය. බුදුහු යොදුන් එකසිය විස්සක් දුර වැඩසිටම එම භික්ෂුව දෙසබලා යම්සේ මේ භික්ෂුව මහා ප්‍රඥා ඇත්තෙකි. එලෙසම ආත්මය පිහිටුවීම වටී. සිතා ඔහුටම කියන්නේ ඔහු හා කථාකරන්නේ යම්සේද එලෙසට ආලෝකයක් පැතිරවීය. එසේ පතුරුවා මේ ගාථාව දෙසුහ.

බවුන් වැඩුමෙන් නුවණ වැඩිවේ
පිරුළු දෙඩුමෙන් නුවණ මුඩුවේ
නැණ වඩන මග බුදුන් දෙසුවේ
එමග යාමම ඔබට යුතුවේ.

භාවනාවේ යෙදෙමින් ඒකාන්තයෙන් ප්‍රඥාව උපදියි. භාවනාවේ නොයෙදීමෙන් ප්‍රඥාව වැනසේ. වැඩපිණිසද අවැඩ පිණිස ද මේ දෙපරිදි මාර්ගය දෙමග දැන යම්සේ ප්‍රඥාව වඩාද කථා එලෙස තමා යෝනිසෝ මනසිකාරයෙ පිහිටුවන්නේය එහි **යොගා** යනු. අරමුණු තිස් අට පිළිබඳ යෝනියෝ මනසිකාර හුරී යනු බෙහෙවින් පොළව නුවණින් සමවු හා සඞ්ඛයෝ යනු විනාශයයි **එතංදෙධාපනනති** මේ දෙපරිදි මාර්ගය මේ යෝගය ද අයෝගයද යන දෙපරිදිමග **භවාය විභවාය** යනු වර්ධනයද අවර්ධනයද **නථාති** - යම් පරිද්දෙකින් මහාප්‍රඥාව වැඩේද මෙසේ තමන් වාසය කරන්නැයි යන අරුතයි.

දෙසුම කෙළවර පෝඨිල තෙරුන් රහත්බැවින් පිහිටියේය.

පෝඨිල තෙරුන් පිළිබඳ වූ කථා පුවතයි.

20-8

"වනං ඡින්දථ" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩසිටියදී බොහෝ මහළු තෙරවරුන් නිමිති කරගෙන දේශනා කළහ.

මේ භික්ෂූන් ගිහිකල සැවැත් නුවර කුටුම්බිකයෙන් වී සම්පත් ඇති මහත් ධනවතුන්ලෙස එකිනෙකා යාළුවන්ව එකට පිංකම් කරමින් බුදුන් ගේ ධර්මදේශනය අසා අපි මහළු අයයි ගිහිගෙයි විසීමෙන් කවර අර්ථයක්ද බුදුන්ගෙන් පැවිද්ද ඉල්ලා ගෙන පැවිදි වෙමු යයි පැවිදි වූවාහුය. මහළු නිසා ධර්මය පරිපූර්ණ කිරීමට නොහැකි වන්නේ විහාරය කෙලවර පන්සලක් කරවා එකළාව වාසය කළාහුය. පිඬුපිණිස හැසිරෙන්නේද බෙහෙවින් තම දුදරුවන් ගේ නිවෙස් වලටම ගොස් අහාර ගත්හ. ඔවුන් අතර එක් අයකුගේ පෙරබිරිඳ මධුරපාචිකා නම් වූවාය. ඕතොමෝ මේ සියල්ලන්ගේම පිහිට පිණිස වූවාය. මේ නිසා සියළු දෙන තමන් ලත් ආහාරය ගෙන ගොස් ඇගේ නිවසේ වාඩිවී ආහාර වළඳති. ඇයද ඔවුන්ට තබන ලද සුපව්‍යඤ්ජන දෙන්නීය. ඇය එක්තරා ආබාධයක් නිසා කළුරිය කළාය. අනතුරුව මහළු තෙරුන් හිතවත් තෙරුන්ගේ පන්සලට රැස් වී එකිනෙකා ගෙල වැළඳගෙන මධුරපාචිකා උවැසිය කළුරිය කළායයි වැලපෙමින් හැඬුහ. භික්ෂූන් වහන්සේලා හාත් පසින් දිව අවුත් මේ කුමක්ද ඇවැත්නියි විමසා ස්වාමිනි අපට සහායික වූ පුරාණ දුතිකාව කළුරිය කළාය. ඇය අපට අතිශයින් උපකාරී වූවාය. මෙබඳු කාන්තාවක් අපි කොහින් ලබන්නද? මේ කරුණ නිසා හඬමුයි පැවසුහ. භික්ෂූහු ධම්සභා මණ්ඩපයේ කථාවක් ඉපදවූහ. බුදුහු දම්සභාවට පැමිණ මා එන්නට පෙර කුමන කථාවකින් සිටියෝදැයි විමසා අදාළ කරුණ පැවසුවිට මහණෙනි දැන් පමණක් නොව පෙරද කාක යෝනියේ ඉපිද මුහුදු තෙර හැසිරෙන්නේ මුහුදුරළින් මුහුදට ගසාගෙන ගොස් මැරුණ නිසා කපුටෝ හඬා වැලපී ඇය පිටතට ගන්නෙමුයි හොටෙන් මුහුද ඉසිමින් වෙහෙසුනහ මුහුදු ජලය ඉසීම නිසා අපගේ හකු විඩාවට පැමිණියේය. මුඛයද වියළෙයි. මුහුද දිය ඇඳලන්නට වීර්යය කරමිහ. දිය හිස්කළ නොහෙම්මය. මුහුද පිරේ. මෙම කාක විස්තර කොට එම භික්ෂූන් අමතා මහණෙනි ! රාග දොස මෝහ නම් කෙලෙස් වනය නිසා තොප විසින් මේ දුකට පැමිණෙන ලදහ. එම කෙලෙස් වනය සිදීම

සුදුසුවේ. මෙසේ නිදුක් වේවායි පවසා මේ ගාථාව පැවසුහ.

සිඳිනු මැන කෙලෙස්වන - වඩනු මැන බවුන්මග
ලොකු කුඩා හැම කෙලෙස් - බිඳුර යනු නිවන්මග
ඉතිරියක වෙත බැඳුණු - ආදරය බිදියයුතු
නිබෙන නෙක් එය හිතේ - නිවන් හිමිවනු නැතේ

මහණෙනි වනය සිඳිවි. ගස් නොකපවි කෙලෙස්වනයෙන් බිය ඇතිවේ. කෙලෙස් වනයද වන්‍යථයද - සිඳදමා කෙලෙස්වන රහිතවමු.

පුරුෂයාගේ ස්ත්‍රීන් විෂයෙහි වූ ස්වල්ප මාත්‍රවුද කෙලෙස් නැමැති වනයෙක් යම්තාක් කල් නොසිඳිපවත්තේද? ඒ තාක් කල් හෙතෙමේ මව කෙරෙහි ඇලුණු කිරිදරාබොන මැස්සාමෙන් ස්ත්‍රීන් කෙරෙහි පටිබද්ධ සිත් ඇත්තේමය. ඇලුණු සිත් ඇත්තේ මය.

එහි මාරුක්‍ඛං යනු බුදුන් විසින් වනය සිඳින්නැයි පවසන ලද්දේ මෑතදී පැවිදිවූ භික්ෂූන්ට බුදුහු අප විසින් වෑ පොරෝගෙන වනය සිඳින්නැයි ගස් කැපීමේ කැමැත්ත ඇතිවිය ඉක්බිති ම විසින් රාගාදී කෙලෙස් වනය සඳහා කියන ලදි රුක් නොවේ යනුවෙන් ප්‍රතිශේධ කරමින්. මා රුක්‍ඛන්ති ආහ. වනතෝ - ප්‍රකෘතික වනයෙන් සිංහ ආදින්ගෙන් බියක් ඇතිවේ. මෙලෙස ජාති ආදී බිය. කෙලෙස් වනයෙන් ඇතිබිය යන අර්ථයි. **වනංව වනථං චාති** - මෙහි මහත් රුක් වනථ වනයේ ඇති කුඩා ගස් වනථ නම්, මුලින් හටගත් ගස් වනය නිමිනි ඒ ඇසුරෙන් හැදුන ගස් වනථ නමින්ද හැදින්වේ. එය මේ දෙකම සතර වැනි මාර්ග ඤාණයෙන් සිඳිය යුතුය.

යාවංහි වනථොනි - යම්තාක් අණුමාත්‍රවුද කෙලෙස් වනයෙන් යුක්ත වූ මිනිසුන්ට ගැහැණුන්ගෙන් සිත නොබිඳේමය. **කිරි උරා බොන වස්සා** මව් දෙනට බැඳුන අයුරින් ඇලුන සිත් ඇතිබවයි යන අර්ථයි. දේශනාවසානයේ පන්සියයක් මහළු තෙරවරු සෝවාන් ඵලයෙහි පිහිටියාහුය. පැමිණි අයටද දෙසුම සාර්ථක විය.

මහළු තෙරුන් පිළිබඳ වූ කථා පුවතයි.

20-9

"උපජීඤ්ඣා - යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී සැරියුත් තෙරුන්ගේ සද්ධි විහාරික තෙරනමක් ඇරබ දේශනා කළහ. එක් රන්කරුවෙකුගේ රූමත් පුතෙක් සැරියුත් තෙරුන් සම්පයේ පැවිදිවීය. තෙරුන් වහන්සේ තරුණ අයට රාගය උත්සන්න වේයයි සිතා ඔහුගේ රාගය දුරකරලීම සඳහා අසුභ කර්මස්ථානයක් දුන්නේ ය. ඔහුට එය සප්පාය නොවීය එනිසා ආරණ්‍යයට පිවිස තෙවසක් උත්සාහ කරන්නේ සිතේ එකඟතාවක් හෝ නොලැබ නැවත තෙරුන්වෙත පැමිණ එළඹ සිටි කල්හි තෙරුන් විසින් කර්මස්ථානයන් පිළිබඳ විමසිය ඒ භික්ෂුව සියලු පවත් කීහ. අනතුරුව කර්මස්ථානයන්ගෙන් ප්‍රතිඵල නු වුයේයයි කෙලවරට පමැණීම සුදුසු නොවේයයි පවසා නැවතද එම කර්මස්ථානයම මනැවින් කියවා දුන්නේය. ඔහු දෙවනවරද කිසිදු විශේෂයක් ඇතිකර ගැනීමට නොහැකිවූයේ පැමිණ තෙරුන්ට දැනුම් දුන්නේය. අනතුරුව තෙරුන් කරුණු සහිතව උපමා සහිතව එම කර්මස්ථානයම කියාදුන්හ. තෙරුන් සිතූහ. ක්‍රියාකාරී භික්ෂුව තමන් වෙත පවතින කමවඡන්දාදිය විද්‍යාමාන බවද අවිද්‍යමාන බවද දැනගනී. මේ භික්ෂුව ක්‍රියා කාරියෙක් නොව අකාරිකයෙකි. පිළිපන් කෙනෙක් නොව නොපිළිපන්නෙකි. මම මොහුගේ අදහස් නොදනිමි බුදුන් විසින් මොහු නික්ම වියයුතු අයෙක්වේ. ඔහු කැඳවාගෙන සවස් යාමයේ බුදුන් වෙත එළඹ ස්වාමීනි මොහු මගේ සද්ධිවිහාරිකයෙකි. මොහුට මේ කරුණ නිසා මේ කර්මස්ථානය දුන්නෙමි. සියළු පුවත් දැනුම් දුන්හ.

ඉක්බිති බුදුහු ආසයානුසය ඤාණය. පාරමී පුරා දසදහසක් ලෝකධාතුව නාද කරවමින් සර්වඥතාඥානය ලත් බුදුන්ටම විෂයවේයයි පවසා කවර කුලයකින් මොහු පැවිදු වුයේදැයි ආවර්ජනා කරන්නේ රන් කරුවෙකුගේ කුලයෙන් යැයි දැන අතීත ආත්මභාව බලන්නේ පන්සියයක් ආත්මභාව වල ස්වර්ණකර කුලයේම උපන් බව දැක. මේ තරුණයා බොහෝකලක් රන්කම් කිරීමෙන්ම පෙරලුණි. එනිසා මොහු කනිකාදි මල් නෙළීම් මල් ආදියෙන් කමටහන් කරවමියි සිතා රන් රුවන්ම පරිවර්තනය කරණ ලද්දේය. එනිසා

මොහුට අසුභ පටික්කූල කර්මස්ථාන සුදුසු නො වන්නේ මොහුට මනාපවූ කර්මස්ථානය යෝගාඃයයි. සිතා සාරිපුත්තය. ඔබ විසින් කර්මස්ථාන දී සාරමසක් පෙළන භික්ෂුව අද සවස් වරුවේදීම රහත් බවට පත්වීම බලන්න. යන්නැයි උනන්දු කොට ඍද්ධියෙන් රියසකක් පමණ රන් නෙළුමක් මවා පතුවලින් හා පියුම් නටුවෙන් ජල බිඳු මුදවන සේ කරවා මහණ මේ නෙළුම ගෙන විහාරයට දුරින් වැලිගොඩක තබා ඉදිරියේ පර්යඞ්කයෙන් වාඩිවී ලොහිතක ලෝහිතක යනුවෙන් පරිකර්ම කරන්නැයි දුන්නේය. ඒ බුදුන් අතින් තෙම ගනිද්දීම සිත පැහැදුනි. ඔහු විහාරයේ කෙළවරකට ගොස් වැලි ගොඩක් සාදා එහි නෙළුම් දණ්ඩ ගසා ඉදිරියේ පර්යංකයේ සිටිමින් ලොහිතකං ලොහිතකං යනුවෙන් පරිකර්මය පටන් ගත්තේය. එහිදී ඒ අවස්ථා වේදීම නීවරණ ප්‍රහාණය විය උපචාර ධ්‍යානය ඇතිවුනි. ඉන් අනතුරුව ප්‍රථම ධ්‍යානය උපදවා පඤ්ච ආකාර වාසභාවයට පත්ව වාඩිවී සිටියදීම දුතියජඣාන ආදියෙහි වසඟවුයේ චතුර්ථ ධ්‍යානයේ ධ්‍යාන ක්‍රීඩා කරන්නේ වැඩසිටියේය. බුදුහු ඔහුට ධ්‍යාන උපන්බව දැන ගෙන ඔහුට ධර්ම තායට වඩා උතුම් විශේෂ ඥානයන් ඉපදවීමට හැකිවේදැයි බලා හැකිබව දැනගෙන එම නෙළුම මැලවේවයි අදිටන් කළහ. එය අතින් මඩින ලද නෙළුමක් මැලවෙන්නාසේ කළු පැහැ ගැන්වුනි. ඔහු ධ්‍යානයෙන් නැගිට එය බලා කුමක් හෙයින් මේ නෙළුම ජරාවෙන් යුතුවුයේ පෙනෙයි නොගත් දෙයෙහිද මෙලෙස ජරාවෙන් පෙළෙනකල ග්‍රහනය කරණ ලද්දේ කවර කථාවක්ද? මෙහිද ජරාවෙන් වැඩ පවත්නේයයි අනිත්‍ය ලක්ෂණ බැලුවේය. එය දුටුවිට දුඃඛ ලක්ෂණයද අනිත්‍ය ලක්ෂණයද දැක්කේම වෙයි. ඔහුට තුන්ලොවම අසාර සේ ගෙලේ බැඳි කුණපයක්ලෙස වැටහුනි. එකෙණෙහි ඔහු අසල දරුවො එක් හඬක් පිටකර නෙළුම් කඩා ගොඩබිම එක් රැස් කරනි. ඔහු ජලයේද ගොඩබිමද තුමුදු මල් බැලුවේය. අනතුරුව ජලයේ මල් වඩාත් අලංකාරලෙස ජලය වගුරුවමින් මෙන් නැගී සිටියහ. අනෙක් මල් මැලවුයේ විය. ඔහු උපාදින්න වුන ජරාව මෙලෙසින් පහර දේ . ග්‍රහණය කළේවා කිම පහර නොදේද වඩාත් හොඳට අනිත්‍ය ලක්ෂ නාදිය දුටුවේය. මොහුට කර්මස්ථාන ප්‍රකට වීයයි. දැන ගඳ කිළියේ සිටම ආලෝකයක් විදවීය. ඔහු ඔහුගේ මුහුණට ආලෝකය දුන්නේය. අනතුරුව මේ කුමක්දැයි බලනවිට බුදුහු අවුත් ඉදිරියේ වැඩසිටියේ මෙන් විය ඔහු නැගිට ඇදිලි බැඳගෙන අනතුරුව බුදුහු ඔහුගේ සප්පාය සලකාබලා මේ ගාථාව පැවසුහ.

නිල් මහනෙල් මලක් නිල් දිය මත පිපුණු
සියතිනි සිදිනවා මෙන් ඔබ හද බැඳුණු
තන්හා මාන ඈ කෙලෙසුන් සිත රැඳුණු
අරහත් නුවණැසින් පින්වත සිඳ දමනු

සරත් කාලයෙහි පිපුණු කුමුදු මලක් අතින් ගෙන, උදුරා දමන්නාක් මෙන් තමන්ගේ ස්නේහය උදුරා දමන්න. සිඳ දමන්න. නිවන්මගම වඩන්න නිවන උතුම් සැපත යයි බුදු රදුන් විසින් දේශනා කරන ලදී.

එහි **උජ්ජහ** යනු අර්හත් මාර්ගයෙන් සිදීම. **සාරාදිකංතා** යනු සරත් කාලයේ හටගත් **සන්ති මග්ගං** - නිර්වානගාමී ආර්ය අෂ්ඨාංගික මාර්ගය, බෑහයති යනු වඩයි. **නිබ්බාණං** නිවණ නම් සුගතෙනදෙසිතං - බුද්ධ දේසිතය. එනිසා එම මාර්ගය වඩයි යන අර්ථයි.

දේශනාවසානයේ ඒ භික්ෂුව අර්හත්වයේ පිහිටියේය.

(ස්වර්ණ) රන්කරු තෙරුන් පිළිබඳ කථා පුවතයි

20-10

"ඉධ වස්සං" යනු මෙම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩසිටියදී මහාධන **වෙළෙන්දා නිමිති** කරගෙන දේශනා කළහ.

ඔහු බරණැස් නගරයේ සිට වණුක් මල් වලින් සායම් කළ වස්ත්‍ර ගැල් පන්සියයක පුරවා ගෙන වෙළඳාම පිණිස සැවැතට පැමිණියේය. ගංතෙරට පැමිණ ගෙට ගගින් එතර වෙමියි එහිම ගැල් මුදවා විසීය. රාත්‍රී මහා මෙඝයක් ඇතිවී වැස්සේය. ගඟ දින හතක් ජලය පිරී පැවතුනි, නාගරිකයෝද දින හතක් නැකත් කෙළි කළහ. වණුක්මලින් සායම් කළ වස්ත්‍රවලින් (රතුමල්) වලින් කාර්යය නිම නොවීය. වෙළෙන්දා සිතූ වේය. මම දුරසිට ආවෙමි. ඉදින් නැවත යන්නේනම් ප්‍රපංචයක් ප්‍රමාදයක් තරමක පාඩුවක් ඇතිවේ. මෙහිම වර්ෂා ඍතුව හේමන්ත හා ගිම්හාන ඍතුව මගේ කර්මාන්ත කරමින් වාසය කොට මේවා විකුණා ආපසු යමියි සිතීය. බුදුහු නගරයේ පිඬුසිඟා යන අතර ඔහුගේ මේ අදහස දැනගෙන සිනහ පහළ කරණුලදී. ඒ පිළිබඳව අනද තෙරුන් විමසුවිට මේ ලෙසට පැවසුහ. ආනන්ද ඔබ මහාධන වෙළෙන්දු දුටුවේද?ට එසේය ස්වාමීනි. ඔහු තමන්ගේ ජීවිත අන්තරාය නොදැන මේ අවුරුද්ද මෙහිම වාසයකර භාණ්ඩ විකිණීමට සිතුවේය. ස්වාමීනි ඔහුට කවර අනතුරක් වන්නේද? බුදුහු එසේය ආනන්ද ඔහුතව දින හතකින් මරුමුවට වැටේ පවසා මේ ගාථාව පැවසුහ.

අපෙජව කිච්චං අතපපං කොජඤ්ඤා මරණං සුවේ" අද කළ යුතු දේ අදම කළයුතුය. හෙට මරණය සිදුවේදයි දන්නේ. කවුරුහුද? මහාසේනා ඇති මාරයා සමග කවර සටනක්ද, මෙසේ සිතා දිවා රෑ අප්‍රමාදීව කටයුතු කරණ, කෙලෙස් තවන, තැනැත්තා හඳෙකරත්ත වේ. යයි මුනිවරු පවසති.

ස්වාමිනි අපියමු ඔහුට මෙය දන්වාසිටිමු. විස්වාසයෙන් යුතුව..... ආනන්ද යන්න. තෙරුන්, ගැල් දොරට ගොස් භික්ෂාවේ හැසිරුනි. වෙළෙන්දා තෙරුන්ට මෙසේ කීවේය. ආහාරය අපේක්ෂා කෙරේද? අනතුරුව තෙරුන්

මෙසේ කිවේය. ඔබ කොපමණ කලක් මෙහි වසන්නේද ස්වාමීනි මම දුරසිට පැමිණියේ වෙමි. ඉදින් මම ආපසු යන්නට ටික දිනක් පමාවේ. මේ වසර මෙහි සිට භාණ්ඩ විකුණා යන්නෙමි. උපාසකය. උවදුරක් ඇත. ජීවිතාන්තරා (අනාතුරු) ඇත. අප්‍රමාදී විමට වටී. ස්වාමිනි කවර අනතුරක්ද? උපාසකය දිවි අනතුරක් ඇත. දින හතකින් එය සිදු වන්නේය. ඔහු සංවේගයට පත්ව බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට ආරාධනාකොට දින හතක් දන් දී අනුමෝදනාව සඳහා පාත්‍රය ගත්තේය. අනතුරුව බුදුහු අනුමෝදනා කරන්නේ උපාසකය, නුවණැත්තන් විසින් නම් මෙහිම වර්ෂ ආදියක් වසන්නෙමියි මේ මේ කර්මාන්ත වල යෙදෙන්නෙමියි සිතීම නොවටී. තමන්ගේ ජීවිත අන්තරායම සිතීම වඩාත් වටී. යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

තව ටිකක් කල් ඉඳ
සොයා ගෙන නිසි දනරැස
ගෙදර යමි ආපසු
කියා සැලසුම් සදයි රිසිසේ,
එහෙත් තම මරණය
පසු පස හඹා එන බව
නො දනිමින් සැලසුම්
තනයි අනුවණ දනා රිසිසේ.

මෙහිම හේමන්ත - ගිම්හ - වස්සාන ඍතුවල වසන්නෙමි බාලයා අනතුර අවබෝධ කරනොගෙන මෙලෙස සිතයි.

එහි **ඉධ වස්සනනි** - මේ ස්ථානයේම මෙහිම කරමින් සිව්මසක් හෝ වර්ෂයක් වාසය කරන්නෙමි. හෙමන්ත **ගිම්හිසු** - ගිම්හාන සතර මසක්ද යම් යම් දේ කරන්නෙමියි මෙහිම වසන්නෙමියි **දිට්ඨ ධම්මික සම්පරායික** අර්ථය නොදන්නා බාලයා සිතයි. අන්තරායන්ති - අසවල් අසවල් කාලයේ හෝ දේශයේ හෝ මැරෙන්නෙමියි තමන්ගේ ජීවිත අනතුරු අවබෝධ නොගනී. දෙසුම අවසන වෙළෙන්දා සෝවාන් ඵලයෙහි පිහිටියේය. පැමිණි අයටද සාර්ථක විය. වෙළෙන්දාද බුදුන් අනුව ගමන් කර නැවතී මට හිස

312

රැදාවක් ඇතිවීයයි ඇදේ නිදාගත්තේය. එසේ නිදා සිටියදීම කළුරිය කොට තුසිත දෙව්ලොව උපන්නේය. (පහළවිය)

මහාධන වෙළෙන්දාගේ කථා පුවතයි.

20-11

"නං පුත්ත පසු සම්මත්තං" යන මේ ධර්මදේශනය බුදුහු දෙව්රම වැඩ සිටියදි කිසා ගෝතමිය නිමිති කරගෙන දේශනා කළහ. (කතාව) සහසයවර්ගයේ එයි.

යමෙක් වර්ෂ සියයක් අමෘත පදය නොදැක ජීවත් වේද, එසේ ජීවත්වීමට වඩා අමෘත පදය (නිවන) දකිමින් එක දිනක් ජීවත් වීම අගනේය සුදුසුයි.

ගාථාවේ වර්ණනය විස්තර කොට කියන ලදී එදින ශාස්තෘහු කිසා ගෝතමිය ඔබ විසින් එකමිටක් හෝ අබ ලැබුවේදැයි විමසුහ. නැන ස්වාමිනි මුළු ගමේම ජීවත්වන්නන් අතර මළ අය බොහෝ වෙති. අනතුරුව ශාස්තෘහු ඔබ මගේම පුතුයා මැරුනේයයි සලකයිද? ඒකාන්ත ධර්මයෙකි. මේ සත්ත්වයන්ට මාරයා නම් සියලු සත්ත්වයන් නොපිරිණු අදහස් තිබියදීම මහා ඕඝයක් සේ අදිමින් අපාය නැමති මුහුදට ඇද දමතියි පවසා ධර්මය දේශනා කරන්නේ මේ ගාථාව පැවසුහ.

දන සම්පත් සමග දරු සම්පත්ද	බලා
ඒ පිළිබඳව තන්හාවෙන් වෙමිනි	මුලා
නිවසන දනන් මරුවා ගෙනෙවිති	තලා
සෝදා ගියා වැනි ගේදොර මුහුද	ගලා

එහි - **නං පුත්තපසූ සම්මත්තං** - ඒ රූපයෙන් ද බලයෙන්ද. සම්පූර්ණ වූ දු පුතුන් ලබා ඔවුන්ගේ අභිරූපයද, බලවත් බවද. උගත් බවද, වැඩෙහි දක්ෂ බවද, බලා සතුටු වන්නෙමි. මගේ ගව මහිෂාදින් ගේ, බලසම්පන්න බවද, බර ඉසිලීමේ දක්ෂතාද, බොහෝ කිරි ඇති දෙනුන් ද, ආදී වශයෙන් දරුවන් කෙරෙහිද සම්පත් කෙරෙහිද, සතුටු වන්නේ යයි සිතා සිටින මිනිසා නිදා සිටිය දීම මහා වතුරකට ගසා ගෙන යන්නාක් මෙන් මාරයා රැගෙන යන්නේය. **ව්‍යාසත්ත මනසන්ති** - රන් රුවන් ආදියෙහි හෝ පාතු සිවුරු ආදියෙහි හෝ කිසිවක් ලැබ වඩාත් උතුම් ප්‍රාර්ථනයේ ඇලුන මනස හෝ ඇස් හඳුනාගත් අරමුණුවල පෙරකී ලෙස හෝ පරිෂ්කාරවල යම් යම් දෙයක්

314

ලැබුවේද ඒ ඒ තැන ඇලුන නිසා ඇලුන සිත් ඇති **සුත්තං ගාමනති** - නිදිගත් සත්වයා. **මහොඝො** යම් සේ මෙබඳු ගමක් ගැඹුරු පළල් මහත් වූ මහනදියක මහා ඕඝය අන්තිම වශයෙන් බල්ලෙක් හෝ ඉතිරි නොකර සියල්ල ගහගෙන යයි. මේ ලෙසට කියන ලද ආකාරයෙන් මිනිසා මාරයා රැගෙන යයි. කියා ගෝතමිය සෝවාන් වූවාය. පැමිණි අයටද සාර්ථක විය.

කිසාගෝතමියගේ කථාවයි.

20-12

"න සන්ති පුත්තාති " යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී පටාචාරා නිමිත්තිකරගෙන දේශනාකළහ. (කථාවස්තුව සහස්ස වග්ගයේ එයි)

"යොව වස්ස පතං ජීවේ අපස්සං උදයව්‍යයං" යමෙක් වර්ෂ සියයක් - ඇතිවීම නැතිවීම නො දැක ජීවත් වේද? එයට වඩා හට ගැනීම නැතිවීම දකිමින් එක් දිනක් ජීවත්වීම වටී.

ගාථා වර්ණනය විස්තර කොට කියනලදී. එකල්හි පටාචාරාවන්ගේ ශෝකය තුනී නියාව දැන, පටාචාරාවෙනි, මිය පරලොව ගියවුන්ට වැදූ දෙමාපියෝ වත්, තමන් හැදූ දරුවෝ වත්, සෙසු නැදෑයෝ වත්, වෙනත් ස්වාභාවික ආරක්ෂාවක් වත් නොමැත්තේය. සරණ වන්නට නො හැක්කේමය. එසේ ඇතිකල්හි නුවණැත්තෝ සිල් රැක, තමන්ගේ නිවන් මග සාදා ගැනීමම වටී යයි පවසා ධර්මය දේශනා කරමින් මේ ගාථාව පැවසුහ.

මරණය හිමිය උපදින හැම කෙනෙකු	හට
දූ දරු මව්පියෝ නැත පිහිට	වීමට
නැදෑයින් කිසිත් නැත ඔබ තනිව	සිට
අරි අට මග වඩා යායුතුය	නිවණට

මරණයෙන් යටපත් වූවහුට පිහිට පිණිස දූ පුතුන් නැත. පියවරුනැත. ඥාතීන් නැත මාරයා වැටුනවිට ඥාතීන්ගේ පිහිට නැත. සිලයෙන් සංවරවූ නුවණැත්තෝ මෙය දැන නිවන් මග වහා ශුද්ධ කරගනී. තෂ්ඨ එහි **තාණයා** යනු ආරක්ෂාව - පිහිටවීම සඳහාය. **බන්ධවා** යනු පුතුන්ද දුවරුද තබා අනෙක් ඥාති සහෘදයෝ නැත. **අනත කෙනාධි පනතස්ස** මරණ බියෙන් මැඩගත් පැවැත්ම. පුතුන් ආදීන් කැමබීම ආදිය දීමෙන් මෙන්ම ඇතිවන කාර්ය අවසන් කිරීම ද පිහිට විද මරණ කාලයේ කිසියම් උපායකින් මරණය වලක් වන්නට අසමත් බැවින් පිහිට පිණිස ආරක්ෂාව පිණිස නැත්තේමය. එනිසා කියන ලදී. **නත්ථි ඤාතීසු - නාණතානි** ඥාතීන්ගේ පිහිටක් නැත. මේ

316

කරුණ නිසා එකිනෙකාට පිහිට වීමට අසමර්ත සඞඛ්‍යාත කරුණ දැන නුවණැත්තා චතුපාරිශුද්ධි සිලයෙන් සංවර වී රකිනලද ගෝපනය කරණ ලද ඉඳුරන් ඇතිව නිවන් මග වූ අෂ්ඨාංගික මාර්ගය වහවහා වැඩිය යුතුයයි යන අර්ථයි. දේශනය අවසානයේ පටාචාරා සෝවාන් ඵලයෙහි පිහිටි යාය. අනෙක් බොහෝ දෙන සෝවාන් ඇදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

පටාචාරාවගේ කථා පුවතයි.
මග්ග වර්ණණාව නිමි

විසි වැනි වර්ගයයි.

21-1

"මනතාසුබ පරිවාහා" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනා රාමයේ වැඩ සිටියදි තමන්ගේ පෙර කර්මය නිමිති කරගෙන දේශනා කළහ.

එක් සමයක විසාලාව සමෘර්ධිමත් විය. සම්පූර්ණ වූ බොහෝ ජනයාගෙන් පිරී පැවතුනි. එහි චරින් වර රජ කරණ ක්ෂත්‍රියයෝම "හත් දහස් හත්සිය හැත්තෑ (7777) හතක් වූ වුහ. ඔවුන්ගේ වාසය සඳහා එමපමණ ප්‍රාසාද හා කුළු ගෙවල් උයන්වල විසීම සඳහා ආරාම පොකුණු ද වුහ.

මේ මහනුවර පසුකලෙක දුර්භික්ෂයක් විය. ශෂ්‍ය දුබලවිය. එහි සාගත හේතුවෙන් පළමුව දුගීමිනිස්සු කළුරිය කළහ. තැන තැන දමන ලද ඔවුන්ගේ මිණී කුණු වල ගඳින් අමනුෂ්‍යයෝ නගරයට පිවිසුනහ. අමනුෂ්‍ය උපද්‍රවයෙන් බොහෝ දෙනෙක් මියගියහ. ඔවුන්ගේ මළකුණු ගඳ පිළිකුලනිසා සත්ත්වයන්ට අභිවාතක රෝගය උපනී. මේ ලෙසට දුර්භික්ෂ බය අමනුෂ්‍ය බය රෝග බය යන තුන් බිය ඇතිවිය. නුවර වැස්සෝ රැස්වී රජුට කිවාහුය. මහරජ මේ නුවර තුන්බිය ඇතිවිය. ඕන්පෙර ධාර්මික රජවරුන්ගේ කාලයේදී මෙබඳු බයක් නම් ඇති නොවිය. රජු සන්ථාගාරයේ සියල්ලන් එක් රැස් කරවා රජවරුන්ට මෙසේ කීවාහුය. ඉදින් අප අතර අධාර්මික බවක් (නොදහැමිබවක්) තිබේ නම් එය සොයා බැලිය යුතුය. විසාලාව වැසි සියළු ප්‍රවේනින් සොයන්නේ රජුගේ කිසි දොසක් නොදැක මහරජ ඔබගේ දෝෂයක් නැතැයි කියා තෙසේ නම් මේ බිය සංසිඳවන්නෙමු. දැයි සම්මණ්ත්‍රණය කළහ. එහිදී ඇතැම් කෙනෙක් බලි පුද කිරීමෙන් ආයාචනය කරමුයි එය මංගල ක්‍රියාවක්බව පැවසුවිට එයපවත්වා වැලක්වීමට නොහැකි වේ. ඇතැම් කෙනෙක් ෂට් ශාස්තෘවරු මහානුභාව සම්පන්නය. ඔවුහු මෙහි පැමිණි පමණකින් තුන් බිය දුරුවන්නේයයි පැවසුහ. තවත් කෙනෙක් සම්මා සම්බුදුන් වහන්සේ ලොව පහළ විය. උන්වහන්සේ සියළු සතුන්ගේ යහපත සඳහා ධර්මය දේශනා කරති. මහා ඍද්ධිමත්ය මහත් ආනුභාව

සහිතය. උන්වහන්සේ මෙහි වැඩමකළවිට තුන් බිය පහවීමට හේතුවේයයි පැවසූහ. ඔවුන්ගේ වචනය පිළිබඳව සියල්ලෝම සතුටු වූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් කොහේ වාසයකරත්දැයි විමසුහ. ඒදිනවල බුදුහු වස් සමාදන් වීමට ආසන්න නිසා බිම්බිසාර රජුට ප්‍රතිඥා දී වේළුවන විහාරයේ වැඩ සිටිති. මේ කාලයේදී බිම්බිසාර හා එක්ව සෝවාන් ඵලයට පත් මහාලි නම් ලිච්ඡවී රජ එම පිරිසේ සිටියේ විය. විශාලානගර වැසියෝ මහත් පුද පඬුරු සාදා බිම්බිසාර රජුට දැනුම් දී බුදුන් වහන්සේ මෙහි වැඩමකර වන්නැයි මහාලි ලිච්ඡවිද පුරෝහිත ප්‍රත්‍යාද යැවූහ. ඔවුන් ගොස් රජුට පඬුරුදී එම පුවත දැනුම් දී මහරජ බුදුන් වහන්සේ අපේ නගරයට වැඩමවනු මැනවැයි ඉල්ලා සිටියහ. රජු තෙපිම එය දැනගත්වායි නොපිළිගත්හ. ඔවුහු බුදුන්වෙත එළඹ වැඳ ඉල්ලා සිටියහ. ස්වාමීනි - විශාලා මහනුවර තුන්බිය ඇතිවී තිබේ. ඔබවහන්සේ එහි වැඩම කළකල්හි මේ උවදුරු දුරුවන්නේ ය. ස්වාමීනි වඩිනුමැනව. බුදුහු ඔවුන්ගේ වචනය අසා ආවර්ජනා කරන්නේ විශාලාවට ගොස් රතන සූත්‍රය දේශනාකළවිට ඒ ආරක්ෂාව කෙල දහසක් සක්වල පැතිරෙන්නේ ය සූත්‍ර දේශනය අවසන අසූහාරදහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය වන්නේ ය ඒ බිය දුරුවේයයි ද දැන ඔවුන්ගේ ආරාධනය පිළිගත්හ. බිම්බිසාර රජ බුදුන්ගේ විශාලා නුවර ගමන පිළිගත්තේයයි අසා නුවර සෝෂාවක් කර බුදුන් වෙත එළඹ කිම ස්වාමීනි ඔබ වහන්සේ විශාලා නුවරට යාම පිළිගත්තේදැයි විමසා මහරජ එසේයයි පැවසුවිට එසේ නම් ස්වාමීනි වඩින්න. මර්ගය පිළිසකර කරමියි පවසා රජගහ නුවරට හා ගංගාමට අතර වූ යොදුන් පහක මාර්ගය සමකරවා යොදුනක් යොදුනක් දුර විහාර කරවා බුදුන් ගමන් කරණ වේලාවන් දැනුම් දුන්හ. බුදුහු පන්සියයක් භික්ෂූන් සමග මගට පිළිපන්හ. රජු යොදුනක් දුර දනක් පමණට දුරට පස් පෑ මල් විසුරුවා කොඩි - පතාක - කෙසෙල් ආදීන් ඔසවා බ්‍රහ්ම - ඡත්‍ර - අධිඡත්‍ර කොට සේසත් දෙකක් එක් එක් භික්ෂුවකට එක් එක් සේසත හිසට උසුලුවා පිරිවර සහිතව මල් ගඳ ආදියෙන් පුජා කරමින් බුදුන් එක් එක් විහාරයක වාසය කරවා මහදන් දී දින පහකින් ගංතෙරට පමුණුවා එහි නැවක අලංකාරකර විසාලා නුවර වාසිනීට ලිපියක් (හස්නක්) යැවීය. මාර්ග සකසා බුදුන්ගේ පෙරගමන් කරත්වායි දැන්වීය. ඔවුහු දෙගුණයක් පුජා කරන්නෙමුයි විශාලාව හා ගංගානදිය අතර තුන්යොදුන් භූමිය සමකරවා බුදුරජුන්ට සේසත් සතරත් එක් එක් භික්ෂුවකට සේසත් දෙක බැගින්ද සේසත් පිට

සේසත් නංවා, පුජා කරමින් අවුත් ගංගා තෙර සිටියාහුය. බිම්බිසාර රජ නැව් දෙකක් එකට බැඳ මණ්ඩපයක් කරවා මල් දාමයන්ගෙන් සරසවා සියලු මැණික්වලින් බුද්ධාසනයක් පැනවුහ. බුදුහු එහි වාඩිවූහ. භික්ෂුන්ද නැවට නැගී. බුදුන් පිරිවරා වාඩිවූහ. රජු බුදුන් අනුව ගමන්කොට කරවටක් දියට බැස ඔබවහන්සේ නැවත වඩිනතුරු මේ ගංතෙරට වී සිටිමියි කියා නැව පිටත්කර නැවතුනි. බුදුහු ගංගාවේ යොදුනක් පමණ දුර ගංගාවේ ගමන් කර විශාලා වාසින්ගේ සීමාවට වැඩම කළහ. ලිච්ඡවී රජවරු බුදුන්වෙත පෙරගමන් කොට පමුණුවා බුදුරජාණන් වහන්සේ නැවෙන් බස්වාගත්හ. බුදුහු නැවෙන් බැස ගංතෙර පා තබනවාත් සමගම මහ මෙසයක් පැනනැගී පොකුරු වැස්සක් වැස්සේය. හැම තන්හි දණක් පමණ - කළවා පමණ - උකුල් ප්‍රදේශය පමණම ජලය ගලමින් සියළු කුණප ගඟට යැවුහ. පිරිසිදු භූමි භාගයක් වූයේය. ලිච්ඡවී රජවරු බුදුන් යොදුනෙන් යොදුන වාසය කරවා මහදන් දී දෙගුණයක් පුජා පවත්වා දින තුනකින් විශාලාවට වැඩමවූහ. සක් දෙවි රජ දේව සමූහයා පිරිවරා ගියේය. මහේසාක්‍ය දෙවියන්ගේ පැමිණීම නිසා අමනුෂ්‍යයෝ බොහෝසෙයින් පළාගියහ. බුදුහු සවස නගර දොරටුවේ සිට ආනන්ද තෙරුන් ඇමතූහ. ආනන්ද මේ රතන සුත්‍රය ඉගෙනගෙන ලිච්ඡවී කුමාරවරුන් සමග හැසිරෙමින් විශාලාවේ ප්‍රාකාර තුන අතර පිරිත් කරන්න. ආනන්ද තෙරහු ශාස්තෘන් විචාරා දෙනලද රතන සුත්‍රය ඉගෙන ලිච්ඡවී කුමාරවරු සමග හැසිරෙමින් විශාලාවේ තුන් ප්‍රකාර අතර බුදුන්ගේ ශීලා පාත්‍රයෙන් ජලය ගෙන නගර දොරටුවේ සිටියේ ප්‍රතිධානයේ පටන් (බුද්ධත්වය පැතීමේ සිට) තථාගතයන් වහන්සේගේ දසපාරමී උපපාරමී - පරමත්ථ පාරමී පඤ්ච මහා පරිත්‍යාග ලෝකාර්ථ චරියාව ඤාතත්ථ චරියාව - බුද්ධිචරියාව මේ තුන් චර්යා පශ්චිම භාවයේ බිහිවීම ජාතිය අභිනිෂ්ක්‍රමණය - ධ්‍යාන වැඩීම බෝධි පර්යංකයේ මාරපරාජය කිරීම -සර්වඥතාඥානය ප්‍රතිවේධය නවලෝකොත්තර ධර්මය මේ සියළු බුදුගුණ ආවර්ජනය කොට නගරයට පිවිසි තුන්යම් රැය ප්‍රාකාර තුන අතර පිරිත් කරමින් හැසිරුනාහුය. "යංකිඤ්චි" යන ගාථාව කියනවිටම උඩට දමන ලද ජලය අමනුෂ්‍යයන්ගේ සිරුරු මත වැටුනි. තෙවැනි ගාථාවේ සිට රිදී මල් මඩමක්සේ ජලබිඳු ඇඟසට නැගී ගිලන්වූ මිනිසුන්ගේ සිරුරුමත වැටුනාහුය. එකෙණෙහි රෝග නිවාරණය වූ මිනිස්සු නැගිනැගී තෙරුන් පිරිවරා ගත්හ. "යංකිඤ්චි"

යන පදය සිට ජලයෙන් ස්පර්ශවූ අමනුෂ්‍යයෝ පලායන්නේ - කසලගොඩ බිත්ති ප්‍රදේශ ඇසුරුකල අමනුෂ්‍යයෝ ඒ ඒ දොරවලින් පළාගියහ. දොරටු වලින් යාමට එහි ඉඩ නොලැබූ අය ප්‍රාකාර බිඳ පළාගියහ. මහ ජනයා නගරය මැද සන්ථාගාරය සියලු සුවඳින් පිරිබඳ කොට උඩ රන් තාරකා ඇදි විසිතුරු වියන් බැඳ බුද්ධාසනයක් පනවා බුදුන්ට ආරාධනා කළහ. බුදුහු පනවන ලද අසුනේ වැඩසිටියහ. භික්ෂු සංඝයාද ලිච්ඡවි සමූහයාද බුදුන් පිරිවරා වාඩිවුහ. සක්දෙව් රජද දේවගනයා පිරිවරා සුදුසු අවකාශයේ සිටියේය. තෙරුන් වහන්සේද මුළු නගරය පුරා ඇවිද සුවවූ රෝග ඇති මහජනයා සමග පැමිණ බුදුන් වැඳ වාඩිවුහ. බුදුහු පිරිස බලා එකෙණෙහි රතන සූත්‍රය දේශනාකළහ. දෙසුම අවසන ප්‍රාණීන් අසුහතර දහසකට ධර්මාවබෝධය විය. මෙලෙස දෙවනුව ද දින හතක් මේ සූත්‍රය දේශනාකර සියළු බිය සංසිඳුන බව දැන ලිච්ඡවී සමූහයා අමතා විශාලාවෙන් නික්මුනි. ලිච්ඡවී රජවරු දෙගුණයක් සත්කාර කරන්නේ නැවත දින තුනකින් බුදුන් ගංතෙරට වැඩමවුහ. ගංගාවේ සිටි නාග රාජයෝ මෙසේ සිතූහ. මිනිස්සු තථාගතයන් වහන්සේට සත්කාර කරති. අපි නොකරන්නේ කුමක් හෙයින්ද ඔවුහු ස්වර්ණ - රජත - රන් රිදී මැණික්මය නැව් මවා රන් රිදී - මැණික්මය ආසන මවා පනවා පස්වන් සියුම් ගැවසුන ජලය කරවා - ස්වාමීනි අපටත් අනුග්‍රහ කරණු මැනවයි පවසා - තම තමන්ගේ නැව්වලට නගින ලෙසට ආයාචනා කළහ. මිනිස්සු ද නාගයෝ ද තථාගතයන් වහන්සේට පූජා කරති. අපි කෙසේ නොකරමුදැයි බුමාටු දෙවියන් ඇතුළු අකණිට්ඨ බ්‍රහ්ම ලෝකය දක්වා සියළු දෙවියෝ සත්කාර කළහ. (තතථ) එහි නාගයෝ යොදුනක් දුර සේසත් පිට සේසත් නංවා ලුහ. ජතුය නොසිඳ කොඩියට පතාකද පතාක අතර මල්දම් වත්සුණු සුවඳදුම් ආදි සත්කාර කළහ. සියළු අලංකාර ප්‍රතිමණ්ඩිතවූ දෙවිපුත්වරු උත්සව විලාශයක් ගෙන උද්ඝෝෂණ කරමින් අහසේ හැසිරුනහ. මේ තුන් පිරිසේ සමාගමය මහත්විය. යමක පාටිහාරිය සමාගමය. දෙවාරෝහණ සමාගමය. මේ ගංගාරෝහණ සමාගමය යන එකතුවීම් මහත්විය. එතෙර බිම්බිසාර රජ ලිච්ඡවීන් කළ සත්කාරයෙන් දෙගුණයක් සත්කාර සාදා බුදුන්ගේ වැඩම කරවීම බලමින් සිටියහ. බුදුහු ගංගාවේ දෙපස රජවරුන්ගේ මහත් සත්කාරය බලා නාගයින්ගේ ද අදහස දැන එක් එක් නැවකට පන්සියයක් රහතුන් සමග නිර්මිත බුද්ධ කායයන් මැවූහ. එක් එක් සේසත කල්ප වෘක්ෂයේ මල්දම් යට නාග සමූහයා පිරිවරා

වාඩි විය. එවිට බුමාටු දෙවියන් අතරද නිර්මිත බුද්ධකායක් මැවුහ. මෙලෙස මුළු සක්වල තුළ එකම අලංකාර එකම උත්සවයක් එකම සැණ කෙළියක් විය. නාගයන්ට අනුග්‍රහ කරන්නේ භූමිස්ථ දේවතා ආදීන්ද එක් එක් ඉඩ ඇති තැන පිරිවර සහිතව එක් එක් නිර්මිත බුද්ධ රූපයක් මැවීය. මෙලෙස මුළු සක්වල තුළට එකම උත්සවයක්විය නාගයන්ට අනුග්‍රහ කරන්නෝ එක් රන්වන් නැවකට නැංගේය. භික්ෂූන් වහන්සේලා ද එක් නැවකට නැගෙහුය. නා රජවරු බුද්ධ ප්‍රමුඛ සංඝයා හා නාග භවනට පිවිසී මුළු රෑ බුදුන් වෙතින් බණ කථා අසා දෙවන දින දිව්‍යමය කෑම් බීම් ආහාර පාන බුද්ධ ප්‍රමුඛ භික්ෂුසංඝයාට පිළිගැන්වුහ. බුදුහු අනුමෝදනා කොට නා භවනින් නික්ම මුළු සක්වල දෙවියන් ගේ වැඳීම් පිදීම් ගරු බුහුමන් මැද පන්සියයක් නැව් වලින් ගංගාව තරණය කළහ. රජු පෙරගමන් කර බුදුහු නැවෙන් බස්වා ලිච්ඡවීන් කළ සත්කාරය මෙන් දෙගුණයක් සත්කාර කර පෙරදිමෙන්ම දින පහකින් රජගහ නුවරට වැඩමවුහ.

දෙවැනි දින භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාතයෙන් පසුව සවස් වේලේ දම්සභා මන්ඩපයට රැස්වී කථාවක් ඉපදවුහ. අහෝ බුදුවරයන්ගේ මහත් ආනුභාවය අහෝ බුදුන්කෙරෙහි දෙවි මිනිසුන්ගේ ප්‍රසාදය ගඟින් එතරද ගඟින් මෙතරද අටයොදුන් මග බුදුන්කෙරෙහි ප්‍රසාදයෙන් රජවරු මග සමතුලකරවා වැලිවිසුරුවා දණක් පමණ ගැඹුරට නොයෙක් වර්ණ මල් අතුරණ ලදි නාගයන්ගේ ආනුභාවයෙන් පස්වන් නෙළුම් සරසන ලදි අකිනිටා බඹලොව දක්වා සේසත් පිට සේසත් නංවා මුළු සක්වල ගැබ එකම අලංකාරයක් එකම උත්සවයක් මෙන් විය. බුදුන් පැමිණ මා ඒමට පළමුව කිනම් කථාවකින් යුතුව කවර කථාවකින් යුතුව සිටියෝදැයි විමසා මෙනම් කතාවකින් යයි පැවසුවිට මහණෙනි මෙය මට කළ පූජා සත්කාරයක් නොවේ. මෙය මගේ බුද්ධානුභාවය නිසා ඇතිවීයයිද නාග දේව බ්‍රහ්ම ආනුභාවයෙන් අතීතයේදී කරන ලද අප්‍රමාණ පරිත්‍යාග නිසා උපන්නේයයි පවසා භික්ෂූන්ගේ ඉල්ලීම අනුව එම අදහස පැහැදිලි කිරීම සඳහා අතීතය ගෙන හැර දැක්වුහ.

පෙර තක්සිලාවේ සඞ්ඛ බ්‍රාහ්මණයෙක් සිටියේය. ඔහුගේ පුත් සුසීමනම් තරුණයායි. සොළොස් වියේදී එක් දිනක් පියාවෙත පැමිණ මෙසේ කීවේය.

පියාණනි මට බරණැසට ගොස් මන්ත්‍ර ඉගෙනීමට අවසර දෙන්න යනුවෙනි. දරුව එසේනම් අසවල් බ්‍රාහ්මණයා මගේ මිතුරෙකි. ඔහු වෙත ගොස් ඉගෙනගන්නැ පිළිවදන් දී පිළිවෙලින් බරණැසට ගොස් එම බමුණාවෙත එළඹ පියඵවු බව ආදී වශයෙන් තොරතුරු කථා කරමින් උන්හ. පැවසුවේය. ඉක්බිති ඔහු මිතුරාගේ පුතායයි පිළිගෙන කරදර සංසිඳ ගුහදවසක මන්ත්‍ර කීමට පටන් ගත්තේය ඔහු කෙටි වශයෙන් හෝ බොහෝ වශයෙන් ගන්නේ ගත්ගත් දෙය රංබඳුනේ සිංහතෙල් සේ නොනසා ධාරණය කරගත්තේ නොබෝ දිනකින් ගුරුවරයා ඉදිරියේ උගතයුතු සියල්ල ඉගෙනගෙන සජ්ඣායනා කරන්නේ තමන් උගත් ශිල්ප මුල මැද පෙනේ අවසානය නොපෙනේ කියා ආචාර්ය වරයාට කීකල්හි. දරුව මමද නොදනිමි. කී කල අනතුරුව ආචාර්යයන් වහන්ස අවසානය කවරෙක් දනීදැයි විමසා දරුව ඉසිපතනයේ ඍෂිවරු වාසය කරති. ඒ අය දන්නවා ඇත. ඔවුන් වෙත එළඹ විමසන්න. ආචාර්ය වරයා මෙසේ පැවසූවිට පසේ බුදුන් වෙත එළඹ විමසුවේය. තෙපි අවසානය දන්නාහුද? එසේය - තරමක් දනිමි. එසේ නම් මට කියනු මැනව. අපි - පැවිදි නොවුවන්ට නොකියමියි ඉදින් ඔබට අවසාන අර්ථය අවශ්‍ය වේනම් පැවිදි වන්නැයි කිවාහුය. ඔහු යහපතැයි පිළිගෙන ඔවුන්වෙත පැවිදිවිය. අනතුරුව ඔවුහු මෙසේ හික්මිය යුතුයි. මෙලෙස වාසයකළ යුතුය. මෙලෙස පෙරවියයුතුය. මේ ආදීලෙස ආභිසමාචාරික ශීලය කීවාහුය. ඔහු ඒ අනුව හික් මෙන්නේ උපනිශ්‍රය සම්පන්න බැවින් නොබෝ කලකින් පච්චෙක සම්බෝධිය පසේ බුදුබව අවබෝධකර මුළු බාරාණසී නගරයේ ගගන තලයෙහි පුන් සඳසේ ප්‍රකට වුයේ, ලාභයෙන් අගතැන් පැමිණියේය. ඔහු අල්පායුෂ්ක සංවත්තනික" කර්ම කළ හෙයින් නොබෝකලකින් පිරිනිවන් පෑහ. අනතුරුව පසේ බුදුවරුද මහජනයාද ආදානය කර ශාරීරික ධාතු ගෙන නගරය දොරටුවේ ථූපයක් කර පිහිටවුහ. සඬබ බ්‍රාහ්මණයාද පුතු ගොස් බොහෝකල් ගෙවුයේයයි ඔහු ගැන තොරතුරු දැනගන්නෙමි ඔහු දකිනු කැමතිව තක්ශිලාවෙන් නික්මී පිළිවෙළින් බරණැසට පැමිණ මහජනයා එක්රැස් වී සිටිනු දක ඒකාන්තයෙන් මෙ මහ ජනයා අතරෙන් එකෙක් හෝ මගේ පුතුගේ පුවත දන්නේයයි ළඟට එළඹ විමසුවේය. සුසිම නම් තරුණයා මෙහි පැමිණියේය. ඔහු පිළිබඳ තොරතුරු දන්නේදැයි විමසිය බ්‍රාහ්මණය එසේය දනිමු. අසවල් බ්‍රාහ්මණයා ළඟ ත්‍රිවේදය සජ්ඣායනා කර පැවිදිවී

පච්චේක සම්මාසම්බෝධිය අවබෝධ කර පිරිනිවන් පෑහ. මෙය උන්වහන්සේ ගේ ථූපයයි. ඔහු එවිට බිම පෙරළී හඬා වැලපී එම චෛත්‍ය අඬ්ගනයට ගොස් තණ ගලවා උතුරු සළුවෙන් වැලි ගෙනවිත් ථූප අංගනයේ විසිරුවා කෙණියෙන් පැන් ගෙනවුත් ඉසිමින් වන මල් වලින් පූජාකර සළුවෙන් පතාකයන් නංවා ථූපය මතුවේ තමන්ගේ කුඩය බැඳ ගියේය.

බුදුහු මෙම අතීතය ගෙන හැර දක්වා එකල සංඛනම් බ්‍රාහ්මණය, වූයේ මාය. මවිසින් සුසිම නම්පසේ බුදුන්ගේ චෛත්‍ය අඬ්ගනයේ තණ ගැලවූ ඒ මට නිසැකයෙන් අටයොදුන් මග කටු කොහොල් හරවා ශුද්ධ වූ සමතුළිත බිමක් කරණ ලදි. එහි මම වැලි විසුරු හෙයින් අට යොදුන් මග මෙසේ වැලි විසුරුවන ලදී. මවිසින් වන මලින් පුදකළ හෙයින් මගේ ඒ (පිනෙන්) විපාකයෙන් අට යොදුන් මග නොයෙක් වර්ණවත් මල්වලින් මල් විසුරුවන ලදී. යොදුනක් දුර ගංගා ජලයේ මල් විසිරුනි. එදින මම කෙන්ඩියෙන් පැන්ගෙනා අවුත් චෛත්‍ය මලුව තෙමු නිසා ඒ විපාකයෙන් විශාලාවේ පොකුරු වැස්සක් වැස්සේය. මම එහි පතාකනැංවූ ඡත්‍රසිට ජනු බැඳ මුළු සක්වල ගම එකම උත්සවයක් මෙන් විය. මේ ලෙසම මහණෙනි. මේ පූජාසත්කාරය මගේ නොව - බුද්ධානුභාවයෙන් අතීතයේදී අප්‍රමාණ පරිත්‍යාග අනුභවයෙන් යයි පවසා ධර්මය දේශනා කරන්නේ මේ ගාථාව වදාළහ.

සුළු සැපත හළ විට
මහ සැපතක් පෙනේනම්
සුළු සැප හැර පියා
ලැබ ගැනුම මහ සම්පත්
නැණවත් සිරිත වේ
"සංඛන" බමුණු පුතුසේ.

මද සැපයක් අත්හැරීමෙන් මහත් වූ සැපයක් දක්නේ නම්, ඒ මහත්වූ සැපත මනාව දකිමින් නුවණැත්තා මද සැපය හැරදමන්නේය. ඒ මහත් වූ සැපත නම් නිවන් සුවය වේ.

එහි **මත්තා සුඛං** - යනු ප්‍රමාණ සුවයයි. සුළු සුවයකිය කියනු ලැබේ. ඔහුගේ පරිත්‍යාගය නිසා **විපුලං සුඛන්ති** - උදාර සුවය නම් - නිවන් සුවයයි කියැවේ එය බලන්නේ ය. යන අර්ථයි එක් භෝජන භාජනයක් සරසා අනුභව කරන්නාට සුළු සුවයක් ඇතිවේ. එය පරිත්‍යාග කර උපෝසථය හෝ කරන්නාට දානය හෝ දෙන්නාට විපුල උදාර නිවන් සුවය උපදී. මේ නිසා ඉදින් මෙසේ ස්වල්ප සුවය පරිත්‍යාගකර විපුල සුවය ලබයි ඉක්බිති විපුල සුවය මැනවින් බලන්නා නුවණැත්තෙකි ඒ අල්ප සුවය වර්ජනය කරන්නැයි යන අර්ථයි. දේශනාවසනයේ බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පැමිණියහ.

ගංගා රෝහණ කථා ප්‍රවතයි.

21-2

"පර දුක්ඛූපධා නෙන" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී එක් කිකිළි බිජුවට කෑ කුමාරිකාවක අරමුණු කරගෙන දේශනා කළහ. සැවැත් නුවරට නොදුරෙහි පණ්ඩු පුරනම් එක් ගමක් ඇත. එහි එක් - ධීවරයෙක් වාසය කරයි. ඔහු සැවැත් නුවරට යන්නේ අච්චරවතී ගඟ අසල කැස්බෑවකුගේ බිත්තර දැක ඒවා ගෙන සැවතට ගොස් එක් ගෙයකදී උයවා කමින් ඒ ගෙදර එක් දැරියකටද එක් බිජුවක් දුන්නේය. ඇය එය කා එතැන් සිට වෙනත් කෑයුතු දෙයක් නොකමැතිවෙයි. අනතුරුව ඇගේ මව කිකිළියක් බිජුදැමූ තැනකින් එක් බිත්තරයක් ගෙන දුන්නාය. ඇය එය කා රස තෘෂ්ණාවෙන් බැඳුනේ එතැන් පටන් තමන්ම කිකිළියන්ගේ බිජු ලබාගෙන කයි. ඇය දැක ඇගෙන් පීඩාවටපත් කිකිළිය වෛර බැන්දාය ඉන් චුතව යක්ෂණියක් වී තිගේ දරුවන් කෑමට සමත් වී උපදින්නෙමියි ප්‍රාර්ථනා කර මරණයට පත්ව ඒගෙදරම බැළලියක් වී උපනී. අනෙක් තැනැත්තිය ද කළුරිය කොට එහිම කිකිළියක් වි උපන්නාය. කිකිළිය බිජු දැමීමාය බැළලිය පැමිණ ඒවා කා දෙවැනි වරද තෙවැනි වරද කෑවාය. කිකිළිය තුන්වරක් මගේ බිජු කා දැයි මාද කෑමට කැමති ය. මෙයින් චුතව පුතුන් සහිත ඇය කෑමට ලැබේවායි ප්‍රාර්ථනා කර එයින් චුතව කොටි දෙනක් වී ඉපදුනි අනෙක් අය(කිකිළි) මුව දෙනෙක් වී උපනි. ඇය වදනකළ කොටි දෙන පැමිණ ඇය පුතු සමගම කෑවාය. මේලෙස කමින් ආත්මභාව පන්සියයක් එකිනෙකාට දුක් උපදවා අවසානයේදී එක් යක්ෂණියක්ව උපනි. අනෙක් තැනැත්ති සැවැත් නුවර එක් කළ දියණියක්ව ඉපදුනි. මෙයින් පසුව **නහි වෙරානි වෙරානි** යන ගථා වර්ණනාව කී පරිද්දෙන් දත යුතුය.

මෙහි වනාහි බුදුහු වෛරය අවෛරයෙන් සන්සිඳේයයි පවසා වෛරයෙන් වෛරය කිසිදා නොසන් සිඳේයයි මේ ගාථාව පැවසූහ.

අනුන් හට දුක්	දී
සිටියත් තමන් සුව	දී
වයිරයෙන් පෙර	දී
කවදා නමුත් වර	දී

අන් අයට දුක් ඇතිකර තමන් සුවය කැමතිවේද වෛරයෙන් ගැටුනේ දඹහු වෛරයෙන් නොමිදේ.

එහි පරදුකබුපදානෙන - යනු අන් අයට දුක් ඇතිකරලීමෙන් යන අර්ථයි. වෙරසංසග්ග සංසටෙයා යම් පුද්ගලයෙක් ආක්‍රොෂකිරීම, ආදිලෙස එකිනෙකා හා වෛර බැඳීමෙන් ගැටුනේ ඔහු වෛරයෙන් නොමිදේ. **වෙරා** සොන පරිමුචචනි නිත්‍ය වශයෙන් වෛරී ලෙසට දුකටම පැමිණේ. යන අර්ථයි.

දෙසුම අවසානයේ යකින්න සරණෙයෙහි පිහිටා පන්සිල් සමාදන්ව වෛරයෙන් මිදුනි. අනෙක් තැනැත්තියද සෝවාන් ඵලයෙහි පිහිටියාය. පැමිණ පිරිසටද දේශනය සාර්ථක විය.

කිකිළි බිත්තර කෑ තැනැත්තිය පිළිබඳ කථා පුවතයි.

21-3

"යංහි කිඤ්චං" - යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ හද්දිය නුවර ඇසුරු කොට ජාතියා වනයේ දී හද්දිය භික්ෂුව නිමිතිකර වදාළ සේක.

ඔවුහු පාපළඳනා - සෙරෙප්පු - සැරසීමේ යෙදුන අය වුහ. එකල්හි හද්දිය භික්ෂුව නොයෙක් ආකාර පාවහන් සැරසීමේ යෙදුනේ වෙති. තෘණ පාවහන් කිරීමද කරවීම ද කරති. මුඤ්ජ පාවහන් - බබුස්තණ සෙරෙප්පු - කිතුල් සෙරෙප්පු නෙළුම් සෙරෙප්පු කම්බල සෙරෙප්පු යන මේවා කිරීමද කරවීමද හිස් දෙයෙකැයි උද්දේස විමසා අධි - සීල -අධි චිනත - අධි පඤ්ඤා භික්ෂූන් ඔවුන් පිළිබඳව කථා කරණබව දැන සෝෂා කර බුදුන්ට දනුම් දුන්හ. බුදුහු එම භික්ෂුවට ගර්හා කොට මහණෙනි තොප අන් කාර්යකට පැමිණ අනෙක් කට යුත්තක යෙදුනේ යයි පවසා ධර්මය දේශනා කරමින් මේ ගාථාව පැවසුහ.

කළ යුතු දේ නොකොට සිව් සිල් රැකු	මා දී
බාහිර දේ කළොත් දෙස් පාලන	ආදී
වැඩෙමින් කෙලෙස් තන්හා - රා -	මානාදී
අරිමග නිවන් මග ඉන් යනු ඇත	සේදී

කළයුතු භාවනා - කරමින් මනා සිල් රැක
එළඹ සිටි සිහි ඇති - මග නැණින් පිරිපුන්වූ
මහණෙකුගෙ සිතින් නම් - නැසේ කාමාදි ආසාව

සිල් රැකීම් ආදී තමන් විසින් කටයුතු යම් දෑ මහණෙකු විසින් හැර දමා පිරිකර ඔප මට්ටම් කිරීම් ආදී නො කළ යුතු දෑ කරයිද, උඩඟවූ පමා වූ ඔහුගේ ආශ්‍රවයෝ වැඩෙත්.

යම් කෙනෙකුන් විසින් කායගතාසති භාවනාව නිතොර මොනවට වඩන ලද්ද කටයුත්තෙහි නිත්‍ය ක්‍රියා ඇති නොකොට යුතු දෑ නො සෙවිත් මනා සිහි නුවණ ඇති ඔවුන්ගේ ආශ්‍රමයෝ විනාශ වෙත්.

එහි **යංහි කිඤ්චං** - යනු භික්ෂූන් විසින් පැවිදිවූ තැන්සිට අපමණ **සීලස්ඛන්ධ** ආරක්ෂා කිරීමයි. ආරණ්‍යයෙහි විසීම ධුතාංග දැරීම භාවනාවේ යෙදීම මේ ආදී කාර්යයන් මෙහි යම් තමන්ගේ කටයුතු **තං අපවිද්ධං** විසිකළ **අකිඤ්චනති** - භික්ෂූන්ගේ - කුඩ සැරසීම - පාවහන් පාත්‍රය, පටිය, ඉතේ බඳින පටිය, මේවායේ සැරසීම නොකළ යුතුදේවෙයි. යම් කෙනෙක් මේවා කරයිද ඔවුන්ගේ මානය වැඩි හැසිරෙන නිසා **උන්නලානං** - සිහිය බැහැරයයි. **පමත්තානං** සතර කෙලෙස් වැඩෙ යන අර්ථයි. **සුසමාරද්ධ** මනා පරීක්ෂාවෙන් **කායගතා සතිනි** - කායනු පස්සනා භාවනාවයි. **අකිඤ්චංනි** - ඔවුහු කුඩ සැරසීම් ආදිය නොකට යුතුයි. **න සෙවනෙති** සේවනය නොකරති. යන අර්ථයි **කිඤ්චෙ** නම් පැවිදි වූ තැන්සිට කළයුතු අපරිමාණ ලෙස සිල් රැකීම ගෝපනාදිය කරයි. **සාතච්චකාරිනො** - නිතර කරණ අටඨිත කාරී. ඔවුන්ගේ සිහියෙන් නොවිසීමෙන් සතානං **සාත්‍ථක සම්පජඤ්ඤ** - සප්පාය **සම්පජඤ්ඤ** ගෝචර **සපජඤ්ඤ අසම්මෝහ සම්පජඤ්ඤ** - යන **සමපජඤ්ඤ** මේ සතර **සම්පජඤ්ඤයෙන් දන්නාවු සමඤ්ඤානානං** සතර කෙලෙස් දුරුවේ. ආසවා අත්‍ථං **ගච්ඡන්ති පරික්ඛිණ** අභාවයට යති. යන අර්ථයි.

දේශනය අවසන එම භික්ෂුහු රහත් බැව්හි පිහිටියාහුය. පැමිණි සිටි අයටද දෙසුම සාර්ථක විය.

හද්දිය භික්ෂූන් පිළිබඳ කථා පුවතයි.

21-4

"**මාතරං**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩසිටියදී ලකුණ්ටක භද්දිය තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

එක් දිනක් බොහෝ ආගන්තුක භික්ෂූහු බුදුන් දිවාකල සිටින තැනට එළඹ වැඳ එකත් පසෙක සිටියාහුය. මේ අවස්ථාවේදී ලකුණ්ටක භද්දිය තෙරුන් බුදුන් නොදුරෙන් වැඩමකළහ. බුදුහු එම භික්ෂූන් වහන්සේලාගේ සිත්තුළ ඇති වුණු අදහස් දැනගෙන බලන්න මහණෙනි. මේ භික්ෂුව දෙමාපියන් නිසා නිදුක්ලෙස යන්නේයයි පැවසීය. එම භික්ෂූන් විසින් බුදුරජාණන් වහන්සේ කුමක් කියන්නේදැයි එකිනෙකාගේ මුහුණ බලා සැක සහිතව මේ කුමක් කියන්නේදැයි විමසු විට ඔවුන්ට ධර්මය දේශනා කරමින් මේ ගාථාව වදාළහ.

තන්හාව මව මෙනි
මමය මාගේ හැඟුම පිතුමෙනි,
මිසදිටු රජුන් වැනි
නැසුම වේවා රහත් නුවණිනි,

තණ්හාව නැමති මවද - මානය නැමති පියාද - ශාස්වත උච්ඡේද නැමති ක්ෂත්‍රිය රජුන් දෙදෙනාද නසා නඳරාග නැමති අයකැමියා සහිතවු දොළොස් ආයතන නැමති රට නසා - රහතන් - නැමති බමුණ නිදුකින් නිවසයි.

එහි **සානුචරන්ති** - යනු ආදායම් ඇතිකරණ - අයකැමියා සහිත - මෙහි තණ්හාජනෙති පුරිසං - යන වචන යෙන් තුන් භවයේ සත්ත්වයන්ට ජන්මය ලබා දෙනහෙයින් තෘෂ්ණාව **මාතා** නම් මම අසවල් රජුට හෝ රාජ මහා මාත්‍යයන්ට හෝ පුතු නිසා **පිතරං** පියා නිසා අස්මිමානය උපදින හෙයින් අස්මිමානය මානය **පිතා** පියා නම්. ලෝකය මෙන් වූ රජුන්ට යම්හෙයකින්

සියළු දෘෂ්ඨි ගත - ශාස්වත උච්ඡේද ආදී දෘෂ්ටි භාජනය කරත්ද මේ දෘෂ්ටි දෙක බන්තිය රාජානො ක්ෂත්‍රිය රජවරු දෙදෙනායි. ද්වාදස ආයතන නිතර පැතිර පවත්නා හෙයින්. අයකැමියා ආයුත්තත පුරුෂයා මෙන් ද නන්දිරාග සහගත ඇල්ම ඇතිවන නිසා නුවර නම් වේ. රට සමාන හෙයින් රට්ඨං රටනම් අනුචරො අනුවර නම් අනීඝ - යනු නිදුක් යන්නයි බ්‍රාහමණො බ්‍රාහ්මණනම් ක්ෂීණාශ්‍රව. අර්හත් මාර්ග ඤාණයෙන් තෘෂ්ණාව නැසූ හෙයින් ක්ෂීණාශ්‍රව තෙමේ නිඝුකෙඛා නිදුකින් යාති සිටීයන අර්ථයි. මේ දෙසුම අවසන භික්ෂූන් අර්හත්වයට පත්වුහ.

දෙවනි ගාථාවද එම අදහසින්ම - ලකුණ්ටක භද්දිය තෙරුන් උදෙසාම දේශනාකළහ. එහි දෙව සොතීයෙ යනු බ්‍රාහ්මණයින් දෙදෙනා මේ ගාථාවේ අර්ථය බුදුහු තමන්ගේ ධර්මයේ ආධිපත්‍යය නිසා විවිධ දේශනා කුශලතාව නිසාද ශාස්වත උච්ඡේද දෘෂ්ටි බ්‍රාහ්මණ ක්ෂත්‍රිය දෙදෙනා උපමාකොට දේශනාකළහ. වෙය්‍යග්ඝ පඤ්චමං ව්‍යාඝ්‍රයන් හැසිරෙන හෙයින් උවදුරු සහිත වූ නිසා ගමන්කළ නොහැකි මග වෙය්‍යග්ඝ නම් වේ. ඊට සමාන බැවින් විචිකිච්ඡා නීවරණයද වෙය්‍යඝ නම් එය පස්වනු කොට ඇති බැවින් නීවරණ පඤ්චකය වෙය්‍යග්ඝ පඤ්චකය නම් වේ. මේ වෙය්‍යග්ඝ පඤ්චකය අර්හත් ඤාණය මගින් නැතිකිරීම අහෝසි කිරීම නිසා බ්‍රාහ්මණ නම් වෙයි. යන අර්තයි. ඉතිරි පෙරමෙනි.

ලකුණ්ඨක භද්දිය තෙරුන් පිළිබඳ කථා පුවතයි.

21-5

"සුසපබුදඛං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩසිටියදී දාරු සාකටිකගේ පුතු නිමිති කරගෙන දේශනා කළහ.

රජගහනුවර සම්මාදිට්ඨික පුතාද මිථ්‍යා දෘෂ්ටික පුතා ද යනුවෙන් දරුවෝ දෙදෙනෙක් නිතර පන්දු ක්‍රීඩාවේ යෙදෙති. මොවුන් දෙදෙනා අතරින් සම්මා දෘෂ්ටික පුත්‍රයා බෝලය දැමීමේදී බුද්ධානුස්සතිය සිහි කොට "නමොබුද්ධස්සාති" යනුවෙන් පවසා පන්දුව දමයි. අනෙකා තීර්ථක යන්ගේ ගුණය උදෙසා "නමෝ අරහන්තානං" රහතුන්ට නමස්කාර වේවායි කියා පන්දුව දමයි. ඔවුන් දෙදෙනා අතර සම්මා දිට්ඨිකගේ පුතා දිනයි - අනෙකා පැරදෙයි ඔහු ඔහුගේ ක්‍රියාව දැක මේ තැනැත්තා මෙය සිහිකොට මෙලෙස කියා පන්දු..... දමන්නේ මා පරදවයි. මම ද එසේ කරමියි බුද්ධානුස්සතිය පුරුදුකළේය. ඉක්බිති එක් දිනක් ඔහුගේ පියා කරත්තය යොදා දර සඳහා යන්නේ මේ දරුවා ද කැඳවාගෙන ගොස් කැලයේ දර කරත්තය පුරවා ආපසු එන්නේ නගරයෙන් බැහැර සොහොනක් ළඟ. ජලය පහසුතැනක ගොනුන් මුදවා ආහාර ගැනීම කළේය. ඉක්බිති එම ගොන්නු සවස් කාලයේ පුරුදු පරිදි අනෙක් ගව සමූහයාද සමග නගරයට පිවිසියාහුය. රියකරුද ගොනුන් ලුහුබැඳ ගොස් නගරයට සිවිසියේ සවස ගොනුන් දක, ඔවුන් ගෙන නික්මෙන්නේ වාසල දොර වැසීය. එකල්හි රියකරුට නගරයෙන් පිටත යා නොහැකි වුයෙන් ඔහුගේ පුතා තනිවම රාත්‍රිකාලයේ කරත්තය යටට වී නිදාගත්තේය. රජගහ නුවර ප්‍රකෘතියෙන්ම අමනුෂ්‍යයන් බහුලය. මොහු සොහොන අසල නිදාගත්තේ අමනුෂ්‍යයෝ දෙදෙනෙක් ඔහු දුටුවෝය. එකෙක් මිථ්‍යා දෘෂ්ටික හෙයින් සසුනට විරුද්ධය. එකෙක් සම්‍යක්දෘෂ්ටි නිසා සසුනට පක්ෂය ඔවුන්ගෙන් මිථ්‍ය, දෘෂ්ටිකයා මෙසේ කීවේය. අපි මොකුත් නොකෑවෙමු මොහු කමු යනුවෙනි. අනෙකා වැඩක් නැත මට රුචි නොවේ වැලැක්වීය. ඔහු අනෙකා විසින් වලක්වන ලද්දේද ඔහුගේ වචනය නොතකා දරුවා පයින් ගෙන ඇද්දේය. ඔහු බුද්ධානුස්සතිය පුහුණු හෙයින් එකෙනෙහි නමෝ බුද්ධස්සති - පැවසුවේය. අමනුෂ්‍යයා මහත් බියට පත්ව පසෙකටවී සිටියේය. අනතුරුව

අනෙකා අපවිසින් නොකට යුත්තක් කළෙමු. දඩුවමක් කරමුයි කියා ඔහු රකිමින් සිටියහ. මිථ්‍යා දෘෂ්ටිකයා නගරයට පිවිස රජුගේ භෝජන භාජනයෙන් ආහාර භාජනය පුරවාගෙන ගෙන ආවේය. ඉක්බිති දෙදෙනාම ඔහුගේ දෙමාපියන් ලෙසට උවටැන් කර කෑම කවා මේ අක්ෂර රජු දකීවා, වෙන අයකු නොදකීවා. යි එම පුවත ප්‍රකාශ කරමින් යක්ෂයන්ගේ ආනුභාවයෙන් ආහාර බඳුනේ අකුරු කොටා පාත්‍රය දර කරත්තයේම තබා මුළු රාත්‍රිය ආරක්ෂා කොට ගියාහුය.

දෙවැනි දවසේ රාජ මන්දිරයෙන් භාණ්ඩ සොරා ගත්තේයයි කෝලාහල කරමින් දොරටුවසා බලා එහි නොදක නගරයෙන් නික්මී ඔබ මොබ බලවන්නේ දර කරත්තයේ රන් භාජනය දක මේ සොරායයි එම දරුවා ගෙන රජු දක්වීය. රජු අකුරු බලා මේ කුමක්ද දරුව යනුවෙන් විමසුවේය. දේවයනි මම නොදනිමි. මගේ දෙමාපියෝ රාත්‍රි අවුත් මට කෑම දී රකිමින් සිටියාහුය. මම ද දෙමාපියන්ගේ රැකවරණය මට බිය නැතිව මම නිදාගත්තෙමි. මම දන්නේ මෙපමනකි. මේ අවස්ථාවේදී ඔහුගේ දෙමාපියෝ ද එතැනට ආවාහුය. රජු ඒ පුවත දැන ඒ තිදෙනාම ගෙන බුදුන් වෙත ගොස් සියල්ල පවසා ස්වාමීනි "බුද්ධා නුස්සතිය" කුමක්ද මෙසේ සිදු වේද නැතහොත් ධම්මානුස්සතියෙන් සිදු වේද? අනතුරුව බුදුහු මහරජ නුදු බුද්ධානුස්සතියෙන් පමණක් නොව, සහකාර වූ සිත මනාසේ වඩන ලද්දේද, ඔවුන් ආරක්ෂාවේ, අනුන්ගේ රැකවරණයකින් හෝ මන්ත්‍ර ඖෂධ ආදියෙන් හෝ කාර්යයන් නැතැයි පවසා ස්ථාන හය දක්වමින් මේ ගාථාව පැවසුහ.

දවල් රෑ හැම දින
සමරන්නෙ නම් බුදු ගුණ
බියෙන් තොර ගතියෙන
කෙනෙකි සුවසේ නිදා පිබිදෙන

යම් කෙනෙකුට රෑ දාවල් දෙක්හි බුදුගුණ භාවනාව අරමුණු කොට උපන් සිහිය ඇත්තේ ද? ඒ ගෞතම ශ්‍රාවකයෝ හැම කල්හි සුවසේ නිදා පිබිදෙති. නිතර බුද්ධගතා සතිය ඇතිවීම, ධර්මගතා සතිය, ඇතිවීම සංඝගතා සතිය

ඇතිවීම, කාය ගතා සතිය ඇතිවීම සතුන් මැරීමෙන් වෙන්වීම, කරුණ සිත ඇතිවීම යන මෛත්‍රිය වැඩීම යන කරුණු සයයි.

එහි **සුපබුද්ධං පබුජ්ඣිනති** - යනු බුද්ධගතා **සතිය** ගෙන නිදාගන්නා අවදිවන විටද බුද්ධගතා සතිය ගෙන මනාසේ අවදි වෙති. **සදාගොතම සාවකා** - ගෞතම ගෝත්‍ර බුදුන්ගේ අනුශාසනයන් ශ්‍රවණය කරන්නා අදහන්නා හා එසේම අනුසාසනා කරන්නා ගොතම ශ්‍රාවක නම්, බුද්ධගතා **සති** - යනු ඉතිපි සෝ භගවා ආදි ප්‍රභේදයෙන් බුදුගුණ ඇරබ උපදින සිහියයි. එය නිත්‍ය කාලයේ ඇත. ඔවුන් හැමදා මැනවින් අවදිවේ යන අර්ථයි. එසේ නොහැකිවන්නෝ එක් දිනක් තුන්කල්හි දෙකල්හි එක් කාලයක බුද්ධානුස්සතිය සිහිකරන්නේ සුවසේ අවදිවෙති. **ධම්මසති** "ස්වාඛාතො භගවතා ධම්මෙමා" ආදී වශයෙන් ධර්මයේ ගුණසිහි කරමින්, උපදින්නේ **ධම්මානුස්සතියයි.** ආදී ධර්මයේ ගුණ අරබයා සිහිය වඩන්නේ ධම්මානුස්සතියයි. **සංඝගතා සති** - සුපටිපන්නො භගවතො - මේ ආදී ප්‍රභේද සංඝ ගුණ නිමිත්තිකරගෙන උපදවන සිහියයි. **කායගතා සති** නම් දොළොස් ආකාර වශයෙන් ද, නවසිවථික වශයෙන්ද නැත හොත් චතු ධාතු වවත්ථාන වශයෙන්ද, ආධ්‍යාත්මික නිලකසිණාදී රූපධ්‍යාන වශයෙන්ද උපදින සතියයි. **අහිංසාය රතෝ** - ඔහු කරුණා සහගත චේතනාවෙන් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. මෙලෙස කරුණා භාවනාවේ ඇලුනේ **භාවනායානි** - යනු චෙතනා භාවනාව කිසියම් උපරිමතලයෙන් කරුණා භාවනාව කී හෙයින් මෙහි සියළු අවශේෂ භාවනා නම් මෙහිදී මෛත්‍රී භාවනාව අදහස් කරණ ලදී. ඉතිරි කොටස් කියන ලද අයුරින් දතයුතුය.

දේශනාවසානයේ ඒ දරුවා සමග දෙමාපියෝ සෝවාන් ඵලයේ පිහිටි යාහුවෙති. පසුව පැවිදිවී සියල්ලෝ අර්හත්වයට පැමිණියහ. පැමිණි අයටද දේශනය සාර්ථක විය.

දාරුසාකටික - දරකරත්ත කරුගේ පුතු පිළිබඳ කථා පුවතයි.

21-6

"දුප්පබ්බජ්ජං " යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ විශාලාවේ වැඩ සිටියදී එක්තරා වජ්ජී පුත්‍රක භික්ෂුවක් නිමිති කරගෙන දේශනා කළහ. එක්තරා වජ්ජී පුත්‍රක භික්ෂුවක් විශාලා නුවර එක්තරා වන ලැහැබක වාසය කරයි. එසමයෙහි විසාලා නුවර මුළු රාත්‍රියේම උත්සවයක් පැවතුනි එම උත්සව අවස්ථාවේ විසාලාවේ කරන ලද තූර්ය වාදන ගායන ශබ්දයන් අසා අඩමින් එම අවස්ථාවේදී මේ ගාථාව පැවසුහ.

කැලයේ ඉවත විසිකරණ ලද දරලියක් සේ නුදකලාවම මම ආරණ්‍යයේ වාසය කරමි. මෙබඳු පව්කාරයන්ට දිලිසෙන රාත්‍රියක් කොයින්ද?

ඔහු වනාහි වජ්ජි රටේ රාජ පුත්‍රයෙකි. වාරයට පැමිණි රාජ්‍ය තනතුර අත්හැර දමා පැවිදි වුයේය. විසාලා මහනුවර චාතුර්මහාරාජික දෙව්ලොව සමග ඒකාබද්ධ කලාක්මෙන් මුළු නුවර ධජ පතාකාදියෙන් සරසා ඉල්මස පුරපසළොස්වක් පොහෝදින මුළු රාත්‍රි උත්සව පවතිනවිට බෙර ආදී තූර්ය වාදනය වනවිට වීණා ආදී වාදක ශබ්දය අසා යම් විශාලාවේ හත්දහස් සත්සියයක් රජවරු එම රටේ යුවරාජ සේනාපති ආදීන් අලංකාර කළ සිරුරු ඇතිව නැකැත් කෙළි සඳහා වීථියට බැසගත් විට. සැටරියනක් මහා සක්මනේ සක්මන් කරමින් සිටිද්දී අහස මැද සිටි පුන් සඳ දැක සක්මන් මළුවේ කෙලවර ඵලකය නිසා එහි ආධාරයෙන් සිටියේ අලංකාර වස්ත්‍රාභරණයන්ගෙන් විරහිතවූ, වනයේ විසිකරණ ලද දර කැබැල්ලක්සේ තම ආත්මභාවය බලා අතීතය මතක් වී, මට වඩා ළාමක කෙනෙක් නවත් ඇත්දැයි සිතන්නේ, ප්‍රකෘති වසයෙන්, ආරඤ්ඤික ගුණ ඇති භික්ෂුව තුළ ඇතිවූ අකමැත්ත උකටලී බව දුටු එම වන රොදේ අධිගෘහිත දෙවියා මේ භික්ෂුව සංවේගයට පත්කරමියි යන අදහසින් එකකො ත්‍වං අරඤ්ඤේ විහරසි.

වනයේ අත්හැර දමන ලද දරකඩක් ලෙස ඔබ හුදෙකලාව වනයේ වාසය කරයි. ස්වර්ගගාමී වූ නිදොස් වූ ඔබවහන්සේ කෙරෙහි. බොහෝදෙනෙක් විසින් ප්‍රියකරණු ලැබේ. නිරයේ ඉපැත්ම ඇත්හැර ස්වර්ගගාමී වන්නේය.

මේ කියන ලද ගාථාව අසා දෙවැනි දිනයේ දී බුදුන් වෙත එළඹ වැඳ වාඩිවූහ. ශාස්තෘන් වහන්සේ එම පුවත දැන ගිහිගෙයි විසීමේ දුකඛිතබව ප්‍රකාශ කිරීමට ෂඩ්විධ දුක් කැටිකොට මේ ගාථාව පවසා වදාළහ.

මහණකම අමාරුයි - ඇලීමත් එහි අසිරුයි.
අමාරුයි තව ටිකක් නො ගැලපෙන්නන් හා විසීමත්
මේ හැමට වඩාමත් අමාරුයි වාසෙ ගිහිගේ
කළයුතු එකම දේ රහත් වීමෙන් නිවීමයි.

පැවිද්ද අපහසුය. සිත් ඇලවීම දුකසේ කළයුතුය විසිම අපහසුය ගිහිගේ එයට වඩා දුක් සහිතය අසමාන අදහස් ඇත්තවුන් හා විසීම අපහසුය. දික් වූ සසර මගට පිළිපන්නෝ දුක විසින් ලුහු බඳිනු ලබති. එනිසා දික් වූ සසර ගමන් කරන්නෙක් හෝ, පසුපස එළවා ගෙන එන දුක් ඇත්තෙක් නොවිය යුතුය.

එහි **දුප්පඛඡ්ජනතී** - අල්පවූහෝ මහත්වූ භෝගයන් ද ඤාති සමූහයා ද අත්හැර මේ සසුනේ උරදී පැවිදිවීම නම් දුකකි. **දුරභිරමං**" යනු මෙසේ පැවිදිවුවහු විසින් භික්ෂාවෙන් ජීවිතය ගෙවීම ගැටෙමින් උත්සාහ කරමින් අපමණ සීලක්ඛන්ධය රැකීම ධම්මානු ධර්ම ප්‍රතිපත්ති පූරණයෙහි ඇලීම දුකකි. **දුරාවාසා** යම් හෙයකින් ගිහි ගෙයක වාසය කරන්නේ රජවරුන්ට රාජ කෘත්‍යය ඉසුරුමත් අයට ඊශ්වර කෘත්‍ය දැරිය යුතුය පරිජනයන්ට මෙන්ම ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට සංග්‍රහ කළයුතුය. මෙසේ නිවිට ගෘහ වාසයද සිදුරු කළයක් සේ මහා සමුද්‍රයක් සේ පිරවිය නොහැකිය. මේ නිසා ගිහිගෙයි විසීම දුරාවාසය විසීම දුකකි. මේ කරුණින්ම දුකයි යන අර්ථයි. **දුක්ඛා සමාන සංවාසෝ** ජාති ගෝත්‍ර කුලභෝගාදියෙන්ද පැවිද්දෝ සීලාචාර, බහුශ්‍රැත ආදී සමානයෝ ඔබ කවුද මමකවුද ආදිය කියා අධිකරණ විභාග කෙරේ ඔවුන් අසමාන නම් වේ. එවැනි අසමාන අය හා එකට විසීම

දුකක්වේ යනු අර්ථයි. **දුක්ඛානුපති නද්ධගූ** යමෙක් විටිට සංඛ්‍යාත දුරගමනට පිළිසන්නහු (දුරගමන) සසර ගමන දුකට වැටීමකි. එනිසා නවඛගූ - යනු යම් හෙයකින් දුකට අනුපතිත බවම දුකකි. සසර නැමති දිගු ගමන යාම සඳහා නොවන්නේ කියන ලද ආකාරයට දුකෙන් අනුපතිත වුවද නොවේ යන අර්ථයි.

දෙසුම අවසන එම භික්ෂුව පඤ්ච ස්ථාන යන්හි දක්වන ලද දුකෙහි කළකිරුනේ පඤ්ච ඕරම්භාගිය ආදී සංයෝජන පළවා අර්හත්වයෙහි පිහිටියේය.

වජ්ජි පුත්තක භික්ෂුවගේ කථා පුවතයි.

21-7

"සද්ධානි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී විත්ත ගෘහපති නිමිත් කරගෙන දේශනා කළහ.

කථා වස්තුව බාලවර්ගයේ **"අසතං භාවන මිච්ඡෙය්‍ය"** යන ගාථා වර්ණනය විස්තර කරණ ලදී ගාථාවද එසේම කියන ලදී. ස්වාමීනි කුමක්ද ඔබ වහන්සේ වෙතට පැමිණි නිසා මොහුට ලාභ සත්කාර ලැබුනේද නැත හොත් අන්තැනක ගියද උපදීද? ආනෑඳ මාලඟට ආවාවු අයටද අන්තැනක ගිය තැනැත්තන්ටද ලාභ උපදී. මේ උපාසක තෙමේ ශ්‍රද්ධාවත්ය ප්‍රසන්නය. **සීල** සම්පන්නය. මෙබඳු අය යම් යම් දිසාවක් සේවනය කරයිද ඒ ඒ තැන ලාභසත්කාර උපදවයි. කියා මේ ගාථාව පැවසුහ.

සීලය සැදෑනැ ගුණ
දන්දීම - දන සම්පත
තියෙන කෙනෙකුන්හට
නිතැනින් ලැබේ බුහුමන්.

ශ්‍රද්ධාවෙන් සීලයෙන් යුත් කීර්තිමත් ධනධාන්‍ය දී ලෞකික ධනයෙන් හා ශ්‍රද්ධා ශීලදී ආර්ය ධනයෙන් යුත්තවු යමෙක් යම් යම් ප්‍රදේශයක් භජනය කරයිද ඒ ඒ තැනගේ පුදන ලද්දේවෙයි.

එහි **සද්ධා** - යනු ලෞකික ලෝකෝත්තර වූ ශ්‍රද්ධාවෙන් යුතු වූයේ **සීලෙනා** යනු අගාරික සීලය - අනගාරික සීලය දෙයාකාර සිල් වලින් මෙහි අගාරික සීලය අදහස් කරණ ලදී. ඉන් යුතු වූයේ යන අර්ථයි - **යසො භොග සම්පජිනො** යම් ඒ අතේ පිඬු සිටුවරයා ආදී පන්සියයක් උපාසකවරු පිරිවැරුවේ. ගිහි සැප කීර්තිය හා සප්තවිධ ආර්ය ධන සංඛ්‍යාත ද්විධ භෝගයන් ගෙන් සමන්නාගත වූයේ යන අර්තයි. **යංයං පදෙසංති** නැගෙන

338

හිර ආදී දිසාවන් මෙබඳු කුල පුත්‍රයෙක් සේවනය කරයිද ඒ ඒ තැන්වල මෙබඳු ලාභ සත්කාරයෙන් පුදන ලද්දේ වෙයි යන අර්ථයි.

චිත්ත ගෘහපති පිළිබඳ වූ කථා පුවතයි.

21-8

"දූරෙ සන්තෝනි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටියදී අනේ පිඬු සිටුවරයාගේ දූ වූ චුල්ල සුභද්‍රාව නිමිති කරගෙන දේශනා කරණ ලදී.

අනේ පිඬු සිටුවරයාගේ ළමා අවදියේ සිට උග්ග නගරවාසී උග්ගනම් සිටු පුත්‍රයෙක් මිත්‍රව සිටියේය. ඔවුහු එකම ආචාර්ය කුලයක ශිල්ප ඉගෙන ගනිද්දී එකිනෙකා මෙසේ කථිකා කරගත්හ. අපි වයසට ගිය කල දූ පුතුන් ඉපදුනවිට යමෙක් පුතුට දුවක් සොයයිද අනෙකා විසින් දියණිය දියයුතුය. යනුවෙනි. මේ දෙදෙනාම වැඩුන පසු ඒ ඒ නගරවල සිටුතනතුරුවලට පත්වූහ. මෙ අතර එක්කලෙක උග්ග සිටුවරයා වෙළඳාමේ යෙදෙන්නේ පන්සියයක් ගැල්ගෙන සැවැත් නුවරට ගියේය. අනේ පිඬු සිටුවරයා තමාගේ දූ චුල්ල සුභද්‍රා කැඳවා දරුව ඔබේ පියාවන උග්ගසෙටුගේ පැමිනියේය. ඔහුට කළයුතු සියළු කාර්යයන් ඔබට පැවරේයයි අණ කළේය. ඇය යහපතැයි පිළිගෙන ඔහු පැමිණ දිනසිට සිය අතින්ම බත් ව්‍යඤ්ජන ආදිය පිළියෙල කරයි. මල්ගඳ විලවුන් ආදිය සපයා දෙයි. භෝජන කාලයේ දී ඔහුට ස්නානය සඳහා ජලය පිළියෙළ කරයි. නාන තැන්සිට සියළු කටයුතු මැනවින් ඉටු කරයි. උග්ග සිටුවරයා ඇගේ ආචාර සම්පත්තිය දැක පැහැදුන සිත් ඇත්තේ එක් දිනක් අනේ පිඬු සිටුවරයා සමග සතුටු කථාවේ යෙදෙමින් සිටියේ අපි තරුණ අවදියේ දී මෙබඳු කථිකාවක් කළෙමු. සිහිකොට චුල සුභද්‍රාව තමන්ගේ පුතුට යෝජනා කළේය. ඔහු ප්‍රකෘතියෙන්ම මිථ්‍යා දෘෂ්ටිකය. එනිසා බුදුන්ට මේ කරුණ දක්වා - සිටිවිට බුදුහු උග්ග සිටුවරයාගේ උපනිශ්‍රය සම්පත් දැක අනුමත කළ විට, බිරිඳ සමග කතිකාකොට ඔහුගේ වචනය පිළිගෙන දවසක් තබා දුවනිය විශාඛාවට බාර දී උනන්දු කරවන්නේ ධනංජය සිටුවරයාමෙන් මහත් සත්කාර කොට සුභද්‍රාවට කථා කොට දරුව නැන්දාගේ කුලගෙයි වසන අයනම් ඇතුළත ගිනි පිටකිරීම නොකළ යුතුය. ආදි ධනඤ්ජය සිටුවරයා විසාඛාවට දෙනලද ක්‍රමයටම අවාද දසය දී. ඉදින් මගේ දුවගේ දොසක් ඇතිවේද නොපවිසින් ශුද්ධ කල යුතුයයි කෙළෙඹියන් අටදෙනෙක් වෙන්කරදී ඇය පිටත්ව යන

340

දිනයේ බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට මහදන් දී පෙර භවයේදී දියණිය කළ සුචරිත ඵල විභූතිය ලොවට හෙළි කොට දක්වන්නාක් මෙන් මහත් සත්කාරයෙන් දුවණිය පිටත්කළ හැරියේය. ඇය අනුපිළිවෙලින් උග්ග නගරයට පැමිණිකළ නැන්දනියන් ගේ කුළයෙ අය සමග මහජනයා පෙරගමන් කළහ. ඇයද තමන්ගේ ශ්‍රී සම්පත් ප්‍රකට කිරීමට, විශාඛාව මෙන් මුළු නගරයට තමන් ප්‍රදර්ශනය කරන්නී රථයේ සිට නගරයට පිවිස නාගරිකයන් එවන ලද තුටු පඬුරු ගෙන සුදුසුලෙස ඒ ඒ අයට යවන්නී. මුළු නුවර තමන්ගේ ගුණ හා ඒකාබද්ධ කළාය. මංගල දවස්හි වනාහි නැන්දනියෝ අවේළකයින්ට සත්කාර කරමින් පැමිණ අපේ ශ්‍රමණයන්ට වදින්නැයි යැවුවාය. ඇය ලජ්ජාවෙන් නග්නවූ නිවටුන් දැකීමට නොහැකිව යාමට කැමති නොවූවාය. ඔහු (මාමා) නැවත නැවත යවාද ඇයවිසින් ප්‍රතික්ෂෙප කලේ කිපී ඇය පිටකරන්නැයි කුටුම්බිකයින් කැඳවා මේ කරුණ දන්වා සිටියේය. ඔවුහු ඇගේ නිදොස්බව දැන සිටුවරයාට දැනුම් දුන්හ. ශ්‍රමණයින් ලජ්ජා නැති අයයයි නො වඳී උග්ගසේන භාර්යාවට දැනුම් දුන්නේය. ඕතොමෝ ඔබේ ශ්‍රමණයෝ කෙබඳුද ඔවුන්ගේ ප්‍රසංගනීය බව කෙසේද යයි ඇය කැඳවා විමසුවේය. ඔබේ ශ්‍රමණයෝ කවරාකාරද ඔබ බෙහෙවින් පසසන ඒ ශ්‍රමණයන්ගේ සිල්කෙසේද මවුන්ගේ පැවතුම්ද මට කියා දෙන්න.

අනතුරුව සුභද්‍රාව බුදුන්ගේ ද බුද්ධ ශ්‍රාවකයින්ගේද ගුණ ප්‍රකාශ කරමින් මෙලෙස පැවසුවාය.

ඉන්ද්‍රිය සංවරය, මනස සංසුන්ය - යන එන සිටින විට බිමට හරවාගත් ඇස් වෙති. ශ්‍රමණයෝ පමණට කරාකරණ අයයි - මගේ ශ්‍රමණයෝ එබඳුය. මගේ ශ්‍රමණයෙන් වහන්සේලා කයින් පිරිසිදුය. වචනයෙන් පිරිසිදුය. නොකැළල් අයයි මනස පිරිසිදුය. මගේ ශ්‍රමණයෝ එබඳුය.

ලෝකයේ මිනිස්සු ලාභයෙන් උඩගුවේ. අලාභයෙන් යට පත්වූපැව තුම්ඇත්තේ වී හිත් දුෂ්‍ය වේ. මගේ ශ්‍රමණයෝ ලාභ අලාභ දෙක්හිදීම එක සමානය. වෙනස් නොවේ. ලෝ වැස්සෝ යසසින් සම්පත් වලින් උඩඟු වේ. සම්පත් පිරිහුණු විට කළකිරේ. දුෂ්‍ය වේ. මාගේ ශ්‍රමණයෝ යස අයස

දෙක්හිදීම එකම ස්ථානය වෙනස් නොවේ ප්‍රශංසා වෙන් ලෝකයා උඩගුවේ. නින්දාවෙන් පහත්වේ දුකට පත්වේ. එහෙත් මගේ ශ්‍රමණයෝ නින්දා ප්‍රසංසා දෙකේදීමසම ස්ථානව සිටිති.

සැපයෙන් ලෝකයා උඩගුවේ. දුකෙන් අවනත වේ. සැපදුක් දෙකේදීම මගේ ශ්‍රමණයෝ එක හා සමාන සිටිති. මෙබඳු වචන වලින් නැන්දනිය. සතුටු කලාය.

අනතුරුව ඔබේ ශ්‍රමණයින් අපටද දක්වීමට හැකිදැයි කියා හැකිබව පැවසුවිට එසේනම් යම්සේ අපට පෙනෙන ලෙසට කරන්නැයි පැවසුවිට ඇය බුදුන් ප්‍රධාන මහා සංඝයාට මහදනක් සකසා ප්‍රාසාදයේ මතුමහලේ සිට ජේතවනා රාමයට අභිමුඛව සකසා පසඟ පිහිටුවා වැඳ බුදුගුණ සිහිකර සුවඳ දුම් පූජාකර ස්වාමීනි හෙට දානය සඳහා බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට ආරාධනාකරමි. මේ දැනුම් දීමෙන් බුදුන්ට ආරාධනා කළබව දැනගනිවා යි දැ සමන් මල් අඳුමිටක් අහසට දැමීය. මල් අහසින් ගොස් සිටුපිරිස මැද ධර්මය දේශනා කරණ බුදුන්ගේ මතුවේ මල් වියනක් ලෙස පිහිටියේය. එකෙණෙහි අනේ පිඬුසිටුවරයාද ධර්ම කථාවක් අසා හෙට දනට ආරාධනා කළේය. බුදුහු ගෘහපතිය මම බාරගන්නා ලදී. පැවසුවිට ස්වාමීනි මම පළමුව පැමිණ ආරාධනා කළෙමි. මට පළමු කිසිවෙක් පැමිණියේද විමසුවිට, චුල්ලසුභද්‍රා ආරාධනාකළේයයි පවසා ස්වාමීනි චුල්ල සුභද්‍රා යොදුන් එකසිය විස්සක් දුර වාසය කරයි. එසේය ගෘහපතිය දුරස්ව සිටියද සත් පුරුෂයෝ ඉදිරියේ සිටියාසේ ප්‍රකාශ කරති පවසා මේ ගාථාව පැවසුවාය.

සිටිනත් කොතැන යහපත්දන දුර	බැහැර
සමනළ කන්ද මෙන් පැහැපත් වෙයි	නිතර
යහපත් නොවන අය ලඟ සිටියත්	වැනිර
හියක් වැන්න රැ විදි රජයන	අඳුර

සත්පුරුෂයෝ දුර සිටියේ වී නමුත් හිමාලය පර්වතය මෙන් පෙනෙත්. අසත් පුරුෂයෝ ළඟ සිටියද, අඳුරේ විදි රජතළ මෙන් නොපෙනේ.

එහි **සනෙත** - රාගාදි ක්ලේශයන්ගෙන් වෙන්වූ නිසා බුද්ධාදි උතුමෝ **සන්ත** නම් වේ. මෙහි දී පුර්ව බුදුවරු කරණ ලද **අධිකාර** ඇති මතුවූ කුශල මුල් ඇත්තේ පුරුදු කරණ ලද භාවනා ඇත්තේ යන අදහසයි. **පකාසන්ති** දුරසිටියද බුදුවරුන්ගේ ඤාණපථය ප්‍රකට වේ. **හිමවන්තෙනාව** යම් සේ තුන්යොදුන් දහසක් පළල යොදුන් පන්සියයක් උස කුළුපර්වත අසුහාර දහසක් ඇති හිමවත දුරවුවත් ළග පිහිටියේ වෙයි. **අසන්තෙත්ථා** - දිවය ධම්ම ගරුක පරලොව දිනූ ආමිස ඇස් ඇති ජීවත්වීමට පැවිදිවූ බාල පුද්ගලයෝ අසනත නම් ඔවුහු බුදුන්ගේ දකුණු දණමණ්ඩලය අසල සිටියද දක්නට නොලැබේ. **රත්තිංඛිනතා** - චතුරංග සමන්නාගත **ඝනඅන්ධ කාරයේ** විදී හී තලයක් මෙන් නොපෙනේ. සමහර උපනිශ්‍රය සම්පත් පූර්ව හේද නිසා අභාවයට යාමෙක් නොපෙනේ යන අර්ථයි. දේශනාවසානයේ බොහෝ දෙනා සෝවාන් ඵල ආදී මාර්ග ඵලයන්ට පැමිණියාහුය.

සක්දෙව් රජ බුදුහු චූලසුභද්‍රාව ගේ ආරාධනය පිළිගත් බව දූන විශ්වකර්ම දෙව් පුතුට අණකලේය. කුළු ගෙවල් පන්සියයක් මවා හෙට දින බුදුන් ප්‍රමුඛ සංඝයා උග්ගහ නගරයට පමුණුවන ලෙසට, - විශ්වකර්ම දෙව් දෙවන දිනයේ කුළුගෙවල් පන්සියයක් නිර්මිත කොට දෙවිරම දොරටුව අබියස සිටියේය. බුදුහු පන්සියයක් රහතන් වහන්සේලා පමණක් තෝරාගෙන පිරිවර සහිත කුයාගාරවල වාඩිවී උග්ගනගරයට වැඩමකළහ. උග්ග සිටුවරයාද පිරිවර සහිතව සුභද්‍රාව ක්‍රියන ලද කුමය අනුව බුදුන් වඩින මග බලමින් සිටින්නේ බුදුහු මහත් ශ්‍රී සම්පතින් වඩිනු දැක වැඳ පැහැදුන සිතින් මල් ආදියෙන් පුදා පිරිවර සහිතව පිළිගෙන වැඳ මහදන් දී නැවත නැවත ආරාධනා කර සත් දිනක් මහදන් පුජාකලේය. බුදුරජාණන් වහන්සේද සුදුසු බව සලකා ධර්මය දේශනා කළහ. ඔහු මුල්කොට අසුහාරදහසක් ප්‍රාණීන්ට ධර්මාව බෝධය විය. බුදුහු සුභද්‍රාවට අනුග්‍රහ පිණිස නුඹ මෙහි වසන්නැයි අනුරුද්ධ තෙරුන් නතර කර සැවැත් නගරයටම වැඩම කළහ. එතැන්සිට එම නගරය ශ්‍රද්ධා සම්පන්න නගරයක් වූයේය.

චුල්ල සුභද්‍රාවගේ කථා පුවතයි.

21-9

"එකාසනනති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී එක විහාරික තෙරුන් නමි තෙරනමක් නිමිති කරගෙන දේශනාකළහ.

එම තෙරුන් වහන්සේ වනාහි එකලාව සයනය කරති. එකලාව තනියම වාසිවෙති. එකලාව සක්මන් කරති. තනියම සිටිතියි. සිවුපිරිස අතර ප්‍රසිද්ධවිය. අනතුරුව ඉක්බිති භික්ෂූන් වහන්සේලා මෙබඳු ස්වරූප ඇති තෙරනමක් සිටියයි බුදුහුන්ට දැනුම් දුන්හ. බුදුරජාණන් වහන්සේ සාධු - සාධු - යයි සාධුකාරදී භික්ෂූන් නම් විවේකී විසිය යුතුය. විවේකයෙන් සිටියයුතුයයි විවේකයේ අනුසස් කියා මේ ගාථාව පැවසුහ.

පිරිස් මැද වූවද
කරදර කෙතෙක් ආවද
තමන් තනිවම හිද
තම කමටහන වැඩුමද

එකලාව හැසිරෙමින්
තමන් දමනය තමා කරනොත්
ඒ මහණහු ලොවේ
උතුම් මහණෙක් වේමැයි.

ආත්ම දමනය කරන තැනැත්තා තනිව හිඳීම, තනිව ගෙවීම, තනිව හැසිරීම, කරන්නේය. නො මැළි වුයේ තනිවම හැසිරෙන්නේය. දුර වනයේම ඇලුණෙක් වන්නේය.

එහි **එකාසනං එකසෙය්‍යං** භික්ෂූන් වහන්සේලා දහසක් මැද වුවද මුල කර්මස්ථාන අත්නොහැර එම මනසිකාරයෙන්ම සිටින තැනැත්තා ඒකාසන නම් වේ. ලෝහ පාසාදය සමාන වූ ප්‍රාසාදයක භික්ෂූන් දහසක් මැද පනවන

ලද විසිතුරු ඇකිතිරිලි වලින් යුත් මාහැඟි සයනයේ වුවද - සිහිය පිහිටුවාගෙන දකුණ ඇලයෙන් මූල කර්මස්ථාන සිහිකරමින් නිදන භික්ෂුවට එක සෙය්‍ය මෙබඳු ඒකාසනයම ඒක සෙය්‍යාවම භජනය කරයි යනු අර්ථයි. **අනඤ්ඤනෝ** දණහිස් වල බලය නිසා දිවි ගෙවීමට කුසීන නොවී සිව් ඉරියව්හි නුදෙකලාවම හැසිරේයන අර්ථයි. **එකොදමයනනි** - රාත්‍රි ස්ථාන ආදියේ කමටහන්වල යෙදී මාර්ග ඵල ආදී වශයෙන් එකලාව ආත්මය දමනය කරමි යන අර්ථයි. **වනනෙත රමිනෝ සියා** - මෙසේ තමන් දමනය කරන්නේ ස්ත්‍රී පුරුෂ ආදීන්ගෙන් වෙන්වූ විවේකී වූ වනයෙහි ඇලුනේ වෙයි. බොහෝ අය වාසය කරණ ජනාකීර්ණ වූ විහාරයක ආත්ම දමනය කිරීම අපහසුය යන අර්ථයි.

දේශනය අවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පැමිණියහ. එවක් පටන් උන්වහන්සේ ඒකවිහාරියයි ප්‍රසිද්ධවිය.

ඒක විහාරික තෙරුන් පිළිබඳ වූ කථා පුවතයි.

ප්‍රකීර්ණක වර්ග වර්ණනය නිමාවිය.

විසිඑක් වැනි වර්ගයයි.

22-1

"අහුන වාදිනි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර දෙවිරම වැඩසිටියදී සුන්දරී පරිබ්බාජිකාව නිමිත්තකරගෙන දේශනා කළහ.

මහා ජනයා විසින් බුදුරජාණන් වහන්සේ සත්කාර කරණ ලද්දේ ගරු බුහුමන් කරණ ලද්දේ පුදන ලද්දේ වුහ. වැඩි විස්තර උදාන පාලියේ සඳහන් පරිදිය. මේ කෙටි විස්තරයයි. භාග්‍යවතුන් වහන්සේට මෙන්ම භික්ෂු සංඝයාටද පස්මහ නදියේ සැඩ දිය පහරසේ ලාභ සත්කාර ලැබෙන විට එලෙස ලාභ සත්කාර නොලැබ අහේනියට පත්වූ අන්‍යතීර්ථකයෝ සූර්ය උදාවේදී කලාමැදිරියන් සේ ප්‍රභාරහිතව ගියාහුය. අපි සිටින බවක් වත් කිසිවෙක් නොදනී. කෙසේ නම් කවුරුන් හෝ සමග එකතුවී ශ්‍රමණ භවත් ගෞතමයන්ට නින්දා අපහාස අත්කර ලාභ සත්කාර අතුරුදහන් කරන්නේදැයි කථාකරන්නට වුහ. මෙසේ කථාකරන අතර මෙබඳු අදහසක් ඇතිවිය. සුන්දරිය සමග එකතුවී හැකිවෙනැයි සිතූහ. මේ අතර එක් දිනක් සුන්දරී පරිබ්බාජිකාව තීර්ථකාරාමයට පැමිණ වැඳළා සිටියත් තීර්ථකයෝ ඇය සමග කථා නො කළහ. ඇය නැවත නැවත කථාකරන්නී වුවද ප්‍රතිවචනයක් නොලැබ ආර්යනි කවර හේතුවක්නිසා මෙසේ මුසුප්පු වන්නේද, වෙහෙසන්නේදැයි විමසුවාය. ඇයි නැගණිය ශ්‍රමණ ගෞතමයන් අපව පෙලා, අපට ලැබෙන ලාභ සත්කාර පිරිහෙලා ඇති බව ඔබ නොදන්නීද? ඉතින් ම විසින් මෙහිදී කුමක් කළයුතුද නැගණිය ඔබ රුමත්ය. සෝභාවත්ය. ශ්‍රමණ භවත් ගෞතමයන්ට අපකීර්තිය ඇතිකොට මහජනයා ඔබගේ කථාවට නම්මවා ගෙන, ග්‍රහණය කරගෙන, ඔහුට ලාභසත්කාර නැතිවන තැනට කටයුතු කරන්නැයි පැවසූහ. ඇය යහපතැයි පිළිගෙන එතැන් පටන් සුන්දරිය මල්ගද විලපුන් කපුරු කකුල් ආදිය ගෙන්වාගෙන, මහාජනයා ශාස්තෘන් වහන්සේ ගෙන් බණ අසා ගෙවල් වලට යන සවස කාලයේ, ඔවුන්ට පෙනෙන සේ ජේතවනාරාම ය දෙසට යයි. කොහේ යන්නේදැයි විමසුවිට ශ්‍රමණ භවත් ගෞතමයන් වෙතයයි ද ඔහුසමග මම එකම ගඳකිළියේ වසමුයි ද කියා, අන් තීර්ථක ආරාමයක සිට උදැසනම

දෙව්රම් මාවතට පිවිස නගරය දෙසට ගමන් කරයි. මිනිසුන් ..... සුන්දරිය කොහේ ගියේ දැයි විමසනවිට - මම ශ්‍රමණ භවත් ගෞතමයන් හා එක ගඳකිළියේ සිට ඔහු රමණයෙන් සතුටුකොට ආපසු එමියි පවසයි. අනතුරුව ඔවුන් දිනකිපයකට පසුව ඥාතකයන්ට කහවණු දී "යම් සුන්දරිය මරා ශ්‍රමණ භවත් ගෞතමයන්ටත් ගඩ කුටිය අසල මල් දමන කසල ගොඩේ දමා එනු" යනුවෙන් කීවාහුය ඔවුහු එසේ කළහ. අනතුරුව නිර්ථකයෝ සුන්දරී දක්නට නැතැයි උද්ඝෝෂණය කොට රජුට දන්වා, තෙපි කවුරුන් සැක කරන්නේදැයි විමසුවිට, පසුගිය දිනවල ඇය ජේතවනයේ විසුවාය දැන් ඇගේ නොරතුරක් නොදනිමුයි කීහු, එසේ නම් යවු, ඇය සොයන්නයි රජු විසින් අනුමත කළේය, තමන්ගේ උපස්ථායකයින් රැගෙන දෙව්රමට ගොස් සොයන්නේ මල් ගොඩ උඩ ඇය දක, ඇඳක තබාගෙන නගරයට ගෙනගොස්, ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ" බුදුන් කළ පාපකර්මය වසමුයි" සුසැදරිය මරා මල්ගොඩ අස්සේ තබනලදැයි රජුට දැනුම් දුන්නාහුය. රජතුමා එසේ වී නම් තෙපි නගරයේ මෙය කියා ඇවිදින්නැයි කීවේය. ඔව්හු ද නගර වීදිවල බලන්න ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ වැඩ බලන්නැයි නගරයේ කියා නැවත රජුගේ මාලිගාව දොරටුවට ගියහ. රජතුමා අමු සොහොනෙහි මැස්සක් තනවා සුන්දරීගේ සිරුර ආරක්ෂා කරවීය. සැවැත් නුවර වාසීන් අතර ආර්යයන් හැර සෙසු අය බලන්න. ගෞතම පුත්‍රයන්ගේ මහිමය මේ ආදිය කියා ඇතුළු නගරයේ මෙන්ම පිටත නගරයේ වසන, අනෙක් භික්ෂූන්ටද ආක්‍රොශ කරති. නගරයේ ගමේ සැරිසරන භික්ෂූහු මේ පුවත බුදුන්ට දැනුම් දුන්හ. එසේනම් තෙපි ඒ මනුෂ්‍යයන්ටම ප්‍රතිචෝදනා කරවු. යනුවෙන් පවසා මේ ගාථාව පැවසුහ.

කළ වරද නො පිළිගෙන
වරද කර බොරු කියන
නිහිනගති ඇති දෙදෙන
රැදෙයි මහ නිරයේම මතුදින

බොරු කියන්නාද, යමක් සිදුකොට නොකෙළෙමියි කියන නැනැත්තා ද නිරයට යති. නිහින කර්ම ඇති මේ දෙදෙනාම පරලොව දී සමාන වේ. එහි - අහුන වාදිනි - අන් අයගේ දොස් නොදැක බොරු ගොතා සිත් ලෙස

අන්අයට පීඩා කරණ අය කත්වාති යමෙක් පව්කම් කරනැත එසේ නොකෙලෙමියි කියන අය **පෙච්චසමා භවනති** මේ දෙපිරිසට පරලොව ගොස් සමාන වෙති. පැවතුම් ස්වභාවයෙන්ද ආයුෂයෙන්ද එක සමාන බවම නියම වේ. බොහෝ දෙන පව්කම් කොට බොහෝකලක් නිරයේ පැසෙති. ස්වල්පයක් කර ස්වල්පකාලයක් ගතකරති. යම් හෙයකින් ඔවුන් ලාමක කර්මයක්ම කෙරේ. **"නිහින කම්මා මනුජා පරහථා"** එම පදයට පෙර පදය හා සම්බන්ධ වේ. මුල් අයද පසුඅයද මෙයින් ගොස් **පෙර** කර්ම නිසා පරලොවදී සමානවෙති යන අර්ථයි. දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පත්වුහ. රජු සුන්දරිය කවුරුන් විසින් මරවන ලදදැයි සොයා බැලීමට රාජ පුරුෂයන් යෙදවීය. අනතුරුව ඒ ධූර්තයෝ එම කහවනු වලින් රා බොමින් එකිනෙකා කෝලාහල කරගත්හ. එකෙක් **අනෙකාට** කීවේය. නුඹ සුන්දරිය එකම පහරකින් මරා මල්ගොඩ අතර තබා ඉන් ලැබූ කහවනුවලින් රා බොයි. හොඳයි හොඳයි රාජපුරුෂයෝ එම ධූර්තයන් ගෙන රජුට දැක්වුහ. රජතුමා ඔවුන්ගෙන් තෙපි සුන්දරී පරිබ්‍රාජිකාව මැරුවේ දැයි විමසීය. එසේය දේවයනි ! කවුරුන් විසින් මරවන ලද්දේද? දේවයනි - තීර්ථකයන් විසිනි, රජු තීර්ථකයන් කැඳවා තෙපි නගරයේ ඇවිද මෙසේ කියවු - මේ සුන්දරිය බුදුන්ට අපකීර්තිය ඇතිකරලීම සඳහා අප විසින් මරවන ලදී. ශ්‍රමණ භවත් ගෞතමයන් හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයින් විසින් නොකරණ ලදී. ඔවුන්ගේ වරදක් නැත. වරද අපේමය - යනුවෙන් ඔවුන් විසින් පවසන ලදී. අනුව්‍රණ මහජනයා එදා පිළිගත්හ. තීර්ථකයන් **"පුරිසවධ"** දඬුවම් වලට ලක්කළහ. එතැන් පටන බුදුරජාණන් වහන්සේට මහාසත්කාර ලැබුනි.

සුන්දරී පරිබ්බාජිකාවගේ කථා පුවතයි.

22-2

"කාසාව කණ්ඨා" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩසිටියදී දුශ්චරිත නිසා දුශ්චරිතවල ප්‍රතිඵල වසයෙන් පෙළුන සත්ත්වයන් නිමිත්තකරගෙන දේශනාකළහ.

ආයුෂ්මත් මහමුගලන් තෙරුන් විසින් ලක්ෂණ තෙරුන් සමග ගිජුකුළු පව්වෙන් බසිනවිට අටයි සංඛලික ප්‍රේත ආදීන්ගේ ආත්මභාව දැක සිනා පහල කරන්නේ ලක්ඛණ තෙරුන් විසින් සිනා පහළ කිරීමට හේතු විමසුමෙන් ඇවැත්නි මේ සුදුසු කාලය නොවේ. බුදුන් හමුවේ මගෙන් මේ පිළිබඳව විමසන්නැයි කීය. ලක්ඛණ තෙරුන් ද එය සිත තබාගෙන තථාගතයන් ඉදිරියේදී තෙරුන්ගෙන් විචාරණ ලද්දේ. ඇවැත්නි මම ගිජුකුළු පව්වෙන් බසද්දී තුන් සිවුරු පාත්‍රා ගිනි ගෙන දිලිසෙන්නාවූ ඇට සැකිලිපමණකින් යුත් භික්ෂු භික්ෂුණී ලෙසින් පැවිදි ප්‍රේතයන් දුටිමියි. සහධම්මික ලක්ඛණ තෙරුන්ට දනුම් දුන්නේය. ශාස්තෘන් වහන්සේ මෙහිදී කාශ්‍යප බුද්ධ කාලයේදී පැවිදිව, පැවිද්ද අනුරූපව පුරන්නට නොහැකි වුවන්ගේ ආත්ම භාවය පවසා, ඒ අවස්ථාවේ එතැන සිටියවුන්ට බොහෝ දුශ්චරිත කර්ම විපාක දක්වමින් මේ ගාථාව පැවසුහ.

පොරවා ඇතත් සිය සිරුරෙහි	කසාවත
පාපී ගතිය ඇත. සංයම ගතිය	නැත
නොතකා හරිනහොත් සිය පැවිදි	පිළිවෙත
මතුදින අපායෙහි දුක් විඳනැවෙනු	ඇත.

කසාවතින් ගෙළ වෙළා ගත්, මහණ පිළිවෙත් හි නොයෙදෙන, සංයමක් නැති බොහෝ පුද්ගලයෝ වෙති. ඒ පාපී පුද්ගලයෝ, සිය පව් කම් හේතුවෙන් නරකයෙහිම උපදිති.

එහි **කසාව කණ්ඨ** යනු කසාවතකින් වෙලන ලද ගෙල ඇත්තෝයි. පාප **ධම්මානි** - ලාමක වූ ධර්මයෝ, **අසඤ්ඤතානි** කායාදී සංවර රහිත - පාපී

පුද්ගලයෝය. තමන් විසින් කළ අකුශල කර්මයෙන් ඔවුන් නරකයේ උපදිනි ඔවුන් එහි පැසී, ඉන් චුතවුවෝ විපාක වශයෙන් ප්‍රේත යෝනියේද මෙලෙස විපාක විඳී යන අර්ථයි දෙසුම අවසන බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පැමිණියහ.

දුශ්චරිත ඵල අනුභව කරණ සත්ත්වයන් පිළිබඳ කථා පුවතයි.

22-3

"සෙය්‍යථා අයොගුළෝ" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ විශාලාවේ මහාවනයේ වැඩසිටියදී "වග්ගුමුදා" නදී තීරයේ භික්ෂූන් නිමිත්තිකරගෙන දේශනා කළහ.

කථා පුවත "උත්තරී මනුස්ස ධම්ම පාරාජිකාවේ" ආ ලෙසට ය එදින බුදුන් එම භික්ෂූන්ට මහණෙනි තෙපි උදරපෝෂණය සඳහා ගිහියන්ට ඔවුනොවුන්ගේ උතුරු මිනිස් දම් (මහඟු ලොව්තුරා දහම්) ගුණ පවසව් ද? කියා ඔවුන් විසින් එසේය ස්වාමීනියි පැවසුවිට බුදුහු නොයෙක් ආකාරයෙන් ගර්හා කොට මේ ගාථාව පැවසුහ.

දුස්සීලෙකුව සිටීමී	න්
සිව්පසයෙ රසවිඳිමී	න්
ඉන්නෙපා අදමී	න්
සිටිනු රත් ලෝ ගුලිම ගිලිමී	න්

සීල සංයමයක් නැති දුශ්ශීලයා රට වැසියන් විසින් සැදහැයෙන් දෙනු ලබන සිව් පසය වළඳනවාට වඩා ගිනි ගුළියක් සේ රත්වුණු ලෝහ ගිලීම යහපති.

එහි යංවෙ භුඤ්ජයෘ - යනු යම් දුසිල් පුද්ගලයෙක් කාය ආදීයෙන් හෝ අසංවර වූයේ රට වැසියන් විසින් ශ්‍රද්ධාවෙන් දෙනලද ආහාරය ශ්‍රමණයයි අඟවා ගෙන අනුභව කරයිද, එයට වඩා ගිනිගත් යගුලියක් ගිලීම ශ්‍රේෂ්ඨය සුන්දරය කුමක්නිසාද එයින් එකම ආත්මභාවයකදී විපාක ලැබේ දුශ්ශීල නැනැත්තේ සැදහැවතුන්ගේ සිව්පස පරිභෝග කර ජාති දස දහස් ගණන් නිරයේ පැසෙන්නේයයි යන අර්ථයි. දේශනය අවසන බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵල ආදියට පත්වූහ.

වග්ගුමුදා හෝ තෙර වැසි භික්ෂූන්ගේ කථා පුවතයි.

22-4

"චත්තාරි ඨානානි යන" මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර ජේතවනා රාමයේ වැඩ සිටියදී අනේ පිඬු සිටුහුගේ බෑනාවු බෙම නම් සිටුපුත්‍රයා නිමිති කරගෙන දේශනා කළහ.

ඔහු මනාරූප ඇත්තේය. බොහෝ ස්ත්‍රිනු ඔහුදැක රාගයෙන් යුතු වුයේ තමන්ගේ ස්වභාවයෙන් සිටීමට නොහැකිවුන. ඔහුද පරදාර කර්මයෙහි කැමැත්තේ විය. අනතුරුව ඔහු රාත්‍රියේ රාජ පුරුෂයන් විසින් අල්ලා ගන්නාලදුව රජුට දැක්වුහ. රජ මහා සිටුවරයාට ලජජා වෙතියි ඔහුට කිසිවක් නොකියා මුදවා යැවීය. හෙතෙමේ ද එ වරදින් නොවැලකුනේය. අනතුරුව දෙවනුවද තෙවනුවද රාජ පුරුෂයන් ගෙන රජුට දැක්වුහ. රජු නිදහස් කළේය මහ සිටුවරයා මේ පුවත දැන ඔහු රැගෙන බුදුන් වෙත ගොස් ඒ පුවත දැනුම් දී ස්වාමීනි මොහුට ධර්ම දේශනා කරන්නැයි පැවසුවේය. බුදුහු ඔහුට සංවේගය ඇති වන සේ කතා කොට පරදාර සේවනයේ දොස් දක්වමින් මේ ගාථාව පැවසුහ.

> **පර අඹුවන් සෙවුම - බලවත් පාපයකි ලොව**
> **නිදි නොලැබ දුක් වී - අකුසල් උපදවයි ඉන්**
> **නිරයෙහි වැටීමද - බියට පැමිණීමද**
> **දඬුවම් ලැබීමද - සිදු වේ එයින් නොමදව,**

පරඹුවන් සේවනය කරණ ප්‍රමාද වූ මිනිසා අකුසල් ලබයි. කැමති සේ නිදි නොලබයි. තුන්වැනිව නින්ද ලබයි. ගතරවෙනිව නරකයේ උපදියි. මේ දුඃඛිත කරුණු සතර පැමිනේ.

අකුශල් ලැබීමද ලාමක ගතියද ඔහුට වෙයි. බියට පත් වුවහු බියටපත් ස්ත්‍රියක් සමග යෙදෙන කාමරතියද ස්වල්ප වන්නේය. රජුද බර දඬුවම් දෙයි. එනිසා පුරුෂයා පරදාර සේවනය නොකළයුතුයි.

එහි ඨානාති - දුකට කරුණුයි **පමත්තෝනි** - සිහි මුර්ඡාවෙන් යුතුවුයේ වෙයි

352

ආපජ්ජතිති - දුක්වලට පැමිනේ, **පරදාරූ පසෙවී පර** අඹුවන් සේවනය කිරීමෙන් **අපුඤ්ඤලාභං** - අකුසල් ලබයි. එසේ අකුසල් ලැබීමෙන් නරකාදියෙහි උපදින්නට සිදුවේ. යම් සේ නින්දත් නොලැබ එලෙස නින්දක් නොලැබ, අකමැත්තෙන් ස්වල්ප කාලයක් නින්ද ලබයි. **අපුඤ්ඤලාභො** මෙසේ මොහුට අකුසල් නිසා පාපී ස්වභාවය ඇති වේ. **රතීව ථොකිකාති** - බියවු තැනැත්තාට බියවු ස්ත්‍රියක් සමග යෙදෙන රතියද ස්වල්පය සීමිතය. ගරුකං රජවරු ද අත් පා කැපීම් ආදී වශයෙන් ගරු දඩුවම් පනවයි. එනිසා යමෙක් පරදාර සේවනය කරන්නේ මේ අකුශලයන්ට පත්වේ. එනිසා පරදාර සේවනය නොකළ යුතුය. යන අර්ථයි.

දෙසුම අවසාන යේ ඛේම උපාසක තෙමේ සෝවාන් ඵලයට පත්විය. එතැන් පටන් මහජනයා සුවසේ කල්යැවීය. ඔහුගේ පුර්ව කර්මය කුමක්ද? ඔහු කාශ්‍යප බුද්ධ කාලයේ දී උතුම් මල්ලවයෙක්ව ඉපිද රන් පටසළු දෙකක් තථාගතයන් වහන්සේගේ රන් ථූපයකට නංවා ප්‍රාර්ථනයක් තැබීය. තමා සහලේ ඤාති ස්ත්‍රීන් හැර අනෙක් ස්ත්‍රීන් මා දැක මට ඇලේවා යනු වෙන් ප්‍රාර්ථනා කළේය. මෙය ඔහුගේ පුර්ව කර්මයයි. මේ නිසා ඔහු උපනුපන් ස්ථානයන්හි අන් අයගේ ස්ත්‍රීන්ට තමන්ගේ තැන සිටීමට නොහැකි වුහ.

ඛේම උපාසක පිළිබඳ කථා පුවතයි.

22-5

"කුසෝ යථානි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර ජේතවනා රාමයේ වැඩසිටියදී එක්තරා දුර්වච භික්ෂුවක් නිමිත් කරගෙන දේශනා කළහ.

සැවැත් නුවර එක් භික්ෂුවක් නොදැන එක් තණපතක් සිඳ කුකුසක් ඇතිවූ නිසා වෙනත් භික්ෂුවක් වෙත එළඹ ඇවැත්නි යමෙක් තණ පතක් සිඳියිද? ඔහුට කුමක්වේදැයි ? සිහිපත් කරන්න. අවබෝධ කර මෙහි කිසිවරදක් නැත. දේශනාකර මිදේයයි පවසා තමන් ද දෙඅතින් තණ මිටක් කඩා ගත්තේය. භික්ෂූහු එම පුවත බුදුන්ට දැන්වූහ. බුදුහු එම භික්ෂුවට නොයෙක් අකාරයෙන් ගරහා ධර්මය දේශනා කරන්නේ මේ ගාථාව පැවසීය.

කුසතණ කපන මිනිසා එය වැරදි	**ලෙස**
කැපුවොත් තුවාලයි අත් පා නොසිතූ	**ලෙස**
නො පුරන මහණකම විනයෙහි පැනෙන	**ලෙස**
නවතිනු නොමැත - අටමහ	**නරකයෙන්මිස**

වැරදි ලෙසට අල්ලාගත් කුසතණපත ඒ අල්ලාගත් අතම කපා දමයි. එමෙන් වැරදිලෙස යෙදූ පැවිදි බව ඒ පුද්ගලයා නිරයට ඇද දමයි. ලිහිල් කොට කරන පින්කම ද, කිලිටු වූ ව්‍රතය ද, සැකයෙන් හැසිරෙන බඹසර ද මේ සියල්ල මහත්ඵල නොවේ. යම් කුසලයක් කරන්නේ නම් එය මනා කොටම කරන්න. වීර්යයෙන් ම කරන්න. ලිහිල් වූ මහණදම බොහෝ සෙයින් රජස් වගුරවයි.

එහි **කුසෝ** යනු කොලේ දෙපස නියුණුවූ තෘණ වර්ගයකි. අන්තිම වශයෙන් තල් කොලයක්ද යම්සේ කුස යම්සේ **දුග්ගහීතෝ** ඔහුගේ **හත්ථං අනුකන්තති** වැරදි ලෙස ගන්නේද නරකලෙසට ගත්තේද ගත් තැනැත්තාගේ අත කපාදමයි පලයි මෙලෙසින්ම ශ්‍රමණ ධර්ම සංඛ්‍යාත පැවිදිකම **සාමඤ්ඤමපි** සිලයෙන් බැඳුනේ වතද වැරදිලෙස යෙදුවේද නිරයේ උපදී. යන අර්ථයි. **සිථිලං** දැඩිව නොගෙන සිහිල් ලෙස ගැනීම කර **යංකිංචිකම්මං**

සංකිලිට්ඨනති - **සිථිලං** - පසුබට වී ක්‍රියා කිරීමෙන් ලිහිල් වසයෙන් ගෙන කරනලද යං කිඤ්චි කම්මං කිසියම් ක්‍රියාවක්. **සංකිලිට්ඨනති** - වෛශ්‍යාවන් සිටින අගෝචර ප්‍රදේශවල හැසිරීමෙන් කිලිටි වීම. **සංකසසරං** - සැකයෙන් යුතුව උපෝසථ කර්මයක් හෝ වෙනත් කාර්යයක් සඳහා රැස් වන්නා වූ සංඝයා දැක, අද මේ අය මගේ හැසිරීම දැන මා උක්ෂේපනය පිණිස පැමිණියාහුයයි තමන්ගේ හැසිරීම ගැන සැක සහිත වුයේම **නතං හොති**, මෙබඳු වූ ශ්‍රමණ ධර්මය හෝ බ්‍රහ්ම චරියාව ඒ පුද්ගලයාට මහත්ඵල නොවේ. ඔහුගේ මහත්ඵල රහිත භාවය නිසා ඔහුට සිව්පසයෙන් උවැටන් කරන දායකාදීන්ට මහත්ඵල නොවේ. "කයිරාවෙ" එහෙයින් යමකේ කරන් ලද්දම තමන් විසින් නොකළ යුතුය. දළහමෙන **පරක්කමෙ** - ස්ථිර අදිටනින් යුතුව, ව ත් සමාදන් වී ක්‍රියා කළ යුතුය. **පරිබ්බාජෝ** - ශ්‍රමණධර්මය පැහැදුනු සිතින් යුත්තව. කඩින් කඩ නො කොට, කළ යුතු වන්නේය. **භියෝ ආකිරතෙ රජනති** - අභ්‍යන්තරයෙහි විද්‍යමාන වන්නාවූ රාග රජස්වලට මෙබඳු වූ ශ්‍රමණ ධර්මය වට්ටන්නට පත් කරන්නට නො හැකි වන්නේය. ඔහුගේ මත්තෙහි වූ ද, අනාෘ වූ ද රාගාදී රජස් ඉවත් හළන්නේය, ඉවතට වන්කරන්නේය යන අර්ථයි.

දේශනාවසානයේ බොහෝ දෙනා සෝවාන් ආදී මාර්ග ඵලවලට පැමිණියාහුය ඒ භික්ෂුවද සංවරයෙහි පිහිටා පසුව මනාසේ දක්නා නුවණ ඇතිකොට පත් වුයේය.

අකිකරු භික්ෂුවගේ කථා පුවතයි.

22-6

"අකතහි" යනාදි මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩසිටියදී එක්තරා ඊර්ෂ්‍යා පරවශ ස්ත්‍රියක් නිමිති කරගෙන දේශනා කළහ.

ඇගේ සැමියා එක් ගෘහසේවිකාවක් සමග අසද්ධර්මයෙහි යෙදුනේය. ගෘහණිය ඊර්ෂ්‍යා පරවශවෙමින් එම දාසිය අත් පාවලින් බැඳ ඇගේ කන් නාසා කපා දමා එක් රහස් කාමරයක තබා දොරවසා එම කර්මය තමන් කළ බව සැඟවීම සඳහා ස්වාමීන් සමග විහාරයට ගොස් ධර්මය අසමුයි සැමියාද රැගෙන විහාරයට ගොස් බණ අසන්නට වාඩිවුවාය. අනතුරුව ඇගේ ආගන්තුක ඥාතීන් ගෙට අවුත් දොර ඇර එම විප්‍රකාරය දැක දාසිය මුදාහළහ. ඇය විහාරයට ගොස් සිව්පිරිස මැදදී මේ කරුණ බුදුන්ට දැනුම් දුන්නාය. බුදුහු ඇගේ වචනය අසා දුශ්චරිතය නම් අනෙක් අය නොදන්නේයයි බිඳක් පමණකුදු කල්පනා නොකළ යුතුය. අන්අය නොදන්නේද එලෙස යහපත් දේම කළ යුතුය. සඟවා කරන ලද පුවද දුශ්චරිතය නම් පසුව පසුතැවිල්ල ඇතිකරයි. සුචරිතය නම් සතුට ඇතිකරයි. යනුවෙන් පවසා මේ ගාථාව පැවසුහ.

දුසිරිතෙහි නො	ඇලෙනු
එය කොට නැවත	නොතැවෙනු
සුසිරිතෙහි	නියැලෙනු
එයින් නැමදා සතුට	වළඳනු

අකුශලය නොකරණ ලද්දේම උතුම් මේ දුසිරිත් පසුව සිත තවයි. යමක් කොට නොතැවේද එබඳු කුශලයම කරණ ලද්දේ ද ශ්‍රේෂ්ඨයි වේ.

එහි **දුකතං.** - වැරදි සහිතය, අපායෙහි පිළිසිඳිනාවූ කර්ම **අකතමෙව සෙයෝ** නොකිරීම ශ්‍රේෂ්ඨවේ. උතුම්ය. **පච්ඡා තපතීනි** යමක් සිදු කොට එය සිහි පත් වන සෑම විටකම තැවේමයි. සුකතං නිවැරදියෙහිම සුවදායක සුගති ඉපදීමට හේතුවන කර්මයයි **කතං සෙයෝ යං කත්වා** යමක් කර

356

පසුව සිහිකරණ කල සතුටුවේ ද **නානුතප්පති** නො තැවේද? සොම්නස් ඇති වීටම උතුම්ය යන අර්ථයි දේශනය අවසනයේ **උපාසකයාද** ඒ ස්ත්‍රියද සෝවාන් ඵලයෙහි පිහිටියේය. එම දාසිය එහිම දාසබව්න් මුදා ධම්ම චාරි කෙනෙක් කළහ.

ඊර්ෂ්‍යා පරවශ ස්ත්‍රියගේ කථා පුවතයි.

22-7

"නගරං යථාති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී බොහෝ ආගන්තුක භික්ෂූන් නිමිති කරගෙන දේශනා කළහ.

එක භික්ෂු පිරිසක් එක් ප්‍රත්‍යන්ත පෙදෙසක වස් සමාදන් වී පළමු මස සුවසේ වාසයකළහ. මධ්‍යම මාසයේ දී සොරුන් පැමිණ ඔවුන්ගේ ගොදුරු ගමට පහර දී බලහත් කාරයෙන් භාණ්ඩ රැගෙන ගියාහුය. එතැන් පටන් මනුෂ්‍යයෝ සොරුන් මර්ධනය සඳහා ඒ ප්‍රත්‍යන්ත නගරය ප්‍රතිසංස්කරණය කරන්නේ එම භික්ෂූන්ට සකසා උවටැන් කිරීමට ඉඩකඩ නොලැබුහ. ඔවුහු අපහසුවෙන් වස්කාලය අවසන් කර (පවාරණයෙන් පසු) බුදුන් දකිමට සැවැත් නුවරට ගොස් බුදුන් වැඳ එකත් පසෙක සිටියාහුය. බුදුහු ඔවුන් සමග කරණ ලද පිළිසඳර කථා ඇත්තේ කිම මහණෙනි සුවසේ විසුවෝදැයි විමසා සිටිවිට ස්වාමීනි අපි පළමු මාසයේ දී සුවසේ විසිවෙමු. මධ්‍යම මාසයේදී සොරු ගමට පහර දුන්හ. එතැන් පටන් මිනිස්සු නගරය ආරක්ෂා කරන්නේ සකසා උවටැන් කිරීමට අවකාශ නොලැබුහ. මේ නිසා අපහසුවෙන් වාසය කලෙමුයි කීවිට, වැඩක් නැත මහණෙනි නොසිතවු. එසු විහාරය නම් නිතර දුර්ලභයි. යම් සේ ඒ මිනිස්සු නගරය ආරක්ෂා කළෝද මෙලෙස භික්ෂූන් විසින් ආත්ම භාවය රැකීමට වටීයයි කියා මේ ගාථාව දෙසුහ.

වට කොට නුවර සුවිසල් මහ පවුරු	තනා
යොදවා සෙබළු රැකවරණය යෙදුව	ගෙනා
නුවරක් වගේ සුරකින, රජු රටම	දිනා
රැකගනු ඔබේ සිත කය සහ වදන	මනා

ප්‍රත්‍යන්ත නගරයක ඇතුලත හා පිටත ආරක්ෂා කරන ලද්දේ යම්සේ වේද? එසේම තමා රකිව්. යම් හෙයකින් මේ වටිනා මොහොත ඉක්ම ගියාහු. නරකයෙහි ඉපදී ශෝක කෙරෙත්ද එහෙයින් ඒ මොහොත ඒකාන්තයෙන් ඉක්ම නොයේවා.

එහි **සන්තර බාහිර** - යම් සේ මහණෙනි ඒ මිනිසුන් විසින් ඒ ප්‍රත්‍යන්ත පිටිසර නගරය දොරටු පවුරු ආදියෙන් ථිර කරත්ද දොරටු අට්ටාල දිය අගල් ආදියෙන් ස්ථිර කරත්ද බාහිරවම ආරක්ෂා කෙරේද? මෙලෙස තොපද සිහිය පිහිටුවා ආධ්‍යාත්මික සදොර වසා දොරටු රකින්නා ලෙස රකිද එසේම බාහිර ෂඩ් ආයතන ආධ්‍යාත්මය නැසීම සඳහා පවතිත්. එසේ නොගත් නේද ස්ථිර කර ඔවුන්ට ප්‍රවේශ නොවීම සඳහා ද්වාර වසා ඇතිවිට පහනොකොට මෙසේ තමන් රකින්නේ යන අර්ථයි. "මා උදෙසා" යමෙක් විසින් මෙසේ තමන් ආරක්ෂා නොකරයිද, එම පුද්ගලයා බුද්ධ උත්පාද කාලයේ මධ්‍යඞ්ම දේශයේ ඉපිද ඒ මොහොතේ සම්‍යක් දෘෂ්ටිය ලැබ ෂඩ් ආයතන නො අඩුව මේ සියළු ලක්ෂණ ලැබ උදාවූ මේ යහපත් පරිපූර්ණ මොහොත ඉක්මවයි. තෙපි ඒ පරිපූර්ණ මොහොත නොඉක්මවා **බණාතීනා** - යම් කිසිවකු විසින් ඒ උසස් මොහොත ඉක්මවන ලද්දේ නම්, ඔව්හු නිරයේ ඉපදී සෝකයට පත්වේ යන අර්ථයි.

දේශනාවසානයේ එම භික්ෂූහු උපන් සංවේග ඇතිව රහත් භාවයේ පිහිටියාහුය.

බොහෝ ආගන්තුක භික්ෂූන් වහන්සේලා
පිළිබඳ කථා පුවතයි.

22.8

"අලජ්ජිතායෙනි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී නිගණ්ඨයන් අරමුණු කරගෙන දේශනා කළහ. එක් දිනක් භික්ෂූන් වහන්සේලා නිගණ්ඨයන් දැක ඒ පිළිබඳ කථාවක් ඇතිකළහ. ඇවැත්නි හැම අතින්ම නොවැසු අචේලකයක් අතර මේ නිගණ්ඨයෝ වඩාත් උතුම් වේ. අනෙක් අයට වඩා උතුම් වන්නේ ඔවුන් ඉදිරි පස වසාගන්නා හෙයිනි. එනිසාම ඔවුහු ලජ්ජා සහිතවෙති සිතමි. මෙය අසා නිගණ්ඨයෝ අපි එම කාරණය නිසා නොවසමු. අපි එලෙසට වසන්නේ පස් දුවිලි ආදිය පුද්ගලයන්හා ජීවිත ඉන්ද්‍රිය ප්‍රතිබද්ධවේ. අපෙග් භික්ෂා භාජනයට දුවිලි හා පස් නොවැටෙවායි වසාගෙන සිටිමුයි කියා ඔවුන්හා වාද ප්‍රතිවාද වශයෙන් බොහෝ කථා භික්ෂූන් වහන්සේලා බුදුන් වෙත එළඹ සිටියදී මේ ප්‍රවෘත්තිය දැනුම් දුන්හ. බුදුරජාණන් වහන්සේ මහණෙනි ! ලජ්ජා නොවිය යුතු තැන ලජ්ජා වී ලජ්ජාවිය යුතු තැන ලජ්ජා නොවීම නම් දුගති ගමනට හේතුවේයයි පවසා ධර්මදේශනාකරමින් මේ ගාථා පැවසුහ. ලජ්ජා නොවිය යුතු තැන ලජ්ජා වන ලජ්ජා වියයුතු තැන ලජ්ජා නොවන මිත්‍යාදෘෂ්ටි ගත් අය දුගතියට යති.

බිය නොවියයුතු තැන බිය දකින බිය වියයුතු තැන බිය නොදක්වන මිථ්‍යා දෘෂ්ටි ගත් පුද්ගලයෝ දුගතියට යති.

ලජ්ජා වන්න නිසි තැන කදි පවිකමට
බිය විය යුතු තැනදි බිය නොවුවොත් පවට
මිසදිටු ගති ගනොත් ඔබෙ සන්සුන් සිතට
යනවා නියතමයි අටමහ දුගතියට

එහි **අලජ්ජිතායෙනි** - ලජ්ජාවියයුතු බැවින් භික්ෂා භාජනය ලජ්ජා නොවිය යුතු දෙයකි. ඔවුන් එය වසාගෙන හැසිරෙන්නේ ඉන් ලජ්ජා නම් වෙති. ලජ්ජිතායෙති. නොවැසූ ලජ්ජා සහිත අග පසඟයෙන් ලජ්ජා විය යුතුය. එබඳු ස්ථාන නොවසා ගෙන යති. එහි ඔවුන්ට ලජ්ජාවක් නැත. මේ නිසා

ඔවුන්ට එය ලජ්ජා නොවියයුතු තැන ලජ්ජා නම් වේ. ලජ්ජා විය යුතු තැන ලජ්ජා නොවීම හිස් දේ ගැනීමක් මෙන්ම අනෙකක් ගන්නා බැවින් මිථ්‍යා දෘෂ්ටි නම් වේ. එබඳුදෙය සමාදන් වී හැසි රීම විචඡා දිටයී සමාදාන පුද්ගලයා නිරය ආදී - දුගතිවලට යති. යන අදහසයි. **අභයෙති** - භික්ෂා භාජනය නිසා රාග දොස මෝහ යන දෘෂටි ක්ලේශ දුසිරිත් භය ඇතිනොවන හෙයින් භික්ෂා භාජනය අභය නම් බියෙන් එය වැසීම නම් **අභයෙ භයදස්සී** නම් වේ. ලජ්ජා ඇතිවන අඬ්ග නිසා රාගාදිය උපදින නිසා එය බිය නම් එම අංග නොවැසීම නිසා **භයෙව අභය දස්සිනො** - ඒ අයථාලෙස සමාදන් වීම නිසා මිථ්‍යා දෘෂ්ටි සහිත පුද්ගලයෝ දුගතියට යතියන අර්ථයි.

නිගණ්ඨයෝ දේශනය අවසානයේදී බොහෝ දෙනෙක් කළකිරුණ සිත් ඇත්තෝව පැවිදිවුහ. එතැනට පැමිණි අයටද දේශනය සාර්ථක විය.

නිගණ්ඨයින් පිළිබඳ කථාපුවතයි.

22-9

"අවජ්ජ" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී තීර්ථක ශ්‍රාවකයන් අරමුණු කරගෙන දේශනා කළහ.

එක් සමයෙක අන්‍ය තීර්ථක යන්ගේ දායකයෝ තම පුතුන්, සම්‍යදෘෂ්ටික උපාසක වරුන්ගේ පුතුන් සමග පිරිවරාගෙන ක්‍රීඩා කරණු දැක, ඔවුන් ගෙට ආ කළ තෙපි ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන් නොවැදිය යුතුය. ඔවුන්ගේ විහාරවලට නොයායුතුයයි තීර්ථකදායකයන් විසින් දිවුරුම් ගන්නා ලදී. ඔවුහු ද එක්දිනක් දෙවිරම වෙහෙරට පිටත දොරටුව අසල ක්‍රීඩා කරමින් පිපාසිතව සිටියාහුය. එක්තරා උපාසක දරුවෙක් එක් ළමයෙකුට කථා කොට නුඹ එහි ගොස් පැන්බී අපටද පැන් රැගෙන එන්නැයි විහාරයට යැවුහ. ඔහු විහාරයට පිවිස බුදුන් වැඳ ජලය පානය කොට එම අදහස දැන්වීය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ ඔබ පැන් පානය කර ගොස් අන්අයටද පැමිණ පැන් පානය කිරීමට එවන්නැයි ඔහුට වදාළහ. ඔව්හු ද පැමිණ පැන් පානය කළහ. බුදුහු ඔවුන් කැඳවා ඔවුන්ට ගැලපෙන ධර්මයක් දේශනා කොට ඔවුන් අචල ශ්‍රද්ධාවේ පිහිටුවා සරණ ශීලයෙහි පිහිටවූහ. ඔවුහු ඔවුන්ගේ ගෙවලට ගියපසු මේ කරුණ දෙමාපියන්ට දන්වා සිටියහ. අනතුරුව ඔවුන්ගේ දෙමාපියෝ පුත්‍රයෝ පෙරලු දෘෂ්ටි ඇත්තෝ වුවෝයයි. දොම්නසට පත්ව ඇඬුහ. ඔවුන් අතර පවුල්වල බොහෝ වූ අසල් වැසියෝ පැමිණ දොම්නස සංසිඳවනු සඳහා ධර්ම කීවාහුය. ඔවුහු ඔවුන්ගේ කථාව අසා මේ දරුවන් ශ්‍රමණ භවත් ගෞතමයන්ටම පාවාදෙමුයි මහත් ඤාතීන් සමග විහාරයට ගෙන ගියහ. ශාස්තෘන් වහන්සේ ඔවුන්ගේ අදහස් බලා ධර්මදේශනා කරන්නේ මේ ගාථාව වදාළහ.

වරද නිවරද යයි - නිවරද වරද වේමැයි
වැරදි සිතිවිළි ගැනුම ජීවිතේ මරණයයි
වැරදි දැන වැරදි සේ - එයින් මිදෙනා දනෝ
සුගතියට යන්නෝ - සම්දිටු සිත් ගැනීමෙන්

362

නිවරද කරුණෙහි වරදයයි අදහස ඇති වරදෙහි නිවැරදියයි දූකුම ඇති - මිසදිටු ගැනීම ඇති සත්ත්වයෝ දුගතියට යති.

වරද වරදලෙස දූන - නිවරද දේ නිවැරදි ලෙසට දූන නිවැරදි (සම්මා) දෘෂ්ටිය ගත්නාවූ සත්ත්වයෝ සුගතියට යන්නාහුය.

එහි **අවජ්ජති** - දසවස්ථුක සම්මා දෘෂ්ටියත් ඒ ඇසුරු කොට ඇති ධර්මත්, **වජ්ජමතිනොති** - මෙය වරදයයි උපන් අදහස් ඇති දසවස් තත් වැරදි දෘෂ්ටියෙහි මිථ්‍යාදෘෂ්ටියෙහි උපනිශ්‍රය ධර්මයෙහි නිවරද දකින. මෙසේ අවජ්ජං වජ්ජතො, වජ්ජංච අවජ්ජතො නිවරද වරද ලෙසද වරද නිවරද ලෙසද දූන හඳුනාගෙන මිථ්‍යා දෘෂටිය ගත් අය මිචඡා දිටඨි සමාදානා, **සත්තා දුගහතිං ගචඡනති** - සත්ත්වයෝ නිරයට යන අර්ථයි දෙවැනි ගාථා වේ කියන ලද ලෙසට වෙනස් වූ අර්ථය දතයුතුය. දේශනාවසානයේ ඒ සියල්ලෝ තිසරණයේ පිහිටා නැවත නැවතද ධර්මය අසා සෝවාන් ඵලයෙහි පිහිටියාහුය.

නිර්ථ සාවකයන් පිළිබඳවූ කථා පුවතයි.

නිරය වර්ග වර්ණනය නිමාවිය.

විසි දෙවෙනි වර්ගයයි.

23-1

"අහං නාගෝ වාති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ කොසඹෑ නුවර වැඩ සිටියදී තමන් අරමුණු කොට දේශනා කළහ.

කථා පුවත අපමාද වර්ගයේ මුල්ගාථා වර්ණනයේ විස්තර කළ පරිදි කියනලදී. එහි මාගන්දිය කිසිවක් කිරීමට තමන් අසමත් වැ ශ්‍රමණ භවත් ගෞතමයන්ට කළයුතු දේ කරමියි නාගරිකයන්ට අල්ලස් දී ශ්‍රමණ භවත් ගෞතමයන් ඇතුළු පිරිස නුවරට පිවිස හැසිරෙන විටදී ආක්‍රොෂකොට පරිභව කොට බැන පළවා හරින්නැයි දැසි දස් කම්කරු පිරිසට අණකළාය. මිත්‍යා දෘෂ්ටිකයෝ රත්නත්‍රයේ නොපැහැදී, ඇතුළු නගරයට පිවිසි බුදුන් ලුහුබැඳ සොරෙකි, බාලයෙකි, මුළාවුවෙකි වංචාකරුවෙකි ඔටුවෙකි, ගොණෙකි, කොටළු වෙකි. නිරිසතෙකි, තිරිසනෙකි ඔබට සුගතියක් නැත. දුගතියම බලාපොරොත්තු වන්නැයි දස ආක්‍රොෂ වස්තූන්ගෙන් නින්දා බස් කියති. මෙසේ පරිභව කරණු අසා අයුෂ්මත් ආනන්ද තෙරුන් බුදුන්ට මෙසේ කීවේය. ස්වාමීනි මේ නගර වැසියෝ අපට ආක්‍රොෂ පරිභව කරති. මෙයින් වෙනත් තැනකට යමුයි. කියා පැවසුහ. ආනන්ද කොහි යන්නද? ස්වාමීනි අනෙක් නගරයකට යමු. එහි මිනිසුනුත් මෙසේ ආක්‍රොෂ කරණවිට කොහි යමුද? එයිනුත් අනෙක් නගරයකට යි පැවසුහ. ආනන්ද මෙලෙස කිරීම නොවටී. යම් තැනක අධිකරණයක් උපදීද, එයට මුහුණදී එය සංසිඳුන පසු අන්තැනකට යාම වටී. ආනන්ද මේ ආක්‍රොෂ කරන්නේ කවුරුන්ද? දාස - කම්කරුවෝ සියල්ලෝම ආක්‍රොෂ කරතියි - පැවසුහ. ආනන්ද යුද්ධයකට ගිය ඇනා සතර දිශාවෙන් එනා ඊ පහර ඉවසීම වගකීමයි. එසේම බොහෝ දුස්සීලයන් විසින් කියන කථා ඉවසීම සවන්දීම එය මගේ වගකීමයි. පවසා තමන් ආරම්භ කොට ධර්මය දේශනා කරන්නේ. මේ ගාථාව දේශනා කළහ.

364

සතර පැත්තෙන් එන
හීසර පහර ඉවසන
ඇතෙකු මෙන් යුදට ගිය
දුදනනගෙ දුසිලුන්ගෙ
පරුස බස් විඳගනිමි
දැමුණු මහ ඇතෙකුසේ

යුදබිමේදී හතර දිගින් වැදෙන හී පහර ඉවසන ඇතෙකු මෙන්, මම ද දුසිලුන් විසින්, අනුන් විසින් කියන එරුෂ වචන ඉවසමි.

බොහෝ දෙනා රැස්වන තැනට දමනය වූ ඇතෙකුම ගෙනයයි. රජු ද දමනය වූ ඇතෙකු පිටම නගී. ඔවුනොවුන් විසින් කියනු ලබන එරුෂ වචන ඉවසන මනාව හික්මුණු තැනැත්තාම මිනිසුන් අතර ශ්‍රේෂ්ඨය.

දැඩි වෙර ඇති අශ්වයෝ ද ආජානීය හා සෛන්ධව අශ්වයෝද, මහානාග නම් ඇත්තු ද, දමනය වූ විටම උතුම්ය, ඒ සැමටම වඩා තමා දමනය කිරීම උතුම් වේ.

එහි **නාගොවාති** - ඇතකුමෙන් **වාපාතො පතිතනති** දුන්නෙත් මිදුනු **අතිවාකෘං** - අට අනාර්ය ව්‍යවහාර ලෙස පවතින ක්‍රම වචනය ඉක්මවීමේ වචනය, **නිතක්ඛිසෘං** යම්සේ යුද්ධයට සුදුසු වූ දැමුනු මහා ඇතා හී සර විත් වැදුනවිට වේදනාවුයේද ඉවසයි. මෙසේම නින්දාබස් ඉවසයි යන අර්ථයි. **දුසීලො** ලෞකික මහජනයා බොහෝ දෙන දුස්සීලය - තම තමන්ට රුචිලෙස වචන කියති ගැටෙමින් හැසිරෙති. මධ්‍යස්ථව සිට බලමින් එය ඉවසීම මගේ වගකීමයි. මට බාරයි **සමිනිං** උද්‍යාන ක්‍රීඩා මණ්ඩල ආදියෙහි මහජනයා මැදට යන්නේ දැමුනාවුම ගොනුන් අසුන් යානයෙහි යොදාගෙනම රාජා රජුද එලෙසට සතුන් පිට යන්නේ දැමුනු සතෙකු පිට ම යයි. **මනුසෙසසුනි** - මිනිසුන් අතරද චතුරාර්ය මාර්ග යෙහි දැමුනු තැනැත්තාම ශ්‍රේෂ්ඨවේ. **යොතිවාකෘං තිතිකඛති**- යම් කෙනෙක් මෙබඳුවූ ශීලාචාරය ඉක්මවන වචන නැවත නැවත කියන්නේද ඉවසයි ද නොසැලේ ද වෙහෙසට පත්නොවේ ද මෙබඳු දැමුන තැනැත්තා ශ්‍රේෂ්ඨවේ. යන අර්ථයි.

අසඝතරාති කොටළුවෙකු නිසා වෙළඹගෙන් බිහි වූ **ආජානීයෙයාති** - ආජානීය නම් අසුන් හික්මවන ආචාර්යවරයා යමක් සිතයිද කියයිද වහාම එය දැන ගැනීමෙහි සමත් තැනැත්තායි. **සින්ධවාති** - සින්ධව රට උපන් අශ්ව යෝයි. මහානාගාති - **කුඤ්ජර** සංඛ්‍යාත මහා ඇත්තුය. **අත්ත දන්තෝති** - **මේ** අසුන් දමුනෝද එසේම යම් කෙනෙක් සිව් අරිය මගෙහි යෙදී තමා තමන් දමනය කරන්නේ නම් මෙතෙමේ ශාන්ත වූ සුසීල වූ අයෙක් වේ. එහෙයින් ඔහු අනෙක් සියල්ලන් අතුරෙන් උත්තරීතර වේ යන අර්ථයි. දේශනාවසානයේ අල්ලස් ගෙන වීථි **සඤ්චල** සිට නින්දා කළ සියලු ඒ මහජනයා සෝවාන් ඵලයට පැමිණියෝය යන අර්ථයි.

තමන් නිමිත්තකරගෙන කියන ලද කථා පුවතයි.

23-2

"නහි එතෙහිනි" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර දෙවිරම් වෙහෙර වැඩසිටියදී පැවිදිවීමට පෙර දක්ෂ ඇත්ගොව්වෙක් වූ එක් භික්ෂුවක් නිමිති කරගෙන දේශනා කළහ.

ඒ භික්ෂුව එක් දිනක් අචිරවති නදීතෙර ඇතුන් මෙල්ල කරන්නෙක්, එක් ඇතෙකු දමනය කරන්නෙමැයි තමන් කැමති කාරණය ඉගැන්වීමට නොහැකිවනු දැක ලඟ සිටි භික්ෂුවක් අමතා මෙසේ කීවේය. ඇවැත්නි. ඉදින් මේ ඇතුන් දමනය කරන්නා මේ ඇතාගේ අසවල් නිලය බලා අසවල් තැනට ඇන්නේ නම් මේ ඇතා දමනය වන්නේ යයි කීය. ඇත් හික්මන්නාද, ඒ භික්ෂුව කී කථාව අසා ඒ කියූ අයුරින්ම නිල බලා ඇන ඇතා මැනවින් දමනය කළේය. එම භික්ෂුහු එම පුවත තථාගතයන්ට දැනුම් දුන්හ. බුදුහු එම භික්ෂුව කැඳවා ඔබ මෙය කෙළේදැයි විමසා ස්වාමීනි ඇත්තයයි පැවසුවිට ගර්හාකොට ඇයි හිස් පුරුෂය, ඇත් යානයක හෝ අනෙක් යානයක් නොව තමන්ම දමනය කරගැනීමෙන් මෙතෙක් නොගිය විරූ තැන කට යාම සුදුසුය. මේ නිසා තමන්වම දමනය කර ගන්න. වෙනත් අය කුමකට දමනය කරන්නේද? මෙසේ පවසා මේ ගාථාව පැවසුහ.

අරියමග අනුව ගිය
මහරහතන් වහන්සේ
යානාවෙන් නොයන
නිවන් මගටම පිවිසියේවේ.

දැමුණා වූ තැනැත්තා ආර්යයන් වහන්සේ මනාව දැමුණා වූ සිත නිසා නිවන දෙසට යම් සේ යයිද, මේ ඇත් අස් ආදී යානාවලින් එහි යා නොහැකිය.

මෙබඳු වූ ඇත් යානාදියෙන් **න-එතෙහි යානෙහි කිසියම්** පුද්ගලයෙකුට සිහිනෙන්ද එහි නොයා හැකිය. **අගතං දිසං** නො ගිය දිසාව වූ නිවණ දිසාවට **තථා** එසේ යා යුතුය. පූර්වාභාගයෙහි පළමුව ඉන්ද්‍රිය දමනයෙන්ද,

දනෙත්තන අපරභාගයෙහි (දෙවනුව) ආර්ය මාර්ග භාවනාවෙන්ද, **සුදනෙත්තන අත්තනා** මැනවින් දැමුණු නිවන් සෙවුනාවූ, ප්‍රඥාවන්ත පුද්ගලයා, ඒ නොගිය දිසාව වූ නිවණට **ගච්ඡනති** පැමිණෙති. එහෙයින් ආත්ම දමනය සදහාම හැසිරෙත් යන අර්ථයි. දේශනාවසානයේ බොහෝ දෙනා සෝවාන් ආදී මාර්ගඵලට පැමිණියාහුය.

හස්ති ශිල්පය දත් භික්ෂුවගේ කථා පුවතයි.

23-3

"ධනපාලකොහි" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ සැවැත්නුවර වැඩසිටියදී එක්තරා බ්‍රාහ්මණ පුත්‍රයෙක් නිමිති කරගෙන දේශනාකළහ.

සැවැත් නුවර එක් බ්‍රාහ්මණයෙක් ලක්ෂ අටක මහත් සම්පත් ඇතිව වයසට පත්ව පුතුන් සතර දෙනාම ආවාහ කර එක් අයකුට ලක්ෂය බැගින් ලක්ෂ හතරක් දුන්නේය. අනතුරුව බැමිණිය කළුරිය කළවිට පුත්තු මෙසේ කතිකා කළහ. ඉදින් පියා අනෙක් බැමිණියක් ගෙනෙන්නේනම්, ඇගේ කුසේ උපන් අය වශයෙන් කුලය බිඳේ - අප ඔහු බලාහදාගෙන උවැටන් කරන්නෙමු ඔහුට ප්‍රනීත ආහාරපාන වලින් සංග්‍රහ කරයි. අත්පා මිරිකීම්, පිළිදෑගුම් කිරීම් ආදිය කොට උවටැන් කර එක් දිනක් බමුණා දවල් නිදා අවදි වුවහුට අත්පා සම්බාහනය කරමින් ගෙදර දුක් ආදිය කියා "අපි ඔබට මේ ආකාරයෙන් දිවි ඇතිතෙක් උවටැන් කරන්නෙමු" ඉතිරි ධනයද අපට දෙන්නැයි ඉල්ලුහ. බ්‍රාහ්මණයා නැවත එකිනෙකාට ලක්ෂයක් බැගින් දී තමන්ට අදින පොරවන පමණක් තබාගෙන සියළු උපභෝග පරිභෝග ද කොටස් හතරක් කර පවරා දුනි. ඒ දෙටුපුතා දින කීපයක් උවටැන් කළේය. අනතුරුව එක් දිනක් බමුණා දිය නා එනවිට දොර කොටුවේ සිටි ලේලිය මෙසේ කීවාය. ඔබ විසින් දෙටුපුතාට සීයක්හෝ දහසක් හෝ අතිරේක යමක් දුන්නේද? හැම දෙනාටම ලක්ෂ දෙක බැගින් දුන්නානේද? ඇයි අනෙක් පුතුන්ගේ නිවෙස්වලට ඇමට මාර්ගය නො දන්නේද? විමසීය - ඔහුද වසලීයයි කිපී අනිකෙනෙකුගේ ගෙට ගියේය. එහි ද දින කීපයට පසු මෙබඳු උපායෙන් පලවා හැරියේ අනෙකා ගේ ගෙටගියේය. මේලෙසට එක ගෙයකටද පිවිසීමට නොලැබ පඬරඬග පැවිද්දෙන් පැවිදි වී මහමග සිගාකන්නෙකු වී භික්ෂාවේ යෙදෙමින් කල් ගෙවුන පසු, ජරාවෙන් දිරාගියේ නරක භෝජන නරක සයන ආදියෙන් මැලවුන ශරීර ඇතිව භික්ෂාවේ යෙදෙන්නටද අපොහොසත්ව අවුත් පිලේ නිදා ගෙන අවදිවී, වාඩි වී සිටියේ තමන් දෙසබලා දරුවන් ගෙන් තමන්ට පිහිටක් නොලබන්නේ මෙසේ සිතුවේය. ශ්‍රමණ භවත් ගෞතමයන් වෙත ගිය හොත් හේ බැම නොහකුළා උඩුකුරු නොකොට - සිය මුහුණු ඇතිව පිළිසඳර කථාවේ දක්ෂ වූ ශ්‍රමණ භවත් ගෞතමයන් වෙත එළඹ පිළිසඳරක් ලබමියි, ඔහු අදින

පෙරවන සළුව තබා භික්ෂා භාජනය ගෙන දණ්ඩක් අතින් ගෙන බුදුන් වෙතට ගියේය. මෙසේ ද කීය. ඉක්බිති එක්තරා බමුණු මහසල් කෙනෙක් රූක්ෂ වූ පොරෝණාද ගෙන, දුකට පත්ව බුදුන් යම් තැන කද එතැනට එළඹුනි" බුදුහු එකත් පසෙක සිටි ඔහු සමග පිළිසඳර කථාකොට මෙසේ වදාළහ. කුමක්නිසා බ්‍රාහ්මණය ඔබ රූක්ෂ වූයේ, කටුක වූ දිවියක් ගෙවන්නේ ඇයි භාග්‍යවත් ගෞතමයන් වහන්ස, මට පුත්තු සිව් දෙනෙකි. ඔවුන් භාර්යාවන් හා කථාකොට ගෙවලින් බැහැර කළාහුය. එසේ නම් බ්‍රාහ්මණය මේ ගාථාව සම්පූර්ණ කර මහජනයා රැස් වූ කල සභාවක පුතුන්ද සිටි අවස්ථාවක කියන්න.

1. යම් පුතුන් සමග මම සතුටු වීම් ද යම් පුතුන් ගේ දියුණුව කැමැති වීම්ද? ඒ දරුවෝ බල්ලන් ලවා උගුරන් ලුහුබද වන සේ භාර්යාවන් නිසා මුළාවී දැන් මා එළවා දමයි.
2. අසත් පුරුෂ වූ මගේ දරුවෝ දුටුතැන තාත්තේ කියා හැසිරෙති රැක්ක යුතු අවධියේ මා අත්හළ ඔව්හු පුතුන් ලෙස පෙනී සිටි යක්කුය.
3. ධාවනයට නුසුදුසු වූ මහළු වූ අශ්වයකු අත්හැර දමන්නා සේ, සම්පත් රහිත වූ දිරාපත් මා පුතුන් විසින් අත්හරින ලදුව අනුන්ගේ ගෙවල්වල සිඟාකයි.
4. ඒ මාගේ අසත්පුරුෂ දරුවන්ට වඩා මේ සැරයටිය උතුම් ය. අනින්ට එන ගොන් හරක්, කන්ට ආ බල්ලන් එළවා මා ආරක්ෂා කරන හෙයිනි.
5. අදුරු නැන දී සැරයටිය පෙරටු වෙයි. ගැඹුරු දියගහියන කල පිටි වහල් වෙයි. යන කල පැකිල ගියත් සැරයටියේ පිහිටෙන් නැගිට සිටිය හැකිය.

ඔහු ද බුදුන්ගෙන් මේ ගාථා ඉගෙන එබඳු වූ බ්‍රාහ්මණයින් රැස්වන දිනයක දී සියළු අලංකාරයන්ගෙන් යුතු වැ පුතුන් වටිනා අසුන්වල සිටින විට, මේ මට සුදුසු කාලයයි සිතා පිරිස මැදට පිවිස, අත උස්සා ඔබට ගාථා සතරක් කියන්නට කැමැත්තෙමි. අසව්යයි කීය. බ්‍රාහ්මණය කියන්න අපි අසන්නෙමුයි, කීවිට, සිටගෙනම පැවසුවේය මෙසමයෙහි මිනිසුන්ගේ පිළිවෙතක් වෙයි. යමෙක් මවුපියන් සතුදේ කයිද එසේ කමින් ඔවුන් පෝෂණය නො කරයිද ඔහු මැරිය යුතුයයි සම්මතයක් විය. මේ නිසා එම බ්‍රාහ්මණ දරුවෝ පියාගේ පා පිට වැටී අපට ජීවිතය දෙන්නැයි ඉල්ලා

සිටියහ. ඔහු පුතුන් කෙරෙහි මෘදුබව නිසා මගේ පුතුන් විනාශ නොකරන්න. මාව පෝෂණය කරන්නේයයි පැවසුවේය. අනතුරුව පුතුන්ට මිනිස්සු කීවාහුය. ඉදින් අදපටන් පියාට හොඳින් නො සලකන්නේනම් තොප ඝාතනය කරන්නෙමු. ඔවුහු බියට පත්ව පියා පිටේ තබාගෙන තුමූ නැගිට ගෙට ගෙන ගොස් සිරුර තෙල් ගා තවා සම්බාහනය කොට සුවඳ සුණු ආදියෙන් නාවා බැමිණියන් කැඳවා අදපටන් අපේ පියා මැනවින් පෝෂණය කරවු. ඉදින් තොපි ප්‍රමාද වන්නෝනම් තොප ම නිග්‍රහ කරමු යි කියා ප්‍රණීත භෝජන වැළඳ වූහ. බ්‍රාහ්මණයා හොඳ ආහාරද සුව ස්පර්ෂයද ලැබ දිනකිපයකින් හටගත් බලය ඇත්තේ පිනවූ ඉන්ද්‍රිය ඇත්තේ ආත්මභාවය බලා මම මේ සම්පත් ශ්‍රමණ භවත් ගෞතමයන් නිසා ලබන ලද්දේ වෙමි. පඬුරු වෙනුවෙන් එක් සළු යුගලක් ගෙන බුදුන් වෙත ගොස් කරණ ලද පිළිසඳර ඇත්තේ එකත්පසෙක සිට එම වස්ත්‍ර යුගලය බුදුන් පාමුල තබා පින්වත් ගෞතමයාණන් වහන්ස. අපි බ්‍රාහ්මණයෝ වෙමු. ඔබ වහන්සේ අපට ගුරුව සිටිහෙයින් ගුරු පූජාවක් කරන්නෙමි. පිළිගනු ලැබේවා, මේ ආචාර්ය ධනයයි (ගරුභාගයයි) බුදුරජාණන් වහන්සේ ඔහුට අනුකම්පාවෙන් එය පිළිගෙන ධර්මය දේශනා කළහ. දේශනය අ ව ස න බ්‍රාහ්මණයා සරණයෙහි ද පිහිටා මෙසේ පැවසුවේය. පින්වත් ගෞතමයාණනි මගේ පුතුන්ගෙන් නිතර ලැබෙන බත් කොටස් හතරකි. ඉන් දෙකක් මම ඔබ වහන්සේට දෙන්නෙමි. අනතුරුව බුදුරජාණන් වහන්සේ යහපති බ්‍රාහ්මණය. මම ඔබ රුචි තැනකට එන්නෙමි යි පවසා පිටත්කර හැරීයේය. බමුණ ගෙටගොස් පුතුන්ට මෙසේ කීවේය. දරුව ශ්‍රමණ භවත් ගෞතමයන් මගේ සහායකයායි. උන්වහන්සේ වැඩම කළවිට පමානොවමු. ඔවුහු හොඳයි පියාණනි. බුදුහු දෙවන දවස්හි පිඬු පිණිස හැසිරෙන අතර ජ්‍යෙෂ්ඨ පුතුගේ නිවසට වැඩම කළහ. ඔහු බුදුන් දැක පාත්‍රය ගෙන ගෙට පිවිස වටිනා පීඨයක වාස කරවා ප්‍රණීත භෝජන දුන්නේය. බුදුහු දෙවන දින අනෙක් අනෙක් නිවෙස් වලට පිළිවෙලින් සියළු ගෙවල් වලට ගියේය. ඔවුහු සියල්ලෝම එලෙසටම සත්කාර කළාහුය. අනතුරුව එක් දිනක් ජ්‍යෙෂ්ඨ පුතු මංගල කරුණක් එළඹ විට පියාට කීවේය. පියාණනි කාට නම් මංගල බත දෙන්නේද කියා මම නොදනිමි. ශ්‍රමණ භවත් ගෞතමයන් මගේ මිතුරා නොවේද? එසේනම් හෙට උන්වහන්සේ සහිත පන්සියයක් භික්ෂූන්ට ආරාධනා කරන්න. බ්‍රාහ්මණයා

එලෙස කළේය. බුදුහු දෙවැනි දිනයෙහි පිරිවර සහිතව ඔහුගේ ගෙට වැඩමකළහ. ඔහු කොළපාට සායම් ගා සියළු අලංකාරයෙන් සරසන ලද ගෙයි බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වාඩිකරවා ජලය අඩුවෙන් යෙදූ පැනි කිරිබත් ද ප්‍රණීත බාදෘද වැළඳවුහ. දන්වළඳා අවසන බමුණාගේ පුතුන් හතරදෙන බුදුන් ලඟ වාඩිවී මෙසේ කීහ. පින්වත් ගෞතමය අපි අපේ පියා පෝෂණය කරමු. ප්‍රමාද නොවෙමු. මොහුගේ ස්භාවය බලන්න බුදුහු ඔබලා විසින් යහපතක් කරණ ලදී මවුපිය පෝෂණය නම් පෞරාණික පණ්ඩිතයන්ගේ අවීර්ණ සිරිතකියි. පවසා "තඤ්ඤ නාගඤ්ඤ විපච්චාසෙන විරූළ්හා සලලකි කුටජා" ආදී වූ මේ එකාදස නිපාතයේ මාතු පොසක නාගරාජ ජාතකය විස්තර වශයෙන් කියා මේ ගාථාව වදාළහ.

ඇත් හලෙහි දම්වැලින් - බැද දැමුව ඇත් රජද
තමන්ගේ නිජ බිමම - සිහි කරයි එකසිතින්
රජ බොජුන් ඉවතලති - "දනපාල" මව නිසා

ධනපාලක නම් වූ ඇතා තියුණු වද ඇත්තේ නොවැලැක්විය හැක්කේ ඇත් හැලේ බඳින ලද්දේ ආහාර නොබුදියි. ඒ ඇතා ඇතුන් සිටින වනයම සිහිකරයි.

එහි **ධනපාලකෝ නාමානි** - යනු එදවස කාසි ජනපදයේ රජුගේ ඇතුන් පුහුණු කරන්නා යවා රමණීය නාග වනයෙන් ගෙන්වන ලද ඇතාගේ මේ නම වේ. **කටුකප්ප භෙදනොනි** - තියුණු මද ඇත්තු මද වැගිරෙන කල **කන් කඩා හැළෙයි**. ප්‍රකෘතියෙන් ඇත්තු මේ කාලයේ දී අංකු - (හෙණ්ඩුව) හෝ කුන්තායුධ නෝමර පවා කඩා දමති. චණ්ඩ වෙති. ඔහු ඉතා දරුණුය. **"කටුකප්ප භෙදනෝ දුනිවාරියෝ"** යනු එහෙයින් කියන ලදී. බදෙඩා **කබලං නහුඤ්ජති** මේ ඇතා ඉතා සැඩය. බඳිනලද ඔහු ඇත් හලට ගෙනගොස් **පරිඤ්ඤප** කොට සුවඳ පිරිබව කොට උඩුවියන් බැඳ රජුගේ රජ බොජුන් සමාන නොයෙක් රසවත් භෝජන දුන්නත් ඔහු කිසිවක් කෑමට අකමැති විය. එම කරුණ නිසා **බදෙඩා කබලං නහුඤ්ජති** කියන ලදී. **සුමරති නාගවනඤ්ඤා** තමන් වසන නාග වනය ඉතා සිත්කළුය. මේ නාග වනයෙහි වෙසෙන මගේ මව පුතු වියෝගයෙන් දුකට පත්වූවාය. මාතෘ

උපස්ථානය නම් වූ ධාර්මික ප්‍රතිපදාව නොපුරා මේ බොජුන් වැළඳීමෙන් කවර සුවයක්ද? එහෙයින් නාග වනයෙහිම සිට මාතෘ උපස්ථානය කරන්නට පුළුවන් වේ යයි මෙය කියන ලදී. **සුමරනි නාගවන කුඤ්ජරෝ** - ශාස්තෘන් වහන්සේ තමන්ගේ පූර්ව චරිතය ගෙන හැර දක්වා ධර්ම දේශනා කරත්ම ඒ සියල්ලන්ගේම ඇස් කඳුළුවලින් පිරී මෘදු හදවතින් යුතුව කඳුළු ධාරා ගලා ගියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට සත්පාය වන පරිදි චතුරාර්ය සත්‍යය දේශනාකළහ.

දේශනාවසානයේ පුතුන් සමග බ්‍රාහ්මණයා සෝවාන් ඵලයෙහි පිහිටියානුය.

.එක්තරා බ්‍රාහ්මණයකුගේ පුතුන් පිළිබඳ පුවතයි.

23-4

"**මිද්ධියදා - නි** " මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී පසේනදි කොසොල් රජ නිමිත්තකරගෙන දේශනාකළහ.

එක් සමයෙක රජු සහල් ද්‍රෝණියක බත් ද, එයට අනුරූප සුප ව්‍යඤ්ජනද අනුභව කරයි. ඔහු එක් දිනක් ගන්නාලද උදේ ආහාර ඇත්තේ බත් මතය දුර නොකරම බුදුන් වෙත ගොස් ක්ලාන්ත වුයේ ඔබමොබ පෙරළෙයි. (නින්දෙන්) නිදිමතින් පෙළුනේ කෙලින් සිටගැනීමට අපහසුවුයේ එකත් පසෙක හොත්තේය. ඉක්බිතිවැ ශාස්තෘන් වහන්සේ මෙසේ ඇසීය. ඇයි මහරජ විවේක නොගෙනම ආවේද? එසේය ස්වාමීනි බත් කැ වේලේ පටන් මට මහා දුකක් ඇතිවේ. එහිදී ශාස්තෘන් වහන්සේ මහරජ බොහෝ කොට ආහාර ගැනීමේ දී මේ දුක ඇති වේ කියා මේ ගාථාව වදාළහ.

උගුර ළඟටම අහර වළඳා
කුසීනව ඇති කුසල වළකා
නිදන ඌරෙකු වගේ නැවෙනා
මෝඩයා නිවනට නොයේ

යමෙක් මැලිගතියෙන් යුක්ත වුයේද, බොහෝ කොට කයි ද, ඒ මේ අත පෙරලෙමින් නිදයි ද, ඌරු අහරින් තරවු ඌරෙකු වැනි වූ, ඒ මෝඩයා සසරින් එතෙර වන්නේ නැත.

එහි **විද්ධි** ඊන මිද්ධයෙන් පෙළුනේ - **මහඝාසො මහා භොජනො** - ආහාර හත්ථක - නැගිට සිටින්නටත් බැරි වනසේ කෑම කන පුද්ගලයා අලංසාටක - ඉනේ වස්ත්‍රය තබා ගැනීමට වත් බැරිවන සේ කෑම කන පුද්ගලයා තත්‍රවට්ටක - සිරුර දරාගත නොහැකිවන තරමට කෑම ගෙන පෙරලී පෙරලී සිටින තැනැත්තා. කාක මාසක - කපුටන්ට හොට දමාගත හැකි සේ උගුර ළඟටම කෑම කන තැනැත්තා භුත්තවමිතක - කෑම කෑ තැනම වැමෑරීමට තරම් කෑම කන අය යන මෙයින් එකකුසේ **නිවාත පුටෝ නි** - කුණ්ඩකාදි සූකර බහින් ස්පර්ශ වුයේ, ගෙවල ඌරෝ ළපටි කාලයේ සිට පෝෂණය

කළවිට මහත් වූ විට ගෙයින් පිටතට යා නොහැකි වන්නේ ඇඳන් යට පෙරලී පෙරළී ආශ්වාස ප්‍රශ්වාස කරමින් නිදයි. මේ කියන ලද පරිද්දෙන්ම පුරුෂයාද බත් මතයෙන් මත් වී අලස වී මහ ඌරෙකුසේ අනෙක් ඉරියව්වලින් සිටීමට නොහැක්කේ, නිදන සුළු ම වේ. **සමපරිවතත සායී** එබඳු තැනැත්තාට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රි ලක්ෂණ සිහිකරන්නට නොහැකිවන්නේ ය. ඔවුන්ට යහපත් සිහිය නැත්තේ මෝඩයෙක්ම වෙති. **පුනප්පුනං ගබ්භං උපෙති** නැවත නැවතත් මව්කුසයක්හිම උපදිත් (සසර කෙළවර නොවේ) දේශනාවසානයේ ශාස්තෘන් වහන්සේ රජුට උපකාර වසයෙන්

"මනුජස්ස සදා සතීමතො මත්තං
ජානතො ලද්ධ භොජනෙ
තනුතස්ස භවන්ති වෙදනා
සනිකං ජීරති ආයු පාලයතනි"

මේ ගාථාව වදාරා, එය උත්තර මානවකයාට උගන්වා, මේ ගාථාව රජුන් ආහාර ගන්නා වේලාවේ. කියැන්නැයි වදාළහ. මේ උපායෙන් ආහාර අඩු කිරීමේ ක්‍රමය උපායානු කුලව වදාළහ. හෙතෙමේ ද එසේ කළේය. රජු එයින් මතු දිනයෙක නැළියෙක පමණ බත දක්වා ආහාර වේල අඩුකොට සැහැල්ලු සිරුරින් යුතුව, සුවයට පැමිණ, ශාස්තෘන් වහන්සේ කෙරෙහි උපන් විශ්වාසයෙන් යුතුවැ ශාස්තෘන් වෙත අසදෘස දානය පැවැත්වීය. අනුමෝදනාව ඇසීමට පැමිණි මහාජනයා මහත් විශේෂතාවයන්ට පැමිණියාහුය.

ප්‍රසේනදී කොසොල් රජුගේ කථා පුවතයි.

23.5

"ඉදං පුරෙති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී "සානු" සාමණේර තෙරුන් නිමිත්තකරගෙන දේශනාකළහ. ඔහු එක් උපාසිකාවකගේ එකම පුත්‍රයායි. ඉක්බිති ඇය ඔහු ළමාකාලයේදීම පැවිදිකරවීය. ඔහු පැවිදිකළ තැන් පටන් සිල්වත් වූයේය, වත් සම්පන්න වූයේ. ආචාර්ය උපාධ්‍යාය වත් ද, ආගන්තුක වත් ද හොඳින් ඉටුකළේය. මාසයේ දින අටක් උදේම අවදිවී පැන් මළුවේ ජලය තබා බණ දෙසන මළුව අතුගා පහන් දල්වා මිහිරි ස්වරයෙන් ධර්ම දේශනය සඳහා අඬ ගසයි. භික්ෂූන් වහන්සේලා ඔහුගේ උත්සාහය දැන පද භාගය (බණකියැන්නැයි) සාමණේර හටම දුන් මගේ හද රිදේ. කය පීඩාදේ ආදී කිසියම් ප්‍රතිකාරයක් නොකොට ධර්මාසනයට නැග අහස් ගඟ ගලා බස්නා ලෙස ධර්මය දේශනා කර වසිත්නේ. මගේ දෙමාපියන්ට මේ පිං අනුමෝදන් කරමියි කියයි. ජීවතුන් අතර සිටින ඔහුගේ දෙමාපියෝ මෙසේ පින් දුන් බව නොදනිති. ඔහුගේ දෙවැනි ආත්ම භාවයක මවක් යකිනියක්ව උත්පත්තිය ලබා සිටියාය. ඕතොමෝ දේවතාවන් සමග පැමිණ බණ අසා සාමණේර භික්ෂුව විසින් දෙන ලද පින් අනුමෝදන් වෙමියි. දරුව කියයි. සිල්වත් වූ භික්ෂුව දෙවියන් සහිත ලෝකයාට ප්‍රිය වේ. එම සාමණෙරයන් කෙරෙහි ලජ්ජා බුහුමන් ගෞරව සහිතව මහා බ්‍රහ්මයන් මෙන් ද ගිනි කඳක් මෙන්ද සිතයි. සාමණේරයන් කෙරෙහි ගෞරවයෙන් එම යක්ෂණිය ගරු කොට බලයි ධර්මශ්‍රවණ යක්ෂ සමාගම ආදියේ දී සානු මාතා වෝ යයි කියා ඒ යක්ෂණියට - අග්‍ර ආසනය, අග්‍ර දිය, අග්‍ර පිණ්ඩය දෙති. මහේශාඛ්‍ය යක්ෂයෝ ඇය දක මාර්ගයෙන් මෑත්වෙති. අසුනෙන් නැගිටිති. අනතුරුව ඒ සාමනේර නම වයසට පත්ව මුහුකුරාගිය ඉන්ද්‍රිය ඇත්තේ අනහිරතියෙන් පෙළෙන්. අනහිරතිය දුරු කිරීම සඳහා උත්සාහ නොහැකි වන්නේ වැඩුනු කෙස්, නිය ඇතිව කිළිටි අඳන සිවුරු ඇත්තේ, කිසිවෙකුටත් නොදන්වා පාසිවුරු ගෙන හුදකලාව මවගේ නිවසට ගියේය, උවැසිය පුතු දැක වැඳ මෙසේ කීවාය. දරුව ඔබ පෙර දින ආචාර්ය උපාධ්‍යාය සමග හෝ කුඩා සාමණේර නමක් සමග වැඩියේය. අද එකලාව වැඩම කළේ කුමක් හෙයින්ද? උන්වහන්සේ කළකිරුනබව පැවසුහ. එම උවැසිය නොයෙක් ආකාරයෙන් ගිහිගෙයි

වාසයේ ඇති ආදීනව දක්වා පුතාට අවවාද දුන්නේද දැනුමක් ඇතිකරන්නට අපොහොසත්ව තමන්ගේ ධර්මතාවෙන් හෝ තමන්ට හැකි පමණින් සලකන්නෙමැයි සිතා දරුව සිටින්න. ඔබට කැඳබත් සකස්කරමි. කැඳ බී කරන ලද බත් කිසෙන් පසුව, ඔබට කැමති වස්තුයක් දෙමි කියා අසුනක් පනවා දුන්නාය. සාමණේර නම වාඩි වුයේය. උවැසිය ඉතා ඉක්මනින් කැඳ හා කෑයුතු දැ සපයා දුන්නේය. අනතුරුව බත් සපයා දෙමියි නොදුරේ සිටි සහල් සෝදයි. එකළ එට යක්ෂණිය සාමණේර නම කොහේදැයි කිසියම් භික්ෂාවක් ලබන්නේදැයි ආවර්ජනා කරන්නේ ඔහු සිවුරුහරනට සිටින බව දැන මට දෙවියන් ඉදිරියේ ලජ්ජා උපදවන්නේදැයි, යම් විකෘතියට. වෙනස්වීමට අනතුරක් කරන්නෙමියි සිතා පැමිණ සිරුරට අවේශ වී ගෙල හරවා කෙල වැගිරෙමින් බිමවැටුනි. උවසිය පුතාට සිදු වූ මේ විකාර දක වේගයෙන් ගොස් පුතා වැළඳගෙන උකුලෙහි නිදිකර වුවාය. මුළු ගම්වැසියන් පැමිණ බලිකර්ම ආදිය කළහ. උවැසිය අඩමින් මේ ගාථාව් පැවසුවාය.

"චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අවයමි. "

යම් කෙනෙක් මසක් පාසා තුදුස්වක, තෙළෙස්වක, පසළොස්වක, හා සතවක, අටවක, නවවකත්, අෂ්ටාංග උපෝසථය රකිත්ද, සෙසු පින්කම්වලත් යෙදේද, උන් හා සමග අමනුෂ්‍යයෝ සෙල්ලම් නොකරති. එහෙත් සානු සාමණේරයන් සමග අමනුෂ්‍යයෝ ක්‍රීඩා කරන බව පෙනේ. ඒ බව රහතුන්ගෙන් අසමු.

උපාසිකාවගේ ඒ වචනය අසා,

යම් කෙනෙක් පාටිහාරිය පක්ෂ උපෝසථය රකීද. අෂ්ටාංග උපෝසථය රකීද බ්‍රහ්මචරියාව රකීද. ඒ අය සමග අමනුෂ්‍යයෝ සෙල්ලම් නොකරති. කියා මෙසේද කීය. සානු තෙරණුවෝ බුදුන් අත්හරියි. කිසිදු පාප කර්මයක් විවෘතව හෝ රහසින් වත් නොකළ යුතුය. යම් කිසිවෙක් පව්කම් කරන්නේ ද කරවන්නේද, ශාසනයෙන් පිරිහී පව්කම් කරන්නහුට අපි දුක් පමුණුවමු - එසේ නොවන්නේ නම් අපි පලායමු මේ යක්ෂණියගේ වචනයයි.

මෙසේ පව්කම් කොට පක්ෂියෙකු මෙන් ඉගිල යන්නෙකුට වුවද මෝක්ෂය නම් නැත්තේය. කියා යකින්න සාමණේරයන් මිදුවාය. හෙතෙම ඇස්හැර බලා හිස කෙස් විසුරුවාගෙන හුස්ම ඉහළ පහළ හෙළමින් හඬන්නා වූ මව ද, රැස්ව සිටි න ගමේ මිනිසුන් ද දැක. තමන් යක්ෂණියක විසින් ගත් බව නොදැන. මම කලින් පුටුවේ ඉඳගෙන සිටියෙමි. අම්මා සමීපයේ හාල් ගරමින් සිටියාය. දැන් වනාහී බිම වැතිරී සිටින්නේ මන්දැයි මවගෙන් විමසන්නේ,

මෑණියනි යමෙක් එක්කෝ මළ කෙනෙකු වෙනුවෙන් හඬති. නැතිනම් නොදක්නා කෙනෙකු වෙනුවෙන් හඬති. මා මළේන් නැත. නො පෙනෙන සේ දුරගියේත් නැත. එසේ හෙයින් කවර හෙයින් ඇඬන්නේද? ඇසීය.

ඉක්බිති මව වස්තුකාම ක්ලේශකාම හැර පියා සසුනෙහි පැවිදිවී, නැවත චෙනස් වීමට සිවුරු හැරීමට ආ ගමනේ ආදීනව දක්වමින් මෙසේ කීවාය.

මළගිය අය වෙනුවෙන් හඬති. නොදක්නා අය වෙනුවෙන් හඬති. යමෙක් ගිහිගෙයි වාසය හැරපියා පැවිදි වුයේ ද ඔහු නැවත සිවුරු හරිද, ඔහු නොමළේත් මළා වේ. ශාසනයෙන් ඔහු මළා වේ. එබැවින් මම හඬමි.

මෙසේද කියා ගෘහවාසය ගිනිගොඩක වාසය මෙන්ද නරකාදියක වාසය මෙන්ද උපමා කොට. ගෘහවාසයෙහි ආදීනව දක්වන්නේ නැවත මෙසේ කීවාය. දරුව, ගිනි ගොඩකින් නික්මුණු ඔබ නැවත ගිනි ගොඩට පනින්න කැමති වේද නරක දුකින් මිදුණු ඔබ නැවත නරකයට අපායට වැටෙන්නට කැමති වේද?

දරුව ඔබට යහපතක් වේවා. මා විසින් මගේ පුතා ගිනිගෙන දිලියෙන්නා වූ ගෙයකින් වටිනා භාණ්ඩයක් ඉවත් කරන්නාසේ බුදු සසුනෙහි පැවිදි කරවුයෙමි. ඔබ නැවත ඒ ගිනි ගොඩ වූ ගෘහවාසයට බසින්නට කැමති වෙහිද මේ කාර්යයෙන් කාහට අවමන් කරන්නේද කවුරු අවමන් විඳින්නේද, මේ අවමන් විඳීම දැක්වීමට මේ ගාථාව කීවාය.

ගිනිගත් ගෙයකින් වටිනා භාණ්ඩ ඉවත්කර ගෙන පලායන්නෙකු මෙන්, බුදු සසුනේ පැවිදි වූ ඔබ නැවත ඒ ගිහිගෙට වැදීමට කැමතිවන්නේ ද, එසේ කිරීමෙන් කවර හෙයින් අවමන් කරන්නේද අවමන් විඳින්නේද

හෙතෙම මවගේ මේ කීමෙන් පසුව, එය සලකා මෑණියනි මට ගිහි වීමෙන් අර්ථයක් නැතැයි කීයේය. ඉක්බිති මව, මැනැවි පුතුනි යි තුටු පහටුව ප්‍රණීත භෝජන තනා වළඳවා. පුත්‍රය දැන් වයස කීයදයි ඇසීය. එවිට වයස නිසි පරිදි විසිවයස් සම්පූර්ණ බව දැන තුන්සිවුරු සපයා දුන්නීය. හෙතෙම පිරිපුන් පා සිවුරු ඇතිව උපසම්පදාවට පත්වුයේය.

ඉක්බිතිව ඔහුගේ සිත් හසර බලන ශාස්තෘන් වහන්සේ, පළමුව සිතේ පැවැති විපරීත බව උකටලී බව දැන සිත නම් විවිධ අරමුණුවල දීර්ඝ කාලයක් හැසිරෙන්නේය. එසේ වූ සිතට නිග්‍රහ නොකිරීමේ යහපත් බවත් නැත. එහෙයින් අංකුසයකින් (හෙන්ඩුවකින්) මත් ඇතෙකු දමනය කරන්නාක් මෙන් හිලෑ කරන්නාක් මෙන්, සිත දමනය කළ යුතුය. නිග්‍රහ කළ යුතුය. නිවනෙහි යෙදීම කළ යුතුයයි වදාරා මේ ගාථාව වදාළහ.

පෙරදී මගේ සිත සිතූ ලෙස හැම නැනෙක
වැරදී ගිය අයුරු සිහියට ගෙන මනක
අංකුසයෙන් මතැතු හිලෑලන ලෙසක
විඳසුන් නැණින් දමනය කරගමි යෙහෙක

එහි අර්ථය. **ඉදංචිත්තං** මේ සිතනම් මෙයින් පෙර රූපාදී අරමුණු වලද රාගාදී අරමුණු වලද, **යෙන** කැමති ලෙසින් යමක් කැමතිවන්නේද එහි යෙදීම් වසයෙන්, **යත්‍රකාමං** යම් කාම සුවයක් කැමතිවේද එහි හැසිරෙමින්. **යථාසුඛං** දීර්ඝ කාලයක් චාරිකා කළේය. **අජ්ජ අහං පහිනනං** දක්ෂ ඇත්ගොව්වකු විසින්මත් ඇතෙකු **අඞ්කුසගහනෝ** අංකුසයෙන් හිලෑ කරන්නාක් මෙන්, **විය** යහපත් සිහියෙන් **නිග්ගහෙස්සාමි** අයාලේයාමට නොහැකි කොට දමනය කළෙමි. දේශනය අවසානයේදී සානු තෙරුන්

සමග ධර්මශ්‍රවණය තුළ බොහෝ දෙවියන්ට ධර්මාභිසමය විය. ඔහු ත්‍රිපිටක බුද්ධ වචනය ඉගෙන "මහාධර්ම කථිකයකු වී " වසර එකසිය විස්සක් සිට මුළු දඹදිව කළඹා පිරිනිවන් පෑවාහුය.

පස්වැනි වූ සානුසාමණේරයන් වහන්සේ පිළිබඳ කථා පුවතයි

23.6

"අපමාදරතොති" යන මේ ධර්මදේශනය තථාගතයන් වහන්සේ ජේතවනාරාමයේ වැඩසිටියදී කොසොල් රජුගේ බද්ධෙරක නම් ඇතෙක් පිළිබඳව දේශනාකළහ.

එම ඇතා තරුණ කාලයේදී මහා බලවතෙක්ව සිට වැඩකර පසුව වයසට යාම නිසා ආබාධ වලින් පෙළුනේ එක් මහා විලක එරී මඩේ ලැග එගොඩ වීමට නොහැකිවිය. මහජනයා එය දැක මෙබඳු බලවත් ඇතා මෙසේ දුබල බවට පත්වුයේ කෙසේ උඩට ගන්නහුද, රජු මේ පුවත අසා ඇත්ගොව්වාට අණකළේය යන්න එම ඇතා මඩෙන් පිටතට ගන්නැයි නියෝග දුනි. ඔහු එතැනට ගොස් ස්ථානයේ සංග්‍රාම බිමක්ලෙස දක්වා යුදබෙර නාද කළේය. මානයෙන් යුත් ඇතා වේගයෙන් නැගිට ගොඩබිම පිහිටියේය. භික්ෂූන් මේ කරුණ දැක තථාගතයන් වහන්සේට දන්වා සිටියහ. බුදුහු මහණෙහි මේ ඇතා විසින් ප්‍රකෘතියෙන් මඩේ එරී දුකට පත්වුයේ තමන් විසින් ම උඩට ආවේය. තෙපි ද කෙලෙස් දුර්ගයක වැටුනේ එනිසා යෝනිසෝ මනසිකාරය පිහිටුවා තමන් ද, කෙලෙස්මඩින් උඩට නැගෙමු. යයි පවසා මේ ගාථාව දෙසුහ.

පහන් සිත රකින්න. අප්‍රමාදී වෙන්න මඩේ ගැලුන ඇතා ගොඩට ආවාසේ තෙපිද කෙලෙස් දුදුලෙන් ගොඩ නැගෙව.

මාසින තුළ හොවී කෙළෙසුන් වෙමිනි	ගුලී
උදුරා දැමිය යුතු වෙයි ලැබ ගනුව	එලී
ගොඩ එන පරිදි මනැතෙකු මඩ වගුරෙ	ගිලී
විදසුන් නැණින් නොපමාවෙන් සිදිමි	යලී

එහි අපමාදරතා සිහියෙන් වෙන්ව නොසිටීමේ කැමැත්ත ඇත්තේ මව් **සචිත්තං** රූපාදී අරමුණුවල තමන්ගේ සිතට කැමති පරිදි හැසිරීමට ඉඩ නොදෙව් සිත රකිව්, දුගහා යම් සේ, **පඞ්කසත්තෝ කුඤ්ජරෝ** අත් පා

වලින් උත්සාහ කොට මඩවගුරෙන් උඩට විත් පොළවෙහි සිටින්නට සමත් ඇතා මෙන්, තෙපිද කෙලෙස් මඩින් **අත්තානං** උදධරථ තමන් ගොඩ ටි නිර්වාණය නමැති ස්ථාලයෙහි පිහිටව් යන අර්ථයි.

දේශනාවසානයේ ඒ භික්ෂුහු අර්හත් ඵලයෙහි පිහිටියාහුය.

බද්ධෙරක ඇතාගේ කථා පුවතයි.

23.7

"සවෙ ලභෙථාති" යන මේ ධර්ම දේශනය **ශාස්තෘන් වහන්සේ** පාරිලෙය්‍යක ඇතාගෙන් උවැටන් ලබමින් ආරක්ෂිත වනයෙහි වැඩසිටියදී බොහෝ භික්ෂූන් නිමිත්තිකරගෙන දේශනා.

කථා පුවත, යමක වර්ගයේ "පරෙවන විජානන්ති" යන ගාථාවර්ණනාවේ සඳහන් වන පරිදිය.

බුදුරජාණන් වහන්සේ ඇත් රජුගෙන් උවටැන් ලබා වසන ආකාරය මුළු දඹදිවම ප්‍රකට විය. සැවැත් නුවරින් අනේපිඬු විසාඛා මහා උපාසිකාව මේ ආදී මහ කුලයන් විසින් ආනන්ද තෙරුන්ට පණිවිඩයක් යැවූහ. ස්වාමීනි තථාගතයන් වහන්සේ අපට මුණගස්වන්න යනු වෙනි. දිසාවාසී පන්සියයක් භික්ෂූන් වස්වසා, ආනන්ද තෙරුන් වෙත එළඹ ආයුෂ්මත් ආනන්ද අපි බොහෝකාලයකින් බුදුන්ගෙන් බණ නොඇසුවෙමු. අපට ධර්මයක් අසන්න සලසා දෙන්නැයි ඉල්ලා සිටියහ. තෙරුන් වහන්සේ එම තෙරවරු ගෙන තුන්මසක් ඒකවිහාරීවූ බුදුන් වෙත යාම සුදුසු නොවේ. යයි සිතා තනියම ආනන්ද තෙරුන් වැඩියහ. පාරිලෙය්‍ය ඇතා ඒ දැක දණ්ඩක් ගෙන පැන්නේය. එය තථාගතයන් දැක පාරිලෙය්‍ය අයින් වෙන්න ඉවත්වෙන්න එන්න. මේ බුද්ධ උපස්ථායකයයි පැවසුහ.

හෙතෙම එකෙණෙහිම ලීදණ්ඩ විසිකොට ඉවතලා පා සිවුරු ගැනීමට ඉල්වීය. ස්ථවිරයෝ නුදුන්හ. ඇතා ද වත පිළිවෙත මැනවින් දැන ගත්තෙක් වන්නේය. ශාස්තෘන් වහන්සේ වැඩ සිටින ගල් තළාවේ තමන්ගේ පිරිකර නොතබන්නේ යයි සිතීය. ස්ථවිරතෙමේ පා සිවුරු බිම තැබීය. වත් සිරිත් දන්නා අය ගරු අසුන් හි හෝ ඇදෙහි හෝ තමන්ගේ පිරිකර නොතබති. තෙරණුවෝ ශාස්තෘන් වැඳ එකත්පසෙක සිටියහ. ශාස්තෘන් වහන්සේ හුදෙකලාව තනිවම ආවේදයි විචාළහ. භික්ෂූන් පන්සියයක් සමග ආවෙමි යයි කියා, දැන් ඒ අය කොහිදැයි විමසා, ඔබ වහන්සේ ගේ අදහස් නොදන්නා බැවින් පිටත නතර කර ආවෙමියි කීහ. ඒ පිරිස කැඳවාගෙන එන්නැයි කී

විට ඔව්හු කැඳවූහ. ශාස්තෘන් වහන්සේ ඔවුන් සමඟ පිළිසඳර කථාකොට ඒ මහණුන්, වහන්ස බුද්ධ සුකුමාල වූ ද ක්ෂත්‍රිය සුඛුමාල වූ - ඔබ වහන්සේ විසින්, තෙමෙසක් එකමතැන සිටිමින්, නිදියමින් දුෂ්කර කාර්යයක්ම කරන ලද්දේ යයි කීහු. වත් පිළිවෙත් කරන්නෙක් ද නො සිටි බව හඟිමියි කී කල්හි, මහණෙනි පාරිලෙය්‍ය ඇතු ඒ සියළු කාර්යයන් කළේ යයි, ද මෙවැනි සහයක් ලබන්නෙකු සමඟ සිටීම, වසන්නට ලැබීම යහපත්ය. සුදුසුය එසේ නොලබන්නේ නම ඒකචාරීව තනිව හැසිරීම ශ්‍රේෂ්ටයයි පවසා මේ ගාථා වදාළහ.

නුවණ සහ විරිය - ඇති කලණ මිතුරෙකු හා
විසුම යහපත් වේ - සියලු උවදුරු මැඩගෙන

ගුණ නුවණ ඇතියෙක් - නොලදොත් තමන් ඇසුරට
මහ ජනක රජුමෙන් - හුදෙකලාවම විසිය යුතුවේ.

නැණමද බාලයන් - සමග විසුමට වැඩියෙන්
පව් සිරිත් දුරලා - තනිව විසුමම අගී හැමවිට.

මනා පැවතුම් ඇති - නුවණ ඇති සමඟ හැසිරෙන අයෙක් ලදොත් සියලු විපත් මග හැර තුටු සිතින් ඔහු හා විසිය යුතු

මනා පැවතුම් ඇති යහළුවෙකු නොලදොත්, මහා ජනක රජු මෙන්ද පාරිලේයක ඇතා මෙන් ද තනිව විසිය යුතු

හුදෙකලා වාසය උතුම්ය. අනුවණය හා සහාය බවක් නැත. ඔහු ඇසුරෙන් යහපතක් සිදු නොවන බැවිනි. එනිසා පිරිස් පරිහරණයෙහි උත්සාහ නැතිව වනයෙහි තනිව වසන පාරිලේය ඇතා මෙන් තනිව විසිය යුතුය.

එහි **නිපකං** අර්ථ අනර්ථ දන්නා වූ ප්‍රඥාවෙන් යුක්ත වූ, **සාධු විහාරි ධීරං** - කල්‍යාණ වූ පැවතුම් ඇති, ධෛර්යමත් වූ, ප්‍රාඥ වූ, **පරිසඤ්ඤානි** එබඳු වූ මෛත්‍රී විහාර සහිත වූවකුගේ සහාය ලබන්නේ නම් සිංහ ව්‍යාඝ්‍ර

ආදීන්ගෙන් වන සියලු උවදුරු මැඩ රාග භය ද්වේශ භය ආදී උවදුරු ද නසා, සියලු උවදුරුවලින් දුරු වී, සියලු උවදුරු මැඩ පවත්වා එළඹ සිටි සිහියෙන් යුක්තව හැසිරෙන්නේය. කල්ගත කරන්නේය යන අර්ථයි. **රාජාව රට්ඨානි** රට හැර ගිය මහා ජනක රජු මෙන් දිනාගත් හෝ අතටපත් හෝ මහරටක් අත්හළ රජු. මේ රාජ්‍යය නම් මහත්සේ ප්‍රමාදයට කරුණුය. මේ රාජ්‍යයෙන් මට කවර වැඩක්ද, යනුවෙන් සිතා යටත්රට හැර හුදෙකලාවම මහා අරණ්‍යයට පිවිස, තවුස් පැවිද්දෙන් පැවිදිව, සිව් ඉරියව්හි හුදෙකලාව හැසිරෙයි. මෙසේ තනිව හැසිරීම දැක්වීම සඳහා මෙය කියන ලදී. **මාතඞ්ග රඤ්ඤාව නාගො** මම වනාහි ඇතුන් ඇතින්නියන් ඇත් නාම්බන්, ඇත් පැටවුන් විසින් කා ඉතිරිකරන ලද, මේරු කොල කම් ඔවුන් විසින් කඩා දමා ඉතිරිකරන ලද අතු හා අතුවල මේරු කොලකම් ඇත් රැළ දියට බැස නා ගියායින් පසු, ඔවුන් විසින් බොර කරන ලද දිය මට බොන්න ලැබේ. බොර වතුර නාන්නට ලැබේ. මා ජලයට බසින විට ජලයෙන් ගොඩ එන ඇතින්නියෝ මගේ ඇගේ හැපෙති. මම මේ අලිරැළෙන් වෙන් වී වාසය කරන්නේ නම් ඉතා යෙහෙකි. මෙසේ සිතා, මාතඞ්ග යයි නම් ලද, මේ වනයේ වෙසෙන ඇතා පිරිස අත්හැර, සියලු ඉරියව්හි තනිව හැසිරෙයි. යන අර්ථයි. **එකස්සා** පැවිද්දාගේ පැවිදිවූ තැන් පටන්, තනිව හැසිරීමේ කැමැත්ත, තනිව හැසිරීමේ ඇල්ම තනිව හැසිරීම,

චරිතං සෙය්‍යා නත්ථීබාලෙ සහායත වුළසිල, මධ්‍යම සීල, දස කථා වස්තු කෙලෙස් ධුනාංග විදර්ශනා නුවණ සතර මග, සතර ඵල, ත්‍රිවිද්‍යාෂට් අභිඤ්ඤා, අමාමහ නිවන, මේවා සහාය වීම යනුයි. යම් කිසි බාලයකු නිසා ඒ ධර්මයන්ට පැමිණීමට නොහැක්කේද එවැනි බාලයන් සමග සහ වාසය අත්හළ යුතුය. එකො මේ කාරණයෙන් සියලු ඉරියව්හි අප්‍රමාද නොව් හුදෙකලාව හැසිරෙන්න. **නවපාපානි** පව්කම් නොකළ යුතුය. **අපෙපාසසුකෙකා** ආශාව ආලය දුරුකළ යුතුය. **අරඤ්ඤමාතඞ්ග නාගො** මේ අරණෙහි කැමති කැමති තැනක සුවසේ හැසිරෙයි. මෙසේ තනිව හැසිරෙන්නේ ස්වල්ප වූ පාපයක් නො කරයි. යන අර්ථයි. එහෙයින්

තොපගේ සුදුසු සහාය නොලත් බැවින් ඒකචාරීව විසීම කළ යුතු වන්නේය. යන මෙම අර්ථය දක්වමින් ශාස්තෘන් වහන්සේ එම භික්ෂූන්ට ධර්ම දේශනා කළසේක.

දේශනාවසානයේ පන්සියයක් භික්ෂූහු රහත් බවෙහි පිහිටුහ.

ප්‍රදේශවාසී පන්සියයක් භික්ෂූන්ගේ කථා පුවතයි.

23.8

"අත්ථමහි ති" යන මේ ධර්ම දේශනය බුදුහු හිමවත් පෙදෙසේ අරඤ්ඤ කුටියේ වැඩසිටියදී මාරයා නිමිති කරගෙන දේශනා කළහ.

එකල රජවරු මිනිස්සු පීඩාවට ලක්කර රාජ්‍යය කරත්. එහි දී භාග්‍යවතුන් වහන්සේ අධාර්මික රජවරුන්ගේ රාජ්‍යයන්හි දඬුවම් වලින් හා භාණ්ඩ පැහැර ගැනීම් වලින් පීඩිත එම මිනිසුන් දැක කාරුණිකව මෙලෙස සිතූහ. විනාශ නොකර, ඝාතනය නොකර. ජය නොගෙන දඬුමුගුරු නොමැතිව ශෝක නොකර සෝක නොකරවා ධර්මයෙන් රාජ්‍යයක් කිරීමට හැකිවේද?

පාපී වූ මාරතෙම භාග්‍යවතුන්ගේ මේ පරිවිතර්කය දැන, ශ්‍රමණ ගෞතම තෙමේ දැහැමින් රාජ්‍යය කරන්නට හැකිවේදැයි කල්පනා කරයි. ශ්‍රමණ ගෞතමයන් රාජ්‍යය කරන්නට කැමති වේ නම්, පමා නොවී එය කළ යුතුයි - රාජ්‍යය සඳහා පහසුකම් ලබා දී ඔහුගේ උත්සාහ වඩවන්නට යමියි සිතා ශාස්තෘන් වෙත ගොස් මෙසේ කීය. භාගවතුන් වහන්සේ රාජ්‍යය විචාරවා සුගතයන් වහන්සේ විනාශ නොකර, ඝාතනය නොකර. ජය නොගෙන, (යුද්ධ නොකොට) දඬු මුගුරු නැතිව, ධර්මයෙන් රාජ්‍යය කෙරේවා.

ඉක්බිති ශාස්තෘන් වහන්සේ පාපී මාරය මේ ඇයි ද ඔබ මගේ කුමන විතර්කයක් දුටුවේද. ඔබ මට කුමක් කියන්නේ ද? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සතර ඍද්ධිපාද මැනවින් වැඩුයේය. ඔබ වහන්සේ අපේක්ෂා කරන්නේ නම් හිමවත් පර්වතය රත්රන් බවට පරිවර්තනය කළ හැකිය. ඔබට ධනය ඇත. මම ද ඔබට ධනය දෙමි ඔබ වහන්සේ ධර්මයෙන් රාජ්‍යය කළ මැනව.

හිමවත් පර්වතය රන් රිදී වුවත් හුදෙක් මට එයින් කවර ප්‍රයෝජනයක් ද,

යමෙක් දුක නොදනිද. දුකෙහි හේතුව නොදනීද, නැවත ඉපදීමේ හේතුව හා ලෝකයේ පැවැත්ම නොදනිද, එවැනි වූ තාගේ අවවාද භික්ෂූන් වලින් කවර

අර්ථයක්ද, ඔබ සමග මගේ කිසිදු කථාවක් නැත.

දිවියෙහි කලණ මිතුරන් ලැබුමද සැපය
ලද දෙයකින් තුටුව දිවි ගෙවුම ද සැපය
මරණය ලගාවන විට කුසලය සැපය
මොක් සුව විඳුම හැම සැපතට වැඩි සැපය.

කිසියම් කටයුත්තක් ඇති කල්හි යහළුවෝ සැපගෙන දේ තමන් සන්තක සුළු දෙයින් හෝ සතුටුවීම සැපයි මරණ සන්නයේ දී පින සැපයි. රහත් බව ඒකාන්ත සැපයයි මවට, පියාට, මහණුන්ට, රහත් උතුමන්ට සත්කාර කිරීම සැපයි. ජරාව තෙක් සිල් රැකීම ශ්‍රද්ධාව පිහිටීම. නුවණ ලැබීම පව් නොකිරීම සැපයි.

එහි **අසංමහි** පැවිද්දෙකුට සිවුරු මැසීම්, යාමය ඇති කිරීම් හා ගිහියෙකුට කෘෂිකර්ම, වාණිජ, කටයුත්තක් එළඹ සිටි කල්හි බලවත් පක්ෂය සංසිඳවීමෙහි මැඩ පැවැත්වීමෙහි, යම්කිසි කෘත්‍යයක් උපන්විට ඒ කෘත්‍යය සම්පූර්ණ කරලීමට හැකියාව ඇති එබඳු මිතුයෝ, **සුඛා සහායා** සුවගෙන දේ යන අර්ථයි. **තුටයීසුඛා** යම්හෙයකින් ගිහියන් ද ලද දෙයින් සතුටු නොවී, ගෙවල් බිඳීම් ආදිය කරත්, පැවිද්දෝ නානාවිධ එක්වියි අනේසන ධර්මයන් හි යෙදීත් සතුටු නොවෙත්, **තසමා** එහෙයින් යමෙක් **ඉතරීතරෙන** සුළු වූ හෝ මහත් වූ හෝ තමන් සන්තක දෙයින් සතුටු වීම. **සුඛා** සැපය යන අර්ථයි. **ප්‍රකඤ්ඤනති** මරණ කාලයෙහි දී තම අදහස් පරිදි කරණ ලද පින්කම්ම සැප ගෙන දේ. **සබ්බස්සා** සියලු සසර දුක් ප්‍රහීණ කරන අර්හත්වය සියල්ලන්ටම වඩා සුවය. **මතෙතයච්** මව් කෙරෙහි මනා පිළිවෙත් ඇති බව, **පිතරි** පියා කෙරෙහි මනා පිළිවෙත් ඇති බව, මව්පියන්ට උවැටන් කිරීම, කළයුතුයි. මව් පියෝ දූ පුතුන් තමන්ට උපස්ථාන නොකරන බව දන තමන් සතු දේ පොළවෙහි නිධන් කරයි. අනුන්ට හෝ දෙති. මව් පියන්ට උපස්ථාන නොකරන පුද්ගලයා නින්දා ලබයි මරණින් පසුව ගුථ නරකයේ උපදිත්. යම්කිසිවෙක් දෙමාපියන්ට උපස්ථාන කරයිද ඔව්හු ඔවුන්ට සම්පත් ධනය දෙයි. ප්‍රශංසාද ලබත් මරණින්මතු ස්වර්ගයේ උපදිත්. එහෙයින් දෙපරිද්දෙකින් සැප විදී කියයි. පැවිද්දන් කෙරෙහි මනා

පැවැත්මයි. බ්‍රහ්මඤ්ඤතානි බැහැර කරන ලද පවු ඇති බුදු - පසේබුදු ශ්‍රාවකයින් අතර මනාව පිළිසඳී ඔවුන්ට සිවුපසයෙන් උවටැන් කිරීම පරිත්‍යාග කිරීම කියන ලදී. මෙයද ලොව සැපයකි. **සීලනති** - මණිකුණ්ඩල රතු වස්ත්‍ර ආදි අලංකාර වීම නම් ඒ ඒ වයසේ සිටි අයටම ශෝභාමත් වේ. මෙහි ළදරුවන්ගේ අලංකාරය මහළු අයටද මහල්ලන්ගේ අලංකාරය ළමාකලටද හොබී. දකින්නෝ උමතු කෙනෙකි උමතු අයෙකියි ගර්හා කරති. දෝෂයක්ම දකිති. පන්සිල් දසසිල් ආදිය දරුවාටද මහල්ලාටද සියල්ලන්ටම හැම වයසකදීම සුදුසුවේ. **සුඛං යාව ජරා සීලං - සද්ධා පනිධීනානි** ලෞකික ලෝකෝත්තර වශයෙන් ශ්‍රද්ධාව දේයාකාරය ශ්‍රද්ධාව නිශ්චලව පිහිටීම සුවයකි. ලෞකික ලෝකෝත්තර ප්‍රඥාව ලැබීම සුවයකි.

"පාපානං අකරණනති" ඒ දඬු කැඩිම්, පාරවල් වැසීම් ආදී පවු නොකිරීම මෙලොව සුවයකි. යන අර්ථයි. දෙසුම අවසන බොහෝ දේවතාවන්ට ධර්මාවබෝධය සිදුවිය.

මාරයා පිළිබඳ කථා පුවතයි.
නාග වර්ග වර්ණනය නිමා විය.

විසිතුන්වැනි වර්ගයයි.

24-1

"මනුජස්සානි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී කපිල ඇමති නිමිති කරගෙන දේශනා කළහ.

පෙර අතීතයේදී කාශ්‍යප භාග්‍යවතුන් පිරිනිවන් පෑ කාලයේදී කුලදෙකක සහෝදරයෝ දෙදෙනෙක් ගිහිගෙන් නික්ම ශ්‍රාවකයින් අසල පැවිදි වූහ. මේ දෙදෙනා අතර වැඩිමලා සොඛන - නම් විය. බාලයා කපිල නම් විය. මොවුන්ගේ මව සාධිනී නම් වුවාය. කණිටු සහෝදරිය තාපනා නම් වුවාය. ඇය ද භික්ෂුණීන් අතර පැවිදි වුවාය. මේ ලෙසට ඔවුන් පැවිදි වූ පසුව සොහොයුරන් දෙදෙනා ආචාර්ය උපාධ්‍යයන්ට වත්වත් කර වාසය කරණ අතර ස්වාමීනි ! මේ සසුනේ ධුර කියක්දැයි විමසූහ.

එසේ විමසා ග්‍රන්ථධුරය හා විදස්සනා ධුරය යනුවෙන් ධුර දෙකක් බව අසා වැඩිමලා විපස්සනා ධුරය පුරමියි වසර පහක් ආචාර්ය උපාධ්‍යයන් ලඟ වාසය කර අර්හත්වය දක්වා කමටහන් ගෙන කැලයට පිවිස උත්සාහ කරමින් රහත්බවට පත්විය. බාලයා මම තවමත් තරුණය. මහළු කල විදර්ශනාධුරය ලබා පුරමියි ග්‍රන්ථධුරය පිහිටා ත්‍රිපිටකය උගන්නේය. ඔහුගේ පර්යාප්තිය නිසා පිරිවරද පිරිවර නිසා ලාභයද ඇතිවිය. ඔහු බහුශ්‍රැත මදයෙන් මත්වූයේ ලාභ තෘෂ්ණාවෙන් මැඩගත්තේ බොහෝ පණ්ඩිතමානි බැවින් අන්අය විසින් කියනලද කැපදේ අකැපදේ ලෙසත් අකැප කැපදේ ලෙසටත් කියති. නිවැරදිදේ වැරදි ලෙසටද වැරදිදේ නිවැරදි ලෙසට ද කියයි. මේනිසා සුජේසල භික්ෂූන් පැමිණ ඇවැත්නි කපිල, මෙලෙය නොකියවු කියා ධර්මයද විනය ද දක්වා අවවාද කරන්නේ, තෙපි කුමක් දන්නේද? හිස් කළයක් වගේ මේ ආදී දේ කියමින් ගරහමින් අවමන්කරමින් හැසිරෙයි. අනතුරුව සහෝදර සෝධන තෙරුන්ට මේ පිළිබඳව කරුණු කීවාහුය. උන්වහන්සේද මෙම තෙරුන් වෙත එළඹ ඇවැත්නි කපිල ඔබ වහන්සේලාගේ මනාපැවැත්ම සසුනට ආයුෂ වේ. මේ නිසා සම්‍යක් ප්‍රතිපත්ති දුරුකර කැපදේ ආදිය වලකමින් අවවාද නොකරන්න. ඔහු

උන්වහන්සේගේ ආවවාදයද බැහැර කලේය. මෙසේ ඇතිකලද එම තෙරුන් දෙතුන් වරක් අවවාද කර එය පිළි නොගන්නේ, මගේ වචන නොකරතියි දැන ඇවැත්නි එසේ නම් තමන්ට වුවමනා ලෙස කරන්නැයි කියා පිටත්ව ගියහ. එතැන්සිට යහපත් භික්ෂූන් ඔහු අත් හලහ. ඔහු දුරාචාර වී දුරාචාරීන් පිරිවරා වාසය කරන්නේ, එක් දිනක් පොහොය ගෙයි ප්‍රාතිමෝක්ෂය දෙසමියි තල්පත ගෙන ධර්මාසනයේ සිට, ඇවැත්නි මෙතැන රැස්වූ භික්ෂූන්ට ප්‍රාතිමොක්ෂ දේශනය සුදුසුද? විමසා පිළිතුරු දීමෙන් කවර අර්ථයක්දැයි භික්ෂූන් පිළිතුරු නොදී නිශ්ශබ්දව සිටින විට භික්ෂූන්ට - ප්‍රවචන නැතැයි ඇවැත්නි ධර්මයද විනයද නැත. ප්‍රාතිමෝක්ෂයෙන් ඇසීමෙන් හෝ නොඇසීමෙන් කවර ප්‍රයෝජනයක්ද කවර අරුතක්ද කියා අසුනින් නැගිසිටියේය මෙලෙස ඔහු කාශ්‍යප බුදුන්ගේ සසුන පර්යාප්ති ශාසනය පසු බැස්සවීය. මෙසේ කපිල තෙරුන් ආයු කෙළවර කළුරිය කොට අවීචි නරකයේ උපන්හ. සෝධන තෙරුන්ද එදිනම පිරිනිවන් පෑහ. කපිල තෙරුන්ගේ මවද සහෝදරියද විපාක අනුව සුපේසල භික්ෂූන්ට ආක්‍රොෂ කොට බැනවැදී අවීචි නිරයේ උපන්නාහුය. මෙකල පන්සියයක් පුරුෂයෝ ගවඝාතන - ගම් පැහැරීම් ආදිය කර සොරකමින් ජීවත් වෙමින් සිටියදී ජනපද වාසී මිනිසුන් ඔවුන් ලුහුබඳින්නාහු පලායන අතර වන සෙනසුනට පිවිසී එහි කිසි පිළිසරණක් නෙලැබ. එක්තරා ආරණ්‍යක භික්ෂුවක් දැක වැඳ අපට පිලිසරණ වේවායි කීවාහුය. තොපට සීලය හැර වෙනත් පිළිසරණක් නැත. සියල්ලෝම පන්සිල් සමාදන් වෙවු. මෙසේ පැවසුවිට යහපතැයි සියළු දෙන පන්සිල් සමාදන්වූහ. අනතුරුව තෙරණුවෝ අවවාද කළෝය. දැන් තොප සිල් වත්හුය. ජීවිත හේතුවෙන් හෝ සිල් නොකඩවු සිත් දුෂණයන්ද නොකළ යුතුය. ඔවුහු යහපතැයි පිළිගන්නාහුය. අනතුරුව ඒ ජනපදිකයෝ එම තැනට පැමිණ ඔබ නොබ සොයන්නේ එම සොරුන් දැක සියලු සොරුන් ඝාතනය කළහ. ඔවුන් මියගොස් දෙව්ලොව පහළවුනි නායක සොරා ජ්‍යෙෂ්ට දේවපුත්‍රයා විය. ඔවුහු අනුලෝම පටිලෝම වශයෙන් එක් බුද්ධාන්තරයක් දෙව්ලොව සැරිසරා මේ බුදෙධාත්පාද කාලයේදී සැවැත්නුවර කුල පන්සියක් ඇති. ධීවර ගමක උපන්නාහුය. ජ්‍යෙෂ්ඨ දේව පුත්‍රයා ධීවර නායකයාගේ ගෘහයෙහි පිළිසඳ ගත්තේය. අනෙක් අය අනෙක් අය අතර මෙලෙස ඔවුන් එක දවසකම උපන්හ. ප්‍රතිසන්ධියද බිහි වීමද එකම දිනයේ සිදුවිය. ධීවර නායකයා මේගමේ අද

උපන් වෙනත් දරුවන් ඇත්දැයි සොයා බලා ඔවුන්ගේ උපත ගැන අසා දැනගෙන මොවුන් මගේ පුතාට සහායකයින් වන්නේයයි සියල්ලන්ම පෝෂණය කරන්නට මුදල් දෙවීය. මේ සියල්ලෝම වැලි කෙලියේ සිට මිතුරන් වී පිළිවලින් වයසට පත් වූහ. ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයාම ප්‍රධානියා විය. කපිල බුද්ධාන්තරයක් නිරයේ පැසී විපාක වශයෙන් එකල අවිරවති ගඟේ රන්වන්වූ දුඟද හමන කට ඇති මාළුවෙක් වී උපන්නේය. අනතුරු දිනෙක ඒ යාළුවෝ මාළුවන් අල්ලාගනිමුයි දැල් ආදිය ගෙන ගඟට දමූහ. මේ අතර එම මාළුවා ඔවුන්ගේ දැලට අසුවිය. එය දැක සියළු ධීවරයෝ මහා හඬින් කෑගැසූහ. අපේ පුතුන් පළමුදින මාළු අල්ලද්දී රන් මාළුවෙකු බැන්දාහුය දන් අපට රජු බොහෝධනය දෙනු ඇත. මේ යාළුවෝ මාළුවා ඔරුවක පටවා ඔරුව පිටින්ම රජු වෙතටගෙ ගියාහුය. රජුද මේ කුමක්දැයි විමසා දේවයනි මාළුවෙකුයි කීවාහුය. රජු රන්වන් මසු දැක ඔවුහු මොහුගේ රන්වන් බවට හේතු දන්නේදැයි මාළුවා ගෙන්වාගෙන බුදුන්වෙත ගියේය. මාළුවගේ කට ඇරිය විගස මුළුදෙව්රම් වෙහෙරම දුඟද හැමීය. එය දැඩි දුගඳයක් විය. රජතුමා තථාගතයන් වහන්සේගෙන් හේතු විමසුවේය. ස්වාමීනි කුමක් නිසා මාළුවා රන්වන් වීද කුමක් නිසා දුඟද හමයිද? මහරජ මොහු කාශ්‍යප බුද්ධකාලයේ දී "කපිල" නම් භික්ෂුවක්විය. බහුශ්‍රැත වූයේ මහපිරිවර වූයේ ලාභ තෘෂ්ණාවෙන් පෙලුනේ තම වචනය නො පිළිගත්තන්ට ආක්‍රොෂ පරිභව කළේ ඒ බුදුන්ගේ සසුනද පරිහානියට පත් කළේය.

එම අකුශල කර්මයෙන් ඔහු අවීචියේ ඉපිද විපාක වශයෙන් දැන් මත්ස්‍යයෙක් විය. ඔහු බොහෝකලක් බුද්ධ ධර්මය නිසා - බුදුගුණය වර්ණය කළ නිසා රන්වන් පැහැය ලැබුවේය. එකල්හී භික්ෂූන්ට නින්ද පරිභව කෙළේද එනිසා මොහුගේ කටින් දැඩි දුගඳක් හමයි. මහරජ ! මම ඔහු කථා කරවන්න දැයි විමසුහ. රජු ස්වාමීනි කථාකරවන්නැයි පැවසුවේය. අනතුරුව බුදුහු ඔබ කපිලදැයි විමසුහ. එසේය ස්වාමීනි මම කපිලයි. කොහේ සිට ආවේද ස්වාමීනි මම අවීචිමහා නකරයේ සිටය. ඔබේ ජ්‍යෙෂ්ඨ සහෝදරයා සෝධන කොහේද, පිරිනිවන් පෑයේය. ඔබේ මව සාධනී කොහේද? නිරයේ ඉපදුනි ස්වාමීනි, ඔබේ නැගණිය තාපනා කොහේද? මහා නරකයේ ඉපදුනි. ස්වාමීනි, දැන් ඔබ කොහේ යන්නේද දැන් ස්වාමීනි අවීචි නිරයටම යමියි කියා විපිලිසර වූයේ ඔරුවට හිසෙන් ගසා මරණට

පත්ව එකෙනෙහිම කළුරිය කොට නරකයේ උපනී. මහජනයා සංවේගයට පත්විය. ලොමුඩැහ ගත්හ. මේ අවස්තාවේදී එතැනට පැමිණි පිරිසට ඔවුන්ගේ සිත් හසර බලා එම අවස්ථාවට ගැලපෙනසේ ධර්මය දේශනා කිරීමට ධම්ම චරියං **"බ්‍රහ්ම චරියං එතදාහු වසුතතම"** යන සුත්‍ර නිපාතයේ කපිල සුත්‍රය කියා මේ ගාථාව දේශනා කලහ.

තන්හා බරින පුඟුලා දිගු සසර	බැදී
බවයෙන් බවය පැන පැන දුක් ගැහැට	විදී
මැනවින් වැඩුණු ගස් අතු අග පලය	සැදී
"මාලුව වැල" එනී එමගින් නස	ලදී

1. පමා වී හැසිරෙන මිනිසාට තෘෂ්ණාව මාළුවා වැලක් වැනිම වැඩේ. තන්හාටෙන් වසඟ වූ ඒ තැනැත්තා, වනයේ ගසින් ගසට පනින වඳුරෙකු මෙන් භවයෙන් භවයට යයි.

2. ලාමක වූ මේ තණ්හාව ලෝකයේ යමෙකු මැඩලයිද ඔහුට වැස්සෙන් තෙමී වැසෙන තණ මෙන් ශෝකය වැඩෙත්.

3. ලෝකයෙහි දුකසේ ඉක්මවිය යුතු මේ තන්හාව මැඩ පවත්වයිද ඒ තැනැත්තා කෙරෙන් පොකුරු පතින් ගිලිහෙන දිය බින්දු මෙන් ශෝකය ගිලිහෙයි.

4. යම් කිසි පිරිසක් මෙහි රැස්වුවාහුද, හැම දෙනාටම යහපතක් වේවා. ඔබ හැමට මෙය කියමි. සැවැන්දරා මුල් කැමැත්තෙක් පොළව හාරා එය ගන්නාක් මෙන්, තණ්හාව විනාශ කරන්න. සැඩ වතුර පහරකින් බට පදුරක් බිඳගෙන යන්නාක් මෙන් මාරයා විසින් ඔබලා මර්දනය නොකෙරේවා

එහි **පමත්ත චාරිනොනි"** - සිහිය බැහැරවීම නිසා ප්‍රමාදයෙන් ප්‍රමාදයේ යෙදෙන පුද්ගලයාට ධ්‍යාන නැත. විපස්සනා මාර්ග ඵල නැත. මාර්ග ඵලඥාණ නොවැඩේ. යම්සේ ගසක් වෙලාගත් මාළුවා වැල විසින් ගස විනාශ කරන්නාක් මෙනි. මාලුවා වැල වැඩෙනෙ ලෙසට දොරටු හය නිසා නැවත නැවත **ඉඡදිමෙන්** තෘෂ්ණාව වැඩේ. යන අර්ථයි. **සො පලවනි**

නුරාතුරං ඔහු තෘෂ්ණාව නිසා භවයක් පාසා දිවයයි තමන් මෙන්ද? **ඵලම්වඡංව වනසම්මිං** යම් සේ ගස්වල ගෙඩි කැමතිවන වඳුරෝ වනයේ සැරි සරමින් ඒ ඒ ගස්වල අතුගනී එකක් අතහැර තවෙකක් ගනී. එයද අත්හැර වෙන එකක් ගනී. අතු නොලැබ සමුහ වසයෙන් පැවතීමට නොපැමිණේ. මෙසේ තණ්හාවසික පුද්ගලයා භවයක් භවයක් පාසා දුවන්නේ අරමුණක් නොලැබ තෘෂ්ණාව ක්ෂය නොකළෝ සසර නැවැත්මට නො පත්තෝය.

යං යනු යම් පුද්ගලයෙක්, **එසා** ලාමක බැවින්, **ජම්මී** විස ආහාර, විසමල් - විසගෙඩි විස පරිභෝග, නිසා රූපාදීන්හි විශේෂයෙන් ශක්ති බැවින් ශාපලත් **විසත්තිකා** යයි විසත්තිකා නම් කියන ලද. ඈඩ්වාරික තෘෂ්ණ තොමෝ, **තණහා** වැඩේ. යම්සේ වැසි කාලයේ නැවත නැවත වැස්ස වහින කල්හි **අභිවඩ්ඪං බිරණං** තෘණ වැඩෙත්ද, මෙසේ ඒ පුද්ගලයාගේ සංසාර චෘතය සෝකයෙන් වැඩේ යන අර්ථයි. **දුරච්චයං** කිසියම් පුද්ගලයෙක් මේ කියන ලද ආකාරයට තෘෂ්ණාව ඉක්මයිද දුරුකරයිද මැඩ පවත්වයිද සහතෙ මැඩ පවත්වයි. එබැවින් පුද්ගලයන්ගේ සංසාර ගමන **සොකාප පතනනි** ශෝක යෙහි වැටේ. යම්සේ නෙලුම් පතෙහි වැටෙන. උදබිඳු දියබිඳු නොරදාද මෙසේ නො පිහිටයි යන අර්ථයි. **තං** වොවදාමි. මේ කරුණෙන් තොපට **කියමි**. භදදංවෝ තොපගේ භදුයෙක් වේවා, මම කපිල වීමි. විනාසයට පැමිණියෙමි. **මුලං** යනු මේ ඈඩ්වාරික තෘෂ්ණාව අර්හත් මාර්ග ඤාණයෙන් මුල සිදිවි. **උසිරපෙවව බිරණං** සැවැන්දරා මුල්වලින් වැඩක් ඇති පුද්ගලයා උදුල්ලකින් බිම සාර සැවැන්දරා මුල් ගන්නේද යන අර්ථයි. **මාවෝ නලංව සොතොව සොතොව මාරෝ භඤ්ජි** පුනපපුනං ගං ඉවුරක හටගත් බට පඳුරු මහා වේගයෙන් ආ ගංවතුරකින් ගලවා ගෙන යන්නේද එසේ ක්ලේශ මාර, මෘත්‍යුමාර, දේවපුත්‍ර මාර ආදී පස්මරුන් තොපට හානියක් නො කෙරේවා.

දේශනාවසානයේ පන්සියයක් කේවට්ට පුත්‍රයන් සංවේගයට පැමිණ දුක් කෙළවර **කිරීම** ප්‍රාර්ථනා කරමින් ශාස්තෘන් සමීපයේ පැවිදිවී නොබෝ කලකින්ම දුක් කෙළවර කොට ශාස්තෘන් වහන්සේ සමග, ප්‍රතිපත්ති ධර්ම රකිමින් එක්ව විසුහ.

කපිල මත්ස්‍යයාගේ කථා පුවතයි.

24.2

"යථාපිමුලෙ" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩසිටියදී එක් අපවිත්‍ර ඌරු පැටියෙකු නිමිතිකරගෙන දේශනා කළහ.

එක් දිනක් බුදුහු රජගහ නුවරට පිඬුපිණිස වැඩමවන විට එක් ඊරි පැටවෙක් දැක සිනා පහළ කළහ. උන්වහන්සේගේ සිනා පහළකරණ විට ඇරුණමුවින් නික්මුන දන්ත රශ්මිය දැක ආනන්ද තෙරුණුවෝ ස්වාමීනි සිනා වන්නේයයි කුමක් නිසාදැයි විමසුහ. බුදුරජාණන් වහන්සේ අනන්ද මේ ඊරි පැටවා දෙස බලන්න. අනන්ද මේ ඊරි පැටවා කකුසඳ බුද්ධකාලයේදී එක් ආසන ශාලාවක කිකිළියක වුවාය. ඇය එක් යෝගාවචර විපස්සනා කර්මස්ථාන සඡඣායනා කරණ භික්ෂුවකගේ ඒ ධර්ම ඝෝෂාව අසා ඉන් චුතවුවා රජ කුලයක ඉපිද උබ්බරි නම් රාජ දුවනියක් වුවාය. ඇය පසු කලෙක වැසිකිළියක පණු රැලක් දැක එහි පණුවන් පිළිබඳ සංඥා උපදවා ප්‍රථම ධ්‍යාන ලැබුවාය. ඇය එහි දිවි ඇතිතාක් සිට එයින් චුතව බඹලොව ඉපදුනි. ඉන් චුතවී භවගති වශයෙන්, කම්පාකරමින් දන් ඌරුයෝනියේ ඉපදුනි මේ කරුණ දැක මම සිනා පහළකලෙමි. එය අසා ආනන්ද තෙරුන් ප්‍රමුඛ භික්ෂූන් මහත් සංවේගයට පත්වූවාහුය. බුදුහු ඔවුන්ගේ සංවේගය උපදවා භවතෘෂ්ණාවේ ආදීනව ප්‍රකාශකරමින් අතුරු විටියේ සිටියදීම මේ ගාථාව ප්‍රකාශ කළහ.

හොඳහැටි වැඩි ඇත්නම් යම් ගසෙක	**මුල**
කැපුවත් යමෙක් යළි දළු ලා නැගෙති	**පල**
නැසුවේ නොමැතිනම් තන්හාගසේ	**මුල**
යළි යළි ඉපිද දුක් ගෙන දෙයි සසර	**තුල**

ගසක මුදුනින් හා අතුවලින් සිඳ දැම්මත් මුල නිරුපද්‍රිතව තිබේනම් යළි වැඩෙන්නා සේ තෘෂ්ණ අනුසය නොනැසූ කල යළි වැඩේ.

2. ශ්‍රෝතස් සතිසක් ඇති මන වඩන රූපාදියෙහි හටගන්නා වූ තෘෂ්ණාව

බලවත් වේද, නුවණ නැති ඔහුගේ රාග නිශ්‍රිත සංකල්පයෝ, විතර්කයෝ බලවත්ව අපායට පමුණුවයි.

3. තෘෂ්ණ නමැති සැඩ වතුර හැම තැනම ගලයි. තෘෂ්ණ නමැති ලතාව සදොරින් මතු වී සිටී. එසේ හටගන්නා වූ තෘෂ්ණ ලතාව දැක එහි මුල සිඳිය යුතුයි.
4. රූපාදී අරමුණුවල ගලාගිය ආශාවෙන් තෙත් වූ, සොම්නස් වේදනා වෙත්. ඔවුහු සැප සොයන්නෝ වෙති. එබඳු සත්ත්වයෝ ජාතියට හා ජරාවට පැමිණෙන්නෝ වෙති.
5. තණ්හාවෙන් පිරිවරන ලද සත්ත්වයෝ බඳිනා ලද සාවෙකු මෙන් බිය වෙති. රාගාදී සත් සංගයන් ගෙන් ද, දස සංයෝජනයන්ගෙන්ද බැඳුනු සත්ත්වයෝ නැවත නැවත දුකට පත්වෙති.
6. එහෙයින් නිවණ කැමතිවන භික්ෂුව තණ්හාව දුරු කළ යුතුය.

එහි **මූලෙ** යම්කිසි ගසක සතර දිසාවෙහි සතරක්ද. සෘජුව යටට ගිය මුලක් දැයි පවත්නා පස්වර්ගයේ මුල් කැපීම කෙටීම, ගිනි තැබීම, උදුරා දැමීම, ආදී යම්කිසි උපද්‍රවයකින්, **අනුපඳවෙ**, උවදුරක් නොවූ විට, දළෙහ **"සොරුකෙඬා"** - ඒ රුක නැවත දැඩිවගයෙන්, අතු ඉති රිකිලි වසයෙන් **පුනදෙව රුහති** නැවත වැඩේ. මෙසේම සදොරෙහි උපදින්නා වූ තෘෂ්ණාව **අනුසයෙ** - අර්හත් මාර්ග ඤාණයෙන් **අනුහතෙ** - මුලින් උදුරා නො දැමුවිට ඒ ඒ භවයන්හි උත්පත්ති ආදියට ගොදුරුවේ. **ඉදං දුකඛං පුනපපනං නිබබනති** - මේ ජරා මරණාදී දුක් නැවත නැවත උපදී යන අර්ථයි. "යසසා "යම් පුද්ගලයකුගේ අධ්‍යාත්මයෙහි උපදින්නා වූ අටලොස් තෘෂ්ණ සිතිවිලිවලින් ද සතිසක් වූ තණහා හැසිරවීම්වලින් සමන්විත වේ. සිත් ඇදගන්නා වූ රූපාදියෙහි පවතියි. ගලා බසියි **මනාපසසවණා** යනුවේ. තන්හාව **භුසා** බලවත් වේ. ඒ පුද්ගලයා ගේ විපරීත වූ ඤාණය **දුදිටයං** යනුවේ. නැවත නැවත ඉපදීම් වසයෙන් මහත්බැවින්, වාහා වී ධ්‍යාන හෝ විදර්ශනා හෝ ඇසුරු නොකරමින් **රාගනිසසිතා සඞකපපා වහනති**. රාග නිශ්‍රිත වූ සංකල්පයින් උසුලමින් ජීවත් වේ යන අර්ථයි. **සවනති සබබධි සොතානි**. මේ තණ්හා නමැති දිය පහර චක්ද්වාරය ආදී වසයෙන් සියලු රූපාදී ආරම්මණයන්හි යෙදී රූප තණ්හා - පෙ - භවතණ්හා ආදියෙන් සියලු භවයන්හි දුක්විඳින්නේය. **ලතා** - යනු වෙළෙන අර්ථයෙන්ද එකට එකතු

කිරීමේ අර්ථයෙන් ද ලතා (මාළුවා) වැල මෙනි. **උබ්භිජ්ජ තිට්ඨතීති** - සදොරින් උපන් රූපාදී අරමුණු කෙරෙහි පවතී. **තඤ්ච දිස්වා** - යනු ඒ තෘෂ්ණා නමැති ලතාව **"එතාය තණ්හාය උප්පජ්ජමානාය උප්පජ්ජති"** ආදී වසයෙන් උපත් ස්ථාන වසයෙන් දන. **පඤ්ඤායා** කැලයෙහි උපන්නා වූ වැලක් ආයුධයකින් සිදදමන්නාක් මෙන් මාර්ග ප්‍රඥාවෙන් තෘෂ්ණා මුල **ඡින්දථ** - සිදිය යුතුය යන අර්ථයි. **සරිතානි යනු** විසුරුවා යවන ලද **සිනෙහිතානි**. සිවුරු පිරිකර ආදිය පිළිබඳව පවත්නා ස්නේහය, තෘෂ්ණා ඉවත දැමිය යුතුය යන අර්ථයි. **සොමනස්සානි** - තෘෂිණාවෙන් දුරුවූ සත්ත්වයන්ට මෙවැනි වූ සොම්නසක් ඇති වේ. **තෙ සාතසිතානි** - ඒ තෘෂ්ණා වසී වූ පුද්ගලයෝ සැප කැමති වී සුව සොයන්නෝ වෙති. **තෙවෙ** යනු යම් මෙබඳු වූ මිනිස්සු ජාති ජරා ව්‍යාධි මරණ ආදියට පැමිණෙත්. **ජාති ජරූපගා** නම් වේ. පජා යනු මේ සත්ත්වයෝ තෘෂ්ණ සංඛ්‍යාවට ගියාහු තෘෂ්ණාවෙන්, **පුරක්ඛතො,** අභිමුඛ පිරිවර වී, **බාධිතො** යනු වැද්දෙකු විසින් වනයේ බඳින ලද සසො විය සාවෙකු මෙන්, **පරිසපපනති** - බිය වෙත් **සංයෝජන සඟසත්තා** යනු දසවිධ සංයෝජනයන් ගෙන්ද, සප්තවිධ රාගාදී බැඳුම් වලින් ද, සත්ත්වයන් බැඳී එහි ලැගුම් ගෙන, **චිරායති** දීර්ඝ කාලයක් නැවත නැවත ජාති ආදී දුක්ඛයන්ට පැමිණෙත් යන අර්ථයි. **තස්මා** එහෙයින් තෘෂ්ණාව පෙරදැරි කරගෙන එයින් වෙළෙන සත්ත්වයෝ **අත්තනො විරාගං** රාගාදියෙන් විතැන් වූ නිවණ ප්‍රාර්ථනා කරන්නා වූ නිවණ කැමැත්ත වූ **භික්ඛු** භික්ෂුහු අර්හත්මගින් එහි පැමිණීමට **කසිණං** විනොදයෙ - තෘෂ්ණාව බැහැරකළ යුතුය. ඉවත දැමිය යුතුය. යන අර්ථයි. දේශනාවසානයේ බොහෝදෙන සෝවාන් ආදී ඵලවල පිහිටියා හුය.

එම ඊරි පැටියා එම අත්බැවින් චුත වී ස්වර්ණ භූමියේ රාජකුලයෙහි ඉපදී, එයින් චුතවැ, බරණැස් නුවර ඉපිද, එයින් චුත වී සුප්පාරක පටුනෙහි අස් වෙළෙඳකුගේ ගෙදර ඉපදුනේය. එයින් චුතවී කාවීර පටුනෙහි ගම්පතියකුගේ ගෙදර දුවක්ව ඉන් චුතව අනුරාධ පුරයේ ධනවත් නිවසකද උපනි. ඉන් චුතවී දක්ෂිණ දේශයේ ලක්දිව "හොක්කන්ත" නම් ගම සුමන නම් කෙළඹියාගේ සුමනා නමින් දියණියක්ව ඉපදුනි. අනතුරුව ඇගේ පියා එම ගමින් පිටකලවිට දිසාවාපි ප්‍රදේශයට ගොස් මහාමුනි නම් ගමේ වාසය කළාය. එහිදී දුටුගැමුණු මහරජුගේ ඇමති ලකුණටක අකිම්බරු කිසියම්

කාර්යක් සඳහා එහි ගියේ ඇය දූක මහත් මංගල උත්සව කර ඇය කැඳවා මහා පුණ්ණ ගමට ගියේ එහිදී කෝටි පබඛත මහා විහාරවාසී මහා අනුරුද්ධ තෙරුන් එහි පිඬු පිණිස හැසිරෙමින් ඇගේ ගෙදොර සිටිනු ඇය දූක භික්ෂූන් සමග මෙසේ පැවසුහ. ඇවැත්නි හිරි පැටිපවා ගොයයිම්බර ඇමතිගේ බිරිඳ වී පැමිණ සිටී අහෝ ආශ්චර්යයකි. ඕ තොමෝ මේ කථාව අසා ඒ අතීත භවය ජාති ස්වරණ ඤාණය ලැබුවාය. ඒ අවස්ථාවේ ඇති වූ සංවේගයෙන් ස්වාමියාට කියා මහත් ඉසුරින් පංචබලිත තෙරණියන් වෙත පැවිදිව තිස්ස මහා විහාරයේ මහා සතිපට්ඨාන සූත්‍ර දේශනාව අසා සෝවාන් ඵලයට පත්වූවාය. පසුව දෙමළ ම ර්දනය කළ පසු මවු පියන්ගේ වසන ගෙත්තන්ත ගමට ගොස් එහි වාසය කරන්නී කලලක විහාරයෙ මහා විශෝපම සූත්‍රය අසා අර්හත් බවට පත් වූවාය. ඇය පිරිනිවන් පෑ දින භික්ෂු භික්ෂුනීන් විසින් විමසන ලදුව භික්ෂුණීන් වෙත සියළු ප්‍රවෘත්තිය නිතර කියා රැස්වූ භික්ෂුසංඝයා මැද මණ්ඩල රාට වාසී ධම්ම පද භාණක මහානිකාය තෙරුන් සමග සංසන්දනය කර මම මුලදී මිනිස් අත්බැවින් චුතව කිකිළියක් වී උකුස්සෙක් සීසවෙජදන කර රජගහ නුවර ඉපිද පරිබබා ජිකාවන් අතර පැවිදිවී පඨමජඣාන ඇතිකරගෙන ඉන් චුතව සිටුකුලයේද අනතුරුව ඌර පෝතිකාවත් ඉන් අනතුරුව ස්වර්ණ භූමියේද ඉන්පසු බරණැසද ඉන් අනතුරුව සුප්පාරක පටුනේ ද පසුව කාවීර පටුනේද අනතුරුව අනුරාධ පුරයේද ඉන්පසු ගොකන්නක ගමේද මෙලෙස සම විෂම ආත්මභාව දහතුනක් ඉපදී කලකිරිනු බවත් සියල්ලෝ අප්‍රමාදීව කටයුතු කළ යුතු බව කියා සිව් පිරිස සංවේගයට පත්කර පරිනිවන් පෑවාය.

සූකර පෝතිකාවගේ කතා පුවතයි.

24.3

"යො නිබ්බණථොනි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනයේ වැඩ සිටියදී සිවුරු හළ කෙනෙක් නිමිත්තකරගෙන දේශනා කළහ.

මහා කාශ්‍යප තෙරුන්ගේ එක් සද්ධි විහාරික භික්ෂුවක් වී ධ්‍යාන සතර උපදවා, තමන්ගේ මාමා වූ රන්කරුවෙකුගේ නිවසේ විෂභාග රූපයක් දැක එහි බැඳුන සිත් ඇත්තේ උපැවිදි වුයේය. අනතුරුව මිනිස්සු අලස බැවින් කටයුතු කිරීමට නොකමැතිව ගෙයින් බැහැර කළහ. ඔහු පවිටු මිතු ඇසුරින් සොරකමින් දිවි ගෙවමින් හැසුරුනි. අනතුරුව ඔහු එක් දිනක් අල්ලාගෙන අත් පසුපසට තබා දැඩියේ බැඳ කස පහරින් තලමින් සාතනය කරණ තැනට ගෙන ගියහ. තෙරුන් පිණ්ඩපාතයේ යාමට පිවිසෙන්නේ ඔහු දකුණු දොරටුවෙන් ගෙනයනු බලා බන්ධනය ලිහිල්කර පෙර ඔබ විසින් පුරුදු කළ කර්මස්ථානය යලි සිය කරන්නැයි පැවසුවේය. ඔහු එම අවවාදයෙන් සිහිය ලබා නැවත චතුර්ථ ධ්‍යානය ඉපිදවීය. අනතුරුව සාතනය කරණ තැනට ගෙනගොස් සාතනය කරමුයි උල (හෙල්ල) එසවුහ ඔහු බියෙන් ත්‍රස්ත නොවීය. අනතුරුව ඔහුගේ සතර පැත්තේම සිටි මිනිස්සු කඩු. කිණිසි තෝමර ආදී ආයුධ උස්සා සිටියද ඔහු බියට පත් නොවීය. ඉක්බිතිව එහි රැස්ව සිටි මිනිස්සු මොහු බලන්න නොයෙක් සිය ගණන් ආයුධගත් අත්ඇති පුරුෂයන් මැද තැති නොගනී. නො සැලේ කම්පා නොවේ. ආශ්චර්යකි. අද්භූත දෙයකි මෙසේ මහා ශබ්ද කර කෑගසා රජුට මේ පුවත දැනුම් දුන්හ. රජුා මේ කරුණ අසා ඔහු මුදවා හරින්නැයි පැවසුවේය. බුදුන් හමුවටද ගොස් එම කරුණ දැනුම් දුන්නේ ය. බුදුහු ආලෝකයක් පතුරුවා ඔහුට ධර්ම දේශනා කරන්නට මේ ගාථාව පැවසුහ.

ගිහි සැපත් අතැර දා යමෙක් ඉන්	මිදිලා
තවුස් දම් රැකියමුත් වනයෙහිම	ඇලිලා
ඔහු එයින් වෙනස් වී කම් සුවෙහි	ගිලිලා
යළින් ගිහිගෙට යයිද ආසාවෙ	බැඳිලා

එහි අර්ථය :-

යො යම් පුද්ගලයෙක් ගිහි බවෙහි ආලය සංඛ්‍යාත වූ වනය අත්හැර පැවිදි වී, **නිබ්බාණථො** දිවා විහාර සංඛ්‍යාත තපසෙහි ඇලුණේ, **අධිමුත්තො** - ගෘහවාසය සම්බන්ධ වූ තණ්හාවෙන් **මුත්තො** මිදී නැවත ඔහු ගෘහවාස බන්ධනයටම ගිහිගෙය නමැති වනයටම ගියේද **එථනං පුග්ගලං පස්සථ** පැමිණේවි මේ පුද්ගලයා බලව්.

හෙතෙම මේ ධර්මදේශනාව අසා ඒ රාජපුරුසයන් විසින් ඔහුව උල හිටවුවද ඒ උල අග සිටගෙනම උදයව්‍යය භාවනා වෙහි පිහිටා නිලකුණු මෙනෙහි කොට සංස්කාරයන් සම් මර්ශනය කරන්නේ සෝවාන් පෙලෙහි පිහිටා සමවත් සුව අනුභව කරමින් අහසට නැගී අහසින්ම ශාස්තෘන් සමීපයට ගොස් බුදුන් වැඳ රජුන් සහිත පිරිස් මැද රහත් බවට පැමිණියහ.

සිවුරු හළ කෙනෙකු පිළිබඳ කථා පුවතයි.

24.4

"නතං දළහනති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩසිටියදී සිරගෙයක් පිළිබඳව දේශනාකළහ.

එක් කලෙක බොහෝ ගෙවල්බිඳින අතර මගදී මිනිසුන් ඝාතනය කරණ මිනීමරු සොරුන් ගෙනවුත් කොසොල් රජුට පෙන්වූහ. ඔවුන් රජු විසින් දම්වැල් වලින් බැඳ රැහැන් බන්ධන මාංචු බන්ධන ආදියෙන් බැඳවීය. සියළු ජන පදවලින් භික්ෂූන් වහන්සේලා බුදුන් දකිනු කැමතිව අවුත් වැඳ දෙවන දින සැවැත්නුවර පිඬුපිණිස හැසිරෙන අතර සිරගෙට ගොස් එම සොරුන් දැක පිණ්ඩපාතයෙන් පසු සවස බුදුන්වෙත එළඹ ස්වාමීනි අද අපි පිඬුසිඟා වඩින අතර සිරගෙයි සොරු දම්වැල් ආදියෙන් බැඳ මහදුක් විඳින අයුරු දිටිමු. පළායාමට නොහැකි මේ බැඳුම්වලට වඩා ස්ථිරසාර වෙනත් බැඳුම් ඇත්ද ස්වාමීනියි විමසූහ. මහණෙනි මේ බන්ධන මොනවාද යමෙකුට ධන ධාන්‍ය අඹුදරුවන් පිළිබඳ තන්හා කෙලෙස් බන්ධන මේ බැඳුම් වලට වඩා සියදහස් ගුණයෙන් ස්ථිරසාර වේ. මේ මහත් බන්ධන වලින් මිදුන පෙර පඬිවරු හිමවතට පිවිස පැවිදි වුනයි පවසා අතීතය ගෙන හැර දැක්වූහ.

පෙර බරණැස බ්‍රහ්මදත්ත රජු රජ කරණ අතර බෝසත් තුමා එක් දුගී නිවසක ඉපදුනි. ඔහු වයසට පැමිණෙන අතර පියා කළුරිය කළේය. ඔහු බැලමෙහෙවරකර මව පෝෂණය කළේය. ඔහුගේ මව අකමැත්තෙන් සිටිය දිම එක් කුල දුවක් පාවා දී පසුකලෙක කලුරියකළාය ඔහුගේ බිරිඳගේ කුස දරුගැබක් පිහිටියේය. ඔහු මේ දරුගැබ පිහිටි බව නොදැන සොදුර ඔබ කුලිවැඩ හෝ වතාවත් කර ජීවත් වෙව මම පැවිදි වන්නෙමි. කිවේය. ඇය එවිට ස්වාමීනි මට ගැබක් පිහිටියේය මා බිහිකරණ දරුවා දැක පැවිදිවන්නැයි කිවේය. ඔහු යහපතැයි පිළිගෙන දරුවා වැදූ පසු සොදුර ඔබ හොඳින් බිහිකළ නිසා මව දැන් පැවිදි වෙමි. ඉක්බිති ඇය පුතා කිරි බී අවසන් වන තෙක් පමා වන්නැයි කියා නැවත ද දරු ගැබක් ගත්තේය. (ගැබිගනි) ඔහු මෙසේ සිතුවේය. මොහු මැය ගිවිස්සාගෙන මැගේ කැමැත්තෙන් යාමට නොලැබෙයි. මැයට නොකියාම පලා ගොස් පැවිදි වන්නමියි සිතා

ඇයට නොදන්වා රාත්‍රියේ නැගිට පලාගියේය. අනතුරුව නගරා රක්ෂකයෝ අල්ලා ගත්හ. ඔහු ස්වාමීනි මම මව පෝෂණය කරන්නෙකි. මා මුදාහරින්නැයි ගැලවී එක් තැනක සිට හිමවතට පිවිස ඍෂි පැවිද්දෙන් පැවිදිවී අභිඥා සමාපත්ති උපදවා ධ්‍යාන ක්‍රීඩාවේ යෙදෙමින් වාසය කළේය. ඔහු එහි වසන්නේ මෙබඳු වූ ම විදීමට අපහසු පුත්‍රදාර බන්ධනය කෙලෙස් බන්ධනය සිඳ දැමුවේ යයි උදානයක් පැවසීය. බුදුහු මේ අතීතය දක්වා ඔහු විසින් ප්‍රකාශකරණ ලද උදානය මේ ගාථාවෙන් දක්වූහ.

යකඩෙන් දැවෙන්, කළුගලකින් කරන	**ලද**
සිරගෙය මහා බැඳුමක් යයි සිතන	**වද**
දූ දරු රන් රුවන් වතුපිටි කෙරෙහි	**නද**
ආසාවම මහා බැඳුමයි සසර	**බැඳ**

ඒ ආසාව දුරු කරමින් කෙනෙක් ලොවේ
පැවිදිව වසන්නේ නම් දුක්වලින් නිවේ.

ලෝහමය වූ ද. දැවමය වූ ද. බුබුස් තණ වලින් වූ ද. බන්ධනයක් වෙයිනම් ප්‍රාඥයෝ එය දැඩි බැම්මක් ලෙසම නොකියති මැණික් හා කුණ්ඩලාභරණ විෂයෙහි අතිශයින් ඇලුනාවු යම් තෘෂ්ණාවක් වේද පුතුන් කෙරෙහිද අඹුවන් කෙරෙහිද යම් අපේක්ෂාවක් වේද. මේ බන්ධනය දැඩි බන්ධනයක් යයි ප්‍රාඥයෝ කීහ. සත්වයා පහත්බවට ගෙන යන්නාවු සිහිල් වූ මුදාහල නොහැකි වූ මේ බැම්මද ඥානය නැමති කඩුවෙන් සිඳ අපේක්ෂා නැතිව කම් සුව අත්හැර පැවිදිවෙති.

එහි **ධීරා** යනු බුද්ධාදී පණ්ඩිත පුරුෂයෝය යකඩ දම්වැල් ලෝහ කුරු ආදියෙන් කරන ලද බැඳුම **ආයසං**, ලී දැව ආදියෙන් කරන ලද බන්ධන **දාරුජං**, බුබුස් තණ ආදියෙන් කරන ලද්ද **බබ්බජ**. හණවැහැරි ආදී කඩමලින් කරන රජ්ජු බන්ධන ආදි කඩු ආදියෙන් සිඳීමට හැකි බැවින් ස්ථිරයයි නොකියති. යන අර්ථයි **සාරත්තරත්තා** - අතිශයින් ඇලුණා වූ රාගයෙන් යුක්ත වීම අර්ථයි. මණිකුණ්ඩලෙසු මැණික් කුණ්ඩලාභරණ ආදිය පිළිබඳව ඇලීම ඒ රාගයයි. **එතංදළ්හං** මෙය දැඩිය. **යා පු නත්තදාරෙසු අපෙඛා** - අඹුදරුවන්

ක්ලේශ වසයෙන් බැඳීම දැඩියයි පඬිවරු කියති. **ඔහාරිතං** යටබලා යන සතර අපාය, යන්හි උපදින තැනැත්තාය. **සිථිලං** බැඳුනු තැන සම් - මස් ආදිය නොසිදිය. ලේ නොගලයි. බැඳුනුබව නොදන්න ගොඩබිම ද ජලයෙහිද කර්මාන්ත කරන්නට දීම. දු පපමුඤ්චන්ති ලෝභ වසයෙන් එක් වරක් වත් උපන්නාවූ ක්ලේශ, කැස්බෑවකුගේ කටින් ඩැහැගත් දෙයක් නොගැලවෙන්නාක් මෙන් දුක්ම පමුණුවයි. **බන්ධන** යන්ගෙන් මිදුනු **එතමපි** ඡෙත්‍වාන යන මෙසේ දැඩිව ගත් ක්ලේශ බන්ධනයන්, නුවණ නමැති කඩුවෙන් සිඳ අනපෙක්ඛිනො බලාපොරොත්තු රහිතවැ **කාමසුඛං පහාය** පරිබ්බජං කම් සැකය හැර පැවිද්දට ගියේය යන අර්ථයයි.

දේගනාවසානයේ බොහෝදෙන සෝවාන් ඵලාදියට පැමිණියාහ.

බන්ධනාගාරය පිළිබඳ කථාපුවත

24.5

"යෙ රාග රත්තා" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ රජගහ නුවර වේළුවනා රාමයේ වැඩ සිටියදී බෙමා නම් බිම්බිසාර රජුගේ අගමෙහෙසිය නිමිත්තකරගෙන දේශනාකළහ.

ඇය වනාහි පදුමුත්තර බුද්ධ පාද මූලයේ පතන ලද ප්‍රාර්ථනය නිසා ඉතාම අභිරූපී ප්‍රාසාදික ස්ත්‍රියක් වුවාය. බුදුහු රූපයේ දොස් කියනියි අසා බුදුන් හමුවට යාමට නොකැමති වුවාය. රජු ඇගේ රූපමද භාවය දැනගෙන වේළුවනාරාමය වර්ණනා කරණ ගීත රචනාකර කාව්‍ය කරුවන් ආදීන්ට දෙවීය. ඔවුන් ගේ ඒ ගී ගායනා අසා තමන් නොදුටුවිරූ නොඇසූ විරූ වේළුවනය පිළිබඳව ආශාවක් ඇයට ඇතිවිය. ඇය කවර උයනක් පිළිබඳව ගයන්නේදැයි අසා දේවිය ඔබගේ වේළුවන උයන පිළිබඳවයයි පැවසුවිට උයනට යනු කැමැතිවිය. බුදුරජාණන් වහන්සේ ඇගේ පැමිණීම දැන ගෙන පිරිසමැද සිට ධර්මය දේශනා කරමින්ම - තල් වටක් ගෙන තමා පසුපස සිට පවන් සලන ඉතා අභිරූපි කාන්තාවක් මැවීය. බෙමා දේවිය ඇතුළුවන විටම එම ස්ත්‍රී රූපය දැක සිතුවාය. තථාගතයන් වහන්සේ රූපයේ දොස් කියනියි පවසති මේ ස්ත්‍රිය උන්වහන්සේ අසල සිට පවන් සලයි. මම ඇගේ රූවෙන් අඩකටවත් නොගැලපේ. මෙතරම් අභිරූපි කාන්තාවක් මම කිසිදා දැකනැත. බුදුරජාණන් වහන්සේට අභූත අසත්‍ය චෝදනා නගතියි සිතමි. මෙසේ සිතා බුදුන්ගේ කටහඬවත් නො අසා එම ස්ත්‍රිය දෙසම බලමින්ම සිටියාය. බුදුහු ඇගේ සිත්හසර බලා බෙමාවනි ! ඔබ රූපයේ සාරයක් ඇතැයි සිතන්නිය. බලන්න ඇගේ නිසරුබව කියා මේ ගාථාව දෙසුහ.

බෙමාවනි ! ඉතා අපිරිසිදු වූ ලෙඩ බහුල වූ. කුණු සැරව වැගිරෙන්නා වූ මේ සිරුර බලන්න. බාලයෝ මේ නිසරු වූ සිරුර ප්‍රාර්ථනා කරති.

ඇය ගාථාව කෙලවර සෝවාන් ඵලයෙහි පිහිටියායි අනතුරුව තථාගතයන් වහන්සේ බෙමාවනි ! මේ සත්ත්වයෝ රාගයෙන් රත්වූවෝ ද්වේශයෙන් දූෂිත වූවෝ මෝහයෙන් මුලාවූවෝ තමන්ගේ තෘෂ්ණ ගඟ ඉක්මවීමට

නොහැකි වෙති. එහිම ඇලෙනි පවසා මේ ගාථාව දේශනා කළහ.

මකුළුවකු තමන් කළ දැල තුළම පටලැවී
සිටින මෙන් රාගයෙන් රත්ව දන මේ ලොවේ
දුක් විඳින අතර තුර නුවණ ඇති තැනැත්තේ
සියලු දුක් බිඳුර දා නිවන්පුර සැපත් වේ.

එහි මකුළුවකු ජාලනති යම්සේ මකුළුවෙක් නුල් දැල එලා ඒ දැල මැද නාභි මණ්ඩලයේ සිටින්නේ, දැලට වැටෙන්නා වූ මැස්සෙක් හෝ මදුරුවෙක් හෝ වේගයෙන් අවුත් දැලේ රැඳුනු විට මකුළුවා වේගයෙන් අවුත් උගු විද ඒ සතාගේ රසඕජාව බී නැවත ගොස් එතැනම නොවී. මෙසේම රාගයෙන් රත් වූ ද්වේෂයෙන් දූෂිතවූ. මෝහයෙන් මුළා වූ, **සයංකතං** තෘෂ්ණාව **සොතං අනුපතං** ඔහුට එය සමනය කරන්නට නොහැකිවේ. මෙසේ මුදාගන්නට නොහැකිවේ. **එතමපි ඡෙත්වාන වදනතිධීරා** පණ්ඩිතයෝ, **එතං** මෙසේ දැඩිව ගත් බන්ධන සිඳ, **අනපෙකඛිනෝ** ආශාවන්ගෙන් ඈත් වී. අරහත් මගින් සියලු දුක් අවසන් කොට දුරුර නිවනට පැමිණෙත් යන අර්ථයි.

මේදසුම අවසන ඛේමා බිසව රහත්බවට පත්වුනි. මහජනයාටද දේශනය සාර්ථකවිය. බුදුරදුන්ද මහරජුට මෙසේ පැවසුහ. ඛේමා පැවිදි වීමට හෝ පිරිනිවන් පෑම සුදුසු වේ. ඇය පැවිදිවි අග්‍රශ්‍රාවිකා වුවාය.

ඛේමා තෙරණියගේ කථා පුවතයි.

24.6

"**මුඤ්ච පුරෙනි**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩසිටියදී උගගසේන නිමිතිකරගෙන දේශනා කළහ.

පන්සියයක් නළුවෝ - සංවත්සරයේ දී හෝ සමසකින් හෝ පැමිණිවිට රජගහ නුවරට ගොස් රජු ඉදිරියේ දිනහතක් උත්සව කොට බොහෝ රන් මසුරන් ලබත් මේ අතර පිණුම් ගසන්නන්ගේ ද කෙලවරක් නැත. මහජනයා මැසි පිට මැසි බැඳ ඒ මත සිට සැණකෙළිය බලත්. මේ අතර එක් නළුවෙකුගේ දුවක් උණ ගසකට නැග එහි උඩ පෙරළි එහි කෙළවර අහසේ සක්මන් කරමින් නටයි. ගයයි මේ අවස්ථාවේ උගග සේන නම් සිටු පුත් සියමිතුරා සමග උඩ බැඳි ඇදක සිට ඒ නැටුම බලා ඇගේ අත්පා විසුරුවා ලීම් කෙරෙහි උපන් ස්නේහ ඇත්තේ ගෙට ගොස් ඇය ලැබුනොත් ජීවත් වෙමි. නොලැබෙන්නේ නම් මෙහිම මැරෙමි. ආහාර වර්ජනය කර ඇඳේ වැතුරුනි. මවු පියන් විසින් දරුව ඔබට කුමක් රුචි වේදැයි විමසා ඒ නිළි යුවතියම ලබන්නේ නම් ජීවිතය ඇත. නො ලබන්නේ නම් මෙහිම මැරෙමි කිය. දරුව එසේ නොකරන්න. අපගේ කුලයට ද භෝගයන්ට ද සුදුසු වූ කුමරියක ගෙන එන්නෙමුයි පැවසුවද එලෙසම කියා නිදාගත්තේය. අනතුරුව ඔහුගේ පියා බෙහෙවින් ආයාචනා කළද ඔහු දැනුවත් කිරීමට නොහැකිව. ඔහු ගේ මිතුරා කැඳවා කහවනු දහසක් දී මේ කහවනු ගෙන තම දියණිය මගේ පුතුට දෙන්නැයි නළුවන්ට පණිවිඩය යැව්වේය. ඔහු (නළුවා) කහවනු ගෙන නො දෙමි. ඉදින් ඔහුට මැය ලබානොගෙන ජීවත් වීමට නොහැකිනම් ඒනිසා ඔහු අප සමගම හැසිරේවායි ද එවිට දුව දෙන්නේ යයි ද පැවසුවේය. දෙමව්පියෝ මේ කරුණ පුතුට දැන්වුහ. ඔහු මම ඔවුන් සමග හැසිරෙන්නෙමියි කියා දෙමාපියෝ ඇවිටිලි කරද්දීම ඔවුන්ගේ කථා නොපිළිගෙන ගෙයින් නික්මී නළුවාගේ ලඟට ගියේය. ඔහු ඔහුගේ දුව දී ඔහු සමගම ගම් නියම්ගම් රාජධානිවල ශිල්ප දක්වමින් හැසිරුනේය. ඇයද ඔහු සමග එකතු වී නොබෝ දිනකින් පුතෙකු ලැබ ඔහුට විහිළු කරමින් කරත්ත රකින්නාගේ පුතා භාණ්ඩ අදින්නාගේ පුතා කිසිවක් නොදන්නාගේ පුතා යනුවෙන් අපහාස දේ කියයි. ඔහු ද ඔවුන්ගේ

කරත්ත ගාල්කර නතර කර සිටියතැන් වලදී ගොනුන්ට තණ කොල ගෙන එයි. ශිල්පදක්වන ස්ථානයන්ට දෙන ලද භාණ්ඩ ඔසවාගෙන යයි. එහිදීද එය ගලපා එම ස්ත්‍රිය පුතුට ඇනුම්පද කියමින් එසේ කියයි. ඔහු තමන් නිමිතිකරගෙන ඈ ගායනා කරණ බව දැන මා නිමිතිකරගෙන කියන්නේදැයි ඇසුවේය. එසේය ඔබ නිසා කියමි. එසේ නම් මම පළායමි. ඇය ඔබ ගියත් නොගියත් මට කමක් නැතයි නැවත නැවත එලෙසම (ඇනුම්පද සහිත) ගීතය ගයයි. ඇය නම් තමන්ගේ රූසපුවත් ධන ලාභයත් නිසා කිසිවෙක් නොතකයි. ඔහු මැගේ කවර කරුණක් නිසා මේ මානය තිබේදැයි සිතන්නේ ශිල්පය නිසායයි දැන හොඳයි ශිල්පය උගනිමියි මාමා ලඟට පැමිණ ඔහු දන්නා ශිල්පය ඉගෙන ගම් නියම්ගම් ආදියේ ශිල්ප දක්වන්නේ පිළිවෙළින් රජගහ නුවරට පැමිණ මෙයින් පස්වන දින උග්ග සේන සිටුපුත් නගර වැසියන්ට ශිල්ප දක්වන්නේයයි ප්‍රචාරය කරවීය. නාගරිකයෝ මැසි පිට මැසි බැඳ සත්වැනි දින එක්රැස් වුහ. ඔහුද සැටරියන් උණගසකට නැග එහි මුදුනේ සිටියේය. එදවස බුදුහු උදැසන ලොව බලන්නේ ඔහු තමන්ගේ ඤාණ ජාලයේ ඇතුළට වැදුන බව දැන (දලට හසුවුනා දක) කුමක් වන්නේදැයි ආවර්ජනා කර බලන්නේ හෙට සිටුපුත් ශිල්ප දක්වන්නෙමියි උණගස මුදුනට නැග සිටින්නේ ය. ඔහු බැලීමට මහජනයා එක් රැස් වන්නේ ය. එහි දී මම සතර පද ගාථාවක් දෙන්නෙමි් එය අසා අසුහාරදහසක් මිනිසුන්ට ධර්මාවබෝධය වන්නේ ය. උග්ග සේන ද රහත් බවට පත්වන්නේ යයි දැනගත්හ. බුදුහු දෙවන දින කාලය සලකා භික්ෂුසංඝයා පිරිවර කොටගෙන රජගහ නුවර පිඬුපිණිස හැසුරුනහ. උග්ග සේනද බුදුහු පිවිසීට පෙරම ශෝභා කිරීමට මහජනයාට ඇගිලි ශබ්ද (අහුරු ශබ්දය නගා) උණ ගස මත්තට නැගී සිටියේය. මේ අවස්ථාවේදී බුදුන් නගරයට පිවිසෙන්නේ යම්සේ ඔහු පිරිසට නොපෙනෙන සේ තනි කර තමන් පමණක් පෙනෙන ලෙසට දක්වුහ. උග්ගසේන පිරිස දෙසබලා පිරිස මා දෙස නොබලති කියා දොම්නසට පත් වුයේ මෙය මට අවුරුද්දකින් කළයුතු ශිල්පය බුදුන් ද නගරයට පිවිසෙනවිට පිරිස මදෙස නොබලා බුදුන් ම බලයි. මගේ මේ ශිල්ප දැක්වීම හිස් දෙයකැයි සිතුවේය. බුදුහු ඔහුගේ සිත දැනගෙන මහමුගලන් හිමි අමතා යන්න මුගලන් සිටු පුත්‍රයාට ශිල්ප දන්වන්නැයි කියන්න. තෙරුන් ගොස් උණගස යට සිටි සිටුපුත් අමතා මේ ගාථාව පැවසුහ.

නාට්‍ය පුතුය මෙහි බලන්න උගග සේන මහ බල ඇත්ත රංගනය කරන්න. මහජනයා සිනා ගන්වන්න. ඔහු තෙරුන්ගේ කථාව අසා සතුටු සිත් ඇතිව බුදුහු මගේ ශිල්ප දකිනු කැමැත්තේයයි උණ ගස මත සිටිමින්ම මේ ගාථාව පැවසුවේය.

මහා ප්‍රාඥවූ මහා ඍද්ධි ඇති මුගලන් රහතන් වහන්ස බලන්න රංගනය කොට මහජනතාව සිනා ගන්වමි.

මේ ලෙසට කියා උණගසේ අහසට නැග එසේම තුදුස් වතාවක් පෙරලී බැස උණගස මතම සිටියේය. අනතුරුව බුදුහු උග්ග සේන පණ්ඩිතය ඔබ අතීත - අනාගත වර්තමාන සම්බන්ධයන්හි ආලය අත්හැර ජාති ආදී දුකින් මිදීමට වටී. පවසා මේ ගාථාව දෙසුහ.

යටගිය මතුව එන - වර්තමන නෙකල්හී
පස්කඳ කෙරෙහි ඇති ආසා මුදාලා
බිඳහැර දමා සව් කෙලෙසුන් සතොස්ලෙස
පිවිසෙනු නිවන් පුර නො පැමිණ ජරාවට

අතීතය මුදාලන්න අනාගතයෙන් දුරුවන්න මැද වර්තමානයෙන් පස්කඳ කෙරෙහි ඇති ආසාවෙන් මිදෙන්න පරතෙර ගිය කෙනෙක් වන්න. භවයාගේ පරතෙරට පැමිණෙන්න. නැවත ජාති ජරා තත්ත්වයට නොපත් වන්න

තත්‍ථ එහි **මුඤ්චඅ පුරෙනි** - අතීත ස්කන්ධයන්හි හි ආලය ප්‍රාර්තනය තෘෂ්ණාව මුදන්න. පච්ජති අනාගත සබන්ධයෙන්හිද ආලය මුදන්න. **මජෙඣතති** වර්තමානයේ ද පස්කඳ පිළිබඳ ආසාව මුදන්න. මෙසේ ඇතිකල්හි **භවසස පාරගූති** තුන් භවයන්යහි අභිඤ්ඤා පරිඥාන භාවනා සච්ජිකිරිය වශයෙන් සියලු සංඛතධර්ම යන්හි **විමුනතමාන සො ජාති** ජරා මරණ යන මේවාට නොඑළඹෙන්න යන අර්ථයි. දේශනය අවසානයේ අසුහාර දහසක් ප්‍රාණීන්ට ධර්මාව බෝධය වූයේය.

සිටු පුත්‍රයාද උණගස මත සිටියදීම (චතුපටිසම්භිදා) සිවුපිළිසිඹියා අර්හත්වයට පත්ව උණගසෙන් බැස බුදුන්වෙත එළඹ පසඟ පිහිටුවා වැඳ බුදුන්ගෙන් පැවිද්ද ඉල්ලුවේය. අනතුරුව බුදුරජාණන් වහන්සේ දකුණ අත දිගුකොට එහි භික්ඛුනි එව මහණයයි පැවසුහ. එකෙණෙහිම අටපිරිකර ධාරී හැටවයස් තෙරනමක් මෙන් වුයේය. අනතුරුව භික්ෂූන් ඇවැත්නි උගග සේන හැටරියන් උස උණ ගසින් තොප බසින විට බියක් නොවුවේදැයි විමසුහ. නැත ඇවැත්නි මට බියක් නැතැයි පැපැවසීය ස්වාමීනි උග්ග සේන බිය නැතැයි පවසයි. නොවුදෙයක් කියා අනෙකක් කියන්නේයයි පැවසුහ. තථාගතයන් වහන්සේ මහණෙනි. මගේ පුත් උග්ගසේන සමානවූ සංයෝජන සිඳ ලූ භික්ෂූන් බිය නොවෙති. පවසා බ්‍රාහ්මණ වර්ගයේ මේ ගාථාව දේශනා කළහ.

"සබ්බ සං යෝජනං ඡෙත්වා
යො වෙ න පරි තස්ස ති."

සියළු සංයේජන සිඳ දමා යමෙක් නොතැවේද කෙලෙස් සංසිඳවූ විසංයුත්තවූ තැනැත්තාට මම බ්‍රාහ්මණයයි කියමි.

දේශනය අවසානයේ බොහෝ පිරිසකට ධර්මාව බෝධය විය.

නැවත එක් දිනක් ධර්මසභාවේ කථාවක් ඇතිකළහ. ඇවැත් නි මෙබඳු රහත් වීමේ හේතු සම්පත් ඇති කෙනෙකුට කළු දුවක් නිසා නළුවන් සමග හැසිරීමට කරුණ කුමක්ද රහත් වීමට කරුණ කුමක්දයි කථාකළහ. තථාගතයන් වහන්සේ පැමිණ කිනම්කථාවකින් යුතුව මා ඒමට පෙර සිටියේ දැයි විමසා මේ පිළිබඳව යයි පැවසුවිට මේ කරුණු දෙකම ඔහු විසින් කරණ ලදැයි පවසා එය පෙන්වා දීමට අතීත කථාව දක්වුහ.

පෙර කාශ්‍යප බුදුරදුන්ගේ ස්වර්ණ තෛත්‍යය කර වන විට බරණැස වැඩි කුළ පුත්‍රයෝ බොහෝ කැයුතු බිදිය යුතු දැ වාහනයකට දමා අත්කම් උදව් කරන්නෙමුයි චෛත්‍ය කරණ තැනට යන්නේ අතර මග එක් තෙරනමක් පිඩුසිඟා යාමට පිවිසෙන අයුරු දුටුවෝය. එක් කුල දුවක් තෙරුන් බලා

ස්වාමීයාට කීවේය. ස්වාමිනි ආර්යයන් වහන්සේ අපවෙත පිඬුසිඟා වඩිති මේ රථයේද බොහෝ දේ ඇත පාත්‍රය ගෙනෙන්න භික්ෂාට දෙන්නෙමි. ඔහු පාත්‍රය රැගෙනවිත් ආහාර පුරවා තෙරුන් අත තබා දෙදෙනාම ප්‍රාර්ථනා කළහ. ස්වාමීනි ඔබවහන්සේට දීමෙන් මෙලොව දීම ප්‍රතිඵල ලබන්නෝ වෙමු. එම තෙරණුවෝද රහතන් වහන්සේ නමකි. එනිසා ඔවුන් දෙසබලා ඔවුන්ගේ පැතුම ඉටුවන බව දැන සිනහ පහළ කළහ. එය දැක එම ස්ත්‍රිය ස්වාමීයාට කිවාය. අපේ ආර්යයන් වහන්සේ සිනාසෙති එතෙක් නටන්නෙත් (නළුවෙක්) වන්නේය. ස්වාමීයා ද එසේම වන්නේයයි කියා පිටත්ව ගියහ. මේ ඔවුන්ගේ පුර්ව කුශලකර්මයයි. එ අය එහි දිවි ඇතිතෙක් සිට දෙව්ලොව ඉපිද ඉන් චුතවී එම ස්ත්‍රිය නළු ගෙදරක ඉපදුනි. පුරුෂයා සිටුගෙයක ඉපදුනි. ඇගේ ප්‍රතිවචන දීම නිසා නිළියන් සමග හැසිරුණි - ක්ෂීණාශ්‍රවයන්ට දුන් පිණ්ඩපාතය නිසා අර්හත්වයට පත්විය. ඕ තොමෝද නිළි දියණියද මගේ ස්වාමියාගේ ස්වභාවයට මම ද පැමිණෙන්නෙමියි මෙහෙණි සස්නෙහි පැවිදි වී, අර්හත් භාවයෙහි පිහිටියාය.

උග්ග සේන සිටුපුත්‍රයාගේ කථා පුවතයි.

24.7

"චිතකක මථිතසඤ්ඤා" යන මේ ධර්ම දේශනය බුදුරජාණන් වහන්සේ දෙවිරම වැඩසිටියදී එක් කුඩා භික්ෂුවක් නිමිති කරගෙන දේශනා කළහ.

එක් කුඩා භික්ෂුනමක් සලාක ගෙයින් තම සලාක කැඳ ගෙන ආසන ශාලාවට ගොස් එහි ජලය නොලැබී ජලය සඳහා එක් ගෙයකට ගියේය. එක් කුමාරිකාවක් ඔහු දැක්ක පමණින් උපන් ස්නේහයෙන් ස්වාමීනි නැවත පැන් අවශ්‍ය විටක මෙහාටම එන්නැයි පැවසුවාය. එම භික්ෂුව එතැන් පටන් ජලය නොලැබෙන දිනවලට එම නිවසටම යයි. ඇයද පාත්‍රය ගෙන පැන් දෙයි. මෙලෙස කාලය ගතවනවිට කැඳ දී එක් දිනක් එහි වාඩි කරවා බත් දුන්නාය. ඔහු ලඟින්වාඩිවී ස්වාමීනි මේ ගෙදර නැතිදෙයක්නම් නැත. හුදෙක් අපි විමසන මිනිසෙක් නොලබමුයි කථාව ඉපදවිය. ඔහු දින කීපයකින් ඇගේ කථාව අසා කලකිරුණි. ඉක්බිති එක් දිනක් ආගන්තුක භික්ෂුවක් දැක ඇවැත්නි නුඹ කෘෂයේ පඩුවන් පැහැ ඇත්තේ වෙයි. විමසා ඇවැත්නි කළ කිරුනෙමි. පැවසූ විට ආචාර්ය උපාධ්‍යාය වරුන් වෙත ගෙන ගියහ. ඔවුන් ද දහර භික්ෂුව තථාගතයන් වහන්සේ වෙත ගෙන ගොස් මේ පුවත දැනුම් දුන්හ. බුදුහු භික්ෂුව ඔබ කළකිරුණ බව සැබැවක් දැයි විමසුහ. සැබැවක් බව පැවසූ විට බුදුහු මහණ මා වැනි පටන් ගත් වීර්ය ඇති මේ බුද්ධ ශාසනයේ පැවිදිවී මම සෝවාන් වීමි මම සකෘදාගාමී වීමි ආදිවශයෙන් නොකියා කුමක් නිසා කළකිරුනේද? බැරුරුම් දෙයක් ඔබ කළෙහිය. කුමක් නිසා කළකිරුනේදැයි විමසුහ.

ස්වාමීනි එක් ස්ත්‍රියක් මට මෙසේ කීවාය යනුවෙන් නොරතුරු පැවසුවිට මහණ ආශ්චර්යක් නොවේ. ඇගේ ක්‍රියාව පුදුමයක් නොවේ. ඇය පෙරභවයේදී මුළු දඹදිව ශ්‍රේෂ්ඨ ධනුර්ධර පඩිවරයා අත්හැර එම මොහොතේ දුටු කෙනාට සෙනෙහස උපදවා ඔහු ජීවිතක්ෂයට පත් කළේයයි පවසා භික්ෂුන්ගේ ඉල්ලීම අනුව අතීත කථාව ගෙනහැර දැක්වුහ. පෙර චුල්ල ධනුග්ගහ පණ්ඩිත ව සිටි සමයේ තක්ෂිලාවේ දිසාපාමොක් ආචාර්ය වරයා සමීපයෙහි ශිල්ප උගෙන ගුරුවරයා සතුටුව දුන් දුවණිය

රැගෙන බරණැසට යන අතර එක් කැලැවට පිවිසෙන තැනක ඊතල පනහකින් සොරුන් පනහක් මරා ඊතල අවසන් වුවිට සොර දෙටුවා ගෙන බිම හෙලා සොඳුරිය කඩුව ගෙන එන්නැයි පැවසුවිට ඇය විසින් එකෙනෙහි දුටු සොරාට සෙනෙහස බැඳ සොරු අත මිට තබා සොරා විසින් ධනුග්ගහ වඩිවරයා මැරුබව පවසා සොරා විසින් ඇය රැගෙන යන විට, මැය තවත් එකෙක් දැක මා මරණු ඇතැයි කියා මැයගෙන් කවර ප්‍රයෝජනයක්දැයි සිතා එක ගඟක් දැක ඇය මෙතෙර තබා ඇගේ බඩුගෙන භාණ්ඩ එතෙර තබා ඔබ එතර කර වීමට එන්නේමියි කියා ඇය අත් හැර ගිය ස්වරූපය අනාවරණය කර.

1. බ්‍රාහ්මණය සියළු භාණ්ඩ රැගෙන එතරට තරණය කළේය ඉක්මනින් වහාම එව මේ නදියෙන් මා ද වහා එතර කරවා
2. පින්වතිය දිගු කලක් ඇසුරු කළ ස්ථිර සැමියාගෙන් වෙනස් වී, ඇසුරක් නැති අලුතෙන් හමු වූ මා වෙත ඔබ බැඳුනි. තී (යම්කිසි දුවසක) මාගෙන් ද වෙනස් වී අනෙකෙකු පාවා ගන්නීය. මම මෙතැනිනුත් ඉතා ඇතට යන්නෙමි.
3. තුවරලා ලැහැබෙක කවර තැනැත්තියක් මහ හඬින් සිනාසේද, නැටුමක් ගැයූ මක් මෙහි නැත. සුන්දර ඌරු යුග්මයක් ඇති රුසිරු තැනැත්තිය හැඩිය යුතු අවස්ථාවේ කුමක් හෙයින් සිනා සෙන්නේද?
4. මෝඩ වූ සිඟාලය තෝ නුවණ නැත්තෙහි මාළුවාද මස් වැදුල්ලද දෙකම් නැති කර ගත්තේය. දැන් අසරණයකු සේ කල්පනා කරන්නෙහිය.
5. අනුන්ගේ වරද දැකීම පහසුය. තමන්ගේ වරද දැකීම අපහසුය. තී සැමියා ද සොර සැමියා ද දෙදෙනාම නැති කරගෙන පිරිහී මා මෙන් තීද කල්පනා කරමින් ළත වේ.
6. ජම්බුකය ! ඔබ යමක් කීවේද එය නිවරදිය මම මෙතැනින් ගොස් අනෙක් හිමියකු සොයා ඔහු සමගින් යන්නෙමි.
7. යමෙක් මැටි තලියක් සොරා ගනීද, හේ ඒ පුරුද්දෙන් රන්තලියක් සොරකම් කරන්නේ ය. .තී පාපකර්මය කළාය. නැවත නැවත ද තී එයම කන්නීය.

මෙලෙස පඤ්චක නිපාතයේ චුල්ලධනුග්ගහ ජාතකය විස්තර කොට එකල චුල්ලධනුග්ගහ පණ්ඩිත ඔබ වුයේය එම ස්ත්‍රිය මැයයි. සිවලෙකුගේ ස්වරූප යෙන් පැමිණ ඇයට නිග්‍රහ කරණ ලද සක් දෙවිඳු වුයේ මම යි. පවසා එම ස්ත්‍රිය දුටුපමනින් සෙනෙහෙ බැඳ මුළු දඹදිවට අග්‍ර පණ්ඩිතවූ ධනුග්ගහක විනාශ කළේය. එබඳු එම ස්ත්‍රිය නිමිති කරගෙන ඇතිවූ ඔබේ තෘෂ්ණාව සිඳ දමන්නැයි භික්ෂුවට උපදෙස් දී සිව්සස් දේශනාකරන්නේ මෙම ගාථාව දේශනාකළහ.

විසම වූ අරමුණු සුව වසයෙන් ගෙන
තන්හා වඩනා අනුවණයෝ
සංසාරේ බැම් තදකර ගනිමින්
ජරා මරණ දුක් විඳ ගන්නේ.

යුතු වී හැමදා හොඳ සිහියෙන්
අසුබ භාවනා වඩන කෙනා
මාර බැඳුම් බිඳ සියලු කෙලෙස් සිඳ
නිවන් මගින් සැනසුමම ලබයි.

කාමය පිළිබඳව නො එක් සිතිවිලි වලින් මඩනා ලදුව, තියුණු රාග ඇති විෂම අරමුණු සුභ වසයෙන් දකින, පුද්ගලයාට බොහෝසෙයින් තණ්හාව වැඩේ ඒ තැනැත්තා තණ්හා බැම්ම දැඩිකරයි.

යමෙක් කාමයන් පිළිබඳ සිතිවිලි සන්සිඳවීමෙහි ඇලුනේද, හැම කල්හි ම සිහියෙන් යුතු වුයේ අසුභ භාවනාව වඩයිද, මේ තැනැත්තා තණ්හාව නසන්නේය. ඔහු මාරයාගේ බැම්ම සිදින්නේය.

මෙහි - **විතක්කපමථිනස්ස** කාම විතර්කාදී විතර්කයන්හි ගැලුනු. **නිබ්බාරාගස්ස** රාග බහුල වූ, **සුභානුපස්සිනෝ** - අරමුණු සුභ නිමිති වසයෙන් ගෙන, කරණ ලද අසුභ නිමිති සුභවය යෙන් ගෙන සිහිකරන්නාහට, **තණ්හානි** මෙබඳුවූ එකම ධ්‍යානයක් වත් නොවැඩේ.

ඉක්බිති **ෂඩ්ද්වාරික** තෘෂ්ණාවම වැඩේ. හීයෙහා වඩයිති බොහෝ සෙයින් වැඩේ. **එසඩෝ** මෙවැනි පුද්ගල තෙමේ. තෘෂ්ණා බන්ධනය **දළහං** ස්ථිර කෙරේ. දැඩි කෙරේ. **විතක්කූප සමෙති** මිථ්‍යා විතර්ක විනාස කිරීම සඳහා දස අසුභ යන්හි ප්‍රථම ධ්‍යානයෙහි, **සදා සතෝ** - යමෙක් මෙහි නිමග්ග ඵලඹ සිටි සිහියෙන් එහි අසුභ ධ්‍යානය වඩයි ද, **ව්‍යනති කා හිති** මේ භික්ෂුව තුන් භවයන්හි උපදින්නා වූ තෘෂ්ණාව දුරුකිරීම කරන්නේය. **මාරබන්ධනං** හෙතෙමේ ත්‍රෛ භූමික සංසාර වෘත්ත සඞ්ඛ්‍යාත මාර බන්ධනය. සිදින්නේය යන අර්ථය දේශනාවසානයේ ඒ භික්ෂුව සෝවාන් පෙලෙහි පිහිටි යේය. පැමිණ සිටි අයට සාර්ථක වූයේය.

දහරක භික්ෂු පිළිබඳවූ කථා පුවතයි.

24.8

"නිට්ඨං ගතො" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර දෙවිරම වැඩ සිටියදී මාරයා නිමිත්තකරගෙන දේශනා කළහ.

එක් දිනක් නුසුදුසු කාලයෙහි බොහෝ තෙරවරු දෙව්රම් වෙහෙරට පිවිස (සැතපෙන තැන් නැතිව) එක්නමක් රාහුල තෙරුන් වසන ස්ථානයට ගොස් ඔහු නැගිටුවා තෙමේ එහි සැතපුනහ. උන්වහන්සේ නිදන්නට වෙන තැනක් නොදැක තථා ගතයන් වහන්සේගේ ගන්ධ කුටියේ ඉදිරි පස වැතිරුනේය. එදින උන්වහන්සේ රහත්බවට පත්වී අවසන් වූයේය. වසවර්ති මාරයා රාහුල තෙරුන් ගඳකිලියේ ඉදිරිපස නිදා සිටිනුදැක මෙසේ සිතුවේය. තථාගතයන්ගේ ඇගිල්ලක් මෙන් වූ රාහුල තෙරුන්, ගඳකිළි දොරටුවේ නිදා සිටිය දී තමන් ගඳකිලිය තුළ නිදන්නේ ය. ඇගිල්ල රිදෙන කල තම මුළු සිරුරම රිදෙන්නාක් මෙන් වන්නේ වේද? වශයෙන් සිතා ඔහු මහත් ඇත් රජකුගේ ස්වභාවයක් මවාගෙන අවුත් හොඬින් තෙරුන්ගේ සිරුර පරීක්ෂාකොට හොඬය හෙලා වටකොට මහත් හඬින් කෘෂ්ණවාදය කළේය. බුදුහු ගඳකිළිය තුළ වැඩ සිටියදීම ඒ මාරයාබව දැනගෙන, මාරය ඔබ වැනි සියදහස් ගණනකට වුවද මගේ පුතුට බියක් ඇතිකරලීමට නොහැකිය. මගේ පුතුද තැතිගැනීම් රහිත තෘෂ්ණා දුරුවුයේ මහා වීර්යවත් වුයේ මහා ප්‍රාඥයෙක් වුයේ යයි පවසා මේ ගාථාව දේශනාකළහ.

තණ්හාව දුරලා සියලු කෙලෙසුන්සිඳලූ රහතන් වහන්සේ උපන්මුල් සිද ඇත්තේ එබැවින් බියක් හෝ සැකයක් ඔහුට නැත්මැයි.

නැති කොට කෙලෙස් සිව් පිළිසිඹියා	පත්ව
වසනිද යම් අයෙක් සසුනෙහි	අරහත්ව
ඔහු නැති නො ගෙන මරුවාට ද	බියපත්ව
බැබළෙති හැම දෙනා අතරෙහි	පැණවත්ව

1. යමෙක් අර්හත්යයි කියන ලද නිෂ්ඨාවට පැමිණියේ වේද. තැති නොගන්නේද පහවූ තෘෂ්ණ අත්තේද රාගාදි අඩගන රහිතද භවයෙහි

උපතට හේතු වූ කෙලෙස් උල් සින්දේද මේ ඔහුගේ අන්තිම ආත්ම භාවයයි

2. තෘෂ්ණාව නැතිකල - ආත්ම ආදී වශයෙන් නොගන්නා නිරුත්තියෙහි ත්‍රිපිටකයෙහි - සිව්පිළිසිඹියාවෙන් දක්ෂ යමෙක් අක්ෂරයන්ගේ සමුදාය පූර්වපර අක්ෂරයද දන්නේ අන්තිම ශරීරයේ පිහිටි හේ ඒකාන්තයෙන් මහා ප්‍රඥයෙකි. මහා පුරුෂයෙකි.

තපථ එහි **නිට්ඨං ගතො** යනු මේ සසුනෙහි පැවිදි වුවන්ට අර්හත්වය නිෂ්ඨාවනම් (ගමනේ අවසානය) එම තත්ත්වයට පත්වූයේ **අසනභාසි** යනු ඇතුලත රාගාදී කෙලෙස් නොමැති නිසා තැති ගැනීම් රහිතය **අවජිනි භවසල්ලානි** භවගාමී සියලු උල් සිනදේය **සමුසසයො** - මේ මොහුගේ අන්තිම ශරීරයි **අනාදානො** - ස්කන්ධාදීන් ගේ නිමාවයි. **නිරුත්තිපද කොවිදො** - නිරුක්තින්හිද සෙසු පදයන්හිද අරුත්දනී. සිව්පිළි සිඹියාවන්හි දක්ෂය. - **සනනිපාතං ජඤඤා පුබබ පරානි වාති** - යනු අකුරු සමුහය. ශබ්ද ශාස්ත්‍රය පිළිබඳ වූ අක්ෂරා රාසිය පෙර අකුරුය මුල අකුරුය. මැද අකුර අග අකුරු දැනීම, යම් පදයක මුල අකුරු පෙනේනම් මේ මුල අකුරට මේවා මැද හා අග අකුරු විය යුතුයයි ද, මැද අකුරු පෙනේ නම්, මේ මැද අකුරට මේවා මුල හා අග අකුරු විය යුතුයයි ද. අග අකුර පෙනේ නම් මේ අකුර මේවා මැද හා මුල අකුරු විය යුතු යයි ද, දන්නේ මේ මහාප්‍රාඥ වන්නේ ය.

සවෙ අනතිමසරිරො මේ අන්තිම ශරීරයයි අර්ථ ධර්ම නිරුත්ති, පටිභාන, යන සිව්පිළි සිඹියාවන්හිද, සීලාදියෙහි ද. හිමිකරු වී ප්‍රඥාවෙන් යුක්ත වූයේය. මහාපඤඤා "විමුතත චිතෙතා චාවාහං සාරි පුතත **මහා පුරිසො**" 'වදාමී' විමුක්තවූ සිත් ඇති බැවින් මහාපුරිසො

මහා පුරුෂ යයි යන අර්ථයි. දේශනාවසානයේ බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණුනහ. මාරයා ශ්‍රමණ ගෞතමයන් විසින් මා හඳුනා ගත්තේ යයි පළා ගියහ.

මාරයා පිළිබඳ වූ කථාපුවතයි.

24.9

"සබ්බාභිභූ" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ අතර මග හමුවූ උපක ආජීවක නිමිත්තකරගෙන පැවසූහ.

එක් සමයක බුදුහු බුද්ධත්වයට පත්ව බෝමැඩ සතිහතක් ගතකොට තමන් වහන්සේගේ පාසිවුරු ගෙන ධර්මචක්‍රදේශනය පැවැත්වීම සඳහා බරණැස බලා යොදුන් දහඅටක් දුර මගට පිළිපන්නේ. අතර මගදී "උපක ආජීවකයා හමුවුනි. ඔහු ද බුදුන් දැක ඇවැත්නි ඔබේ ඉන්ද්‍රියන් සුපසන්ය සම පැහැපත්ය. පිරිසිදුය කවුරුන් උදෙසා ඔබ පැවිදි වුයේද? ඔබගේ ශාස්තෘවරයා කවුරුන්ද? ඔබ කාගේ ධර්මයක් රුචිකරන්නේ දැයි විමසුහ. අනතුරුව බුදුහු මට උපාධ්‍යාය වරයෙක් හෝ ආචාර්යවරයෙක් හෝ නැත කියා මේ ගාථාව පැවසුහ.

තුන්ලොව සියලු දෙය - මැඩ පැවැත්වූ යෙමි මම
සකර දමැ නො ඇලී - සියලු දේ දැන ගත්තෙමි
සියල්ලම දුරලා - රහත් පලලද මේමට
ගුරුවරයෙක් වෙනින් - මා හට කෙසේ වන්නෙ ද

සියළු හේතු ධර්ම මැඩ පැවත්වීම් චාතුර්භූමික ධර්ම කාමාවචර රූපාවචර අරූපාවචර ලොකුත්තර සියල්ල දැනගනිමි. තණ්හා දෘෂ්ටි ආදී සියළු ධර්ම යන්හි නො ඇළුනේ සියල්ල අත්හැර තෘෂ්ණා දුරුකර මිදුනේ. ස්වයං අවබෝධය ඇති මට කවර ගුරුවරයෙක්ද? මාගේ ගුරුවරයා වශයෙන් කවරෙක් කියම්ද?

එහි **සබ්බාභිභූ** සියළු ත්‍රෛභූමික ධර්ම මැඩ පැවැත්වූ **සබ්බවිදූ** - දැනගත් චාතුර් භූමික ධර්ම **ධම්මෙසු** තත්හාදී සියළු ත්‍රෛභූමික ධර්මයන්හි තණ්හා දිට්ඨි ආදියෙහි නො ඇලුනේ, **සබ්බංජහො** සියලු ත්‍රෛභූමක ධර්මයන් හැර සිටියේ. **තණ්හක්ඛය** තෘෂ්ණා නැතිකරලීම් විමුතෙතා තණ්හාව නැති කිරීමෙන් උපන් අර්හත් භාවය සසරින් මිදීම ඇති **සයං අභිඤ්ඤාය**

තුමාවිසින්ම අවබෝධ කරගෙන විශේෂ ඤාණ ලද මට කවර නම් ගුරුවරයෙක්ද කවර නම් උපාධ්‍යායයෙක්ද කවුරුන් කියා උදෙසන්නේද?

දේශනාව අවසානයේ උපක තෙම බුදුන්ගේ වචනයට සතුටු නොවීය. ප්‍රතික්ෂේප කළේද නැත. හිස සලා දිව නටවා හුදෙකලා මාර්ගයට පිවිස එක්තරා වැදි නිවාසස්ථානයක් කරා පිටත්ව ගියේය. (වංගකාර ජනපදයට)

උපක ආජීවක පිළිබඳ කථා පුවතයි.

24.10

"සබ්බ දානං" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩ සිටියදී සක්දෙවිරජ නිමිත්තකරගෙන දේශනාකළහ.

එක් අවස්ථාවක තාවතිංස දෙව්ලොව දෙවියෝ රැස්වී ප්‍රශ්න හතරක් ඉපද වුහ. දානයන් අතර වඩාශ්‍රේෂ්ඨ දානය කුමක්ද? රසයන් අතර කවර රසයක් ශ්‍රේෂ්ඨද, ඇලීම් අතර කවර ඇලීමක් උසස්ද තෘෂ්ණාක්ෂය කිරීම කුමක් හෙයින් ශ්‍රේෂඨ වන්නේද? මේ ප්‍රශ්නවලට එක දෙවියෙකුටද පිළිතුරු දීමට නොහැකි විය. එක දෙවියෙක් තවත් දෙවියෙකුගෙන් විමසා මේ ලෙසට එකිනෙකා විමසා දසදහසක් සක්වල දොළොස් වසරක් හැසිරුනහ. මෙතෙක් කලක් ප්‍රශ්නයන්ගේ අර්ථය නොදුන දසදහසක් සක්වල දෙවියෝ රැස්වී සතරමහ දෙවිරජ වරුන් අසලට ගොස්, ඇයි දරුවනි මහාදේව සන්නිපාතයක් සිදුවුයේ විමසුවිට මේ ප්‍රශ්ණ හතර ඉදිරිපත් කළහ. එම ප්‍රශ්න මොනවද? දරුවනියි විමසුහ. දානයන් අතර කවර දානයන් ශ්‍රෙෂ්ඨවේද? රසයන් අතර කවර රසයක් ශ්‍රේෂ්ට වේද. ඇලීම් අතර කවර ඇලීමක් උසස්ද, තන්හා ක්ෂය කිරීම කවරහෙයින් ශ්‍රේෂ්ඨ වේද? මේ ප්‍රශ්න විසඳාගැනීමට නොහැකිව පැමිණියෙමුයි කීහ. දරුවනි අපිද මෙම ප්‍රශ්නවල අර්ථ නොදනිමු. අපේ රජ තුමා ජනයන් දහසක් සිතනලද අර්ථ සිතා ක්ෂණයකින් දැනගනී. ඔහු අපේ ප්‍රඥාවෙන්ද පිනෙන් ද විශිෂ්ඨය. එන්න ඔහු සමීපයට යමු එම දේව සමූහයා ගෙන සක් දෙවි රජ වෙතට ගොස් ඔහු විසින් ද ඇයි දරුව මහත් දේව සන්නිපාතයක් කුමක් හෙයින් දැයි විමසුවේය. මෙම ප්‍රශ්න ඉදිරිපත් කළේය. දරුවෙනි මෙම ප්‍රශ්න වලට අහේතුකව අර්ථ දැනගැනීමට නොහැකිය. මේවා බුද්ධ විෂයට හේතුවේ බුදුහු මේ අවස්ථාවේදී කොහේ වැඩ සිටිත්දැයි විමසා දෙව්රම බව දැන ගෙන එන්න උන්වහන්සේ වෙතට යන්නෙමුයි දේවගණයා සමග රාත්‍රි කාලයේ මුළු දෙව්රම බබුළුවා බුදුන්වෙත එළඹ වැඳ එකත් පසෙක සිට ඇයි මහරජ විශාල දේව පිරිසක් සමග පැමිණියේ යනුවෙන් ප්‍රශ්නකළහ. ස්වාමීනි මේ දේව සමූහය මේ ප්‍රශ්න ඇසුහ. මේවාට පිළිතුරු දන්නා වෙනත් කෙනෙක් නැත. අපට මෙම ප්‍රශ්නවලට අර්ථ පවසනු මැනව. කී විට මහරජ හොඳයි ම විසින් පාරමිතා පුරා මහාපරිත්‍යාග කර තොපවැන්නන්ගේ සැකදුරලනු

සඳහා ම සර්වඥතාඥාණය ලබන ලදිමි. ඔබ විසින් නගන ලද ප්‍රශ්නවලට "සියළු දාන අතරින් ධර්ම දානය ශ්‍රේෂ්ඨ වේ. සියළු රස අතර ධර්ම රසය ශ්‍රේෂ්ඨවේ. සියලුම ඇලීම් අතර ධර්ම රතිය වඩාත් ශ්‍රේෂ්ඨ වේ. තෘෂ්ණාක්ෂය කිරීම නම් රහත් බවට පැමිණෙන හෙයින් ශ්‍රේෂ්ඨයි පවසා මෙම ගාථාව දේශනා කළහ.

ධර්ම දානය සියලු මහදන් පරදවා ජයගනු ලබයි
සියලු රසයට වඩා වැඩියෙන් දහම් රසයම සින පිනයි
නො ඇලෙමින් කිසිතැනෙක දහමෙහි ඇලීමම නිති හිතකරයි
නැසු ආසා රහත් තෙර නම සියලු දුක් පරදා දින යි.

එහි **සබ්බදානං ධම්ම දානනති** - ඉදින් සක්වල ගැබ බඹලොව දක්වා නිතර වැඩ සිටින බුදු පසේ බුදු මහරහතන් වහන්සේලාට කෙසෙල් දළු සමාන සිවුරු දෙන්නේද එම සමාගමයේදී සතර පද ගාථාවකින් කරණ ලද අනුශාසනයම් ශ්‍රේෂ්ඨවේ. එම දානය එම ගාථාවේ දහසයෙන් කොටසක් හෝ නොවටී. මෙලෙස ධර්ම දේශනයම වචනයෙන්ද ඇසීමෙන්ද වහත් වේ. යම් පුද්ගලයෙක් බොහෝ අයට ඒ ධර්ම ශ්‍රවණය කරණ ලද්දේනම් එහිම අනුසස් මහත්ය. මෙබඳු පිරිසකට ප්‍රණීත පිණ්ඩපාත පාත්‍රයේ පුරවා දෙනලද දානයට වඩා ගිතෙල් පාත්‍රය පුරවා දෙන ලද දානයටද වඩා මහාවිහාරයවැනි මහවෙහෙරවල් ලෝහ මහා ප්‍රාසාද වැනි ප්‍රාසාද සියදහස් ගණනක් කරවා දුන්නේද අනේ පිඬු සිටුවරයා ආදීන් විසින් විහාර වෙනුවෙන් කළ පරිත්‍යාග වලටද වඩා පිරිසයෙන් සතර පද ගාථාවකින් කරණ ලද අනුසාසනය වශයෙන් කරණ ලද ධර්ම දානයම අගනේය. ශ්‍රේෂ්ඨ වන්නේය. කුමක් නිසාද එබඳු පිං කරන්නේ මේබඳු ධර්මදේශනා ඇසීමනිසාය. නො අසා එසේ නොකරති. ඉදින් මේ සත්ත්වයෝ ධර්මය නොඅසන්නම් සැන්දක් පමණ බත් හෝ එපමන කැඳවත් දන් නො දෙති. මෙකරුණ නිසා සියළු දානවලට වඩා ධර්මදානයම ශ්‍රේෂ්ඨවේ. බුද්ධ - පච්චෙක බුද්ධ වරයන් තබා මුළු කල්පයකට වසින වැසි බිඳු ගණන් කිරීමට සමත් ප්‍රඥාවෙන් යුත් සාරිපුත්ත මහතෙරුන් ආදීන් ද තම ධර්මතාව නිසා සෝවාන් ආදී ඵලයන් අවබෝධ කර ගැනීමට නොහැකිවුහ. අස්සජි ආදී තෙරවරුන් දේශනා කරණ ලද ධර්මය අසාම සෝවාන් ආදී ඵලයන්ට

පත්වූහ. මෙසේ අස්සජී තෙරුන් වැන්නෝ ද, බණ අසාම සෝවාන් වූහ. ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව ශ්‍රාවක පාර මී ඥාණයම සාක්ෂාත් කරන්නාහ. මේ කරුණින් ද මහරජ සියලු දානයන්ට වඩා ධර්ම දානයම ශ්‍රේෂ්ඨ වන්නේය. **සබ්බං රසං ධම්ම රසෝ ජිනාති** සියළු ස්වාද රස ආදී රසයන් අතුරෙන් උසස් ලෙස දෙවියන් ගේ සුධාභොජන රසය ද සසර වෘතයට වැටී දුක් අනුභාවයටම හේතු වේ. යම් බදු වූ සත්තිස් බෝධි පාක්ෂික ධර්ම සංඛ්‍යාත නවලොකොත්තර ධර්ම රසයම සියළු රසයන්ට වඩා ශ්‍රේෂ්ඨය. යන්න එයින් කියවේ.

යම් පුත්‍රරතිය. ධීතුරතිය, ධාන්‍ය රතිය, ස්ත්‍රී රතිය. ධන රතිය. නැටුම් ගැයුම්, වාදන ආදී අනේක රති තිබේ. මේ සියලු රති සංසාරවට්ට යේ වැටී දුක් ඇති කිරීමට හේතුවේ. යම් කෙනෙක් ධර්මය අසයිනම් හෝ කියයිනම් හෝ කියවයි නම් ඇතුලත ඇතිවන ප්‍රීතිය උදග්ග භාවය ඇතිකරයි. කඳුලු ඇතිවේ. ලොමු ඩැහැ ගැනීම කෙරෙයි. සංසාර වටටය අවසන් කර අර්හත්වයට පත්කරවයි. එනිසා ධර්ම රතිය ශ්‍රේෂ්ඨයවේ. **සබ්බං රතිං ධම්ම රති ජිනාති** යනුවෙන් කීහ. තෘෂ්ණාව නැති කිරීම වනාහී. තෘෂ්ණාව නැති කිරීමෙන් උපදින්නාවූ අර්හත් බව සියලු සංසාර වෘත්ත දුඃඛයන් මැඩ පවත්වන බැවින් සියල්ලටම ශ්‍රේෂ්ඨ වේ **"තණ්හක්ඛයෝ සබ්බ දුක්ඛං ජිනාති"** යන්න එහෙයින් කියන ලදී. මෙසේ ශාස්තෘන් වහන්සේ මෙම ගාථාවේ අර්ථය පැහැදිලි කරණවිට අසුහාර දාහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය සිදුවිය. සක් දෙවිඳුද ධර්මය අසා බුදුන් වැඳ මෙලෙස පැවසුවේය. ස්වාමීනි මෙතරම් උතුම් ධර්ම දානයෙන් අපට ප්‍රාප්තිය නො දෙත්ද? ඉන්පසු භික්ෂු සංඝයාට කථා කොට ප්‍රාප්තිය දෙනුමැනව. බුදුහු ඔහුගේ වචනය අසා භික්ෂු සංඝයා රැස් කරවා මහණෙනි අද පටන් මහා ධර්ම ශ්‍රමණයකින් හෝ ප්‍රකෘති ධර්ම ශ්‍රවණයක් හෝ උපනිශ්‍රිත කථාවක් හෝ යටත් පිරිසයෙන් අනුමෝදනයක් හෝ කියා සියලු සත්ත්වයන්ට පින් අනුමෝදන් කරන්නැයි වදාළහ.

ශක්‍රදේවේන්ද්‍රයන්ගේ ප්‍රශ්න පිළිබඳ කථා පුවතයි.

24.11

"හනන්ති භෝගා" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී අපුත්තක සිටුවරයා නිමිති කරගෙන දේශනා කළහ. සැවැත්නුවර සිටි දූ දරුවන් නැති සිටුවරයා කළුරිය කළ බව අසා පසේනදි කොසොල් රජු අපුත්තක ගේ ධනය කාට ලැබේදැයි විමසා රජුට බව දැනගෙන දිනහතකින් ඔහුගේ නිවසින් ධනය රාජමන්දිරයට ගෙන්වා ගෙන බුදුන්වෙත එළඹ සිටිවිට, බුදුහු ඇයි මහරජ මේ මහදවල් කොහි සිට ආවේදැයි විමසුවිට ස්වාමීනි සැවැත් නුවර සිටුගෘහපතියා කළුරිය කළේය. දරුවන් නොමැති ඔහුගේ වස්තුව රාජ මන්දිරයට ගෙනවුත් මම මෙහි ආවෙමියි පැවසීය. සියල්ල සුත්‍රයේ සඳහන් පරිදි දැනගත යුතුය.

මේ සිටුවරයා වනාහි රන් තැටියක ඉතා රස ආහාර භෝජන ගෙනදුන්විට මේවා මිනිසුන් අනුභව කරත්ද? ඇයි ඔබ මා සමග මේ ගෙයි ක්‍රීඩා කරත්ද භෝජන දුන්විට ගල්කැට දඬු ආදියෙන් පහරදී පළවාහැර මේ මිනිසුන්ගේ ආහාරයයි සුන්ස හල් බත් අනුභව කරයි. ඒ ඇඹුල් කාඩි හොඳි සමගය. වස්තු - යාන - කුඩ ආදිය ද වටිනා මනවඩන ද දුන්විටදී එම මිනිසුන්ට ගල්කැට - දඬුමුගුරු වලින් පහරදී පලවාහැර හනවැහැරි දරයි. දිරාගිය යානයක ගමන්කරයි. කොලවලින් තැනූ කුඩයක් දරයි. මෙලෙස රජුදන්වා සිටියාට පසු බුදුහු ඔහුගේ පූර්ව කර්මය දේශනාකළහ.

මහරජ ඔහු පෙරදී නගරසිඩී පසේ බුදුරජාණන් වහන්සේ පිඬු සිඟා වැඩි වේලේ මේ ශ්‍රමනයාට පිණ්ඩපාතය දෙන්නැයි බිරිඳට කියා, වාඩිවී සිටි අසුනෙන් නැගිට ගියේය. ශ්‍රද්ධා නැති බාලයා මෙසේ කියා ගියවිට ඔහුගේ බිරිය ශ්‍රද්ධාවත් වූයේ බොහෝකලකින් ඔහුගේ මුවෙන් දෙන්න යයි වචනය ඇසූ නිසා අද මගේ මනදොළ පිරෙන සේ පිණ්ඩපාතය දෙමියි පසේ බුදුන්ගේ පාත්‍රය ගෙන ප්‍රණීත භෝජන පුරවා දුනි. සිටුවරයා නැවත ගෙදර එනවිට පසේ බුදුන් දැක, ශ්‍රමණය ඔබ කිසිවක් ලැබුවේදැයි විමසුවේය. ඔහු පාත්‍රය ගෙන ප්‍රණීත ආහාර දැක විපිලිසර මෙලෙසට සිතුවේය. මේ පිණ්ඩපාතය උතුම්ය. මේ ආහාර මගේ දාසයන් හෝ කම්කෙරුවන් කෑවේ

නම්. ඔව්හු මගේ කර්මාන්ත කරන්නාහුය. මේ තැනැත්තා ගොස් මේවා අනුභව කර නිදාගන්නේය. මගේ ආහාරය නිරර්ථකලෙස නැතිවුනි.

තව ද ඔහු අපුත්තක වීමට හේතුව මෙසේ වදාළහ. ඔහුගේ සහෝදරයාගේ පුතෙකු ඔහු සමීපයේ වැඩුනි. එම සහෝදරයාගේ පුතා මොහුගේ ඇගිල්ල අල්ලාගෙන ඇවිදින කාලයේ, එසේ ඇවිදිමින් හැසිරෙමින් මෙය මගේ පියාසතු රටයයි. මේ ඔහුගේ ගොනායි. මේ ආදිය කීවේය. අනතුරුව මේ සිටුවරයා දන්මම මොනු මේවා කියයි නම් මොනු වැඩුන පසු මේගෙදර සම්පත් කවුරු හෝ දකින්නේය මේ පුතා අතර ද වස්තුව ඉඩකඩම් බෙදෙන්නේ යයි සිතා. ඔහු කැලයට ගෙනගොස් එක් ගසක් මුලදී බොටුව අඹරා මුල්කඳක්සේ පලා මරා ගෙල සොලවා එහිම වළට විසි කළේය. මේ ඔහුගේ පුර්ව අකුශල කර්මයයි. ඒ පවින් ඔහු අපුත්තක විය. මහරජ ගෘහපති සිටුවරයා තගරසී බී පසේ බුදුන් පිණ්ඩපාතයෙන් පිදුවේද එම කුශල කර්මයේ විපාකයෙන් හත්වරක් දිව්‍ය ලෝකයේ ඉපිද එම කර්මයේම විපාක වශයෙන් මේ සැවැත් නුවර හත්වරක් සිටුතනතුර දරුවේය. මහරජ මේ සිටුවරයා දන්දී පසුව විපිළිසර වීද, දානයන් මගේ කම්කරුවන්ට දුන්නේනම් හොඳයයි සිතුවේද? එම විපාකය නිසා ඔහුට ප්‍රණීත ආහාර ගැනිමට සිත් නොදේ. වස්තු - යාන හා පඤ්චකාමගුණ ලැබීමට සිත් ඇතිනොවේ. එමෙන්ම වස්තුව නිසා සහෝදරයාගේ එකම පුතා ඝාතනය කළේද එම අකුශල විපාකය නිසා බොහෝ වර්ෂ සිය දහස් ගණනක් නරකයේ පැසී එම කර්මයට විපාක වශයෙන් මේ සත්වැනි ආත්මයේ ද ධනයට හිමි දරුවෙක් නොමැතිව සම්පත් රාජසන්තක විය.

මහරජ මේ සිටුවරයාගේ පැරණි පිනද අවසන්විය අළුත් පින්ද රැස් නොකළේය. මහරජ මේ සිටුවරයා අද මහා රෞරව නරකයේ පැසෙන්නේය. රජ බුද්ධ වචනය අසා අහෝ ස්වාමිනි බැයැරුම් කර්මයෙකි. මෙපණ සම්පත් ලබා තමන්ද පරිභෝග නොකළේය. ඔබ වහන්සේ වැනි බුදුන් වැඩසිටි විහාරයට ආසන්නයේ සිට පිංකමක්ද නොකෙළේය. එසේය මහරජ අනුවණ මිනිසුන් නම් භෝග ලැබ නිවන් යති. බොහෝ භෝග උපන් තෘෂ්ණාව නිසා බොහෝකලක් වැනසුවේයයි පවසා මේ ගාථාව වදාළහ.

සම්පත්කාමී අනුවණයෝ අනුන් නසා
තමනුත් නසී වස්තුව ඉඩ කඩම් නිසා
සොයනා නිවන්මග උතුමෝ, දහම් අසා
සසරින් මිදෙති දස සංයෝජනම නසා

පරතෙර නොසයන අඥාන යෝ භෝග වනසති. අනුවණයෝ සම්පත් කෙරෙහි ලෝභ කමෙන් තමන්ද අන්අයද විනාශ කරති. එහි **නො චෙ - පාරග ගවෙ සිනො** යම් පරතෙර හෝ අවසානය සොයන පුද්ගලයෙක් සම්පත් විනාශ නොකරයි. අක්‍ෂේඥව අත්තානන්ති සම්පත් නිසා ඇතිවූ තෘෂ්ණාවෙන් අනුවණයෝ අනුන්ද තමන්ද විනාශ කරති. යන අර්ථයි. දේශනාවසානයේ බොහෝදෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

අපුත්තක සිටුවරයා පිළිබඳ කථා පුවතයි.

24.12

"නිණ්ණදොසානි" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ **පණ්ඩු කම්බල** ශෛලා සනයේ වැඩසිටියදි අංකුර දෙවියා නිමිති කරගෙන දේශනාකළහ.

කථා පුවත "**යෙ ඣාන පසුතාධීරා**" යන ගාථාව විස්තරයේ සඳහන්වෙයි. එහිදී **ඉන්ද්‍රක** දෙවිපුත් නිමිති කරගෙන පැවසුහ. ඔහු වනාහි ඇතුළු ගමට පිඩුපිණිස වැඩමකළ අනුරුද්ධ තෙරුන්ට හැන්දක් පමණ **පිණ්ඩපාතය** දුන්නේය. ඔහුගේ මේ පිණ නිසා අඞ්කුර දසදහසක් අවුරුදු දොළොස් යොදුනක් උදුන් පෙළ බැඳ දුන් දානයට වඩා මහත්පල මහානිසන්ස විය. එනිසා මෙසේ පැවසුහ. මේනිසා අඞ්කුර ගේ දානය මෙන් සිතා විමසා දන්දිය යුතුය එය යහපත් කෙතක වැපිරූ බීජයක් සේ මහත්ඵල මහානිසංස වේ. ඔබ එලෙස නොකළේය. එනිසා ඔබේ දානය මහත්ඵල නොවීය. මෙය විස්තර කරමින්.

"**විචෙය්‍ය දානං දාතබ්බං - යත්ථ දින්නං මහප්ඵලං**" යම් පුද්ගලයෙකු විෂයෙහි දන් දීමෙහි දී දෙන ලද දානය මහත්ඵල මහානිසංස වේදැයි සොයා බලා දානය දිය යුතුය. නුවණින් සොයා දන් දෙන දායකයෝ ස්වර්ගයට පැමිණෙත්. යම් කෙනෙකුට දන් දීමෙන් මහත්ඵල මහානි සංස වේද එනිසා බුදුන් විසින් පවසන ලද දානය විමසා දියයුතුය මෙලොව දක්ෂිණාර්හ උතුමන්ට දන් දීමෙන් මහත්පල මහානි සංසවේ. එය යහපත් කුඹුරක වපුරන ලද බීජමෙනි.

තවදුරටත් ධර්ම දේශනා කරමින් මේ ගාථා පැවසුහ.

1. රාග දොෂයෙන් යුත් මේ ප්‍රජාව තෘණ දෝෂයෙන් යුතු කෙතක් වැනිවේ. එනිසා විතරාගී උතුමන්ට දුන් දානය මහත්ඵල මහානිසංසවේ.
2. දෙවිෂයෙන් යුතු මේ ප්‍රජාව තෘණ වැවුන කෙතක් වැන්න. එනිසා දෙවිෂයෙන් තොර උතුමන්ට දීම මහත්ඵල වේ.
3. මෝහයෙන් යුත් මේ ප්‍රජාව තෘණ වැවුන කෙතක් වැන්න, මෝහය නැති

උතුමන්ට දීම මහත්ඵල වේ.

4. ඉවජ්ජාදොෂයෙන් යුත් මේ ප්‍රජාව තෘණවැඩුන කෙතක් බඳුය. ඉවජ්ජා දෝෂයෙන් තොර උතුමන්ට දීම මහත් ඵල වේ.

බොරු පන්. ඉලුක් තණ	- පැළ වූ පුරන් කුඹුරක
වැපුරුව ද බිත්තර වී	- අස්වැන්න නොලැබෙමයි.
ත පෝ ගුණ සිල් ගුණ	- නැත්තන්ට දන් දීම ද
පුරන් වූ කුඹුරක	- වී වැපුරුවා මෙන් වේ.

එහි තිණදොසානි තෘණ දෝෂනම් ඉලුක් ආදී තෘණ ඇතිවී පුරන් වූ කෙත්වල වැපිරීමෙන් අස්වැන්න ගත නොහැකිය. මෙලෙසට සත්ත්වයන් ගේ සිත් තුළ රාගය ඉපදීමෙන් දුෂණය වේ. එනිසා - රාග - දොස - මෝහයෙන් යුතු පුද්ගලයන්ට දීමෙන් මහත්ඵල ඇතිනොවේ. එවැනි දෝෂ රහිත උතුමන්ට දීමෙන් මහත්ඵල ඇතිවේ. දේශනාව අවසානයේ අඬිකුර ද, ඉඳුකද සෝවාන් ඵලයේ පිහිටියහ. රැස්ව සිටි හැම දෙනට දේශනය සාර්ථක විය.

අඬිකුර දෙවියන් පිළිබඳ කථා පුවතයි.

විසි හතරවැනි

තණහා වග්ග වර්ණය නිමියේය.

25-1

"චක්ඛුනා සංවරෝ" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී භික්ෂූන් පස්නමක් නිමිති කරගෙන දේශනා කළහ.

මෙම භික්ෂූන් අතර එක් එක් භික්ෂුවක් චක්ඛුද්වාර ආදී පඤ්චද්වාර අතුරින් එක් එක් දවාරයක් ආරක්ෂා කළහ. මේ අතර දිනක් රැස්වී මම දුෂ්කර දෙයක් ආරක්ෂාකරමි මම දුෂ්කර ඉන්ද්‍රියන් රකිමියි. විවාද කර බුදුන්ගෙන් විමසා මෙහි අර්ථය දැනගනිමුයි තථාගතයන් වහන්සේ වෙත පැමිණ - ස්වාමීනි අපි චක්ඛුද්වාර ආදී පඤ්චද්වාර ආරක්ෂා කර තම තමන් රක්ෂණය කරන ද්වාරයම වඩාත් දුෂ්කර යයි සිතමු. මේ ද්වාර අතරින් කවර ද්වාරයක් ආරක්ෂාව අපහසු දැයි විමසුහ. බුදුහු එකම භික්ෂුවකට ද අපහාස නොකර - මහණෙනි මේ සියළු ඉන්ද්‍රිය සංවර කිරීම - දුෂ්කරවේ. මහණෙනි ඔබ දැන් පමණක් නොව පෙරද පස්තැනක අසංවර වූහ. එනිසා පඩිවරුන්ගේ අවවාදයේ නොපිහිටා ජීවිතක්ෂයට පත්වුනි. ස්වාමීනි කවරදාද ඔවුන්ගේ ඉල්ලීම අනුව අතීතය පෙන්වා දුන්හ. අතීතයේ (මා දුන් අවවාද නො පිළිගෙන) රකුසියගේ වසඟයට පත්ව තොප ජීවිතක්ෂයට පත් වූ අතර, රකුසිය කෙරෙහි නො ඇලුනු මම තක්සිලාවේ රජකමට පත්ව, ශ්වේතච්ඡත්‍රය යට සිංහාසනයේ හිඳිමින් තමන්ගේ රජසිරි සැපත් බලා වීර්යය නම් සෑම කෙනෙකු විසින්ම කළ යුතුයයි කියා උදාන වසයෙන් මේ ගාථාව පැවසුහ.

දැඩිලෙස ධාරනී ප්‍රඥාවෙන් ද කුශල උපදේශයේ ද සිටිය හෙයින් බියපත් නොවී රාක්ෂසියන්ගේ වසඟයට නොගොස් මහත් සම්පත් ලැබීම්.

මේ ගාථාව දක්වා එදාද තෙපි පස්දෙනා තක්ශිලාවේ රාජ්‍යය ගැනීම සඳහා නික්මී මහා සත්වයන් පිරිවරා අයුධ ඇතිව මග යන්නේ අතරමග රාක්ෂසීන් විසින් චක්ඛුද්වාරාදී වශයෙන් පැමිණි රූපාදී අරමුණුවල අසංවරවී පඬිවරුන්ගේ අවවාද නොපිහිටා වසඟවී රකුසියන් විසින් කන ලද්දේ

මරණයට පැමිණියහ. එම අරමුණු වල සංවර වී පසුපස ලුහුබැඳි දෙවිදුවක් බඳු රකුසිය නොසලකා හොඳින් තක්ශිලාවට ගොස් රාජ්‍යයට පත් වූයේ මම ම යයි මේ තක්ෂිලා ජාතකය සසඳා මහණෙනි භික්ෂුවක් විසින් සියළු ද්වාර සංවර කළ යුතුය මෙම ද්වාර සංවර කරන්නේ සියළු දුකින් මිදේ යයි පවසා ධර්ම දේශනා කරන්නේ මේ ගාථාව පැවසුහ.

ඇස, කණ - නහය දිව සංවර කළ	**යුතුය**
කය සහ මනස සදොරම රැකගත	**යුතුය**
සංවර කරන ලද සිත මහබල	**ගතුය**
සදොරම සංවරය මහණෙකු කළ	**යුතුය**

"චක්ඛුනා සංවරෝ සාධු - සාධු සොතෙන සංවරෝ" ඇසින් සංවරවීම යහපත්ය. කනින් දිවෙන් සංවරවීම යහපත්ය නැහැයෙන් සංවරවීම යහපත්ය. දිවෙන් සංවරවීම වැදගත්ය. කයින් වචනයින් මනසින් සංවරවීම වැදගත්ය. මේ ද්වාරත්‍රයෙන් සංවරවූ භික්ෂුව සියළු දුකින් මිදේ.

එහි **චක්ඛුනා** - යනු යම් දිනක භික්ෂුවක් ඇසට රූපයක් හමු වූ විට එම ඉටු අරමුනේ නොරැඳී දුෂ්ට අරමුණක දුෂ්‍ය නොවී, මෝහය නො උපදවන්නාවූ අයට එම දොරටුවේ සංවරය ඇතිවේ. ද්වාරය ැසිමයි. එය ගෝපනය නම් **චක්ඛුනා සංවරෝ සාධු** මෙම න්‍යායයි. සෝත ද්වාරයේද ඝ්‍රාණ ද්වාරාදී සදොරෙහි සංවර හෝ අසංවර වේද ජවන විථියේද එම නත්ත්ව ලබයි. අසංවර වන්නේ නොඉවසීම අශ්‍රද්ධාව කුසිතකම, සිහිමුලාව අනුවණබව අකුශල විථියේ මේ පහ ලැබේ. සංවර බව ඇතිවන විට සද්ධා - ඉවසීම - වීර්යය - සතිය ඤාණය කුශල විථිය මේ පස් ආකාරය ලබයි. **කායෙනසංවරෝ** කයින් සංවර වීම මෙහි වනාහි පසාදකාය චෝපන කාය දෙකේම සංවර බව කියයි.

එහි ප්‍රසාදද්වාරයේ සංවරය කියන ලද්දේමය. චොපන ද්වාරයෙහි සංවරය වූ කලි ප්‍රාණඝාතයෙන්, අදත්තාදානයෙන්, පස්කම් සැපත් හී වැරදි ලෙස හැසිරීමය. චොපනකාය සමග අකුල් විථියෙහි උපදිත්. ඒ මෙම ද්වාරයන් අසංවර වීමය. ප්‍රාණඝාතාදියෙන් වෙන් වීම ආදිය සංවර වීමයි. එය කුසල්

වීථියෙහි උපදියි.
සාධු වාචාය යනු, මෙහි වොපන වචනය ඒ සමගම උපදින්, මුසාවාද ආදිය මගින් තම වචී ද්වාරය අසංවර වීම මෙහිදී කියන ලදී. මුසාවාදා දියෙන් වැළකීම වචී ද්වාරයේ සංවරයයි. **මනසාසංවරෝ** යනු මෙහි ද ජවන් සිත් හි අනෙක් ජවනයන් සමග අභිධ්‍යා - ව්‍යාපාද - මිච්ඡාදිටඨි ආදිය ඇතිවීම මනසේ අසංවරයයි. අභිධ්‍යා ආදිය නැතිවීම සංවර වීමයි.

සාධු සබ්බත්‍ථානි - මේ අන්දමට චක්ඛුද්වාරා දී සියළු ද්වාරයන්හි සංවර වීමම මැනවි මීට අමතරව සංවර ද්වාර අටක් ද අසංවර ද්වාර අටක් ද සියලු සංසාර වට්ට මූල දුකට හේතුවන බව දක්වයි. අසංවරද්වාරයෙන් ගෙන් යුත් තැනැත්තා සංසාර වෘතයෙන් නො මිදෙන බව ද සංවරද්වාරයන්ගෙන් යුත් තැනැත්තා සංසාර වෘත්තයෙන් මිදෙන බවද, කියයි. එහෙයින් කියන ලදී. **සබ්බත්‍ථ සංවුතෝ භික්ඛු සබ්බ දුක්ඛා පමුච්චති.**

දේශනාවගේ කෙළවර භික්ෂූන් පස්දෙන සෝතාපත්ති ඵලයෙහි පිහිටියාහුය.

භික්ෂූන් පස් දෙනාගේ කථා පුවතයි.

25.2

"හත්ථ සඤ්ඤතෝති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩසිටියදී හංස ජාතක එක් භික්ෂුනමක් පිළිබඳව දේශනා කරණ ලදී.

සැවැත් නුවර වාසී වූ මිත්‍රශීලීව සිටි භික්ෂු දෙනමක් පැවිදිවී උපසම්පදාවද ලබා බෙහෙවින්ම එකඳාව හැසිරෙති. ඔවුන් දෙනම එක් දිනක් අචිරවතී ගඟට ගොස් නා අවිව තපිමින් සිහි කටයුතු කථාවක් කරමින් සිටියහුය. මේ අවස්ථාවේදී අහසින් යන හංස යුවලක් දැක තරුණ භික්ෂුව ගල් කැටයක් ගෙන එක් හංසයෙකුගේ ඇහැට පහරමියි කිවේය. දෙවැන්නා නොහැක්කේයැයි පැවසුවේය. සිටින්න මේ පැත්තේ ඇසට නොව අනෙක් පැත්තේ ඇසට පහරදෙමියි පැවසුවේය. එයද නොහැක්කේයයි පැවසුවේය. එසේනම් බලන්නැයි දෙවැන්නා තව ගලක් ගෙන හංසයාගේ පසුපස පැත්තට විද්දේය. ගල්කැටය යන හඬ අසා පියැඹීම නවතා හංසයා බැලුවේය. එවිට ඔහු අනෙක් රටුම් ගල් කැටයක් ගෙන යට ඇස පැත්තට විද අනෙක් ඇසෙන් නික්ම යන ලෙස විද්දේය. හංසයා විලාප නගමින් ඔවුන් පාමුල වැටුනි. එහි සිටි භික්ෂූන් වහන්සේලා එය දැක ඇවැත්නි බුදුසසුනේ පැවිදි වී අනුචිත දෙයක් නොප කරණ ලදී. ප්‍රාණ ඝාතය කරන්නේ යයි කියා ඔවුන් රැගෙන තථාගතයන් වහන්සේ වෙතට ගෙන ගියහ. මහණෙනි සැබෑද නොප ප්‍රාණ ඝාතය කලෝද? යනුවෙන් විමසා සැබෑබව පැවසුවිට මහණ මෙබඳු නෛර්යානික සසුනක පැවිදි වී මෙලෙස කළේද? පැරණි පඬිවරු බුදුවරුන් නොසිටි සමයක ගිහිගෙයි වසමින් ස්වල්ප කරුණුවලදී ද සැක ඇතිකළහ. නුඹ වනාහි මෙබඳු සසුනක පැවිදිවී කුකුස් පමණ නොමැතිවියයි පවසා ඔවුන්ගේ ඉල්ලීම පරිදි අතීතය ගෙන හැර දැක්වුහ.

අතීතයේ කුරු රට ඉඳුප්‍රස්ථ නගරයේ (ඉදිපත් නුවර) ධනංජය රජු රාජ්‍යකරණ අතර බෝසත් තෙම ඔහුගේ අගමෙහෙසියගේ කුස පිළිසිඳ ගත්තේය. පසුව ඉපදී පිළිවෙළින් ප්‍රසිද්ධ වී තක්සලාවේ ශිල්ප හදාරා පියා විසින් යුවරජ තනතුරේ පිහිටවූයේ පියාගේ අභාවයෙන් පසු රාජ්‍යයට පත්ව

දසරාජ ධර්ම වෙනස් නොකරමින් කුරු ධර්මය ආරක්ෂා කළේය. කුරු ධම්ම නම් පඤ්ච ශීලයයි. මෙම පංචශීලය බෝධි සත්ත්වයෝ පිරිසිදු ලෙසට ආරක්ෂා කරයි. බෝසත් මව අගමෙහෙසිය බාල සොහොයුරු යුවරජ පුරෝහිත බමුණා රැහැන් ගන්නා ඇමති, රියදුරා, සිටුවරයා ගණන් සාදන්නා (වහින්නා) මහ ඇමති, දොරටු පාලයා, නගර සෝභනිය, වණ්ණා දාසිය මෙලෙසට එකොළොස් දෙනෙක් කුරු ධර්මය ආරක්ෂා කරත් මෙකල කාලිංග රට දන්ත පුරයේ කලිඟු රජ රාජ්‍යය කරද්දී එම රටට වර්ෂාව නොවැටුනි. බෝසතාණන් වහන්සේගේ අඤ්ජන වසභනම් මඬගල හස්තියා මහා පුණ්‍යවන්තයෙක් වීය. රටවැසියා මේ ඇතා ගෙන ආ විට වැස්ස වසියයි හැඟීමෙන් රජුට දැනුම් දුන්නාහුය. රජතුමා එම ඇතු ගෙනයාම සඳහා බ්‍රාහ්මණයින් යැව්වේය. ඔවුන් ගොස් බෝසතුන් ගෙන් ඇතා ඉල්ලා සිටියහ බුදුහු ඔවුන්ගේ ආයාචනයට හේතු දක්වමින්

මහරජුනි. ඔබ වහන්සේ ගේ ශ්‍රද්ධාව ද ශීලය ද දන අඳුන් වන් වූ මගුලැතු, ගෙන එම්හයි කලිඟු රජු සමීපයෙන් ස්වර්ණ රජතාදිය ගෙන ආවෙමු. (නිකනිපාතයේ ජාතක කථාව) ඇතා ගෙන ආවද වැසි නොවසින නිසා එම රජු කුරු ධර්ම ආරක්ෂා කරන්නේ යයි එය රන් පටක (තහඩුවක) ලියා ගෙන එන්නැයි නැවත කාලිඞ්ග වාසී බ්‍රාහ්මණයෝද ඇමති වරුද යැව්වේය. ඔවුන් ගොස් ඉල්ලාසිටි විට රජු මුල්කොට සියල්ලෝම අභ්‍යන්තර ශීලයේ කිසියම් කුකුස් මාත්‍රයක් කොට අපේ ශීලය අපිරිසිදු යයි ප්‍රතික්ෂේපකරත් මේ පමනකින් ශීල භේදය වේයයි ඔවුන් විසින් නැවත නැවත ඉල්ලා තම තමන්ගේ ගිලය කීවාහුය. කලිඟු රජා රන් තහඩුවේ ලියවා ගෙන ආවාවු කුරුධර්මය දැක සමාදන්වී මනාව සම්පූර්ණ කළේය. එවිට වැස්ස වැටුනි රට ආරක්ෂා සහිත සුභික්ෂය ඇතිවිය බුදුහු මේ අතීතය ගෙන හැර දක්වුහ.

එකල ගණිකාව උත්පල වණ්ණාය, දොරටු පාලයා පුණ්ණය. රැහැන් ඇමතියා කව්චායන ය. කෘෂිකර්මී ඇමති කෝලිත වීය, සැරියුත් තෙරුන් සිටුවරයා විය. රියැදුරා අනුරුද්ධය. බ්‍රාහ්මණයා කස්සපය. යුව රජු නන්ද පණ්ඩිතයා ය. රජ බිසව රාහුල මාතාවය. මව මහා මායා දේවිය. කුරු රජ මහා බෝධි සත්ත්වයෝය.

ජාතක දේශනාව නිමවා - මහණෙනි මෙලෙස පෙර පඬිවරු ස්වල්ප මාත්‍රයකුඳු කුකුසක් ඇතිවුවිට තම සීලභේදය සැකකළහ. නුඹලා මාගේ බුද්ධ ශාසනයේ පැවිදිව ප්‍රාණ ඝාතය කරමින් බැර්රුම් කර්මයක් කළාහුය. භික්ෂුවක්නම් අතින් දෙපයින් වචනයෙන් සංවර විය යුතුයයි පවසා මේ ගාථාව දේශනා කළහ.

අත පය දෙකම සංවර කර	මනාලෙස
සංවර ලෙසින් කළ යුතුමය කතා	බස
වඩමින් කමටහන් සිතකින්	සමාහිත
මහණුන් සිටිය යුතුමය බුදු පුතා	ලෙස

අතින් සංවර වේ පාදයෙන් සංවරවේ වචනයෙන් සංවර වේ. උතුම් සංයමයට ආධ්‍යාත්මයට ඇලුනේ සංයතවූයේ එකලාව සංයතවූයේ භික්ෂුව නම් වේ.

එහි **හත්ථ සඤ්ඤතෝ** අතින් ක්‍රීඩා කිරීම, අනුන්ට පහර දීම ආදිය නොකොට සන්සුන් කර ගැනීම හත්ථසඤ්ඤතනම් වේ. දෙවන පදයෙහිද මෙම න්‍යායමයි. **වාචාය සඤ්ඤතෝ** වචනයෙන් මුසාවාදාදිය නොකීම වචනයේ සංවරයයි. **සඤ්ඤතුත්තමෝ** - කයෙහි සංවරභාවය, අඟ පසඟයන ගෙන කෙරෙන කාය විකාරාදියෙන් හා සතුන් මැරීම ආදියෙන් වෙන්වීම යන අර්ථයි. **අජ්ඣත්තරතෝ** අධ්‍යාත්ම විෂය පුළුල් කරමින් කමටහන් වැඩීමෙහි ඇලීම. **සමාහිතෝ** මනාකොට සිත එකඟ කරගත් පුද්ගලයා - **එකෝ සන්තුසිතෝ** - යනු ඒක විහාරීම හුදෙකලාව. විපස්සනාචාරයෙහි පටන්, අධිගමයට පත්වීම තෙක් සතුටු සිතින් කමටහන් වඩා සතුටු වීම, අර්හත්වය ඒකාන්ත සතුට කිම සඳහා කියන ලදී.

දේශනාවගේ කෙළවර බොහෝ දෙනා සෝවාන් පෙළෙහි පිහිටියේය.

හංස ජාතක භික්ෂුවගේ කථා පුවතයි.

25.3

"යො මුඛ සඤ්ඤතොනි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටියදී කෝකාලික භික්ෂුව නිමිති කරගෙන දේශනා කළහ.

කතා පුවත - ඉක්බිති කෝකාලික භික්ෂුව බුදුන් යම්තැනක ද එතැනට එළඹුනි. සුත්‍රයේ සඳහන් ලෙසට අර්ථයද අටුවා වේ කියන ලද පරිදි දැනගත යුතුය. කෝකාලික භික්ෂුව පදුම නිරයේ උපන් විට ධර්ම සභාවේ කථාවක් උපන. අහෝ කෝකාලික භික්ෂුව තමන්ගේ කට නිසා විනාශයට පත්වුයේ දැගසව්වන්ට ආක්‍රොෂ කරද්දීම පොළොව විවර වුයේය. ශාස්තෘන් වහන්සේ පැමිණ, මහණෙනි කිනම් කථාවකින් යුතුව සිටියේ දැයි විමසා කෝකාලික ගැන බව සඳහන් කලවිට මහණෙනි දැන් පමණක් නොව කෝකාලික පෙරද තම කට නිසා විනාශ වුයේයයි පවසා එම කථාව අසනු කැමති භික්ෂූන්ගේ ඉල්ලීම අනුව එය පැවසීමට අතීත කථාව දක්වුහ.

යටගිය දවස හිමවත් පෙදෙසේ එක් විලක ඉදිබුවෙක් වාසයකරයි. හංස පෝතකයින් දෙදෙනෙක් ගොඳුරු සඳහා හැසිරෙන්නේ ඔහු හා විශ්වාස වන්ත බවට පත්විය. දැඩිලෙස විශ්වාස වන්ත වූ ඔව්හු එක් දිනක් ඉදිබුවාගෙන් මෙසේ විමසුහ. යහළුව ! අප වසන හිමාලයේ චිත්‍රකූට පර්වත තළාවේ රන් ගුහාවේ වසන තැන රමණීය වේ. එතැනට අප හා යන්නේද? මම කෙසේ යන්නේද? අපි ඔබව ගෙනයන්නෙමු. එහෙත් කට රැකගන්නේ නම් පමණි. යාළුවනි කට රැක ගන්නෙමි රැගෙන යන්නැයි කීවේය. ඔවුන් දෙදෙනා යහපතැයි කියා එක දණ්ඩක් කටට දී ඉදිබුවාලවා එය සපාගන්නට කියා හංසයින් දෙදෙනා කෝටුවේ දෙකෙලවර හොටවලින් ඩැහැගෙන අහසට නැගුනාහුය. ගම් දරුවෝ හංසයන් විසින් මෙලෙස ගෙනයනු ලබන ඉදිබුවා අතර මගදී දැක හංසයන් දෙදනෙක් ඉදිබුවෙක් දණ්ඩකින් උසුලා යතියි කිවාහුය. ඉදිබුවා ඉදින් මගේ යාළුවෝ මා ගෙනයති දුෂ්ට කොල්ලනි තොපට මොකදැයි විමසීමට කියනුකැමතිව කට ඇරියේය. හංසයන්ගේ ශීඝ්‍රවේගය නිසා බරණැස නගරයේ රජ මැදුරේ උඩට පැමිණි අවස්ථාවේදී

කටින් අල්ලාගෙන සිටි තැනින් දන්ඩෙන් ගැලවී රජ මිදුලේ වැටී දෙකට බිඳුනි. තථාගතයන් වහන්සේ මේ අතීත කථාව ගෙන හැර දැක්වීය.

සංවර වූ මුවින් - පද දූන කිව යුතුමය
පෙළ අරුත් බණපද - කියන මහණම උතුම් වන්නේ

1. ඉබ්බා කතා කිරීමට යාමෙන් ඒකාන්තයෙන් තමන්විසින් නැසිනි. මුවින් මනාකොට ගත දඩු කැබැල්ල අතහැරීම නිසා තමාගේ තෙපුලම තමා නැසීය.
2. ශ්‍රේෂ්ඨ වූ මහරජ, මේ කාරණය දැක කුසල සහගත වූ ඇත්ත කතාවම සුදුසු තන්හිම කිවයුතුය. නුසුදුසු තැන බොහෝ කොට බිනීමෙන් ඉබ්බා නැසුනු බව දක්නෙහිය.

මෙය දුක නිපාතයේ බහු භාණී (කච්ඡප) ජාතකය විස්තර කර මහණෙනි භික්ෂුවක්නම් කය සංවර කර උඩඟුනොවී නිවුන සිතින් සිටිය යුතුය යි කියා මේ ගාථාව පැවසුවේය. කට ප්‍රවේශම් කරගත්, පමණ දූන කථාකරන සුළු සන්සුන් සිතැති යම් මහණෙක් අර්ථයද ධර්මයද කියන්නේද ඔහුගේ වචන මිහිරිය.

එහි **මුඛසඤ්ඤතොති** - දාස සැඩොල් ආදී දුදනෝ දුර්ජනයෙකි නුඹ දුශ්ශීලයෙකි ආදිය නොකීමට මුවින් සංවර විය යුතුය. මත්තභාණී **මත්තා** යනු ප්‍රඥාවයි. ප්‍රඥාවෙන් කථාකරණුයේ මත්තභාණී **අනුද්ධතොති** - නිවුන සිතයි. **අත්ථං ධම්මංච දීපෙතති** - කියන ලද දේශනාව ධර්මය විය යුතු **මධුරතති** - මෙබඳු භික්ෂුවකගේ කියන වචනය මිහිරි වේ. යමෙක් වනාහි අර්තයම සම්පාදනය කරයි ද පෙළ අරුත පෙළ දහම අරුතට ගැලපෙන සේ මනාව පැවසීම මිහිරි නම් වේ. දේශනාව අවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

කෝකාලික පිළිබඳ කථා පුවතයි.

25.4

"ධම්මාරාමොති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර ජේතවනයේ වැඩසිටියදී **ධම්මාරාමථෙර** නම් භික්ෂුවක් නිමිත්තකරගෙන දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේ මෙයින් සිවුමසකට පසුව පිරිනිවන් පාන්නෙමියි දැනුම් දුන්විට නොයෙක් දහස්ගණන් භික්ෂූන් බුදුන් පිරිවරා හැසිරුනාහුය. එහි පුහුදුන් අයට කඳුළු ධාරා මැඩ ගැනීමට නොහැකිවුහ. රහතන් වහන්සේලාට ධර්ම සංවේගය ඇතිවිය. සියල්ලෝම කුමක් කරමුදැයි කණ්ඩායම් බෙදෙමින් හැසිරෙති. එක් ධම්මාරාම නම් භික්ෂුනමක් භික්ෂූන් සමඟ හැසිරීමට නොගියේය. භික්ෂූන් ඇවැත්නි කුමක් දැයි විමසන විටද පිළිතුරු ද නොදී - මෙලෙස සිතුවේය. තථාගතයන් වහන්සේ සිවුමසකින් පිරිනිවන් පාන සේක. බුදුන් වැඩසිටියදීම උත්සහ දරා රහත් බවට පත්වන්නෙමි. මෙලෙස සිතා හුදකළා වී හැසිරෙමින් බුදුන් දෙසූ ධර්මය ආවර්ජනාකරයි. සිතයි. සිහිපත් කරයි. මේ බව භික්ෂූන් වහන්සේලා බුදුන්ට දැනුම් දුන්හ.

ස්වාමීනි ! ධම්මා රාම භික්ෂුව ඔබවහන්සේ කෙරෙහි ස්නෙහ මාත්‍රයක් හෝ නැත්තේය. බුදුහු පිරිනිවන් පාන්නාහ. කුමක් නම් කරන්නවුදැයි අප විසින් සම්මන්ත්‍රණය කරමින් සිටිමු. ඔහු එයට සහභාගි වන්නේ නැත. බුදුහු ඔහු ගෙන්වා සැබෑදැයි විමසුහ. සැබෑය ස්වාමීනි. කුමක් නිසාද? ස්වාමීනි ඔබවහන්සේ සිවිමසකින් පිරිනිවන් පාන්නාහ. මම අවීතරාගී වෙමි. ඔබ වහන්සේ වැඩසිටියදීම අර්හත්වයට පැමිණෙන්නෙමියි ඔබවහන්සේ දේශනා කළ ධර්ම මෙනෙහි කරමින් සිටිමි. එම ධර්ම සිහිපත්කරමි. බුදුහු සාධු සාධු යනුවෙන් සාධුකාර දී මහණෙනි මට සෙනේහ ඇති භික්ෂූන් විසින් ධම්මාරාම මෙන් වියයුතුය. මල් ගඳ විලවුන් වලින් පූජා කිරීම මට කරණ පූජාවක්නොවේ. ධර්මානු ධර්ම ප්‍රතිපත්තියම මට කරණ පූජාවයි. පවසා මෙම ගාථාව පැවසුහ.

දහමෙහිම රිසි ඇතිව - දහමෙහි ඇලෙන මහණහු
සමත විදසුන් වඩමින් - දහමින් නො පිරිහේ මැයි.

ධර්මය සොයන ධර්මයේ ඇලුන ධම්මා රාම ධර්මය සිහිකරණ භික්ෂුව දහමින් නොපිරිහේ.

එහි නිවසන තැනින් සමථ විපස්සනා ධර්මය සේවනය නිසා **ධම්මා රාම** නම් එහිම ධර්මයේ ඇලුනේ **ධම්ම රත** නම් වේ. ධර්මයට නැවත නැවත සිතන නිසා ආවර්ජනය කරන්නේ සිහිකරන්නේ යන අර්ථයි ධම්මං **අනුවිචින්තයං** යමෙක් ඒ ධර්මය ආවර්ජනා කරන්නේද, සිහිකරන්නේද යන අර්ථයි. **අනුසංසරං** ධර්මයම සිහිපත් කරන්නේ, **සද්ධම්මා** මෙබඳු භික්ෂුව සත්තිස් බෝධි පාක්ෂික ධර්ම නව විධ ලෝකෝත්තර ධර්මය යන්ගෙන් නොපිරිහේ යන අර්ථයි. දේශනා කෙළවර එම භික්ෂුව රහත් බවෙහි පිහිටියේය. පැමිණ අයටද සාර්ථක දේශනයක් විය.

ධම්මාරාම තෙරුන් පිළිබඳ කථා පුවතයි.

25.5

"සලාභනනි" - යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩසිටිය දී එක්තරා විපක්ෂ සේවක භික්ෂුවක් නිමිති කරගෙන මෙම ගාථාව දේශනා කළහ.

දේවදත්ත පාක්ෂික භික්ෂුවක් සහායක වූයේය. ඔහු එම භික්ෂූන් සමග පිණ්ඩපාතයේ හැසිරි කරණ ලද බත්කිස ඇත්තේ එනු දැක කොහි ගියේදැයි විමසුවේය. අසුවල් නැන පිණ්ඩපාතයේ හැසිරුණෙමි. ඔබට පිණ්ඩ පාතය ලැබුනේද? එසේය ලැබුනි මෙහි අපට මහත් ලාභ සත්කාර ඇත. දිනකිපයක් මෙහිම ඉන්නැයි පැවසුවේය. ඔහු එම භික්ෂුවගේ වචනයෙන් දින කිපයක් එහි වාසය කර තම ස්ථානයටම ගියේය. අනතුරුව භික්ෂූන් ස්වාමීනි මෙම භික්ෂුව දෙව්දත් තෙරුන්ට උපන් ලාභ සත්කාර පරිභෝග කරයි. මොහු දේවදත්ත පාක්ෂිකයෙකියි තථාගතයන් වහන්සේට දැනුම් දුන්හ. ඔහු කැඳවා භික්ෂුව ඔබ එසේ කළේදැයි? බුදුරදුහු විමසුහ. එසේය ස්වාමීනි මම එහි ලාබාල භික්ෂුනමක් නිසා දින කිපයක් එහි වාසය කළෙමි. එහෙත් දෙව්දත් තෙරුන් ගෙන් ලත් දෙය රුචිනොකරමි. ඉක්බිති බුදුරදුන් ලැබුකිසිවක් ඔබ රුචි නොකෙළේද? දුටු දුටු අයගේ දේ ලබනු රිසිව හැසිරෙන්නේ ඔබ දැන් පමණක් නොව මෙබඳුදේ පෙර භවයේ දීද කරණ ලදී. දැන් ස්වාමීනි ඔහුගේ ක්‍රියා දුටුවේ පෙර භවයේදී මෙලෙස අන්අයගේ දේ රුචි කලේයයි යන්න පැහැදිලි කරණ ලෙසට ඉල්ලා සිටිය නිසා අතීත කථාව ගෙන හැර දක්වුහ.

1. මහිලා මුඛ නම් ඇතා පළමු සොරුන්ගේ රෞද්‍ර වචන අසා හමුවුවන් මරමින් සොරුන් ගේ වචනය අනුව හැසිරුනේය. සුසංයත වූ සිල්වතුන් ගේ මෘදු මොලොක් වචන අසා. හස්තියා පළමු තමා තුළ තුබූ සියලු යහගුණයන්හි පිහිටියේය.

මේ මහිලාමුඛ ජාතකය විස්තරකර දී මහණෙනි භික්ෂුවක් විසින් නම් ස්වකීය ලාභයෙන්ම සතුටු වියයුතුය. අන්අයගෙන් ලාභය පැතීම නොවටී.

පරලාභය ප්‍රාර්ථනා කරන්නාට ධ්‍යාන විපස්සනා මාර්ග ඵලයන් අතුරෙන් එකම ධර්මයක් හෝ නො උපදී. සියලාභ සන්තුෂ්ටියම ධ්‍යාන ආදීන් උපදිතියි පවසා ධර්මය දේශනා කරන්නේ මේ ගාථාව පැවසුහ.

ලාබය සොය සොයා
අනුන් ලාබ ද පතනා
ලාබයෙම හිජු වූ
මහණ අධිගම නොලබයි.

සුළු වුව ද ලද දෙය
හෙළා නොදකින අපිස් දිවි ඇති
පිරිසිදු වූ මහණහට
දෙවියෝ වඳිති දිව රැ

තම ලාභය ඉක්මවා නොයන්නේය. අන් අයගේ ලාභය පතමින් නො හැසිරෙන්නේය. අන් අයගේ ලාභය ප්‍රියකරන්නා සමාධියට පත් නොවේ.

භික්ෂුව සුලු ලාභ ඇත්තේ ද? තමන් ලද ඒ සුළුලාභය හෙලා නොදකී. පිරිසිදු දිවි පෙවෙතක් ඇති අලස නොවූ මහණහට ඒකාන්තයෙන් දෙවියෝ පසසත්

එහි **සලාභං** යනු - තමන් විසින් උපදවන ලාභයයි. ගෙපිළිවෙලින් පිඬු සිඟා යාම පිළිකෙව් කොට වැරදි ආකාරයෙන් ජීවත් වන්නේ තම ලාභය ඉතා මදයයි අවමන් කරයි. පිළිකුල් කරයි. එසේ නොකරන්නන් විසින්

නාතිමඤ්ඤෙය්‍ය අඤ්ඤසං පිහ අන්‍යයන්ගේ ලාභය ප්‍රාර්තනා කරන්නේ නොහැසිරේ **සමාධිං නාධිගච්ඡති අඤ්ඤසං** අනුන්ගේ සිවුරු කිරීම - ආදියේ උනන්දුව දක්වන අනුන්ගේලාභය **සොයායන** භික්ෂුව අර්පන සමාධිය හෝ උපචාර සමාධිය හෝ නො ලබයි.

438

සලාතං නාතිමඤ්ඤති උසස් පහත් නැති බැරි කුලයන්හි ගෙපිළිවෙලින් හැසිරෙන භික්ෂුව ස්වකීය ලාභයක් නොලබන්නේ වෙයි. **තංවෙ** යනු මෙබඳු වූ භික්ෂුව සාර ජීවිතය සඳහා **සුද්ධාජීවිං** තම දෙපා වල ශක්තියෙන් ජීවිතයේ දී කුසීත බවින් තොර වේ. **අතන්දිතං දෙවා පසංසන්ති** - එබඳ භික්ෂුව දෙවියන්ගේ ප්‍රශංසාවට ලක් වේ.

විපක්ෂ සේවක භික්ෂුවගේ කථා පුවතයි.

25.6

"සබ්බසොනි" යන මේ ධර්මදේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී පඤ්චඟ දායක නම් බමුණා නිමිති කරගෙන දේශනාකළහ.

මේ තැනැත්තා නම් කෙත ශුද්ධ කලවිට ම **"ඛෙත්තඟ"** දානය දෙයි. කමතට ගෙනෙනකළ **"බලඟ"** දානය දෙයි. කමතේ කොළ මඩිනවිට බලඟ භණ්ඩඟ නම් දානය දෙයි. සැළිවලට දමන කාලයේදී **"කුම්භඟ"** දානය දෙයි. තලිය වඩන කාලයේදී පාතඟ නම් දානය දෙයි. මේ පඤ්චඟ දානයම දෙයි. ගෙදරට පැමිනි කෙනෙකුට ආහාර නොදී නො වළඳ යි. මේ නිසාම ඔහුට පඤ්චඟ දායක යන නම ඇතිවුනි. බුදුරදුන් ඔහුගේ ද බැමිණියගේ ද තුන් මාර්ගඵලයක් ලබාගැනීමට හේතු සම්පත් දක බ්‍රහ්මණයා ආහාර ගන්නා වේලාවේ ගොස් දොර අසල වැඩසිටියහ. බමුණාද දොර ලඟ ගෙය තුළට මුහුණලා වාඩිවී ආහාර අනුභව කරයි. දොර අසල වැඩසිටි බුදුරදුන් නො දකී. බැමිනිය ඔහුට බෙදමින් සිටියදී බුදුන් දක මෙසේ සිතුවාය. මේ බ්‍රාහ්මණයා පස්වනාවක් අග්‍රදානය දී අනුභව කරයි. දැනුදු ශ්‍රමණ භවත් ගෞතමයන් පැමිණ දොරලඟ වැඩි සිටියේය. ඉදින් බ්‍රාහ්මණයා ඔහු තම බත බැහැර කර දෙන්නේනම් මට නැවත ඉවීමට නොහැකිවෙමි. ඇය ගෞතමයන් වහන්සේ මුවාවන ලෙසට බුදුන් දෙසට පිට හරවා බමුණාගේ පිටුපසින් ඔහුව මුවාකරමින්. පුන්සඳ අත්ලෙන් වසා ලන්නාසේ සිටියේය. එසේ සිට බුදුන් ආපසු ගියේද නැත්දැයි බුදුන් නොපෙනෙන ලෙසට බැලුවාය. බුදුහු එලෙසම සිටගෙන සිටියහ. බ්‍රාහ්මණයාට ඇඟේය යන බියෙන් ඉක්ම යන්නැයි ද නොකියයි පසුබාමින් ඉක්මනින් ඉවත්වන්නැයි පැවසුවාය. බුදුහු නොයමියි හිස සෙලවුහ. (හිස සලමින් නොයනබව ඇඟවුහ) ලෝක ගුරුවූ බුදුන් නොයමියි හිස සැලීම නිසා ඇයට එය දරා ගැනීමට නොහැකිව මහ හඬින් සිනාසුනාහ. එම අවස්ථාවේ බුදුහු ගෙය දෙසට ආලෝක ප්‍රභාවක් පිටකළහ. පිටුපස බැමිණිය දෙනසිනා හඬ ඇසූ බමුණා ඔඩවර්ණ රශ්මියේ ප්‍රභවද බලා බුදුන් සිටිනතැන් දුටුවේය. බුදුවරයින් නම් ගමට හෝ ආරණ්‍යයට හෝ හේතු

සම්පත් ඇති අයට තමන් නොදන්වා නොයති. බ්‍රාහ්මණයා බුදුන් දැක එම්බල නී නැසුනෙමි රාජ පුත්‍රයෙක් පැමිණ දොරලඟ සිටින විට මට නොදන්වා බැරෑරුම් දෙයක් කරණ ලදී. පවසා අඩක් අනුභව කරණ ලද ආහාර බඳුන ගෙන තථාගතයන් වෙත ගොස් - පින්වත් ගෞතමයාණනි මම අවස්ථා පහක් - මුල්කොටස දන්දීම අනුභව කරණ කෙනෙක්මී. මෙය මැදින් බෙදා එකම කොට කොටසක් අනුභව කළෙමි. එක් කොටසක් ඉතිරි විය. මේ මගේ බත් දානය පිළිගනු මැනව. නැත මට ඉඳුල් බතින් වැඩක් නැතැයි නොකියා බ්‍රාහ්මණය මට අග්‍ර වූ දෙයම, මුල් කොටසම මට සුදුසුය. බ්‍රාහ්මණය අපි පරදත්තූපජීවිහු ජීවිහු වෙමු. අන්අය දෙන දෙයින් යැපෙන ප්‍රේතයන් වැන්නැයි කියා මෙම ගාථාව පැවසුහ.

මුලින් හෝ මැදින්හෝ අවශේෂ වශයෙන් අන් අයගෙන් යැපෙන්නට පිණ්ඩපාතය ලැබෙන්නේද ලැබුනේය හෝ නොලැබුනේයයි ධීර මුණිවරයෝ වෙනස්කම් නොදන්වති.

බමුණ මෙය අසා ප්‍රසන්න සිත් ඇතිව අහෝ ආශ්චර්යකි දීප සාමීවූ රාජ පුත්‍රයා ඔබේ ඉඳුල්බතින් වැඩක් නැතැයි නොකියයි. දොර ලඟම සිට බුදුන්ගෙන් ප්‍රශ්නයක් ඇසුවේය. පින්වත් ගෞතමයන් වහන්ස ! ඔබ වහන්සේගේ ශ්‍රාවකයින්ට භික්ඛු යනුවෙන් පවසති කොපමණකින් නම් භික්ෂුවක් වේද ප්‍රශ්න කළේය. බුදුහු මොවුන්ට කවර ස්වරූප ධර්මයක් දෙසන්නේ දැයි බලන්නේ මේ දෙදෙනා කාෂ්‍යප බුද්ධ කාලයේදී නාමරූප කියමින් කතාකළහ. ඒ නාමරූප දක්වමින්ම මොවුන්ට ධර්ම දේශනාකිරීම වටියයි සිතා බමුණ නාම යෙහිද රූපයෙහිද නොඇලී නොගැටී ශෝක නොකරමින් සිටින්නා භික්ෂුවනමින් හැඳින්වේයයි මේ ගාථාව පැවසුහ.

නාම රූප දෙක පිළිබඳ නැති ඇල්ම
මම මය මගේමය යන බැමි බිඳදැම්ම
පුද්ගලයා පැවිද්දට රුචිකර බැල්ම
"බික්සුව" නම ලබයි පුරනා සිවි සිල්ම

යමෙකුට නාම රූප දෙක්හී හැම ලෙසින්ම මමය මගේය යන හැඟිමක්, නැත්ද නාම රූප දෙක නැසුණු කල්හිත් සෝක නොකරයිද ඒ තැනැත්තා ඒකාන්තයෙන් භික්ෂුව වේ.

එහි **සබ්බසො** යනු සියළු වේදනා ආදී සතර රූපස්ඛන්ධ වසයෙන්ද, පඤ්චස්ඛන්ධ වසයෙන් ද පවත්නා **නාම රූපෙ මමායිතං** = නාම රූපයන්හි මම ය මගේය යන හැඟීමක් නැති සේ මමත්වයක් නොමැතිද **අසතාවන සෝචති** යනු එම නාම රූපදෙකේ ක්ෂය වීමට වැයවීමට පත්වූයේ මගේ රූපය ක්ෂය විය මගේ විඤ්ඤාණය ක්ෂයවිය. යනුවෙන් ශෝක නොකරයිද දුකට පත් නොවේ ද බයවය ධර්මය ක්ෂයවීයයි බලයි. ද **සචෙති** ඔහු මෙබඳු ස්වරූප පවතිද්දි නාම රූපදෙකේ මමායනය නැතිද එනිසා ශෝක නොකරන්නේද භික්ඛුනි වුවත්ති භික්ෂුව යයි යන අර්ථයි.

දේශනාව අවසානයේ අඹුසැමි දෙපලම අනාගාමී ඵලයේ පිහිටියාහුය. පැමිණි පිරිසටද දෙසුම සාර්ථක වුයේය.

පඤ්චඟ දායක බ්‍රාහ්මණයා පිළිබඳ වූ කතා පුවතයි.

25.7

"මෙත්තා විහාරිනි" යන මේ ධර්මදේශනය බුදුරදුන් දෙව්රම් වෙහෙර වැඩසිටියදී බොහෝ භික්ෂූන් නිමිත්තිකරගෙන දේශනා කළහ.

එක් සමයක අයුෂ්මත් මහා කච්චායන තෙරුන් අවන්ති ජනපදයේ "කුරර ඝර" ඇසුරු කොට ගෙන පවතින පර්වත විහාරයේ වාසයකරන්නේ, සෝණනම් කුටිකණ්ණ උපාසකයා තෙරුන්ගේ ධර්මකථාවට පැහැදී තෙරුන් වෙත පැවිදිවීමට කැමැත්තේය. තෙරුන් විසින් සෝණට සෝණ මෙය දුෂ්කරය. එක බතින්, එක ඉරියව්වෙන්, බ්‍රහ්මචරියාම රැකීමට සිදුවේ. මෙලෙස පවසා දෙවරක් ප්‍රතික්ෂේප කරන ලදී. පැවිද්ද සඳහා දැඩිලෙස පැවිදිවීමට අභිශයින් ඇති කැමැත්ත නිසා තෙවැනි වර තෙරුන් කැමතිකර පැවිදි වී භික්ෂූන් අඩුනිසා දක්ෂිණාපථයේ වස්තුනකට පසුව ලබන ලද උපසම්පදාව ඇත්තේ බුදුන් දකිනු කැමතිව උපාධ්‍යායන් ගෙන් විමසා උන්වහන්සේ විසින් දෙනලද අස්නගෙන අනුපිළිවෙළින් දෙව්රමට වැඩමකර බුදුන්වැඳ කරුණලද පිළිසඳර ඇත්තේ බුදුන් හා එකම ගඳකිළියේ අනුමත කරණ ලද සෙනසුනේ බොහෝ රාත්‍රී ඉඩඇති තැන කල්යවා රාත්‍රී භාගයේදී කල්යවා අළුයම බුදුන් විසින් ආරාධන කරණ ලද්දේ සුත්‍ර නිපාතයේ සොළොස් අටයක වර්ගයන් සියල්ලම මිහිරි සරින් සජ්ඣායනා කළහ. අනතුරුව තථාගතයන් වහන්සේ සජ්ඣායනය අවසානයේ අනුමෝදනා කරමින් සාධුසාධු යයි සාධුකාර දුන්හ. බුදුන් විසින් දෙනලද සාධු නාදය අසා බුමාටු දෙවියෝ නාග සුපර්ණයෝ ද මෙසේ බඹලොව දක්වා එකම සාධුකාරයක් විය. මේ අවස්ථාවේදී දෙව්රමින් යොදුන් එකසිය විස්සක් දුර කුරර ඝර නගරයේ තෙරුන්ගේ මව වූ උවැසියගේ නිවසේ අධිගෘහීත දෙවියා ද මහත් හඬින් සාධුකාර දුන්නේය. අනතුරුව උපාසිකාව කවුද මේ සාධුකාර දෙන්නේ - යනුවෙන් විමසුවාය. සහෝදරිය මම යි ඔබ කවුරුන්ද ඔබේ භවනයේ වසන දේවතාවාවෙමි. ඔබ මෙයට පෙර සාධුකාර නොදී අදදෙන්නේ කුමක් නිසාදැයි විමසුහ. මම ඔබට සාධුකාර නොදුන්නෙමි. එසේනම් ඔබ කාට සාධුකාර දුන්නේද? ඔබගේ පුත් සෝණ කුටිකණ්ණ තෙරුන්ට සාධුකාර දුනිමි. ඇයි මගේ පුතු කුමක් කලේද? ඔබේ

පුතු අද තථාගතයන් සමඟ එක ගඳකිළියේ වසමින් බුදුන්ට ධර්ම දේශනා කළේය. බුදුහු ඔබ පුතුගේ ශබ්දය අසා පැහැදී සාධුකාර දුන්හ. එනිසා ම විසින්ද සාධුකරය දෙන ලද්දේය. සම්මා සම්බුදුන් ගේ සාධුකාරය කියා භූම්‍යසථ දෙවියෝද අනතුරුව බඹලොව දක්වාම සාධුනාදයට පැවතුනි. දෙවියනි ! කිම. මගේ පුතා බුදුන්ට ධර්මය දේශනා කළේද නැතහොත් බුදුහු මගේ පුතුට ධර්මය දේශනා කළේද? ඔබේ පුතු විසින් බුදුන්ට ධර්මය දේශනා කරණ ලදී. මෙලෙස දෙවියන් සමග කථා කරද්දී උපාසිකාව පස්වනක් ප්‍රීතියෙන් පිනා ගොස් මුළු සිරුර පුරා ප්‍රීතිය පැතිරුනි. අනතුරුව ඇයට මෙබඳු අදහසක් ඇතිවුනි. ඉදින් මගේ පුතුට බුදුන් හා එක ගඳකිලියක සිට ධර්මය දේශනා කරන්නට හැකිනම් මටද දේශනා කළහැකිය පුතු පැමිණි දිනයක මමද ධර්මය අසන්නෙමියි සිතුවාය. සෝණ තෙරුන්ද බුදුන් විසින් සාධුකාර මා ලැබුවේ මේ මගේ උපධ්‍යායන් වහන්සේ කියා එවා වදාළ මෙහෙවර දැනුම් දීමට කාලය යයි බුදුන් විසින් ප්‍රත්‍යන්ත ජනපදවල පස්නමක් ආදිකොට උපසම්පදාව ලබා දීම ආදී වර පහක් බුදුන්ගෙන් ලබා ගෙන කීප දවසක් ශාස්තෘන් වහන්සේ වෙත වැස උපාධ්‍යායයන් බලන්නෙමියි බුදුන් විමසා දෙවිරමින් නික්මී පිළිවෙලින් උපාධ්‍යායන් වහන්සේ වෙතට පැමිණියේය. තෙරුන් වහන්සේ දෙවැනි දිනයේදී ඔහු රැගෙන පිඬුසිඟායන්නේ මෑණියන්වූ උපාසිකාවගේ ගෙදරටගොස් සිටියහ. ඇය පුතු දැක සතුටුව වැඳ හොඳින් වළඳවා මෙසේ ඇසුවේය. ඔබ බුදුන් හා එක ගඳකිළියේ සිට බුදුන්ට ධර්ම කථා කීවේද? උපාසිකා මාතාවනි ඔබට මෙය කවුරුන් කීවේද, දරුව, මේ ගෙයි අධිගෘහිත දෙවියා මහහඬින් සාධුකාරදී ම විසින් විමසන ලදුව මේ තොරතුරු ඔහු විසින් කියන ලදී. එය අසා මම ද මෙසේ සිතුවෙමි. මගේ පුතු බුදුන්ට ධර්මය දේශනා කළේනම් මටද දේශනා කරුණු ඇත කියා අසවල් දින දේශනය පිළියෙල කරමි. ඔබ වහන්සේ දේශනා කරන්න. උන් වහන්සේ පිළිගත්හ. උවැසිය භික්ෂුසංඝයාට දන් දී පුජාකර පුතුගේ ධර්මය අසමියි එකම දාසිය ගෙය ආරක්ෂා කිරීමට තබා සියළු පරිවාර ජනයා රැගෙන නගරය තුළ ධර්ම දේශනය සඳහා පිළියෙල කළ සරසන ලද මණ්ඩපයට නැගී ධර්මය දේශනා කරණ පුතුගේ ධර්මය ඇසීම සඳහා පිටත්ව ගියාය. මෙකල නවසියයක් සොරු එම උවැසියගේ ගෙයි අවකාශයක් සොයන්නේ එහි හැසිරුනාහ. ඇගේ ගෙය ප්‍රාකාර හතකින් වට කරණ ලදී. දොරටු හතකි. ඒ ඒ දොරටු

වෙහි දරුණු බල්ලන් බඳින ලදී. ඇතුළු ගෙයි වහලයේ ජලය වැටෙන තැන අගලකි එහි ඊයම් වලින් පුරවන ලදී. දවල් කාලයේ අව්වෙන් දැඩිසේ පැසී තිබේ. රාත්‍රියේදී තදවේ. රළුලෙසට තිබේ. මේ අතර මඩ වලින් පිරි අගලකි. එය අතර මහත් යකඩ දාම නිතර භූමියට වැටේ මෙබඳු රැකවරණ හා උවැසිය ගේ තුළ සිටින බව නිමිති කරගෙන එම සොරුන් අවකාශයක් නොලැබ මෙම ධර්ම දේශනය පැවති දින ඇය එහි ගිය බව දැන උමඟක් සාදා ඊයම් හා යකඩ සංඝාටක යට කොටසින් ගෙතුලට පිවිසියේය. යම් කිසි හෙයකින් සොරු ගෙට ඇතුල් වූ බව අසා හෝ දැන ධර්මය ඇසීම නවතා ගෙය දෙසට එන්නීනම් පහර දී ඇය ඝාතනය කිරීම සඳහා තව සොරෙකු එහි යැවීය. ඔහු ගොස් ඇය සමීපයේ සිටියේය. සොරුන්ද ඇතුලත ගෙයි පහන් දල්වා කහවනු ගබඩාවේ දොර විවරාකළහ. එම දාසිය සොරුන් දැක උපාසිකාව බණ අසන තැනට ගොස් ආර්යාවනි බොහෝ සොරු පැමිණ කහවනු ගබඩාව අරින ලදී. යයි දැනුම් දුන්නාය. සොරු තමන් දුටු කහවනු ගනිවා මම මගේ පුතුගේ ධර්මය අසමි. මෙලෙස රිදී ගබඩාව විවරකළ විටද රන් ගබඩාව විවර කළවිටද දාසිය දැනුම් දුන්නේද තුන් වැනි වාරයේ ඇය පැමිණ දැනුම් දෙනවිට උපාසිකාව මගේ ගෙට ආ සොරු කැමති දෙයක් පැහැර ගනිවා අනතුරුත් නොකරන්න. ඉදින් නැවත ආවොත් කළ යුතුදේ දනිමි. ගෙදරට ම යනුයි දාසිය ගෙදර යැවුවාය. සොර දෙටුවා මේ කථාව අසා මෙබඳු කාන්තාවක් සතු වස්තුව ගැනීම අකුණු ගසා හිස සැලීමට සිදු වේයයි. සොරුන් වෙතට ගොස් උවැසියගේ සියළු දේ තිබුලෙස ආපසු තබන්නැයි කිවේය. ඔවුන් කහවනු රිදී රන් ගබඩාවල ඒවා එලෙසම තැබුහ. මේ ධර්ම තාවයි. ධර්මයේ ආනුභාවයයි ධර්මය ධර්ම චාරින් ආරක්ෂා කරති.

දහම් හිම හැසිරෙන
දහමට අනුව නියැලෙන
අය රකිනි දහමම
ඔව්හු අවුරති රැඳු අවාමග

දැහැමියා දහමින් රැකේ. ධර්මය හැසිරුනේ සැප ඇතිකරයි. මෙම අනුහසින් මැනවින් හැසිරුනේ ධම්ම චාරියා දුගතියට නොම යන්නේය.

සොරුන්ද ගොස් ධර්මය දෙසන තැන සිටියහ. තෙරුන්ද ධර්මය දේශනාකර අළුයම ධර්මාසනයෙන් බැස්සාහ. එකෙනෙහි සොර දෙටුවා උවැසියගේ පාමුල වැටී ආර්යාවෙනි මට සමාවන්න ඇයි මේ දරුව, මම ඔබට ආඝාත බැඳ ඔබ ඝාතනය කිරීමට සිටියෙමි. එසේනම් දරුව මම සමාව දෙමි. අනෙක් සොරුන්ද එලෙසම පවසා දරුවනි සමාව දෙමියි ඔවුන් කීවාහුය. ආර්යාවනි ඉදින් අපට සමාව දෙන්නේනම් ඔබේ පුතු ලඟ අපට පැවිදි වීමට අවසර දෙන්න - ඇය පුතුට වැඳ මෙසේ කීවාය. දරුව මේ සොරු මගේ ගුණයෙන් ඔබගේ ධර්ම කථාවේත් පැහැදී පැවිද්ද ඉල්ලති මොවුන් පැවිදි කරන්නැයි පැවසුවාය.

තෙරුන් යෙහෙකැයි පවසා ඔවුන් විසින් අඳින ලද වස්ත්‍ර දහයක් කපවා තඹවන් මැටිවලින් පාටකර ඔවුන් පැවිදි කරවා සීලයන්හි පිහිටුවුහ. උපසම්පන්න කාලයේදී ඔවුන් වෙන් වෙන් කරවා කර්මස්ථාන සියයක් ගෙන එක් පර්වතයකට නැගී ඒ ඒ ගසක සෙවෙනේ වාඩි වී ශ්‍රමණ ධර්ම කළාහුය යොදුන් එකසිය විස්සකට ඈත දෙවිරම වැඩ සිටියදීම එම භික්ෂූන් දෙස බලා ඔවුන්ගේ චරිත වශයෙන් ධර්ම දේශනා කොට ආලෝකයක් පතුරුවා ඉදිරියේ සිට කියන්නාසේ මෙම ගාථා පැවසුහ.

මෛත්‍රී විහාරී භික්ෂුව සසුනේ පැහැදී සංස්ඛාර දවා ශාන්ත පදයට පත්වේ.

1. යම් භික්ෂුවක් මෛත්‍රී විහරණ ඇත්තේද, බුදු සසුනේ පැහැදුනේ ද, ඒ භික්ෂුව සංස්කාර ධර්ම සංසිඳුවන්නා වූ නිවන ලබන්නේ ය.
2. ශ්‍රමණය ! මේ ආත්මභාවය නමැති නැවේ මිථ්‍යා විතර්ක ආදී දිය ඉසදමන්න. ඔබ විසින් සිතා එසේ ඉස දමන ලද නැව (ආත්ම භාවය) සැහැල්ලු වී එන්නේ ය. රාග දෝස ආදී බැඳුම් ද සිද දමා නිවනට පැමිණෙන්න.
3. බැඳුම් පස සිද දමන්න, උද්ධංභාගිය සංයෝජන පස සිඳ දමන්න. පස් ඉඳුරන් මතු මත්තෙහි වඩන්න. පස් වැදෑරුම් බැඳුම් ඉක්ම වූ භික්ෂුව සැඩ වතුර පහරින් එතෙර වූවෝ වෙති.
4. ශ්‍රමණය, ධ්‍යාන වඩන්න. පමා නො වන්න. ඔබේ සිත කම්සැප විසයෙහි නො දුවවන්න. පමා වී ලෝහ ගුලි නො ගිලින්න. නිරය ගින්නෙහි දැවෙමින් මේ දුකකැයි නො අඬන්න.

5. නුවණ නැත්තාට ධ්‍යානයක් නැත. ධ්‍යාන නොවඩන්නාට ප්‍රඥාවක් නැත. යමෙකුට ප්‍රඥාව ද ධ්‍යානය ද ඇත්ද ඔහු ඒකාන්තයෙන් නිවන සමීපයේය
6. විවේක ඇති නැනකට පිවිසියාවූ , නිවුනු සිත් ඇත්තාවූ. ධර්මය, මනාකොට විමසා බලන්නාවූ මහණහට පෘථග්ජන පුද්ගලයන්ට නැති ප්‍රීතියක් ඇති වේ.
7. යම් කලෙක පඤ්චස්කන්ධ හටගැනීම හා නැතිව යාම නුවණින් මෙනෙහි කරයි ද එසේ සිහිකරන හැම කල්හිම ඔහු ප්‍රීතිය හා සතුට ලබයි.
8. මේ සසුනෙහි නුවණැති භික්ෂුවට එහි මෙය මුල් වේ. ඉන්ද්‍රියන්ගේ සංවර යද, සතුටු වීම ද. ප්‍රාතිමෝක්ෂ සීල සංවරෙයද පිරිසිදු දිවි පැවැත්ම ද ඇති කුසීත නොවූ කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්න.
9. පිළිසඳර පැවැතුම් ඇත්තෙක් විය යුතුය. යහපත් හැසිරීමෙහි සුරයෙක් විය යුතුය. ඒ හේතුවෙන් සතුට බහුල කොට ඇති ඔබ දුක් කෙළවර කරන්නේ ය.

එහි මෛත්‍රී කර්මස්ථානයෙන් මෛත්‍රී කරන්නේද, මෛත්‍රී වසයෙන් තුන්වැනි සතරවැනි ධ්‍යාන උපදවා සිටින්නේ **මෙත්තා විහාරී** නම් වේ. **පසන්නෙනා** - යනු යම් කිසිවෙක් බුද්ධ ශාසනයේ ප්‍රසන්න වේද, ප්‍රසාදයට පත් වේද යන අර්ථයි. **පදං සන්තං** - යනු මෙය නිර්වාණයට නමකි. මෙබඳු වූ භික්ෂුව **සන්තං** සියලු සංස්කාරයන්ගෙන් සන්සිඳීම පිණිස **සඞ්ඛාරූප** සමං උතුම් සුවය පිණිස සුව ලැබුවාහු නිවන් සුවය විඳින්නේම ය යන අර්ථයි. **සික්ඛේ භික්ඛු ඉමං නාවං** යනු ආත්මභාව සංඛ්‍යාත මිථ්‍යාවිතර්ක ජලය විසිකර දමා අනුපාදිසේස. **නිබ්බාණමෙසී** - නිවණට පැමිණියේ යන අර්ථයි. මතු දෙව්ලොව සැපත් දෙන්නාවූ උදධමභාගියා සංයෝජන පස පුරුෂයකුගේ ගෙළෙහි බැඳි රැහැනක් කපා හරින්නාක් මෙන් රහත් මගින් විනාශ කළ යුතුය. දුරුකළ යුතුය යන අර්ථයි.

ඉසින්න - සිත්තා තෙ ලහුමෙසති - යම්සේ මහසමුදුරේ නැව සිදුරු වූ විට සිදුරුවසා දිය ඉස හිස්වුවිට සැහැල්ලුවෙන් මුහුදේ නොගිලී වේගයෙන් යහපත්සේ පටුනට ගමන් කරයි. එලෙසට මිථ්‍යා විතර්ක නැමති ජලය හැර

ආත්මභාව නමැති නැව චක්ඛුද්වාර ආදී ඉන්ද්‍රිය සිදුරු සංචරය කරමින් වසාතබා උපන්නා වූ මිථ්‍යා විතරක නමැති ජලය ඉස සැහැල්ලු ලෙස සංසාර වෘත්තය බිඳ දමා වහා නිවණට පැමිණෙන්නේය. **ඡෙත්වා** රාග දෝස ආදී බැඳුම් සිඳ රහත් බවට පැමිණියේ, **තතෝ** අපරභාගයේ පඤ්ච ජහෙ - යට අපායට පමුණුවන ඕරම්භාගිය සංයෝජනයන් පාදයේ බැඳී රැහැනක් සැතකින් කපාහරින පුරුසයකු මෙන් මාර්ගත්‍රයෙන් සිඳ දැමිය යුතුය. - (පඤ්චජහෙ) දෙව්ලොව සැපත් ආදිය දෙන පඤ්ඤ උද්ධම්භාගිය සංයෝජන ගෙළ බැඳි රැහැනක් මෙන් සිතා, අරහත් මගින් දුරු, කරව යනු අර්ථය.

පඤ්ච චුත්තරි භාවයෙ - යනු උද්ධම්භාගිය සංයෝජන ප්‍රහාණය පිණිස සද්ධාදී පඤ්ච ඉන්ද්‍රියන් මතු මඩන්නේ ය. **පඤ්ච සඬ්ගාති ගෙ** - මෙසේ ඇතිකල්හි රාග - ද්වේෂ, මෝහ මාන - දිටඨි ආදී වූ පස ඉක්මවූ තැනැත්තා යි - **භික්ඛු ඔඝතිණ්ණෙ** - කාම භව, දිටඨි, අවිජ්ජා - යන සැඩ චතුර පහරින් එතෙර වූ තැනැත්තායි. **ඣාය භික්ඛු** ශ්‍රමණය ඔබ ධ්‍යාන දෙක්හිම ධ්‍යාන කරන්න. කාය කර්මාදියෙහි අප්‍රමත්තවිය යුතුය ප්‍රමාද නොවන්න. **හමසසු** - පඤ්චවිධ කාම ගුණයන් ඔබගේ සිත මැඩ නොපවත් වාවා, **මා ලොහගුලනෙ** - සිහි මුලාවෙන් යුත් ප්‍රමාදයට පත්වන තැනැත්තා නිරයේ මැටි ලෝහ ගුලි ගිලිත්. එනිසා මෙය කියමි. මා ප්‍රමාද වී නිරයේ ලෝහ ගුලි නොගිලීවා **ඩයහමානො දුක්ඛමිදනති කඛිති** - දවනු ලබමින් දුක්විදිමින් හඬති යන අර්ථයි. **නත්ථිඣානනති** - ධ්‍යාන උපැදවීමට ප්‍රඥාවෙන් උත්සාහ කිරීම, **අපඤ්ඤස්ස** - දුෂ්ප්‍රාඥයාට ධ්‍යාන නොලැබේ. **පඤ්ඤා නත්ථි** අධ්‍යයනය කරන්නහුට "සමාහිතො භික්ඛු යථාභූතං ජානාති" සමාහිතවූ සිත් ඇති භික්ෂුව යථාස්වරූපය අවබෝධ කරයි. යන ස්වභවය ඇත්තේ ප්‍රඥාව නැත්මැයි **යමහි ඣානං පඤ්ඤාචාති** යම් පුද්ගලයෙකු කෙරෙහි මේ දෙකරුණුම ඇත්තේ ද හෙතෙම **නිබ්බාණස්ස සන්තිකෙ** - නිවණ සම්පයේ සිටියේය යන අර්ථයි - **සුඤ්ඤාගාරං පවිටය සඤාති** යනු කිසියම් විධිය කින් විවෘත වූ අවකාශයේ කර්මස්ථාන ගෙන කර්මස්ථාන වැඩීම සඳහා හිඳින්නා වූ අයං **සන්ත චිත්තස්ස** යනු නිවුන සිත, ඇත්තහුව සම්මා - හේතු කාරණ සහිතව ධර්මය බලන්නෙකුට **අමානුසී රති** - අෂ්ට සමාපත්ති සංඛ්‍යාත වූ ධර්මයන් උපදින්නේ ය යන අර්ථයි. **යතො යතො සම්මසති** - යනු අවතිස් අරමුණවල යෙදී සිටින්නේ ක්‍රියා කරන්නේ යම් යම් ආකාරයකින් පෙර බත

පසු බත ආදී කාලයන්හි තම තමන්ට රුචිකර වූ කර්මස්ථානයන් හි කර්මස්ථාන සිහි කරන්නේ ද, **උදයබ්බයඤාණ** පඤ්චස්ස බන්ධය පිළිබඳව ඇතිවීම හා නැතිවීම පිළිබඳ විසිපස් ලක්ෂණයන්, **පීති පාමොජ්ජං** - මෙසේ ස්බන්ධයන්ගේ ඇතිවීම හා නැතිවීම සම්මර්ශනය කරන්නේ, ධර්ම ප්‍රීතිය ධර්ම ප්‍රමෝදය ලබත්. **අමතං** යනු ප්‍රත්‍යය සහිත වූ නාම රූපයන් ප්‍රකට වීමෙන් උපදින්නා වූ ප්‍රීතිය අමෘත මහා නිර්වාණ සම්ප්‍රාප්තිය පණ්ඩිතයන් විසින් අමත යන අර්ථයෙන් දැක්වේ. **තත්‍රයාමාදී** එහි මුල් පුර්ව පියවර වේ. **ඉධ පඤ්ඤස්ස** මේ සාසනයේ නුවණැති භික්ෂුන් දැන්මේ කියන ලද දේ පුර්වාමස්ථයේ දක්වමින් **ඉන්‍ද්‍රියගුත්තති** ආදිය කිහ. සිව් පිරිසිදු ශීලයෙහි පූර්ව අවස්ථාව **ඉන්‍ද්‍රිය සංවරය** වේ. **සන්තුට්ඨි** සිව් පසයෙහි සන්තෝසය ඒ මගින් ආජීවපාරි ශුද්ධි ශීලය හා ප්‍රත්‍ය **සංනිශ්‍රිත** සීලය කියන ලදී. පාතිමොක්ඛ ප්‍රාතිමෝක්ෂය සංඛ්‍යාත වූ ජ්‍යෙෂ්ඨ ශීලය පරිපුර්ණ කළයුතු බව කියන ලදී. මිත්තෙ **භජස්සු කල්‍යාණෙ** - විෂම ක්‍රියාකාරී කම් වලයෙදෙන නුසුදුසු සහායක යන් හැර දමා, යහපත් ජීවිතය සඳහා - සුද්ධාජීවෙ - පුරුෂ ධෛර්යයෙන් යුක්තව කුසීත රහිත ජීවත්වීම සඳහා, අතන්දීතෙ - කලණ මිතුරන් සේවනය කළ යුතුය යන අර්ථයි. **පටිසඨාරා චුතසඤ්ඤනි** - ආමිස පටිසඨාර ධම්ම පටිසත්ථාර යන පටිසන්ථාරා කාර්යයන් වැඩිය යුතුයි යන අර්ථයි. **ආචාර කුසලො** - සීල ආචාර වත් පිළිවෙත් පිරීමේ ආචාර ආදී කුසල් රැස් කිරීමෙහි දක්ෂයෙකු විය යුතුය. තතො පාමොජ්ජ බහුලො - පටිසන්ථාරයන්හි යෙදුනේද, ආචාර කුසල තාවයන්හි වඩන්නවුන් විසින් ද, ධර්මප්‍රමෝද්‍යයෙන් ප්‍රමෝදයට පත්වී සියළු වටට දුකඛ සඃ අනතං **කරිඃසති** සියලු සංසාර වෘත්තයන්ගෙන් වෙන් වූ නිවන් දකි යන අර්ථයි.

මෙලෙස බුදුරජාණන් වහන්සේ විසින් දේශනාකරන ලද මෙම ගාථාවල එක් එක් ගාථා වෙන් සිව්පිළිසිඹියා පත් රහත් බවට පැමිණ අහසට නැගී ඒ සියළුම භික්ෂූන් අහසෙන් එකසිය විසි යොදුන් කාන්තාරය ඉක්මවා බුදුරදුන්ගේ රන්වන් සිරුර වර්ණනා කරමින් ස්තුතිකරමින් වැන්දාහුය.

බොහෝ භික්ෂූන්ගේ කථා පුවතයි.

25.8

"වස්සිකා විය ප්‍රජ්ඣානි " යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී පන්සියයක් භික්ෂූන් නිමිති කරගෙන දේශනා කළහ.

එම භික්ෂූහු බුදුන්වෙතින් කර්මස්ථාන ගෙන ආරණ්‍යයේ මහණ දම් රකින්නේ උදේම පිපෙන (මහෙසිකා) ඉද්දමල් සවස නටුවෙන් ගිලිහෙනු දැක තෙල මල් නටුවෙන් ගිලිහෙන්න පෙරාතුව අපි රාගාදියෙන් මිදෙන්නෙමුයි වීර්යයට පටන් ගත්හ. අධිෂ්ඨානකළහ. බුදුරදුන් මේ භික්ෂූන් බලා මහණෙනි භික්ෂුවක් නම් නටුවෙන් ගිලිහෙන මලක් සේ සසරින් මිදෙන්නට උත්සහ කළ යුතුයයි පවසා ගඳකිළියේ සිටියදීම එළියක් පතුරුවා මේ ගාථාව පැවසුහ.

සමන් වැළ මැලවුණු	- මල් බිම හෙළන අයුරින්
රා දොස දුරුරලා	- ගිලිහෙනු සසර වටයෙන්

මහණ තෙමේ ඉද්දමල් නටුවෙන් ගිලිහෙන අයුරින් රාගයද දේවිගයද මුදා හළ යුතුය. එහි **වස්සිකා** යනු මනාව පිපුණු (දෑසමන්) **මඳවානි** මැළවෙයි. මළානික වෙයි, මෙය කියන ලදී, යම්සේ ඊයේ පිපුණු දෑසමන්, දෙවන දවසේ පරණ වී මැලවී. මිදෙත් නටුවෙන් ගිලිහෙත් එසේ තෙපිද රාගාදියෙන් ද ද්වේෂාදියෙන් ද මිදෙව්.

දේශනාවසානයේ ඒ සියලු භික්ෂූහු අර්හත් ඵලයෙහි පිහිටියාහුය.

පන්සියයක් භික්ෂූන් පිළිබඳ කථා පුවතයි.

25.9

"සන්ත කායොති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩ සිටියදී සන්තකාය තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

උන්වහන්සේට අත් පා පිළිබඳව සැකයක් නම් නොවීය. අනුන් නොසිරියෙන අන්දමින් අත් පා එහා මෙහා කිරීමක් නැත. කය ප්‍රාණවත් කිරීම් රහිතය ශාන්ත වූ ආත්ම ස්වභාවයක් විය. උන්වහන්සේ සිංහ යෝනියෙන් පැමිණි කෙනෙකි. සිංහයෙක් එක් දිනක් ගොදුරු ගෙන රිදී - රන් - මැණික් - පබලු ආදී ගුහාවලින් එක්තරා ගුහාවකට පිවිස මනෝසිලා තලාවක සිරියෙල් සුණු ගොඩක දිනහතක් නිදාගෙන හත්වැනි දිනයේ නැගිට නිදාසිටි තැන බලා ඉදින් නගුට කන් අත්පා වල හෝ සෙලවීමේ වෙනසක් දැක හිරියල් කුඩු විසුරුනේ වේදැයි බලයි. මෙය සිංහ ජාතියට හෝ ගෝත්‍රයට හෝ සුදුසු නොවේයයි නැවත දින හතක් නිරාහාරව නිදා ගනී. හිරියල් කුඩු විසිරී නොනිබේ නම් මේ ඔබගේ ජාති ගෝත්‍රයට සුදුසුයයි සිටිතැනින් නික්මී සිරුර සොලවා දිශාවන් බලා තුන්වරක් සිංහනාද කර ගොදුර සඳහා පිටත්වෙති. මෙබඳු සිංහ කුලයෙන් ආ මේ භික්ෂුවගේ කාය සංවර දැක භික්ෂූහු විසින් බුදුරදුන්ට දැනුම් දුන්හ. ස්වාමීනි සන්තකාය තෙරුන් සමාන වූ භික්ෂුවක් නොදුටුවිරෑය. මුන්වහන්සේ සිටින තැන අත් පා සෙල වීමක් නැත. කය ඇඟමැලි කැඩීමක් නැත. චලනයක් නැත. මහණෙනි භික්ෂූන් විසින් සන්තකාය තෙරුන් ලෙසට කාය ආදි ඉන්ද්‍රියන්හී උපශාන්ත බවක් පැවතීම යුතුම යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

කය වචන සන්සුන්
සන්සුන් සිතැති තැන්පත්
පස්කම් සැපත් දුරලු
උපසන් මහණ සෙට වේ.

සංවරවූ කය ඇති සංයමයට පත් වචන ඇති සංයමයට පත් සිත්ඇති, මනාකොට තැන්පත්වූ පස්කම් දුරලූ (පංචකාමයේ දැමුන) භික්ෂුව ඉතා සංවරයයි කියනු ලැබේ.

එහි **සන්තකායෝ** - ප්‍රාණඝාත ආදිය නො කරන බැවින් නොමැති හෙයින් සංවරවූ. මුසාවාද ආදිය නැති බැවින් **සන්තවා චෝ** අභිධ්‍යා ආදිය නැති බැවින් **සන්තවා හිත** - කය - වචන යෙන් සංයතවූ බැවින් සුසමාහිත සිව් මගින් ලෝකාමිසය දුරුකළබැවින් **වන්ත ලොකාමිසොහිඤ්ඤු** රාගාදියෙන් තොර නිසා අභ්‍යන්තරය උපශාන්ත වූ **උපසනෙතා** යනුවෙන් කියයි.

දේශනය අවසානයේ එම තෙරුන් අර්හත්වයෙහි පිහිටියේය. පැමිණ අයටද දේශනය සාර්ථකවීය.

සන්තකාය තෙරුන් පිළිබඳ වූ කථා පුවතයි.

25.10

"අනතනා වොදයන්තානං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩසිටියදී නඬිගුලකුල තෙරුන් නිමිතිකරගෙන දේශනා කළහ.

එක් දුගී මිනිසෙක් අනුන්ගේ බැල මෙහෙවර කරමින් ජීවත්වේ. රෙදි කැබැල්ලක් ඇඳගෙන නඟුල උස්සාගෙන යන ඔහු දැක එක් භික්ෂුවක් මෙලෙස පැවසුවේය. ඔබ ඇයි මේලෙසට ජීවත් වන්නේ, කවර ප්‍රයෝජනයක්ද. පැවිදි වන්නේ නම් නොවටීද? මෙලෙස ජීවත්වන මා කවුරු නම් පැවිදිකරත්ද? ඉදින් ඔබ පැවිදි වන්නේ නම් මම පැවිදි කරවන්නෙමි ඉක්බිති ඔහු දෙවිරමට පමුණුවා සියතින් නහවා මණ්ඩපයේ තබා පැවිදිකර ඇඳසිටි රෙදිකැබැල්ල සමගම නඟුල මාලක සීමාවේ ගසක් අත්තක තැබ්බවිය ඔහු උපසම්පදා වූ විටද නංගල කුල තෙරුන්ලෙසට ප්‍රසිද්ධ විය. ඔහු බුදුන්ට ලැබෙන ලාභ සත්කාර නිසා ජීවත් වෙමින් කලකිරී කලකිරීම දුරුකරලීමට නොහැකිවන්නේ දැන් ශ්‍රද්ධා දෙය්‍ය කසාවත් අත්හැර දමා යන්නෙමියි. ගසමුලට ගොස් තමන් තමන්ටම අවවාද දුන්නේය. ලජ්ජා නැති තැනැත්ත මේ සිවුර අත්හැර නැවත කඩ රෙද්ද ඇඳගෙන බත් කොට ජීවත් වීමට ලජ්ජා නැත්ද මෙලෙසින් අවවාද දෙමින් සිත තුනී බවට පත්විය. ඔහු පසුව දින කීපයකට පසුව නැවත කළකිරී එලෙසම තමන්ට අවවාද කරගත්තේය. මෙලෙසට අවවාද කර ගැනීමෙන්ම සිත තුනී බවට පත්වූයේය. ඔහු ඒ ආකාරයෙන්ම කළකිරුණ අවස්ථාවේදී එහි ගොස් තමන්ටම අවවාද කරගනී. භික්ෂූන් වහන්සේලා එහි නිතර යනු දැක ඇවැත්නි නංගලකුල තෙරුන් වහන්ස කුමක් නිසා මෙහි එන්නේදැයි විමසුහ. ඔහු අචාර්යන් වහන්සේ වෙත යමියි පවසා දින කීපයකින් රහත්බවට පත්වූහ. භික්ෂූන් වහන්සේලා ඔහු සමග කටකම් කරන්නේ මෙලෙස කිවාහුය. ඇවැත්නි නංගල කුල ස්ථවිරතුමනි ඔබ යන මාර්ගය පාවිච්චි නොකරණ තැනක් සේ විය. අචාර්යන් වහන්සේ වෙතට නොයන්නේ යයි සිතමි. එසේය ස්වාමීනි මගේ ඇලීමක් තිබුනවිට ආවෙමි දැන් ඒ ඇලීම සිඳ දමන ලදී. එනිසා එහි නොයමියි පැවසුවේය. මෙය අසා

භික්ෂුහු මොහු අමුතු දෙයක් කියා අනෙකුත් විස්තර කරතියි බුදුරදුන්ට දැනුම්දුන්හ. එසේය මහණෙහි මගේ පුතු තමන් තමන්ටම අවවාද දී පැවිදි කාර්යයේ මස්තක ප්‍රාප්තවීයයි කියා මේ ගාථාව පැවසුහ.

තමන් පිළිබඳවම තමන් විමසිය යුතු වේ.
තමන්ගේ වැරදි ගැන ඔවදන්ද දිය යුතු වේ
එළඹ සිටි සිහියෙන් විමසන තමන් ගුණදොස්
මහණ තෙම සුවසේ යති දම් රකින්නේ වේ.

තමන් හට තමා මිස
අන් පිළිසරණ නැත්තේ
එනිසා තමන් සිත
වඩා තුන්දොර රැකිය යුතුවේ.

තෙමේ තමාට චෝදනාකරවා තමා විමසන භික්ෂුව නුඹ තෙමේම රැකුණේ සිහි ඇතුව සුවසේ වසන්නේය.

චොදයත්තානං - තමන් විසින් කරන ලද වරදට තමාම චෝදනා කර ගැනීම **පටිමාසෙථා** - **අත්තනාව** මා විසින් බණ දහම් හදාරණ ලදද, **ච** ත් පිළිවෙත් කරන ලද ද ආදී වසයෙන් තමන් විසින් තමාටම විමසීම **සො** හෙතෙම භික්ෂුව මෙසේ ඇති කල්හි තමන්ම ගෝපනය කිරීම - **අත්ත ගු තෙනා** එළඹී සිහියෙන් යුත්තවීම - **සතිමා** සියළු ඉරියව්හී සුවසේ වෙසෙන්නෙමි යන අර්ථයි. **නාරොා** අවශ්‍ය තාවයන්හි පිහිටීම, **අත්තානි අත්තනො ගති** - යම් හෙයකින් අනුන්ගේ ආත්මභාවයෙහි පිහිටා කුසල් කොට ස්වර්ග පරායණ වූ මාර්ගය වඩා සාර්ථක ප්‍රතිඵල ලබන්නට නොහැකි වූවහු කෙසේ නම් අනුන්ට පිහිට වේද යන අර්ථයි. **නසමා** එහෙයින් තමා මැ තමාටම සරණය වී, **භද්‍රං** ආජානීය අශ්වයකු නිසා ලාභය පතන්නා වූ **වාණිජෝ** - වෙළෙන්දකු ඔහුගේ විසමාචාරය දැක පසුදිනක තුන්වරක් නාවා ආහාර පාන වලින් තෙමේම පිළිදැගුම් කරයි. මෙසේ ඔබ ද නුපන් අකුසලයාගේ උපැත්ම නැවැත්වීම සඳහා සිහියෙහි පිහිටා උසස් අකුසල් දුරු කරන්නේ තමන්ගේ සංයමය සංවරය ආරක්ෂා කරව ! මෙසේ පවත්නා කල්හි

454

ප්‍රථමධ්‍යාන ආදිය උපදවා ලෞකික ලොකෝත්තර අධිගම විශේෂත්වයට පැමිණෙන්නේය. යන අර්ථයි.

දේශනාව අවසානයේ බොහෝ දෙනා සෝවාන් ආදී මාර්ග ඵල වලට පැමිණියාහුය.

නඬිගුල කුල තෙරුන් ගේ කථා පුවතයි.

25.11

"**පාමොජ්ජ බහුලො**" යන මේ ධර්ම දේශනය බුදුන් දෙවිරම වැඩසිටියදී වක්කලී තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

ඔහු සැවැත් නුවර බ්‍රාහ්මණ කුලයක ඉපිද වයසට ගියේ පිඬුපිණිස පිවිසි තථාගතයන් වහන්සේ දැක බුදුන්ගේ ශරීර සම්පත්තිය බලා ශරීර සම්පත්ති දර්ශනයෙන් සෑහීමට පත්නොවී මට නිතර බුදුන් දකින්නට ලැබෙන්නේ නම් යහපතැයි සිතා බුදුන් වෙත පැවිදිවී යම් තැනක සිට දසබලයන් වහන්සේ බලන්නට හැකිද එතැනට වී සජ්ඣායනය කම්මට්ඨාන මනසිකාර ආදීන් දුරුකොට බුදුන් දෙස බලමින්ම හැසිරුනේය. බුදුහු ඔහුගේ නුවණ මුනුකුරා යනතුරු කිසිවක් නොකියා දැන් ඔහුගේ නුවණ මුනුකුරා ගියේ යයි දැන "වක්කලී ඔබට මේ කුණු සිරුරින් කවර ප්‍රයෝජනයක්ද? වක්කලී යමෙක් ධර්මය දකීද ඔහු මා දකියයි පවසා අවවාද කළේය. ඔහුට මෙලෙස අවවාද කලද බුදුන්ගේ රුව බලාසිටීම හැර වෙනත් නැනකට යාමට නො හැකිවිය. අනතුරුව බුදුරජාණන් වහන්සේ මෙම භික්ෂුව සංවේගයට පත් නොවී අවබෝධ කරනොගන්නේයයි එස් එළඹීමට ආසන්නයේදී රජගහ නුවරට ගොස් එස් සමාදන් වන දිනයේදී" වක්කලී පහව යව් වක්කලී ඉවත්ව යන්න යනුවෙන් බැහැර කළේය. බුදුහු මා හා කථා නොකරයි. තෙමසක් බුදුන් හමුවේ සිටීමට නොහැකිව මගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක්ද? පර්වතයෙන් පැන දිවිතොර කර ගනිමියි ගිජඣකූට පර්වතයට නැංගේය. බුදුහු ඔහුගේ සිත් විඩාව දැන මෙම භික්ෂුට මා වෙතින් ආශ්වාසයක් නොලබන්නේ මාර්ගඵලයන් ඉපදවීමට හේතු සම්පත් නසාගන්නේ යයි තමන් දැක්වීමට ආලෝකයක් මුදාහලේය. අනතුරුව බුදුරජාණන් වහන්සේ දුටුතැන් සිට මහත් ශෝකය දුරුකලේය. බුදුහු වියලි වැවක් සැඩ දිය පහරකින් පුරවන්නාසේ තෙරුන්ගේ බලවත් ප්‍රීති ප්‍රමෝදය උපදවනු සඳහා මෙම ගාථාව දේශනාකළහ.

පැහැදෙමින් බුදු සසුනේ
පැවිදිව සකරදම් සිඳ
නිවන පිරිසඳ දැන
උතුම් සැපයට මහණ පත් වේ.

බුදුසසුනේ පැහැදුන බුදුරදුන් කෙරෙහි බලවත් සතුට බහුල කොට ඇති භික්ෂුව, සංස්කාර ධර්මයන් සන්සිඳුවන්නාවූ, සැපය වූ

එහි අර්ථය. ප්‍රකෘතියෙන්ම ප්‍රමොදය බහුල භික්ෂුව බුදු සසුනේ ප්‍රසාදය වඩයි. හෙතෙම මෙසේ **පසන්නෝ බුද්ධ සාසනෙ සන්තං පදං** සංඛාරූපසමං සුඛං නිවන ලබයි. **අධිගච්ඡෙය්‍යාති** මේ ගාථාව වදාරා ශාස්තෘන් වහන්සේ අතදිග හැර

1. "චක්කලී එන්න බියනොවන්න තථාගතයන් වහන්සේ ඔබ බලා සිටී. මඩේ එරුණ ඇතෙකු එයින් ගොඩ ගන්නා ලෙස මම ඔබව උඩට ඔසවා තබන්නෙමි.
2. එන්න චක්කලී බිය නොවන්න. රාහු විසින් අල්ලාගත් සූර්ය දිව්‍ය පුත්‍රයා රාහුගෙන් ගලවා ගත්තාක් මෙන් මම ඔබව (සසරින්) ගලවාලන්නෙමි.
3. එන්න චක්කලී බිය නොවන්න රාහු විසින් අල්ලා ගන්නා ලද චන්ද්‍ර දිව්‍යපුත්‍රයා රාහුගෙන් ගලවා ගත්තාක් මෙන් මම ඔබව (සසරින්) ගලවා ගන්නෙමි.

මෙම ගාථා පැවසුහ. දසබලයන් වහන්සේ මා දන්නා ලදී එන්න යැයි මට ආමන්ත්‍රණය කරයි. මේලෙසට බලවත් චිත්ත ප්‍රීතිය උපදවා කොහි යන්නේදැයි ගමන් මග බලන්නේ නො දැක බුදුන් ඉදිරියේ අහසේ පැන පළමුපාදය පර්වතය මත තිබියදීම බුදුන් පැවසූ ගාථා විමසා බලා අහසේ සිටියදීම ප්‍රීතිය විසුරුවා යටපත්කොට සිව්පිළි සිඹියා රහත්බවට පත්ව බුදුන්ට වැදගෙනම බැස බුදුන්ලඟ සිටියේය. ශ්‍රද්ධාවන්ත පුද්ගලයන් අතුරෙන් අග්‍රස්ථානයට පත් කරණලදී.

චක්කලී තෙරුන්ගේ කථා පුවතයි.

25.12

"යො හවෙනි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ පූර්වාරාමයේ වැඩ සිටියදී සුමණ සාමණේරයන් නිමිති කරගෙන මෙම දේශනාව කළහ. මේ එහි අනුපිළිලෙල කථාවයි.

පුදුමුත්තර බුද්ධ කාලයේදී එක් කුල පුත්‍රයෙක් ශාස්තෘන් වහන්සේ සිව්පිරිස මැද එක් භික්ෂුවක් දිවැස් ඇත්තවුන් අතර අග්‍රස්ථානයේ තබනු දැක එම සම්පත්තිය තනතුර ප්‍රාර්ථනා කරමින් ආරාධනාකර දින හතක් බුද්ධප්‍රමුඛ මහා සංඝයාට මහදන් දී ස්වාමීනි මම ද මතු එක් බුද්ධ ශාසනයක දිවැස් ඇත්තවුන් අතර අග්‍රවෙමියි ප්‍රාර්ථනා තැබීය. බුදුහු කල්ප ලක්ෂයක් බලා ඔහුගේ ප්‍රාර්ථනය සමෘද්ධියට පත්වන අයුරු දැක මෙයින් කල්ප ලක්ෂයකට පසුව ගෞතම බුද්ධ ශාසනයෙහි දිවැස් ඇත්තවුන් අතර අග්‍රවූ අනුරුද්ධ නම් තෙරනම වන්නේයයි විවරණ දුන්හ. ඔහු එම විවරණය අසා හෙට සිදුවන දෙයක් ලෙස එම සම්පත පතන්නේ බුදුන් පිරිනිවන් පෑ පසු දිබ්බවක්බු පරිකර්මය විමසා යොදුන් හතක් රන් ථූපය වටකොට නොයෙක් පහන් ගස් දහසක් කරවා පහන් පූජාකොට ඉන් චුතවුයේ දෙව්ලොව ඉපදී දෙව් මිනිසුන් අතර කල්ප ලක්ෂයක් සැරිසරා මේ කල්පයෙහි බරණැස දිළිඳු කුළයක ඉපිද සුමන සිටුවරයා නිසා ඔහුගේ නණ කොල ගෙනෙන්නා ලෙසට ජීවිතය ගතකළේය. හේ අන්න හාර තිස්ස නමින් හැඳින්වීය. සුමණ සිටුවරයාද නිතර එම නගරයේ මහදන් දෙයි. මේ අතර දිනක් උපරිටය් නම් පසේ බුදු රජාණන් වහන්සේ ගන්ධමාදන පර්වතයේ නිරෝධ සමාපත්තියෙන් නැගිට - කාටනම් අනුග්‍රහ කරම්නෙම් දැයි සිතා අද ම විසින් අන්නහාර ට (ආහාර ගෙනෙන්නාට) අනුග්‍රහ කිරීම වටියයි දැන් ඔහු කැලයෙන් තණ අරගෙන ගෙට යන්නේයයි දැන පා සිවුරු ගෙන ඍද්ධියෙන් වැඩම කොට අන්නහාර ගේ (ආහාර ගෙනෙන්නා ගේ) ඉදිරියේ පෙනී සිටියහ. අන්නහාරා ඒ හිස් පාත්‍රය අතේ තිබෙනු දැක ස්වාමීනි ආහාර ලැබුවේදැයි විමසා ලබන්නේය මහපිණකිය, පැවසුවිට එසේනම් ස්වාමීනි ටිකවේලාවක් වැඩසිටින්න තණ කොලද විසිකර වේගයෙන් ගෙට ගොස් සොඳුරිය මට තබන ලද ආහාර භාගය නිබේදයි විමසා ස්වාමීනි ඇතැයි පැවසුවිට වේගයෙන් ආපසු ගොස් පසේ බුදුරජාණන් වහන්සේගේ පාත්‍රය

ගෙන මට දෙන්න කැමැත්ත ඇතිවිට දියයුතු දෙයක් නො ලබමි. දියයුතු දෙත් ඇතිවිට ප්‍රතිග්‍රාහකයෙක් නො ලබමි. අද ප්‍රතිග්‍රාහකයෙක් දකින ලදි. දන් දීමටද දෙයක් ඇත. මට ලාභයකි. ගෙට ගොස් බත් පාත්‍රයට දමා ගෙන අවුත් පසේ බුදුරදුන්ගේ අතේ තබා මේ දානයේ අනුභසින් මට දිළිඳු බව නොවේවා නැත යන වචනය අසන්නට භවයක් පාසා ඇතිනොවේවා ස්වාමීනි මෙබඳු දුක් ජීවිතයෙන් මිදෙන්නේය නැත යන වචනයද අසන්නට නොලැවේවායි ප්‍රාර්ථනා තැබීය. පසේ බුදුන් වහන්සේ එසේම වේවායි මහා පිනැත්නැයි පවසා අනුමෝදනාකර වැඩමකළහ. සුමන සිටුවරයාගේ ඡත්‍රයට අධිපති දෙවියාද උපරිටිය පසේ බුදුන්ට අන්ත භාර දුන් දානය ඉතාඅගි යයි කියා තෙවරක් සාධුකාර දුන්නේය. ඉක්බිති සිටුවරයා ද. කිම මා මෙතෙක් කල් දන් දුන්නත් එය ඔබ නො දක්කේද? මම ඔබගේ දානය සඳහා සාධුකාර නොදුනෙමි. අන්න භාර වනාහි උපරිටය පසේබුදුන්ට දුන් පිණ්ඩපාතය පිළිබඳව පැහැදී ම විසින් සාධුකාර පැවැත්වුවෙමි. ඔහු ආශ්චර්යකි මෙපමණ කලක් මා දන් දෙන්නේ දෙවියන්ගේ සාධුකාර ලබන්නට නොලැබුනි. අන්නහාර - වනාහි ජීවත්වන්නේ එකම පිණ්ඩපාත දානයෙන් සාධුකාර ලැබීය. ඔහුගේ පින්ඩපාත දානයෙහි ඔහු නුසුදුස්සෙක් කොට එම පිණ්ඩ දානයේ කුශලය මා සන්තක දෙයක් කරන්නෙමියි සිතා ඔහු කෑදවා අද ඔබ කිසිවෙකුට යමක් දුන්නේදැයි විමසුවේය. එසේය ස්වාමීනි මම අද උපරිටය පසේ බුදුරදුන්ට මගේ බත් කොටස දන් දුන්නෙමි. එම්බල නුඹ මගේ කහවනු ගෙන එම පිණ්ඩපාතය මට දෙන්න ස්වාමීනි නො දෙමි. ඔහු ගණන කහවනු දහස දක්වා වර්ධනය කළේය. අන්නහාර කහවනු දහසකටද නොදුන්නේය. අනතුරුව පින්වත එසේ වේවා මට පිණ්ඩපාතය නොදෙන්නේ නම් දහසක් ගෙන පිණමට දෙන්නැයි පැවසුවේය. ඔහු ආර්යන් සමග කථා කරගෙන දැනගන්නෙමියි. කියන්නේ පසේ බුදුරදුන් වෙත එළඹ ස්වාමීනි සුමන සිටුවරයා දහසක් දී ඔබවහන්සේට දෙන ලද දානයේ පින ඉල්ලාසිටී. කුමක් කරන්නදැයි විමසුවේය. අනතුරුව ඔහු උපමාවක් ගෙන හැර දක්වුහ. නුවණැත්ත යම්සේ පිංකැමති කෙනෙක් තමාගේ නිවසක පහනක් දැල්වමින් අනෙක් අය මේ පහනින් වැටියක් නෙමා දැල්වාගන්නැයි පළමු පහනේ ප්‍රභාව ඇත්ද? ස්වාමීනි අතිරෙක ප්‍රභාවක් ඇතිවේ. එමෙන්ම පින්වත බත් හැන්දක් කෑද හැන්දක් දන් දී තමන්ගේ පිණ්ඩපාත දානයක පිං දීමෙන් තමන්ගේ පින

වැඩේමයි. ඔබ තනිවම. පිණ්ඩ පාතය දුන්නේය. එහි පිං සිටුවරයාට දීමෙන් පිණ්ඩපාත දාන දෙකක් වේ. එකක් ඔබට අනෙක ඒ සිටුවරයාට ඔහු යහපති ස්වාමීනියි කියා වැඳ සිටුවරයා ලඟට ගොස් ස්වාමීනි, පින් ගන්න. යැයි කීවේය. එසේ නම් මම ශ්‍රද්ධාවෙන් ඔබට පිංදෙමි. ඔබ ශ්‍රද්ධාවෙන් දෙයි මම ද ඔබගේ ගුණයට පූජා කරමි. දරුව ගන්න මෙයින් පසුව සියතින් කර්ම නොකරන්න. වීථියේ ගෙයක් තනා වසන්න. ඔබට යම් උවමනාවක් වී නම් සියල්ල මගෙන් ලබාගන්න. නිරෝධ සමාපත්තියෙන් නැගී සිටි උතුමෙකුට දෙන ලද පිණ්ඩපාත දානය එදිනම විපාක දෙයි. එනිසා රජු ද මේ පුවත අසා අන්නභාර කැඳවා පිං ලබාගෙන මහත් භෝග සම්පත් දී ඔහුට සිටු තනතුරක් පිරිනැමුවේය. ඔහු සුමන සිටුවරයාගේ සහායකවී දිවි ඇතිතෙක් පිංකර ඉන් චුතවූයේ දෙව්ලොව පහලවී දෙව් මිනිසුන් අතර සැරිසරන්නේ මෙම බුදෙඩාත්පාද කාලයේ කපිල වස්තු නගරයේ අමිතෝදන ශාක්‍යයාගේ ගෙදර පිළිසිඳගෙන අනුරුද්ධ නමින් ප්‍රසිද්ධ විය. ඔහු මහානාම ශාක්‍යයාගේ කණිටු සොහොයුරා විය. බුදුරදුන්ගේ සුළුපියාගේ පුත් මේ කුමරු ඉතා සිවුමැලි මහා පිංවත් කෙනෙක් වූයේය. එක් දිනක් ක්ෂත්‍රියන් හයදෙනා අතර කැවුම් ඉලක්ක කර පන්දු ක්‍රීඩා කරන්නේ අනුරුද්ධ කුමරු පැරදුනි. කැවුම් ගෙන ඒමට මවවෙත යැවුනි. ඇය මහත් රන්තලියක් පුරවා කැවුම් යැවීය. කැවුම් කා නැවත ක්‍රීඩා කරන්නේ පැරදුනේ නැවත යැවීය. මෙ ලෙසට තෙවරක් කැවුම් ගෙන ආපසු හතර වැනි වාරයේදී මව දැන් කැවුම් නැතැයි කියා යැවුවාය. ඇගේ වචනය අසා නැත යන පදය නො ඇසුනිසා - නැති කැවුම් යන නම යොදා යන්න නැති කැවුම් රැගෙන එන්නැයි යැවීය. අනතුරුව මෑණියෝ නැති කැවුම් දෙන්නැයි ඉල්ලා සිටිවිට මගේ පුතු නැත යන වචනය නොදන්නා නොඇසු නිසා නැත යන්න කෙසේ දැනුවත් කරන්නේ දැයි රන්බදුන සෝදා වෙනත් රන්බදුනකින් වසා දරුව මෙය මගේ පුතුට දෙන්නැයි යැවීවාය. එකෙනෙහි නගරයට අධිගෘහීත දෙවිදුවක් අපේ ස්වාමියා විසින් "අන්නභාර" කාලයේදී උපරිටය පසේ බුදුරදුන්ට බත් ..... දන් දී නැත යන පදය අසන්නට නොලැබේවායි ප්‍රාර්ථනයක් තැබුවේය. ඉදින් අපි එමකරුණ දැනගෙනම පමුණුවන්නේනම් මගේ සිත සත් කඩකඩ පැලෙන්නේ යයි සිතා දිව්‍ය කැවුම් වලින් භාජනය පුරවා ලුහ. ඒ සේවක පුරුෂය භාජනය ගෙන ඔහුගේ ලඟ තබා විවෘතකළේය. එහි සුවඳ නගරය පුරා පැතිරුනි. කැවුම් කටේ තැබූ

පමණින්ම දහසක් දහසක් රසනහර පැතිරී සිටියේය. අනුරුද්ධ කුමරුද සිතුවේය. මම මෙයට පෙර මෑනියන්ට ප්‍රීය වුයේ යයි නොසිතමි. අනෙක් දිනවලදී නැති කැවුම් නොසාදන ලදී. ඔහු ගොස් මවට මෙසේ කීවේය මෑණියනි ඔබ මට ප්‍රිය නොවේ. දරුව කුමක් කියන්නේද මගේ දෑසට වඩා මගේ හදවත් වාශයට වඩා ඔබ මට ප්‍රිය වේ. මෑණියෙනි මට එතරම් ප්‍රියනම් කුමක් හෙයින් මට මෙයට පෙර නැතිකැවුම් නොසෑදුවේද? නොදුන්නේද? ඇය සේවක පුරුෂයාගෙන් විමසුවාය. දරුව භාජනයේ කිසිවක් තිබුනේද? ආර්යාවනි එසේය කැවුම් භාජනය පිරිතිබුනි. එබඳු කැවුම් මම මෙයට පෙර දැක නැත ඇය මෙසේ සිතුවාය මගේ පුතු පිංකළ කෙනෙකි. දේවතාවෝ දිව්‍යමය කැවුම් තබන්නට ඇත. දරුවාද මවට කීවේය. මෑනියනි මෙයට පෙර මෙබඳු කැවුම් කා නැත. මෙතැන් පටන් මට නැතිකැවුම්ම එවන්න. ඇය එතැන් පටන් එම කැවුම් කෑමට කැමති බව දැන්වුවිට රන්බඳුන සෝදා අනෙක් බඳුනක් යටිකුරුකර වසා තබයි දෙවියෝ පාත්‍රය පුරවති. මෙලෙසම ඔහු ගිහිගෙයි සිටියදී නැත යන පදයේ අර්ථයද නොදන දිව්‍ය කැවුම්ම අනුභව කලේය. බුදුරුදුන් පිරිවර සඳහා ිකුල පිළිවෙළින් ශාක්‍ය කුමාරවරුන් පැවිදි කරද්දි මහානාම ශාක්‍යයා දරුව අපේ කුල ගෙයින් කිසිවෙක් පැවිදි නොවිය. ඔබ හෝ පැවිදිවිය යුතුය. ම විසින් පැවිදි විය යුතුය ඔහු මෙසේ කීවේය. මම සුකුමාලය පැවිදිවීමට නොහැකිය.

එසේනම් කර්මාන්තයක් ඉගෙන ගන්න මම පැවිදි වන්නෙමි. මොන කර්මාන්තයක්ද? ඔහු බත් උපදින ස්ථානය ද නොදනී කර්මාන්තයන් නම් කුමක්දයි නොදනී. එනිසා මෙලෙස කීවේය. එක් දිනක් අනුරුද්ධ - භද්දිය - කිම්බිල - තිදෙනා බත් කොතැනින් ඇතිවේදයි කථාකළහ. ඔවුන් ආහාර කොටුවෙන් උපදියයි පැවසුවේය. ඔහු එක් දිනක් කොටුවෙන් වී දමනු දුටුවේය. එනිසා කොටුවෙන් ඇතැයියයි සිතුවේය. අනතුරුව භද්ධිය කුමරු ඔබ නොදන්නේයයි පවසා බත් - සැළියෙන් ඇතිවේයයි කීවේය. ඔහු දිනක් සැළියෙන් බත් ගන්නවා දැක මෙසේ පැවසුවේය. අනුරුද්ධ කුමරු තොප දෙදෙනාම නොදනී කියා රියනක් උස කැකුළක් ඇති මහා රන් බඳු නෙක බත් උපදියයි කීවේය. ඔහු වී කෙටීමක් හෝ බත් ඉවීමක් දැක නැත. රන් බඳුනේ පුරවා තබන ලද බත් දුටුවේය. මේ නිසා රන් බඳුනෙන්ම බත් උපදියයි ඔවුන්ගේ හැඟීමක් විය. එනිසා මෙසේ පැවසුවේය. මේ නිසා බත්

උපදින ස්ථානය හෝ නොදන්නේ මහ පිනැතැනි කුල පුත් කර්මාන්ත කුමක් දනිද ඔහු මෙහි එන්න අනුරුද්ධ ගිහිගෙය විසීම ඔබට කියාදෙමි. පළමුව කුඹුර බිම් හැනීම් යුතුය ආදී වශයෙන් සහෝදරවරු කරණ කර්මාන්තවල කෙළවරක් නොමැතිබව අසා මට ගිහිගෙයි විසීමෙන් ප්‍රයෝජනයක් නැත. මවගෙන් අසා භද්දිය ප්‍රධාන ශාක්‍ය කුමාරවරුන් සමග නික්මී අනුපිය අඹ වනයේ බුදුන් වෙත එළඹ පැවිදි වුහ. පැවිදිවී මනාලෙස මහා ප්‍රතිපදාවේ නියැලුනේ පිළිවෙලින් ත්‍රිවිද්‍යා ලබා සම්මා පටි පදාවට පිළිපන්නේ දිවැසින් එක අසුනේ සිටියදීම අත්තලයේ තැබූ නෙල්ලි ගෙඩියක් සේ දහසක් ලෝක ධාතුව බැලීමේ සමත්කම ඇතිවී.

පෙරවිසූ කඳ පිළිවෙළදනිමි දිවැස පිරිසිදු කරණ ලදි. ත්‍රිවිද්‍යා ඍද්ධියට පත්වුවෙමි. (බුද්ධ ශාසනයේ ප්‍රයෝජන ලදිමි) මේ උදානය පවසා කවර නම් කුශලයක් කොට මේ සම්පත ලැබුවේදැයි බලන්නේ පියුමතුරා බුද්ධ පාද මූලයේදී ප්‍රාර්ථනයක් තැබුවේයයි. දැන නැවත සසර සැරිසරන්නේ අසවල් කාලයේදී බරණැස සුමන සිටුවරයාැ නිසා ජීවත් වන්නේ "අන්නභාර නම්" වුයේ යයි දැන

එක් සමයක මම බරණැස් නුවර කදින් බර ගෙනයන අන්නභාර නම් දිළින්දෙක්වීමි. උපරිටය පසේ බුදුන්ට පිණ්ඩදානයක් මම දුන්නෙමි.

අනතුරුව ඔහුට මේ අදහසවිය. එදින මම උපරිටය පසේ බුදුන්ට දෙන ලද පිණ්ඩදානය නිසා කහවණු ගෙන පින් ලබාගත් මගේ මිත්‍ර සුමන සිටුවරයා දැන් කොහේදැයි උපන් තැන විමසා බැලීය. වින්ධ්‍යා කැලයේ පර්වත ප්‍රාන්තයේ මුණ්ඩ නම් නියම් ගමක් ඇත. එහි මහාමුණ්ඩ නම් උපාසක මහා සුමන චුල්ල සුමන නම් පුතුන් දෙදෙනෙකි. සුමන සිටුවරයා චුල්ල සුමන නමින් ඉපදුන බව දුටුවේය. දැකද මෙසේ සිතුවේය. මා එහි ගියවිට උපකාරයක් වේදැයි සොයා බලන්නේ මෙය දුටුවේය. මම එහි ගිය විට අවුරුදු හතක්වු චුල්ල සුමන නික්මී පැවිදි වන්නේය. හිස කෙස් කපද්දීම රහත් වන්නේය. වස් කාලය එළඹි විට ගොස් ගම් දොරම බැස්සේය. මහා මුණ්ඩ උපාසක පෙරදී තෙරුන්ගේ විශ්වාස වන්තයෙක්ව සිටියේය. ඔහු තෙරුන් පිඬු සිඟා යාමට සිවුර පොරවන අතර එය දැක මහා සුමන පූතුට

මෙසේ කිවේය. දරුව මගේ අනුරුද්ධ ආර්යයන් වහන්සේ වැඩමකළෝය. වෙනත් කෙනෙක් පාත්‍රය ගැනීමට පෙර පාත්‍රය ගන්න. මම අසුනක් පනවන්නෙමි. ඔහු එලෙස කලේය. උපාසක තෙමේ තෙරුන්ට ඇතුලත අසුනක් පනවා හොඳින් දන්වළඳවා තුන් මසක් වාසය කිරීම සඳහා ප්‍රතිඥාවක් ගත්තේය. තෙරුන් ඉවසුහ. මෙලෙසට තුන්මසක් පිළිදැගුම් කොට මහා පවාරණය සඳහා තුන් සිවුරු තෙල් පහන් ආදියද ගෙනවුත් තෙරුන් පාමුල තබා මේවා පිළිගන්නැයි පැවසුවේය. ප්‍රයෝජනයක් නැත උපාසක මෙයින් මට ප්‍රයෝජනයක් නැත. පිළිගන්නේ නැත්තේ කුමක් නිසාද, උපාසකයා මා ලඟ කැපකරු සාමණේර නමක්ද නැත. එසේ නම් ස්වාමීනි මගේ පුත් මහා සුමන සාමණේර වන්නේය. නැත උපාසික මට මහා සුමන ගෙන් වැඩක් නැත. එසේ නම් ස්වාමීනි චුල්ල සුමන පැවිදි කරන්නැයි පැවසීය. තෙරුන් යහපතැයි පිළිගෙන චුල්ල සුමන පැවිදි කළහ. ඔහු කෙස් කපද්දීම රහත් වුහ. තෙරුන් වහන්සේ ඔහු සමග අඩමසක් පමණ එහි වාසය කර බුදුන් දකින්නෙමුයි ඔහු ගේ ඥාතීන්ගෙන් විමසා අහසින් ගොස් හිමවත් පෙදෙසේ දී ආරණ්‍ය යේ කුටියකට බැසගත්හ. තෙරුන් වහන්සේ ප්‍රකෘතියෙන්ම පටන්ගත් වීර්ය ඇත්තෙකි. මෙහිදී රාත්‍රි දෙකක් සක්මන් කරණ විට උදර වාතයක් ඇතිවිය. අනතුරුව කලාන්ත ස්වරූපයක් දක සාමණේර නම විමසුහ. ස්වාමීනි කුමක්ද වේදනා සහිතද මට උදරා බාධයක් ඇති විය. වෙනත් දිනවලදී ද මෙය ඇතිවන්නේද ස්වාමීනි. එසේය ඇවැත්නි. කුමක් වැළඳීම සඳහා සුදුසුද? ස්වාමීනි, අනෝතත්ත විලෙන් ජලය ලබන්නේනම් සුවපත් වේ. එසේනම් ස්වාමීනි රැගෙන එන්නෙමි. සාමණේරය ඔබට හැකිද එසේ ස්වාමීනි, එසේය ස්වාමීනි, එසේ නම් අනොතත්ත විලේ පන්නක නම් නාග රාජයෙක් ඇත. ඔහු මා දනී ඔහුට කියා බෙහෙත් සඳහා එක් පැන් කළයක් ගෙන එන්න, ඔහු යහපතැයි උපාධ්‍යාය තෙරුන්ට වැද අහසට පැන නැගී යොදුන් පන්සියයක් දුර ස්ථානයට වැඩම කළේය. මේ දවසේදී නා රජු නාග නාටකයන් පිරිවරා ජල ක්‍රීඩා කිරීමට කැමැත්තෙන් සිටියේය. මෙම සාමණේරයන් ඒන්නා වූ දැක කිපුනි. මේ මුඩු ශ්‍රමණයා තමන්ගේ පා වල පස් මගේ සිරුර මත දමමින් හැසිරේ අනෝතත්ත විලේ ජලය පානය කිරීමට ආවා වියා හැකිය දැන් මොහුට පැන් නොදෙමි. පනස් යොදුනක් පැතිරුන අනෝතත්ත විල මහා සැලියකින් වසන්නා සේ පෙනයෙන් වසා වැතිරුනේය. සාමණේරයන්

නාග රාජයාගේ ස්වරූපය බලා කිපුනේ යයි දැන මේ ගාථාව පැවසුවේය.

"සුනොහි මෙ නාගරාජ - උග්ගතේජ මහබ්බල
දෙහි මෙ පාණීය සටං - හෙසජ්ජ තුම්හි ආගතො"

නාග රාජය අසන්න ඔබ මහාබල උග්‍රතේජස් ඇත්තෙකි බෙහෙත් සඳහා පැන් ගෙනයාමට ආවෙමි මට පැන් කළයක් දෙන්න.

මෙය අසා නා රජු මේ ගාථාව පැවසුවේය.
පෙර දිග ගංගානම් මහනදියක් ඇත මහ සමුදරට වැටෙන එම නදියෙන් ජලය ගන්න. මෙය ඇසු සාමනේරයන් වහන්සේ මේ නාගයා කැමැත්තෙන් ජලය නොදෙයි මම බලහත්කාරයෙන් මිනිස් බල පෙන්වා මොහු මැඩ පවත්වා ජලය ගන්නෙමියි සිතා මහරජ මගේ උපාධ්‍යාය තුමා මට අනෝතත්ත විලෙන් ජලය ගෙන එන ලෙසට පැවසුහ. එනිසා මම මෙයින්ම පැන් ගෙන එන්නෙමියි, ඔබට මහා කායික බලයක් ඇත. එහෙයින් අයින් වෙන්න. මාව නොවලක් වන්නැයි කියා මේ ගාථාව පැවසුහ.

නාගරාජයා මෙසේ පැවසුවේය,
සාමණේරය ඔබට පෞරුෂයක් වික්‍රමයක් තිබේනම් ඔබේ වචනයට සතුටු වෙමි. හැකිනම් මා කෝප කරගෙන ජලය ගන්න යයි පැවසුවේය.

අනතුරුව සාමණේර එසේය මහ නාගරාජය මම ගනිමියි පවසා හොඳයි හොඳින් දැනගන්න තුන්වතාවක් ප්‍රතිඥා ගෙන බුද්ධ ශාසනයේ ආනුභාවය පෙන්වා ම විසින් ජලය ගෙන යා යුතු යයි සිතා ආකාශසර දෙවියන් වෙතට ගියේය. ඔවුන් පැමිණ වැඳ ස්වාමීනි කුමක්ද විමසා සිටියහ. මේ අනෝතත්ත විල පිට පන්නක නාග රාජයා සමග මගේ සටනක් ඇත. එහි ගොස් ජය පරාජය බලන්නැයි පැවසුහ. සාමණේරයන් වහන්සේ මේ අයුරින් සතර වරම් ලෝපාලක දෙවියන් ශක්‍රදේවිය සුයාම සන්තුසිත දෙවියන් පරනිම්මිත දෙවියන් වෙතටද එළඹ මේ කරුණ දැනුම් දුන්නේය. අනතුරුව පිළිවෙළින් බඹලොව දක්වා ගොස් බඹලොවින් පැමිණ වැඳ සිටි

විට ස්වාමීනි කුමක් දැයි විමසා සිටියේ මෙම කාරණය දැනුම් දුන්නේය. මේ ලෙසට අසඤ්ඤ අරූපී බ්‍රහ්මයන් හැර සියළු තැන මොහොතින් ඇවිද දැනුම් දුන්නේය. උන්වහන්සේගේ වචනය අසා සියළුම දෙවියෝ අනෝතත්ත විල් තෙර නළයකට දමන ලද තුඹසුණ මෙන් මුළු අහස පුරා රැස් වුහ. දෙවියන් රැස්වූ විට සාමණේරයන් අහසේ සිට නාරජුට මෙසේ පැවසුහ. "උග්‍ර තේජස් ඇති නා රජුනි, බෙහෙතක් සඳහා පැන් ගෙන යන්නට ආමි. එබැවින් පැන් ගැනීමට ඉඩ දෙව"

අනතුරුව නාගයා මෙසේ කීවේය.
ඔබගේ වචනයට මම සතුටු වෙමි. ඔබට යම්කිසි වික්‍රමයක් ඇත්නම් මා අකමැත්තෙන් පැන් ගෙන යව"

උන්වහන්සේ තෙවරක් නාරජුගෙන් ප්‍රතිඥා ගෙන අහසේ සිටියදීම දොළොස් යොදුන් බ්‍රහ්ම ආත්ම භාවයක් මවාගෙන අහසෙන් බැස නා රජුගේ පෙනය පාගා මුහුණ යටට යන සේ පෙළීය. අමුසමක්සේ නාරජුගේ පෙනය ඇකිලී හැන්දක් පමණට පෙණය පත්විය. නා රජුගේ පෙනය ගිලුන ගිලුන නැන්වලින් තල් කඳක් පමණ ජලයධාරා උඩට නැගුනි. සාමණෙර යන් වහන්සේ අහසේ සිටම පැන් බඳුන පිරවීය. දේවතා සමූහය සාධුකාර දුන්හ. අනතුරුව නාගයා ලැජ්ජාවී සාමණේරයන්ට කිපුනි. බඳුවද මලක්සේ ඇස් රතු පැහැවුහ. මෙතෙම දෙවියන් රැස්කර පෙනය මතුපිට සිට මා ලජ්ජාවට පත් කළේය. මොහු ගෙන කටට අත දමා හෘදය මාංශ පාදයෙන් අල්ලා ගෙන ගඟිං එතරට විසි කරමියි සිතා වේගයෙන් ගොස් ලුහුබඳින්නේ වුවද පැමිණිමට නොහැකිවිය. සාමණේරයන් වහන්සේ ගොස් උපාධ්‍යායන් වහන්සේ ගේ අත ජලභාජනය තබා ස්වාමීනි පානය කරන්නැයි පැවසුවේය. නා රජුද පසු පසින් පැමිණ ස්වාමීනි අනුරුද්ධ මේ සුමන සාමණේර මම නොදීම ජලය ගෙන ආවේය. නො බොන්නැයි කීවේය. සාමණේර මෙය සැබෑද ස්වාමීනි පානයකරන්න. මොහු විසින් දෙන ලද පැන් ගෙන ආමි තෙරුණුවෝ රහත්වූ සාමණේරයන්ට බොරුකිමක් නැතැයි දැන ජලය පානය කළහ. එකෙනෙහි උදරා බාධය සංසිඳුනි. නැවත නාගරාජයා මෙසේ පැවසුවේය.

ස්වාමීනි සාමණේරයන් විසින් සියලු දේව සමූහයා රැස්කරවා මා ලජ්ජාවට පත් කළේය. මම ඔහුගේ හඳවත හෝ පලමී, පයින් ගෙන ගඟෙන් එතෙර විසිකරන්නෙමි. මහරජ සාමණේර මහත් ආනුභාව ඇත. ඔබට ඔහු හා සටන් කිරීමට නොහැකිය. ඔහුගෙන් සමාව ගන්න. ඔහු තමන්ද සාමණේරයන්ගේ මහත් ආනුභාවය දැන සිටියද ලජ්ජාව නිසා ලුහුබැඳ ආවේය. අනතුරුව තෙරුන්ගේ වචනයෙන් සමාව අයැද ඔහු හා මිත්‍රත්වයක් ඇතිකරගෙන මෙයින් පසු අනෝතත්ත ජලයෙන් ප්‍රයෝජනයක් ඇතිවිට තොපගේ පැමිණීමක් අවශ්‍ය නොවේ. මට පණිවිඩයක් එවන්න ම විසින්ම ගෙනැවිත් දෙන්නෙමියි කියා පිටත් විය. තෙරුන්ද සාමණේරයන් ගෙන පිටත්වූහ. බුදුහු තෙරුන් පැමිණිබව දැන මිගාර මාතු ප්‍රාසාදයේ තෙරුන්ගේ පැමිණීම බලමින් වාඩිවි සිටියහ. භික්ෂූන්ද තෙරුන් එන බව දැන පෙරගමන් කර පාසිවුරු පිළිගත්හ. මේ අතර ඇතැම් භික්ෂූන් සාමනේරයන්ගේ හිසෙන්ද කන්වලින්ද අත්වලින්ද ගෙන සොලවමින් ඇයි සාමනේර පැමිණ කලකිරුනේදැයි විමසූහ.

බුදුහු ඔවුන්ගේ ක්‍රියාව දක මෙසේ සිතූහ. මේ භික්ෂූන්ගේ ක්‍රියාව බැරෑරුම් දෙයකි. දරුණු විෂ සර්පයෙක් ගෙලෙන් අල්ලා ගැනීමක් වැන්න මොහුගේ ආනුභාව නොදනී. අද මම සුමන සාමණේරයන්ගේ ගුණය ප්‍රකට කිරීම වටනේය. තෙරුන් පැමිණ බුදුන් වැඳ වාඩි වුහ. බුදුහු තෙරණුවන් සමග පිළිසඳර කතා කොට ආනන්ද තෙරුන්ට ඇමතූහ. ආනන්ද අනෝතත්ත විල ජලයෙන් පා සේ දීමට කැමැත්තෙමි. සාමණේරයන්ට කළ දී ජලය ගෙන්වාගන්න. තෙරුණුවෝ විහාරයේ සමග පන්සියයක් සාමණේරවරු රැස් කළහ. උන් වහන්සේලා අතර සුමන සාමණේරයෝ සියල්ලන්ට වඩා අළුත පැවිදි වුවෙකි. ආනන්ද තෙරුණුවෝ සියළු වැඩි වයස් සාමනේරයන්ට පැවසුවේ බුදුරජාණන් වහන්සේ අනෝතත්ත විල් ජලයෙන් ස්නානය කැමති නිසා කළයක් රැගෙන ගොස් පැන් ගෙන එන්න යනු වෙනි. ස්වාමීනි කළ නොහැකියයි කැමති නොවූහ. අන් අයට පැවසුවිට එසේම ප්‍රතික්ෂෙකොට කැමති නොවූහ. කිම මෙහි රහත් වූ සාමනේර නමක් නැත්තේදැයි විමසූහ. ඇත ඔවුහු අප සමග බද්ධවී නැත මල්ගොටු සුමන සාමණේරයන්ටම බැඳුනේයයි නොකමැතිවූහ. පෘථග්ජන අය තමන්ගේ නොහැකි යාව නිසාම අකමැතිවූවාහුය අවසානයේ දී සුමන සාමණේරයන්

ගේ වාරයේදී අනෝතත්ත විලෙන් ජලය ගෙන ආ හැකිදයි විමසුවිට බුදුරජාණන් වහන්සේට නම් ගෙන එන්නෙමියි බුදුන් වැඳ මම ජලය ගෙන එන්න දැයි විමසුවිට එසේය සුමන යයි පැවසුහ. උන් වහන්සේ විශාඛාව විසින් කරවන ලද සත රන් කොටුවේ සෙනසුන් කුටයේ කළ හැටක ජලය අල්ලන මහකළයක් අතින් ගෙන මෙය ඔසවා උරයේ තැබීමෙන් වැඩක් නැත. අතින් එල්ලාගෙන හිමාලය දෙසට අහසට පැන නැගුනි. නාග රාජයා දුරදීම සාමණේරයන් එනු දැක පෙර ගමන් කරඇකයෙන් ගෙන ස්වාමීනි මා සමාන සේවකයින් සිටියදී කුමක් නිසා හුදෙකලාව පැමිණියේද? කළයෙන් ජලය ගෙන තෙමේ ඔසවා ස්වාමීනි පෙරට එන්න මම ගෙන එන්නෙමි. පැවසුවේය. මහරජ ඔබ සිටින්න මටම බුදුරදුන් විසින් අණ කරණ ලද්දේය. අරගෙන එන්නෙමි. පැවසුවේය. කළයේ කට අතින් අල්ලාගෙන අහසින් පැමිණියේය. අනතුරුව බුදුරජාණන් වහන්සේ වඩිනා වූ සුමන සාමණේර දෙස බලා භික්ෂූන්ට ඇමතූහ මහණෙනි බලන්න සාමණේරයන්ගේ ලීලාව අහසේ යන හංස රාජයෙක් මෙන් (සෙඝති) හොබී ඔහුද පැන්කළය තබා බුදුන්ට වැද සිටියේය. අනතුරුව තථාගතයන් වහන්සේ පැවසුහ සුමන ඔබට වයස කීයද? අවුරුදු හතකි ස්වාමීනි එසේ නම් සුමන අදපටන් ඔබ භික්ෂුවක් වන්නේයයි පවසා "දායජ්ජ උපසම්පදාව" පිරිනැමුහ. සාමණේර වරු දෙනමක් පමණක් සත් වයසින් උපසම්පදාව ලැබුවාහුය එනම් සෝපාක හා සුමන සාමණේරයි ඔහු උපසම්පදා ලැබූ පසු ධර්ම සභාවේ කථාවක් ඉපද වුහ.

ඇවැත්නි ආශ්චර්යයි මෙබඳු ළාබාල සාමණේර නමකගේ මෙබඳු ආනුභාව බවක් දැක නැත. බුදුන් පැමිණ කිනම් කථාවකින් යුතුව සිටියේදැයි විමසා සාමණේර ගැන බව පැවසුවිට මහණෙනි මගේ ශාසනයේ දහර කෙනෙක් වුවද මෙබඳු සම්පත් ලබන්නේයයි පවසා මෙම ගාථාව පැවසුහ.

ළඳරු වුවද ගරු පැවිදි තෙමේ යෙදේ නම් බුදුසාසනේ
වළා පටලෙන් මිදුණු පුන්සඳ වගේ මුළු තුන් ලොව දිනේ
දැමූ නාරජ සාමණේර වූ සුමන පොඩි හිමියන් මෙනේ
වයස අවුරුදු හතවුවත් රහතන් වහන්සේ සුව ගෙනේ

එහි **යුඤ්ජති.** උත්සාහ කරයි. දිරි දරයි. **පහාසෙනීස** ඒ භික්ෂුව තමන්ගේ අර්හත් මග නුවණින් අහසෙහි. **මුත්තොචන්දිමා** රාහුගෙන් මිදුණු සඳ දෙවි පුත් මෙන්, **ලෝකං** ස්කන්ධාදී ලෝකය බබුළුවයි. ඒකාලෝක කරයි. දේශනාවසානයේ බොහෝ දෙනා සෝවාන් ඵලයෙහි පිහිටියහ.

සුමණ සාමණේර පුවතයි
භික්ඛු වර්ග නිමි.

විස්පස්වැනි වර්ගය නිමියේය.

26-1

"ඡින්ද සොතනති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී ප්‍රසාද බහුල බ්‍රාහ්මණයෙක් අරමුණුකරගෙන දේශනා කළහ.

ඔහු වනාහි බුදුන්ගෙන් ධර්මය අසා ප්‍රසන්න වූ සිත් ඇත්තේ තම නිවසේ දහසක් පමණ භික්ෂූන්ට නිතර බත් තබා භික්ෂූන් පැමිණිවේලාවේ දී පාත්‍රය ගෙන පින්වතුනි පැමිනෙත්වා පින්වතුනි වාඩි වන්න හොත්තා අරහන්තා පින්වත් රහතුන් වහන්ස යනුවෙන් නිතර රහත් යන වචනය යොදාම කථාකරයි. මෙම භික්ෂූන් වහන්සේලා අතර පුහුදුන් භික්ෂූන් මෙතෙම අපි රහතුන් වහන්සේලා යයි සිතයි එයින් නොසතුටු වුහ. රහතුන් වහන්සේලා අය මෙතෙම අප රහත් ව සිටින බව දැන දැනම කරන කතාව කැයි මෙලෙස සියල්ලෝම සැක ඇති නිසා ඔහුගේ ගෙදරට නො ගියාහුය ඔහු දුකටපත්ව දොම්නස්ව ආර්යන් වහන්සේලා නො එන්නේ ඇයිදැයි විහාරයට ගොස් බුදුන් වැද මේ කරුණ දැනුම් දුන්හ. බුදුරදුන් භික්ෂූන් අමතා මෙලෙස වන්නේ කෙසේදැයි විමසා ඔවුන් විසින් එම අර්ථය දැනුම් දුන්විට මහණෙනි ඔබට මේ අර්හත්ව වාදය පිළිගත හැකිද? ස්වාමීනි අපට ඉවසිය හැකි නොවේ. මෙසේ ඇති කල්හි, මහණෙනි, මිනිසුන්ගේ ඇති බලවත් ප්‍රසාදය නිසා මෙසේ ආමන්ත්‍රණය කරයි. එය ප්‍රසාදය නිසා ආමන්ත්‍රණයේ වරදක් නැත. එසේම මේ බ්‍රාහ්මණයා රහතන් වහන්සේලාට අධික ප්‍රේමයක් ඇත. මේ නිසා තොපද තෘෂ්ණා සෝතුසය සිඳ දමා රහතන්බවට පත්වීම වටී යයි පවසා මෙම ගාථාව දේශනා කළහ.

තන්හා මහ වතුර වියලනු වෙහෙස ගෙන
නන් කාමයන් දුරුකළ මැන සිතට එන
සියළුම සකර දම් පිළිබඳ නැසුම දැන
බමුණානනි නිවන් සුව සෙන විඳිනු මැන

බලුණ පරාක්‍රමය කොට තෘෂ්ණා ශ්‍රෝතය සිඳ දමන්න කාමයන් දුරලන්න. **සහකාරයන්**ගේ විනාශය දැන නිවණ දකින්නෙක් වන්න.

එහි පරක්කම නම් තෘෂ්ණා ශ්‍රෝතසය අප්‍රමාදීව උත්සාහයෙන් සිඳීමට නොහැකිය එහෙයින් ඤාණ යුක්තව මහත් උත්සාහයෙන් වීර්යයෙන් **උත්සාහ** දරා **සොතං** එම ශ්‍රෝතසය සිඳින්න. **කාමෙපනුද** වස්තුකාම **ක්ලේශකාමයන්** ඉවත් කරව. බ්‍රාහ්මණ රහතන් වහන්සේලාට ඇමතීමකි. සංඛාරානං පංචස්ඛන්ධයන්ගේක්ෂය වීම දැන අකතඤ්ඤූනි මෙසේ ඇතිවිට ඔබ, **නිර්වාණය** දනගැනීම අක නම් වේ.

දෙසුම අවසන බොහෝදෙන මාර්ගඵලයන්ට පත්වූහ.

ප්‍රසාද බහුල

බ්‍රාහ්මණයාගේ කථා පුවතයි.

26.2

"යදා ද්වයෙසු ධම්මෙසු" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩ සිටියදී බොහෝ භික්ෂූන් නිමිත්තකර ගෙන දේශනා කළහ.

එක් දිනක් තිස්නමක් පමණ වූ දිසාවාසී භික්ෂූහු පැමිණ බුදුන් වැඳ වාඩිවූහ. සැරියුත් තෙරුණුවෝ මේ භික්ෂූන්ගේ රහත්බවට හේතු සම්පත් දැක බුදුන් වෙත එළඹ සිටගෙනම මෙම ප්‍රශ්න විමසුහ. ස්වාමීනි "දෙව ධම්මා" කියනු ලැබේ මේ ධර්මදෙක කුමක්ද? අනතුරුව බුදුරදුන් "දෙව ධර්ම" නම් සාරිපුත්ත සමථ - විපස්සන නා වන්ට කියනු ලැබේ.

සමන විදසුන් බවුන් වඩමින්
සතර සත්තය දැනුම ලබමින්
සතර යෝගම නසා දමමින්
නිවෙති බමුණෝ නිවන ලබමින්

යම් කලෙක බ්‍රාහ්මණ තෙමේ සමථ විදර්ශනා ධර්මයන්හි පරතෙරට ගියේද එකල චතුරාර්ය සත්‍ය දන්නා වූ ඔහුගේ සියළු සංයෝජන විනාශයට යෙත්.

මෙහි යදා - යන යම් කලෙක ද්වයෙසු ධර්ම දෙක්හි **ධම්මෙසු** - සමථ විදර්ශනා ධර්මයන්හි යෙදෙන ක්ෂීණාශ්‍රවයා **පාරගූ** පරතෙරට ගියේ වෙයි. අථසස සංසාර වෘත්තයෙහි සංයෝජන බිඳදැමූ සඛේඛ සියළු කාමාදි සංයෝග, **සංයෝගා අපථං ගච්ඡතනි** මෙසේ සියළු කාම ඕඝ ආදිය දැන ඒවා ක්ෂය කොට නිවණට යන්නේ ය. යන අර්ථයි.

දේශනාව අවසානයේ සියළු භික්ෂූහු රහත් ඵලයට පත්වූහ.

බොහෝ භික්ෂූන්ගේ කථා පුවතයි.

26.3

"යස්ස පාරං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩ සිටියදී මාරයා නිමිත්තිකරගෙන දේශනා කළහ.

මාරයා එක් දිනක් එක්තරා පුරුෂයෙක් ලෙසට බුදුන් වෙත එළඹ විමසුවේය. ස්වාමීනි - පාරං - පාරං - යනුවෙන් කියනු ලැබේ. මේ පාර - නම් කුමක්ද? බුදුරදුන් මේ මාරයායයි දැන පවුකාරය - ඔබට එතරවීමෙන් කවර ප්‍රයෝජනයක්ද? එය වීතරාගීන් විසින් ප්‍රාර්ථනා කළයුතු දෙයකි.

එගොඩ මෙගොඩ ද දෙගොඩ	නැතිකොට
කෙලෙස් ගිනිදැල් නිවා අළු	කොට
කෙලෙස් බැම්මෙන් මිදුනු	දනහට
බමුණු යන නම ලැබෙයි	වහරට

යමෙකුට එතර ද මෙතරද - මෙතෙරද - එතෙරද නැත්තේද. පහසු කෙලෙස් විඩා ඇති, සියළු කෙලෙසුන්ගෙන් මිදුණු ඒ රහතන් වහන්සේට මම බ්‍රාහ්මණයයි කියමි.

එහි **පාරං** යනු ආධ්‍යාත්මක ආයතන සයයි. (ඇස- කන - දිව - නහය - කය - සිත) **අපාරජං** යනු බාහිර ආයතන සයයි. (රූප - ශබ්ද - රස - ගන්ධ - ස්පර්ශ - ධම්ම) **පාරා පාරං** මේවා නිසා ඇතිවන බියයි, **න විජ්ජති** යනු යම් කෙනෙකුට මේ සියල්ල පිළිබඳව මම ය මගේ ය යන ග්‍රහණය නැතිවීම, සංකිලේසයන් ගෙන් වෙන්වීම. **වීතද්දරං**. සියලු ක්ලේශයන්ගෙන් වෙන්වීම **විසංයුතං තං අහං බ්‍රාහ්මණං** වදාමි. ඔහු බ්‍රාහ්මණයෙකැයි මම කියමි යන අර්ථයි.

දේශනාවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵල වලට පැමිණියාහු

මාරයාගේ කථා පුවතයි.

26.4

"ඣායි" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ජේතවනා රාමයේ වැඩ සිටියදී එක්තරා බ්‍රාහ්මණයෙකු නිමිත්තකරගෙන දේශනාකළහ.

මෙම බ්‍රාහ්මණයා මෙලෙස සිතුවේය. තථාගතයන් වහන්සේ තමන්ගේ ශ්‍රාවකයින්ට බ්‍රාහ්මණ නමින් පවසයි. මම ද ජාති ගෝත්‍රයෙන් බ්‍රාහ්මණයෙකි. එනිසා මටද එසේ ඇමතීම සුදුසුය. ඔහු බුදුන්වෙත එළඹ මේ කරුණ විමසුවේය. මම ජාති ගෝත්‍ර මාත්‍රයෙන් බ්‍රාහ්මණ යයි නො කියමි. උතුම් වූ අර්හත්වයට පත්වූ නිසාම මම මෙලෙස කියමියි පැවසු ශාස්තෘන් වහන්සේ මෙම ගාථාව වදාළහ.

ඇලී දැහැනෙහි කෙලෙස්	නැතිකොට
කරන කටයුතු දුකින්	මිදුම ට
පැමිණි අයහට රහත්	පලයට
බමුණු යයි මම කියමි	තිරකොට

ධ්‍යාන වඩන, රාගාදි රජස් නැති, වනයේ එකලාව වාසකරණ **කතකිච්චං** මගින් කරණ ලද කටයුතු ඇති, ආශ්‍රව නැත්තාවූ උතුම් අර්හත්වයට පත්වූ තැනැත්තා බ්‍රාහ්මණ නමි

එහි ඣායි කසිණ වැඩීමෙන් ද ත්‍රිලක්ෂන භාවනා වැඩීමෙන් ද ධ්‍යානයන්ට පැමිණි, කාම රජස් වලින් වෙන්ව **විරජං** මාසීනං වනයෙහි හුදෙකලාව වීසීම, **කතකිච්චං** සිවිමගින් සොළොස් කෘත්‍යයන් පුරා ඇතිබව. **අනාසවං** ආසවයන්ගෙන් දුරුවීම, **උත්තමත්ථං** අර්හත්භාවය ට **අනුපත්තං අහං** බ්‍රාහමණං පැමිණි තැනැත්තා ම බ්‍රාහ්මණයයි කියමි.

දේශනාවසානයේ ඒ බ්‍රාහ්මණයා සෝවාන් ඵලයෙහි පිහිටියේය. පැමිණි සිටි පිරිසට ද දේශනාව සාර්ථක වුයේය.

එක්තරා බ්‍රාහ්මණයකුගේ කථා පුවතයි.

26.5

"දිවා තපති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ මාතු ප්‍රාසාදයේ වැඩ සිටියදී ආනන්ද තෙරුන්ට දේශනා කළහ.

පසේ නදී කොසොල් රජ වස් පවාරණය කරණ දිනයේදී සියළු අබරන වලින් සැරසී සුවඳ මල් ආදිය ගෙන විහාරයට ගියේය. එකෙනෙහි කාලුදායි තෙරුන් ධ්‍යානයට සම වැදී පිරිස කෙළවර වැඩසිටියේ වෙයි. උන්වහන්සේගේ සිරුර මනවඩන රන්වන් සිරුරක් විය. එකෙණෙහි සඳ උඩට නැගේ. සුර්යයා අවරට යයි. ආනන්ද තෙරණුවෝ - සඳ එළියත් හිරු රැසක් බලා රජුගේ ද- කාලුදායී තෙරුන්ගේ හා තථාගතයන් වහන්සේගේ ද ශරීරශෝභාව බලා විහිදී සියළු ශෝභාවන් පරදවා බුද්ධ ශරීරය ශෝභාවත් බව දක තෙරුන් බුදුන් වැද ස්වාමීනි මම අද ආලෝකය බලද්දී ඒ සියළු ආලෝකයන්ට වඩා ඔබ වහන්සේගේ ශෝභාව රුචි වේ. ඔබ වහන්සේගේ ශරීරා ශෝභාව සියළු ශෝභාවන් පරදවා බබළයි. යනුවෙන් පැවසුහ. අනතුරුව තථාගතයන් වහන්සේ ආනන්ද හිරු දිවාකල බබළයි. සඳ රාත්‍රියේ බබළයි. රජු අබරණ වලින් හා සන්නද්ධ වූයේම බබළයි. රහතන් වහන්සේ ජන සමූහයෙන් වෙන් වී ඇතුලත සමාපත්තිය තුලින්ම ධ්‍යානයෙන්ම බබළයි බුදු වරුන්නම් දිවා රැ දෙකේම පස් තේජසින් බබළයි. යනුවෙන් පවසා මෙම ගාථාව වදාළහ.

දහවල් දවස හිරු බබළයි එළිය	දෙමින්
මුළු රැ දිලෙයි පුන්සඳ ලොව සිසිල	ලමින්
බබළයි මහරජු ද මිණි මුතු කිරුළු	ලමින්
බුදුරජු සිටී නිතරම ලොව බබුළු	වමින්

එහි **දිවාතපති** දවල් කාලයේ බබළයි. රාත්‍රියෙහි ගිය මගද නොපැනේ. **චන්දිමා** චන්දයා ද අහසින් මිදුනේ **රත්‍රි** රාත්‍රියේම බබළයි. දවල් නොබබළයි. **සන්නද්ධෝ** රන් රුවන් සියළු ආභරණවලින් සැරසී සිව්රඟ සෙනඟ පිරිවරා සිටියදීම රජු බබළයි. අනෙක් වෙසකින් සිටියොත් නො බබළයි. **ඣායීති** යනු රහතන් වහන්සේ ගණයාගෙන් වෙන් වී ධ්‍යානයෙන්ම

බබළයි. තෙජසා - සම්මා සම්බුදුන් දුසිල් බව අත්හැර සිල් තෙදින්, නිර්ගුණ නැතිකොට ගුණ තෙදින්. මෝඩබව නැතිව ප්‍රඥා තේජසින්. පව්කම් දුරුර "ප්‍රඥා තේජසින්, අධර්මය දුරුර "ධර්ම තේජසින්. යන පස් වැදූරුම් තේජසින් සදා කල්හිම බබළයි. යන අර්ථයි .

දේශනාවසානයේ බොහෝ දෙනා සෝවාන් ඵලෙහි පිහිටියා ය.

ආනන්ද තෙරුන් පිළිබඳ කථා පුවතයි.

26.6

"බාහිත පාපොති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී එක්තරා බ්‍රාහ්මණ පැවිද්දෙක් නිමිති කරගෙන දේශනා කළහ.

එක් බ්‍රාහ්මණයෙක් - බාහිර ප්‍රවුජ්‍යාවෙන් පැවිදිවී ශ්‍රමණ භවත් ගෞතමයන් තමන්ගේ ශ්‍රාවකයින් පැවිදි කුලේ යයි කියයි. මම ද පැවිද්දෙකි. මම ද එසේ කිම සුදුසුය. යනුවෙන් සිතා බුදුන්වෙත එළඹ මේ කරුණ විම සුවේය. බුදුහු මෙපමණකින් පැවිද්දෙක් නොවේ කෙලෙස් දුරුකල පැවිද්දාම පැවිද්දා වේ. මේ ගාථාව දේශනා කළහ.

පව්කම් බැහැර කොට "බමුණා " නම	ලදව
සම චරියා නිසා "සමණා" වෙයි	දනුව
කෙලෙසුන් නසා "නිකෙලෙස් වී හින	දිනුව
පුඟුලා "පැවිද්දා" යනුවෙන්	දනගනුව

එහි **සමචරියා** යනු සියළු අකුසලයන් සමණය කොට හැසිරෙන බැවින් **නසමා** එහෙයින්, බැහැර කරන ලද පව් ඇති, බ්‍රාහ්මණයා අකුසල් දුරුකොට හැසිරීම නිසා ශ්‍රමණ යයි කියයි. එහෙයින් යමෙක් තමාගේ රාගාදී කෙලෙස් මල **පබ්බාජයං** බැහැර කිරීමෙන් හැසිරේද සතුටුවේද. හෙතෙමේ පැවිදි විම නිසා පැවිද්දා යයි කියයි යන අර්ථයි.

දේශනාවසානයේ ඒ බ්‍රාහ්මණ පැවිද්ද ලබා සෝවාන් ඵලයෙහි පිහිටියේය. පැමිණි සිටියවුන්ට සාර්ථක දේශනාවක් වූයේය.

එක්තරා බ්‍රාහ්මණ පැවිද්දකුගේ කථා පුවතයි.

26.7

"න බ්‍රාහ්මණස්ස" යන මේ ධර්ම දේශනාව ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී සැරියුත් තෙරුන් නිමිති කරගෙන දේශනාකළහ.

එක් තැනක මිනිස්සු බොහෝ දෙනෙක් අහෝ අපේ ආර්යයන් වහන්සේ ඉවසීමේ බලය නිසා ඉවසීමේ ගුණයෙන් යුතුවූයේ බනින විට හෝ පහර දෙනවිට හෝ කිපීම් පමණකුත් නැත. තෙරුන්ගේ ගුණ කීවාහුය. මේ අතර එක් මිථ්‍යා දෘෂ්ටික බමුණෙක් මෙහි නොකිපෙන තැනැත්තා කවුද? යි විමසුවේය. අපේ තෙරුන් ඔහු කිපීමක් නැති ද? නැත බ්‍රාහ්මණය එසේ නම් මම කෝපකර වන්නෙමියි පැවසුවේය. හොඳයි එසේනම් කෝප කරවන්නැයි කීවේය. හොඳයි වේවා මම කළයුතුදේ දනිමියි තෙරුන් වහන්සේ පිඬුපිණිස පිවිසිවිට පසු පසින් ගොස් පිටුපස සිට තදින් අත් පහරක් දුන්නේය. තෙරුන් වහන්සේ මේ කවරෙක්දැයි නොබලාම ගියේය. බමුණාගේ මුළු සිරුරේම දා බිඳු නැගුණි. අහෝ ගුණ සම්පන්න ආර්යයන් වහන්සේ යයි තෙරුන්ගේ පාමුල වැටී ස්වාමීනි මට සමා වන්නැයි කියා මේ කුමක්දැයි විමසුවිට මම ඔබ විමසනු සඳහා ඔබ වහන්සේට පහර දුනිමි යි පැවසුවේය. මම ඔබට සමාව දෙමි. ස්වාමීනි මට සමාව දෙන්නේනම් මගේ නිවසේ සිට දානය වළඳන්නැයි කියා තෙරුන්ගේ පාත්‍රය ගත්තේය. බමුණ ගෙට කැඳවාගෙන ගොස් වැළඳ වූයේය. මිනිස්සු කිපි මොහු විසින් නිරපරාධ වූ ආර්යයන් වහන්සේට පහර දුන්නේ ය. මෙහිම ඔහු මරාදමමුයි ගල්කැට දඬු මුඟුරු ගත් අත් ඇතිව බමුණාගේ ගෙදොර සිටියාහුය. තෙරුන් නැගිට පිටත්ව යන්නේ බමුණා අතට පාත්‍රය දුන්හ. මිනිස්සු ඔහු තෙරුන් සමග එනු දක ස්වාමීනි ඔබ වහන්සේගේ පාත්‍රය ගෙන බමුණා නවත්වන්නැයි කිවාහුය. ඇයි උපාසක වරුනි බ්‍රාහ්මණයා විසින් ඔබ වහන්සේට පහර දෙන ලදී, අපි ඔහුට කළ යුතු දේ දනිමු. ඇයි මොහු විසින් ඔබට පහර දෙන ලද්දේද? ඔබ වහන්සේට පහර දුන්නේය. මම ඔහුගෙන් පහර කා සමාව දුනිමි. ඔබලා යන්න. මිනිසුන් විසුරුවා බමුණ නවතා තෙරුන් විහාරයටම ගියේය. භික්ෂූන් උද්ඝෝෂණ කළහ. මෙය කවර දෙයක්ද සැරියුත් තෙරුන්ට යම් බ්‍රාහ්මණයෙක් පහර දුන්නේද ඔහුගේ නිවසේ වැඩහිඳ භික්ෂාව ගෙන ආවේ වෙයි. තෙරුන්ට පහර දුන් තැන සිට

භික්ෂාව ගෙන ආවේය තෙරුන්ට පහර දුන් නැන් සිට දැන් ඔහු හට ලැජ්ජාවන්නේද අනෙක් අයට පහරදෙමින් හැසිරෙන්නේය. බුදුරදුන් ගොස් කිනම් කථාවකින් යුතුව සිටියේදැයි විමසා කරුණ පැවසු පසු මහණෙනි, බ්‍රාහ්මණයෙක්ම බ්‍රාහ්මණයකුට පහර දීමක් නැත. ගිහි බ්‍රාහ්මණයෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයෙකුට පහර දුන්නේ වෙයි. මේ ක්‍රෝධය අනාගාමී මාර්ගයෙන් සම්පූර්ණ සිඳ දැමීමේ වේ. යයි පවසා ධර්ම දේශනා කරමින් මේ ගාථා දේශනා කළහ.

රහත් බමුණු යන	දෙපිරිසට
පහර දියයුතු නොවේ කිසි	විට
පහර දුන්නද යමෙක් නික	මට
කිපිය යුතු නැත්තේය ඔවු	හට

එකටෙක නොකොට බමුණා නම් සිටිය	යුතු
එය රහතුන්ගෙ උස්ගුණයෙකි නිබිය	යුතු
නැති නම් ඔවුන් තුළ රුදු රොස් පරොස්	සිතු
දුක් කරදර ද නිම වේමැයි තමන්	සතු

1. ක්ෂිණාශ්‍රව බ්‍රාහ්මණයාට රහතන් වහන්සේට පහර නොදෙන්නේය. ක්ෂිණාශ්‍රව බ්‍රාහ්මණ තෙමේ තමන්ට පහර දුන් නැහැත්තාට නො කිපෙන්නේ ය. පහර දුන් නැහැත්තාට නින්දා වේවා ඒ පහර දුන් නැහැත්තාට කිවේද ඊටත් වඩා ඔහුට නින්දා වේවා

2. මේ එක ටෙක පහර නොදීම ක්ෂිණාශ්‍රවයන් වහන්සේ ගේ ස්වල්ප උතුම් බවක් නොවේ. යම් විටෙක කිපුණු නැහැත්තාගේ සිතට කෝප සිතිවිලි වලින් වැළැක්මක් වේද? යම් විධියකින් යමෙකු තුළ හටගත් හිංසා සිත නවතීද ඒ කාරන්යෙන්ම දුක් සන් සිදෙන්නේ ය.

එහි **පහරෙයාති** - මම රහත් වූ බ්‍රාහ්මණයෙක් වේමියි දන්නේ ක්ෂිණාශ්‍රව වූ හෝ අනිත් බ්‍රාහ්මණයකුට පහර නො දිය යුතුය. ඔහුට කෝප නොකළ යුතුය යි **බ්‍රාහමණස්ස** - යනු - ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයාට හනතාරං

පහරදෙන්නේද, ගරහන්නේද, නැනැත්තාට ගරහම් **තනෝ ධි** - යනු යම් කිසිවෙක් පහර දුන් අයට ප්‍රතිප්‍රහාර දේද, **යසස** යමෙකු ට උපරිම වෛරය, **මුඤ්චති** මුදන නැනැත්තාට ගැරහිය යුතුය. **එතද කිඤ්චි සෙය්‍යො** යම් කිසි ක්ෂිණාශ්‍රවයකු හට ආක්‍රොශ කරන්නේද ප්‍රති ආක්‍රෝශ කරන්නේද පහර දෙන්නේද ප්‍රති ප්‍රහාර දෙන්නේද, මේ ඔහුට **බ්‍රාහමණස්ස** කෙසේවත් ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් නොවන්නේ ය. **යදා නිසෙධො මනසො පියො**- ක්‍රෝධ ඇත්තාට ක්‍රෝධ ඉපදීමක් මනසෙහි ප්‍රියවීමක් ක්‍රෝධය ඇති මිනිස්සු මව පියා - බුද්ධ ආදීන්ට ද ක්‍රෝධ කරයි. මේ නිසා යම් කෙනෙක් මනසේ නිශේධයන් ක්‍රෝධ වශයෙන් උපදින සිතට නිග්‍රහ කිරීමක් වේ නම් එයම ශ්‍රේෂ්ඨ බවකි. අධිමාත්‍රයට ශ්‍රේෂ්ඨ වේ. ක්‍රෝධ සිත් ඇත්තා යම් යම් වස්තු වලින් අනාගාමී මාර්ගයෙන් සියළු සසරදුක් යන්නේ නවති ඒ ඒ වස්තුවලින් සියලු සසර දුක නවති. යන අර්තයි.

දෙසුම අවසන බොහෝ දෙනෙක් සෝවාන් ආදී මාර්ගඵලාදීන්ට පැමිණියහ.

සාරිපුත්ත තෙරුන් පිළිබඳ කථා පුවතයි.

26.8

"යස්ස කායෙ නාති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩ සිටියදී මහා ප්‍රජාපති ගෞතමිය නිමිති කරගෙන දේශනා කළහ.

බුදුවරුන් විසින් නම් හේතුවක් නොමැතිව පනවන ලද වස්තුවක් නැත. සේනිබිය දී පනවන ලද අවය ගරු ධර්ම නොයෙක් විධියෙන් අලංකාර වූ මිනිසෙක් දිව්‍ය මල්දමක් සිරසින් දරාගන්නා ලෙසට පිළිගෙන පිරිවර සහිත මහාප්‍රජාපති ගෞතමිය උපසම්පදාව ලැබුවාය. අනෙක් උපාධ්‍යාය කෙනෙක් හෝ ආචාර්ය කෙනෙක් ඇයට නැත. මෙසේ ලබන ලද උපසම්පදාව ඇති තෙරණියන් පිළිබඳව පසු කාලයේදී කථාවක් ඇති කළහ. මහාප්‍රජාපති ගෞතමියට ආචාර්ය උපාධ්‍යාය කෙනෙක් නැත. සියතින් කසාවත් හැඳ ගත්තාය. මෙසේ ද කියා භික්ෂුණීන් කුකුස් ඇති කරගෙන ඇය සමග උපෝසථ නොකළහ. පවාරණය නොකළහ. ඒ භික්ෂූන් ගොස් තථාගතයන් වහන්සේටද මේ කරුණ ප්‍රකාශ කළහ. බුදුහු ඔවුන්ගේ කථාව අසා මවිසින් විසින් මහාප්‍රජාපති ගෞතමියට අෂ්ට ගරු ධර්ම දෙන ලදී ඇගේ ගුරුවරයාත් උපාධ්‍යාය වරයාත් මමයි කාය දුශ්චරිත ආදියන් වෙන්වූ රහතුන්ට සැක නොකළ යුතුය.

කය වඳන මනසින්
දුරාචාරය නැති අය
සකස් වුනු තුන් දොර
අයම බමුණෝ වෙති නි තැනින්

යමෙකු ගේ කයින් වචනයෙන් මනසින් දුෂ්කෘතයක් අකුසලයක් නැත්ද සිත කය වචනය යන තිදොරින් සංවර වේද ඔහු බ්‍රාහ්මණ යනුවෙන් හැඳින්වේ.

තඤ්ච දුක්කතනති එහි වරද සහිත දුක් ඇතිකරණ අපාය ගාමී කර්ම **නිහියානෙහි** කාය ආදී තිදොරින් කරන කාය දුශ්චරිතාදිය වැළැක්වීම පිණිස තිදොර වසන ලද, නැනැත්තා **තංබ්‍රාහමණං** ඔහු බ්‍රාහ්මණයෙකැයි කියමි.

480

යන අර්ථයි

දේශනය අවසානයේදී බොහෝදෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණුනහ.

මහා ප්‍රජාපතී ගෞතමිය පිළිබඳ වූ කථා පුවතයි.

26.9

"**යඤ්ඤා**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී සැරියුත් තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

සැරියුත් තෙරුන් වනාහි අස්සජි තෙරුන් ලඟ ධර්මය අසා සෝවාන් ඵලයට පත්වූ කාලයේ සිට යම් දිසාවක තෙරුන් වාසය කරයිද එම දිසාවට ඇඳිලිබැඳ ඒ සිටින දිසාවට වැඳ නිදා ගනිති. භික්ෂූන් සැරියුත් තෙරුන් මිථ්‍යා දෘෂ්ටිකයහ. අදත් දිසා නමස්කාර කරමින් සිටිති මේ කරුණ බුදුන්ට දක්වා සිටියහ. බුදුරදුන් සැරියුත් තෙරුන් කැඳවා සාරිපුත්ත ඔබ දිසානමදිමින් සිටිනේයයි යන කරුණ සැබෑදැයි විමසුහ. සැරියුත් තෙරණුවෝ ස්වාමීනි මම දිසා නමස්කාර කිරීමහෝ නොකිරීම ඔබ වහන්සේම දන්නේ ය. මෙය පැවසු විට බුදුරදුන් මහණෙනි සාරි පුත්ත දිසා නමස්කාරය කරයි. අස්සජි තෙරුන්ගේ බණ අසා සෝවාන් වීම සිදුවූතැන් සිට එම ආචාර්ය වරයා ට නමස්කාර කරයි. යමෙක් ආචාර්යන් නිසා ධර්මය උගන්නේද එනිසා බ්‍රාහ්මණයෙක් ගිණි පූජා කරන ලෙසට ආචාර්යවරයා සකසා වැදිය යුතුය. පවසා මේ ගාථාව දේශනා කළහ.

බුදුන් දෙසූ දම් පද
යමෙක් මැනවින් දන්නෙද
නැමදිය යුතුය ඔහු
හෝම අග්නිය පුදන්නකු සේ.

යම් කෙනෙකුගෙන් බුද්ධ දේසිත ධර්මය දැනගත් නේද? ගිහි පුදන බ්‍රාහ්මණයෙක් ලෙසට ඒ ආචාර්ය වරයාට සකසා වදින්න.

නපඨ අගහිහුත්තං වානි - යනු යම්සේ බ්‍රාහ්මණයෙක් ගිනිපූජාව මැනවින් පිරිවරා කරයිද බිලි කර්ම කරයි ද එලෙස යඤ්ඤා යම් ආචාර්ය වරයකුගෙන් සම්බුද්ධ දේශිත ධර්මය දැන ගත්තේද ඒ ධර්මය උගන්වූ ගුරුවරයාට

නමස්කාර කරන්න. යන අර්ථය දේශනාවසානයේ බොහෝ දෙනා සෝවාන් ඵලාදියෙහි පිහිටියාහුය.

සාරිපුත්ත තෙරුන් පිළිබඳ වූ කථා පුවතයි.

26.10

"නජටා හිති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී එක් ජටිල බ්‍රාහ්මණයෙක් නිමිති කරගෙන දේශනා කළහ.

මේ ජටිල බ්‍රාහ්මණයා මව් පාර්ශ්වයෙන්ද පිය පාර්ශ්වයෙන්ද සුජාතවූ බ්‍රාහ්මණ කුලයක උපන් කෙනෙකි. ඉදින් ශ්‍රමණ භවත් ගෞතමයන් තම ශ්‍රාවකයින්ට බ්‍රාහ්මණ යනුවෙන් අමතයි. මම ද එලෙස ඇමතීමට සුදුසුයයි සිතා බුදුන් වෙත ගොස් මේ කරුණ පිළිබඳව විමසුවේය. අනතුරුව තථාගතයන් වහන්සේ බ්‍රාහ්මණය මම ජටා දරූ පමණින් හෝ ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් බ්‍රාහ්මණයෙක් වේයයි නොකියමි. අවබෝධකරගත් සත්‍ය ධර්මය ඇති නිසා බ්‍රාහ්මණ යයි කියමි.

හිස බැඳි ජටා වෙන්
දූ කුල ගොත් නිසාවෙන්
බමුණෙක් නොවන්නේ
ඇත්ත හා බුදු දහම නැත්නම්

ජටාවෙන් ගෝත්‍රයෙන් ජාතියෙන් බ්‍රාහ්මණයෙක් නොවේ. යමෙක් කෙරෙහි සත්‍යය ද ධර්මය ද අවබෝධ කරගෙන තිබේනම් ඔහු පිරිසිදුය ඔහු බ්‍රාහ්මණයෙකි.

එහි **සච්චං** - යම් පුද්ගලයකු කෙරෙහි චතුරාර්ය සත්‍යය සොළොස් ආකාරයකින් අවබෝධ කරගෙන ඇත්තේද සත්‍ය ඤාණය මෙන්ම නව විධ ලෝකොත්තර ධර්මයද අවබෝධ කරගෙන තිබේ නම් ඔහු පිරිසිදුය. ඔහු බ්‍රාහ්මණ යෙකි.

දේශනය අවසානයේ බොහෝ දෙනෙක් සෝවාන් ආදී මාර්ග ඵලාදීන්ට පැමිණියහ.

ජටිල බ්‍රාහ්මණයාගේ කථා පුවතයි.

26.11

"කිනෙත" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ කුටාගාර ශාලාවේ වැඩසිටියදී එක් වවුල් වත පිරූ කුහක බමුණෙකු නිමිති කරගෙන දේශනා කළහ.

මේ බමුණා විශාලාවේ නගර දොරටුවේ එක් කුඹුක් ගසකට නැග දෙපාවලින් අතුවල එල්ලී ගස යටට එල්බෙන ශරීර ඇති වැ හිසපහලට තබා ගෙන එල්ලෙමින් කිඹුල්වත් පුර ගම් සියයක් දෙන්න. කහවනු දෙන්න. පිරිවර දෙන්න නොදෙන්නේනම් මෙයින් වැටී මැරී නුවර පාළු කරමි. කියයි.

බුදුරදුන්ද භික්ෂුසංඝයා පිරිවරා නුවරට ඇතුළුවන විට භික්ෂූන් එම බමුණා දැක නික්මී යන විටද එසේම එල්ලී සිටිනු දක්නට ලැබුනි. නාගරික යෝද මොහු අද අළුයම සිට මෙසේ එල්ලී සිටිමින් මේවා නොදෙන්නේනම් වැටී මැරෙමි කියයි. නුවර විනාශ කරමියි කියයි. එසේ මළ හොත් නගරය විනාශ වේ යයි නගරය බියෙන් ඔහු ඉල්ලන සියළු දේ දෙමුයි සාකච්ඡා කොට දුන්හ. ඔහු ගසෙන් බැස ඒ සියල්ල ගෙන පිටත්ව ගියේය. භික්ෂූන් වහන්සේලා විහාරය අසල ඔහු දෙනක් ලෙසට හැසිරී යනු දැක හඳුනා ගෙන බ්‍රාහ්මණය ඔබ කැමති දේ ලැබුනේදැයි විමසා - එසේය ලැබුනේයයි පැවසුවේය. මෙය අසා විහාරය තුලට ගොස් භික්ෂූන් වහන්සේලා තථාගතයන් වහන්සේට දැනුම් දුන්හ. 'මහණෙනි මොහු දැන් පමණක් නොව පෙරද කුහකයෙකි. සොරෙකියි පවසා දැන් අනුවන ජනයන් රවටයි. එදා නුවනැත්තන් වංචා කිරීමට නො හැකි වීයයි පවසා භික්ෂූන් විසින් විමසන ලදුව අතීත කථාව ගෙන හැර දක්වුහ.

අතීතයේදී කාසී රට එක් ගමක් ඇසුරුකොට එක් කුහක තාපසයෙක් විසුවේය. ඔහු එක් කුලගෙයකට යයි. එයින් ඔහු පෝෂණය කරයි. දිවා කාලයේදී පිළියෙළ කරණ කෑයුතු පියයුතු ද තමන්ගේ පුතුන්ට මෙන්ම ඔහුටද කොටසක් වෙන්කර දෙයි. හැන්දෑවේ පිළියෙල කරණ කොටස් තබා පසුදින දෙයි. මේ අතර දිනක් සවස ආහාරයට තලගොයි මස් ලැබ වහාම උයා තබා දෙවැනි දවසේදී ඔහුට දුන්නේය. ඔහු මස් සුවඳ නිසා

රසතෘෂ්ණාවෙන් බැඳී මේ මස් මොනවාදයි විමසා (ගෝධ) තලගොයි මස්යයි අසා භික්ෂාවේ හැසිරී දුරු මිරිස් ආදී කටුක භාණ්ඩ පිඩුසිඟා ගෙන පන්සලට ගොස් ආරක්ෂිතව තැබීය. පන්සලට නො දුරේ එක් තුඹසක දැවැන්ත තලගොයෙක් වාසය කරයි. ඔහු කලින් කල තාපසයා වැඳීමට එයි. මේ දිනයේ උෆ මරන්නෙමියි දණ්ඩක් ගෙන එම තුඹසට නුදුරේ නිදාගත්තෙක් ලෙසට වැතිරී සිටියේය. තලගොයා තුඹසින් නික්ම ඔහුලඟට එන්නේම ඔහුගේ ස්වරූපය සලකා මට මේ ආචාර්ය වරයාගේ ස්වරූපය රුචි නොවේ යයි එහිම නැවතුනි තවුසා උෆ නැවතුන බව දැන උෆ මැරීම සඳහා දන්ඩෙන් දමා ගැසීය. එම දණ්ඩ ලිස්සා ගියේය තලගොයි රජුද තුඹසට පිවිස හිස උඩට තබා ඔහු එන මඟ බලමින් සිටි තාපසයාට මෙසේ කීවේය.

සිත ඇතුළ කෙලෙසුන්
පිරී ඇන්නම් දහසින්
අඳුන් දිවි සම් හැඳ
ජටා බැන්දත් හිස් මත
පිට පොන්න දිලුනත්
ඇතුළත හරය නැත්තේ.

1. ඔබ ශ්‍රමණයෙකැයි සිතා ඔබ සංයත අයෙකැයි සිතා මම ඔබ වෙත ආවෙමි. ඒ ඔබ අසංයත කෙනෙක් ලෙස අශ්‍රමණයෙක් ලෙසට මට පහර දුන්නේය.
2. අඥානය ඔබේ ජටාවෙන් කවර ප්‍රයෝජනයක්ද අඳුන් දිවි සමින් කවර ප්‍රයෝජනයක්ද ඔබේ අභ්‍යන්තරය කෙලෙස් වලින් ගහනය පිටතින් සංවරකම පමනක් පවතී.

අනතුරුව තාපසයා නැවතත් තමන් වෙත පහදවා ගැනීමට පොළඹවා ගැනීමට මෙසේ කීවේය.

තලගොයානණි ! එන්න ඇල්හාල් මෝදක අනුභව කරන්න. තෙල් ලුණු - බොහෝ ඇත තිප්පිලිද ඇත.

එය අසා ගෝධ රජු ඔහුට මෙසේ කීය. ඔබ යම්ලෙසට කියයිද? එසේ වුවත් මට මෙහි බියක්ම පෙනේ. එහෙයින්ම මට පලායාමට සිතේයයි කියා මෙම ගාථාව පැවසුවේය. එය අසා ගෝධ රජු මෙසේ කීය. මට දැන් මෙතැනින් පලා යාමට සිතේ මෙසේද කියා මේ ගාථාව කීය.

ඔබ කෙසේ පැවසුවත් මට බියක්ම දැනේ. ඔබගේ හාල් තෙල් ලුණු ආදියෙන් මට ප්‍රයෝජන නැත. තිප්පිලි මට අගුණය.

මෙසේ කියා මෙතුවක් කල් ඔබ කෙරෙහි මා තුළ ඔබ ශ්‍රමණයෙකැයි යන හැඟීම විය. දැන් ඔබ මට පහර දෙනු කැමැත්තෙන් දන්ඩෙන් දමා ගැසීය. එය දමා ගැසූ තැන් සිට ඔබ අශ්‍රමණ යෙක් වූයේය. ඔබ සමාණ දුෂ්ප්‍රාඥ පුද්ගලයකුගේ ජටාවෙන් කවර අර්තයක් ද? අඳුන් දිවිසමෙන් කවර ගුණයක්ද, අභ්‍යන්තරයෙහි ඔබේ පවත්නා දුර්ගුණ හුදෙක් බාහිර ක්‍රියා කාරකම් වලින් හෙළි දරව් වේයයි කිවේ.

ශාස්තෘන් වහන්සේ මේ අතීත කථාව ගෙන හැර දක්වා - එකල්හි ඒ කුහක තාපසයා අද මේ කුහක බමුණා විය. ගෝධ රජු නම් මම ම වෙමි යි වදාරා ජාතකය පුර්වාපර සන්ධි ගළපා ගෝධ පණ්ඩිතයා විසින් ඔහුට නිග්‍රහ කිරීම දක්වන්නේ කරුණ දක්වමින්

කුමටද ඔබෙ අඳුන් දිවිසම සහින	ජටා
ඇතුළත කෙලෙස් මල, සිවුරය සිරුර	වටා
බාහිර ඔපය නිබුනත් ගෙන විවිද	රටා
හිස් නම් ඇතුළ ඔහු බමුණෙකු	නොවෙයි

එහි කිංතෙජටාහි එම්බා දුමෙමධ අඥානය. ඔබගේ හිස බැඳි මේ ජටාහි ජටාවෙන්, ද මේ අඳුන් දිවිසමින් ද, කිං කවර අර්ථයක්ද අබ්භන්තරං

ඇතුළත, **නෙ** රාගාදී කෙලෙස්වලින් ගහණ වූ, හුදෙක් ඇත්ලාඩමක්. අස්ලාඩමක් මෙන්, මට්ටම්වී තිබේ. **බාහිරං පරිමජ්ජසි** පිට ඔපය රඳා පවතී.

දේශනය අවසානයේ බොහෝදෙන සෝවාන් ආදි මාර්ග ඵලයන්ට පත්වූහ.

එකොළොස් වැනි වූ කුහක බ්‍රාහ්මණයා
පිළිබඳ කථා පුවතයි.

26.12

"පංසුකූල ධරං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ගිජුකුලු පර්වතයේ වැඩ සිටියදී කිසා ගෝතමිය නිමිති කරගෙන දේශනා කළහ.

එදින සක්දෙවිඳු ප්‍රථම යාමය අවසානයේදී දෙවි පිරිස සමග බුදුන්වෙත එළඹ වැඳ එකත් පසෙක සිහි කටයුතු ධර්මකථාවක් අසමින් සිටියේය. ඒ අවස්ථාවේදී කිසා ගෝතමිය බුදුන් දකින්නෙමියි අහසින් අවුත් සක්දෙවිඳු දැක නැවතුනි. ඔහු ඇය වැඳ නැවතෙනු දැක බුදුන්ගෙන් විමසුවේය. ස්වාමීනි මෙහි එමින් ඔබවහන්සේ දැක නැවතුන ඇය කවුද? මහ රජ ඇය කිසා ගෝතමීනම් ඇත්තිය. මගේ දියණිය පංසුකූලික තෙරණිවරුන් අතර අග්‍රයයි මෙම ගාථාව පැවසුහ.

ඉවන හළ රෙදි කැබලිවලින් සිවුරක්	මසා
පොරවමින් දැඩි තපස් රකින නොකරම	මුසා
දැහැන් වඩමින් වසන වෙනෙහි රුක්මුල්	නිසා
උතුම් මෑ නියම බමුණෙක්ය හරි මග	නිසා

පාංශුකූලිකාංගය ධරණ සිහින් වූ නහරවැලි ඉල්පුණු සිරුර ඇති, එක් වනයක ධ්‍යාන වඩන ඕතොමෝ බ්‍රාහ්මණය කැයි මම කියමි.

නත්ථ කිසනති - පාංශුකූලික සිවුරු පෙරවමින් තමන්ට අනුරූප පටිපදා පුරන නහරවැල් ඉල්පුණු අඩමස් ලේ ඇති නිසා එසෙයින් කියන ලදී.

එකං වනසම්ං යනු විවේකීව එක් වන සෙනසුනක ධ්‍යාන වඩන්නී ය. තමහං බ්‍රාහ්මණ - එනිසා මම බ්‍රාහ්මණයකු යයි කියමි යන අර්ථය

දේශනාවසානයේ බොහෝ දෙනා සෝවාන් ආදී මාර්ග ඵලවලට පැමිණියාහුය.

කිසා ගෝතමියගේ කථා පුවතයි.

26.13

"න චා හං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටියදී එක් බ්‍රාහ්මණයෙක් නිමිති කරගෙන දේශනා කළහ.

ඔහු වනාහි ශ්‍රමණ ගෞතමයෝ තම ශ්‍රාවකයන් බ්‍රාහ්මණ යනුවෙන් හඳුන්වති. මම ද බ්‍රාහ්මණ යෝනියේ උපන් කෙනෙකි. මට ද එලෙස ඇමතීම සුදුසුය. මෙසේ කියා බුදුන් වෙත එළඹ මේ පිළිබඳව විමසුහ. අනතුරුව බුදුරදුන් බමුණු කුළයේ උපන් පමණින් මම බ්‍රාහ්මණ යයි නොකියමි. යම් කෙනෙක් රා - දොස් පළිබෝධ නැති. දූ දරු කෙත්වත් ආදි ග්‍රහණයක් නැති කෙලෙස් නැති තැනැත්තා බ්‍රාහ්මණ නමින් හඳුන්වමියි වදාර මේ ගාථාව දේශනා කළහ.

බමුණු කුලයක උපත ලදුවත්,
බමුණු මව්කුස උපත ලදුවත්
ඔහුට බමුණෙක් නොකිය යුතුමැයි
කෙලෙස් බර හෝ වාදියෙකි හේ
කෙලෙස් බිඳකුදු සිතේ නැත්නම්
මාන ලෝභාදිය නොවේනම්
ඔහුම බමුණෙකු වීය පිරිසිදු
ඔහුම රහතුන් වේය නිකෙලෙස්

මම බමුණු යෝනියෙන් උපන් බැමිණියකගේ කුසේ උපන් තැනැත්තා බමුණෙකුයයි නොකියමි. ඉදින් බමුණා රාගාදි පළිබෝධ සහිත කරදර ඇත්තෝද හෙතෙම බ්‍රාහ්මණ නොවේ. පළිබෝධ නැති තෘෂ්ණා වශයෙන් ගැනීම නැති තැනැත්තා බ්‍රාහ්මණ නමින් හඳුන්වමි.

එහි **යොනිජං** - ස්ත්‍රී යෝනියකින් උපන් **මත්තිසම්භවං** බ්‍රාහ්මණ මවකගේ කුසින් උපන් - **භොවාදිනි** - යමෙක් හෝ භෝයනුවෙන් ආමන්ත්‍රනය ආදියකියමින් හැසිරෙන්නේද හෙතෙම භෝ වාදි නම්, **සචෙ** රාගාදි

කරදරවලින් සකිඤ්චනො - මම වනාහි රාගාදි යෙන්, **අකිඤ්චනං** සතර උපාදානයන් විසින් **අනාදානං** නොගන්නා, අයම උතුමිය බ්‍රාහ්මණංවදාමි - බ්‍රාහ්මණ යයි කියමි.

දේශනාවසානයේ එම බ්‍රාහ්මණයා සෝවාන් ඵලයේ පිහිටියේය. පැමිණි අයට ද දෙසුම සාර්ථක විය.

එක් බ්‍රාහ්මණයෙක් පිළිබඳ කථා පුවතයි.

26.14

"සඛ සංයොජනං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වෙළුවනයේ වැඩ සිටියදී උග්ගසේන නම් සිටුවරයා නිමිති කරගෙන දේශනා කළසේක. මෙහි කථාවස්තුව "මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො" යන ගාථාව විස්තර කිරීමේදී දක්න ලදී. එකල භික්ෂූන් පිරිසක් ශාස්තෘන් වෙත පැමිණ, උග්ගසේන බිය නොවෙමි ආදී අභූත දේ හා අනන් මනන් කියන්නේයයි දක්වා සිටි කල්හි මා පුත් උග්ගසේන සිඳහල සංයෝජන ඇති, පුද්ගලයකු නිසා බිය නොවේ. යයි වදාරා මේ ගාථාව වදාළහ.

බිඳ දා සසර	බැමි
ඉක්ම වූ කෙලෙසුන්	ඉමි
සංයෝජනද	දැමි
ඔහුම බමුණා	**කියාපවසමි.**

යමෙක් සියළු දස සංයෝජන සිඳදමා තැති නොගෙන සිටින්නේද රාගාදි සංයෝගයන් ඉක්ම වූ. කෙළෙසුන්ගෙන් වෙන් වූ ඒ තැනැත්තා බ්‍රාහ්මණ යයි කියමි.

තත්‍ථ එහි **සඛ සංයොජනං** - දසවිධ සංයෝජන **න පරි තසසති** - තෘෂ්ණාව නිසා බිය නොවේ. **තමහං** - ඒ මම රාගාදී සංගයන් ඉක්ම වූ **සඞ්ගා තිගං** - සතර ඕඝ දුරුකළ වූ, තැනැත්තා බ්‍රාහ්මණයයි කියමි.

දේශනය අවසානයේ බොහෝ දෙන මාර්ගඵල ලැබූහ.

උග්ගසේන කථාපුවතයි.

26.15

"ඡෙත්වා නන්දිං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවරම් වෙහෙර වැඩ සිටියදී බ්‍රාහ්මණයින් දෙදෙනෙක් නිමිති කරගෙන දේශනා කරණ ලදී.

ඔවුන් අතර එක් අයෙක් චුල්ලරෝහිත නමින් හැඳින්වේ. අනෙකා මහා රෝහිත නම් ඔවුන් එක් දිනක් මගේ ගොනා බලවත්ය ඔබේ ගොනා දුබලයයි විවාද කර අපේ විවාදයෙන් වැඩක් නැත කරත්තය පදවා දූනගන්නෙමුයි අවිරවතී ගංතෙර කරත්ත වැලි වලින් පුරවා ගොණුන් යෙදුහ. මේ අවස්ථාවේදී භික්ෂූන් වහන්සේලාද එහි ස්නානය සඳහා ගොස් සිටියහ. බ්‍රාහ්මණයෝ කරත්ත දෙකේ ගොනුන් බැන්දහ. කරත්තය නිසලවිය. තොන් ලනුව කැඩුනි. භික්ෂූන් මෙය දැක විහාරයට ගොස් මේ කරුණ දැනුම් දුන්හ. බුදුහු මහණෙනි බාහිර වූ වරපට යම් කෙනෙක් සිඳිද භික්ෂුවක් විසින් ආධ්‍යාත්මික ක්‍රෝධය නැමති යොත සිඳ, තෘෂ්ණා නමැති වරපට සිඳීම වටීයයි කියා මේ ගාථාව දේශනාකළහ.

කොරෝදය	දුරුලා
තණ්හාව	ඇතිවළලා
මිසදිටුව	සිඳලා
ඇත්ද ඔහු බමුණාය	කියලා

යම්කෙනෙක් සියළු දස සංයෝජන දුරුකොට සිටි හෙයින් ඒකාන්තයෙන් නැති නොගත්තේද ක්‍රෝධය නැමති දැඩි රැහැනද තෘෂ්ණ නැමති වරපටද සප්තානුශයන් සහිතවූ දෙ සැට මිත්‍යාදෘෂ්ටිය නැමති යදමද සිඳ දමා උදුරා දැමූ අවිද්‍යානැමති හිදි පළිස ඇති සවිසස් දන්නා වූ තැනැත්තා බ්‍රාහ්මණ නමින් මම හඳුන්වමි. එහි **නන්දිං** යනු පමුණුවන නිසා පවතින ක්‍රෝධයයි වරනතනනි බැඳීම් වශයෙන් පවතින තෘෂ්ණාවයි. **සහදාමං සහනුක්කම** යනු අනුශය අනුක්‍රම සහිත දෙසැටක් මිථ්‍යා දෘෂ්ටි නම් මේ සියල්ල සිඳදමා, අවිජ්ජා පලිසය **උක්ඛිත්ත පලිසං බ්‍රාහ්මණං** චතුරාර්ය සත්‍ය අවබෝධ

කරගත් හෙයින් "බුද්ධං බ්‍රාහමණං" බ්‍රාහ්මණ යයි කියමි යනි අර්ථයි.

මේ දෙසුම අවසන පන්සියයක් භික්ෂූහු රහත් බැවින් පිහිටියහ. පැමිණි අයටද දෙසුම සාර්ථක විය.

බ්‍රාහ්මණයින් දෙදෙනා පිළිබඳ කථා පුවතයි.

26.16

"අක්කොසං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ සිටියදී අක්කෝසක භාද්රවාජ නිමිත්තිකරගෙන දේශනා කළහ.

ඔහුගේ සොහොයුරා භාරද්වාජ බමුණාට ධනඤ්ජානි නම් වූ බැමිණියක් වූවාය. ඕ තොමෝ සෝවාන් වූ තැනැත්තියකි. ඔ කිවිසුම් යන විටද - කසින විටද පැකිළෙන (හැපෙන) විටද "න මොතඤ්ඤ භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්සා" යන මේ උදානය පවසයි. ඇය එක් දිනක් බමුණා ආහාර ගන්නා විටකදී පැකිළී (හැපී) මහ හඬින් එලෙසම උදානය පැවසුවාය. බමුණා කිපී වසලිය නි එතැන මෙතැන හැපී ඒ මුඩු මහණගේ ගුණ කියයි. කියා වසලිය දැන් මම එහි ගොස් තිගේ ඒ ශාස්තෘවරයාට වාදය ආරෝපනය කරන්නෙමියි වාද ආරෝපනය කර ඔහු පරදවමියි කීය එසේ නම් යන්න බමුණ ! මම ද ගොස් බලාසිටිමි. යම් කෙනෙක් බුදුන්ට වාදනගාද දිනු කෙනෙක් නැත තාද එහි ගොස් වාදනගවා ඔහු බුදුන් වෙත ගොස් නොවැඳ එකත්පස සිටියේ ප්‍රශ්න අසමින් මෙම ගාථාව පැවසීය.

කුමක් නිසා සුවසේ සිටීද කුමක් නසා ශෝක නොකෙරේද කවර එක ධර්මයක්හුගේ නැසීම යහපත්ද?

ක්‍රෝධය නසා සුවසේ සිටී. ක්‍රෝධය නසා ශෝක නොකෙරේ. විෂක් බඳු වූ විපතට මුල් වූ ක්‍රෝධය නැසීමම ආර්යයෝ පසසති එයද දමා ශෝක නොකරති.

ඔහු බුදුන් කෙරෙහි පැහැදී පැවිදි වී රහත් බවට පත්වුනි. අනතුරුව ඔහුගේ බාල සොහොයුරාද භාරද්වාජද සහෝදරයා පැවිදිවීයයි අසා කීපී අවුත් බුදුන්ට අසභ්‍ය වූ එරුසවු වචනවලින් නින්දා කළේය. ඔහුද බුදුන්ගේ ආගන්තුකයින් විසින් ගෙනා දෙයක් බාර නොගන්නා උපමාව දක්වා සැසඳුවිට බුදුන් කෙරෙහි පැහැදී පැවිදි වී රහත් බවට පත්වුනි. අනෙක් සුන්දරික

භාරද්වාජද විලිඬ්ගක භාරද්වාජද යන කණිටු සහෝදරයන් දෙදෙනා බුදුන්ට ආක්‍රොෂ කරන්නට අවුත් බුදුන් විසින් හික්මවා පැවිදි කරවා රහත්බවට පත්වුනි.

එක් දවසක් දම්සභාවේ කථාවක් ඉපදවුහ. ඇවැත්නි බුදු ගුණ ආශ්චර්ය වේ. සහෝදරයන් සිව් දෙන ආක්‍රොෂ කරද්දීම බුදුහු කිසිවක් නොකියා ඔවුන් පැවිද්දෙහිම පිහිටුවීය. තථාගතයන් වහන්සේ පැමිණ කිනම් කථාවකින් යුතුව සිටියෝ දැයි විමසා මෙය පැහැදිලි කළවිට මහණෙනි මම ක්‍ෂාන්ති බලයෙන් යුතුවූ නිසා දුෂ්ඨයින්ට දුෂ්ටනොවී මහජනයාට පිහිට වීමි පවසා මේ ගාථාව වදාළහ.

තරහ සින නැති	**කොට**
කොරෝදය දා	**ඉවතට**
ඉවසීම බල	**කොට**
සිටින්නා බමුණාය	**හැමවිට**

යම් පුද්ගලයෙක් දශ ආක්‍රොශ ද වධ බන්ධනද දුෂ්ට නොවුයේ ඉවසාද, ක්‍ෂාන්තිය බලය කොට ඇත්තේද නැවත නැවත උපදනා එම ක්‍ෂාන්තියම බලය කොට ඇති අන්තිම සිරුර දරණ තැනැත්තා බ්‍රාහ්මණ යයි මම කියමි.

තත්‍ථ අදුට්ඨොති මේ දශ ආක්‍රෝෂ වස්තූන්ගෙන් අක්‍රෝෂ කරද්දීද අත් ආදියෙන් තලන කල්හිද, අන්‍රුබන්ධන ආදී බැදුම් ආදියේදී යම් කෙනෙක් ක්‍රෝධ නොවන සිත් ඇතිව ඉවසාද ක්‍ෂාන්ති බලයෙන් යුතුවූ **ඛනති** බලං නැවත නැවත ඇතිවන්නා වූ ක්‍ෂාන්ති බලය නම් වූ බලාණිකං බල ඇණියෙන් යුත් ඔහු බ්‍රාහ්මණයයි කියමි

දේශනය අවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී ඵලයන්ට පත්වුහ.

අක්කෝසක භාරද්වාජ පිළිබඳ වූ කථා ප්‍රවතයි.

26.17

"අක්කොධ නං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළු වනාරාමයේ වැඩ සිටියදී සැරියුත් තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

එදින සැරියුත් තෙරුණුවෝ පන්සියයක් භික්ෂූන් වහන්සේලා සමග පිඬු පිණිස හැසිරෙමින් නාලක ගමේ මවගේ ගේදොරට වැඩමකළහ. අනතුරුව ඇය වාඩිකරවා දානය බෙදමින් ආක්‍රොෂ කළාය. අනුන්ගේ ඉඳුල් බත් කන්නා කැඳ බොන්නා, අනුන්ගේ ගෙවල් වලින් හුනුසහල්වලින් සෑදූ කැඳ බොන්නට ඉඳුල්බත්කන්නට අසූ කෝටියක් ධනය අත්හැර පැවිදි වුයේය. ඔබ විසින් පරිභෝග කළ යුතුද නසන ලදී භික්ෂූන්ට ද බත්දෙමින් තොප විසින් මගේ පුතා තමන්ගේ සුළු උපාසක කරණ ලදී දැන් අනුභව කරන්නැයි කියයි. තෙරුන් වහන්සේ භික්ෂාව ලබාගෙන විහාරයටම වැඩමකළහ. ඉක්බිති අයුස්මත් රාහුල තෙරණුවෝ බුදුන් පිණ්ඩපාතයෙන් විමසුහ. අනතුරුව බුදුහු මෙසේ පැවසුහ. රාහුල කොහි ගියේද? ආර්යයන් වහන්සේගේ නිවසට ගියෙමි. ඔබේ ආර්යයන් කවුද? උපාධ්‍යයන් වහන්සේ ගැන කීවෙමි. ආර්ය උපාධ්‍යායන් වහන්සේ කිපුනේ නැත. කුමක් කියාද? මේදෙය කියන ලදී උපාධ්‍යායන් සමග ඔබ කුමක් කීවේද, කිසිවක් නැත. ස්වාමිනි. මෙය අසා භික්ෂූන් ධර්ම සභාවේ කථාවක් ඇතිකළහ. ඇවැත්නි සැරියුත් තෙරුන්ගේ ගුණ ආශ්චර්යය වෙලෙස උන්වහන්සේගේ මෑණියන් ආක්‍රෝශ කරණ විට ක්‍රෝධ මා ත්‍රයක් හෝ නොවීය. බුදුරදුන් පැමිණ කිනම් කථාවකින් යුතුව සිටියේදැයි විමසා මේ පිළිබඳවයයි පැවසුවිට මහණෙනි ! රහතන් වහන්සේලා නම් ක්‍රෝධ යෙන් තොරයයි පවසා මෙම ගාථාව පැවසුහ.

දුනඟදර	සිල්වත්
නොකිපෙන කෙනා	ගුණවත්
දරණ අන්තිම	අත්
ඔහුම බමුණෙකුවේය	දැනුවත්

නොකිපෙන සුළුවු ධෘතාඞග චෘත ඇති සිල්වත් වූ, තෘෂ්ණ සෙනහයෙන් තෙත් නොවූ දැමුන තැනැත්තා ශරීර ඇති තැනැත්තා මම බ්‍රාහ්මණයයි කියමි.

එහි **චතවත්තං** ධුතඞග ගුණවලින් සමන්විත වූ, සිවිපිරිසිදු සිල්වලින් යුතු **සීලවන්තං** - තණ්හා ස්නේහයෙන් තෙත් නොවූ, **අනුසසුතං** සය ඉඳුරන් දමනය කළ **දන්තං** සසර කෙළවර අන්තම ආත්ම භාවයේ සිටි, **අනතිමතං සාරීරං තං අහං බ්‍රාහ්මණං** ඔහු බ්‍රාහ්මණයා යයි මම කියමි.

දේශනාවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී ඵලවලට පැමිණියාහුය.

සැරියුත් තෙරුන් පිළිබඳ කථා ප්‍රවෘත්තයි.

26.18

"වාරිපොක්ඛර පත්තෙවා" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩසිටියදී උප්පල වණ්ණා තෙරණියන් නිමිති කරගෙන දේශනා කළහ.

කථා වස්තුව මධුවා මඤ්ඤති බාලෝ යන ගාථා වර්ණනාවේ විස්තර කෙරෙයි. ඉන් පසු කාලයේදී මහජනයා ධම්සභාවේදී කථාවක් ඇතිකළහ. රහතුන් වහන්සේලාද කාම සේවනයේ යෙදෙති. ඇයි නොයෙදෙන්නෙ ඔවුහු ගස් නොවේ තුඹස් නො වේ මස් ලේ සහිත සරීර ඇත්තෝයි. එනිසා ඔවුන්ද කාම සැපය විඳගනිති. බුදුරදුන් පැමිණ කිනම් කථාවකින් යුතුව සිටියෝදැයි විමසා මේ පිළිබඳව යයි පැවසුවිට මහණෙනි රහතන් වහන්සේලා කාමසුව නො විඳිති. කාම සේවනය නො කරති. යම්සේ නෙළුම් කොලයේ වැටුන ජලබිඳුවසේ නො ඇලේ. නොපිහිටයි. වැටී පෙරලී යයි. මේ ලෙසට රහතන් වහන්සේගේ සිතේ ද්විවිධ වූ කාමයෙහි නොඇලේ. නොපිහිටයි. එකිනෙකට සම්බන්ධකර ධර්මදේශනා කරන්නේ මෙම ගාථාව පැවසුහ.

නො ඇලෙන පරිදි අබ ඇට ඉදි කටු මු	ණෙක
නො රැඳෙන පරිදි දියබිඳු මුදු අල	පතෙක
පස්කම් සුව පනා එහි නො ඇලෙන	කලෙක
බමුණා ඔහුම යයි සඳහන් වෙයි	ගයෙක

නෙළුම් කොලයේ ජලය ඉදිකටුමුණෙහි අබ ඇටයක් නොරඳන මෙන් යමෙක් කාමයන්හි නො ඇලේද ඔහු බ්‍රාහ්මණ යයි කියමි.

එහි යො න ලිම්පති මේ ලෙසට යමෙක් අභ්‍යන්තරයේ ද්විධවූ කාමයෙන්හි නොඇලේ ද යම්තැනක කාමය නොපිහිටාද ඒ විරාගී තැනැත්තා ..... බ්‍රාහ්මණ යනුවෙන් හඳුන්වමි.

දේශනය අවසානයේ බොහෝදෙන සෝවාන් ආදී මාර්ගඵලයන්ට පත්වුහ.

උප්පලවණ්ණා තෙරණිය පිළිබඳ කථා පුවතයි.

26.19

"යො දුක්ඛඤ්ච " යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී එක්තරා බමුණෙක් නිමිති කරගෙන දේශනා කළහ.

එක්තරා දාසයෙක් - ශික්ෂාපද ප්‍රඥප්ති පැනවීමට පෙර පළාගොස් පැවිදි වී අර්හත්වයට පත්වුනි. බ්‍රාහ්මණයා ඔහු බලා නොදැක එක් දිනක් බුදුන් හා පිඬුසිඟා පිවිසෙන දොරමුව අතර දැක සිවුර දැඩිව අල්ලා ගත්තේය. බුදුන් නතරවී ඇයි බ්‍රාහ්මණයයි විමසුවේය. භවත් ගෞතමයෙනි මේ මගේ දාසයෙකි. බ්‍රාහ්මණය මොහු පන්න හාරය පන්නහාර කී විට බ්‍රාහ්මණයා රහත් යයි සැලකුවේය. එනිසා දෙවනුවද පින්වත් ගෞතමයෙනියි පැවසුවිට බුදුරජාණන් වහන්සේ එසේය බ්‍රාහ්මණය බහා තැබූ බර ඇති යනුවෙන් පවසා මෙම ගාථාව දේශනා කළහ.

දුක දුකෙහි වෙනසත්
මේ අන්තිම දකින් නම්
බහා පව් කඳ බරින් මිදුනා
ඔහුම බමුණෙක් වේය පවසත්

යම් කෙනෙක් ජීවතය ක්ෂයවේයයි තමන් දැනගතීද තම දුක නැසීම පිළිබඳ දැන ගනීද වහා තැබූ බර ඇත්තේද, කෙලෙසුන්ගෙන් මිදුනා වූ ඒ නැනැත්තා බ්‍රාහ්මණයයි මම කියමි.

නහර - එහි **දුක්ඛඤ්ච** දුක්ඛස්කන්ධයයි **පනහාර** නම් බිම තබන ලද ස්කන්ධ භාරයයි. යෝග හතරෙන් හා සියළු කෙලෙස් වලින් **විසං යුත්ත වෙන් වූ** , විෂයන්ත වූ ඔහු බ්‍රාහ්මණයයි කියමි.

දේශනාවසානයේ බ්‍රාහ්මණයා සෝවාන් ඵලයේ පිහිටියේය. පැමිණි අයටද දෙසුම සාර්ථක විය.

එක්තරා බ්‍රාහ්මණයෙකු පිළිබඳ කථා පුවතයි.

26.20

"ගම්භීර පඤ්ඤං " යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ගිජ්ඣකූළු පර්වතයේ වැඩසිටියදී ඛේමා භික්ෂුණිය නිමිති කරගෙන දේශනාකළහ.

එක් දිනක් පළමු යාමය අවසානයේ සක්දෙවිඳු දෙව් පිරිස සමග පැමිණ බුදුන් සමීපයේ සිහිකටයුතු ධර්මකථා අසමින් වාඩි විය. මේ අවස්ථාවේදී ඛේමා තෙරණිය බුදුන් දකිමියි අහසින් පැමිණ සක් දෙවිඳු දැක අහසේ සිටියදීම බුදුන් වැඳ නැවතුනාය. සක්දෙවිඳු ඇය දැක ස්වාමිනි මැය කවුදැයි විමසුවේය. ඇය එමින් සිට අහසේ සිටම වැඳ පැවතුනි. බුදුහු මහරජ මගේ දියණියන් ඛේමාය. ඇය මහා ප්‍රාඥයහ. මගහා මගඵ ඤාණයෙහි ඉතා දක්ෂයයි පවසා මෙම ගාථාව පැවසුහ.

විදසුන් නැණ සමග
කඳ පිළිබඳ නුවණ
ගැඹුරින් ඇති රහත් නම
උතුම් බමුණෙක් වේ මැයි.

ප්‍රඥාවන්ත වූ ගැඹුරු නුවණ ඇති. මග නොම දැනුමෙහි සමත් රහත්ඵලයට පත් තැනැත්තා මම බ්‍රාහ්මණ යයි පවසමි.

එහි ගම්භීර පඤ්ඤනති - ගැඹුරුවූ ස්කන්ධ ආදීන්හි ප්‍රඥාවෙන් යුතුවූ ප්‍රඥාව ඇති ධර්මෝජ ප්‍රඥාවෙන් යුත් **මෙධාවිං** මෙය දුගතියයි. මෙය සුගතියයි. මෙය නිර්වාණ මාර්ගයයි. මෙය නොමගයි ආදී වසයෙන් මගෙහිද නොමගෙහිද දක්ෂවූ බැවින්, **මහා මඟසඤ්ඤ කොවිදං.** අර්හත් භාවයට **උත්තමත්ථං** අනුප්පත්තං තමහං බ්‍රාහ්මණං පැමිණි ඔහු බ්‍රාහ්මණ යයි මම කියමි.

දේශනය අවසානයේ බොහෝ දෙන සෝතාපන්න ඵල ආදියට පත්වූවාය.

ඛේමා තෙරණිය පිළිබඳ වූ කථා පුවතයි

26.21

"අසං සටයං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ සිටියදී පඬිභාරවාසී තිස්ස තෙරුන් නිමිති කරගෙන දේශනාකළහ.

උන්වහන්සේ බුදුන්ගෙන් කර්මස්ථාන ගෙන වනයට පිවිස හොඳ සුදුසු සෙනසුනක් බලන්නේ. එක් කඳු බැවුමක ගල්ලෙනක් වෙත පැමිණුනි. පැමිණි වේලාවේදීම උන්වහන්සේගේ සිත එකඟ බවක් ලදහ. උන්වහන්සේ මට මෙහි වාසයකිරීමෙන් පැවිදි කාර්යය සාක්ෂාත් කිරීමට නැකිවන්නේයයි සිතුවේය. ලෙණෙහි අධිගෘහිත දෙවියාද සිල්වත් භික්ෂුවක් පැමිණියේය. මුන් වහන්සේ හා එකමතැන වාසය කිරීම දුකකි. මේ තෙමේ මෙහිම එක් රැයක් ඉඳ පිටත්ව යන්නේයයි සිතා පුතුන් රැගෙන නික්මුනි. තෙරුන් වහන්සේ දෙවන දවසේ අළුයම ගොදුරු ගමට පිඩු පිණිස පිවිසුනි. අනතුරුව එක් උපාසිකාවක් දුටුවිගස පුත්‍ර ස්නේහයක් ලැබ ගෙයි වාඩි කරවා වළඳවා නමන් නිසා තුන්මාසයක් වාසය කිරීමට ඉල්ලා සිටියාය. ඔහුද මැය නිසා භවනිස්සර කිරීමට හැකිවේයයි සිතා අරාධනය පිළිගෙන එම ලෙණටම වැඩම කළේය. දෙවිදුව ද තෙරුන් එනු දැක ඒකාන්තයෙන් කිසිවෙක් විසින් ආරාධනා කරණ ලද්දේ වෙතැයි හෙට හෝ අනිද්දා හෝ යන්නේයයි සිතුවාය මෙලෙස අඩමසක් කෙලවර මේ භික්ෂුව මෙහිම තෙමසක් වස්වාස ඇතුලත වාසය කරනු ඇත. සිල්වත් අය හා එකට පුතුන් සමග වාසය කිරීම දුෂ්කරය. මොහුට නික්ම යන්නයි කීමද අපහසුය. මොහු ගේ සීලයේ කිලිටි තැනක් ඇත්දැයි දිවැසින් බලන්නී, උපසම්පදා මාලකයේ පටන් උන්වහන්සේගේ සීලයේ කිලුටක් නොදැක මොහුගේ සීලය පිරිසිදුය. කිසියම් අපකීර්තියක් ඇතිකරමියි උන්වහන්සේගේ උපටඨායක කුලයේ උපාසිකාව ගේ ජ්‍යෙෂ්ඨ පුතුගේ ශරීරයට ආවේශ වී ගෙල අඹරුවේය ඔහුගේ ඇස් එළියට නික්මුනි. කටින් කෙල වැගුරුනි. උපාසිකාව මේ දැක මේ කුමක්දැයි මහ හඬින් කෑගැසුවේය. මේ අතර දේවතාවිය නොපෙනෙන ලෙසට මෙසේ කීවාය. මා විසින් මොහු ගන්නා ලදී. බලිකර්ම වලින්ද මට වැඩක් නැත. ඔබගේ කුළුපග තෙරුන්ගෙන් වැල් මී ඉල්ලාගෙන එයින් තෙල් සාදාගෙන මොහුට නස්න කර්මයක් දෙන්නැයි එයින්ම මම මොහු

මුදවමියි. ඔහු නැසේවා මියැදේවා මම ආර්යයන් වහන්සේගෙන් වැල් මී ඉල්ලා ගැනීමට නොහැකිවෙමි. ඉදින් වැල්මී ඉල්ලා ගැනීමට නොහැකිනම් මොහුගේ නැහැයට පෙරුම්කායම් කුඩු දමන්නැයි කියන්න. මෙයද කිරීමට කිව නොහැකිය. එසේ නම් ඔහුගේ පාසෝදන ජලය හිසට දමන්න. උපාසිකාව මෙය කිරීමට හැකිය වෙලාව ආවිට තෙරුන් වාඩි කරවා කැඳ බත් පිරිනමා දන්ගන්නා අතර වාඩි වී සිටි තෙරුන්ගේ පා සෝදා ජලයගෙන, ස්වාමීනි මේ ජලය දරුවාගේ හිසේ වත්කරමි.යි විචාරා එසේ ඉසින්නැයි කී කල එසේ කළාය.

දෙවි දුව එකෙනෙහි ඔහු මුදා ගොස් ලෙන් දොර සිටියාය. තෙරුන් ද දන්වළඳා අවසානයේ අසුනින් නැගිට නොවිසිරුනු කර්මස්ථානය නිසා දෙතිස් කුණප භාවනාව සජඣායනා කරමින්ම පිටත්ව ගියේය. අනතුරුව ලෙන් දොරට පැමිණි විට එම දෙවිදුව මහා වෛද්‍යවරය මෙයට නෝ පිවිසේවයි කීවාය. උන්වහන්සේ එහිම සිට නුඹ කවරෙක්දැයි විමසුවේය. මම මෙහි අධිගෘහීත දේවතාවායි මම වෙදකමක් කළ තැනක් තිබේද උපසම්පදා මාලකයේ සිට බලන්නේ ඇටයක්හෝ හෝ කළු හාල් ඇටයක් පමණටත් කැලලක් නොදක මම ම විසින් වෛද්‍යකර්මයක් කළ තැනක් නොදකිමි. කුමක් නිසා මෙසේ කියයිද? ඔබ දකින්නේ නැත්ද? එසේය මම් නොදකිමි. ඔබට කියන්නද? හොඳය කියන්න. අතීතය තිබේවා අද ද නුඹ වහන්සේගේ පා සේදූ ජලය අමනුෂ්‍ය ආවේෂයට පත් උපස්ථාසිකාවගේ පුතුගේ හිසේ වත්කලේ නොවේද? එසේය වත්කළේය. ඇය එය නොදක්නේද ඒ පිළිබඳව ඔබ කුමක් කියයි ද? ඔව් එය සම්බන්ධකර කියමි. තෙරුන්වහන්සේ සිතූහ. අහෝ පුදුමයි මනාව පිහිටුවන ලද ආත්මය සසුනට අනුරූප ලෙස ඇති මගේ චරිතය දෙවියෝද මගේ චතුපාරිශුද්ධ සීලයේ කලංකයක්හෝ කළු හාල් ඇටයක් තරමවත් කැලැක් නොදකම, දරුවාගේ හිසේ වත්කරණ ලද පාසේදූ ජලය දැමීම පමණක් දුටුවේයයි උන්වහන්සේගේ සීලය පිළිබඳ බලවත් ප්‍රීතියක් උපනි

උන්වහන්සේ එය මැඩ පවත්වා පාදය එසවීමක් හෝ නොකොට එහිම අර්හත්වයට පත්ව මා වැනි පිරිසිදු ශ්‍රමණයෙක් දූෂණය කර මා වසන තැන නොසිට ඔබ වහාම මෙතැනින් නික්මෙවයි නිවේදනය කිරීමට අවවාද

කරන්නේ මේ උදානය පැවසුහ.

මගෙ තපස නිමල වෙයි
නිවහනද පිරිසිදුයි
දූෂණය නොකර මා
දැන් නික්ම යනු හොඳයි

මම නිර්වල තවුසෙකි. මගේ වාසය පිරිසිදුය. විසුද්ධ වූ මා දූෂණය නොකරන්න ඔබ මෙතනින් නික්ම යන්න.

උන්වහන්සේ ඒ ගුහාවෙහිම තෙමසක් ගතකර වස් පවාරණ කොට බුදුන් වෙතට ගියකල්හි, භික්ෂූන් විසින් කිම ඇවැත්නි පැවිදි කාර්යය ඔබ වහන්සේගේ ඉටුවුවේදැයි විමසන ලද්දේ, භික්ෂූන් විසින් ඇසු ප්‍රශ්නයට පිළිතුරු දෙමින් තමන් ගල් ලෙනේ වස් සමාදන් වූ තැන්සිට ඒ සියළු පුවත් භික්ෂූන්ට දන්වා සිටියේය. ඇවැත්නි ඔබ වහන්සේ දේවතාවියට එලෙස කියනවිට නො කිපුනේදැයි විමසුවිට, නැත මම කිපුනේ නැත. භික්ෂූන් වහන්සේලා තථාගතයන් වහන්සේට දනුම් දුන්හ. ස්වාමීනි මේ භික්ෂුව වෙනෙකක් පවසයි. බුදුරදුන් ඔවුන්ගේ කථාව අසා මහණෙනි මගේ පුත්‍රයා කිසි දිනෙක නොකිපේ මොහුගේ ගිහියන් සමග හෝ පැවිදි අය සමග හෝ ඇලීමක් නැත. මොහු අල්පේච්ඡය තුටු පහටුය යි පවසා ධර්මය දේශනා කරන්නේ මේ ගාථාව වදාළහ.

ගණයා කෙරෙහි හා
කුලයා කෙරෙහි නො ඇලුණු
අපිස් දිවියක් ඇති
උතුමා නියම බමුණෙකි.

ගිහියන් සමගද පැවිද්දන් සමගද යන දෙපාර්ශවයෙහිම සංසර්ග නැති තෘෂ්ණා ආලයෙහි නොහැසිරෙන අල්පේච්ඡ වූ භික්ෂුවට මම බ්‍රාහ්මණයයි කියමි.

504

එහි අසංසට්ඨං දර්ශනය - ශ්‍රවණය කථාව පාරිභෝගය කාය සංසර්ග අභාවයෙන් අසංසට්ඨ ගිහියන් හා ද පැවිද්දන් හා ද සංසර්ග ඇලීම් නැති යන අර්ථයි **අනොකසාරී** අනාලය චාරී මෙබඳු අය මම බ්‍රාහ්මණ යයි පවසමි.

දේශනය අවසානයේ බොහෝදෙන සෝවාන් ඵලය ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

පබ්භාරවාසි තිස්සතෙරුන් පිළිබඳ වූ කථා පුවතයි.

26.22

"නිධායා" ආදී මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ සිටියදී එක්තරා භික්ෂුවක් නිමිති කරගෙන දේශනා කළහ.

එම භික්ෂුව බුදුන් වෙතින් කර්මස්ථාන ගෙන අරණ්‍යයේහි උත්සහ කරමින් රහත්බවට පත්ව ලබන ලද ගුණය බුදුන්ට දැනුම් දෙමියි ඉන් නික්මුනහ. මේ අතර එක් ගමක එක් ස්ත්‍රියක් ස්වාමියා සමග කලහ කර ගෙයින් පිටවියන්නේ තම ගෙදරට යන්නෙමියි. මගට පිළිපන්නේ අතර මගදී මේ තෙරුන් දැක මොහු සමග යන්නෙමියි පසුපසින් ගියාය. තෙරුන් වහන්සේ ඇය නො දුටුවේය. අනතුරුව ඇගේ සැමියා ගෙට ආවේ ඇය නොදැක ඇගේ නිවසට යන්නට ඇතැයි සිතා ලුහුබඳින්නේ ඇයට හුදකලාව මේ වනය පසුකිරීමට නොහැකියයි කවුරුන් නිසා යන්නේදැයි බලන්නේ තෙරුන්දැක ඔහු මැය රැගෙන යන්නේයයි සිතන්නේ තෙරුන්ට තර්ජනය කළේය. අනතුරුව එම ස්ත්‍රිය මේ තෙරුන් වහන්සේ මා නො දුටුවේය. මා හා කථා නො කළේය. කිසිවක් නො කීවේය.හෙතෙම කිමෙක්ද, ඔබව මොහු විසින්ම ගෙන ගියත් ඔබ ඇත්ත කියන්නේ ද, ඔබට කළයුතු දේ මොහුට කරමියි උපන් ක්‍රෝධය ඇත්තේ ස්ත්‍රිය සමග ආඝාතයෙන් තෙරුන්ට තලා ඇය රඳවාගෙන නැවතුනි. තෙරුන්ගේ මුළු සිරුර හටගත් ගඩු ඇත්තේ විය. අනතුරුව විහාරයට ගිය විට භික්ෂූන් සිරුර සංවිධානය කරමින් ගඩු දක මේ කුමක්දැයි විමසුහ. උන්වහන්සේ තමන්ට සිදුවූ දෙය ඔවුන්ට පැවසුහ. අනතුරුව භික්ෂූන් වහන්සේලා ඇවැත්නි ඒ පුරුෂයා මෙලෙස පහර දෙන විට කුමක් කීවේද ඇයි කෝපයන් ඇතිවුයේ නැත්ද නැත. ඇවැත්නි මට කෝපයක් ඇති නොවීයයි පැවසුවිට බුදුන් වෙත ගොස් මෙම තොරතුරු පැවසුහ. මට ක්‍රෝධය ඇතිනොවූ වේයයි අභූතයන් කියයි. අන් දෙයක් පවසයි. බුදුහු ඔවුන්ගේ කථා අසා මහණෙනි රහතන් වහන්සේලානම් බැහැර කරණ ලද දඬුවම් ඇත්තේ පහර දුන් විටද ක්‍රෝධ නොකරයි යනුවෙන් පවසා

506

බියෙන් තැති ගත් නොගත්
සතුන් නොමරන හා නොමරවන
උතුම් මිනිසා මෙලොවේ
බමුණෙකි රහත් උතුමෙකි.

යමෙක් තැති ගන්නා වූද තැති නොගන්නා වුද සත්ත්වයන් කෙරෙහි කාය දණ්ඩය බහාතබා තෙමේ කිසිවෙක් නො මරාද අනුන් ලවා නො මරවාද ඔහුට මම බ්‍රාහ්මණයයි කියත්.

එහි නිධායා යනු - තබා බහාතබා **තසෙසු ථාවරෙසු** තණහවෙන් බිය වූ තෘෂ්ණ අභාවයෙන් ස්ථිර වූ යමෙක් **න හනති** නොනසාදමෙසේ සියළු සත්ත්වයන් කෙරෙහි පහවූ ක්‍රෝධය බහාතබා ඇති උතුමා මම - බ්‍රාහ්මණ යනුවෙන් හඳුන්වමි.

දෙසුම අවසානයේ බොහෝදෙන සෝවාන් ඵලාදියට පත්වූහ.

එක්තරා භික්ෂුවක් පිළිබඳ කථා පුවතයි.

26.23

"**අවිරුද්ධං**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී සාමණේරවරුන් සිව් නමක් පිළිබඳව දේශනා කළහ.

එක් බැමිණියක් භික්ෂූන් සතර නමක් උදෙසා බත් උයා මහල්ලක බ්‍රාහ්මණයින් සිව් දෙනෙක් උදෙසීම පිණිස වඩමවා ගෙන එන්නැයි තවත් බමුණෙකුට කීය. ඒ බමුණා විහාරයට ගොස් මට බ්‍රාහ්මණයන් සතර නමක් දෙන්නැයි පැවසුවේය. එහි සංකිච්ච පණ්ඩිත සෝපාක - රේවත යන සත්වයස් ඇති සාමණේර රහතන් වහන්සේලා පැමිණියාවුහ. බැමිණිය මහ උසස් අසුන් පනවා බලාසිටි සාමණෙර තෙරවරු දැක කෝපයට පත්ව ලිපට දැමූ ලුණුසේ කටකට ගා වෙවුලුවේ විහාරයට ගොස් තමන්ගේ මුණුබුරන් තරම්වත් නැති පොඩිවුන් සතර දෙනෙක් ගෙන ආවේයයි ඔවුන්ට ඒ ආසනවල වාඩි වීමට ඉඩ නොදී පහත් පුටු අතුරා මේ අසුන්වල වාඩිවන්න වෙන්නැයි කියා බ්‍රාහ්මණය යන්න මහළු භික්ෂූන් බලා ගෙන එන්නැයි පිටත් කළාය. බමුණා ගොස් සැරියුත් තෙරුන් දැක වඩින්න අපේ නිවසට වඩින්නැයි කැඳවාගෙන ආවේය. තෙරුන් පැමිණ සමණේර භික්ෂූන් දැක මේ බ්‍රාහ්මණයින් විසින් දානය ලබන්නට ඇතැයි විමසා නොලද බව අසා සතර නමකට ආහාර පිළියෙළ කළ බව අසා මගේ පාත්‍රය ගෙන එන්නැයි ඉල්ලාගෙන ආපසු වැඩමකළහ. බැමිණිය ද මෙසේ වූයේ කිමදයි විචාරා, සතර දෙනකුට පිළියෙළ කළ දානය බැවින් ආපසු ගිය බව දැන, වහා ගොස් වෙනත් මහළු භික්ෂූන් සතරනමක් වඩමවාගෙන එන්නැයි යැවීය. එහිගිය බමුණා මුගලන් තෙරුන් දැක එලෙසට කියා කැඳවාගෙන ආවේය. උන්වහන්සේ ද සාමණේරවරු දැක එලෙසටම කියා පාත්‍රය ගෙන වැඩම කළේය.

අනතුරුව ඇය බමුණාට මෙසේ කීවාය. බ්‍රාහ්මණ බමුණු අරමකට ගොස් එක් මහළු බමුණෙක් කැඳවාගෙන එන්නැයි මේ අතර සාමණේර වරුද උදේ අළුයම සිට කිසිවක් නොලැබ කුසගින්නෙන් පෙළී වාඩිවී සිටියහ. උන්වහන්සේලාගේ ගුණ තෙදින් සක් දෙවිඳුගේ අසුන උණුවිය. ඔහු

බලන්නේ ඔවුන් අළුයම සිට ක්ළාන්ත බව දැන මව්සින් එහි යාම කළ යුතුයයි ජරා ජීර්ණ මහළු බමුනෙකු ලෙසට වෙස් වලාගෙන එම බමුණන්ගේ උතුම් ආසනයේ වාඩි වුයේය. බ්‍රාහ්මණයා ඔහු දැක දැන් බැමිණිය සතුටුවේයයි සිතා නිවසට කැඳවාගෙන ගියේය. බැමිණිය ඔහු දැක සතුටුවී ආසන දෙකක ඇතිරිලි එක අසුනකට දමා ආර්යනි මෙහි වාඩිවෙන්නැයි පැවසුවේය. සක් දෙවිඳු ගෙට පිවිස සාමණේරවරු සිවුනමට පසඟ පිහිටුවා වැඳ ඔවුන් ගේ ආසන කෙලවර බද්ධ පර්යකයෙන් වාඩි විය. මෙහිදි බැමිණිය බමුණාට ඔබ බ්‍රාහ්මණයෙක් නමුත් මොවුන්ගේ පියා සමාන කෙනෙක් ගෙන ආවේය. නමුත් ඔහු තම මුණුබුරන් සමාන පොඩි අයට වදියි. මට මොහුගෙන් වැඩක් නැත. බැහැර කරන්නැයි කීවාය. ඔහු කඳින්ද අතින්ද කිහිලිලෙන්ද අල්ලාගෙන ඇද දමන්නට හැදුවත් නැගිටින්නට ද කැමති නොවීය.

අනතුරුව බැමිණිය එන්න බ්‍රාහ්මණය නුඹ එක අතකින් ගන්න මම අනිකෙන් ගනිමියි දෙදෙනාම අත්දෙක අල්ලාගෙන පිටට තලමින් දොරින් එළියට කළහ. සක් දෙවිඳුද හුන් තැනම සිටියේ අත පෙරලුවේය ඔවුන් නැවතී වාඩිවී සිටිනු දැක කෑගසමින් එළවා දමුහ. එකෙනෙහි ශක්‍රයා තමන් සක් දෙවිඳුබව පෙන්වීය. අනතුරුව ඔවුන්ට ආහාර දුන්නාහුය. සාමනේරවරු පස්නමම ආහාර ගෙන එක් නමක් කැනිමඩල බිඳ වැඩියේය. එක් නමක් පියස්සේ උඩ කොටසද අනෙක් නම පසු භාගයද එක් නමක් පොළවට කිමිදී සක් දෙවිඳුද තවත් තැනකින් නික්ම ගොස් පස් ආකාරයකින් නික්මගියාහුය. එතැන් පටන් එම නිවස සිදුරු පහේ ගෙදර ලෙසට නම් කෙරුනි. සාමණේර වරු ද ගිය විට භික්ෂූන් වහන්සේලා ඇත්ත කුමක් විදුයි විමසුහ. අපෙන් නො අසන්න අප දුටුතැන් සිට බැමිණිය ක්‍රෝධයෙන් පෙළුනේ පනවන ලද අසුන්වල අපට වාඩිවීමටද ඉඩ නො දී වහවහා මහළු බ්‍රහ්මණයින් ගෙන එන ලෙසට කීවාය. අපේ උපාධ්‍යායන් වහන්සේ පැමිණ ආපසු වැඩම කළහ. අනෙක් මහළු බ්‍රාහ්මණයෙක් ගෙන එන ලෙසට පැවසු නිසා මුගලන් තෙරුණුවෝ ගෙන් වුහ. උන්වහන්සේද අපට දැක නික්මී ගියහ. පසුව බ්‍රාහ්මණ ආරාමයෙන් මහළු බමුණෙක් ගෙන්වීය. ඔහු බ්‍රාහ්මණ වේශයෙන් ආ සක් දෙවිඳුවිය. ඔහු ගිය විට අපට ආහාර දුන්හ. මෙසේ කරණ අයට ඔබ නො කිපුනේද නැත නො කිපුනෙමු

භික්ෂූන් මෙය අසා තථාගතයන් වහන්සේට දැනුම් දුන්හ. ස්වාමීනි මේ අය නො කිපුණේයයි අභූතයන් බොරුවක් කියති. තථාගතයන් වහන්සේ රහතුන් වහන්සේලානම් විරුද්ධ වන්නවුන්ටද විරුද්ධ නොවෙතියි පවසා මෙම ගාථාව පැවසුහ.

විරුදු ජන ඇති සබා මැද්දේ
සාමයෙන් සිටිනා යමෙක් වෙද
දඬු මුගුරු ගත් දනන් මැද්දේ
නිරා යුද වී යමෙක් වේවිද
කෙලෙස් ගහණවු පිරිස් මැද්දේ
කෙලෙස් රහිතව යමෙක් වේවිද
ඔහුම රහතෙකි ඔහුම බමුණෙකි
නිසරු සසරින් එතර වූ

විරුද්ධ වුවන් අතර විරුද්ධ නොවුවද ගන්නා ලද දඬු ඇත්තවුන් අතරෙහි නිවුනු සිතැති, පඤ්චස්කන්ධය මමය මාගේයයි ගැනුම් ඇත්තන් අතර එබඳු ගැනීම් නැති අය බ්‍රාහ්මණ යයි මම කියමි.

එහි **අවිරුද්ධං** ආඝාත වසයෙන් **විරුද්ධෙසුපි** ලෞකික මහජනයන් අතර ක්‍රෝධ කිරීමෙන් විරුද්ධ නොවූ, අතින් හෝ දන්ඩකින් හෝ, ආයුධයකින් අනුන්ට පහර දීමෙහි නො ඇලුණු - වෙන්වූ, **අත්තදණ්ඩෙසු** ජනයන් කෙරෙහි, **නිබ්බුතං** දඬුමුගුරු ගැනීමෙන් නික්මුණු, පස් කඳ තමාගේ යයි ගන්නා, **සාදානෙසු** එසේ ගැනීමෙන් වෙන් වූ, **අනාදානං තං** එබඳු වූ, **අහං බ්‍රාහ්මණ** බ්‍රාහ්මණයයි කියමියන අර්ථයි.

දේශනය අවසන බොහෝදෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ම පැමිණියහ.

විසිතුන් වැනි වූ සතර සාමණේරයන්
පිළිබඳ වූ කථා පුවතයි.

26.24

"යස්ස රාගො" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනයේ වැඩ සිටියදි මහාපන්ථක තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

උන් වහන්සේ ආයුෂ්මත් චුල්ල පන්ථක තෙරුන්ට සිව්මසකින් එක් ගාථාවක් ප්‍රගුණ කිරීමට නොහැකි වන්නේ නුඹ සසුනේ පිරිහුන කෙනෙකි. ගිහි සම්පත් ද පිරිහුන කෙනෙකි. මෙහි වාසය කිරීමෙන් කවර ප්‍රයෝජනයක්ද මෙයින් පිටවී යන්නැයි විහාරයෙන් එළියට දමා දොර වැසුවේය.

භික්ෂූන් වහන්සේලා කථාවක් ඉපදවූහ. අයුස්මත් මහා පන්ථක තෙරුන් විසින් මෙබඳු දෙයක් කළේය. රහතන් වහන්සේලාටද ක්‍රෝධ ඇති වේ. තථාගතයන් වහන්සේ පැමිණ මහණෙනි. කිනම් කතාවකින් යුතුව සිටියෝදැයි විමසා භික්ෂූන්ගෙන්ම එම කරුණ දැනගෙන රහතන් වහන්සේලාට ක්‍රෝධය ඇතිනොවේ. මගේ පුතු විසින් අනාගත අභිවෘද්ධිය පෙරටුගෙන හා ධර්මය පෙරදැරි කිරීම මුල්කරගෙන මෙය කරණ ලදැයි පවසා මේ ගාථාව දෙසුහ.

ඉදිකටු මුණක අබැටක් නොරදන ලෙස ට
රා දොස් මාන මකු අව ගුණ සට කප ට
දුරුකොට ගිහින් දැහැමින් නිවසන අය ට
බමුණෙකි කියා නම් කළ හැකිමය අප ට

යම් කිසිවකු විසින් රාගය ද දෝසයද මෝහයද මානයන් ඉදිකටු අතින් ගිලිහෙන්නාවු අබ ඇටයක් මෙන්. හෙලන ලදද ඔහුට බ්‍රාහ්මණයයි මම පවසයි.

එහි **ආරඟා** යමෙකු තුළ ඇති රාගාදී කෙලෙස්, **මකෙඬා** අනුන්ගේ ගුණ මකන. යටපත් කරන සඟවන ස්වභාව ඇති, **ආරඟා සාසපො පතිතො** ඉදිකටු මුණකින් අබ ඇටයක් වැටෙන්නාක් මෙන් නො පිහිටයි. මෙසේ

සිතෙහි ද ක්‍රෝධය නො පිහිටයි. **තමහං බ්‍රාහ්මණං** ඔහුට බ්‍රාහ්මණ යයි කියමි යන අර්ථයි.

දේනාවසානයේ බොහෝදෙන සෝවාන් ආදී මාර්ග ඵලවල පිහිටියහ.

මහා පන්ථක තෙරුන්ගේ කථා පුවතයි.

26.25

"**අකක්කසං**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ සිටියදී **පිළිඳිවච්ඡ තෙරුන් නිමිත්තකරගෙන** දේශනාකළහ.

උන්වහන්සේ එම වසලී - යටි වසලී - මේ ආදිය කියමින් ගිහියන්ටද පැවිදි අයටද වසල වාදයෙන් කථාකරමින් හැසිරෙයි. එක් දිනක් බොහෝ භික්ෂූන් වහන්සේලා මේ බව බුදුන් වහන්සේට දනුම් දුන්හ. බුදුරජාණන් වහන්සේ පිළිඳිවච්ඡ තෙරුන් අමතා මෙය සැබෑදැයි විමසුහ. ස්වාමීනි එසේ යයි පැවසුවිට මෙම තෙරුන්ගේ පෙර විසු කඳ පිළිවෙළ සිහිකර මහණෙනි පිළඳිවච්ඡ තෙරුන්ට දොස් නොකියව. චෝදනා නො කරව මෙය පිළඳිවච්ඡ තෙරුන්ගේ දෝශයක් නොවේ. පිළඳිවච්ඡ තෙරුන් එක දිගට ජාති පන්සියයක්, කුල බ්‍රාහ්මණව උපන්හ. උන්වහන්සේ දිගුකලක් වසලී වාදයෙන් හැසුරුනේය. රහතන් වහන්සේලා කර්කශ ඵරුස වචන. මම ගැටුම ඇති වචන නැත. වැඩි කාලයක් පුරුදු කළ හෙයින් මගේ පුතු මෙසේ කියයි. යනුවෙන් පවසා ධර්මය දේශනා කරන්නේ මේ ගාථාව පැවසුහ.

සබ වසම කියනා
හිත වැඩ පිණිස රඳනා
කුපිත නො කරන දනා
ඔහුම වේ මැයි නියම බමුණ

එහි **අකක්කසං** පරුෂ නොවූ, **විඤ්ඤාපනිං** අර්ථ දැක්වීම, හැඳින්වීම, **සච්චං** සිදුවූ දෙය, සත්‍යය, **නාභිසජෙති යාය**. වචනයෙන් අනුන් කුපිත කිරීම වසයෙන් නොඇලේද. **ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා** මෙබඳුය. **තමහං බ්‍රාහමණං වදාමි** මම ඔහු බ්‍රාහ්මණ යයි කියමි.

යම් වචනයකින් කිසිවෙකු කුපිත නොකෙරේද රුදුරු බවට නො පැමිණෙන්නේද?යහපත සලසන සැබෑ තෙපුල් යමෙක් කියන්නේද. ඒ තැනැත්තා බ්‍රාහ්මණ යයි මම කියමි.

දේශනය අවසානයේ බොහෝදෙනෙක් සෝවාන් ඵලයට පත්වුහ.

පිළිඳිවච්ඡ තෙරුන් පිළිබඳ කථාවයි.

26.26

"යොධ දීඝං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී එක්තරා තෙර නමක් නිමිති කරගෙන දේශනා කළහ.

සැවැත් නුවර එක් මිථ්‍යා දෘෂ්ටික බ්‍රාහ්මණයෙක් සිරුරේ දුගඳ පැතිරෙන හෙයින් උතුරු සළුව බැහැර කොට එකත් පසෙක තබා ගෙයි දොරටුව අභිමුඛයේ වාඩි වී සිටියේය. මේ අතර රහතන් වහන්සේ නමක් දන්වැළදීමෙන් අනතුරුව විහාරය දෙසට වැඩමකරද්දී එම සළුව දැක ඔබ මොබ බලා කිසිවෙක් නොදක්නේ මෙයට ස්වාමීයෙක් නැතැයි පංශකූල පඤ්චෙන් ගන්නා ලදී. අනතුරුව එය බමුණා දැක ආක්‍රොෂ කරමින්ම අවුත් මුඩුමහණ මගේ සළුව ගන්නේද? පැවසීය. බ්‍රාහ්මණය මෙය ඔබගේද එසේය ශ්‍රමණය අයිතිකරු කිසිවෙක් මට නොපෙනුන නිසා පාංශුකූල සංඥාවෙන් ගතිමි. දැන් මෙය ඔබේ නම් ගන්නැයි ඔහුට දී විහාරයට ගොස් මෙම කරුණ භික්ෂූන්ට දන්වා සිටියහ. මොහුගේ වචනය අසා භික්ෂූන් උන්වහන්සේ සමග කවටකම් කරමින් කිම ඇවැත්නි සාටකය දිගද - කොටද මෘදුද ආදිය විමසන්නේ මට එබඳු සංඥාවක් නැත. මට එබඳු හැඟීමක් නැත. දිග - පළල - රළු - සුමුදු ආදිලෙසට මට ඒ පිළිබඳව ඇලීමක් නැත. මම පාංශුකූල සඤ්ඤාවෙන් ගතිමි මෙය අසා භික්ෂූන් වහන්සේලා තථාගතයන් වහන්සේට අභූතය කියා අනෙකක් කියතියි දැනුම් දුන්හ.

අනුන් සතු දේපල
තමනට නුදුන්නා කල
සොරෙන් ගත් නැති අය
බමුණකු වේය නිකසල

මේ ලෝකයේ යම් දෙයක් දික් වූ, කොට වූ. කුඩා වූ, හෝ මහත් වූ, යහපත් වූ හෝ නපුරු වූ, නුදුන් දෙයක් නො ගනීද, ඒ තැනැත්තා බ්‍රාහ්මණ යැයි මම කියමි.

එහි අර්ථය සළුපිළි ආභරණ ආදිය **දීඝංවා රස්සංවා** දිගයි. කෙටියි කියා හෝ

මුතු මැණික් ආදිය අණුං වා ථූලං වා කියා හෝ මහාර්ඝ අල්ප අර්ඝයයි කියාහෝ සුභං වා අසුභං වා යහපත්ය අයහපත්ය කියා හෝ අත් අයගේ දෙයක් නොගනීද ඔහු බ්‍රාහ්මණ යයි කියමි.

දෙසුම අවසන බොහෝ දෙනෙක් සෝවාන් ඵලයට පත්වුහ.

එක්තරා තෙරණමක් පිළිබඳ වූ කථා පුවතයි.

26.27

"ආසා යස්සා" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ සිටියදී සැරියුත් තෙරුන් නිමිත්තකර ගෙන දේශනා කළහ.

තෙරුන් වහන්සේ පන්සියයක් භික්ෂූන් පිරිවරා ජන පදයේ එක් විහාරයකට ගොස් වස් සමාදන් වුහ. මිනිස්සු තෙරුන් දැක බොහෝ වස්සා වාසික පිළියෙළ කළහ. තෙරුන් වහන්සේ වස් පවරා සියළුම වස්සා වාසිකය ලැබෙන්නට පෙරම බුදුන් වෙත යන්නේ. එහි රැඳිසිටි භික්ෂූන්ට මෙසේ කීහ. මිනිසුන් විසින් වස්සා වාසික ගෙන ආවොත් ඒවා පිළිගෙන කොටස් කොට බෙදා අප ගිය තැනට එවන්න. එසේ නැතිනම් තැන්පත් කොට තබා පණිවුඩයක් එවන්නැයි කියා බුදුන්වෙතට ගියේය. භික්ෂූන් වහන්සේලා කථාවක් ඇතිකළහ. අදත් සැරියුත් තෙරුන්ට තෘෂ්ණාව ඇත. සැරියුත් තෙරුන් මිනිසුන් විසින් වස්සා වාසික දුන් විට තමන් ගේ අන්තේවාසික සද්ධිවිහාරික භික්ෂූන්ට වස් සිවුරු යවන්නැයි කියා තබා තමන්ටද පණිවිඩයක් යවන්නැයි භික්ෂූන්ට පවසා පැමිණියේය. යයි කථාවක් ඉපිද වුහ. බුදුන් පැමිණ කිනම් කථාවකින් යුතුව සිටියෝදැයි විමසා භික්ෂූන්ගෙන්ම කරුණ දැනගත්පසු නැත. මහණෙනි මගේ පුතුට තෘෂ්ණාවක් නැත. මිනිසුන්ට පුණ්‍යයෙන්ද දහර සාමණේරයන්ට ධාර්මික ලාභයෙන් ද පරිහානියක් වේයයි මෙසේ පවසා තිබේ.

බව විබව තන් හා
දුරු කොට කෙලෙස් පන්නා
ඇති රහත් උතුමෝ
බමුණු වේ මැයි දන්නා.

යමෙකුට මෙලොවද පරලොවද ආසාවෝ නොමැතිද තෘෂ්ණා රහිත වූ කෙලෙස් වලින් තොරවූ උන්වහන්සේම මම බ්‍රාහ්මණයයි කියමි.

එහි **ආසා** නම් තෘෂ්ණාවයි. **නිරාසයං** තෘෂ්ණා නොමැති බවයි. **විසංයුත්තං** සියළු කෙලෙසුන්ගෙන් තොර බවයි.

දේශනාව අවසානයේ බොහෝ දෙනා සෝවාන් ආදී මාර්ග ඵල අවබෝධ කර ගත්හ.

සැරියුත් තෙරුන් පිළිබඳ වූ කතා පුවතයි.

26.28

"යඤ්ඤාලයා" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටියදී මහමුගලන් තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

කථා පුවත පෙරසේමයි. මෙහි දී බුදුහු මුගලන් තෙරුන්ට තෘෂ්ණා නොමැතිව බව පෙන්වා දී මේ ගාථාව දේශනා කළහ.

තන්හාවෙන් තොරව
සැක රහිත නැණ ඇතිවම
නිවණට පැමිණි දැන
බමුණු උතුමෝම වෙති නිබඳව

යම් කෙනෙකුට තෘෂ්ණාව නැත්ද අට තැන දැන සැක නැතිව නිවනට බැස එයට පිළිවලින් පැමිණ තැනැත්තාට මම බ්‍රාහ්මණ යයිකියමි.

"නත්ථ ආලයනති" - එහි ආලය තෘෂ්ණාවයි. **අඤ්ඤාය අකථංකථී** අෂඨවිධ යථාස්වභාවයෙන් දැන සැකය අත් හරින ලද, **අමතොගධං අනු පත්තතං** නිවණට බැස පිළිවෙලින් පැමිණි තැනැත්තා බ්‍රාහ්මණයායි .

දේශනාව අවසානයේ බොහෝදෙනෙකුට මාර්ග ඵල ලැබුනි.

මහා මොග්ගල්ලාන තෙරුන් පිළිබඳ වූ කථා පුවතයි.

26.29

"යොධ පුඤ්ඤඤ්ච " යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ පූර්වා රාමයේ වැඩ සිටියදී රේවත තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ. කථා පුවත "ගාමෙවා යදිවා රඤ්ඤ" යන ගාථා වර්ණනයෙන්ද විස්තර කෙරෙයි. එක් දිනක් භික්ෂූන්වහන්සේලා ධම් සභා මණ්ඩපයේදී කථාවක් ඇතිකළහ. අහෝ සාමණේරයන්ගේ ලාභය, අහෝ පිණ, එක් අයෙක් විසින් පන්සියයක් භික්ෂූන් සඳහා පන්සියයක් කුළු ගෙවල් කරණ ලදී ශාස්තෘන් වහන්සේ වැඩමවා කළ කථාව ගැන භික්ෂූන්ගෙන් විමසා දූනගත් පසු මහණෙනි මගේ පුතුට පින් ද පවු ද නැත. මේ කර්ම දෙකම ප්‍රහීන කර තිබේ. යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

පින් පව් දෙක නසා
සෝ රජස් හැම වනසා
කෙලෙස් වැනසු නිසා
ඔහුද බමුණෙකි කියමි නොලසා

යම් කෙනෙක් පිණ ද පව ද යන දෙකම දුරුකළේද ඉක්මවුයේද ශෝක කිරීම් නැති, රජසේ නැති පිරිසිදු වූ ඔහු බ්‍රාහ්මණයෙකි.

එහි **උභො** යනු පින්ද පව්ද යන දෙකම දුරුකළ යන අර්ථයි. **සඞ්ගං** යනු රාගාදී වෙනස්කම්, **උපච්චගා** ඉක්මවා, **තමහං** සංසාර වෘත්ත මූල සෝකයෙන්, **අසොකං** - අභ්‍යන්තරයේ රාග රජස් ආදීන්ගේ අභාව යෙන්, **විරජං** උපක්ලේශ රහිතව. සුද්ධං තමහං බ්‍රාහ්මණං පරිසිදු වූ තැනැත්තා බ්‍රාහ්මනයෙකැයි කියමි යන අර්ථයි.

දේශනාවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණියහ.

රේවත තෙරුන්ගේ කථා පුවතයි.

26.30

"චඤ්ඣාති " යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ සිටියදී චඤ්ඣා තෙරුන් පිළිබඳව මෙම දේශනය කළහ.

එහි අනුපිළිවෙල කථාව මෙසේය. පෙර බරණැස වාසී එක් වෙළෙන්දෙක් ප්‍රාන්ත දේශයකට ගොස් ගම්දොර නිවසක් හදාගෙන කැලෑවේ ගොපලු දරුවන්ගෙන් විමසීය. මේ ගමේ පබඛතපාද කාර්මික මිනිසෙක් සිටීද? ..... ඔහුගේ නම කුමක්ද අසවල් නමයි භාර්යාව ගේ හා ඇගේ දරුවන්ගේ නම් මොනවාද? මේ මේ යයි කීවාහුය. ඔහුගේ නිවස තිබෙන්නේ කොහේද? අසවල් තැනයි. හෙතෙම දරුවන් විසින් දෙන ලද සලකුණු අනුව යහපත් රථයක වාඩිවී ඔහුගේ නිවසට ගොස් රථයෙන් බැස ගෙට පිවිස නම කියා ස්ත්‍රිය කැඳවීය. ඇය අපේ එක් ඥාතීයෙකු වන්නේයයි වේගයෙන් අවුත් අසුනක් පැනවීය. ඔහු එහි වාඩිවී නමකියා මගේ මිතුරා කොහේදැයි විමසුවේය. ස්වාමියා ඔහු වනයට ගියේය. මගේ අසවල් පුතා අසවල් දුව කොයිද සියල්ලන්ගේ නම් කියන විට විමසා මේ ඔවුන්ගේ ඇදුම් හා පැලඳුම්ද දුන්නේය. මගේ මිතුරා වනයෙන් පැමිනිවිට මේ වස්ත්‍රා ආභරණ දෙන්නැයි පැවරුවේය. ඇය ඔහුට උදාරලෙස සත්කාර ස්වාමියා පැමිණිවිට මොනු පැමිණිබව හා සියල්ලන්ගේ නම් කියා මේ මේ දේ දෙන ලදයි පැවසුවාය. ඔහුද කල යුතු දෑ කලේය. අනතුරුව ඔහු සවස් භාගයේ ඇදෙහි සිටියදීම විමසුවේය. යහළුව පර්වත පාදයේ හැසිරෙන විට ඔබ බොහෝසෙයින් කුමක් දක්කේද? අනෙකක් නොදුටුවෙමි රතු සඳුන් ගස් ඇති බොහෝ ගස් දුටුවෙමි. එසේය ඔහු එසේය එසේනම් මටත් පෙන්වන්න. ඔහු සමග ගොස් රත් සඳුන් ගස් සිඳ ගැල් පන් සියයක් පුරවා එන අතර කිවේය. යහළුව බරණැස අසවල් තැන මගේ නිවසයි. කලින් කල මගේ නිවසට එන්න. අනෙක් පඬුරු අවශ්‍ය නැත. රත් සඳුන්ම අරගෙන එන්න ඔහු යහපතැයි කියා කලින් කල ඔහු ලඟට යන්නේ රත් සඳුන්ම රැගෙන යයි. ඔහු ද බොහෝ ධනය දෙයි.

ඉන් පසුකලෙක කාශ්‍යප බුදුන් වහන්සේ පිරිණිවන් පෑවිට පිහිටවූ රන් ථූපය කළ කල්හි ද එම පුරුෂයා බොහෝ රත් සඳුන් ගෙන බරණැසට ගියේය.

අනතුරුව ඒ මිතුරා බොහෝ සඳුන් ගල ගා කුඩු කර පාත්‍රය පුරවා එන්න යහළුව බත් පිසයිද ඒතාක් චෛත්‍යය කරණ සථානයට ගොස් එන්නෙමුයි, ඔහුද රැගෙන එහිගොස් චන්දන පුජා කළේය. ඒ ප්‍රත්‍යන්ත වාසී මිතුරා චෛත්‍ය ගැබ සඳුන් වලින් සඳ මඩල (ආකෘතිය කළේය) ඔහුගේ පුර්ව කර්මය මෙයයි. ඔහු ඉන් චුත වූයේ දෙව්ලොව ඉපිද එක් බුද්ධාන්තරයක් එහි ගතකොට මේ බුද්ධොත් පාදයේදී රජගහ නුවර බ්‍රාහ්මණ මහාසාල කුලයේ උපනි ඔහුගේ පෙකනියේ සඳමඩල සමාන ප්‍රභාවක් ඇතිවුනි. මේ නිසා ඔහුව චන්ද්‍රභා යන නම ලැබුනි. චෛත්‍යයේ චන්‍ද්‍රමණ්ඩල කිරීමේ පිනෙන් මේ බමුණා සිතුවේය. අප විසින් මෙය ගෙන ලෝකයා රැවටීමට නැකිය. ඔහු යහනේ වාඩි කරවා යමෙක් මේ ශරීරයට අතින් ස්පර්ශ කරයිද ඔහු මෙතරම් ඉසුරු සම්පත් ලබන්නේයයි කියා හැසිරුනි. සියයක් හෝ දහසක් දී ඔහුගේ අතින් ස්පර්ශ කිරීමට ලබති ඔවුන් මේලෙසට හැසිරෙමින් පිළිවෙලින් සැවැත් නුවරට පිවිසියහ. නගරයට ද විහාරයට ද අතර පදිංචියට පැමිණියහ. සැවැත් නුවර කෝටි පහක් ජනතාව ආර්ය ශ්‍රාවක යන්ට පෙරබත් කළ දන්දෙති. සවස සුවඳ මල් වස්තු බෙහෙත් ආදිය ගත් අත් ඇතිව ධර්ම ශ්‍රවණය සඳහා යති. බ්‍රාහ්මණයා ඒ දැක කොහි යන්නේදැයි විමසුහ. බණ ඇසීම සඳහා බුදුන් වෙතට යයි පැවසුහ. එන්න එහි ගොස් කුමක් කරන්නද? අපේ චන්ද්‍රභා බ්‍රාහ්මණයාගේ ආනුභාව මෙන් ආනුභාවයක් එහි නැත. මොහුගේ ශරීරය ස්පර්ශ කිරීමෙන් මේ මේ දේ ලබත් එන්න බලන්න තොපගේ බ්‍රාහ්මණයා ගේ කවර ආනුභාවයක්ද අපේ තථාගතයන් වහන්සේ ම මහත් ආනුභාව සහිතය. ඔවුන් එකිනෙකා දැන ගැනීමට නොහැකිව විහාරයට ගොස් චන්‍ද්‍රභා බ්‍රාහ්මණයාගේ ද බුදුරජාණන් වහන්සේගේද ආනුභාව දැනගනිමුයි ඔවුන්ගෙන විහාරයට ගියාහුය. බුදුරජාණන් වහන්සේ වෙත ඔහු සම්පවත් වත්ම චන්ද්‍රභාගේ ආනුභාවය, අන්තර්ධාන විය. දුරවිය. ඔහු එහිදී බුදුන් ඉදිරියේ අඟුරු කුඩයක කපුටෙක් මෙන් විය. අනතුරුව එකක් පසකට ගෙන ගියහ. ප්‍රභාව ප්‍රකෘතිමත්විය. නැවත බුදුන් වෙත ගෙන ගියහ. ප්‍රභාව එලෙසම අතුරුදන්විය. මේ ලෙසට තුන්වතාවක් ගොස් අතුරුදන්වන ආලෝකය දැක චන්ද්‍රභා සිතුවේය. මේ බුදුහු ප්‍රභාව නැතිකිරීමේ මණ්ත්‍රයක් දනී යයි සිතමි. ඔහු බුදුන්ගෙන් විමසුවේය. මගේ ප්‍රභාව නැතිකරණ මණ්ත්‍රයක් දන්නේද? ඔව් දනිමි. එසේ නම් එය මට දෙන්න. පැවිදි නොවුවෙකුට දෙන්නට නොහැකිය.

ඒ බ්‍රාහ්මණයා කිවේය. මේ මන්ත්‍රය ගත් පසු මම මුළු දඹදිව ජ්‍යෙෂ්ඨයා වන්නෙමි තෙපි මෙහිම සිටිවු. මම පැවිදිවී දින කීපයකින් මණ්ත්‍රයගන්නෙමි. ඔහු බුදුන්ගෙන් පැවිද්ද ඉල්ලා ගෙන උපසම්පදාවද ලැබුවේය. පසුව ද්වත්තිංසා පැවසුවේය. ඔහු මේ කුමක්දැයි විමසුවේය. මෙය මණ්ත්‍රයට පරිකර්මයයි. වඩන්නට වටී. බ්‍රාහ්මණයෝ වරින් වර පැමිණ මණ්ත්‍රය ගත්තේදැයි විමසති. තවම නොහැකිවිය. ඔහු දින කීපයකින් ම අර්හත්වයට පත්විය. බ්‍රාහ්මණයින් පැමිණ විමසුවිට තෙපි යවු දැන් මම නොපැමිනෙන ධර්මයට පැමිණුනේ වෙමි. භික්ෂූහු බුදුන්ට දැනුම් දුන්හ. ස්වාමීනි මොහු අහුතයක් කියා අනෙකක් විස්තර කරයි. මහණෙනි. දැන් මගේ පුතුගේ නැඳිය ක්ෂීණවිය. කිය යුතු දෙයක්ම වූ දෙයක්ම දැන් කියයි. පවසා මේ ගාථාව පැවසුහ.

නිමල සුදු සඳ සේ
නො කැළඹුණු ගති මනසේ
ඇති බමුණු සුවසේ
සිටියි තන්හා දුරර සිතුසේ

සඳමෙන් විමල වූ පිරිසිදු වූ වෙසෙසින් පහන් වූ නොකැලබුන භවයේ සතුටුවන තෘෂ්ණාව ක්ෂයකළ භව ආශාව ගෙවා ලු තැනැත්තා බ්‍රාහ්මණයයි කියමි.

එහි **විමලං** යනු සඳ සේ නිර්මල බව. **සුද්ධං** - උපක්ලේශ නැතිබව **විප්පසන්නං** - ප්‍රසන්න වූ සිත, **අනාවිලං** - නො කැළඹුණු බව, (කෙලෙස් නමැති මඩ හා බොර නැති බැවින්) **නන්දීභව පරික්ඛීණ** - භවය පිළිබඳ ආශාව සහමුලින් සිඳ දැමීම, **තමහං බ්‍රාහ්මණං** - ඒ තැනැත්තා බ්‍රාහ්මණ යයි කියමි.

දේශනාව අවසානයේ බොහෝදෙනා සෝවාන් ආදී මාර්ග ඵලවලට පැමිණියාහුය.

චන්ද්‍රාභ තෙරුන්ගේ පුවතයි.

26.31

"යො ඉමං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ කුණ්ඩ කෝලිය ඇසුරු කොට කුන්ඩධාන වනයේ වාසය කරද්දී සීවලී තෙරුන් පිළිබඳව දේශනා කළහ.

එක් සමයක කෝලිය දියණියක් වූ සුප්පවාසා සත්වසක් දරුගැබක් දරා දිනහතක් මුළු ගර්භණීව තියුණු කටුක දුක් වේදනාවන්ගෙන් පෙළුනේ සම්මා සම්බුදුන් වහන්සේ යමෙකුට මෙබඳු දුක් ප්‍රහාණය සඳහාම ධර්මය දේශනා කරති. ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සුපටිපන්නය. මෙබඳු දුක් ප්‍රහාණය සඳහා පිළිපන්නේ ය. නිවන පරම සුවයකි. මෙබඳු දුකක් නොපවතී මේ තුන් විතර්කවලින් ඒ දුක ඉවසන්නී, ස්වාමියා බුදුන් වෙතට යවා ඇගේ වචනයෙන් බුදුන් වන්දනා කිරීමට ආරාධනා කිරීමෙන් සුප්පවාසා කෝලිය ධීතා සුවපත්වේවා, සුවපත් නිරෝගි දරුවෙක් බිහිකෙරේවා" මෙලෙස බුදුන් පැවසුකෙනෙහි සුවපත්ව නිරෝගි දරුවෙක් බිහිකළාය. අනතුරුව බුද්ධ ප්‍රමුඛ සංඝයාට ආරාධනාකර දින හතක් මහදන් දුන්නාය. ඇගේ පුතා ද උපන්දින සිටම ජල පෙරණයක් ගෙන පැන් පෙරා දුන්නේය. ඔහු පසුකලෙක ගිහිගෙයින් නික්මී පැවිදිවුයේ අර්හත්වයට පත්වුනි. මේ අතර දිනක් භික්ෂූන් වහන්සේලා ධම්සභාමණ්ඩපයේ කථාවක් ඇතිකළහ. බලන්න ඇවැත්නි මෙබඳු රහතන් වහන්සේ නමකට උපනිසසය සම්පත් ඇතිව මෙපමණ කලක් මව්කුස දුක් අනුභව කළේය. කොපමණ බහුල වූ දුකක් මොහු විසින් වින්දේද. මෙහි දී බුදුන් පැමිණ කළ තථාම පිලිබඳව විමසා දන එසේය මහණෙනි මගේ පුත් සීවලී මෙපමණ දුකක් විඳ ඉන් මිදී පැමිණ අවබෝධ කරගෙන වාසය කරන්නේයයි මේ ගාථාව පැවසුහ.

කෙලෙස් මඩ නම් මහා දුර්ගෙන්
එතරවී ගිය අමා නිවනට
සැකය ආසා මාන දුරුකළ
කිසිම අයුරින් සසර බැමි නැති
පහන් සිත් ඇති රහත් උතුමා
බමුණු නාමය ලබයි නිතැතින්

යමෙක් මේ කෙලෙස් මඩ සහිත මගද ක්ලේශ නැමති දුර්ගයද සසරවටද මෝහයද ඉක්මවුයේ ද ඕඝයෙන් එතරවීද නිවන් නැමති පරතෙරට ගියේද ධ්‍යාන කරන්නේද තෘෂ්ණ රහිත ද සැක සහිත ප්‍රශ්න නොමැත්තේද කිසිවක් දැඩිලෙසට නොගෙන කෙලෙස් ප්‍රශ්ණයෙන් නිවුනේද ඔහු බ්‍රාහ්මණයෙකි මම කියමි.

එහි අර්ථය - **යො** යම් භික්ෂුවක්, මේ රාගාදි **පලිපථං කෙලෙස් දුග්ගං ච සංසාර** දුර්ග වූ සංසාර වෘත්තය චතුරාර්ය සත්‍යය අවබෝධ කර නොගැනීම මොහං, (ඉක්මගිය) සතර ඕඝයන් තරණය කර පරතෙරට නොගියාහු දෙවදූරුම් ධ්‍යානයන්ගෙන්, **ඣායී.** තෘෂ්ණාව දුරු කිරීම නිසා **අනෙඡෝ** - අටතැන්හි සැක නැත්තේ **අකථං කථී** - උපාදානයන් දුරු කිරීම නිසා අනුපාදයත්වා, කෙලෙස් දුරු කිරීමෙන් **නබ්බුතෝ. තමහං බ්‍රාහ්මණං** ඒ තැනැත්තා බමුණකුයි කියමි.

දේශනාවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵල ලදහ.

සීවලී තෙරුන්ගේ කථා පුවතයි.

26.32

"**යොධ කාමෙ**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ජේතවනයේ වැඩ සිටියදී සුන්දර සමුද්ද තෙරුන් නිමිතිකර ගෙන දේශනා කළහ.

සැවැත් නුවර වාසී එක් කුල පුතුයෙක් සුන්දර සමුද්ද නම් විය. සතළිස් කෙලක් ධන සම්පත් ඇති මහා කුළයක උපන් හේ එක් දිනක් සවස් වරුවේ ගඳමල් ආදිය ගෙන මහජනයා ධර්ම ශ්‍රවණය සඳහා දෙව්රමට යනු බලා කොහේ යන්නේදයි විමසා බුදුන් වෙත ධර්ම ශ්‍රවණය සඳහායයි පැවසුවිට මම ද යන්නෙමියි කියා ඔවුන් සමග ගොස් පිරිස් කෙළවර වාඩි වුයේය. බුදුහු ඔහුගේ අදහස් විමසා අනුපිළිවෙළ කථාව දේශනා කළහ. ඔහු ගිහිගෙයි වසමින් පිරිසිදු බ්‍රහ්මචරියාව හැසිරීමට නොහැකියයි වදාළ බුද්ධ දේශනය අසා පැවිදි වීම සඳහා හටගත් උනන්දුව නිසා පිරිස විසිරි ගිය පසු බුදුන්ගෙන් පැවිද්ද ඉල්ලා සිටියේය. මවුපියන්ගේ අනුමැතියෙන් තොරව පැවිදි නො කරන්නේයයි අසා ගෙදර ගොස් රටයිපාලි කුල පුත්‍රයාසේ මහත් උත්සහයෙන් දෙමාපිය අනුමැතිය ගෙන බුදුන් වෙත පැවිදි වී උපසම්පදාව ලැබ මෙහි විසීමෙන් කවර ප්‍රයෝජනයක් දැයි ඉන් නික්මී රජගහ නුවරට ගොස් පිඬුපිණිස හැසිරෙමින් කල්ගත කරමින් සිටියදී අතර දිනක් සැවැත් නුවර උන්වහන්සේගේ දෙමාපියන් එක් උත්සව දිනයක මහත් සිරිසෝභාවෙන් ඔහුගේ සහායක කුමාර වරු ක්‍රීඩා කරණු දැක අපේ පුතුට මෙය දුර්ලභ විය එසේ සිතා හැඬුහ මේ අවස්ථාවේදී එක් ගණිකාවක් එම කුලයට නිවසට ගොස් ඔහුගේ මව සිටිනු දැක මෑණියනි කුමක් නිසා හඬන්නේදැයි විමසුවාය. පුතා සිහි පත්වී අඬමි. මෑණියනි දැන් ඔහු කොහේද? භික්ෂූන් අතර පැවිදිවිය. ඇයි උපවැදි කිරීම නොවටීද? වටී නමුත් කැමති නැත. මේ නගරයෙන් රජග නගරයට ගියේය. හොඳයි මම ඔහු උපැවිදි කරන්නේනම් මට කුමක් කරන්නේද? මේ මගේ කුළයට ස්වාමී කරවන්නෙමි. එසේනම් මට මග වියදම් දෙන්න මගවියදම් ගෙන මහත් පිරිවරින් රජ ගහ නුවරට ගොස් උන්වහන්සේ පිඬු සිඟා යන වීථියේ නිවසක් ගෙන උදේම ප්‍රණීත ආහාර පිළියෙළ කොට තෙරුන් පිඬු සිඟා වඩින විට භික්ෂාදි දින කීපයකට පසුව ස්වාමීනි මෙහිම සිට දන් වැළඳීම

කරන්නැයි පාත්‍රය ගත්තාය. උන්වහන්සේ පාත්‍රය දුන්නාහ. අනතුරුව ප්‍රණීත ආහාරවලින් අනුභව කරවා ස්වාමිනි මෙහාටම පිණ්ඩ පාතයේ වැඩීම සුදුසු නො වන්නේද දින කීපයක් ආලින්දයේ වාඩි කරවා දානය වළඳවා පසුව දරුවන්ට කැවුම් දී සංග්‍රහ කර තෙරුන් වැඩියවිට එන්න මට වලකද්දී මෙහි පැමිණ දුවිලි නංවා ලන්නැයි පැවසුවාය. දානය අවස්ථාවේදී ඇය වලක්වද්දීම දුවිලි නැංවුහ.

ඇය දෙවැනි දිනයේ දී ස්වාමීනි දරුවන් වලක්වද්දීත් දුවිලි නංවන නිසා ගෙතුළ වාඩිවී වළඳනු මැනව. දින කීපයක් මේ ලෙසට ගෙය තුළදී දන් වැළඳවුවාය. නැවත ඇය තෙරුන් වළඳන විට මහා ශබ්ද ඇතිකර වුවාය. ඊට පසුදින ඇය ස්වාමීනි මෙහි අතිශයින් ශබ්ද සහිතය මම වලක්වා සිටියද මේ ළමයි වචනය නොගනී මතු මහලෙහිම වාඩි වී වළඳන්නැයි පැවසුවිට තෙරුන් පෙරටු කොට ප්‍රාසාදයට නගින්නී දොරවල් ආදිය වසමින්ම ප්‍රාසාදයට නැගුනි ගෙපිළිවෙලින් යාමට කලකිරුණ අතරට භෝජන රස තෘෂ්ණාවේ බැඳුනේ ඇගේ වචනය නිසා සත් බුමුපහයට නැංගාහ. ඇය තෙරුන් වාඩි කරවා "වචනය සම්පව සිටි සථානයන්හි ගැහැණු මිනිස්සුන්ට ආදරයෙන් කියයි. විජම්බනය කරයි. හැමෙයි, බබලවයි, ලජ්ජාව දක්වයි. නියෙන් නිය ගටයි. පයින් පය පාගයි කටුවකින් පොළොවේ ලියයි. දරුවන් උසවති පහතට එල්ලයි. ක්‍රීඩා කරයි ක්‍රීඩා කරවයි. සිඹියි. සිබවයි කයි කවයි දෙයි ඉල්ලයි කරණ දේ කරයි. උස්හඩින් කථාකරයි. පහත් හඩින් කියවයි. සඟවා කියයි. විවෘතව කියයි නැටීමෙන් - ගායනයෙන් - වාදනයෙන් ඇඹීමෙන් විලාශ දැක්වීමෙන් අලංකාර කිරීමෙන් හඬ නගා සිනාසෙයි. බලයි. කටී ප්‍රදේශය සොලවයි සැඟවුණු තැන් සොලවයි. කළවා විවර කරයි කළවා වසයි. පියවුරු දක්වයි හඬ දක්වයි. ඇස පිසදමයි, ඇහි බැම ඔසවයි. තොල ලෙවකයි. දිව සොලවයි. රෙද්ද ලිහයි රෙද්ද ඇදගනී. කෙස් මුදාහරියි කෙස් බඳියි මේ ආදී ස්ත්‍රී ලක්ෂණ ස්ත්‍රී ලීලා පෙන්වා ඔහු ඉදිරියේ සිට මේ ගාථාව කීවාය.

ලා තඹ වැනි රතු පා ඇති වේසියගේ මිරිවැඩි සඟලට නැග ඔබද තවම තරුණය ඔබේ මම ද තවම තරුණය එබැවින් අප දෙදෙනම සැපත් විඳ හිහිව සැරයටි වාරුවෙන් සිටින විට පසුව පැවිදි වන්නෙමු.

තෙරුන් වහන්සේට අහෝ මේ බැරෑරුම් දෙයකි. සිහිනොකර කරණ ලද ක්‍රියාවකහැටි මහත් සංවේගයක් ඇති විය. මේ අවස්ථාවේදී බුදුහු යොදුන් හතළිස් පහක් දුර දෙව්රම සිටියදීම මේ කරුණ දැක සිනා පහළ කළහ. මේ නිසා ආනන්ද තෙරණුවෝ ස්වාමීනි කුමක් නිසා කවර හේතුවකින් සිතා පහළ කිරීමට ආනන්ද රජගහ නුවර පත්බුමු පහයක සුන්දර සමුද්ද තෙරුන් හා ගණිකාවක සමඟ සංග්‍රාමයක් පවතී. ස්වාමීනි කාට නම් ජය අත්වේද. කාට පරාජය සිදුවේද? ආනන්ද සුන්දර සමුද්දට ජය අත්වේ. ගණිකාව පරාජයට පත්වේ. තෙරුන්ට ජය පවසා එහි වැඩසිටියදීම ආලෝකයක් පතුරුවා භික්ෂුව කාම දෙකම අපේක්ෂා රහිතව අත්හරින්න යයි පවසා මේ ගාථාව දෙසුහ.

ගිහිගෙයින් නික්මී
අනගාරිකව වෙසෙනා
පස්කම් දුරුලු ඔහු
උතුම් බමුණෙක් වේමැයි

මෙලොව යම් පුද්ගලයෙක් කාමයන් පහකොට ගිහිගෙය හැර පැවිදිවේද, කාමයන් භවයන් ක්ෂයකළ ඔහුට මට බ්‍රාහ්මණයයි කියමි.

එහි අර්ථය **යො** - යම් පුද්ගලයෙක් **ඉධ** - මෙලොව උභොපි **කාමෙ**, හිත්‍වා දෙවැදෑරුම් කාමයන් අත්හැර **අනාගාරො භුඤ්ජා** - ගිහිගෙන් නික්ම පැවිදිව, කාමයන්ද භවයන්ද, නැති නැති කරයිද ඔහු බ්‍රාහ්මණ වේ.

දේශනය අවසානයේ තෙරුන් රහත්වී සෘද්ධි බලයෙන් අහසට නැගී කැණිමඩල බිඳදමා පැමිණ බුදුන් වැන්දේය. ධම් සභාවේ කථාවක් ඇතිකළහ. ඇවැත්නි ! දිව පිනවන රසය නිසා මනස නැසුනි. සුන්දර සමුද්ද තෙරුන්ට තථාගතයන් අවශ්‍යවිය බුදුහු එම කථාව අසා මහණෙනි දැන් පමණක් නොව පෙරද ඔහු රස තෘෂ්ණාවේ බැඳී මාව අවශ්‍යවීයයි පවසා අතීතය ගෙනහැර දැක්වූහ.

නිරන්තර වාසස්ථාන වූ, ආවාසයෙහි ද, මිත්‍රා සත්ථවයෙහිද ඡන්දරාගය ලාමකය. දිවට දැනෙන රසයෙහි ඡන්දරාගය යට කී දෙකරුණෙහි ඇල් මට වඩා ලාමකය. ඊට වඩා අධික ඡන්ද රාගයක් නැත්තේමය. සඤ්ඡය නම් උයන්පලු තෙමේ වාතමෘගයා රසයෙන් පොළඹවා තමාගේ වසඟයට ගත්තේය.

ඒකක නිපාතයේ එන මෙම වාතමිග ජාතකය විස්තර කොට එදා වාත මෘගයා (අද) සුන්දර සමුද්ද නම් වුයේය. මෙම ගාථාව වදාරා එය විසඳූ රජුගේ මහා මාත්‍යා මම වී මැයි ජාතක ය ගළපා වදාළ සේක.

සුන්දර සමුද්ද තෙරුන්ගේ කථා පුවතයි.

26.33

"යොධ තණ්හං" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනයේ වැඩ සිටියදී ජෝතිය තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

මේ එහි පිළිවෙළ කථාවයි. පෙර බරණැස් නුවර සහෝදරවරු දෙදෙනෙක් මහත් උක් කුඹුරක් කළාහුය. අනතුරුව බාල සහෝදරයා උක් කුඹුරට ගොස් එකක් වැඩිමල් සහෝදරයාට දෙන්නෙමි. එකක් මටයයි සිතා උක්ගස් දෙකක් ගෙන රසය බැහැරනොයනු සඳහා කැපූ තැන් බැඳ ගත්තේය. ඒ කාලයේදී උක්ගස් යන්ත්‍රයෙන් මැඩීමක් නැත. අග හෝ මුල සිදීමෙන් පෙරහනෙන් දිය වැගිරෙන ලෙසට පැණි වැගිරේ.

මොහු කුඹුරෙන් උක් ගස්ගෙන ආපසු එන අවස්ථාවේදී - ගන්ධමාදන පර්වතයේ පසේ බුදුරජාණන් වහන්සේ සමාපත්තියෙන් නැගිට අද කාටනම් අනුග්‍රහ කරමිදයි විමසා බලන්නේ මේ සොහොයුරු තම ඤාණ ජාලයට හසුවිය. සංග්‍රහ කිරීමට සමර්ථ භාවය දැන පා සිවුරු ගෙන ඍද්ධියෙන් පැමිණ ඔහු ඉදිරියේ සිටියහ. බාල සොහොයුරු බුදුරජාණන් වහන්සේ දැක පැහැදුන සිත් ඇතිව උතුරු සළුව උස් වූ බිම් පෙදෙසක අතුරා ස්වාමිනි මෙහි වාඩි වන්නැයි පසේ බුදුන් වාඩි කරවා පාත්‍රය එළවන්නැයි ඉල්ලා උක් ගසේ බැමිලිහීය උග් ගසින් පැණි වැගිරි පාත්‍රයට වැටුනි. පසේ බුදුන් උක්පැණි පානය කළහ. ස්වාමිනි ඔබවහන්සේ උක්රස පානය කිරීම යහපති ඉදින් මගේ වැඩිමල් සොහොයුරාද උග්ගස දුන්විට ඔහුද දන් දෙනු ඇතැයි සිතා ස්වාමිනි පාත්‍රය මේ දෙසට යොමුකරණු මැනව දෙවනුවද උක්ගසේ බැඳතුබු තැන ලිහා රසය පාත්‍රයට පරෙන්නට හැරියේය. පළමු උග්ගසේ පැණි වැළඳූ නිසා දෙවැනි උග්ගසේ පැණි පාත්‍රයේ පුරවා අනෙක් අය හා බෙදා ගැනීමට වාඩිවී සිටියහ. ඔහු බුදුන්ගේ ආකාරය දැනගෙන පසඟ පිහිටුවා වැද ස්වාමීනි මම දෙන ලද අග්ග රසය නිසා නිසැකවම මේ විපාකයෙන් දෙව්මිනිස් සම්පත් අනුභව කොට කෙලවර ඔබ විසින් පැතූ සම්පත් පැමිණෙන්නේයයි ප්‍රාර්ථනා තැබුහ පසේ බුදුන්ද එසේ වේවායි පවසා ඉට්ඨං පත්ථිතං ආදී දෙ ගාථාවෙන් අනුමෝදනා කර ඔහු පාර්ථනා

කරණ ලෙසට අදිටන් කර අහසින් ගන්ධමාදන පර්වතයට වැඩම කරවා පන්සියයක් පසේ බුදු වරුන් වහන්සේලාට එම රසය දුන්හ. ඔහු මේ ප්‍රාතිහාර්යය දැක සහෝදරයා ලඟට ගියකල්හි කොහි ගියේ දැයි විමසූ විට උක් කුඹුර බලන්ටයයි පැවසුවිට ඔබ වැනි කෙනෙකුන් කුඹුර බැලීමට යාමෙන් කවර ප්‍රයෝජනයක්ද එකක් හෝ දෙකක් ගෙන ආයුතු නොවන්නේද? සහෝදරයා පැවසූ විට එසේය සොහොයුර ම විසින් උක්ගස් දෙකක් ගෙන ආමි. එකක් පසේ බුදුන් දැක රස දන් දුනිමි. කිම මුලින්ද අගින්ද රස දුන්නේ පසේ බුදුරදුන් කුමක් කළාහුද මගේ උක්ගසේ රසය පානය කර ඔබ සඳහා වූ උක්ගසේ රස පාත්‍රයට ගෙන ගන්ධමාදන පර්වතයට වැඩමවා පන්සියයක් පසේ බුදුවරුන්ට දන් දුන්හ. මේ සියළු කරා විස්තර අසමින් සිටින අතර මහත් ප්‍රීතියට පත්ව සතුට පැතිරී උන්වහන්සේට පිදීමෙන් මෙලොවදීම සම්පත් ලැබෙයයි ප්‍රාර්ථනා තැබීය. බාලයා ත්‍රිවිධ සම්පත් පැතීය දෙවන්නා රහත්බවකින්ම පැතිය. පත්විය. ඔවුහු දිවි ඇතිතෙක් සිට ඉන් චුතව දෙව්ලොව ඉපිද බුද්ධාන්තරයක් ගෙවුහ. ඔවුන් දෙව්ලොව සිටි කාලයේදීම විපස්සී බුදුන් ලොව පහළ වුහ. ඔවුන්ද දෙව්ලොවින් චුතවී බන්ධුමතී නුවර එකම කුළ ගෙයක ජ්‍යෙෂ්ඨයා ජ්‍යෙෂ්ඨ සහෝදරයා ලෙසටද බාලයා බාල සොහොයුරා ලෙසටද උපත ලැබුහ. ජ්‍යෙෂ්ඨයා සේන නම්විය. කණිෂ්ඨයා අපරාජිත නම් විය. ඔවුන් වයසට පත් වූ විට කුටුම්බය පිහිටුවා වාසයකරණ අතර බුද්ධ රත්නය ලොව පහළ විය. ධර්ම රත්නය සංඝරත්නය ද පහළ විය. දන්දෙව් පින්කරවු අද අටවක, අද අමාවක - උපෝසථ සමාදන්වමු. ධර්මය අසවු මේ ආදී ධර්මඝෝෂා බන්ධුමතී නුවර ඝෝෂා අසා මහජනයා පෙරවරු දන් දී සවස බණ ඇසීමට යනු දැක කුටුම්බක ඔබ කොහේ යන්නේදැයි විමසා බුදුන්වෙත ධර්මය ඇසීමටයයි දැනගත්විට මමද යමියි ඔවුන් සමග ගොස් පිරිස කෙලවර වාඩිවිය. බුදුහු ඔහුගේ අදහස දැනගෙන අනුපිළිවෙල කථාව කළහ. ඔහු බුදුන්ගේ ධර්මය අසා උත්සාහවත් වුයේ බුදුන්ගෙන් පැවිද්ද ඉල්ලුවේය. අනතුරුව බුදුහු ඔබට දැන්විය යුතු ඥාතීන් සිටීදැයි විමසුහ. ඔහු බාල සොහොයුරා වෙත ගොස් මේ කුළයේ යම් ධන සම්පතක් තිබේ ද ඒ සියලු දේ ඔබට අයත්වේවායි පැවසුවේය. ඔබ ස්වාමී යැයි විමසුවිට මම බුදුන් වෙත පැවිදි වන්නෙමි. ස්වාමියා කුමක් කියන්නේද මවමිය ගියවිට මෑණියන් වැනිවිය. පියා මියගිය විට පියා වැනිවිය. ඔබ මෙහි සිටියදීම

සම්පත් ඇතිනිසා මෙහිදීම පිංකල හැකිය. මෙලෙස පැවිදි නො වන්නැයි ඉල්ලා සිටියේය. ම විසින් බුදුන් සමීපයේ ධර්මය අසන ලදී එය ගිහි ගෙයි සිටියදී සපුරන්නට නොහැකිය. ඔබ නවතින්න මම පැවිදි වන්නෙමි. මෙලෙස බාල සොහොයුරා ගෙදර නවතා බුදුන් වෙත පැවිදිවී ලබන ලද උපසම්පදා? ඇත්තේ නොබෝ දිනකින් රහත්ඵලයට පත්වුහ. බාලයාද පැවිදි වූ සොහොයුරාට සත්කාර කරමියි දින හතරක් බුද්ධ ප්‍රමුඛ සංඝයාට දන් දී සහෝදරයාට වැඳ මෙලෙස කීවේය. ස්වාමීනි ඔබ විසින් භව නිස්සරණය කරණ ලදී. මට පස්කම් ගුණයේ බැඳී නික්මී පැවිදි වීමටද නො හැක්කෙමි. මම ගෙයි සිටියදීම සුදුසු වූ මහත් පිංකම් කියා දෙන්නැයි පැවසුවේය. එහි දී තෙරුන් වහන්සේ යහපත නුවණැත්ත බුදුන්ට ගඳ කිළියක් කරන්නැයි පැවසුවේය. ඔහු යහපතැයි පිළිගෙන නොයෙක් දැව වර්ග ගෙන්වා ගෙන කුළුණු ආදිය එකක් රන් ඔබ්බවා තවෙකක් රිදී ඔබ්බවා තව එකක මැණික් ඔබ්බවා සියල්ලම සියළු රත්න ජාති යොදා කරවා ඒ වායෙන් ගඳ කිළිය කරණ කාලයේ වනාහි තමන්ට සමාන නම් ඇති අපරාජිත නම් බෑනා පැමිණ මම ද කරමි. මට ද ප්‍රාප්තිය දෙන්න. මාමණ්ඩිය යනුවෙන් ඉල්ලා සිටි විට දරුව නොදෙමි අන්‍යයන්ට අසාධාරණ වුවක් කරන්නෙමි ඔහු බොහෝ කොට ඉල්ලූ පිං නොලැබුන විට ගඳකිළිය ඉදිරියේ ඇති ශාලාවක් කිරීම වටියයි සත්රුවන්මය හත්වී ශාලාවක් කළේය. ඔහු මේ බුදෙධාත්පාද කාලයේ මෙණඩක සිටුවරයා වී උපන්නේය. ගඳ කිළිය සත් රුවන්මය විය. මහා ජනෙල් තුනක් විය. ඒවා ඉදිරියේ යට සුදුපැහැ ගැන් වූ පොකුණු තුනක් විය. සුවඳ වර්ග හතරක් ඇති ජලය පුරවා අපරාජිත ගෘහපති පස්වනක් පියුම් රෝපනය කළේය. බුදුරජාණන් වහන්සේ ඇතුළත වැඩ සිටින විට සුලඟින් නැගෙන මල්රේණු සිරුරට වැටීම සඳහා ගන්ධ කුටි මුදුනේ කපලු භාජනයක රත්න ස්වර්ණමය සුණු තිබුනි. පහළුමය මුදුනේයට මණික්මය උළු කැට විය. නටන මොනරෙකුගේ රුව එහි විය. සත් රුවන් වලින් කැටයම් කළයුතු දෑ කැටයම් කර ඉතිරි සියල්ලම ගෙන දණක් පමණ දුරට ගඳකිළිය වටකොට පිරිවෙණ පිරවීය මෙලෙස ගඳකිළිය නිමාකොටා අපරාජිත ගෘහපති සහෝදර තෙරුන් වෙත එළම මෙසේ පැවසුවේය. ස්වාමීනි ගඳකිළියේ කටයුතු නිමා විය. එය පරිභෝග කිරීම අපේක්ෂා කරමි. පරිභෝග කිරීමෙන් මහත් පිනක් සිදුවේ. තෙරුන් වහන්සේ බුදුන් වෙත එළඹ ස්වාමීනි මේ

කෙළඹියා විසින් ගඳ කිළිය නිමවන ලදී. දැන් එය පරිභෝග කිරීම අපේක්ෂා කරයි. යනුවෙන් පැවසුහ. බුදුරජාණන් වහන්සේ අසුනින් නැගී සිට ගඳකිළිය දෙසට ගොස් ගඳකිළිය වටා තබන ලද මැණික් රාශිය බලා දොරටු කොටුවෙහි වැඩසිටියහ. අනතුරුව කෙළෙඹියා ස්වාමීනි පිවිසෙන්නැයි පැවසුවේය. තථාගතයන් වහන්සේ එලෙසටම සිට තෙවැනි වර ඒ සහෝදර තෙරුන්දෙස බැලුහ. උන්වහන්සේ බැලූ ආකාරයෙන්ම දැනගෙන කණිටු සොහොයුරාට (කෙළෙඹියාට) මෙසේ පැවසුවේය. එන්න දරුව මවිසින් ආරක්ෂාව සිදුකරනු ලැබේ. නුඹ වහන්සේ සුවසේ වාසයකරණ සේක්වා යයි තථාගතයන් වහන්සේට කියන ලෙසට පැවසූහ. කෙළෙඹියා උන්වහන්සේගේ වචනය අසා බුදුන්ට පසඟ පිහිටුවා වැඳ ස්වාමීනි යම් සේ මිනිස්සු ගස් මුල සිට අපේක්ෂාවක් නැතිවම ආපසුයත්ද යම්සේ ගඟක් තරණය කර ඔරුව අතහැර බැහැරයත්ද එලෙසට අපේක්ෂාවක් නොමැතිවම ඔබ වහන්සේ වසන සේක්වායි පැවසුහ. කුමක් නිසා බුදුහු සිටගෙන සිටීද උන්වහන්සේට මෙබඳු අදහසක් ඇතිවිය. බුදුන් වෙතට පෙරවරුවේදී සවස් කාලයේද බොහෝ දෙන පැමිණෙති ඔවුන් මැණික් අරගෙන යනවිට වලක්වන්නට නොහැකිය. පිරිවෙන්හි මෙපමණ මැණික් විසුරුවා ඇතිවිට තව උපස්ථායකයින් ගෙනයනවිට වැලකිය නොහැකිය. කෙළෙඹියා මාකෙරෙහි වෛර බැඳ අපාය ගාමී වන්නේය. මේ කරුණ නිසා පළමුව ඇතුල් නොවී බලා සිටියහ. ඒවා ම විසින් රැකේ ඔබ වහන්සේ වාසය කරන්නැයි පැවසුවිට පිවිසුනාහුය. කෙළෙඹියාද භාත්පස ආරක්ෂාව තබා මිනිසුන්ට කිහ. දරුවනි උකුලේ හෝ සෙම්බුවල හා ගෙනයන්නන් වලක් වටු අතින් ගෙන යන්නන් නො වලක්වවු. නගරය තුළද දැනුම් දුනි. ම විසින් ගඳකුට පිරිවෙනේ සත්රුවන් විසුරුවා ඇත. බුදුන්ගෙන් ධර්මය අසා යන්නවුන් දුගී අය දෙඅත් පුරවා ගනිත්වා - සුවපත් අය එක් අතකින් පමණක් ගෙනයවු. ඔහු මෙසේ සිතා මේ ලෙසට අණදුනි. සැදැහැවත්හු ධර්මය ඇසීමට පැමිනෙති. ශ්‍රාද්ධා නැති අය ධන ආශාවෙන් ගොස් බණ අසා දුකින් මිදෙති. මේ නිසා ජනතාවට සංග්‍රහ වශයෙන් මෙලෙස දැනුම් දුන්නේය. මහජනයා ඔහු විසින් කියන ලද පරිදිම මැණික් ගත්හ. වරක් අඩුවූ විට පිරවීය මේ ලෙසට තුන්වතාවක් පිරවීය. දණක් පමණට සප්තරතන පුරවාලීය. බුදුරදුන්ගේ පා තබන තැන පුහුල් ගෙඩියක් තරම් වූ මැණිකක් තබා තිබුනි. ඔහු මෙසේ තබන ලද්දේ බුද්ධ ශරීරයෙන් රන්වන් වූ ප්‍රභාවෙන්

යුත් මැණික් ප්‍රභාව බලන අයට තෘප්තියක් ඇතිනොවේ. එනිසා එම මැණික තබන ලදී. මහ ජනතාවද තෘප්තියක් නොමැතිවම බලා සිටියහ. මේ අතර එක් මිථ්‍යා දෘෂ්ටික බමුණෙක් බුදුන් පාමුල අනර්ඝ මැණික ගන්නෙමියි බුදුන් වන්දනා වට පැමිණි පිරිස අතරින් රිංගා ගොස් කෙළෙඹියා ඔහු ඇතුල්වුන ආකාරයෙන්ම මැණික ගනීයයි සිතා එය නොගනී වායි සිතුවේය. බ්‍රාහ්මණයාද බුදුන් පා වඳින ලෙසට පාද මුලයට අතයවා මැණික ගෙන ඔඩොක්කුවේ තබාගෙන ගියේය. කෙළෙඹියාට සිත ප්‍රසාදයට පත්කර ගැනීම පහසු නොවීය. හේ ධර්ම දේශනය අවසන බුදුන් වෙත එළඹ ස්වාමීනි මම ගඳකිළිය වටා තුන්වතාවක්ම සත් රුවන් පුරවාලීමි.ඒවා ගැනීමේදී මට අවසානයක් ඇති නොවීය. සිත බහුලව බහුලව පැහැදුනේ විය. අද බ්‍රාහ්මණයා මැණිකවෙත එනවිට අහෝ නොගනීවායි සිතුවෙමි. එහෙත් එය රැගෙන යනවිට මගේ සිත ප්‍රසාදයට පත්කර ගැනීමට නොහැකිවිය බුදුරදුන් ඔහුගේ කථාව අසා උපාසකය තමන් සතුදේ අන් අය විසින් නොගෙන යන්නට කටයුතු කිරීම කළ නොහැකියයි න්‍යායක් දුන්නේය. හේ බුදුන් විසින් දෙන ලද න්‍යාය අනුව සිට බුදුන් වැඳ ස්වාමීනි අද පටන් මා සතු ඇදි වතක නුලක් පමණවත් මා අභිභවා නොයෙක් සියගණන් රජවරුද - සොරුන්ද ගැනීමට සමත් අය නොවේවායි ප්‍රාර්ථනයක් කළේය. බුදුරදුන්ද එලෙස වේවායි අනුමෝදනා කළහ. ඔහු ගඳකිළි මහ උත්සවය කරද්දී හැට අට දහසක් භික්ෂූන් වහන්සේලාට මහදන් පිරිනමා කෙළෙවර තුන් සිවුරු පූජා කළේය. නවක භික්ෂූන්ට සිවුරු රෙදි ලක්ෂයක් අගනා ඒවා පරිත්‍යාග කෙරුණි. ඔහු මෙසේ දිවි ඇතිතෙක් පිංකර ඉන් චුතවූයේ දෙවිලොව ඉපදුනේ මෙපමණකල් දෙවිමිනිසුන් අතර සැරිසරා මේ බුදෙඩාත් පාද කාලයේදී රජගහනුවර එක් සිටුකුලයක ප්‍රතිසන්ධි ගෙන දසඑකඩ මසක් මවුකුස සිටියේය. ඔහු උපන්දින නගරයේ සියළු ආභරණ දිළිසුනි. ආලෝකයක් නිකුත් වුනි. නගරයම එකම ප්‍රභාවක් පැවතුනි. සිටාණෝද අළුයම රාජ්‍ය උපාස්ථානයට ගියේය. අනතුරුව රජු විසින් විමසන ලදී. අපේ සියළු ආයුධ දිළිසුණි. නගරයට එකම ආලෝකයක් විය. ඔබ මෙයට හේතු කාරණ දන්නේද? රජතුමනි දනිමි. කුමක්ද හේතුව මගේ ගෙයි ඔබේ දාසයෙක් උපන්නේය. ඔහුගේ පින්තෙදින් මෙය සිදුවිය. කුමක්ද ඔහු හොරෙක් වන්නේද? නැත දේවයනි, කරණ ලද අධිකාර ඇති පිංවතෙකි. එනිසා ඔහු වැයමින් පෝෂණය කිරීම වටී. මෙය කිරිසඳහා

වේවායි. දෙනිකව දහයක් නියම කර පැනවීය. මොහුට නම් තබන දින මුළු නගරයම බැබලුන නිසා ජෝතිය යනුවෙන් නම්කෙරුනි. අනතුරුව ඔහු වැඩිවියට පත්කළ නිවසක් සැදීම සඳහා බිම සකස් කරණ විට සක්දෙවිදු හටන උණුසුම් විය. සක්දෙවිදු මේ කුමක්දැයි සොයා බලන්නේ ජෝතියට ගෙයක් ගන්නේයයි දැන මෙබඳු ගෙයක ඔහු නොවටීයයි මා විසින් එහි යායුතු යයි වඩුවෙකුගේ වේෂයෙන් එහි ගොස් කුමක් කරන්නේදැයි විමසා ජෝතියගේ ගෙය හදන තැන ගන්නෙමුයි. පහවයවු මොහු තොප විසින් කරණ ගෙයි නොවසයි කියා සොළොස් කරියක් පමණ භූමි ප්‍රදේශය බැලුවේය. එකෙණෙහිම එම ප්‍රදේශ කසිණ මණ්ඩලයක් ලෙස සමාන විය. නැවත මෙතැන පොළව බිඳ සප්ත රතනමය ප්‍රාකාර සහිත සත්මහල් පහයක් ඇතිවේයයි සිතා බැලු වේය. ඒවෙලෙහිම පත්මහල් ප්‍රාසාදයක් පැන නැගුනි. නැවත මේ මන්දිරය වටකොට සත්තරතනමය ප්‍රාකාරහතක් වේවායි සිතා බැලුවේය. එබඳු වූ ප්‍රාකාර පැන නැගුනි. මේ මා අතර කල්පවෘක්ෂ හටගනිත්වායි ප්‍රාසාදයේ සතර කොන්හි ප්‍රාසාද හතරක් නැගේවායි සිතා බැලුවේය. සියල්ල එසේම ඇතිවිය. එසේම සතර කොනෙහි සතර නිධිකුම්භ (නිධාන්පිරවු මහතළ) ඇති වේවායි සිතා බැලුවිට එකක් යොදුනක් දිගවිය. එකක් ගවු තුනක්විය එකක් අඩයොදුනක් දුරට පිහිටි යේය, එකක්ගවු පමණ දුරවිය. බෝසතුන්ට පහළ වූ නිධිකුම්භ මේවාගේ කටටම සමානවිය. යටට පොළොව අවසානයට පැතුරුනි. ජෝතිය සිටුවරයාට පහළ වූ නිධි කුම්භයන්ගේ මුඛ පරිමාව කියා නැත සියල්ලම කට කැපූ තල්ගෙඩි සේ පිරිතිබුනි. සතර මුළුවල තරුණ තල්කඳක් ප්‍රමාණ වූ සතර රන්මය උක් යෂ්ඨි ඇතිවිය. ඒවායේ මැණික්මය කොල ස්වර්ණමය උක්යෂ්ටි ඇතිවිය. පෙර කරණ ලද කර්ම දැක්වීම මේ සියල්ල පහල විය. දොරවල් හතේ යක්ෂයෝ සත් දෙනෙක් ආරක්ෂාව ගත්හ. පළමු දොර කොටුවේ යමකවෝලි නම් යක්ෂයා පිරිවර යකුන් දහයක් සමග ආරක්ෂාව ගත්තේය. දෙවැනි දොරටුවේ "උප්පල" නම් යක්ෂයා තමයක්ෂ පිරිස දෙදහසක් සමග ආරක්ෂාව ගත්හ. තුන්වැනි දොරටුවේ "වජිර" නම් යක්ෂයා තුන් දහසක් පිරිස සමග ආරක්ෂාව ගත්තේය. හතර වැනි දොරටුවේ "වජිර බාහු" යක්ෂයා හාර දහසක් සමග ආරක්ෂාව ගත්තේය. පස්වැන්නේ පන්දහසක් සමග ද සයවැන්නෙහි කටපූ නම් යක්ෂයා සයදහසක් යක්ෂයන් ද සමගද හත් වැන්නේ දිසා මුඛ නම් යක්ෂයා හත් දහසක් සමග

ආරක්ෂාව ගත්තේය මේ ලෙසට ප්‍රාසාදයේ ඇතුලතද පිටතද දැඩි ආරක්ෂාවක් විය. මේ තොරතුරු අසා බිම්බිසාර රජු සෙටියි ඡතුය යැවීය. ඔහු ජෝතිය සිටු නමින් ප්‍රසිද්ධ විය. ඔහු සමග කරණ ලද කුශල කර්ම නිසා ස්ත්‍රිය උතුරුකුරු ප්‍රදේශයේ උපන්නාය. අනතුරුව දෙවියෝ ඇය ගෙනවුත් ශ්‍රීයහන් ගබඩාවේ නිදිකර තැබුහ. ඇය එන විට එක් සහල් නැලියක් දිලිසෙන ගල් තුනක් ගත්තේය. ඔවුන්ගේ දිවි ඇතිතෙක් ඒ සහල් නැලියේ බත්මවිය ඉදින් අවශ්‍යනම් ගැල් සියයක් මුව පිරීමට කැමතිවේනම් එය නැලියක් ලෙසටම පවතී. බත් උයන විට සහල් සැළියේ තබා ඒ ගල්උඩා තබයි. ගල් ඒවේලාවේ දිලිසී ඇවිල බත් උයන විට පැසී නිවියයි මේ සංඥාවෙන් බත පැසීබව ඇති දනී. සුප ආදීය උයන විටද මේ ලෙසටම ඉදේ. ගෘහයේ මැණික් ආලෝකයෙන්ම වසන්නී ගින්නේ හෝ පහසේ හෝ ආලෝකය නො දන්නීය. ජෝතිය සිටුවරයාගේ මේ සම්පත් පිළිබඳව මුළු දඹදිවම ප්‍රසිද්ධවිය. මහජනයා යාන වාහන යොදාගෙන මන්දිරය බැලීමට එති. ජෝතිය සිටුවරයා පැමිනි සැමට උතුරු කුරු දේශයේ බත් පිසදෙයි කල්ප වෘක්ෂයෙන් වස්ත්‍ර ගනීවා ආභරණ ගනීවායි අණ කරයි. තුන්ගවු පමණ වූ නිධානවලින් කට විවෘත කරවා යැවීමට අවශ්‍ය (මුදල්) ධනය ගන්නැයි නියෝග දුනි. මුළු දඹදිව වාසීන් ධනය ගත්තේ පමණක් දැගුලෙන්ගත් ගත් නොවිය. එය අඩුනොවේ. ගඳ කිළියේ පිරිවෙනේ වැලි අතුරුවා විසිරුවන ලද මැණික් නිසා ලද සම්පත්තියයි. මෙලෙස මහජනයා පැමිණ කැමති දෑ අරගෙන යන විට බිම්බිසාර රජුටද මෙය බලන්නට සිතක් ඇතිවිය. ජෝතිය සිටුවරයාගේ පියාට මෙසේ කීවේය. ඔබේ පුතුගේ ප්‍රාසාදය දකිනු කැමැත්තෙමි. ඔහු දේවයනි යහපතැයි කියා ගොස් පුතුට පැවසුවේය. දරුව රජු ඔබේ ප්‍රාසාදය දකිනු කැමතිය. යහපත පැමිණේවායි දැන්වුවිට රජු මහත් පිරිවර සමග එහි ගියේය. පළමු දොරකොටුවේදි අතුගා කසල බැහැර කරණ දාසිය රජුට අත දුන්නාය. රජු සිටුවරයාගේ බිරිඳ යයි සිතා ඇගේ බාහුවේ අත නොතැබුවේය.

මේ ලෙසට අනෙක් දොරටුවල දාසීන් සිටු බිරිය යයි සිතමින් ඇගේ බාහුවේ අත නොතැබුවේය. ජෝතිය පැමිණ ඉදිරියට පෙරගමන්කර නමස්කාර කර පසුපසින් සිට දේවයනි පෙරට යන්නැයි පැවසුවේය. රජු මැණික් ඇල්ලූ පොළොවේ මිනිසුන් සියයක් මෙන් පෙනේ ඔහු මම ගැනීම සඳහා

අවධානයක් කරණ ලද්දේයයි සිතුවේ පා එසවීමට නොහැකිවිය ජෝතිය දේවයනි මෙය අවමානයක් නොවේ. මා පසුපස එන්නැයි පෙරට ගියේය. රජු ඔහු නැගුපසු රජු පා තබා ඉහළම තලයේසිට ප්‍රාසාදය බලන්නේ හැසිරුනේය. එදින අජාසත්ත කුමරුද පියාගේ අගිල්ලේ එල්ලී හැසිරෙන්නේ මෙසේ සිතුවේය. හෝ මගේ පියා කෙතරම් අද බාලයෙක්ද? පියාගේ සිටු වරයා සත්රුවන් මය ප්‍රාසාදයක වාසයකරයි. මම රජ වී මෙන් පසුව මොහුට මෙම මන්දිරයේ වාසය කිරීමට නොදෙමි. රජුද උපරිම තලයට නගින විට උදේ ආහාරගන්නා වේලාව ලඟාවිය. රජු සිටුවරයාට කථා කොට මහ සිටු තුමනි මෙහිම ආහාරගනිමු. දනිමි දේවයනි රජතුමාට ආහාරා පිළියෙළ කර ඇත. ඔහු සොළොස් සුවඳ කළයකින් ස්නානය කර රන්මය වූ සිටුවරයාගේ වාඩිවන මණ්ඩපයේ පනවා තිබූ අසුනේ වාඩි වුයේය. අනතුරුව රජුට අතසෝදන ජලය දී ලක්ෂයක් වටිනා රන් බඳුනක තෙත් කිරිබත් බෙදා රජු ඉදිරියේ තැබුවේය. රජු භෝජනය කැයි හැඟීමෙන් කන්නට පටන්ගති. සිටුවරයා දේවයෙනි, මෙය භෝජනයක් නොවේ. කිලින්න පයාසනම් අනෙක් රන් බඳුනක භෝජන වඩා මුල් භාජනය තැබුහ. උඩ තැබූ බදුනේ උණු නිසා වැළඳීම පහසුය. රජු මධුර ආහාර අනුභව කරන්නේ ප්‍රමාණයක් නො දක්නේය. අනතුරුව සිටුවරයා එයද ඇදිලිබැඳ ඇත දේවයනි මෙය ප්‍රමාණවත් වේ. මෙයට වඩා ගැනීමෙන් දිරවීමට අපහසු වනු ඇතැයි පැවසුවේය. අනතුරුව රජු මෙසේ කීවේය. ඇයි ගෘහපතිය ගරුකොට කියන්නේ තමන්ගේ බත දේවයනි මේවා අපේ නොවේ. සියළුම බලකායට මෙයම බත මේ ව්‍යඤ්ජන ද මට අපකීර්තියටද බිය වෙමි. ඇයි ඒ ඉදින් දේවයන් වහන්සේට කායික අලස වත් බවක් ඇතිවේනම් ඊයේ රජතුමා සිටුවරයා බත අනුභව කරණ ලදී. සිටුවරයා විසින් කිසිවක් කරණ ලද්දේයයි යන වචන වලට මට බියවෙමි. එසේ නම් බත් ගෙනයන්න. ජලය ගෙන එන්න. රජු බත්කිස අවසානයේ ඒ සියළු රජ පිරිවර රජු බත් කිස අවසානයේ ඒ සියළු රජ පිරිවර ද ඒ බත අනුභව කළහ. රජ සුබ කථාවෙන් සිටියේ සිටුවරයා අමතා කිම මේ සිටු මැදුරේ බිරිඳක් නැත්දැයි විමසුවේය. දේවයෙනි ඇත. ඇය කොහේද සිරියහන් ගබඩාවේ සිටී දේවයන් පැමිණිබව නොදනී. රජු පිරිවර සහිතව පැමිණි බව නො දනී. රජතෙමේ ඔබ දකිනු කැමතිවේ. රජු දැකීමට නොවටින්නේදැයි සිටු බිරිඳට කීවේය. ඇය නිදාගෙන ගෙන ස්වාමීනි රජු කවුරුද ? රජු නම් අපේ

ප්‍රධානියායි පැවසුවිට අකමැත්ත පවසමින් අපේ පිං දුබලය අපට වඩා ඉසුරෙන් නොසිටීමට ශ්‍රද්ධා වෙන් පිං නොකිරීම නිසා සිදුවිය. ඒ කාන්තයෙන් නො අදහා දන්දෙන ලද්දේය මේ එහි ඵලයකි. ස්වාමීනි දැන් කුමක් කරන්නද - පවන් සැලිය යුතුය සොඳුර ඇය තල්වැට ගෙන අවුත් රජුට පවන්සලා සිටියදී රජුගේ හිස් වෙළුමේ ගඳ මිශ්‍ර සුළඟ වේදනා විය. අනතුරුව ඇසේ කඳුළු ධාරා ඇතිවිය. මේ දැක රජු සිටුවරයාගෙන් විමසුවේය. ගැහැනුනම් අඩුනුවණ ඇති අයයි. රජු මගේ ස්වාමීයාගේ සම්පත් ගනියයි බියෙන් අඩනු ඇත. ඔබේ බිරිඳ අස්වසන්න ඔබේ සම්පත්වලින් මට වැඩක් නැතිබව කියන්න. නැහැ රජතුමනි. ඇය එනිසා අඩන්නේ නැත. එසේ නම් කුමක් නිසා ඇය අඩන්නේද? ඔබ වහන්සේගේ හිස් වෙළුමේ ගඳ ඇගේ ඇස පහරයි. ඇය ඉර එළිය පහන් එළිය නො ගනී. ඇය මැණික් ආලෝකයෙන් ආහාර ගනී. නිදා ගනී. රජ තුමා පහන් එළියෙන් සිටියේ වෙයි. එසේය සිටුවරය එසේනම් දේවයනි අදින් පසු මැණික් එළියෙන් සිටින්නැයි මහත්වූ පුහුල්ගෙඩියක් සමාන උතුම් මැණිකක් පිරිනැමීය. රජ ගෙය බලා ජෝතිය සිටුවරයාගේ සම්පත් ඉතා මහත්යයි කියා පිටත්ව ගියේය. මේ ජෝතිය සිටු වරයාගේ කථාවයි.

දැන් ජටිලගේ උප්පත්ති කථාව දැනගත යුතුය. බරණැස එක් සිටුදුවක් රෑමත් වූවාය. ඇය පහළොව දාසය වසර අතර කාලයේ ආරක්ෂාව සඳහා එක් දාසියක් දී සත්බුමු ප්‍රාසාදයක උපරිම තලයේ සිරයහනේ වාසය කරවීය. ඇය එක් දිනක් ජනේලය විවරකර පිටත බලන්නේ අහසින් යන එක් විද්‍යාධරයෙකු විසින් දැක උපන් සේනහ ඇතිව ජනේලයෙන් ඇතුළුවී ඇය සමග සහවාසය කලේය. ඇය ඔහු හා සංවාසය කිරීම නිසා නොබෝ දිනකින් ගැබ් ගත්තාය. අනතුරුව ඇය දාසිය දැක මැණියෙනි මේ කුමක් නිසාදැයි විමසා සිටිවිට එසේ වේවා ඔබ කිසිවෙකුටත් මෙය නොකියන්න. කුමරිය මෙසේ කීමනිසා ඇය බියෙන් නිහඬ වූවාය. කුමරිය දසමසකින් දරුවෙකු බිහිකළාය. අළුත් භාජනයක් ගෙන්වාගෙන එහි ඒ දරුවා නිදිකරවා එම භාජනය වසා ඒ මත මල් දාමයක් තබා මෙය හිසෙන් ගෙන ගොස් ගඟට දමන්නැයි කියා මේ කුමක් දැ විමසුවිට ආර්යාවගේ බලිකර්ම යක්ෂයි කියන ලෙස පැවසුවාය. ඇය එසේ කළාය. ගඟ පහළ කොටසේ නාමින් සිටිය කාන්තාවන් දෙදෙනෙක් භාජනය දියේ පාවනු බලා එක් ස්ත්‍රියක් භාජනය

මටයි කීවාය අනෙක් ස්ත්‍රීය එහි තිබෙන දෙය මටයයි පැවසුවාය. භාජනය පැමිණිවිට දරුවා මටයයි කීවාය. ඔවුන් දෙදෙනා විවාද කරමින් විනිශ්චය ස්ථානයට ගොස් මේ කරුණ දැනුම් දී ඇමතියන්ටද විනිශ්චය කිරීමට අපහසුව රජුලඟට ගියාහුය. රජතුමා ඔවුන්ගේ වචනය ගෙන නුඹ භාජනය ගන්න, නුඹ දරුවා ගන්නැයි පැවසුවේය. යම් ස්ත්‍රියක් දරුවා ලැබුවාද ඇය මහා කච්චාන තෙරුන් වහන්සේගේ උපස්ථායිකාවක් වෙයි. එනිසා ඇය මේ දරුවා තෙරුන්ලඟ පැවිදිකරවමින් පෝෂණය කළාය. ඔහු උපන්දින ගම්වල සෝධා පිරිසිදු නොකළ හෙයින් කෙස් කැටිවී තිබුනි .

එනිසා ඔහුට ජටිල යන නම ඇතිවුනි. පයින් හැසිරෙන කාලයේදී තෙරුන් එම නිවසට පිණ්ඩ පාතයේ වැඩම කළහ. උපාසිකාව තෙරුන් වාඩි කරවා ආහාර පිරිනැමීම කළාය. තෙරුන් දරුවා දක කිම උපාසිකාව දරුවෙක් ලැබුවාදැයි විමසුහ. එසේය ස්වාමීනි මේ දරුවා ඔබවහන්සේ වෙත පැවිදි කරවන්නෙමියි පෝෂණය කළෙමි මොහු පැවිදි කරවන්නැයි දුන්නාය. තෙරුන් යහපතැයි ඔහු රැගෙන යන්නේ මොහුට ගිහි සම්පත් තිබේදැයි බලන්නේ මහා පින් වත් සත්වයෙකැයි ද මහා සම්පත් අනුභව කරන්නේයයි දැන දහර කාලයේදීම ඤාණයද මුහුකුරා යන්නේයයි සිතා ඔහුන් ගෙන ගොස් තක්සිලාවේ එක් උපස්ථායක ගෙයකට වැඩම කළහ.

ඔහු තෙරුන්ට වැද දරුවා දැක ස්වාමීනි ඔබවහන්සේ දරුවෙක් ලබන ලදදැයි විමසුවේය. එසේය උපාසක ඔහු පැවිදිකරවන තුරු ඔබ ලඟම සිටිවායි පැවසුහ. ඔහු යහපතැයි දරුවා පුතුතනතුරේ තබා පෝෂණය කළේය. ඔහුගේ ගෙදර වසර දොළහක් වටිනා භාණ්ඩ විය. ඔහු වෙනත් ගමකට යනවිට කඩයට ගෙන ගොස් වෙළඳහලේ දරුවා තබා ඒ ඒ භාණ්ඩ වල මුදළ කියා මේ මේ භාණ්ඩ මෙතරම් වටින්නේයයි ද මෙපමණ අයකර දෙන්න යයිද පවසා ගියේය. එදවස නගර ආරක්ෂක දෙවියා යටත් පිරිසයින් මිරිස් දිරවන පමණක්වත් අවශ්‍ය අය එම කඩය දෙසටම යැවුහ. ඔහු වසර දොළහක් වටිනා භාණ්ඩ එකම දවසින් විකුණා අවසන් විය. කෙළෙඹියා පැමිණ කඩයේ කිසිවක් නොදැක දරුව සියල්ල විනාශවුවේ දැයි විමසුවේය. නැත විනාශ නො කෙලෙමි. සියල්ලම ඔබ කිව ආකාරයට විකුණුවෙමි. මේ අසවල් භාණ්ඩයට මුදළ මේ අසවල් භාණ්ඩයට මිළ යයි දුන්නේය.

කෙළෙඹියා පැහැදී අතර්ස පුරුෂ යෙකි කොහේ වුවත් ජීවත් විය හැකි දක්ෂයෙකි. තම නිවසේ වැඩසිටි දුවනිය ඔහුට දී ඔවුන්ට නිවසක්ද සාදා දෙන ලෙසට මිනිසුන්ට අණදී එය සාදවා ඔවුන්ගේ නිවසට යන ලෙසට කියා එහි වාසය කරවීය. අනතුරුව ගෙට පිවිසෙන අවස්ථාවේදී එක පාදයකින් දොර පඩියේ පියවර තුබුවිගස ගෙය පසුපස බිම බිඳී රියන් අසුවක් වූ රන් පර්වතයක් මැවුනි. රජතුමා සිටුවරයාගේ නිවස රන් පර්වතයක් පැන නැංගේයයි අසා සිටුතනතුරට දෙන ඡත්‍රයක් යැවීය ඔහු ජටිල සිටුතුමා විය. ඔහුට පුතුන් තිදෙනෙක් වුහ. ඔහු ඔවුන් වයසට පත්කළ පැවිද්දට සිත උපදවා ඉදින් අපගේ සමාන සිටුකුලයක් වන්නේ නම් පැවිදි වීමට දෙන්නේය. එසේ නොවේනම් නොදෙන්නේය. දඹදිව අප සමාන භෝග සම්පත් ඇති කුලයක් තිබේදැයි ස්වර්ණය උළුකැටයක් රන්මය කෙවිටක් රන්මය හවඩියක් කරවා පුරුෂයන්ගේ අතට දී යවූ මේවා ගෙන කිසිවක් සොයන ලෙසට දඹදිව් තලයේ හැසිරි, අපට සමාන භෝග ඇති සිටුකුලයක් ඇතිබව හෝ නොමැතිබව දැනපැමිණෙව් යැවීය. ඔවුහු චාරිකාවේ යෙදෙමින් භද්දිය නගරයට පැමිණියාහුය. ඔවුන් මෙණ්ඩක සිටුවරයා දක දරුවනි කුමක් කරවිදැයි විමසා එක් දෙයක් සොයමින් හැසිරෙන්නාවුයි පැවසුවිට මේවාට මේවා ගෙන කිසිවක් ගෙන බලමින් හැසිරීමෙන් වැඩක් නැත. රට පරීක්ෂා කරමින් හැසිරේයයි දැන දරුව අපේ පසුපස ගෙයි පරීක්ෂාකර බලන්නැයි කීවිය. ඔවුහු එහි අවකිරියක් පමණ නැන ඇත්, අශ්ව. ගව ප්‍රමාණ පිටින් පිට ගැටී පොළව බිඳ නැගීසිටී යට කියන ලද පරිදි රන් බැටලුවන් දක ඒ අතර හැසිරි නික්මුනාහුය. අනතුරුව සිටුවරයා ඔවුන්ගෙන් දරුවනි විමසා යන දෙය හමුවිදැයි විමසුවේය නොදන්නා ලදී කිවිට එසේනම් යන්නැයි පිටත් කළේය.

ඔවුන් ඉන් පිටත්ව ගොස් තම සිටුවරයාට දරුවෙනි අපට සමාන සම්පත් ඇති සිටුවරයෙක් දක්කේදැයි විමසා ස්වාමීනි ඔබට කුමක් කිවේද මෙණ්ඩක සිටුවරයාට මෙහෙව් සම්පත් ඇතැයි පැවසුවේය. එම සියළු පුවත් අසා සිටුතුමා සතුටුව එකක් හමුවිය තව ද එබඳු සිටු මැඳුරු ඇතැයි සිතා ලක්ෂයක්වටිනා පලසක් දී දරුවෙනි යවු තවත් සිටුකුලයක් සොයමි කියා පිටත්කර යැවීවේය. ඔවුහු රජගහ නුවරට ගොස් ජෝතිය සිටුවරයාගේ ගෙය අසල දර ගොඩක් රැස්කර ගිනි අවුලුවා සිටියාහුය මේ කුමක්දැයි

විමසුවිටද අපි මහාර්ඝ වූ එක් කම්බලයක් ගෙන විකුණන්නේ මිළට ගන්නෙක් නැතැයි පැවසුහ. ඔවුන් කැඳවා මේ කම්බිලිය කොපමණ වටිනදැයි විමසුවේය. ලක්ෂයකැයි පැවසුවිට ලක්ෂයක් දී දොර කොටුවට පැමිණ කසල ශුද්ධ කරණ දාසියට දෙන්නැයි ඔවුන්ගේ අත යැව්වේය. ඇය කම්බලය ගෙන අඩමින් ස්වාමියා වෙතට ගොස් ඇය ස්වාමීනි අපරාධයක් ඇතිවිට මට පහර දෙන්න නොවටිද කෑමක් නිසා මෙබඳු නොවටිනා කම්බිලියක් එව්වේද? කෙසේනම් මම අදිමිද නැතහොත් පොරවමිද? නැත මෙය එව්වේ ඔබේ නිදන ඇඳ කෙළවර තබා නිදනවිට සුවඳ ජලයෙන් සෝධන පා පිස දැමීම සඳහාය. ඇය එය කිරීමටවත් නොවටීද? එය කිරීමට හැකියයි පවසා පිටත්ව ගියේය. එම පුරුෂයෝ මේ කරුණ දැක තම සිටු වරයාගේ සමීපයට ගොස් දරුව දුටුවේදැයි විමසුවිට ස්වාමීනි ඔබට කුමක් කිවේද රජගහ නුවර ජෝතිය සිටුවරයාට මේ තරම් සම්පත් තිබේ. ගෙදර සියළු සම්පත් දනුම්දී මේ පුවත් පැවසුහ. සිටුවරයා මේ තොරතුරු අසා සතුටුව දැන් පැවිදි වීම ලබන්නේයයි රජුවෙතට ගොස් මහරජ පැවිදිවීමට කැමතියයි පැවසුවිට හොඳය මහ සිටුතුමනි පැවිදි වන්නැයි අනුමත කළේය. ඔහු ගෙට ගොස් පුතුන් අමතා රන්දණ්ඩ වජිරනලය උදැල්ල දෙටු පුතුට භාරදී දරුව ... පසුපස රන් පර්වතයකි. රන් පර්වතයක් ඇත. ගලවන්නැයි පැවසුවේය. ඔහු උදැල්ල ගෙන රන් පර්වතයට පහර දුනි. පිහිටි ගලක් උඩට ගැසුවාක් මෙන් විය. ඔහුගේ අතින් උදැල්ල ගෙන මධ්‍යමයාගේ අතට දී යැව්වේය. ඔහු පහර දෙනවිටද ගලමතට පහර දුන්නා සේ විය. පසුව බාල පුතුට දුනි ඔහු පහර දෙනවිට එකම එකකුලක මැටි ගොඩකට පහර දෙන්නාක් සේ විය. අනතුරුව සිටුවරයා එන්න දරුවනි මෙයින් වැඩක් නැත. පවසා අනෙක් ජ්‍යෙෂ්ඨ සහෝදරයන් කැඳවා මේ රන් පර්වතය ඔබට ඇතිවුයේ නොවේ. මට ද බාලයාටද ඇතිවිය. මොහු සමග එකට එකතුවී පාරිභෝග තරන්නැයි පැවසුවේය. කුමක් නිසා ඔවුන් සඳහාම පහළ වීද කුමක් නිසා ජටිල උපන්කළ ජලයේ වැටුනේද?තමන් කළ කර්මය නිසාමය. කාශ්‍යප බුදුන් ගේ සෑය කරණ කාලයේදී එක් රහතන් වහන්සේ නමක් චෛත්‍ය කරණ තැනට ගොස් බලා දරුවෙන් චෛත්‍යයේ උතුරු දිග මූණ නොනැංගේ කුමක් නිසාද? විමසුහ. රන් ප්‍රමාණවත් නැතැයි පැවසුවේය. මම ඇතුළු ගමට පිවිසී ඔබ සම්මාදන් කරවන්නෙමි. තෙපි සමාදන් කරවන්නෙමියි තෙපි ආදර යෙන් කර්මාන්තය කරන්නැයි ඔහු මෙසේ කියා නගරයට පිවිස මැණි

වරුනි පියවරුනි. තොපගේ චෛත්‍යයට එක් දොරටුවකට රන් සෑහෙන්නේ නැත. රන් දෙන්නැයි මහජනයා සම්මාදන් කරවමින් රන් කුලයකට ගියේය. ස්වර්ණාභරණ හඳන්නාද එකෙනෙහිම භාර්යාව සමග කලහ කොට සිටියේ වෙයි. මේ අනුව තෙරුන් වහන්සේ චෛත්‍යයේ ඔබ විසින් ගන්නා ලද කොටස රන් ප්‍රමාණවත් නොවේ. එය දැනගැනීම වැදගත් වේය. පැවසුහ. ඔහු භාර්යාවට කෝපයෙන් ඔබේ ශාස්තෘ වරයා ජලයට විසිකර යන්නැයි පැවසුවේය. අනතුරුව ඇය ඔහුට ඉතා සැහැසි දෙයක් නුඹ විසින් කරණ ලදී මා කෙරෙහි කෝපයෙන් නුඹ මට දොස් නැසිය යුතුය. නැතහොත් පහර දිය යුතුය කුමක් නිසා අතීත, අනාගත, වර්තමාන, බුදුවරුන්ට වෛර කළේදැයි විමසුවේය. රන්කරු එකෙනෙහි සංවේගයට පත්වූයේ ස්වාමීනි මට සමාවන්නැයි කියා තෙරුන්ගේ පාමුල වැටුනි. දරුව ඔබ මට කිසිවක් නොකිවේය. බුදුන් ගෙන් සමාව ගන්න. ස්වාමීනි කුමක් කර මම සමාව ගන්නේද? රන් මල් තුනක් කර කළයේ තබා ඇතුල් නිධානයේ තබන්න. එසේ තබා තෙත වස්ත්‍රයෙන් තෙත කෙස්වලින් සිට සමාව ඉල්ලන්න. ඔහු ස්වාමීනි යහපතැයි ස්වාමීනි කියා රන්මල් කරන්නේ පූතුන් තිදෙනා අතරින් ජ්‍යෙෂ්ඨ පුතු අමතා එන්න දරුව මම බුදුන්ට වෛර සහිත වචනයෙන් කථාකළෙමි. එනිසා මේ මල් කර ධාතු නිධානයේ තබා සමාව ගන්නෙමි. නුඹද මට උපකාර කරන්නැයි පැවසුවේය. පියාණනි ඔබම ධෛර්යය වචන කීවේය. එනිසා ඔබම එය කරන්නැයි කීරීමට කැමති නොවිය. මධ්‍යම පුතුටද කණිෂ්ඨ පුතුටද මෙසේම කිවේය, කණිෂ්ඨයා පියාට ඇතිවූ කරුණ පුතාටද හාරවේ. පියාගේ සහායකයා වී රන්මල් කළේය. රන් කරු විශාල පමණ රන් මල් කර කළයක තබා ධාතු නිධානයේ තබා තෙත කෙස් හා තෙත වස්ත්‍ර ඇතිව බුදුන් ක්ෂමා කරවීය. මේ නිසා ඔහු හත්වරක් ජලයට වැටුනි මේ කරුණ නිසා කෙලවර සිටි ආත්මභාවය නිසා මෙලොව දීද නිසැකව ජලයේ වැටුනි. ජ්‍යෙෂ්ඨ පුතුන් දෙදෙනා රන් මල් කරණ අවස්ථාවේදී සහාය දීමට අකමැතිවිය. එනිසා ඔවුන්ට මේ කරුණ නිසා රන් පර්වතය ඇති නොවුයේය. කණිටු පුතාව හා ජටිලට එකට එකතුවී කළ නිසා රන් පර්වතය කඩාගත හැකිවිය. මෙලෙස පුතුන්ට අවාද දී බුදුන් වෙත පැවිදිවී දින කීපයකින්ම රහත් වීමට හැකිවිය. බුදුහු පසුකලෙක පන්සියයක් භික්ෂූන් සමග පිඬුසිඟා වඩින්නේ ඔහුගේ ගෙදරට වැඩමකළහ. ඔවුන්තිදෙනා බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට අඩමසක් භික්ෂාව පිරිනැමුහ.

542

භික්ෂූන්ද දම් සභාවේ කථාවක් ඇතිකළහ. බුදුහු ඔවුන්ගේ කථා අසා මහණෙනි මගේ පුතුන්ට තෘෂ්ණාව හෝ මානය නැතැයි පවසා ධර්ම දේශනා කරන්නේ මේ ගාථාව දෙසුහ.

තන්හාව නැති කොට
ගිහිගෙන්ද නික්මී ගොස්
පැවිදි සුව විඳිනෝ
බමුණෙනි මේ අරහත්

මෙලොව යමෙක් කාමයන් පහකොට අනගාරිව පැවිදි වේද කර්මයන් හා භවයන් පහකෙරයිද ඔහු බ්‍රාහ්මණයයි මම පවසමි.

එහි අරුත - යෝ ඉධලොකෙ සඳොරින් - යමෙක් මෙලොව තණ්හාව දුරු කොට ගිහිගෙයි දිවිය අත්හැර අනාගාරෝ හුත්වා - පැවිදිවේද තෘෂ්ණාවක් භවයක් පරික්ෂිණ කළ නිසා ඔහු බ්‍රාහ්මණයයි මම විමසමි.

දෙසුම අවසන බොහෝ දෙන මාර්ග ඵලයන්ට පත් වුහ.

ජටිල සිටුවරයා පිළිබඳ කථා පුවතයි.

26.34

"**යොධ තණ්හං**" යන මේ ධර්ම දේශනය බුදුහු වේළුවනාරාමයේ වැඩසිටියදී ජෝතිය තෙරුන් පිළිබඳව දේශනා කළහ.

අජාසත් රජු දෙව්දත් තෙරුන් සමග එකට එකතුවී පියා ඝාතනය කර රාජ්‍යයේ පිහිටියේ ජෝතිය සිටුතුමාගේ ප්‍රාසාදය ගන්නෙමියි සංග්‍රාම සන්නධ වුයේ නික්මී මැණික් ප්‍රාකාරයේ පිරිවර සහිත තම ඡායාව දැක ගෘහපති මා යුද්ධ කිරීමට සුදානම් වී බලසෙනඟ ගෙන නික්මී යයි සලකා ලඟට යාමට නොහැකි විය. සිටුවරයාද එදින උපෝසථ සමාදන්වී අළුයම ඇහැර ගෙන විහාරයට ගොස් බුදුන්ලඟ බණ අසමින් සිටියේය. පළමු ද්වාර කොටුව ආරක්ෂාව ගෙන සිටි යමකෝලි යක්ෂයා ඔහු දැක කොහේ යන්නේදයි පිරිවර සහිතව විනාශ කොට දිසා විදිසාවන්හි ලුහු බැන්දේය. රජු විහාරයටම ගියේය, අනතුරුව සිටුවරයා දැක දේවයනි කුමක්දැයි පවසා නැගිසිටියේය. ගෘහපතිය කිම ඔබ ඔබේ පුරුෂයන් මා හා යුද්ධ කිරීමට යොදා යුද්ධ කිරීමට අණකර මෙහි අවුත් බණ අසන ලෙස සිටියි. පැවසුවේය. එවිට සිටුවරයා ඇයි දේවයෙනි. මගේ ගෙය ගැනීමට ගියේද? ඔව් ගියෙමි. මම අකමැතිව මගේ ගෙය ගැනීමට රජවරු දහයකටවත් ගත නොහැකිය. එහිදී ඇය ඔබ රජුද? කියා විමසුවේය. රජතුමනි මාසන්තක නුල්පොටක් හෝ මගේ අකමැත්තෙන් රජවරුන් විසින් හෝ තෙරුන් විසින් හෝ ගැනීමට නොහැකිය. මම ඔබේ කැමැත්තෙන් ගන්නේ කුමක්දැයි විමසුවේය. හොඳයි දේවයනි මේ ඇඟිලි දහසේ මුදු විස්සක් ඇත. මම මේවා ඔබට නොදෙමු හැකිනම් ඔබ ගන්නැයි පැවසුවේය. එහිදී රජු දණ ගසා උත්කුටුකයෙන් සිට පනින්නේනම් රියන් දහයක් උඩට නැඟී සිටගෙන පනින්නේ නම් රියන් අසුවක් උඩට යන්නේය මෙබඳු බලසම්පන්න රජු එහෙ මෙහෙ පෙරළෙමින් එක මුදුවක්ද කඩාගැනීමට නොහැකි විය. අනතුරුව සිටුතුමා දේවයෙනි සළුව අතුරන්නැයි කියා ඇඟිලි සෘජුලෙසට තැබුවේය. මුදු විස්ස නික්මී වැටුනි. අනතුරුව සිටුවරයා දේවයෙනි මා සන්තක දෑ මගේ අකමැත්තෙන් ගත නොහැකියයි පවසා රජුගේ ක්‍රියාදාමයෙන් කළ කිරුන සිටුවරයා මට පැවිදිවීම අවසර දෙන්නැයි

පැවසුනේය. ඔහු පැවිදි වූ විට සුබ ප්‍රාසාදය ගන්නෙමියි සිතා එක වචනයෙන්ම නුඹ පැවිදි වන්නෙයි පැවසුවේය. සිටුවරයා බුදුන් වෙත පැවිදි වී නොබෝ කලකින් රහත්බවට පත්විය. ජෝතික ථෙර නමින් හැඳින්වුනි. ඔහු රහත් බවට පත්වූ විගස සියලුම ඒ සම්පත් අතුරු දහන් විය. සතුලකාය නම් බිරිඳද දෙවියන් විසින් උතුරු කුරු දේශයට ගෙන ගියහ. පසුදිනෙක භික්ෂූන් ඔහු අමතා ඇවැත්නි ජෝතිය එම ප්‍රාසාදය හෝ ස්ත්‍රිය කෙරෙහි තෘෂ්ණාවක් ඇත්දැයි විමසුහ. අවැත්නි නැතැයි පැවසුවිට ඒ පිළිබඳව බුදුන්ට දැනුම් දුන්හ. සිදුනොවුවක් කියන බව පැවසූ විට ඒ පිළිබඳව මහණෙනි මගේ පුතුට ඒවා පිළිබඳ තන්හාවක් නොමැති බව පැවසුහ. මෙලොව යමෙක් කාම තෘෂ්ණ බැහැර කොට ගිහිගෙයින් බැහැරව පැවිදිවේද කාමයන් හා භවයන් දුරුකළ ඔහු බ්‍රාහ්මණයයි මම පවසමි.

එහි අර්ථය යො ඉධ. ලෝකයෙහි ෂට්ද්වාරයන්හි තණ්හං. තෘෂ්ණාව හැර ගෘහවාසයේ අනර්ථ දුක අනගාරික වී භව තණ්හා කාම තණ්හා ආදිය බිඳ දමයි ද ඒ තැනැත්තා බ්‍රාහ්මණයෙකැයි මම කියමි.

මෙම ගාථාවේ අර්ථය, ජටිල ථේර වස්තුවෙහි කියන ලද අයුරින් දත යුතුය.

දේශනාවසානයේ බොහෝ සෝවාන් ආදී මාර්ග ඵලවලට පැමිණියාහුය.

ජෝතිය තෙරුන්ගේ කථා පුවතයි.

26.35

"**හිත්වා**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ සිටියදී එක් කුල පුත්‍රයෙක් නිමිති කරගෙන දේශනා කළහ.

ඔහු ක්‍රීඩා කරමින් හැසිරෙන කල්හි බුදුන්ගේ ධර්ම කථාවක් අසා පැවිදිව රහත් බවට පැමිණුනි. එසමයෙහි බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා සමග පිවිසෙන විට භික්ෂූන් වහන්සේලා එක් නළු පුත්‍රයෙක් ක්‍රීඩාකරණු දැක ඔහුගෙන් විමසුහ. ඇවැත්නි මොහු ඔබ කළ ක්‍රීඩාව ක්‍රීඩා කරන්නේද කියා ඔබට මේ ගැන බැදීමක් ඇලීමක් තිබේද? යි විමසා නැතැයි පැවසුවිට ස්වාමීනි මොහු අහුනයක් කියන්නේ යයි කියා සිටියදී බුදුහු මගේ පුත් සියළු යෝග ඉක්මවා සිටින්නේ යයි පවසා මේ ගාථාව දේශනා කළහ.

දෙවි මිනිස් පස්කම්
සුවය හැරදා නිසිසේ
සතර ඔගෙන් මිදී
නිවසන කෙනා බමුණෙකි.

යමෙක් මානුෂික ආයුෂ හා පඤ්චකාම අත්හැර දිව්‍යායුෂ හා දිව්‍ය පඤ්චකාමය ඉක්මවා ගියේද සියළු යෝගයන්ගෙන් වෙන්ම විසංයුතතං ඒ තැනැත්තා බ්‍රාහ්මණ නමින් හඳුන්වමි.

මානුසකං යොගං මානුෂික ආයුෂ පඤ්චකාම ගුණ **දිව්‍ය** යෝගයේද මේ න්‍යාය මැයි **උපචිගා** හෙතෙම මානුෂික යෝග අත්හැර **දිබ්බංයොගං** සියළු චතුර්විධ යෝගයෙන් වෙන්ව **විසං යුත්තං අහං බ්‍රාහ්මණං** - සිටින තැනැත්තා බ්‍රාහ්මණයෙකැයි කියමි.

දේශනාව අවසානයේ බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පත්වුනි.

නාට්‍ය පුත්‍රයා පිළිබඳ කථා පුවතයි.

26.36

"හිත්වා රතිඤ්ඤාති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ සිටියදී එක් නාට්‍ය බ්‍රාහ්මණයෙක් නිමිත්තකර ගෙන දේශනා කළහ.

කථා පුවත පෙරසේමය. මෙහිදී බුදුහු මගේ පුත් රතියද අරතියද දුරු කොට සිටිනේයයි පවසා මේ ගාථාව දේශනා කළහ.

කම් සුවයෙ ආසා
හැරදමා පැවිදිව විත්
උකටලී නොව එහි
මහණදම් රැකි උතුමෝ
වීරියෙන් සවිකෙලෙස්
මැඩ පවත්වන උතුමෝ
බමුණුයයි නම්ලැබ
නිවී සැනසෙති උතුම් නිවනින්

ඇල්ම ද නො ඇල්මද දුරුකළ නිවුන උපධි රහිත කෙලෙස් නැති තැනැත්තා සියලු පස්කම් ලොව ජයගත් වෙර වීරිය ඇති තැනැත්තා ඔහු බ්‍රාහ්මණයෙකි. මම කියමි.

රතිං - පඤ්චකාමයෙහි ඇල්ම **අරතිං** අරඤ්ඤවාසයෙහි උකටලී බව, **සීතිභූතං** - නිවුන **නිරූපං** උපධිනැති... කෙලෙස් රහිත. **වීරං** මෙබඳු සියළු ස්කන්ධ ලෝකය මැඩපවත්වා, වීර්ය වඩන්නා සිටින්නා වූ තැනැත්තා බ්‍රාහ්මණයෙකැයි කියමි.

නාට්‍ය පුත්‍ර බ්‍රාහ්මණයෙක් පිළිබඳ කථා පුවතයි.

26.37

"**චුනිං යො වෙදෙහි**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ **වේළුවනයේ** වැඩසිටියදී වංගීස තෙරුන් නිමිති කරගෙන දේශනා කළහ.

රජගහ නුවර වංගීස නමින් එක් බ්‍රාහ්මණයෙක් වූයේය. ඔහු මියගිය මිනිසුන්ගේ හිසට තට්ටු කර මොහු නිරයේ ඉපදුනි. මොහු තිරිසන් යෝනියේ ඉපදුනි. මොහු ප්‍රේත ලෝකයේ ඉපදුනි. මොහු මිනිස්ලොව ඉපදුනි මොහු දෙව්ලොව උපන්නේයයි දන්නේ ය. බමුණෝ මොහු නිසා මුළුලොව රවටා අපේ බඩ වඩා ගත හැකියයි සිතා ඔහු රතුවස්ත්‍ර දෙකක් අන්දවා ජනපදවලට ගෙනගොස් හැසිරෙමින් මිනිසුන්ට කියති. මේ වංගීස නම් බ්‍රාහ්මණ යයි මළ මිනිසුන්ගේ හිස් කබලට තට්ටුකර උපන් තැන දනී. තමන්ගේ මළ ගිය ඥාතීන්ගේ උපන් තැන විමසන්න. පවසයි. මිනිස්සු තමන්ගේ ශක්තිපමණ කහවනු දහසක් කහවනු විස්සක් කහවනු සියයක් දී තම ඥාතීන් උපන්නැන් විමසති. ඔවුන් පිළිවෙළින් සැවැත් නුවරට පැමිණ ජේතවනයට නොදුරේ නවාතැන් ගත්හ. උදේ ආහාරගෙන මහජනයා ගඳමල්ගත් අත් ඇතිව බණ ඇසීමට යනු දක කොහේ යන්නේදැයි විමසා බණ ඇසීමට විහාරයට යන්නෙමුයි කීවිට එහි ගොස් කුමක් කරවුද, අපේ වංගීස බ්‍රාහ්මණයා හා සමාන නැත. ඔහු මියගිය මිනිසුන්ගේ හිස් කබලට තට්ටු කර මියගිය අය උපන් තැන කියයි. ඔබගේ මළ ඥාතීන් උපන් තැන් විමසා දනිමු. යයි පැවසුහ. ඔවුහු වංගීස කුමක් දනිද අපේ ශාස්තෘවරයා සමාන නැතැයි කියා විවාදකර අපි මෙය දැන ගනිමුයි ඔවුහුත් රැගෙන විහාරයට ගියාහුය. බුදුහු ඔවුන් ආබව දැනගෙන නිරයේ තිරිසන් යෝනියේ, මිනිස් ලොවේ දෙව්ලොවේ සිව් ස්ථානයක උපන් අයගේ හිස් කබල් ද රහතන් වහන්සේ නමකගේ හිස් කබලක්ද තබා වංගීස විමසා පළමු හිස් කබල ඇති තැනැත්තා නිරයේ උපන් බව පැවසීය. බුදුහු සාධුකාර දී අනුමත කළහ. අනෙක් හිස් කබල් තුන අයිති අය නොවරදවා කිහෙයින් සාධුකාර දී අනුමත කර පස්වැනි හිස පෙන්වා මෙය කාගේදැයි විමසුවේය. ඔහුට

පැවසීමට නොහැකිවිය. නොදන්නා බව පැවසුවේය. බුදුරජාණන් වහන්සේ දන්නා බව පැවසුහ. එම මන්ත්‍රය ඉල්ලා සිටිවිට පැවිදි නොවූවන්ට නොදෙන බව පැවසුහ. මෙම මන්ත්‍රය ගත්විට මම මුළු දඹදිවම අග්‍ර වෙමියි සිතා පැමිණ බ්‍රාහ්මණයන්ට සිටින්නැයි කියා බුදුන්වෙත පැවිදිවී උපසම්පදාවද ලබා වංගීස තෙරනම් විය. අනතුරුව ඔහුට ද්වතිංසාකාර දෙතිස් කුණප කර්මස්ථානය දුන්නේය. මන්ත්‍රයට පරිකර්ම වන භාවනාව වඩන ලෙසට පැවසුවේය. බමුණන් පැමිණ වරින් වර මන්ත්‍රය ගත්තේ දැයි විමසුහ. පසුව ගනිමියි ඔවුන්ට පවසා පිටත් කළේය. දින කීපයකින් රහතන් බවට පත්විය මිත්‍ර බමුණා විමසුවිට දැන්මට අවශ්‍යනැතැයි පවසා ඔවුන්ට යන ලෙසට පැවසුවේය. මෙය අසා භික්ෂූන් වංගීස බොරුවක් කියතැයි බුදුන්ට දන්වා සිටියේය. පසුව එසේ නොකියන ලෙසටත් දැන් මගේ පුතු චුති පටිසන්ධි දැක්මේ දක්ෂයෙක් බවත් පැවසුහ.

දෙව් මිනිස් නැමගේ
චුතිය හා උපතද දැන
නිසිමග ගමන් ගත්
නොඇලුණු කිසි තැනෙක් හී
සිව්සස් දත් අයට
බමුණු නාමය උරුම වේමැයි

යම් කෙනෙක් සත්ත්වයන්ගේ චුතිය උත්පත්තියද හැම ලෙසින් දනීද. කිසිවෙක නො ඇලුණා වූ සිත් ඇති මහා ගති ඇති. චතුර් විධසත්‍යය අවබෝධ කළ ඔහු බ්‍රාහ්මණයයි මම කියමි. යමෙකුගේ ගතිය දෙවියෝ ගඳබ්බ හා මිනිස්සු නොදනිත් ද. සිඳුණු ආශ්‍රව ඇති පිදුමට සුදුසු වූ ඒ තැනැත්තා බ්‍රාහ්මණයෙකැයි මම කියමි.

එහි යො වෙදි - යමෙක් **සත්තානං** - සත්ත්වයන්ගේ සියලු ආකාර **චුතිං** චුතියද පිළිසිඳීමද ප්‍රකටව දනීද, **නමහං** නොලැගේද, **අසත්තං** ප්‍රතිපත්තියෙහි මනාව පිහිටියේද. **සුගතං** සිව්සස්හි අවබෝධය ඇත්තේද බුද්ධං බ්‍රාහ්මණයයි කියමි යන අර්ථයි. යම් මේ දේවාදීහු. **ගතිං න ජානන්ති** ජාති ස්වභාවය නො දන්නේද, ආශ්‍රවයන් ප්‍රහාණය කළ බැවින්. ඛීණසවං

කෙලෙසුන්ගෙන් වෙන්වූයේ **අරහන්තං බ්‍රාහ්මණං** බ්‍රාහ්මණය කියයි. යන අර්ථයි

දේශනාවසානයේ බොහෝ දෙනෙක් සෝවාන් ආදී මාර්ග ඵලවල පිහිටියාහුය.

වංගීස තෙරුන් පිළිබඳ කථා පුවත

26.38

"යසසාති" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩසිටියදී ධම්ම දිනනා භික්ෂුණිය නිමිති කරගෙන දේශනාකළහ.

එක්දිනක් ධම්ම දිනනා භික්ෂුණියගේ ගිහිකල ස්වාමීයා වූ විසාඛ උපාසකයා බුදුන්ගෙන් බණ අසා අනාගාමී ඵලයට පත්වී මෙසේ සිතුවේය. ම විසින් සියළු ධනය ධම්ම දිනනාට පැවරීය යුතුය. එතුමා පෙරාතුව එනවිට ජනේලයෙන් බලාසිටින ධම්ම දින්නා සිනා පහළ කරයි. එනමුත් එදින ඔහු ජනේලයෙන් බලාසිටින ඇය දෙස නොබැලුවේය. මේ කුමක් වීදැයි සිතා හොඳයි කෑම ගන්නා විට දුනගතිමියි කෑම අවස්ථාවේදී බත් බෙදුවාය. ඔහු අනෙක් දිනවල එන්න එකට කෑම ගනිමුයි කථාකරයි. මෙදින නිහඬවම කෑම ගත්තේය. ඇය කිසියම් කරුණකට කෝපවී ඇතැයි සිතුවාය. අනතුරුව විසාඛ පහසුවෙන් සිටින විට ධම්ම දිනනා කථාකොට මේ ගෙයි සියළු සම්පත් ඔබම බාර ගන්නැයි පැවසුවේය. ඇය තරහ වීනම් මෙසේ සම්පත් පවරා නොදෙයි මේ කුමක්දැයි විමසා ස්වාමීනි ඔබ මම මෙයින් පසු කිසිවක් නො විමසන්නේද ඔබ විසින් විසිකරණ ලද කෙල මෙන් ඇතිකල මගේ පැවිද්ද අනුමත කරන්න. ඔහු ද මැනවැයි පිළිගෙන මහත් සත්කාරයෙන් භික්ෂුණී ආරාමයට ගෙන ගොස් පැවිදි කළේය. ඇය උපසම්පදාව ලබා ධම්ම දිනනා ථෙරී නම් වූවාය ඇය විවේකය කැමතිව භික්ෂුණීන් සමග ජන පදයට ගොස් එහි වාසය කරන්නී නොබෝ දිනකින් සිටුපිළිසිඹියා රහත් බවට පත්වුවාය. නැවත ඇය මා නිසා ඥාතීන් පින් කරන්නේයයි නැවත ද රජගහ නුවරට ආපසු ගියාය. උපාසක ඇය පැමිණි බව අසා කුමක් නිසා ආවේදැයි භික්ෂුනී ආරාමයට ගොස් තෙරණියට වැද එකත් පසෙක සිට ආර්යාවනි ඇසීමට නුසුදුසු ප්‍රශ්නයක් මම අසමි. ඔබ කළකිරීමට පත්වුයේද? යනුවෙන් ඇසීමට ගොස් සෝවාන් මාර්ගය පිළිබඳව ප්‍රශ්න කළේය ඇය එම ප්‍රශ්න විසඳුවේය. උපාසක ඒ පිළිවෙලට අනෙක් මාර්ග පිළිබඳවද ප්‍රශ්න අසා ඉක්ම ගිය ප්‍රශ්න විමසුවිට ඉක්මවා ගියේයයි ඇවැත්නි විසාඛ බුදුන්ගෙන් මේ ප්‍රශ්න අසන්නැයි කී විට තෙරණිය වැඳ නැගිට බුදුන් වෙත ගොස් ඒ කථා සල්ලාපය සියල්ල බුදුන්ට

දැනුම් දුන්හ. බුදුහු මැනවින් ඇය කියා තිබේ මගේ දියණිය ධම්ම දින්නා මගෙන් ප්‍රශ්න ඇසුවිටද පිළිතුරුදෙන ආකාරයටම ඇය ප්‍රශ්න විසඳා තිබේ. යයි පවසමින් මේ ගාථාව පැවසුහ.

පෙර පසුද මැද යන
තුන් තන්හි පස් කඳ ගැන
ආසා කිසින් නැති
රාග තන් හා සිතින් දුරුකළ
හැඟුම නැති මම මගේ
උතුමෝ බමුණු වේ මැයි.

යමෙකුට අතීතයේ ස්ඛන්ධ පිළිබඳවද අනාගත ස්ඛන්ධයන්හිද වර්තමාන ස්ඛන්ධයන්හිද කරදර පළිබෝධ යක් නැත්ද රාගාදි කිඤ්චන නැති තෘෂ්ණාදි වශයෙන් ග්‍රහණයක් නැති ඔහු බ්‍රාහ්මණ යයි මම කියමි.

එහි **පුරෙ** අතීත ස්ඛන්ධ පිළිබඳව ද. **පච්ඡා** අනාගත ස්ඛන්ධ පිළිබඳව ද, **මජ්ඣෙ** වර්තමාන ස්ඛන්ධ පිළිබඳව ද, **කිඤ්චනං** - යමෙකුට ඒ ඒ තන්හි තණ්හා සංඛ්‍යාත වූ කිසිවක්, **නත්ථි** රාගාදී කිසිත් නැත්ද. **අකිඤ්චනං** - කිසිදු ග්‍රහණයක් නැත්තේ ද, **අනාදානං, බ්‍රාහ්මණං** - බ්‍රාහ්මණයෙකැයි කියමි.

දේශනාවසානයේ බොහෝ දෙන මාර්ග ඵලවලට පැමිණියාහුය.

ධම්ම දින්නා තෙරණියගේ කථා පුවතයි.

26.39

"**උසභනන්ති**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ ජේතවනාරාමයේ වැඩසිටියදී අඬගුලිමාල තෙරුන් නිමිත්තකරගෙන දේශනා කළහ.

කථා පුවත "නවෙ කදරියා දෙවලොකං වජන්ති" යන ගාථා වර්ණනාවේ කියන ලද ආකාරයටය. භික්ෂූන් වහන්සේලා අඬගුලිමාල තෙරුන්ගෙන් විමසුහ. ඇවැත්නි කිම දුෂ්ට වූ හීලෑනොවූ ඇතා කුඩය අල්ලාගෙන සිටිනවිට බියක් ඇතිනොවීද? ඇවැත්නි මම බිය නොවුවෙමි. අඬගුලි මාල වෙනත් දෙයක් කියන බව බුදුන්ට පැවසුවිට නැත මහණෙනි මගේ පුතු අඬගුලි මාල බිය නොවේ. රහත් වෘෂභයන් අතර ජ්‍යෙෂ්ඨ වෘෂභවූ මගේ පුත් අඬගුලිමාල වැනි අය බිය නොවෙති.

නැති ගැනුම් සහ බියත් නැතිකොට
තුන් මරුන් දිනූ විරිය වඩමින්
කෙලෙස් සේදූ නැණින් සිව්සස්
යුතු වූ උතුමෝ බමුණු වේමැයි.

අජානීය වෘෂභ රාජයකු සමාන උතුම් වෙර ඇති, මහත් තෙද ඇති, තණ්හා ආශා දුරු කළ. සිව්සස් දහම් මනාව දත් ඒ තැනැත්තා බ්‍රාහ්මණයයි මම කියමි.

එහි අර්ථය බිය නැති බැවින් ආජානීය වෘෂභයකු සමාන, **උසභං** උතුම් වූ, **පවරං**. වීර්ය සම්පත්තියෙන් යුත්. **වීරං**. මහත් වූ සිල් සමුදායෙන් යුත්. **මහෙසිං** ත්‍රිවිධ මාරයන් දිනූ බැවින් **විජිතාවිනං** කෙලෙස් නැති බැවින් **නහාතකං** චතුරාර්ය සත්‍යය අවබෝධ කළ බැවින් **බුද්ධං නං** එබඳු වූ තැනැත්තා බ්‍රාහ්මණයෙකුයි මම කියමි. යන අර්ථයි.

දේශනාවසානයේ බොහෝ දෙනා සෝවාන් ආදී මාර්ග ඵලවලට පත්වූහ.

අඬගුලි මාල තෙරුන් පිළිබඳ කථා පුවතයි.

26.40

"**පුබ්බෙ නිවාසං**" යන මේ ධර්ම දේශනය ශාස්තෘන් වහන්සේ දෙව්රම වැඩසිටියදී දේවඩ්ගික බ්‍රාහ්මණයාගේ ප්‍රශ්න පිළිබඳව දේශනා කළහ.

එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ වාත ආබාධයෙන් පෙළුණ බැවින්. උණදිය ටිකක් ගෙන ඒම සඳහා උපවාන තෙරුන් දේවඩ්ගික බ්‍රාහ්මණයා වෙත යැවීය. උන් වහන්සේ බමුණා වෙතට ගොස් බුදුරදුන් ආබාධිත බව පවසා උණුවතුර ඉල්ලුවේය. එය අසා බමුණා සතුටුවුයේ මට ලාභයකි බුදුරජාණන් වහන්සේ උණු පැන් සඳහා ශ්‍රාවකයෙක් එවීවේය. උණුපැන් කදක් සාධා පුරුසයෙකු ලවා යවා උපවාන තෙරුන් අත පැණි මුලක්ද යැවීය. තෙරුන් එය ගෙන්වා ගෙන විහාරයට ගොස් බුදුන් උණු ජලයෙන් නාවා උණු ජලයෙන් පැණි දියකර බුදුන්ට පිරිනැමුහ. එකෙනෙහිම ආබාධය සංසිඳුනි. බමුණා මෙසේ සිතුවේය. කාට යමක් දීමෙන් මහත්ඵල මහානි සංස වේද? බුදුන්ගෙන් මෙය විමසමියි බුදුන්වෙත ගොස් එම කරුණ විමසන්නේ මේ ගාථාව පැවසුවේය.

කඳ පිළිවෙළ දන්න පෙර දින තමන්	විසූ
දෙව්ලොව සිටින අය ගැන දිව කණින්	ඇසූ
වෙසෙරද නැණින් අරහත් වී කෙලෙස්	නැසූ
උතුමෝ බමුණෙනි ය සිව් බඹසරින්	විසූ

දෙය්‍ය ධර්ම කාටනම් දිය යුතුද කාට දීමෙන් මහත්ඵල මහානිසංස වේද? කෙසේ යාග කිරීමෙන් දක්ෂිණාව සමෘද්ධ වේද?

අනතුරුව බුදුහු මෙබදු බ්‍රාහ්මණයෙකුට දීමෙන් මහත්ඵල වේ යයි පවසමින් මේ ගාථාව පැවසුහ.

යමෙක් පෙරවිසු කඳ පිළිවෙල දනීද, දෙව්ලොව. මනුලොව. බඹලොව, අපාය ආදිය දිවැසින් දකීද. තවද අර්හත් ඵලයට පැමිණියේද. විශිෂ්ඨ ඥානයෙන් දන සිවු මගින් කටයුතු නිමකලේද, සියළු කෙලෙසුන්ගෙන්

අවසානයයි කියූ අර්හත් ඵල සංඛ්‍යාත බඹසර වැස හිමි කළ ඒ රහතන් වහන්සේ එම බ්‍රාහ්මණ යයි කියමි.

එහි අර්ථය - **යො පුබ්බෙ නිවාසං** - යමෙක් පූර්වේ නිවාසය ප්‍රකට කොට විසිහයක් වූ දේව ලොකාදී සියලු ලෝකයන් දකීද? **සග්ගං අපායං** - සදෙව් ලොව හා අපාය. දිවැසින් දකිද. **අථො ජාතික්ඛය** ඉපැත්ම නැසුමට රහත් ඵලයට පැමිණියේද. අවබෝධ කටයුතු ධර්මය මනාව අවබෝධ කොට. දැනගතයුතු ධර්ම මනාව දැනගෙන සාක්ෂාත් කළ යුතු ධර්ම සාක්ෂාත් කොට, ප්‍රහීණ කළයුතු ධර්ම ප්‍රහීණ කොට, සියලු බඹසර වැස නිමවීම් ඇති. ආසවක්ඛය ප්‍රඥාවෙන් කෙළවරට පැමිණියා වූ, **මුනි** සියලු කෙලෙස් අවසන් කොට අර්හත් මාර්ග ඥානයෙන් සමන් විතව බඹසර වැසීමෙන් කෙළවරට පැමිණි බැවින් **සබ්බ වොසිත වොසානං. බ්‍රාහ්මණං** ඒ තැනැත්තා බ්‍රාහ්මණ යයි කියමි. යන අර්ථයි.

දේශනාවසානයේ බොහෝ දෙනා සෝවාන් ආදී මාර්ග ඵලවලට පැමිණියාහුය. බමුණාද පැහැදුනු සිතින් යුතුව උපාසක බව පිළිගත්තේය.

දේවඩ්ගික බ්‍රාහ්මණයාගේ කථා පුවතයි.

බ්‍රාහ්මණ වර්ගය නිමියේය.

විසි හය වැනි වර්ගය සමාප්තයි.

556

1.	යමක වර්ගයේ කථා	- 14කි
2.	අප්ප මාද ,, ,,	- 09 කි
3.	චිත්ත ,, ,,	- 09 කි
4.	පුප්ඵ ,, ,,	- 11 කි
5.	බාල ,, ,,	- 14 කි
6.	පණ්ඩිත ,, ,,	- 11 කි
7.	අරහන්ත ,, ,,	- 10 කි
8.	සහස්සු ,, ,,	- 14 කි
9.	පාපවර්ගයේ ,, ,,	- 12 කි
10.	දණ්ඩ ,, ,,	- 10 කි
11.	ජරා ,, ,,	- 09 කි
12.	අත්ත ,, ,,	- 10 කි
13.	ලෝක ,, ,,	- 11 කි
14.	බුද්ධ ,, ,,	- 09 කි
15.	සුඛ ,, ,,	- 08 කි
16.	පිය ,, ,,	- 09 කි
17.	කෝධ ,, ,,	- 08 කි
18.	මල ,, ,,	- 12 කි
19.	ධම්මට්ඨ ,, ,,	- 10 කි
20.	මග්ග ,, ,,	- 10 කි
21.	ප්‍රකීර්ණක වර්ගයේ කථා	- 09 කි
22.	නිරය වග්ග	- 09 කි
23.	නාග	- 08 කි
24.	තණ්හා	- 12 කි
25.	භික්ඛු	- 12 කි
26.	බ්‍රාහ්මණ	- 39 කි
		299

මෙලෙසම දෙසිය අනුනවයක් කථාවස්තු පවසා සංක්ෂේප වශයෙන් හා විස්තර වශයෙන් රචනා කරණලද බණවර හැත්තෑදෙකක් වූ ධම්ම පද වර්ණනාව නිමාවිය.

මහර්ෂීවූ ධර්මරාජයන් වහන්සේ විසින් ධම්ම පදපාලියේ දේශනා කරණ ලද ධම්ම පද ගාථා වර්ග වශයෙන් විසි හයක්වූ කථා වශයෙන් දෙසිය අනූනවයක්වූ ධම්ම පද අර්ථ කථා කෘත වේදී අධිරාජයා විසින් කරවන ලද මහා විහාරයේ සිරිකුඩ්ඩ රජු කරවූ ප්‍රාසාදයේ සිට ලෝකයාට අර්ථහිත සඳහා අර්ථ ව්‍යඤ්ජන යෙන් යුත් බුද්ධ ධර්මය පැවතිම සඳහා බණවර 72 ක් යුත් පාලි ධම්මපද අට්ඨ කථාව රචනා කිරීමෙන් මා ලද පුණ්‍ය සමූහය සියළු ප්‍රාණීන්ට ලැබී සියළු පැතුම් ඉටුවී මධුරවූ නිවන් සුව සමෘද්ධ වේවා.

පරම විසුද්ධ ශ්‍රද්ධා බුද්ධි විරිය ප්‍රති මණ්ඩිත වූ ශීලාචර ඍජු, මෘදූ, ගුණ යන්ගෙන් සපිරුණු සිය සමය සමයාන්තර ඤාණ සමූහයෙන් යුතු ඤාණ ග්‍රහණයෙහි සමර්ථවූ ප්‍රඥා සාමවයෙන් යුක්ත වූ ත්‍රිපිටක පර්යාප්ත ප්‍රභේද ඤාණ යෙන්ද අට්ඨ කථා සහිත බුද්ධ ශාසනයේ අප්‍රතිහත ඤාණ ප්‍රභාවෙන්ද මහා ව්‍යාකරණඥ වුද උදාර ග්‍රන්ථ කරණයේ හික්ෂණ වුද මධුර, උදාර ඕජෝගුණ ලාවන්‍ය යුතු මහා කාව්‍ය කරණයෙන් යුත් ඡලභිඥා පටිසම්භිදා දී ප්‍රභේද ගුණ ප්‍රති මණ්ඩිත වූ උත්තරී මනුෂ්‍ය ධර්ම සුප්‍රතිෂ්ඨිත ථේරවංශයට ප්‍රදීපාය මානවූ මහාවිහාර වංගාලංකාර වූ විපුල විසුද්ධ බුද්ධි ප්‍රභාවෙන් යුත් බුද්ධ ඝෝෂ යන ගරු නාමයේන් යුත් තෙරුන් විසින් මේ ධම්ම පද වර්ණනය නම් වූ අටුවාව කරණ ලද්දේය.

ලෝකෝත්තරමය සුවය සොයන කුල පුතුන්ට ශීලවිසුද්ධි න්‍යාය පෙන්වා දෙන තාදි ගුණ ඇති පිරිසිදු සිත් ඇති ලොවට මහර්ෂීවූ බුද්ධ යන නම ලොව පවතීවා.

පාදි ධම්ම පදට්ඨ කථාවේ දෙවැනි කොටසට

පන්නල සුමේධ නායක ස්ථිරයන් විසින් කරණ ලද

සිංහල පරිවර්තනය

නිමා විය.

—//—

සුචිය

අ

අග්ගාලව 109-214
අග්ගිදත්ත 162
අඞ්ගුත්තර පෙදෙස 260
අජගර 16
අජාසත් 178
අත්ථදත්ත 94
අතුල 234
අඳුන්වනය 226
අනිත්ථිගනීධ 200
අනුරුද්ධ 141
අනේපිඬු 139
අප්‍රත්තක සිටු 419
අභය රාජ කුමරු 104
අලවිනුවර 182
අවන්ති 439
අංකුර 145-421
අංග 162
ආනන්ද 66-157-471
අටරියනක් 1
අටයක බත 4
අත්‍යන්ත දුශ්ශීල 86
අධිමානික 52
අරඤ්ඤවාසී 81
අවමඟුල් 02
අල්පේච්ඡතා 22
අසද්ධර්මස්ථවය 71
ආජානීය ඇතුන් 167
ආයු සංස්කාරහැරීම 189
ආශීර් විෂයකු 109

ඉ

ඉන්දසාල ගුහා 189
ඉන්දික 421
ඉන්දු 145
ඉසිපතානාරාමය 209
ඊරි පැටවා 393

උ

උත්පලවණ්ණා 140
උත්තරී 50-51
උත්තරා 217
උත්තරද්වාරගම 270
උත්තර මානවක 153
උපනන්ද 75
උපවත්තන 268
උස්සල 529
උෆරු සා කටික 331
උපචාර ධ්‍යානය 308
උපනිශ්‍රය ධ්‍යානය 308

උපනිශ්‍රය සම්පත් 83
උපෝසථ 159
උපෝසථ කුලය 167
උරු පැටියකු 390

එ

ඒක විහාරික 343
ඒකුදාන 273
ඒරකපත්ත 152

ක

කටපථ 529
කට්ඨවාහන 72
කච්චායන 439
කලුගල්කඩ 17
කස්සප 152
කාල ථේර 90
කාල සිටුපුත් 125
කාල සීලා පව්ව 18
කාශ්‍යප 6
කාසිගාම 178
කිසා ගෝතමී 314-485
කුණ්ඩධාන වනය 518
කුණ්ඩ කෝලිය 518
කුමාර කාශ්‍යප 80
කුරරඝර 439
කුරුරට 162
කුසිනාරා නුවර 268
කූටාගාර සාලා 199
කොසොල් රජු 162
කෝකාලික 430
කාකසුර 257
කුචඡපොයිල 302
කුඤ්ජර ගාලා 260
කෙළඹියෙක් 195
කෝකනද 71
බීරණපථමහක සොහොන 63
ඛේම සිටුපුත් 351

ග

ගන්ධමාදන පර්වතය 262
ගරුකාපක්ති 86
ගවඝාතක 237
ගැරඬියකු 4
ගිනි කඳන් සේ 23
ගීත වාදනය 67
ගොපල්ලා 11
ගණඩ උයන් ගොව්වා 137
ගන්ධ මාදන පව්ව 36
ගන්ධ සිටු 34
ගිජුකුළු පව්ව 298

ගිජඣ කූට 348
සරණී 139

ජ

ජනපද 255
ජනපද විහාරය 243
ජටිල බ්‍රාහ්මණ 480
ජාතික වනය 267-327
ජෝතිය 537

ඣ

ඣඤ්ඣ මානවිකා 119
ඣුල්ල පන්ථක 506
ඣුල්ල සුභද්‍රා 339
ඣුලකාල උපාසක 93

ත

තල සත්තික 03
තසරය 110
තුන් වයස 73
තිස්ස 243-255
තෝදෙය්‍ය 170
ථුල්ල සාරික 250
ථුල්ල සාවක 250

ද

දිසාමුඛ 529
දේවදත්ත 87
දායජ්ජ උපසම්පදා
දේවතාවිය 07
දේවස්ථානය 170
දොරවුපාල පුතු 255
ධම්මකරක 265
ධම්මචාරී 357
ධුර්තයෝ 67

න

නගුලිසක් පමණ 137
නාගමානවිකාව 153
නීති ධර්මය 271
නීවරණ ප්‍රහාණය 308
නඬිගුල කුල තෙරුන් 451
නන්දිය 210
නන්දි විසාල 141

ප

පඤ්චග්ගදායක 438
පටාචාරා 314
පුණණ 217

පුණ්ණා 231
පදුමුත්තර 81
පධාන කම්මිකතිස්ස 295
පධාන තිස්ස 78
පඛහාර 494
පිලෝතික 33
පෝඨිල තෙරුන් 302
පඤ්ච ආකාර වාස භාවය 308
පණ්ඩරඩග පැවිද්ද 366
පද භාගය 245
පරි කර්මය 308
පහරදාන විනය සිඛපදය 1
පාලි පිරවුව 245
පාවාඩ වස්ත්‍ර 72
පිටුවාවක් 260
පේසකාර දියණිය 112

ඛ

ඛරණැස 19
බහුභාණ්ඩික 26
බෝධිරාජ කුමරු 71
හතතාහතික සෙටඨී 38
භද්දිය නුවර 260-327
බන්ධනාගාරය 398
බහුභාණ්ඩික 22
බිලීබාන්නා 287
භදෙදකරතත 310

ම

මගධ 62
මධුර පාචිකා 305
මල්ලිකා දේවි 59
මහමුගලන් 13-17-410-514
මහධන සිටු 310
මහ මේරුව 140
මහාකාල උපාසිකා 85-92
මාගන්දි 128
මධ්‍යම දේශය 167
මරණ බිය 01
මහරි රුක් 152
මහාසාල කුල 167
මාර පරාජය 65
මාලුවා වැළ 87
මිථ්‍යාදෘෂ්ටික කුලය 220
මුඩු මහණුන් 220
මෙණ්ඩක 266

ය

යමක චෝළ 529

ර

රන්කරු 241
රාජ කුලයෙහි 67
රාජ රථ 61
රිය සකක් පමණ 308
රජගහනුවර 17
රූපනන්දා 58
රෝහිණී 212

ල

ලක්ඛණ තෙරුන් 13
ලකුණටක භද්දිය 275-330
ලාලුදායී 64

ව

වක්කලී 453
වළාහක 167
වස් පවාරණය 79
වස් සිවුරු 75
වාක් කරණ 278
වජිර 529
වජිරබාහු 529
වග්ගු මුදා නදී තෙර 350
විශාඛා 12 - 197
විනිශ්චය ඇමති, 270
වීර සාමණේර 140
වේළුවණාරාමය 205-331


ස

සඤ්ජීක පුත්ත 71
සතුල්ල කාය 539
සහඵකාය තෙරුන් 447
සන්තති මහ ඇමති 30
සැවැත් නුවර 22
සැරියුත් 148-493-513
සමිද්ධි 161
සිරිමා 46-221
සම්මුඤ්ජනී ථෙර 165
සාතරස ආහාර 39
සත් බුදුවරු 157
සහායකයා 237
සියක්වර පෙරූ තෙල් 221
සාටක 75
සුරාලෝලී 67
සංඝ භේදය 88
ෂඩ්වර්ගීය 02
ෂඩ් වර්ණරශ්මි 154
සාකේතනුවර 226
සුහද්ද 268
සුසීම 322

සුන්දර සමුද්ද 520
සුමණ සාමණේර 476
සුද්ධෝදන රජු 101
සොණ කුටිකණ්ණ
ශාක්‍ය ජනපදය 173

හ

හස්ති ශිල්පය 364
හිනි කුණේකු 243
හිරි ඔතප් 22
හේසකලා වන 71



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

භදන්ත බුද්ධඝොෂාචාර්‍යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිංහලට්ඨකථා පාලියට පරිවර්‍තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk, info@buddhistcc.com
www.buddhistcc.com

ISBN 978-955-1604-25-7